

W.S.A.H.M. Senanayaka
Sworn Translator (Sinhala/English)
Udawela, Welipennagahamulla
☎076 5562621
manekasenanayake@gmail.com

සිතියම 1: නිම කරන ලද / ක්‍රියාත්මක කෙරෙමින් පවතින හා අනුමත වූ මාර්ග ව්‍යාපෘති

ආයතනික කළමනාකරණ ව්‍යුහය

සභාපති
සී. පී. අතුලුවගේ මයා

අධ්‍යක්ෂ ජනරාල්
එල්.වී.එස්.වීරකෝන් මයා

අතිරේක අධ්‍යක්ෂ ජනරාල් - වත්කම් මෙහෙයුම් සහ කළමනාකරණය
එස්. ඕපානායක මයා

අතිරේක අධ්‍යක්ෂ ජනරාල් - ඉදිකිරීම් සැලසුම්
ආර්.ඒ.එස්.කේ. කළුආරච්චි මිය / එල්.එස්.ප්‍රේමතිලක මයා (වැඩබලන)

අතිරේක අධ්‍යක්ෂ ජනරාල් - ජාල සැලසුම්
ඩී.එම්. දයාරත්න මයා / බී.ඒ.ආර්.ප්‍රේමරත්න මිය (වැඩ බලන)

අතිරේක අධ්‍යක්ෂ ජනරාල් - ව්‍යාපෘති
පී.කේ.ඩී. තිසේරා මයා / බී.ඒ.ආර්.ප්‍රේමරත්න මිය (වැඩ බලන)

ක්‍රියාකාරී අංශවල අධ්‍යක්ෂවරුන්

අධ්‍යක්ෂ නඩත්තු කළමනාකරණ	:	බී.ඒ.ආර්.ප්‍රේමරත්න මිය
අධ්‍යක්ෂ ඉදිකිරීම්	:	පී.කේ.ඩී. තිසේරා මයා/ ඒ.යූ අරම්පොල මයා
අධ්‍යක්ෂ ග්‍රාමීය පාලම් ඉදිකිරීම්	:	ටී. එස්. සිල්වා මිය (වැඩ බලන)
අධ්‍යක්ෂ අධිවේගී සැලසුම්	:	ආර්. ඒ. එස්. කේ. කළුආරච්චි මිය / ජී. ජයලත් මයා
අධ්‍යක්ෂ ඉංජිනේරු සේවය	:	එල්. එස්. ප්‍රේමතිලක මයා
අධ්‍යක්ෂ පර්යේෂණ හා සංවර්ධන	:	කේ.එල්.අයි.රණසෝම මිය (වැඩ බලන)
අධ්‍යක්ෂ ඉඩම්	:	ඩී. එම්. දයරත්න මයා / එන්.කේ.එල්.නෙත්තිකුමාර මයා (වැඩ බලන)
අධ්‍යක්ෂ, පාරිසරික හා සමාජ සංවර්ධන අංශය	:	ටී. ඩී. විජේවර්ධන මිය / එන්.කේ.එල්.නෙත්තිකුමාර මයා
අධ්‍යක්ෂ සැලසුම්	:	ඩී. එන්. සියම්බලපිටිය මිය / ඩී.ඒ.එස්. ජයසේකර මිය
අධ්‍යක්ෂ අධිවේගී මාර්ග මෙහෙයුම්, නඩත්තු හා කළමනාකරණ	:	ජේ.එන්. ලොඩ්වික් මයා (වැඩ බලන)
අධ්‍යක්ෂ යාන්ත්‍රික	:	අයි.එම්.ජේ.කීර්ති මයා
අධ්‍යක්ෂ පුහුණු	:	කේ.පී.අයි.ආර්. පෙරේරා මයා (වැඩ බලන)
අධ්‍යක්ෂ නීති	:	ජේ. වෛද්‍යදාස මයා /සුබානි මිය
අධ්‍යක්ෂ ක්‍රමසම්පාදන	:	වී. මොහාන් මයා
අධ්‍යක්ෂ පරිපාලන	:	එන්.සූරියකුමාරන් මයා (වැඩ බලන)
අධ්‍යක්ෂ මූල්‍ය	:	එච්. කන්නංගර මයා
අධ්‍යක්ෂ අභ්‍යන්තර විගණන	:	ජේ.රත්නායක මයා (රාජකාරී ආවරණය කිරීම)
අධ්‍යක්ෂ තත්ත්ව සහතික හා ප්‍රගති අධීක්ෂණ	:	ටී. රත්නජෝති මිය
අධ්‍යක්ෂ දේපළ කළමනාකරණය සහ ආදායම්	:	පුරප්පාඩු වී ඇත

ව්‍යාපෘති කළමනාකරණ ඒකකවල අධ්‍යක්ෂවරු

ව්‍යාපෘති අධ්‍යක්ෂ (මධ්‍යම අධිවේගී මාර්ග ව්‍යාපෘතිය 1 කොටස)	ඩබ්ලිව්.කේ.කොඩිතුවක්කු මයා
ව්‍යාපෘති අධ්‍යක්ෂ (මධ්‍යම අධිවේගී මාර්ග ව්‍යාපෘතිය 2 කොටස)	කේ.එච්.එම්.ඒ.කේ.කෙහෙල්ඇල්ල මයා
ව්‍යාපෘති අධ්‍යක්ෂ (මධ්‍යම අධිවේගී මාර්ග ව්‍යාපෘතිය 3 කොටස)	එල්.වී.එස්. වීරකෝන් මයා
ව්‍යාපෘති අධ්‍යක්ෂ (මධ්‍යම අධිවේගී මාර්ග ව්‍යාපෘතිය 4 කොටස)	එල්.වී.එස්. වීරකෝන් මයා (වැඩ බලන)
ව්‍යාපෘති අධ්‍යක්ෂ (රුවන්පුර අධිවේගී මාර්ග ව්‍යාපෘතිය)	එච්.ජී.එන්. ප්‍රේමකාන්ති මිය
ව්‍යාපෘති අධ්‍යක්ෂ (විශේෂ ව්‍යාපෘති කළමනාකරණය)	එස්.එච්. ජයසිංහ මයා
ව්‍යාපෘති අධ්‍යක්ෂ (විවිධ විදේශ ආධාර ව්‍යාපෘතිය)	අයි.කේ. බද්දේගම මයා (වැඩ බලන)
ව්‍යාපෘති අධ්‍යක්ෂ (ප්‍රවාහන සම්බන්ධතා සහ වත්කම් කළමනාකරණ ව්‍යාපෘතිය)	එල්.යූ.ඩී. අතපත්තු
ව්‍යාපෘති අධ්‍යක්ෂ (දක්ෂිණ මාර්ග සම්බන්ධතා ව්‍යාපෘතිය)	එච්.එච්.එන්.ඒ.හෙට්ටිආරච්චි මයා
මාර්ග ජාල වැඩිදියුණු කිරීමේ ව්‍යාපෘතිය (චීන එක්සිම් බැංකු අරමුදල් යටතේ සිදු කරන හුනාන් ව්‍යාපෘතිය)	එම්.ආර්. සුදත් මයා
ව්‍යාපෘති අධ්‍යක්ෂ (දේශීය බැංකු අරමුදල් සහ ග්‍රාමීය මාර්ග ව්‍යාපෘතිය)	එම්.ආර්. සුදත් මයා
ව්‍යාපෘති අධ්‍යක්ෂ (කුලුනු මතින් දිවෙන වරාය පිවිසුම් අධිවේගී මාර්ගය)	කේ.ඩබ්ලිව්. කණ්ඩම්බි (වැඩ බලන)
ව්‍යාපෘති අධ්‍යක්ෂ (බදුල්ල-චෙන්කලාඩි මාර්ග වැඩිදියුණු කිරීමේ ව්‍යාපෘතිය)	ඒ.පී.කේ. අබේදීර මයා (වැඩ බලන)
ව්‍යාපෘති අධ්‍යක්ෂ (නව කැලණි පාලම් ඉදිකිරීම් ව්‍යාපෘතිය)	ඩී.ඒ.එස්.ජයසේකර මිය
ව්‍යාපෘති අධ්‍යක්ෂ (ජාතික මාර්ග ජාලයේ නායයෑම් ආපදා ආරක්ෂණ ව්‍යාපෘතිය)	කේ.පී. කොඩිතුවක්කු මයා
ව්‍යාපෘති අධ්‍යක්ෂ (අයි-රෝඩ් ව්‍යාපෘතිය - ව්‍යාපෘති සම්බන්ධීකරණය)	එල්.යූ.ඩී. අතපත්තු මයා
ව්‍යාපෘති අධ්‍යක්ෂ (කුළුණු මතින් දිවෙන නව කැලණි පාලමේ සිට අතුරුගිරිය දක්වා වන අධිවේගී මාර්ග ව්‍යාපෘතිය)	කේ සෙල්වනාදන් මහතා
ව්‍යාපෘති අධ්‍යක්ෂ (මහනුවර උමං මාර්ග ඉදිකිරීම් ව්‍යාපෘතිය)	ඩබ්ලිව්.එම්. ගුණසිංහ මයා
ව්‍යාපෘති අධ්‍යක්ෂ (මාර්ග සම්බන්ධතා සහ සංවර්ධන ඇතුළත් ව්‍යාපෘතිය)	ඩී.එන්.එල්.කේ.ගන්නෝරුව මිය

හැඳින්වීම

මාර්ග සංවර්ධන අධිකාරියේ (RDA) 2021 වර්ෂය සඳහා වන වාර්ෂික වාර්තාව, මාර්ග සංවර්ධන අධිකාරියේ ආයතනික හා මෙහෙයුම් අංශයන් සැකෙවින් සාකච්ඡා කරන අතර වර්ෂය තුළ එහි ක්‍රියාකාරිත්වය සහ ජයග්‍රහණ පිළිබඳ සවිස්තරාත්මක තොරතුරු සපයනු ලබයි. මාර්ග සංවර්ධන අධිකාරියේ මෙහෙයුම් අංශ සහ කාර්ය සාධනය පිළිබඳ කෙටි දළ විශ්ලේෂණයක් ආරම්භයේ දී ලබා දී ඇති අතර මාර්ග සංවර්ධන අධිකාරියේ සංවිධානාත්මක කරුණු ද සාකච්ඡා කර ඇත. 2021 වර්ෂය තුළ මාර්ග සංවර්ධන අධිකාරියේ එක් එක් ක්‍රියාකාරී අංශවල කාර්යයන්, වගකීම් සහ කාර්යසාධනය පිළිබඳව කාර්ය සාධනය මීළඟට ඉදිරිපත් කර ඇත. මහාමාර්ග අමාත්‍යාංශය විසින් සෘජුව හසුරුවන ලද එක් එක් විදේශ අරමුදල් ව්‍යාපෘති පිළිබඳ සවිස්තර තොරතුරු ද ඇතුළත් කර ඇත. මාර්ග සංවර්ධන අධිකාරියේ සමස්ත මූල්‍ය කාර්ය සාධනය වාර්තාවේ වෙනම පරිච්ඡේදයක් යටතේ ඉදිරිපත් කර ඇත. වාර්තාව අවසානයේ සපුරා ගත් ඉලක්ක සහ අරමුණු සාක්ෂාත් කර ගැනීම් ඉදිරිපත් කර ඇති අතර මූල්‍ය ප්‍රකාශය සහ විගණකාධිපති වාර්තාව වාර්තාවට ඇමුණුම් ලෙස දක්වා ඇත.











පටුන

දළ විශ්ලේෂණය..... 1

අ. ක්‍රියාකාරී අංශ සහ දේශීය අරමුදල් සහිත ව්‍යාපෘතිවල කාර්ය සාධනය 13

1. මාර්ග නඩත්තුව ක්‍රියාත්මක කිරීම..... 13
2. දේශීය අරමුදල් යටතේ මාර්ග පුළුල් කිරීම..... 14
3. මාර්ග සහ පාලම් සැලසුම් නිර්මාණය..... 30
3.1 මාර්ග සංවර්ධන අධිකාරියේ ප්‍රධාන කාර්යාලයේ පිහිටි මහාමාර්ග සැලසුම් අංශය 30
3.2 ඉංජිනේරු සේවා අංශය..... 44
3.3 මහනුවර සැලසුම් කාර්යාලය..... 52
3.4 රත්නපුර සැලසුම් කාර්යාලය 57
4. මාර්ග සහ පාලම් වැඩවල තත්ත්ව පාලනය 61
5. මාර්ග හා පාලම් වැඩවලදී තත්ත්ව ආරක්ෂණය හා ප්‍රගතිය අධීක්ෂණය කිරීම..... 69
6. මාර්ග ආරක්ෂාව සහ රථවාහන කළමනාකරණය..... 71
7. ඉඩම් අත්කර ගැනීම සහ නැවත පදිංචි කිරීම..... 76
8. පාරිසරික හා සමාජ ආරක්ෂණ පියවරයන් ක්‍රියාත්මක කිරීම..... 82
9. සැලසුම්කරණය..... 89
9.1 රථවාහන දත්ත රැස් කිරීම සහ ඇගයීම..... 89
9.2 ජාල සැලසුම් කිරීම සහ වාර්තා කිරීම..... 91
9.3 රථවාහන ආකෘති නිර්මාණය..... 93
9.4 කළමනාකරණ තොරතුරු පද්ධතිය නඩත්තු කිරීම..... 96
9.5 අධිවේගී මාර්ග තොරතුරු සහ සංවර්ධන කළමනාකරණ පද්ධතිය (HIDMS)..... 98
10. අධිවේගී මාර්ග කළමනාකරණය..... 105
11. දේපල කළමනාකරණය සහ ආදායම් එකතු කිරීම..... 120
12. යාන්ත්‍රික සේවා..... 126
13. මිනිස්බල සංවර්ධනය..... 130
14. නීති සේවා..... 135
15. ප්‍රසම්පාදන කළමනාකරණ සේවා..... 138
16. පිරිස් කළමනාකරණය..... 144
17. මූල්‍ය කළමනාකරණය..... 149
18. අභ්‍යන්තර විගණන කාර්ය සාධනය..... 151

ආ. විදේශ අරමුදල් සහිත ව්‍යාපෘති..... 153

1. මධ්‍යම අධිවේගී මාර්ගය..... 153
1.1 මධ්‍යම අධිවේගී මාර්ග ව්‍යාපෘතිය 1 කොටස..... 155
1.2 මධ්‍යම අධිවේගී මාර්ග ව්‍යාපෘතිය 2 කොටස..... 159
1.3 මධ්‍යම අධිවේගී මාර්ග ව්‍යාපෘතිය 3 කොටස..... 162
1.4 මධ්‍යම අධිවේගී මාර්ග ව්‍යාපෘතිය 4 කොටස..... 168
2. රුවන්පුර අධිවේගී මාර්ගය..... 170
3. කුළුණු මත ඉදිවන වරාය ව්‍යාපෘතිය මහාමාර්ග ව්‍යාපෘතිය..... 174
4. නව කැළණි පාලමේ සිට අතුරුගිරිය දක්වා කුළුණු මත ඉදිවන අධිවේගී මාර්ගය..... 180
5. විශේෂ ව්‍යාපෘති කළමනාකරණය..... 185
5.1. පාලම් 25 ව්‍යාපෘතිය ප්‍රතිසංස්කරණය කිරීම (KFAED ණය)..... 185

5.2 බෙස්ලයින් මාර්ගයේ දකුණු දිගුව ඉදිකිරීම (අදියර III)..... 189
6. විවිධ විදේශ ආධාර ව්‍යාපෘතිය..... 190
6.1 සංවර්ධනය සඳහා වන සෞඳි අරමුදල (SFD-2) මගින් අරමුදල් සපයන මාර්ග ජාල සංවර්ධන ව්‍යාපෘතිය යටතේ මාර්ග ප්‍රතිසංස්කරණය කිරීම සහ වැඩිදියුණු කිරීම..... 190
6.2 ජාත්‍යන්තර සංවර්ධනය සඳහා වන ඔපෙක් අරමුදල (OFID-1) විසින් අරමුදල් සපයන ජාතික මාර්ග වැඩිදියුණු කිරීමේ ව්‍යාපෘතිය යටතේ මාර්ග ප්‍රතිසංස්කරණය කිරීම සහ වැඩිදියුණු කිරීම..... 193
6.3 සංවර්ධනය සඳහා ඔපෙක් අරමුදල (OFID -2) ණය අංක 1511 PB මගින් අරමුදල් සපයන කොළඹ ජාතික මහාමාර්ග ව්‍යාපෘතිය යටතේ මාර්ග ප්‍රතිසංස්කරණය කිරීම සහ වැඩිදියුණු කිරීම..... 193
6.4 සංවර්ධනය සඳහා වන ඔපෙක් අරමුදල (OFID-3) ණය අංක 1662P මගින් අරමුදල් සපයන බස්නාහිර පළාත් මාර්ග සංවර්ධන ව්‍යාපෘතිය යටතේ මාර්ග ප්‍රතිසංස්කරණය කිරීම සහ වැඩිදියුණු කිරීම..... 195
6.5 සංවර්ධනය සඳහා වන ඔපෙක් අරමුදල (OFID) විසින් අරමුදල් සපයන ගාල්ල - දෙනියාය - මාදම්පේ මාර්ග (A017) ව්‍යාපෘතිය (OFID -4)..... 196
6.6 කොහුවල සහ ගැටඹේ ගුවන් පාලම් දෙකක් ඉදිකිරීම..... 199
6.7 උත්තරානන්ද මාවත, කොම්පඤ්ඤවීදියේ ජස්ටිස් අක්බර් මාවත සහ බාලදක්ෂ මාවත සහ කොළඹ - රත්නපුර - වැල්ලවාය - මඩකලපුව (A004) මාර්ගය සම්බන්ධ කරමින් ගුවන් පාලම් ඉදිකිරීම..... 202
7. ප්‍රවාහන සම්බන්ධතා සහ වත්කම් කළමනාකරණ ව්‍යාපෘතිය..... 204
8. දක්ෂිණ මාර්ග සම්බන්ධතා ව්‍යාපෘතිය..... 214
9. චීන එක්සිම් බැංකුව (හූනාන් ශාඛාව) අරමුදල් සපයන ව්‍යාපෘතිය..... 216
10. බදුල්ල චෙන්කලඩි මාර්ගය වැඩිදියුණු කිරීමේ ව්‍යාපෘතිය..... 220
11. කැලණි ගඟ හරහා නව පාලම ඉදිකිරීමේ ව්‍යාපෘතිය..... 223
12. ඒකාබද්ධ මාර්ග ආයෝජන වැඩසටහන (i-ROAD ව්‍යාපෘතිය)..... 228
12.1 iRoad I..... 228
12.2 iRoad II..... 240
13. ජාතික මාර්ග ජාලයේ නායයෑම් ආපදා ආරක්ෂණ ව්‍යාපෘතිය..... 250
14. මහනුවර උමං මාර්ග ඉදිකිරීම් ව්‍යාපෘතිය..... 253
15. මාර්ග සම්බන්ධතා සහ සංවර්ධන ව්‍යාපෘතිය..... 256

ඇ. මාර්ග සංවර්ධන අධිකාරියේ සමස්ත මූල්‍ය කාර්ය සාධනය..... 258

ඈ. ඉලක්ක සහ අරමුණු සාක්ෂාත් කර ගැනීම 262

කෙටි යෙදුම්

AADT	වාර්ෂික සාමාන්‍ය දෛනික ගමනාගමනය
ADB	ආසියානු සංවර්ධන බැංකුව
ADG	අතිරේක අධ්‍යක්ෂ ජනරාල්
ADT	සාමාන්‍ය දෛනික ගමනාගමනය
AO&M	වත්කම් මෙහෙයුම් සහ කළමනාකරණය
BH	සිදුරු විදීම
BIQ	මූලික තොරතුරු ප්‍රශ්නාවලිය
BIV	පාලම් පරීක්ෂා කිරීමේ වාහනය
BMS	පාලම් නඩත්තු පද්ධතිය
Bn	බිලියනය
BOQ	ප්‍රමාණ බිල්පත
CDB	චීන සංවර්ධන බැංකුව
CE	ප්‍රධාන ඉංජිනේරු
CEA	මධ්‍යම පරිසර අධිකාරිය
CEP	මධ්‍යම අධිවේගී මාර්ග ව්‍යාපෘතිය
CEB	ලංකා විදුලිබල මණ්ඩලය
CKE	කොළඹ - කටුනායක අධිවේගී මාර්ගය
CP	කොන්ත්‍රාත් පැකේජය
DCP	ගතික කේතු විනිවිදීම
DF	දේශීය අරමුදල්
DG	අධ්‍යක්ෂ ජනරාල්
Dwg	සටහන් ඇඳීම්
EDCF	ආර්ථික සංවර්ධන සංස්ථා අරමුදල
EE	විධායක ඉංජිනේරු
EOM&M	අධිවේගී මාර්ග මෙහෙයුම්, නඩත්තු හා කළමනාකරණය
EOT	කාලය දීර්ඝ කිරීම
EP	නැගෙනහිර පළාත
EPF	සේවක අර්ථසාධක අරමුදල
ES	ඉංජිනේරු සේවය
ESDD	පාරිසරික හා සමාජ සංවර්ධන අංශය
ESEP	දක්ෂිණ අධිවේගී මාර්ග ව්‍යාපෘතිය පුළුල් කිරීම
ETF	සේවක භාර අරමුදල
Exp	අධිවේගී මාර්ග
FAG	විදේශ ආධාර ප්‍රදාන
FAL	විදේශ ආධාර ණය
FARDF	විදේශ ආධාර ආශ්‍රිත දේශීය අරමුදල්
FWD	පතිත බර උත්ක්‍රමණ මීටරය
GIC	රජයේ තොරතුරු මධ්‍යස්ථානය
GIS	භූගෝලීය තොරතුරු පද්ධතිය
GOSL	ශ්‍රී ලංකා රජය
GPRS	ජංගම සන්නිවේදනය සඳහා ගෝලීය පද්ධතිය
GPS	ගෝලීය ස්ථානගත කිරීමේ පද්ධතිය
HDD	අධිවේගී මාර්ග සැලසුම් අංශය
HDM – 4	මහාමාර්ග සංවර්ධනය හා කළමනාකරණය - 4
HIMS	මහාමාර්ග තොරතුරු කළමනාකරණ පද්ධතිය
IC	අන්තර් හුවමාරුව
ICTAD	ඉදිකිරීම් පුහුණු හා සංවර්ධන ආයතනය
ITS	නැණවත් ප්‍රවාහන පද්ධතිය
JICA	ජපන් ජාත්‍යන්තර සහයෝගිතා ඒජන්සිය

KFAED	අරාබි ආර්ථික සංවර්ධනය සඳහා කුවේට් අරමුදල
km	කිලෝමීටරය
LAIS	ඉඩම් අත් කර ගැනීමේ තොරතුරු පද්ධතිය
LBFP	දේශීය බැංකු අරමුදල් සහිත ව්‍යාපෘතිය
LED	ආලෝක විමෝචක දියෝඩය
LOA	පිළිගැනීමේ ලිපිය
MCC	අත්කම් වර්ගීකරණ සංගණනය
MFAP	විවිධ විදේශ ආධාර ව්‍යාපෘතිය
MFNSV	බහුකාර්ය ජාල සමීක්ෂණ රථය
MIS	කළමනාකරණ තොරතුරු පද්ධතිය
MM	නඩත්තු කළමනාකරණය
Mn	මිලියනය
MOFP	මුදල් හා සැලසුම් අමාත්‍යාංශය
MOHP&S	මහාමාර්ග, වරාය සහ නැව් කටයුතු අමාත්‍යාංශය
MOU	අවබෝධතා ගිවිසුම
MPC	අමාත්‍යාංශ ප්‍රසම්පාදන කමිටුව
MW	මාවත
NAITA	ජාතික ආධුනික හා කාර්මික පුහුණු අධිකාරිය
NBT	ජාතිය ගොඩනැගීමේ බද්ද
NCP	උතුරු මැද පළාත
NIBM	ව්‍යාපාර කළමනාකරණ ජාතික ආයතනය
NP	උතුරු පළාත
NPD	ජාතික සැලසුම් දෙපාර්තමේන්තුව
NRCP	උතුරු මාර්ග සම්බන්ධතා ව්‍යාපෘතිය
NWP	වයඹ පළාත
NWS & DB	ජාතික ජල සම්පාදන හා ජලාපවහන මණ්ඩලය
OCH	පිටත වටරවුම් අධිවේගී මාර්ගය
OFID	ජාත්‍යන්තර සංවර්ධනය සඳහා ඔපෙක් අරමුදල කොරියානු එක්සිම් බැංකුව
OPEC	ඛනිජ තෙල් අපනයන රටවල සංවිධානය
PCU	මගී කාර් ඒකකය
PD	ව්‍යාපෘති අධ්‍යක්ෂ
PIP	ව්‍යාපෘති ක්‍රියාත්මක කිරීමේ සැලැස්ම
PM&R	වත්කම් කළමනාකරණය සහ ආදායම්
PMU	ව්‍යාපෘති කළමනාකරණ ඒකකය
POS	විකුණුම් ලක්ෂය
PRP	ප්‍රමුඛතා මාර්ග ව්‍යාපෘතිය
PSC	පෙරසවි කොන්ක්‍රීට්
PWD	පොදු වැඩ දෙපාර්තමේන්තුව
R&D	පර්යේෂණ හා සංවර්ධනය
RBCD	ග්‍රාමීය පාලම් ඉදිකිරීම් අංශය
RDA	මාර්ග සංවර්ධන අධිකාරිය
RFAL	ප්‍රතිපූර්ණ විදේශාධාර ණය
RIS	මාර්ග තොරතුරු පද්ධතිය
ROW	මාර්ග අයිතිය
RP	නැවත පදිංචි කිරීමේ සැලැස්ම
RPPF	මාර්ග ව්‍යාපෘති සකස් කිරීමේ පහසුකම
Rs.	ශ්‍රී ලංකා රුපියල්
SCAPC	අමාත්‍ය මණ්ඩලය පත් කළ ස්ථාවර ප්‍රසම්පාදන කමිටුව
SCARC	අමාත්‍ය මණ්ඩලය පත් කළ ස්ථාවර සමාලෝචන කමිටුව
SFD	සංවර්ධනය සඳහා වූ සෞදි අරමුදල

SI	පද්ධති අන්තර් හුවමාරුව
SLLR & DC	ශ්‍රී ලංකා ඉඩම් ගොඩකිරීමේ සහ සංවර්ධනය කිරීමේ සංස්ථාව
SLRAMS	ශ්‍රී ලංකා මාර්ග වත්කම් කළමනාකරණ පද්ධතිය
SOR	බඳවා ගැනීමේ පරිපාටිය
SP	දකුණු පළාත
SPMU	විශේෂ ව්‍යාපෘති කළමනාකරණ ඒකකය
SRCP	දක්ෂිණ මාර්ග සම්බන්ධතා ව්‍යාපෘතිය
STDP	දක්ෂිණ ප්‍රවාහන සංවර්ධන ව්‍යාපෘතිය
TLS	රථවාහන ආලෝක පද්ධතිය
TOR	යොමුකිරීමේ අනුදේශ
UDA	නාගරික සංවර්ධන අධිකාරිය
UP	ඌව පළාත
VAT	අගය එකතු කළ බද්ද
VOC	වාහන මෙහෙයුම් පිරිවැය
WB	ලෝක බැංකුව
WLAN	රැහැන් රහිත ස්වකිය ප්‍රදේශ ජාලය
WP	බස්නාහිර පළාත
WPP	බස්නාහිර පළාත් ව්‍යාපෘති කාර්යාලය

දළ විශ්ලේෂණය

ඕනෑම ජාතියක සමාජ ආර්ථික සංවර්ධනය හා පසුකාලීන ආර්ථික වර්ධනය එහි ප්‍රවාහන යටිතල ව්‍යුහය සමඟ දැඩිව බද්ධව පවතී. තවද, ඕනෑම රටක ප්‍රවාහන පද්ධතිවල මට්ටම හා ගුණාත්මකභාවය දේශපාලන, ආර්ථික හා සමාජ ප්‍රගතියට බලපෑම් කිරීමේදී තීරණාත්මක වැදගත්කමක් ඇති අතර දේශීය, ජාතික හා කලාපීය සංවර්ධන සැලසුම්කරණයේ සෑම අදියරකදීම මේවා පිළිබඳව සලකා බැලිය යුතුය. මෑතදී, සැලකිය යුතු සංවර්ධන වැඩසටහන් බොහොමයක් යටිතල පහසුකම් සංවර්ධනය යටතේ ක්‍රියාත්මක කර ඇති අතර අයවැය ප්‍රතිපාදනවලින් සැලකිය යුතු කොටසක් මහාමාර්ග අංශයට වෙන් කර ඇත.

ශ්‍රී ලංකාවේ වර්තමාන මාර්ග ඝනත්වය වර්ග කිලෝමීටරයකට කිලෝමීටර 1.7ක් වන අතර එය කලාපීය රාජ්‍යයන් හා සසඳන විට ඉතා ඉහළ අගයකි. ශ්‍රී ලංකාව තුළ සෑම දෙසටම පැතිරුණු මාර්ග ජාලයක් පවතින අතර රටේ සමස්ත ජනගහනයට පළාත් අතර ගමනාගමනයට පහසුවන පරිදි හොඳින් සකසා ඇත කෙසේ වෙතත්, 1978 වසරේ සිට අඛණ්ඩව වාහන ගමනාගමනය වර්ධනය වීමත් සමඟ මාර්ග ප්‍රවාහන පද්ධතියේ ධාරිතාව තවමත් ප්‍රමාණවත් නොවීම නිසා විශේෂයෙන් නගරබද ප්‍රදේශවල සංචලනයේ කාර්යක්ෂමතාව අඩුවිය. කෙසේ වෙතත්, අවශ්‍ය සේවා මට්ටමට ළඟාවීම සඳහා ජාතික මාර්ග ජාලය පුනරුත්ථාපනය කිරීම හා වැඩිදියුණු කිරීම සඳහා වන තිරසාර වැඩපිළිවෙළක් වෙනුවෙන් මාර්ග සංවර්ධන අධිකාරිය කටයුතු කරමින් සිටී.

මෙම මාර්ග සහ පාලම් ප්‍රතිසංස්කරණ / වැඩිදියුණු කිරීමේ වැඩසටහන තිරසාර සංවර්ධන ඉලක්ක (SDGs) ගණනාවක් සාක්ෂාත් කර ගැනීමට දායක වේ. තිරසාර සංවර්ධන ඉලක්ක අංක 09 වන ප්‍රත්‍යාස්ථ යටිතල පහසුකම් ගොඩනඟා, තිරසාර කාර්මිකකරණය ප්‍රවර්ධනය කිරීම සහ නවෝත්පාදනයන් පෝෂණය කිරීම සහ අවසානයේ එමඟින් තිරසාර සංවර්ධන ඉලක්ක අංක 11: ආරක්ෂිත, ඔරොත්තු දෙන සහ තිරසාර නගර සහ මිනිස් ජනාවාස ඇතිකිරීම වෙනුවෙන් දායක වෙමින් වැඩිදියුණු කළ පොදු ප්‍රවාහනයට පහසුකම් සැපයීම ද ඇතුළත්ව, ප්‍රත්‍යාස්ථ යටිතල පහසුකම් ගොඩනැගීම කෙරෙහි මෙම ව්‍යාපෘති අවධානය යොමු කරයි. මෙම සියලු ව්‍යාපෘති මඟින් තිරසාර සංවර්ධන ඉලක්ක අංක 13: වැඩිදියුණු කළ මාර්ගවල ගුණාත්මක භාවය හරහා හරිතාගාර වායු විමෝචනය අඩු කිරීම මගින් දේශගුණික විපර්යාසවල බලපෑම් අවම කිරීමේ දේශගුණික ක්‍රියාමාර්ග සඳහා වක්‍රව දායක වනු ඇත.

ශ්‍රී ලංකාවේ මාර්ග ජාලය ප්‍රධාන වශයෙන් ජාතික මාර්ග, පළාත් මාර්ග සහ පළාත් පාලන ආයතන විසින් පාලනය කරනු ලබන මාර්ග ලෙස කොටස් තුනකට බෙදා ඇත. මාර්ග ජාල සම්බන්ධතාවය සලකා බලා පළාත් සභා / පළාත් පාලන ආයතනවලට අයත් මාර්ග වරින් වර මාර්ග සංවර්ධන අධිකාරිය විසින් අත්පත් කර ගෙන ඒවා ජාතික මාර්ග ජාලයට ඇතුළත් කරනු ලැබේ. 2021 වර්ෂයේ අවසානය වන විට ජාතික මාර්ග ජාලය කි.මී. 12,224.7ක් වන ඒ පංතියේ මාර්ග සහ ප්‍රධාන මාර්ග (බී පංතිය) වලින් සහ කි.මී 312.6 ක් වන අධිවේගී මාර්ග සහ පාලම් 4,254 කින් සමන්විත විය. ජාතික මාර්ග ජාලය නඩත්තු කිරීම හා සංවර්ධනය කිරීම සහ පවත්නා මාර්ග ජාලය වැඩි දියුණු කිරීම සඳහා නව මහාමාර්ග, පාලම් සහ අධිවේගී මාර්ග සැලසුම් කිරීම, නිර්මාණය කිරීම සහ ඉදිකිරීම පිළිබඳව මාර්ග සංවර්ධන අධිකාරිය වගකිව යුතුය.

වගුව 1: ශ්‍රී ලංකාවේ ජාතික මහාමාර්ග ජාලයේ පැතිරීම

පළාත	*අධිවේගී මාර්ග /කි.මී*	*ජාතික මාර්ග /කි.මී*		
	ඊ පංතිය	*ඒ පංතිය*	*B පංතිය*	*එකතුව*
බස්නාහිර	113.24	373.79	1,235.26	1,609.05
මධ්‍යම		408.59	1,333.71	1,742.30
දකුණ	161.82	352.91	1,154.39	1,507.30
උතුර		734.49	524.99	1,259.48
නැගෙනහිර		619.55	551.14	1,170.69
වයඹ	35.67	352.80	1,005.14	1,357.94
උතුරු මැද		491.19	706.12	1,197.31
ඌව		468.52	692.94	1,161.46
සබරගමුව	1.86	415.58	803.55	1,219.13
එකතුව	**312.59**	**4,217.42**	**8,007.24**	**12,224.66**



සිතියම 2: ශ්‍රී ලංකාවේ ජාතික මහාමාර්ග ජාලය

ජාතික මාර්ග නඩත්තු කිරීම

මාර්ග අබලන් වීම වැලැක්වීම හා වර්ෂය පුරා සතුටුදායක මට්ටමින් සේවා තත්ත්වය පවත්වා ගැනීම සඳහා නිතිපතා නඩත්තු කළ යුතුය. මාර්ග නඩත්තුව සඳහා අවශ්‍ය සමස්ත අරමුදල් මාර්ග නඩත්තු භාර අරමුදල යටතේ මාර්ග තත්ත්ව තක්සේරුවලට අනුව ප්‍රදේශයන් වෙත මුදා හැරේ. සාමාන්‍ය නඩත්තු කටයුතුවලට අමතරව, වැලි මුද්‍රිත තාර ආලේපනය සහ ඉරිතැලීම් මුද්‍රිත තාර ආලේපනය වැනි වරින් වර සිදු කරන නඩත්තු කිරීමේ ක්‍රමයක් මාර්ග සංවර්ධන අධිකාරිය විසින් ක්‍රියාත්මක කරයි. 2021 වර්ෂය තුළ මාර්ග කිලෝමීටර් 77.5ක් වැලි මුද්‍රිත තාර ආලේපනය/ මතුපිට නැවත සකස් කිරීම / ඉරිතැලීම් මුද්‍රා තැබීම සිදු කර ඇත.



මාර්ග ප්‍රතිසංස්කරණය/ පුළුල් කිරීම සහ වැඩිදියුණු කිරීම

මාර්ග ජාලය සේවා තත්ත්වයෙන් පවත්වා ගැනීම සඳහා මාර්ග පුනරුත්ථාපනය එකසේ වැදගත්ය. පුනරුත්ථාපනය, නොවැළැක්විය හැකි සේවා තත්ත්වය හා ප්‍රවාහනය බිඳ වැටීම් වළක්වමින් මාර්ගවල ප්‍රයෝජ්‍යවත් සේවා කාලය දිගු කිරීමට උපකාරී වේ. දීර්ඝ කාලයක් පැරණි මහාමාර්ගවලට අතිරේක ධාරිතාවක් එකතු කරමින්, වැඩි දියුණු කිරීමකින් තොරව හුදෙක් සාමාන්‍ය නඩත්තුව සිදු කිරීමෙන් අවශ්‍ය සංචලතාවය සාධනය කිරීමට එතරම් දායක නොවේ. මාර්ග ජාලය තුළ අපේක්ෂිත සංචලතාව ළඟා කර ගැනීම සඳහා අවධානය යොමු කළ යුතු ප්‍රධාන සාධක වන්නේ ධාරිතාව, ධාවන තත්ත්වය මාර්ග ආරක්ෂාව සහ රථවාහන කළමනාකරණයයි. 2021 වර්ෂය තුළ ජාතික මාර්ග කිලෝමීටර් 280ක් පමණ සහ මාර්ග සංවර්ධන අධිකාරියේ නොවන /ග්‍රාමීය මාර්ග කිලෝමීටර් 4,580ක් ප්‍රතිසංස්කරණය කර වැඩිදියුණු කර ඇත.



අධිවේගී මාර්ග ඉදිකිරීම

අනාගත රථවාහන ඉල්ලුමට සහ සංවර්ධන කටයුතුවලට සරිලන පරිදි සියලුම වැදගත් භූමි තීරයන්, ආවරණය වන පරිදි ශ්‍රී ලංකාවේ අධිවේගී මාර්ග ජාලය හඳුනාගෙන ඇත. 2021 වර්ෂය ආරම්භයේදී දිග කිලෝමීටර් 271.7 ක් වූ අධිවේගී මාර්ග ක්‍රියාත්මක විය. මධ්‍යම අධිවේගී මාර්ගය කඩවත සිට දඹුල්ල දක්වා, කුරුණෑගල හරහා පොතුහැර සිට ගලගෙදරට සම්බන්ධ කිරීමට සැලසුම් කර ඇත. කඩවත සිට මීරිගම දක්වා කොටසේ ඉදිකිරීම් කටයුතු සිදුවෙමින් පවතී. මීරිගම-කුරුණෑගල කොටස 2021 දී නිම කරන ලද අතර 2022 ජනවාරි මස මෙහෙයුම් ආරම්භ කරන ලදී.

ආදායම් රැස් කිරීම

උපදේශන සේවා සැපයීම, සැලසුම් කිරීම සහ ක්ෂේත්‍ර හා රසායනාගාර පරීක්ෂණ පැවැත්වීම මඟින් උපදේශන ගාස්තු ලෙස මාර්ග සංවර්ධන අධිකාරිය ආදායම් උපයා ගනී. තවද, අධිවේගී මාර්ග ගාස්තු සහ සාප්පු සංකීර්ණ, මාර්ග පුවරු, විවේක උද්‍යාන කුලියට දීම ආදී වක්කම්වලින් සහ ඊට අමතරව බස් නැවතුම්පොළවල්, රූපවාහිනී රැහැන් කණු, ප්‍රචාරණ පුවරු, ලොතරැයි කුටි සහ අනවසර පුවරුවලින් ලැබෙන දඩ මුදල් ආදියෙන්ද ආදායම් උපයා ගනී.

මූල්‍ය කාර්යසාධනය

2021 වර්ෂය සඳහා දේශීය හා විදේශීය අරමුදල් ඇතුළු සමස්ත අරමුදල් ප්‍රතිපාදන රු. මිලියන 358.15 වන අතර වියදම රු.මිලියන 211.32 කි.

වගුව 2: අරමුදල් මූලාශ්‍රය මත පදනම් වූ මූල්‍ය කාර්ය සාධනය.

අරමුදල් මූලාශ්‍රය	ප්‍රතිපාදන (රු.මිලියන)	වියදම (රු.මිලියන)
දේශීය අරමුදල්	202,255.36	98,928.14
විදේශ ණය	135,144.84	94,381.58
ප්‍රතිපූර්ණ විදේශ ණය	100.00	97.00
විදේශ මුදල් ආශ්‍රිත පිරිවැය	18,825.02	16,091.76
විදේශ මූල්‍යයනයට සම්බන්ධිත දේශීය සම මූල්‍යයනය	1,825.32	1,825.32
එකතුව	**358,150.54**	**211,323.79**



සිතියම 3: ශ්‍රී ලංකාවේ අධිවේගී මාර්ග ජාලය

මාර්ග සංවර්ධන අධිකාරිය

මාර්ග සංවර්ධන අධිකාරිය 1981 අංක 73 දරණ මාර්ග සංවර්ධන අධිකාරී පනත මඟින්, ව්‍යවස්ථාපිත ආයතනයක් වශයෙන් සංස්ථාපිත කරන ලද අතර 1986 වර්ෂයේ දී මහාමාර්ග දෙපාර්තමේන්තුවේ අනුප්‍රාප්තික ආයතනය බවට පත් විය. එතැන් පටන්, මාර්ග සංවර්ධන අධිකාරිය ජාතික මාර්ග ජාලය නඩත්තු කිරීමේ හා තත්ත්වය නැංවීම සඳහා වගකිව යුතු ආයතනයක් බවට පත් විය.
මාර්ග සංවර්ධන අධිකාරිය මහාමාර්ග හා මාර්ග සංවර්ධන අමාත්‍යාංශය යටතේ, පවතින ආයතනවලින් එකක් වන අතර, එය ශ්‍රී ලංකාවේ මහාමාර්ග අංශයේ ප්‍රමුඛතම ආයතනයයි. අමාත්‍යාංශය මහාමාර්ග අංශයට සම්බන්ධ විෂයන් ආවරණය කරමින්, ප්‍රතිපත්ති හා වැඩසටහන් සම්පාදනය කිරීමේ වගකීම දරනු ලබයි.

මාර්ග සංවර්ධන අධිකාරිය යනු රටේ ප්‍රමුඛතම මහාමාර්ග අධිකාරිය වන අතර, A පන්තියේ මාර්ග, ප්‍රධාන (B පන්තිය) මාර්ග සහ අධිවේගී මාර්ගවලින් සමන්විත ජාතික මාහාමාර්ග ජාලය නඩත්තු කිරීම සහ සංවර්ධනය කිරීම සඳහා මෙන්ම පවතින ජාතික මාර්ග පද්ධතිය වැඩිදියුණු කිරීම සඳහා නව මහාමාර්ග, පාලම් සහ අධිවේගී මාර්ග සැලසුම් කිරීම, නිර්මාණය කිරීම සහ ඉදි කිරීම සඳහා වගකීම දරයි.

ජාතික මහාමාර්ග ජාලය 2021 වර්ෂය අවසන් වන විට අධිවේගී මාර්ග කිලෝමීටර් 312.6ක් සහ පාලම 4,250ක් ඇතුළුව මාර්ග කිලෝමීටර් 12,496.3කින් සමන්විත විය.

මාර්ග සංවර්ධන අධිකාරියේ කළමනාකරණය

මාර්ග සංවර්ධන අධිකාරියේ කළමනාකාරිත්වය ක්‍රියාත්මක කරනු ලබන්නේ මහාමාර්ග කටයුතු භාර ගරු අමාත්‍යතුමා විසින් පත් කරන ලද කළමනාකාරිත්ව මණ්ඩලයක් විසිනි. කළමනාකාරිත්ව මණ්ඩලය රටේ ජාතික මහාමාර්ග ජාලය සංවර්ධනය කිරීමේ රාජ්‍ය ප්‍රතිපත්තිය ක්‍රියාත්මක කිරීම සඳහා අමාත්‍යවරයාට වග කියනු ලබයි.

2021 වර්ෂයේ දී අධ්‍යක්ෂ මණ්ඩල රැස්වීම් දොළහක් පැවැත්වූ අතර, කළමනාකරණ මණ්ඩලය පහත සඳහන් පරිදි පහත සඳහන් සාමාජිකයින්ගෙන් සමන්විත විය.

2021 වර්ෂය සඳහා මාර්ග සංවර්ධන අධිකාරියේ කළමනාකරණ මණ්ඩලය

සභාපති : සී.පී.අතුළුවගේ

පත්කළ සාමාජිකයන් :

- බී.එම්.සී.කේ.බස්නායක
- ක්‍රිෂාන්ත කපුවත්ත
- සී.පී.රත්වත්තේ
- එස්.යෙහිය
- ආචාර්ය අයි. ඩී. එම්. රත්නායක
- ආචාර්ය ජී.ඒ.ජේ.එස්.බණ්ඩාර

හිටපු නිල සාමාජිකයන් :

- ඊ.ඒ.ආර්.රේණුකා
- පී.රණවීර
- ඩී.පී.වික්‍රමසිංහ
- එම්.ආර්.ජී.ඒ.බී.මුතුකුඩේ
- ඩබ්ලිව්.එච්.කේ.ඩී.බී.රත්නායක
- එච්. ජයසිංහ
- ටී.විජේතුංග

දැක්ම

තිරසාරව සංවර්ධිත ශ්‍රී ලංකාවක්

අපගේ මෙහෙවර

මාර්ග අංශයේ ප්‍රමුඛතම ජාතික ආයතනය වශයෙන් ජාතික සමාජීය ආර්ථික සංවර්ධනය සඳහා මහ පාදමින් මහජනයා හා භාණ්ඩ ප්‍රවාහනය සඳහා පිළිගත හැකි මට්ටමෙන් ආරක්ෂාව හා පහසුව සහිත පරිසර හිතකාමී අයුරින්, සංචලතාවය හා ප්‍රවේශය සහතික කිරීම සඳහා ප්‍රමාණවත් හා කාර්යක්ෂම ජාතික මහාමාර්ග පද්ධතියක් සැපයීම.

ඉලක්ක හා අරමුණු

- ප්‍රමාණවත් ජාතික මහාමාර්ග ජාලයක් සාධනය කිරීම;
- පිළිගත හැකි තත්ත්වයෙන් මාර්ග නඩත්තු කිරීම මඟින්, ජාතික මහාමාර්ග පද්ධතියේ පිළිගත හැකි තත්ත්වයෙන් සංචලතා මට්ටම සාධනය කිරීම;
- අධි සංචලතා අධිවේගී මාර්ග ජාලයක් සැපයීම;
- මාර්ග භාවිතකරුවන්ගේ පිරිවැය අඩු කිරීමට පියවර ගැනීම;
- ජාතික මහාමාර්ග ජාලය තුළ මාර්ග ආරක්ෂාව වැඩිදියුණු කිරීම;
- සියලුම කාර්යයන්වලදී පරිසර ආරක්ෂාව සහතික කිරීම;
- කාර්යක්ෂමව වත්කම් හා ආයෝජන උපයෝගිතාව සහතික කිරීම;
- මාර්ග සංවර්ධන අධිකාරියේ සමස්ත කාර්ය සාධනය වැඩි දියුණු කිරීම සඳහා ආයතනමය සංවර්ධනය ප්‍රවර්ධනය කිරීම;
- දේශීය මාර්ග ඉදිකිරීම් කර්මාන්ත සංවර්ධනය සඳහා සහාය වීම.

ආයතනික ව්‍යුහය

මාර්ග සංවර්ධන අධිකාරිය; මහාමාර්ග හා පාලම් සැලසුම්කරණය, සැලසුම් නිර්මාණය, ඉදිකිරීම, නඩත්තුව හා මහාමාර්ග ආරක්ෂාව පිළිබඳව විශේෂිත කුසලතා සහිත ප්‍රධාන සිවිල් ඉංජිනේරුමය ආයතනයකි. එහි ආයතනික ව්‍යුහය මාර්ග සංවර්ධන අධිකාරිය වෙත පවරන ලද කාර්යයන් කිරීමට හා එහි ඉලක්ක හා අරමුණු ඉටු කිරීම සඳහා සැලසුම් කර තිබේ.

මාර්ග සංවර්ධන අධිකාරියේ කළමනාකාරිත්ව මණ්ඩලය යටතේ පවතින අතර ප්‍රධාන විධායක නිලධාරී වන්නේ අධ්‍යක්ෂ ජනරාල්වරයායි. ආයතනික ව්‍යුහය තුළ අධ්‍යක්ෂ ජනරාල්වරයාට විවිධ කාර්යයන් ඉටු කිරීම සඳහා අතිරේක අධ්‍යක්ෂ ජනරාල්වරුන් 5 දෙනෙකු සහ අධ්‍යක්ෂවරුන් 20 දෙනෙකු සහාය වේ.

ඊට අමතරව, මහාමාර්ග අමාත්‍යාංශය යටතේ වන ව්‍යාපෘති කළමනාකරණ ඒකක හාර ව්‍යාපෘති අධ්‍යක්ෂවරුන් 19 දෙනෙකු අධ්‍යක්ෂ ජනරාල් මඟින් මඟින් මාර්ග සංවර්ධන අධිකාරියට සම්බන්ධව සිටිති. මාර්ග සංවර්ධන අධිකාරියේ ආයතන සටහන රූප සටහන් අංක 1 දැක්වේ.

මාර්ග සංවර්ධන අධිකාරියේ සේවකයන්

මාර්ග සංවර්ධන අධිකාරියේ විවිධ සේවා වර්ගයන් යටතේ අනුමත සමස්ත සේවක සංඛ්‍යාව පහත දැක්වෙන වගුවේ දැක්වේ.

වගුව 3: මාර්ග සංවර්ධන අධිකාරියේ අනුමත සේවක සංඛ්‍යාවේ සාරාංශය

අංකය	සේවක වර්ගය	අනුමත සේවක සංඛ්‍යාව	
		ස්ථිර	කොන්ත්‍රාත්
1	ජ්‍යෙෂ්ඨ කළමනාකරණ සේවය	88	019
2	ඉංජිනේරු සේවය	777	35
3	පරිපාලන නිලධාරී සේවය	19	0
4	තොරතුරු තාක්ෂණ සේවය	19	1
5	ගණකාධිකාරී සේවය	31	4
6	නීති නිලධාරී සේවය	6	0
7	කණිෂ්ඨ පරිපාලන සේවය	47	1
8	ගිණුම්/විගණන සහකාර සේවය	70	2
9	ආශ්‍රිත නිලධාරී සේවය	78	0
10	තාක්ෂණික සේවය - I	103	0
11	තාක්ෂණික සේවය - II	1145	54
12	ලිපිකරු හා සමාන්තර සේවය	2266	112
13	සහාය කාර්ය මණ්ඩලය	2604	0
උප එකතුව		**7253**	**209**
14	කම්කරු (ස්ථිර)	4,024	0
15	කම්කරු (අනියම්)		
එකතුව		**11,277**	**209**

කාර්ය අංශයන්

මාර්ග සංවර්ධන අධිකාරියේ ආයතන ව්‍යුහය තුළ කාර්ය අංශ 20ක් පවතින අතර, සෑම අංශයක්ම අධ්‍යක්ෂවරයෙකුගේ ප්‍රධානත්වයෙන් පාලනය වේ. සියලුම අංශවල අධ්‍යක්ෂවරුන් පහත දැක්වෙන විස්තර වලට අනුව, අතිරේක අධ්‍යක්ෂවරුන්ට, අධ්‍යක්ෂ ජනරාල්වරයාට හෝ සෘජුවම සභාපතිවරයාට වාර්තා කරනු ලබයි;

අභ්‍යන්තර විගණන අංශයේ අධ්‍යක්ෂවරයා සෘජුවම සභාපතිවරයාට වාර්තා කරයි. අධ්‍යක්ෂ (*නීති අංශය*) සහ අධ්‍යක්ෂ (*නත්ත්ව සහතික හා ප්‍රගති සමාලෝචන අංශය*) සෘජුවම අධ්‍යක්ෂ ජනරාල් වෙත වාර්තා කරයි.

පහත සඳහන් අංශ හතේ අධ්‍යක්ෂවරුන් අතිරේක අධ්‍යක්ෂ ජනරාල් (වත්කම් මෙහෙයුම් සහ කළමනාකරණය) වෙත සෘජුවම වාර්තා කරයි.

ඉදිකිරීම් අංශය

නඩත්තු කළමනාකරණ අංශය

වත්කම් කළමනාකරණ හා ආදායම් අංශය

ග්‍රාමීය පාලම් ඉදිකිරීම් ඒකකය

ප්‍රසම්පාදන අංශය

යාන්ත්‍රික අංශය

අධිවේගී මාර්ග මෙහෙයුම්, නඩත්තු හා කළමනාකරණ අංශය

පහත සඳහන් අංශ හතරේ අධ්‍යක්ෂවරුන් අතිරේක අධ්‍යක්ෂ ජනරාල් (ඉදිකිරීම් සැලසුම්) වෙත සෘජුවම වාර්තා කරනු ලැබේ.

මහාමාර්ග සැලසුම් අංශය

ඉංජිනේරු සේවා අංශය

පර්යේෂණ හා සංවර්ධන අංශය

පාරිසරික හා සමාජ සංවර්ධන අංශය

පහත සඳහන් අංශ හතර පිළිබඳව අධ්‍යක්ෂවරුන් අතිරේක අධ්‍යක්ෂ ජනරාල් (ජාල සැපයුම්)වෙත සෘජුවම වාර්තා කරනු ලබයි.

සැලසුම් අංශය

ඉඩම් අංශය

පුහුණු අංශය

යටිතල පහසුකම්, මාර්ග ආරක්ෂාව සහ රථවාහන කළමනාකරණ අංශය

පහත සඳහන් අංශ දෙක අතිරේක අධ්‍යක්ෂ ජනරාල් (පරිපාලන හා මුදල්) යටතේ පවතී.

පරිපාලන අංශය

මුදල් අංශය

අතිරේක අධ්‍යක්ෂ ජනරාල්වරයෙක් (පරිපාලන හා මුදල්) තවමත් පත් කර නොමැති බැවින්, මෙම අංශවල අධ්‍යක්ෂවරුන් සෘජුවම අධ්‍යක්ෂ ජනරාල්වරයා වෙත වාර්තා කරයි.

ව්‍යාපෘති කළමනාකරණ ඒකක

විදේශ අරමුදල් සහිත ව්‍යාපෘති සියල්ලම පාහේ ව්‍යාපෘති කළමනාකරණ ඒකක (PMUs) විසින් මෙහෙයවනු ලබන අතර, ඒවා මහාමාර්ග අමාත්‍යාංශය යටතේ ස්වාධීන ව්‍යාපෘති කළමනාකරණ ඒකක ලෙස ක්‍රියාත්මක වේ. 2021 දී, පහත සඳහන් ව්‍යාපෘති සඳහා ව්‍යාපෘති කළමනාකරණ ඒකක ක්‍රියාත්මක වෙමින් පැවතුණි;

1. මධ්‍යම අධිවේගී මාර්ග ව්‍යාපෘතිය 1 කොටස (CEP 1)
2. මධ්‍යම අධිවේගී මාර්ග ව්‍යාපෘතිය 2 කොටස (CEP 2)
3. මධ්‍යම අධිවේගී මාර්ග ව්‍යාපෘතිය 3 කොටස (CEP 3)
4. මධ්‍යම අධිවේගී මාර්ග ව්‍යාපෘතිය 4 කොටස (CEP 4)
5. රුවන්පුර අධිවේගී මාර්ග ව්‍යාපෘතිය (REP)
6. කුළුණු මත ඉදිවන වරාය ප්‍රවේශ මහාමාර්ග ව්‍යාපෘතිය
7. නව කැළණි පාලම සිට අතුරුගිරිය දක්වා කුළුණු මත ඉදිවන මහාමාර්ග ව්‍යාපෘතිය
7. විවිධ විදේශ ආධාර ව්‍යාපෘතිය (MFAP)
8. දක්ෂිණ මාර්ග සම්බන්ධතා පිළිබඳ ව්‍යාපෘතිය (SRCP)
9. විශේෂ ව්‍යාපෘති කළමනාකරණ ඒකකය (SPMU)
10. ප්‍රවාහන සම්බන්ධතා හා වත්කම් කළමනාකරණය පිළිබඳ ව්‍යාපෘති (TCAMP)
11. දේශීය බැංකු අරමුදල් සහ ග්‍රාමීය මාර්ග ව්‍යාපෘතිය
12. බදුල්ල - චෙන්කලඩි මාර්ග වැඩිදියුණු කිරීමේ ව්‍යාපෘතිය (BCRIP)
13. කැළණි ගඟ හරහා නව පාලම ඉදිකිරීමේ ව්‍යාපෘතිය (NKBP)
14 චීන එක්සිම් බැංකුවේ (හුනාන් ශාඛාව) අරමුදල් සහිත ව්‍යාපෘතිය
15. ඒකාබද්ධ මාර්ග ආයෝජන වැඩසටහන (i-Road) ව්‍යාපෘතිය (I සහ II)
16. නායයෑම් ආපදා ආරක්ෂණ ව්‍යාපෘතිය
17. නව කැලණි පාලමේ සිට අතුරුගිරිය දක්වා අධිවේගී මාර්ග ව්‍යාපෘතිය
18. මහනුවර උමං මාර්ග ඉදිකිරීමේ ව්‍යාපෘතිය
19. මාර්ග සම්බන්ධතා සහ සංවර්ධන ව්‍යාපෘතිය (ICDP)

මෙම ව්‍යාපෘති කළමනාකරණ ඒකක විසින් මහාමාර්ග හා මාර්ග සංවර්ධන අමාත්‍යාංශයට සහ මාර්ග සංවර්ධන අධිකාරිය වෙත වගකිව යුතු ස්වාධීන ගිණුම් ඒකක පවත්වා ගෙන යනු ලබයි. මාර්ග සංවර්ධන අධිකාරියේ මට්ටමින් මෙකී ව්‍යාපෘතිවල කටයුතු අතිරේක අධ්‍යක්ෂ ජනරාල් (ව්‍යාපෘති) විසින් සම්බන්ධීකරණය කරනු ලබයි. මාර්ග සංවර්ධන අධිකාරියේ ව්‍යාපෘති කළමනාකරණ ඒකකවල ආයතනික සටහන රූප සටහන 2 හි දක්වා ඇත.

පළාත් සංවිධාන ව්‍යුහය

පළාත් සංවිධාන ව්‍යුහය යටතේ පළාත්භාර අධ්‍යක්ෂවරුන් 10 දෙනෙකු වන අතර ඔවුන් අධ්‍යක්ෂ නඩත්තු කළමනාකරණ වෙත වාර්තා කරනු ලැබේ. නැගෙනහිර පළාත කලාප දෙකකට බෙදා ඇති හෙයින් එක් පළාත්භාර අධ්‍යක්ෂවරයෙකු මඩකලපුවට වන අතර අනෙක් අධ්‍යක්ෂවරයා අක්කරෙයිපත්තුවේ සිටී. සෑම පළාත්භාර අධ්‍යක්ෂවරයෙකු යටතේම දිස්ත්‍රික්කයක් වෙනුවෙන් ප්‍රධාන ඉංජිනේරුවරයෙකු සිටින අතර, සෑම කොට්ඨාශයක් සඳහාම විධායක ඉංජිනේරුවරයෙකු වේ. පළාත්භාර අධ්‍යක්ෂවරුන්, ප්‍රධාන ඉංජිනේරුවරුන්ට සහාය වීම සඳහා කොට්ඨාශය තුළ A සහ B පන්තියේ මාර්ග ජාලයේ දිග ප්‍රමාණය අනුව පත් කරන ලද වෙනත් ඉංජිනේරුවන් හා කාර්මික නිලධාරීන් ද වේ.


ছাত্রাবাস ব্যবস্থাপনা কমিটি (ছাত্রাবাস)
ছাত্রাবাস পরিচালক (আবাসিক শিক্ষক)
হাউস টিউটর (ব্লক)
হাউস টিউটর (ব্লক)
হাউস টিউটর (ব্লক)
হাউস টিউটর (ব্লক)
হাউস টিউটর (ব্লক)
হাউস টিউটর (ব্লক)
ছাত্রাবাস পরিচালক সহকারী (আবাসিক শিক্ষ



කෙටි යෙදුම්

ADG	-	අතිරේක අධ්‍යක්ෂ ජනරාල්
PD	-	ව්‍යාපෘති අධ්‍යක්ෂ
NKBP	-	කැළණි ගඟ හරහා නව කැළණි පාලම ඉදිකිරීමේ ව්‍යාපෘතිය
LDPP	-	නාය යෑම් ආපදා ආරක්ෂණ ව්‍යාපෘතිය
CEP	-	ප්‍රමුඛතා මාර්ග ව්‍යාපෘතිය
CRIP	-	දේශගුණික ප්‍රත්‍යස්ථිතිය වැඩි දියුණු කිරීමේ ව්‍යාපෘතිය
EHP	-	කුඑණු මත මහාමාර්ග ව්‍යාපෘතිය (නව කැළණි පාලමේ සිට අතුරුගිරිය දක්වා)
iROAD	-	කුඑණු මත මහාමාර්ග ව්‍යාපෘතිය
MFAP	-	විවිධ විදේශාධාර ව්‍යාපෘතිය
NHSP	-	දක්ෂිණ මාර්ග සම්බන්ධතා ව්‍යාපෘතිය
OCH	-	පිටත වටරවුම් මහාමාර්ග ව්‍යාපෘතිය
BCRIP	-	බදුල්ල - වෙන්කලඩි මාර්ගය වැඩිදියුණු කිරීමේ ව්‍යාපෘතිය
REP	-	රුවන්පුර අධිවේගී මාර්ගය
SPM	-	විශේෂ ව්‍යාපෘති කළමනාකරණ ඒකකය
TCAMP	-	ප්‍රවාහන සම්බන්ධතා හා වත්කම් කළමනාකරණ ව්‍යාපෘතිය
LBF&RRP	-	දේශීය බැංකු අරමුදල් සහ ග්‍රාමීය මාර්ග ව්‍යාපෘති
PAEH	-	චරාය ප්‍රවේශ කුලුනු මත ඉදිවන මහාමාර්ගය
CExBHFP	-	චීන එක්ස්ඕම් බැංකුව(හුනාන් ශාඛාව)අරමුදල් යෙදවූ ව්‍යාපෘතිය
KTCP	-	මහනුවර උමං මාර්ග ඉදිකිරීම් ව්‍යාපෘතිය
ICDP	-	සම්බන්ධතා සහ සංවර්ධන ව්‍යාපෘතිය

රූප සටහන 2 : මාර්ග සංවර්ධන අධිකාරියේ ව්‍යාපෘති කළමනාකරණ ඒකකයේ සංවිධාන සටහන





2021 වර්ෂයේ මාර්ග සංවර්ධන අධිකාරියේ කාර්ය සාධනය







අ. ක්‍රියාකාරී අංශ සහ දේශීය අරමුදල් සහිත ව්‍යාපෘතිවල කාර්ය සාධනය

1. මාර්ග නඩත්තුව ක්‍රියාත්මක කිරීම

මාර්ග නඩත්තුව මාර්ග සංවර්ධන අධිකාරියේ නඩත්තු කළමනාකරණ අංශය විසින් ක්‍රියාත්මක කෙරේ. අධ්‍යක්ෂ (නඩත්තු කළමනාකරණය) විසින් නියෝජ්‍ය අධ්‍යක්ෂවරුන්ගේ සහාය ඇතිව පළාත් අධ්‍යක්ෂවරුන්ගේ වැඩ කටයුතු මෙහෙයවීම හා සම්බන්ධීකරණය කිරීම සිදු කරනු ලැබේ.

ජාතික මාර්ග ජාලයේ ගුණාත්මකභාවය පවත්වා ගැනීම සහ වැඩිදියුණු කිරීම සඳහා නඩත්තු කළමනාකරණ අංශය පහත සඳහන් ප්‍රධාන ක්‍රියාකාරකම් ක්‍රියාත්මක කරයි.

- සාමාන්‍ය / පුනරාවර්තන නඩත්තුව (විදේශ අරමුදල් යටතේ පුනරුත්ථාපනය කරන ලද මාර්ග නඩත්තු කිරීම)
- වාරික නඩත්තුව (මතුපිට යෙදුම / සුළු වැඩිදියුණු කිරීම)
- ව්‍යුහය වැඩිදියුණු කිරීම (පාලම්, බෝක්කු, ජලාපවහන)
- විදුලි පහන්, සංඥා පහන් නඩත්තුව, මාර්ග සලකුණු කිරීම සහ මාර්ග භාණ්ඩ ස්ථාපනය කිරීම
- හදිසි වැඩ / ආපදා වැඩ
- තොටුපලවල් ක්‍රියාත්මක කිරීම හා නඩත්තු කිරීම

වගුව 4: 2021 දී කලින් කල සිදු කරන නඩත්තු කිරීම්, මාර්ග මතුපිට සකස් කිරීම සහ වැලි මුද්‍රිත තාර ආලේපනය කිරීමේ ප්‍රගතිය

පළාත	වැලි මුද්‍රිත තාර ආලේප කිරීම/ පිළිසකර කිරීම (කි.මී)	තාර ආලේප කිරීම (කි.මී)
බස්නාහිර පළාත	15.85	-
මධ්‍යම පළාත	10.88	0.25
දකුණු පළාත	-	1.35
උතුරු පළාත	16.50	3.56
නැගෙනහිර පළාත	4.00	0
නැගෙනහිර පළාත (අඅජ – අක්කරෙයිපත්තුව)	-	3.70
වයඹ පළාත	-	-
උතුරුමැද පළාත	1.00	-
ඌව පළාත	12.58	2.15
සබරගමුව පළාත	1.83	3.88
එකතුව	**62.64**	**14.89**

වගුව 5: 2021 වසරේ මාර්ග නඩත්තු කටයුතුවල ප්‍රගතිය

විස්තරය			2021 වර්ෂය සඳහා ප්‍රතිපාදන (රු.මී)	2021 දෙසැම්බර් වන විට වියදම් (වගකීම් ඇතුළුව) රු.මී
ව්‍යාපෘතිය 01	-	දෛනික නඩත්තුව	3,110.00	1,115.80
ව්‍යාපෘතිය 02	-	කලින් කලට සිදු කරන නඩත්තු	2,430.00	496.80
ව්‍යාපෘතිය 03	-	ව්‍යුහය වැඩිදියුණු කිරීම (පාලම්, බෝක්කු, ජලාපවහන)	245.00	154.94
ව්‍යාපෘතිය 04	-	විදුලි පහන්, සංඥා ලාම්පු, මාර්ග සලකුණු නඩත්තු කිරීම සහ මාර්ග ගෘහ භාණ්ඩ සවි කිරීම	785.00	484.12

ව්‍යාපෘතිය 05 - හදිසි වැඩ / ආපදා කටයුතු	1,920.00	1972.14
ව්‍යාපෘතිය 06 - තොටුපොළ මෙහෙයවීම සහ නඩත්තු කිරීම	12.00	13.26
එකතුව	**8,502.00**	**4,237.06**

2. දේශීය අරමුදල් යටතේ මාර්ග පුළුල් කිරීම

(i) ශ්‍රී ලංකා රජයේ අරමුදල් යටතේ මාර්ග පුළුල් කිරීම සහ වැඩිදියුණු කිරීම

ජාතික මාර්ග, ප්‍රධාන මාර්ග සහ අවධානය අවශ්‍ය නමුත් දේශීය අරමුදල් යටතේ පුළුල් කිරීමේ සහ වැඩිදියුණු කිරීමේ වැඩසටහන යටතේ පරිත්‍යාගශීලීන්ගේ අරමුදල් සඳහා ඉදිරිපත් කළ නොහැකි කුඩා මාර්ග කොටස් සම්බන්ධ කරන වැදගත් සම්බන්ධක මාර්ග පුළුල් කිරීම සහ වැඩිදියුණු කිරීම මෙම අංශය විසින් සිදු කරයි. අවශ්‍යතා අනුව, කුඩා දුර්වල පාලම් පුනරුත්ථාපනය කිරීම සහ ප්‍රතිසංස්කරණය කිරීම ද මෙම වැඩසටහන යටතේ සිදු කෙරේ. තවද 2021 වර්ෂයේදී රජයේ ප්‍රතිපත්ති රාමුව යටතේ කිලෝමීටර් 100,000 විකල්ප මාර්ග පද්ධතිය යටතේ තෝරාගත් ව්‍යාපෘති ක්‍රියාත්මක කිරීමද සිදු කරන ලදී.

මෙම අංශය ඉහත ව්‍යාපෘතිවලට අදාළ සියලුම ප්‍රසම්පාදන කටයුතු සිදු කරයි. පුර්ව ඉදිකිරීම් අදියරේ දී ටෙන්ඩර් ලේඛන පිළියෙළ කිරීම, ලංසු ආරාධනය කිරීම සඳහා පුවත්පත් දැන්වීම් පළ කිරීම, ලංසු විවෘත කිරීම හා පිළිගැනීමේ ලිපිය නිකුත් කිරීම ක්‍රියාත්මක කරන අතර, පශ්චාත් ඉදිකිරීම් අදියරේ දී අධ්‍යක්ෂ ඉදිකිරීම් විසින්, මූල්‍ය හා භෞතික ප්‍රගතිය ආවේක්ෂණය, වැඩබිම් කටයුතු පරීක්ෂාව, සම්ක්කරණය හා වැඩබිම් කටයුතු සඳහා උපදෙස් දීම මඟින් ගෙවීම් සහතික, කොන්ත්‍රාත් විචලනයන්, කල් දිගු කිරීම, මිල උච්චාවචනයන් අත්හිටුවීම (ප්‍රගතිය නොමැති අවස්ථාවල) ආදිය සඳහා අනුමැතිය නිර්දේශ කිරීම හෝ සේව්‍යයා (අධ්‍යක්ෂ ජනරාල්, මාර්ග සංවර්ධන අධිකාරිය) වෙත පහසුකම් සපයනු ලබයි. ඉහත කී ක්‍රියාකාරකම් වලට අමතරව, කොන්ත්‍රාත්තුවේ ඉංජිනේරුවරයා ලෙස ව්‍යාපෘති කිහිපයක සෘජු අධීක්ෂණය සිදු කරනු ලැබේ.

2021 වසර තුළ කිලෝමීටර් 68.65ක් පුළුල් කිරීම සහ වැඩිදියුණු කිරීම අවසන් කර ඇති අතර 2021 වසර අවසන් වන විට කිලෝමීටර් 67.05ක කටයුතු ක්‍රියාත්මක වෙමින් පැවතුණි.

වගුව 6: 2021 වර්ෂය තුළ ක්‍රියාත්මක කරන ලද පුළුල් කිරීම් හා වැඩි දියුණු කිරීමේ මාර්ග ව්‍යාපෘති

පළාත	දිස්ත්‍රික්කය	2021 වර්ෂය සඳහා ප්‍රතිපාදන (රු. මිලියන)	2021 වර්ෂය සඳහා වියදම (රු. මිලියන)	2021 දී ප්‍රදානය කරන ලද ව්‍යාපෘති		2021 අවසන් වන විට සම්පූර්ණ කළ ව්‍යාපෘති		2021 තුළ ක්‍රියාත්මක වෙමින් පැවති	
				ව්‍යාපෘති ගණන	දිග /කි.මී.	ව්‍යාපෘති ගණන	දිග /කි.මී.	ව්‍යාපෘති ගණන	දිග /කි.මී.
බස්නාහිර පළාත	කොළඹ	850.00	673.97	1	-	4	3.30	23.00	3.95
	ගම්පහ	500.00	310.07	4	2.55	-	5.30	17.00	14.09
	කළුතර	250.00	83.80	-	-	1	1.00	10.00	3.00
මධ්‍යම පළාත	නුවර	450.00	90.25	-	-	8	18.58	5.00	1.00
	මාතලේ	350.00	10.98	2	0.80	2	0.53	3.00	0.63
	නුවරඑලිය	260.00	2.43	-	-	6	-	4.00	-
දකුණු පළාත	මාතර	300.00	87.92	-	-	6	9.68	4.00	6.87
	ගාල්ල	300.00	53.34	-	-	-	-	2.00	1.00
	හම්බන්තොට	300.00	77.77	-	-	1	-	2.00	3.40
උතුරු පළාත	යාපනය	250.00	206.78	-	-	-	-	7.00	4.00
	කිලිනොච්චි	200.00	154.10	-	-	-	-	4.00	1.73
	මන්නාරම	90.00	-	-	-	-	-	3.00	3.20
	වවුනියාව	200.00	44.12	-	-	-	-	3.00	1.95
	මුලතිවු	200.00	17.20	-	-	-	-	5.00	1.45
නැගෙනහිර පළාත	මඩකලපුව	200.00	92.54	-	-	1	1.54	4.00	0.42
	අම්පාර	200.00	43.98	1	2.95	1	1.46	1.00	-
	ත්‍රිකුණාමලය	200.00	9.70	-	-	-	0.55	1.00	2.06
වයඹ පළාත	කුරුණෑගල	350.00	278.27	-	-	1	15.65	5.00	1.65
	පුත්තලම	250.00	53.49	-	-	2	2.00	-	-
උතුරු මැද පළාත	අනුරාධපුර	300.00	136.05	1	2.60	-	5.00	3.00	5.00
	පොලොන්නරුව	110.00	5.04	-	-	-	-	-	-
ඌව පළාත	බදුල්ල	250.00	57.94	-	-	4	1.63	-	-
	මොණරාගල	180.00	66.87	-	-	1	-	6.00	3.06
සබරගමුව පළාත	කෑගල්ල	260.00	41.64	2	-	2	0.74	3.00	3.74
	රත්නපුර	200.00	56.84	1	1.00	-	1.69	8.00	4.85
ජාතික ඉතිරිකිරීමේ බැංකුවේ (NSB) අරමුදල් සහිත ව්‍යාපෘති		500.00	488.09						
බදු සංරචකය		600	162.61						
	එකතුව	**8,100.00**	**3,305.79**	**12**	**9.90**	**40**	**68.65**	**123**	**67.05**

(ii) දේශීය බැංකු අරමුදල් සහ ග්‍රාමීය මාර්ග ව්‍යාපෘතිය- ප්‍රධාන මාර්ග සහ අධිවේගී මාර්ග වෙත ප්‍රවේශ වීමට විකල්ප මාර්ග සංවර්ධනය කිරීම

ජාතික ප්‍රතිපත්ති රාමුව මඟින් ප්‍රධාන මාර්ග සහ අධිවේගී මාර්ග සඳහා ඉහළ මට්ටමේ ප්‍රවේශයක් සඳහා විකල්ප මාර්ග පද්ධතියක් සංවර්ධනය කිරීමට බලාපොරොත්තු විය. මේ සම්බන්ධයෙන් අමාත්‍ය මණ්ඩලය විසින් 2019/12/18 දිනැති අංක 19/3398/221/001 දරන සංදේශයක් මගින් කිලෝමීටර් 100,000 විකල්ප මාර්ග පද්ධතිය පුනරුත්ථාපනය කිරීම/ වැඩිදියුණු කිරීම ක්‍රියාත්මක කිරීමට අනුමැතිය ලබා දී ඇති අතර අංක 01/2020 දරන අමාත්‍ය මණ්ඩල සංදේශය 05/02/2020 දින අනුමත කරන ලදී.

මෙම වැඩසටහන 2020 අප්‍රේල් මස ආරම්භ කරන ලද අතර එය 2024 වන විට අවසන් කිරීමට බලාපොරොත්තු වේ. වැඩසටහන යටතේ C6 සිට CS2 දක්වා ඉදිකිරීම් කර්මාන්ත සංවර්ධන අධිකාරියේ (CIDA) ලියාපදිංචි වී ඇති දේශීය කොන්ත්‍රාත්කරුවන්ට කොන්ත්‍රාත් පැකේජ ප්‍රදානය කෙරේ. තවද, තත්ත්ව පාලන ක්‍රමය යටතේ C6 සිට C4 ශ්‍රේණිය සඳහා රුපියල් මිලියන 50 ට අඩු කොන්ත්‍රාත්තු ද, තත්ත්ව සහතික ක්‍රමය යටතේ C3 සහ ඊට වැඩි ශ්‍රේණි ඇති කොන්ත්‍රාත්කරුවන්ට රුපියල් මිලියන 250 සිට රුපියල් මිලියන 50 දක්වා වන කොන්ත්‍රාත්තු ද, ප්‍රදානය කිරීමට තීරණය කර ඇත. මෙම කොන්ත්‍රාත්තු SBD-04 ලේඛන අනුගමනය කරමින් ජාතික තරඟකාරී ලංසු පටිපාටිය යටතේ ටෙන්ඩර් කර ඇත. උපරිම වට්ටමක් ලබා දෙන කොන්ත්‍රාත්කරුවකු, ඔහුගේ අනෙකුත් සුදුසුකම් සෑහීමකට පත්වේ නම්, යම් පැකේජයක් සඳහා සාර්ථක ලංසුකරු ලෙස තෝරා ගනු ලැබේ.

මීට අමතරව, ව්‍යාපෘතිය යටතේ මාර්ග ඉදිකිරීම් වැඩ නියෝග නිකුත් කරමින් මග නැගුම මාර්ග ඉදිකිරීම් සහ උපකරණ සමාගමට වෙන් කර ඇති අතර, සමහර ඉදිකිරීම් ව්‍යාපෘති අධ්‍යක්ෂවරුන්, පළාත් අධ්‍යක්ෂවරුන් සහ ප්‍රධාන ඉංජිනේරුවන් යටතේ ඇති මාර්ග සංවර්ධන අධිකාරියේ බල ගිණුමෙන් සිදු කෙරේ.

මෙම කොන්ත්‍රාත්තු එකවර ගෙවීමේ පදනම (Lump Sum basis) මත ක්‍රියාත්මක වන අතර සිදු කරන ලද වැඩ සඳහා ගෙවීම් සිදු කරනු ලබන්නේ බිල්පත් කාලසීමාවන් තුළ එකඟ වූ කටයුතු සඳහා සිදු කරන ගෙවීමේ ක්‍රමය (milestone payments method) පදනම් කරගෙනය.

විෂය පථය සහ වගකීම්

රටේ සෑම ප්‍රදේශයකටම සම්බන්ධතාව වැඩිදියුණු කරමින් රටේ ආර්ථික සංවර්ධනය නංවාලීම සඳහා ඊට අදාළ අනෙකුත් ආයතනවල සහාය ඇතිව සෑම දිස්ත්‍රික්කයකම මහාමාර්ග අමාත්‍යාංශය විසින් මෙම වැඩසටහන ක්‍රියාත්මක කර ඇත.

මාර්ග තෝරා ගැනීමේ නිර්ණායක පදනම් වන්නේ බහුජන ප්‍රජාවන්ගේ, ප්‍රජා සංවිධානවල, මාර්ග ආශ්‍රිතව ජීවත් වන ජනතාව, ප්‍රාදේශීය සභා, නගර සභා, මහ නගර සභා, පළාත් සභා, පාර්ලිමේන්තු මන්ත්‍රීවරුන් සහ අදාළ ප්‍රදේශවල අනෙකුත් මහජන නියෝජිතයින්ගේ අවශ්‍යතා සහ ඉල්ලීම් මත ය. ඉල්ලීම්, කුසලතා සහ ඒ අනුව සිදු කරන ලද වැඩිදියුණු කිරීම්/පුනරුත්ථාපනය මත ප්‍රමුඛත්වය ලබා දී සලකා බලනු ලැබේ.

ග්‍රාමීය මාර්ග ජාලයේ වැඩිදියුණු කළ සංචලතාව හරහා ප්‍රජාවට අනෙකුත් ප්‍රදේශවලට ප්‍රවේශ වීමේ හැකියාව වැඩි කරයි, ව්‍යාපාරවල ශ්‍රම සංචිතය වැඩි කරයි, අවශ්‍ය ද්‍රව්‍ය හා සේවා ලබා ගැනීමට ඔවුන්ගෙන් වැය වන පිරිවැය අඩු කරයි, ඔවුන්ගේ විභව වෙළඳපල පුළුල් කරයි, එමඟින් රටේ ආර්ථිකයට ධනාත්මක බලපෑමක් ඇති කරයි.

වගුව 7: විකල්ප මාර්ග කිලෝමීටර 100,000ක සංවර්ධන ප්‍රගතිය සාරාංශය

ව්‍යිස්කරය	කැ.ඇ.ණ (රු.මි)	2020 අවසන් වන විට ප්‍රගතිය	2020 වර්ෂය තුළ වියදම් (රු. මි)	2021 අවසන් වන විට ප්‍රගතිය	2021 වර්ෂය තුළ වියදම් (රු. මි)	සටහන්
ප්‍රධාන මාර්ග සහ අධිවේගී මාර්ග වෙත ප්‍රවේශ වීමට විකල්ප මාර්ග කිලෝමීටර් 100,000ක් සංවර්ධනය කිරීම.	1,500,000	4.17%	2,979.85	19.24%	48,261.99	භාණ්ඩාගාර අරමුදල්
			16,133.05		45,417.25	ණය වලින්
එකතුව			**19,113.21**		**93,679.24**	

වර්ෂය තුළ ප්‍රගතියට ඇති වූ බාධා

වැඩසටහනේ ප්‍රගතියට කොවිඩ් -19 වසංගතයේ දෙවන සහ තුන්වන රැළි අහිතකර ලෙස බලපෑවේය. සේවකයින්ගේ සෞඛ්‍යය හා ආරක්ෂාව අවදානමට ලක් විය. කෙසේ වෙතත්, ඉදිකිරීම් කටයුතු 2020 වසරට වඩා ධනාත්මක ලෙස ප්‍රගතියක් ලබා ඇත.

ගෝලීය මෙන්ම දේශීය සැපයුම් දාමයන් බලපෑමට ලක්ව තිබූ අතර එහි ප්‍රතිඵලයක් ලෙස තාර, ප්‍රතිස්ථාපනය කිරීම් වැනි ඉදිකිරීම් ද්‍රව්‍ය සැපයීමේ හිඟයක් ඇති විය. එසේම ඉදිකිරීම් ද්‍රව්‍යවල මිල උච්චාවචනයන් කොන්ත්‍රාත්කරුවන්ට අහිතකර ලෙස බලපෑවේය.

බොහෝ ඉදිකිරීම් සමාගම් සැලකිය යුතු ප්‍රාග්ධන සංචිත නොමැතිව ක්‍රියාත්මක වීම නිසා දුෂ්කරතාවන්ට මුහුණ පා සිටින බව පෙනී ගියේය. රට වසා දැමීමේ බලපෑම් සමඟ, සමාගම්වල මෙම අභ්‍යන්තර ගැටළුව මතු වූ අතර, තත්වයන් යථා තත්ත්වයට පත් වූ විට පවා එම සමාගම්වලට කටයුතු අදාළ කාලයට අනුකූලව සිදු කිරීම අභියෝගාත්මක විය.

ගෙන ඇති/යෝජිත ප්‍රතිකර්ම ක්‍රියාමාර්ග

කොවිඩ් -19 වසංගතය සැලකිල්ලට ගනිමින් සියලුම කොන්ත්‍රාත්තු සඳහා කාලය දීර්ඝ කිරීම යෝජනා කරන ලදී. එක් එක් කොන්ත්‍රාත්තුවේ ඉදිකිරීම් කටයුතු සඳහා කොවිඩ්-19 බලපෑම විශ්ලේෂණය කිරීම සඳහා මාර්ගෝපදේශ මාලාවක් නිකුත් කරන ලද අතර නිසි සලකා බැලීමෙන් පසු මාස තුනක් දක්වා කාලය දීර්ඝ කළ හැකිය.

ඉදිකිරීම් ද්‍රව්‍යවල ඉහළ මිල අස්ථාවරත්වයත් සමඟ, කොන්ත්‍රාත්තු සඳහා මුලින් අදාළ නොවූ මිල උච්චාවචනය සංශෝධනය කර අදාළ කර ඇත. මුල් කොන්ත්‍රාත්තු මුදලින් 20% දක්වා මිල උච්චාවචනයන් සඳහා ගෙවීමට 2022/01/11 දින කැබිනට් තීරණයක් හරහා අනුමැතිය ලබා ගන්නා ලදී. මෙමගින් කොන්ත්‍රාත්කරුවන්ට වැඩ කඩිනම් කිරීමට සහ දැනට කරගෙන යන වැඩ නිම කිරීමට දිරි ගන්වනු ලැබේ.

වගුව 8: 2021 වර්ෂය අවසන් වන විට කිලෝමීටර් 100,000ක විකල්ප මාර්ග සංවර්ධන වැඩසටහනේ මුළු සාරාංශය

පළාත	දිස්ත්‍රික්කය	මාර්ග ගණන	මාර්ගයේ දිග	නිම කළ මාර්ග		ක්‍රියාත්මක වෙමින් පවතින මාර්ග සංඛ්‍යාව			
						ප්‍රගතිය 100%-50%		ප්‍රගතිය 50%-0%	
				මාර්ග ගණන	දිග (කි.මී.)	මාර්ග ගණන	දිග (කි.මී.)	මාර්ග ගණන	දිග (කි.මී.)
මධ්‍යම	මහනුවර	446	681.61	221	266.38	39	82.23	173	310.77
	මාතලේ	230	346.81	71	88.73	24	53.72	130	198.70
	නුවරඑලිය	177	403.31	55	98.52	22	73.71	100	231.08
උප එකතුව		**853**		**347**	**453.63**	**85**	**209.66**	**403**	**740.54**
ඌව	බදුල්ල	291	655.65	134	263.33	22	35.71	129	349.54
	මොනරාගල	375	906.27	154	374.60	25	74.36	179	431.86
උප එකතුව		**666**		**288**	**637.93**	**47**	**110.07**	**308**	**781.40**
උතුරු මැද	අනුරාධපුර	523	1008.04	130	169.46	43	104.19	307	686.00
	පොළොන්නරුව	265	376.76	115	122.89	30	62.86	120	191.01
උප එකතුව		**788**		**245**	**292.35**	**73**	**167**	**427**	**877**
දකුණ	ගාල්ල	550	816.79	273	351.74	36	46.43	159	309.43
	මාතර	925	949.75	380	375.43	38	58.80	488	503.36
	හම්බන්තොට	831	1139.26	333	493.19	85	121.13	404	518.89
උප එකතුව		**2306**		**986**	**1,220.37**	**159**	**226.36**	**1,051**	**1,331.68**
බස්නාහිර	කොළඹ	1183	641.97	559	350.72	40	39.65	584	251.60
	කළුතර	484	600.06	157	181.54	45	71.44	275	335.23
	ගම්පහ	1144	660.26	430	256.77	62	50.46	646	348.20
උප එකතුව		**2811**		**1,146**	**789.02**	**147**	**161.55**	**1,505**	**935.03**

පළාත	දිස්ත්‍රික්කය	මාර්ග ගණන	මාර්ගයේ දිග	නිම කළ මාර්ග		ක්‍රියාත්මක වෙමින් පවතින මාර්ග සංඛ්‍යාව			
						ප්‍රගතිය 100%-50%		ප්‍රගතිය 50%-0%	
				මාර්ග ගණන	දිග (කි.මී.)	මාර්ග ගණන	දිග (කි.මී.)	මාර්ග ගණන	දිග (කි.මී.)
උතුර	යාපනය	208	268.46	29.00	40.34	18	24.11	161	204.01
	කිලිනොච්චිය	45	60.78	-	-	2	2.25	43	58.54
	මන්නාරම	78	103.05	13.00	15.00	3	4.00	62	84.05
	මුලතිව්	68	114.67	2.00	4.95	5	5.75	61	103.98
	වවුනියාව	69	113.45	6.00	8.54	5	9.50	58	95.41
උප එකතුව		**468**	**660.41**	**50**	**68.82**	**33**	**45.60**	**385**	**545.99**
සබරගමුව	රත්නපුරය	686	1201.90	245	316.37	62	147.55	360	713.82
	කෑගල්ල	312	491.85	92	102.01	27	60.87	155	262.98
උප එකතුව		**998**		**337**	**418.38**	**89**	**208.42**	**515**	**976.80**
නැගෙනහිර	අම්පාර	959	1221.10	332	266.77	26	42.30	537	797.03
	මඩකලපුව	180	294.03	73	80.68	16	31.36	87	175.48
	ත්‍රිකුණාමලය	454	570.49	46	35.78	53	64.66	355	470.06
උප එකතුව		**1593**		**451**	**383.23**	**95**	**138.32**	**979**	**1,442.57**
වයඹ	කුරුණෑගල	1025	1753.22	378	649.56	110	250.96	537	852.70
	පුත්තලම	539	857.36	135	239.90	42	73.92	242	425.41
උප එකතුව		**1564**		**513**	**889.46**	**152**	**324.88**	**779**	**1,278.11**
මුලු එකතුව		**12,047**		**4,363**	**5,153.19**	**880**	**1,591.89**	**6,352**	**8,909.13**

(iii) දේශීය අරමුදල් යටතේ පාලම් ප්‍රතිසංස්කරණය කිරීම

අ. ජාතික මහාමාර්ගවල හානියට පත්/ අබලන් වූ පාලම් ප්‍රතිසංස්කරණය කිරීම

ජාතික මාර්ගවල හානි වූ/දුබල පාලම ප්‍රතිසංකරණය කිරීම නඩත්තු කළමනාකරණ අංශය විසින් සිදු කරනු ලැබේ. මෙම වැඩසටහන යටතේ දුර්වල පාලම් වැඩිදියුණු කිරීම සඳහා ඉදිකිරීම් පුහුණුව හා සංවර්ධනය සඳහා ආයතනයේ (ICTAD) ලියාපදිංචි කොන්ත්‍රාත්කරුවන් සහභාගී විය. 2021 වර්ෂයේදී පාලම් 24ක් නිම කරන ලද අතර, පළාත් ප්‍රගතිය පහත දැක්වා ඇත.

වගුව 9 : අබලන් වූ පාලම් වැඩිදියුණු කිරීමේ කටයුතුවල ප්‍රගතිය 2021

අංකය	පළාත	ඇස්තමේන්තු පිරිවැය (රු.මි.)	පාලම් ගණන	භෞතික ප්‍රගතිය		ටෙන්ඩර් අදියර	වියදම (රු. මිලියන) 2021 අවසානය දක්වා වගකීම් ඇතුළුව
				නිම කළ	නිම කළ		
1	බස්නාහිර පළාත	456.41	12	4	8		210.72
2	මධ්‍යම පළාත	264.90	8	2	6		302.39
3	දකුණු පළාත	30.00	1			1	-
4	උතුරු පළාත	6.74	1	1	-		3.79
5	නැගෙනහිර පළාත	26.00	3	-	3		-
6	නැගෙනහිර පළාත (අඅජ – අක්කරෙයිපත්තු)	82.50	2	-	-	2	-
7	වයඹ පළාත	153.26	3	2	1		68.06
8	උතුරුමැද පළාත	374.55	17	14	3		218.71
9	ඌව පළාත	176.46	3	1	1	1	54.20
10	සබරගමුව පළාත	43.73	1	-	1		7.80
		1,614.55	**51**	**24**	**23**	**4**	**865.67**

ආ. ග්‍රාමීය පාලම් ඉදිකිරීම

ග්‍රාමීය පාලම් ඉදිකිරීමේ ඒකකය, අතහැර දමන ලද පැරණි පාලම් කඩා ඉවත් කිරීමෙන් ලැබෙන වානේ කොටස් භාවිත කරමින් ග්‍රාමීය පාලම් ඉදිකිරීම, හදිසි අවස්ථාවලදී බෙලි පාලම් ඉදිකිරීම සහ මාර්ග සංවර්ධන අධිකාරියේ හදිසි පාලම් අලුත්වැඩියා කිරීම්වලට සහභාගී වීමේ වගකීම දරයි.

ග්‍රාමීය පාලම් ඉදිකිරීම් අංශයේ කාර්යයන් සහ වගකීම්

ග්‍රාමීය නිෂ්පාදන නගරයට ප්‍රවාහනය කිරීම පහසු කිරීම සඳහා අමුද්‍රව්‍ය සහ පාරිභෝගික භාණ්ඩ ගමට ප්‍රවාහනය කිරීම සහ ග්‍රාමීය ප්‍රජාවට වෙනත් ප්‍රවාහන පහසුකම් සැපයීම සඳහා ග්‍රාමීය ප්‍රදේශවල පාලම් ඉදිකිරීම සිදු කරනු ලැබේ.

- ගංවතුර හානි වැනි හදිසි අවස්ථා වලදී සහ පාලම් ප්‍රතිසංස්කරණ සිදු කරන ස්ථානවල අතුරු මාර්ගයක් ලෙස මාර්ග සංවර්ධන අධිකාරියේ මාර්ගවල තාවකාලික පාලම් (බෙලි පාලම්) ඉදිකිරීම.
- අදාළ විධායක ඉංජිනේරු, ප්‍රධාන ඉංජිනේරු සහ ව්‍යාපෘති ඉංජිනේරු විසින් ඉල්ලා ඇති පරිදි මාර්ග සංවර්ධන අධිකාරියේ පාලම්වල හදිසි අලුත්වැඩියා කටයුතු සහ හදිසි වැඩ කටයුතු සඳහා සහභාගී වීම.
- මාර්ග සංවර්ධන අධිකාරියේ අධ්‍යක්ෂ ජනරාල් සහ ඉහළ කළමනාකාරීත්වය විසින් ඉල්ලා සිටින ග්‍රාමීය පාලම් ක්ෂේත්‍ර පරීක්ෂා කිරීම.
- ග්‍රාමීය පාලම් සැලසුම් සහ ඇස්තමේන්තු සකස් කිරීම සහ වාර්ෂික ප්‍රතිපාදන හා වැඩසටහන අනුව වැඩ ක්‍රියාත්මක කිරීම.

වගුව 10: අබලන් වූ පාලම් වැඩිදියුණු කිරීමේ කටයුතුවල ප්‍රගතිය 2021

පළාත	පාලම් ගණන	2021 දී නිම කරන ලද පාලම්	2021 අවසානයේ දී ක්‍රියාත්මක වෙමින් පවතින පාලම්	2021 අවසානයේ දී සැලසුම් අදියරේ පවතින පාලම්
මහනුවර	7	4	3	
නුවරඑලිය	6	2	4	
බදුල්ල	3	1	2	
මොනරාගල	5	-	5	
අම්පාර	6	-	6	
ත්‍රිකුණාමලය	12	2	10	1
අනුරාධපුර	3	-	3	
කුරුණෑගල	5	3	1	
කෑගල්ල	11	4	7	
රත්නපුරය	1	-	1	
කොළඹ	4	2	2	
ගම්පහ	1	1	-	
කළුතර	1	-	1	
ගාල්ල	8	2	6	
මුලතිව්	2	-	2	
එකතුව	75	21	53	1

වගුව 11: 2021 තුළ පළාත් මට්ටමින් දරන ලද වියදම්

පළාත	2021 දී වියදම (රු. මිලියන)
මධ්‍යම	55.99
සබරගමුව	53.14
බස්නාහිර	59.30
උතුරු මැද	31.38
වයඹ	20.23
නැගෙනහිර	80.38
දකුණ	22.43
ඌව	27.28
උතුර	24.45
එකතුව	374.58

වගුව 12: 2021 දී ග්‍රාමීය පාලම් ඉදිකිරීමේ සවිස්තරාත්මක ප්‍රගතිය

අංකය	විස්තරය	දිස්ත්‍රික්කය	තා.ඇ.ක(රු.මි)	ආරම්භක දිනය	නිම කළ දිනය	2020 අවසානය වන විට භෞතික ප්‍රගතිය	2020 අවසානය වන විට වියදම් (රු.මි)	2021 අවසානය වන විට භෞතික ප්‍රගතිය	2021 දී වියදම (රු.මි)
1	උඩුගම, ගල්බැදි දොල හරහා පාලම ඉදිකිරීම. (මී. 15, තනි පරායනය) 2014/58	ගාල්ල	7.96	2015.09.08		96%	4.68	98%	0.61
2	නාගොඩ, කොණ්ඩගල, හෝම දොළ හරහා පාලම ඉදිකිරීම. (මී.24, තනි පරායනය) 2014/61	ගාල්ල	12.85	2015.09.24		78%	5.82	92%	0.01
3	බටහිර හිනිදුම, යද්දෙහි කන්ද ඇළ හරහා පාලම ඉදිකිරීමේ ශේෂ කටයුතු. (රඹුටන්ගස් දෙක, තවලම ප්‍රාදේශීය ලේකම් කොට්ඨාශය) මී.16, 2014/18 පරායනය	ගාල්ල	8.96	2014.04.04	2020.09.05	97%	7.01	100%	-
4	තෙල්දෙණිය පහුරුගොල්ල ගම්මානයේ උඩවෙල-ගල්වල පාරේ පාලම පුළුල් කිරීම. 2018/06A	මහනුවර	19.70	2018.10.12	2021.04.01	72%	11.55	100%	3.27
5	ගාල්ල, නුගදූව, ලුණුවිල වත්ත, කැකුලන් ඕවිට ඇළ හරහා පාලම ඉදිකිරීම. 2019-014	ගාල්ල	9.99	2019.11.13	2021.08.18	44%	2.49	100%	4.71
6	නෙළුව, ගිගුම්මඩුව, මාවනාන එගොඩ ඕවිට ඇළ හරහා පාලම ඉදිකිරීම.2019-010	ගාල්ල	20.41	2019.09.24		51%	7.24	99%	9.34
7	දැරණියගල, ඔරුපීඇල්ලගම, මණ්ඩගල් ඔය හරහා පාලම ඉදිකිරීම. 2019-004	කෑගල්ල	12.89	2019.09.02	2021.03.24	90%	6.90	100%	4.35
8	කින්නියා වලෙයි වැද්දන්වන් පාලම ඉදිකිරීම.2019-008	ත්‍රිකුණාමලය	19.16	2019.09.17		45%	-	98%	9.74
9	මස්කෙළිය, සීටන් රදර්ෆෝර්ඩ් හි මස්කෙළි ඔය හරහා පාලම ඉදිකිරීම. 2019-016	නුවරඑලිය	34.68	2019.10.28		75%	14.27	87%	10.06
10	කොත්මලේ කැටබුල හි දී කැටබුල ඔය හරහා පාලම ඉදි කිරීම.2019-017	නුවරඑලිය	10.58	2019.09.02	2021.02.25	95%	9.46	100%	0.23
11	හේවාහැට හෝප් වත්තේ මූල්ඔය හරහා පාලම ඉදිකිරීම. 2019-018	නුවරඑලිය	7.15	2019.08.02		95%	6.95	100%	1.61
12	රිදීමාලියද්ද නාගදීප ඌරණියේ නාගදීප හිරැස්සගොඩ මාර්ගයේ වැද්දගේ කඳුර හරහා පාලම ඉදිකිරීම. 2019-019	බදුල්ල	16.21	2019.09.24	2021.01.22	96%	8.11	100%	7.14

අංකය	විස්තරය	දිස්ත්‍රික්කය	තා.ඇ.ක(රු.මී)	ආරම්භක දිනය	නිම කළ දිනය	2020 අවසානය වන විට භෞතික ප්‍රගතිය	2020 අවසානය වන විට වියදම් (රු.මී)	2021 අවසානය වන විට භෞතික ප්‍රගතිය	2021 දී වියදම (රු.මී)
13	ත්‍රිකුණාමලයේ පලෙයි නගර් මුතූර්හි පලෙයි නගර්-නයිතාල් නගර් මාර්ගයේ මුතූර් කලපුව හරහා පාලම ඉදිකිරීම. 2019-021B	ත්‍රිකුණාමලය	18.81	2020.02.04	2021.11.26	60%	6.00	100%	6.50
14	ඉංගිරිය, කඳන්පිටිය, කටුගල්ගම, මාවක් ඔය හරහා පාලමේ ඉතිරි ඉදිකිරීමේ කටයුතු.2019-024	කළුතර	5.83	2019.08.29		36%	1.83	90%	1.74
15	මාවනැල්ල උඩමුල්ල හිනටිපානකන්ද , හිනටිපනකන්ද දෙහිලියද්දකුඹුර මාර්ගයේ ගංගාදෙස්ස ඔය හරහා පාලම ඉදිකිරීම. 2019-WO-04	කෑගල්ල	15.80	2019.08.12		78%	3.25	78%	-
16	පුල්මුඩේ, ගෝමරන්කඩවල මාර්ගයේ යාන් ඔය සවරාරු ඇළ හරහා පුල්මුඩේ පාලම ඉදිකිරීම. 2019-025A	ත්‍රිකුණාමලය	20.76	2020.02.04	2021.04.28	88%	16.61	100%	3.23
17	නිල්ලඹේ නව නගරයේ, පල්ලේ දෙල්තොට හි නිල්ලඹ ඔය හරහා පාලම ඉදිකිරීම. 2019-027	මහනුවර	19.31	2020.01.01		50%	2.60	88%	10.58
18	හුණුකැටදේගලහ, පුස්සාවෙල, මීමුරේ මහඔය හරහා පාලම ඉදිකිරීම. 2019-029A	මහනුවර	19.17	2020.02.04	2021.09.20	65%	3.00	100%	11.02
19	මීගහකිවුල තල්දෙන ලොග්ගොල් ඔය හරහා පාලමක් ඉදි කිරීම.2019-028	බදුල්ල	9.70	2019.11.22		65%	5.29	67%	1.65
20	මැල්සිරිපුර, මැණික්පාය හි බුලත්වේල්යාය මැණික්පාය මාර්ගයේ කිඹුල්වානා ඔය හරහා පාලම ඉදිකිරීම. 2019-030	කුරුණෑගල	26.46	2020.03.05		25%	7.83	40%	--
21	මැල්සිරිපුර, කිඹුල්වානා ඔය 03 ඒකකයෙ හි කිඹුල්වානා ඔය හරහා පාලම ඉදිකිරීම. 2019-031	කුරුණෑගල	10.94	2020..02.03	2021.12.04	85%	4.98	100%	3.06
22	කුඹුක්ගැටේ පේරගහමුල යාය හෙට්ටිගම මාර්ගයේ කිඹුල්වානා ඔය හරහා පාලම ඉදිකිරීම. 2019-033	කුරුණෑගල	9.64	2020.08.07	2021.02.26	98%	3.80	100%	4.41
23	ත්‍රිකුණාමලය, පුල්මුඩේ, තෙන්නමාරකුඩි, කොක්කුතුඩුවායි මාර්ගයේ පරයන් ආරු හරහා පාලම ඉදිකිරීම. RDA/DPR/UBTW/2020/21/2	ත්‍රිකුණාමලය	33.97	2020.12.01		0%	-	75%	18.29

අංකය	විස්තරය	දිස්ත්‍රික්කය	තා.ඇ.ක(රු.මි)	ආරම්භක දිනය	නිම කළ දිනය	2020 අවසානය වන විට භෞතික ප්‍රගතිය	2020 අවසානය වන විට වියදම් (රු.මි)	2021 අවසානය වන විට භෞතික ප්‍රගතිය	2021 දී වියදම (රු.මි)
24	මුලතිව්, කොක්කුතුඩුවායි හි තෙන්නමරවාඩි, කොක්කුතුඩුවායි මාර්ගයේ ඔඩික්කාරු ආරු හරහා පාලම ඉදිකිරීම. RDA/DPR/UBTW/2020/21/3	මුලතිව්	31.98	2020.12.01		0%	-	45%	9.73
25	ගිරිබාව, සෝලේවැව, සඳගල, 7 වැනි ඒකකයේ,සාලිය හන්දිය මාර්ගයේ සෝලවැව හරහා පාලම ඉදි කිරීම. RDA/DPR/UBTW/2020/21/05	කුරුණෑගල	16.53	2020.12.01	2021.10.01	0%	-	100%	9.56
26	අවිස්සාවේල්ල ඇස්වත්ත පුවක්පිටියේ ප්‍රගතිපුර, නැහෙනහිර කන්ද මාර්ගයේ වවුලේලන ඇළ හරහා පාලම ඉදිකිරීම.2020-007	කොළඹ	12.71	2020.10.27	2021.03.22	60%	-	100%	13.05
27	දීවෙල, බටේවත්ත, මාරපන ඔය හරහා පාලම ඉදිකිරීම.2020-008	කෑගල්ල	15.64	2021.01.12	2021.09.28	0%	-	100%	13.91
28	මුලතිව්, කොකුමෝඩෙයි හි තෙන්නමරවාඩි කොක්කුතුඩුවායි මාර්ගයේ කොක්කුමෝඩෙයි ආරු හරහා පාලම ඉදිකිරීම්. 2020-009	මුලතිව්	18.27	2021.01.18		0%	-	85%	11.52
29	බෝපේ, උඩගම, බෝපේ බතලවත්ත මාර්ගය හරහා පාලම ඉදිකිරීම.2020-010	කොළඹ	5.99	2020.12.10	2020.02.14	35%	-	100%	4.91
30	බිබ්බිල බොක්කේමඩවල, බොක්කේමඩවල බදුල්ලගම්මන මාර්ගයේ මුදියලකදුර හරහා පාලම ඉදිකිරීම.2020-12	මොනරාගල	11.47	2020.10.28		5%	-	70%	5.93
31	බිබිල, මඩලන්ද දමුණුවින්නා ඔය හරහා පාලම ඉදිකිරීම.2020-013	මොනරාගල	12.81	2020.12.10		5%	-	65%	5.21
32	අම්පාර, දඹාන, තොට්ටම හි තොට්ටම ඔම්රංගාව මාරගයේ පන්හල්ඔය හරහා පාලම ඉදිකිරීම.2020-014	අම්පාර	22.04	2020.12.05		0%	-	40%	11.81
33	බිබිල කවුඩැල්ල හි බදුල්ලගම්මන කවුඩැල්ල මාර්ගයේ ගල්ඔය හරහා පාලම ඉදිකිරීම.2020-015	මොනරාගල	13.55	2020.12.29		0%	-	30%	-
34	උඩුදුම්බර, පොල්ගොල්ල හි බලි අමුනා ඔය හරහා වන පාලම ඉකිරි කටයුතු ඉදි කිරීම. 2020-001 B	මහනුවර	2.35	2020.10.16		25%	-	100%	1.73
35	මීගමුව ශාන්ත නිකලස් මාර්ගයේ සිරිකුරුස පාලමේ අලුත්වැඩියා කටයුතු. RDA/DPR/BRW/2020/101	ගම්පහ	38.60	2020.12.24		0%	-	100%	13.13

අංකය	විස්තරය	දිස්ත්‍රික්කය	තා.ඇ.ක(රු.මි)	ආරම්භක දිනය	නිම කළ දිනය	2020 අවසානය වන විට භෞතික ප්‍රගතිය	2020 අවසානය වන විට වියදම් (රු.මි)	2021 අවසානය වන විට භෞතික ප්‍රගතිය	2021 දී වියදම (රු.මි)
36	බිබිල, කෙහෙල්කොටුව මැදගම, කෙහෙල්කොටුව කළුගහවාඩිය මාර්ගයේ දහමල් ඔය හරහා පාලමක් ඉදිකිරීම.RDA/DPR/UP/DKKMB/2020/148	බදුල්ල	33.29	2021.02.26		0%	-	75%	2.46
37	කාගම බුල්නෑව, කාගම හෙලබදුගම මාර්ගයේ කලාඔය හරහා පාලමේ ඉතිරි කටයුතු ඉදි කිරීම. RDA/DPR/NCP/KKHB/2020/147	අනුරාධපුර	43.55	2021.02.05		0%	-	32%	19.17
38	යක්කටුව, ඇතුමලේ, වඳුරඹ හි පාලම අංක 17/4 සඳහා ආධාරක තාප්පයක් (Jacket wall) ඉදිකිරීම. RDA/RBCD/SP/GOSL/2020/016	ගාල්ල	1.20	2021.01.25	2021.05.10	0%	-	100%	0.71
39	අත්තිඩිය ඉඩමේ රැඳවුම් බැම්ම ඉදිකිරීම. RDA/RBCD/WP/GOSL/2020/017	කොළඹ	3.69	2021.02.09		0%	-	40%	1.73
40	කෑගල්ල පල්ලේගම ගල්කැටිය අමුණ ඇළ හරහා පාලම ඉදිකිරීම 2021-001	කෑගල්ල	9.02	2021.03.19	2021.10.30	0%	-	100%	5.17
41	ත්‍රිකුණාමලය පුල්මුඩේ, පුල්මුඩේ සුනාමී නිවාස යෝජනා ක්‍රමයේ කලපුව හරහා පාලමක් ඉදිකිරීම. 2021-002	ත්‍රිකුණාමලය	24.30	2021.03.31		0%	-	60%	14.82
42	ගෝනගල්දෙණිය, වහරක , උඩුවක එලිපල්ලේ මාර්ගයේ දුනුමලේ ඇළ හරහා පාලම ඉදිකිරීම. 2021-003	කෑගල්ල	11.14	2021.03.22		0%	-	70%	5.55
43	බුලත්කොහුපිටිය අලවතුර මුරුතගස්තැන්න මාර්ගයේ මුරුත ඇළ හරහා පාලම ඉදිකිරීම.2021-004	කෑගල්ල	10.44	2021.03.19	2021.10.25	0%	-	100%	7.13
44	මාරස්සන, බව්ලාන, හේවාවිස්ස හි හේවාවිස්ස බව්ලාන මාර්ගයේ බව්ලාන ඇළ හරහා පාලමක් ඉදිකිරීම. 2021-005	මහනුවර	12.11	2021.03.25		0%	-	30%	5.95
45	පුස්සැල්ලාව ගැමුණුපුර හන්දියේ සිට නුවරඑළිය ප්‍රධාන මාර්ගයේ (පල්ලිය අසල), (15+320) දක්වා පුළුවුඩ ඔය හරහා පාලමක් ඉදිකිරීම. 2021-006	නුවරඑලිය	7.16	2021.03.19		0%	-	5%	-
46	පුලියන්කුලම තුලාන, කලාවැව, පුලියන්කුලම අලුත් පුලියන්කුලම මාර්ගයේ පැරණි යෝධ ඇළ හරහා පාලම ඉදිකිරීම.2021-007	අනුරාධපුර	19.65	2021.03.19		0%	-	65%	2.63

අංකය	විස්තරය	දිස්ත්‍රික්කය	තා.ඇ.ක(රු.මි)	ආරම්භක දිනය	නිම කළ දිනය	2020 අවසානය වන විට භෞතික ප්‍රගතිය	2020 අවසානය වන විට වියදම් (රු.මි)	2021 අවසානය වන විට භෞතික ප්‍රගතිය	2021 දී වියදම (රු.මි)
47	තලාව තෙල්ලඹුර මාර්ගයේ, හීන් ඇල හරහා පාලම ඉදිකිරීම.2021-008	ගාල්ල	5.94	2021.03.26		0%	-	50%	1.96
48	පුස්සැල්ලාව ගැමුණුපුර හන්දියේ සිට නුවරඑළිය මේරි හිල් ප්‍රධාන මාර්ගයේ (12+640) හි පුළුවුඩ ඔය හරහා පාලමක් ඉදිකිරීම. 2021-009	නුවරඑලිය	7.29	2021.03.26		0%	-	30%	1.30
49	පුස්සැල්ලාව ගැමුණුපුර හන්දියේ සිට නුවරඑළිය ප්‍රධාන මාර්ගයේ (පාසල අසල) (14+950) දක්වා පුළුවුඩ ඔය හරහා පාලමක් ඉදිකිරීම. 2021-010	නුවරඑලිය	5.71	2021.03.26		0%	-	10%	-
50	උඩුදුම්බර කුඹුක්ගොල්ල මීමුරේ ප්‍රධාන මාර්ගයේ කුඹුක්ගොල්ල මීමුරේ පැගිරිමාන ඔය හරහා පාලම ඉදිකිරීම. 2021-012	මහනුවර	9.26	2021.07.02		0%	-	100%	7.04
51	හත්නාපිටිය කොටියාකුඹුර අරුග්ගම්මන හත්නාපිටිය මාර්ගයේ හීන් ඇළ හරහා පාලම ඉදිකිරීම.2021-013	කෑගල්ල	6.25	2021.03.19		0%	-	35%	-
52	කෑගල්ල, ගොඩිගමුව මොරොන්තොට, ගොඩිගමුව මලවිට මාර්ගයේ හීනකඳුර ඇළ හරහා පාලම ඉදිකිරීම. 2021-014	කෑගල්ල	6.19	2021.06.25		0%	-	8%	0.53
53	ඉපලෝගම නාරංගල්ලේගම 13D ඇළ හරහා පාලම ඉදිකිරීම. 2021-015	අනුරාධපුර	5.83	2021.03.25		0%	-	0%	0.48
A001 සහ A005	පේරාදෙණිය නගරය පුළුල් කිරීම සහ වැඩිදියුණු කිරීම සඳහා ජ්‍යාමිතික සැලසුම		ජ්‍යාමිතික සැලසුම	449.73	98%
	ගෙලිඔය අතුරු මාර්ගයේ 0+770 සිට 3+320 දක්වා ජ්‍යාමිතික සැලසුම	කි.මී.2.55	ජ්‍යාමිතික සැලසුම	330.68	95%
B365	PHK මාර්ගයේ 3+000 සිට 10+043 දක්වා A/C ගල් ඇතිරීම සඳහා වන ජ්‍යාමිතික සැලසුම	කි.මී.7.043	ජ්‍යාමිතික සැලසුම	468.68	70%
	දළදා වීදියේ HNB ගොඩනැගිල්ල ඉදිරිපිටඋමං පාලම සඳහා සැලසුම		ව්‍යුහාත්මක සැලසුම		100%

3.4 රත්නපුර සැලසුම් කාර්යාලය

රත්නපුර - සැලසුම් කාර්යාලය, රත්නපුර ප්‍රධාන ඉංජිනේරුවරයා (සැලසුම්) යටතේ සබරගමුව ව්‍යාපෘති අධ්‍යක්ෂ කාර්යාලයේ ක්‍රියාත්මක වන අතර වෘත්තීය සමාලෝචනය සඳහා වසරකට ඉංජිනේරුවන් හය දෙනෙකුට සැලසුම් පුහුණුව ලබා දීම සඳහා ශ්‍රී ලංකා ඉංජිනේරුවරුන්ගේ ආයතනය (IESL) විසින් ප්‍රතිනතය කර ඇත.

මෙම කාර්යාලය මාර්ග සංවර්ධන අධිකාරියට අයත් නොවන වැඩ ඇතුළුව පළාත තුළ මහාමාර්ග හා පාලම් සැලසුම් නිර්මාණය කිරීම සඳහා ප්‍රධාන වශයෙන් අවධානය යොමු කෙරේ.

කිලෝමීටර් 100,000 මාර්ග වැඩසටහන, පාලම් 5000 වැඩසටහන් , අයි මාර්ග (I road) වැඩසටහන්, ලෝක බැංකු ආධාර යටතේ සිදු කරන මාර්ග සංවර්ධන අධිකාරියේ නොවන මාර්ග වැඩසටහන් සහ සැලසුම්වලට අමතරව, පළාත්භාර අධ්‍යක්ෂගේ උපදෙස් අනුව මිනුම්කරණ පිරිසැකසුම් වැඩ ඇස්තමේන්තු හා තත්ත්ව වාර්තා පිළියෙළ කිරීම හා වැඩබිම පරීක්ෂාවන් සිදු කරනු ලබයි.

වගුව 18: 2021 වර්ෂය තුළ ක්‍රියාකාරකම්වල ප්‍රගතිය

අංකය	මාර්ග කොටස / පාලම් අංකය	වැඩ විස්තරය	මාර්ග අංකය	2021 අවසන් වන විට ප්‍රගතිය	තා.ඇ.ක./ (රු.මි.)
රත්නපුර විධායක ඉංජිනේරු කොට්ඨාශය					
1	කොළඹ - රත්නපුර - වැල්ලවාය - මඩකලපුව මාර්ගයේ අංක 99/6 පාලම පහළට දෙසට ඉදිකිරීම	සමීක්ෂණය, පාලම් සැලසුම්	A004	100 %	167.9
2	රත්නපුර පලාවෙල කරවිට මාර්ගයේ අංක 1/3 පාලමේ මතුපිට සකස් කිරීම සහ ආරක්ෂිත ආලේපන ගැලවීම	පිරිවැය ඇස්තමේන්තුව	B390	100%	66.17
3	කොළඹ - රත්නපුර - වැල්ලවාය - මඩකලපුව මාර්ගයේ අංක 88/1 පාලම ප්‍රතිසංස්කරණය කිරීම	සමීක්ෂණය, පාලම් සැලසුම් පිරිවැය ඇස්තමේන්තුව	A004	100%	68.38
4	කොළඹ - රත්නපුර - වැල්ලවාය - මඩකලපුව මාර්ගයේ පාලම අංක 99/6 (පහළට) ප්‍රතිසංස්කරණය කිරීම	සමීක්ෂණය, පාලම් සැලසුම්	A004	100%	168.79
5	ගොඩිගමුව පාලම ප්‍රතිසංස්කරණය කිරීම	සමීක්ෂණය, පාලම් සැලසුම්	RDA නොවන	100%	21.8
6	සිල්වර්ලැන්ඩ් ජනපදයේ දෙනවක ගඟ හරහා පාලමක් ඉදිකිරීම	සමීක්ෂණය, පාලම් සැලසුම්	RDA නොවන	100%	163.4
7	පානදුර නම්බපාන රත්නපුර මාර්ගයේ අංක 68/1 පාලම	සමීක්ෂණය, පාලම් සැලසුම් ඇස්තමේන්තු	A008	100%	39.28
8	ඉඩංගොඩ - අයගම මාර්ගයේ (කි.මී. 0+000 - 4+000) තිරස් පෙළගැස්ම	මහාමාර්ග සැලසුම්	B160	100%	
9	නායයෑම් අවම කිරීම වෑවල - පාදුක්ක හරහා උඩගම මාර්ගය	සමීක්ෂණය, බිත්ති නිර්මාණය	RDA නොවන	100%	
10	රත්නපුර කජුගස්වත්ත විහාරස්ථානයේ මායිම දිගේ බැම්ම ඉදිකිරීම	සමීක්ෂණය, බිත්ති නිර්මාණය පිරිවැය ඇස්තමේන්තුව	RDA නොවන	100%	14.69
11	රත්නපුර නගරයේ දකුණු අතුරු මාර්ගය ඉදිකිරීම, මුද්දුව පිටියේ සිට - මුවගම විහාරස්ථානය දක්වා (මීටර් 750)	මහාමාර්ග සැලසුම්	RDA නොවන	100%	
12	දකුණු අතුරු මාර්ගය (රත්නපුර) පාලම අංක 1/3	පිරිවැය ඇස්තමේන්තුව	RDA නොවන	100%	47.27
13	රත්නපුර මීහිටිය කළුගඟ හරහා පාලම ප්‍රතිසංස්කරණය කිරීම	සමීක්ෂණය, පාලම් නිර්මාණය	RDA නොවන	100%	378.08

අංකය	මාර්ග කොටස / පාලම් අංකය	වැඩ විස්තරය	මාර්ග අංකය	2021 අවසන් වන විට ප්‍රගතිය	තා.ඇ.ක./ (රු.මී.)
		පිරිවැය ඇස්තමේන්තුව			
14	රත්නපුර, කපුගස්වත්ත විහාරස්ථාන පරිශ්‍රයේ ශේෂ බිත්ති කොටස	සමීක්ෂණය, බිත්ති නිර්මාණය පිරිවැය ඇස්තමේන්තුව	RDA නොවන	100%	16.3
15	යටි මාර්ගය නිර්මාණය - තුඹගොඩ හන්දිය, බලංගොඩ	සමීක්ෂණය,	AA 004	5%	
16	කුරුවිට එරත්නගොඩ පාලම ඉදිකිරීම	සමීක්ෂණය,	RDA නොවන	100%	
17	පල්ලෙබැද්ද - මැදගංඔය - වැලිගෙපොල මාර්ගය වැඩිදියුණු කිරීම	මහාමාර්ග සැලසුම්	B351	100%	
18	රත්නපුර නව නගරයේ AB මාර්ගයේ කොටස වැඩිදියුණු කිරීම	සමීක්ෂණය, පාලම් සැලසුම්	AB35	100%	
19	රත්නපුර බස් නැවතුමේ උමං මාර්ගය	සමීක්ෂණය,	B027	5%	
20	මල්වල කානි මාර්ගය වැඩිදියුණු කිරීම (0+000 – 4+000)	සමීක්ෂණය, පාලම් සැලසුම්	B265	100%	
21	රත්නපුර දකුණු අතුරු මාර්ගයේ කොටඹේ පාලම	සමීක්ෂණය, පාලම් සැලසුම්	RDA නොවන	100%	802.29
22	ඉහළගම මාර්ගයේ (RDA නොවන) 15 වැනි කිලෝමීටරයේ (LHS) නාය යන ස්ථානයේ තිරස් පෙළගැස්ම සහ සිරස් පැතිකඩ	මහාමාර්ග සැලසුම්	RDA නොවන	100%	
ඇඹිලිපිටිය විධායක ඉංජිනේරු කොට්ඨාශය					
23	පල්ලෙබැද්ද මැදගංඔය වැලිගෙපොල මාර්ගයේ අංක 2/3 පාලම ප්‍රතිසංස්කරණය කිරීම	සමීක්ෂණය, පාලම් සැලසුම, ඇස්තමේන්තුව	B351	100%	37.13
24	පල්ලෙබැද්ද මැදගංඔය වැලිගෙපොල මාර්ගයේ අංක 8/1 පාලම ප්‍රතිසංස්කරණය කිරීම	සමීක්ෂණය, පාලම් සැලසුම, ඇස්තමේන්තුව	B351	100%	131.19
25	පල්ලෙබැද්ද මැදගංඔය වැලිගෙපොල මාර්ගයේ අංක 14/1 පාලම ප්‍රතිසංස්කරණය කිරීම	සමීක්ෂණය, පාලම් සැලසුම, ඇස්තමේන්තුව	B351	100%	46.77
පැල්මඩුල්ල විධායක ඉංජිනේරු කොට්ඨාශය					
26	සර්වෝදය මාර්ගය වැඩිදියුණු කිරීම. කි.මී.3.	මහාමාර්ග සැලසුම්	RDA නොවන	100 %	
27	බළන්ගොඩ සමනලවත්ත මාරගයේ 5+650 RHS හි ගැබියන් තාප්පය ඉදිකිරීම	සමීක්ෂණ සහ රැඳවුම් බිත්ති සැලසුම	RDA නොවන	100 %	4.33
28	කොළඹ - රත්නපුර - වැල්ලවාය - මඩකලපුව මාර්ගයේ බෝක්කු අංක 138/3 සහ 138/4 අතර රැඳවුම් බැම්ම	සමීක්ෂණ සහ බිත්ති සැලසුම	A004	100 %	11.15
29	බලංගොඩ - බෝවත්ත - කල්තොට මාර්ගය කි.මී. 3+400 සිට කි.මී.7+400 දක්වා තිරස් පෙළගැස්ම	මහාමාර්ග සැලසුම්	B038	100%	
30	බලංගොඩ, කිරිදිවැල, ශෛලතාරාරාම මාර්ගයේ ප්‍රවේශය වැඩිදියුණු කිරීම (කි.මී. 1)	මහාමාර්ග සැලසුම්	RDA නොවන	100%	
31	මහමෙවුනාව මාර්ගය වැඩිදියුණු කිරීම - 0+600 LHS හි රඳවා ගැනීමේ ව්‍යුහය	සමීක්ෂණය, පාලම් සැලසුම්	RDA නොවන	100%	
32	අස්පොල්ට් යාත්‍රාගාර ප්‍රවේශ මාර්ගය වැඩිදියුණු කිරීම - දමන, බලංගොඩ (කි.මී. 2)	සමීක්ෂණ සහ රැඳවුම් බිත්ති සැලසුම	RDA නොවන	100 %	

අංකය	මාර්ග කොටස / පාලම් අංකය	වැඩ විස්තරය	මාර්ග අංකය	2021 අවසන් වන විට ප්‍රගතිය	තා.ඇ.ක./ (රු.මි.)
33	රිල්හේන - පහළකුට්ටාපිටිය මාර්ගයේ සිරස් පෙළගැස්ම - පැල්මඩුල්ල නගරයේ අතුරු මාර්ගය (කි.මී. 0.3)	මහාමාර්ග සැලසුම්	RDA නොවන	100%	
34	පැල්මඩුල්ල - මාදම්පේ - නෝනාගම මාර්ගයේ අංක 5/9 බෝක්කුවේ යාබැම්ම (RHS) පුළුල් කිරීම සහ ප්‍රතිසංස්කරණය කිරීම	සමීක්ෂණය, පාලම් සැලසුම්	B351	100%	4.4
35	පැල්මඩුල්ල - මාදම්පේ - නෝනාගම මාර්ගය 5/3 සහ 5/4 (LHS) බෝක්කු අතර රැඳවුම් බැම්ම ඉදිකිරීම	සමීක්ෂණය, රැඳවුම් බිත්ති නිර්මාණය	A018	100%	
36	කොළඹ - රත්නපුර - වැල්ලවාය - මඩකලපුව මාර්ගයේ අංක 109/3 (RHS) පාලම පුළුල් කිරීම	සමීක්ෂණය, පාලම් සැලසුම්	A004	100%	17.09
රුවන්වැල්ල විධායක ඉංජිනේරු කොට්ඨාශය					
37	ගලිගමුව - රුවන්වැල්ල මාර්ගයේ අංක 18/3 පාලම පුළුල් කිරීම සහ ප්‍රතිසංස්කරණය කිරීම සඳහා සවිස්තරාත්මක සැලසුම් සහ ඇස්තමේන්තු ඉදිරිපත් කිරීම	සමීක්ෂණය, පාලම් සැලසුම, ඇස්තමේන්තුව	B127	100 %	48.22
38	හානියට පත් පූනාගල , බෙරන්නාව පාලම (RDA නොවන) අලුත්වැඩියා කිරීම සඳහා සැලසුම් කිරීම සහ ඇස්තමේන්තු කිරීම.	සමීක්ෂණය, පාලම් සැලසුම් , ඇස්තමේන්තුව	RDA නොවන	100%	17.43
39	ගම සමඟ පිළිසඳර – කැගල්ල දිස්ත්‍රික්කය ශිව ගිරිය සංගිලි පාලම වෙනුවට නව පාලම.	සමීක්ෂණය, පාලම් සැලසුම්	RDA නොවන	20%	
40	යටදොල නාරම්බැද්ද මාඔය හරහා පාලමක් ඉදිකිරීම ගම සමග පිළිසඳර – දැරණියගල.	සමීක්ෂණය,	RDA නොවන	100%	
41	කිඹිරිපොල සීතාවක ගඟ හරහා එල්ලෙන පාලමේ ශේෂ වැඩ සඳහා සිදු කළ වෙනස්කම්	සැලසුම්, ඇස්තමේන්තු	RDA නොවන	100%	68.8
කැගල්ල විධායක ඉංජිනේරු කොට්ඨාශය					
42	රඹුක්කන මාවනැල්ල මාර්ගයේ 5/4 සහ 5/5 බෝක්කු (LHS) අතර ගැබියන් තාප්පය සැලසුම් කිරීම සහ ඇස්තමේන්තු කිරීම.	සමීක්ෂණය, බිත්ති නිර්මාණය	B385	100%	6.96
43	රඹුක්කන - මාවනැල්ල මාර්ගයේ 5/1 සහ 5/2 බෝක්කු (LHS) අතර රැඳවුම් බැම්ම ඉදිකිරීම සඳහා ඇස්තමේන්තුව	සමීක්ෂණය, බිත්ති නිර්මාණය	B385	100%	48.81
44	කොළඹ - නුවර මාර්ගයේ 87/2 බෝක්කුවෙහි රැඳවුම් බිත්තියේ විස්තර සැලසුම.	සමීක්ෂණය, බිත්ති නිර්මාණය	A001	100%	17.7
45	රඹුක්කන - මාවනැල්ල මාර්ගයේ 3/9 බෝක්කුවෙහි රැඳවුම් බැම්මේ විස්තර සැලසුම් කිරීම සහ ඇස්තමේන්තුව.	සමීක්ෂණය, බිත්ති නිර්මාණය, ඇස්තමේන්තුව	B385	100%	3.58
46	රඹුක්කන - මාවනැල්ල මාර්ගයේ 5/5 සහ 5/6 බෝක්කු (LHS) අතර රැඳවුම් බිත්ති සවිස්තර සැලසුම් කිරීම සහ ඇස්තමේන්තුව	සමීක්ෂණය, බිත්ති නිර්මාණය, ඇස්තමේන්තුව	B385	100%	9.84
47	රඹුක්කන - මාවනැල්ල මාර්ගයේ 5/2 සහ 5/3 බෝක්කු (LHS) අතර රැඳවුම් බිත්ති සවිස්තර සැලසුම් කිරීම සහ ඇස්තමේන්තු කිරීම.	සමීක්ෂණය, බිත්ති නිර්මාණය, ඇස්තමේන්තුව	B385	100%	7.4

අංකය	මාර්ග කොටස / පාලම් අංකය	වැඩ විස්තරය	මාර්ග අංකය	2021 අවසන් වන විට ප්‍රගතිය	තා.ඇ.ක./ (රු.මි.)
48	රඹුක්කන - මාවනැල්ල මාර්ගයේ 5/2 සහ 5/3 බෝක්කු (LHS) අතර රැඳවුම් බිත්ති සවිස්තර සැලසුම් කිරීම සහ ඇස්තමේන්තුව	සමීක්ෂණය, බිත්ති නිර්මාණය, ඇස්තමේන්තුව	B385	100%	7.37
49	නෙළුම්දෙණිය - අලවිව මාර්ගයේ අංක 1/1 පාලමේ සවිස්තරාත්මක සැලසුම ඉදිරිපත් කිරීම	සමීක්ෂණය, පාලම් සැලසුම්	B539	100%	40.6

ප්‍රගතියට ඇති බාධක

- ජ්‍යෙෂ්ඨ සැලසුම් ඉංජිනේරු තනතුර පුරප්පාඩු වී තිබීම.
- පරිගණක පහසුකම් ප්‍රමාණවත් නොවීම (සැලසුම් පුහුණුව ලබන්නන් 6 දෙනෙකු සඳහා සහ අනෙකුත් කාර්ය මණ්ඩල අවශ්‍යතා සඳහා පරිගණක 13ක අවශ්‍යතාවයක් පවතී. නමුත් දැනට පවතින්නේ පරිගණක 8ක් පමණි. එයින් ද පරිගණක 2ක් සැලසුම් මෘදුකාංග භාවිතය සඳහා ගැලපෙන පරිගණක නොවේ).

පිළියම් යෝජනා

- පුරප්පාඩු පිරවීම
- සැලසුම් පුහුණුව ලබන්නන් සඳහා අවම වශයෙන් පරිගණක 3 ක් වත් ලබා දීම.

4. මාර්ග සහ පාලම් වැඩවල තත්ත්ව පාලනය

පර්යේෂණ හා සංවර්ධන අංශය වැඩවල තත්ත්වය පාලනය ආවේක්ෂණය කිරීමේ වගකීම දරයි. මෙම අංශය අතිරේක අධ්‍යක්ෂවරුන් දෙදෙනෙකුගේ ප්‍රධානත්වයෙන් සහ අධ්‍යක්ෂවරයාගේ අධීක්ෂණය යටතේ පවතින ප්‍රාදේශීය සේවා සහ ව්‍යාපෘති අංශයෙන් සහ මධ්‍යම රසායනාගාර සහ විමර්ශන අංශයන්ගෙන් සමන්විත වේ. මෙම අංශය තව දුරටත් පළාත් රසායනාගාර, ව්‍යාපෘති රසායනාගාර හා කලින් කලට පිහිටුවනු ලබන ක්ෂේත්‍ර ඒකකවලින් පරිපුරණය වෙයි.

පර්යේෂණ සහ සංවර්ධන (R&D) අංශය පහත වගකීම දරයි;

- මාර්ග ඉදිකිරීම්, පුනරුත්ථාපනය සහ නඩත්තු කිරීමේදී ගැටළු පිළිබඳ උපදෙස් ලබා දීම සහ කාර්යයේ තත්ත්ව පාලනය අධීක්ෂණය කිරීම.
- මාර්ග ඉදිකිරීම, පුනරුත්ථාපනය සහ නඩත්තුවේදී භාවිතා කරන ද්‍රව්‍ය සහ අනුගමනය කරන ක්‍රම පිළිබඳව ව්‍යවහාරික පර්යේෂණ සිදු කිරීම.
- මාර්ග බැම්, මාර්ග පදික වේදිකා (මැදිරි මාර්ග ව්‍යුහයන්) සහ මාර්ග ඇතිරීම්වල පරීක්ෂණ සහ සැලසුම් සිදු කිරීම.
- පාලම් සැලසුම් කිරීම සඳහා පදනම් විමර්ශනය සිදු කිරීම.
- ද්‍රව්‍ය සහ මිශ්‍ර සැලසුම් පිළිබඳ සාමාන්‍ය පරීක්ෂණ සිදු කිරීම.
- මාර්ගවලට බලපාන නායයෑම් සඳහා ප්‍රතිකර්ම ක්‍රියාත්මක කිරීම සඳහා පරීක්ෂණ සහ සැලසුම් ක්‍රියාත්මක කිරීම.
- මාර්ග ඉදිකිරීම, පුනරුත්ථාපනය සහ නඩත්තු ශිල්පීය ක්‍රම පිළිබඳ තාක්ෂණික නිලධාරීන් පුහුණු කිරීම.

ප්‍රාදේශීය සේවා සහ ව්‍යාපෘති අංශය

(i) මාර්ග හා පාලම් වැඩවල තත්ත්ව පාලනය

පළාත් ක්ෂේත්‍ර රසායනාගාර 9ක් හරහා මාර්ග ඉදිකිරීමේදී සහ නඩත්තු කිරීමේදී සිදුවන කාර්යයේ තත්ත්ව පාලනය සඳහා උපදෙස් සහ සහාය ලබාදී ඇත.

(ii) පාදම් විමර්ශන

2021 වර්ෂය තුළදී පර්යේෂණ සහ සංවර්ධන අංශයේ විදුම් ඒකක දෙක සහ උප කොන්ත්‍රාත්කරු මඟින් (RMC - GEO LAB (Pvt) Ltd) පාලම් 10 ක් සඳහා පාදම් විමර්ශන සිදු කරන ලදී.

වගුව 19: 2021 වර්ෂයේ පාලම් ස්ථානවල සිදු කරන ලද භූමි විදුම් විමර්ශන

කාර්යය	2021 දී සිදුහැ විදුම් ගණන	වර්තමාන තත්ත්වය
ගාල්ල වක්වැල්ල පාලමේ භූමි විදුම් විමර්ශන	10	නිම කෙරිණි
නිකවැරටිය - මොරගොල්ලාගම - සියඹලන්ගමුව මාර්ගයේ (බී 326) පාලම අංක 49/4 හි භූමි විදුම් විමර්ශන	5	කිරීමට පවතින
වාලච්චානයි කලපුව හරහා යෝජිත පාලමේ භූමි විදුම් විමර්ශන	9	කිරීමට පවතින
කොළඹ - රත්නපුර - වැල්ලවාය - මඩකලපුව පාරේ අංක 101/6 පාලමේ භූමි විදුම් විමර්ශන (A004)	4	කිරීමට පවතින
උඩවලව - තණමල්විල මාර්ගයේ පාලම් අංක 20/4 සහ 16/1 හි භූමි විදුම් විමර්ශන	4	කිරීමට පවතින
මරදගහමුල්ල - බඩල්ගම මාර්ගයේ පාලම් අංක 4/6 හි භූමි විදුම් විමර්ශන	3	කිරීමට පවතින
පෑලියගොඩ - පුත්තලම මාර්ගයේ පාලම් අංක 38/2 හි භූමි විදුම් විමර්ශන	3	-සිදු කරමින් පවතින -
ගාල්ල - දෙනියාය - මාදම්පේ මාර්ගයේ පාලම් අංක 116/5 හි භූමි විදුම් විමර්ශන	2	නිම කෙරිණි

මීගමුව සිරිකුරුස පාලමේ භූමි විදුම් විමර්ශන	8	නිම කෙරිණි

අධ්‍යක්ෂ (ඉංජිනේරු සේවා) සහ සේවාදායකයින් විසින් ඉල්ලා ඇති භූමි විමර්ශන කටයුතුවල මුළු වටිනාකම රු. 6,343,167.02 කි.

වගුව 20: භූමි විමර්ශන වලින් ලැබුණු ආදායම් සාරාංශය (විදුම් කටයුතු)

මාසය	අධ්‍යක්ෂ ඉං.සේ විසින් ඉල්ලා සිටින ලද (රු.)	දායකයන් විසින් ඉල්ලා සිටින ලද (රු.)
ජනවාරි	877,799.93	
පෙබරවාරි		
මාර්තු	1,643,929.37	
අප්‍රේ,මැයි,ජුනි		250,000.00
ජූලි		400,000.00
අගෝස්තු		
සැප්තැම්බර්		268,382.88
ඔක්තෝබර්	641,571.55	50,000.00
නොවැම්බර්	1,308,257.79	
දෙසැම්බර්	503,954.10	
එකතුව	399,271.40	
ජනවාරි		
පෙබරවාරි	5,374,784.14	968,382.88

තවද, මෙම අංශය මාර්ග ව්‍යාපෘති සහ ක්ෂේත්‍ර නිලධාරීන් සඳහා මාර්ග ඉදිකිරීම්, ප්‍රතිසංස්කරණ හා නඩත්තු ශිල්පීය ක්‍රම පිළිබඳ උපදෙස් සහ සහාය ලබා දේ.

අ. මධ්‍යම රසායනාගාර සහ විමර්ශන (CL&I) අංශය

(i) සාමාන්‍ය ද්‍රව්‍ය පරීක්ෂාව

මධ්‍යම රසායනාගාරය විසින්, පස්, කළුගල්, ගං වැලි, තාර ද්‍රව්‍ය, සිමෙන්ති කොන්ක්‍රීට් ඝනක, ගැටි, මාර්ෂල් ආදර්ශ, ඇස්පෝල්ට් මිශ්‍රණ ගර්භ ආදර්ශන, මාර්ග සලකුණු ද්‍රව්‍ය හා වානේ ආදිය පරීක්ෂා කර වාර්තා කරන ලදී. තවද ක්‍රියාත්මක කෙරෙමින් පවතින ව්‍යාපෘති හා බාහිර ආයතන සඳහා ඇස්පෝල්ට් මිශ්‍රණ සැලසුම් සිදු කරනු ලැබිය.

පුද්ගලික ආයතන සහ මාර්ග සංවර්ධන අධිකාරියේ ව්‍යාපෘති හරහා ලබාගත් සාම්පල සඳහා වර්ෂය තුළ සිදු කරන ලද රසායනාගාර පරීක්ෂණවල මුළු වටිනාකම රු. 24,309,823.32 කි.තවද, මාර්ග සංවර්ධන අධිකාරියේ හි අංශ සඳහා වටිනාකම රු.5,825,577.56 වූ රසායනාගාර පරීක්ෂණ හා රු.285, 375.00.වූ පර්යේෂණ පරීක්ෂණයන් නොමිලේ සිදු කර ඇත.

වගුව 21: 2021 වර්ෂය තුල මධ්‍යම රසායනාගාර විසින් සිදු කරන ලද මාර්ග ඉදිකිරීම් ද්‍රව්‍ය හා මිශ්‍රණ සැලසුම් පරීක්ෂණවලින් ලැබුණු (සේවාදායක වැඩ සඳහා) ආදායම් සාරාංශය

මාසය	කොන්ක්‍රීට් රසායනාගාරය (රු.)	පස් රසායනාගාරය (රු.)	තාර රසායනාගාරය (රු.)	නවීකරණ පොලිමර් තාර රසායනාගාරය (රු.)	පී සහ වී රසායනාගාරය (රු.)	රසායන විද්‍යාගාරය (රු.)
ජනවාරි	979,025.85	108,720.00	1,679,656.35		582,991.13	102,500.00
පෙබරවාරි	303,213.17	85,701.42	1,198,041.46		315,315.20	
මාර්තු	511,191.36	116,170.00	1,371,792.32	142,805.00	299,264.30	51,048.79
අප්‍රේල්	103,885.00	18,495.00	1,491,795.00		447,637.54	
මැයි	33,548.79		891,525.00	73,890.00	119,760.25	10,000.00

ජූනි	41,655.00	25,525.00	1,679,255.00	31,810.00	285,489.95	
ජූලි	228,398.79	48,700.00	1,414,734.23		235,570.75	15,000.00
අගෝස්තු	198,571.43		473,285.00		336,235.36	30,000.00
සැප්තැම්බර්	512,363.00	4,130.00	1,361,170.00		176,070.38	
ඔක්තෝබර්	454,057.06	34,128.70	1,504,300.00	190,490.00	307,594.28	52,500.00
නොවැම්බර්	126,326.25		844,510.00		356,573.35	
දෙසැම්බර්	339,334.00	25,915.00	1,285,135.00	135,940.00	517,082.86	
එකතුව	**3,831,569.70**	**467,485.12**	**15,195,199.36**	**574,935.00**	**3,979,585.35**	**261,048.79**

වගුව 22 : 2021 වර්ෂය තුළ මධ්‍යම රසායනාගාර විසින් මාර්ග සංවර්ධන අධිකාරියේ කටයුතු වෙනුවෙන් (නොමිලේ) මාර්ග ඉදිකිරීම් ද්‍රව්‍ය සහ මිශ්‍ර සැලසුම් පරීක්ෂා කිරීම් සඳහා වැය කළ වටිනාකමේ සාරාංශය

මාසය	**කොන්ක්‍රීට් රසායනාගාරය (රු.)**	**පස් රසායනාගාරය (රු.)**	**තාර රසායනාගාරය (රු.)**	**පී සහ වී රසායනාගාරය (රු.)**
ජනවාරි		696,887.83	34,950.00	
පෙබරවාරි		76,478.84	25,855.00	
මාර්තු	18,645.00	1,482,939.05	291,660.00	
අප්‍රේල්	1,695.00	190,506.25	16,760.00	
මැයි			34,650.00	
ජූනි		642,008.93		
ජූලි	13,560.00	138,150.00	568,460.00	
අගෝස්තු			27,090.00	
සැප්තැම්බර්	1,695.00	64,450.00		72,375.00
ඔක්තෝබර්	19,125.00		41,230.00	33,528.51
නොවැම්බර්		731,499.24	137,455.00	14,475.00
දෙසැම්බර්	66,936.00	328,092.91	54,420.00	
එකතුව	**121,656.00**	**4,351,013.05**	**1,232,530.00**	**120,378.51**

වගුව 23: පර්යේෂණ කටයුතු සඳහා පරීක්ෂා සිදු කිරීමේ වටිනාකම්වල සාරාංශය (නොමිලයේ)

මාසය	**පස් රසායනාගාරය (රු.)**	**තාර රසායනාගාරය (රු.)**	PMB රසායනාගාරය (රු.)
ජනවාරි			
පෙබරවාරි			
මාර්තු			
අප්‍රේල්			
මැයි			
ජූනි			
ජූලි			
අගෝස්තු			
සැප්තැම්බර්	13,815.00		
ඔක්තෝබර්			
නොවැම්බර්			222,935.00
දෙසැම්බර්		29,910.00	18,715.00
එකතුව	**13,815.00**	**29,910.00**	**241,650.00**

ආ. මාර්ග සංවර්ධන අධිකාරියේ සහ වෙනත් ආයතනවල වැඩ සඳහා පාදම් විමර්ශන හා ඇතුරුම් සැලසුම්

(i) පාදම් විමර්ශන හා සැලසුම්

බෙන්කල්මන් බීම් උත්ක්‍රමණ පරීක්ෂණ, ගතික කේතු විනිවිදුම් පරීක්ෂණ, කැණීම් පරීක්ෂණ සහ පාංශු රසායනාගාර පරීක්ෂණ සහිත පාදම් පරීක්ෂණ මත පදනම් වූ ඇතුරුම් සැලසුම් සිදු කරන ලදී. 2021 වර්ෂය තුළ සිදු කරන ලද පාදම් පරීක්ෂණපරීක්ෂණ සහ සැලසුම් කටයුතු පිළිබඳ විස්තර පහත වගුවේ දක්වා ඇත;

වගුව 24: 2021 වර්ෂය තුළ සිදු කරන ලද පාදම් පරීක්ෂණ සහ සැලසුම් කටයුතු

විස්තරය/මාර්ග නම	කොටස	ප්‍රගතියේ තත්ත්වය
පට්ටිවිල - සපුගස්කන්ද මාර්ගය වැඩිදියුණු කිරීම	කි.මී. 0+000 සිට කි.මී. 3+100 දක්වා	නිම කර ඇත
නාගහමුල්ල සිට සපුගස්කන්ද දක්වා ගෝනවල මාර්ගය වැඩිදියුණු කිරීම	කි.මී. 0+000 සිට කි.මී. 3+500 දක්වා	නිම කර ඇත
මට්ටක්කුලි - උස්වැටකෙයියාව මාර්ගය	කි.මී. 3+660 සිට කි.මී. 4+015 දක්වා	නිම කර ඇත
පල්ලියවත්ත - ඇලකන්ද මාර්ගය	කි.මී. 2.0	නිම කර ඇත
ගාල්ල - බද්දේගම මාර්ගය (ඉරේගහ හන්දිය)	කි.මී. 6+420 සිට කි.මී. 7+980 දක්වා	නිම කර ඇත
කොළඹ - හංවැල්ල ලෝ ලෙවල් මාර්ගය අඹතලේ සිට හංවැල්ල දක්වා	කි.මී. 8+000 සිට කි.මී. 26+000 දක්වා	නිම කර ඇත
පෑලියගොඩ මත්ස්‍ය වෙළඳපොලට විකල්ප පිවිසුම් මාර්ගය	මී. 750 කොටස	නිම කර ඇත
නිට්ටඹුව - උරාපොල මාර්ගය මත ඇතිරුම් සිදු කිරීම	කි.මී. 0+000 සිට කි.මී. 8+000 දක්වා	නිම කර ඇත
මීගමුව - අළුත්පොල මාර්ගය මත ඇතිරුම් සිදු කිරීම	කි.මී. 0+000 සිට කි.මී. 13+200 දක්වා	නිම කර ඇත
කුරණ - තලාදුව මාර්ගය	කි.මී. 0+000 - කි.මී. 1+850 දක්වා	නිම කර ඇත
තුඩැල්ල - පමුණුගම - තලාහේන මීගමුව මාර්ගය	කි.මී. 8+000 සිට කි.මී. 20+110 දක්වා	නිම කර ඇත
අල්ලයි කන්තලෙයි මාර්ගය	කි.මී. 15+000 සිට කි.මී. 42+000 දක්වා	නිම කර ඇත
කොළඹ - ගාල්ල - හම්බන්තොට - වැල්ලවාය මාර්ගය	කි.මී. 293+000 සිට කි.මී. 318+000 දක්වා	සිදුවෙමින් පවතී
සපුගස්කන්ද හන්දිය	හන්දිය	නිම කර ඇත
අවිස්සාවේල්ල - හැටන් - නුවරඑළිය මාර්ගය	කි.මී. 0+800 සිට කි.මී. 42+640 දක්වා	සිදුවෙමින් පවතී
අම්පාර - උහන - මහඔය මාර්ගය	කි.මී. 33+040 සිට කි.මී. 55+400 දක්වා	නිම කර ඇත
දෙටගමුව බැම්ම මාර්ගය	කි.මී. 21+800 සිට කි.මී. 22+150 දක්වා	නිම කර ඇත
ගම්පහ - ජාඇල මාර්ගය (CEP 1- අතුරු මාර්ග)	කි.මී. 5+450 සිට කි.මී. 6+720 දක්වා	නිම කර ඇත
වේයන්ගොඩ රුවන්වැල්ල මාර්ගය (CEP 1- අතුරු මාර්ග)	කි.මී. 0+000 සිට කි.මී. 0+720 දක්වා	නිම කර ඇත
කලගෙඩිහේන - වේයන්ගොඩ මාර්ගය (CEP 1- අතුරු මාර්ග)	කි.මී. 0+000 සිට කි.මී. 0+320 දක්වා	නිම කර ඇත
සංඝරාජ මාවත	කි.මී. 0+000 සිට කි.මී. 2+500 දක්වා	නිම කර ඇත

විස්තරය/මාර්ග නම	කොටස	ප්‍රගතියේ තත්ත්වය
මීගමුව ගිරිඋල්ල මාර්ගය	කි.මී. 3+700 - කි.මී. 28+00 දක්වා	නිම කර ඇත
මට්ටක්කුලිය - උස්වැටකෙයියාව - පින්වත්ත මාර්ගය	කි.මී. 3+000 සිට කි.මී. 5+000 දක්වා	සිදුවෙමින් පවතී
මීගමුව - මීරිගම මාර්ගය	කි.මී. 0+000 to කි.මී. 32+280 දක්වා	නිම කර ඇත
හංවැල්ල - ඌරාපොල මාර්ගය	කි.මී. 0+000 සිට කි.මී. 24+000 දක්වා	නිම කර ඇත
වැලිකඩ බන්ධනාගාරය නැවත ස්ථානගත කරන ස්ථානය	අභ්‍යන්තර මාර්ගය	සිදුවෙමින් පවතී
තංගල්ල - වීරකැටිය මාර්ගය	කි.මී. 0+000 සිට කි.මී. 12+000 දක්වා	නිම කර ඇත
මාතර අකුරැස්ස මාර්ගය	කි.මී. 7+000 සිට කි.මී. 20+000 දක්වා	සිදුවෙමින් පවතී
මද්දවක - කැකනදුර - යටියන මාර්ගය	කි.මී. 0+000 සිට කි.මී. 14+500 දක්වා	නිම කර ඇත
හක්මන - බෙලිඅත්ත - තංගල්ල මාර්ගය	කි.මී. 2+000 සිට කි.මී. 11+100 දක්වා	නිම කර ඇත
ඇඹිලිපිටිය - හුලංදාව - මිද්දෙණිය මාර්ගය	කි.මී. 3+400 සිට කි.මී. 13+000 දක්වා	සිදුවෙමින් පවතී
අධිවේගී පිවිසුමට සමාන්තර මාර්ගය	කි.මී. 8	නිම කර ඇත
කටුගස්තොට කුරුණෑගල පුත්තලම මාර්ගය	කි.මී. 93+850 සිට කි.මී. 124+700 දක්වා	සිදුවෙමින් පවතී
පේරාදෙණිය හල්ලොලුව කටුගස්තොට මාර්ගය	3+000 සිට 10+000 දක්වා	නිම කර ඇත
කිරිබත්ගොඩ - සපුගස්කන්ද මාර්ගය	0+000 සිට කි.මී. 5+000 දක්වා	නිම කර ඇත
පැරණි මීගමුව මාර්ගය සහ ජා ඇල ඒකල ගම්පහ යක්කල මාර්ගය	කි.මී. 0 සිට කි.මී. 0.95 දක්වා සහ කි.මී. 2.0 සිට කි.මී. 2.75 දක්වා	සිදුවෙමින් පවතී
කොළඹ-රත්නපුර වැල්ලවාය (A040)	කි.මී. 194+000 - කි.මී. 205+000	සිදුවෙමින් පවතී
විලියම් ගොපල්ලෝ මාවත	කි.මී. 1+600 සිට කි.මී. 3+700 දක්වා	නිම කර ඇත
කටුනායක EPZ පිවිසුම් මාර්ගය	කි.මී. 0+660 සිට කි.මී. 1+200 දක්වා	සිදුවෙමින් පවතී
වැලිහේන - කටාන මාර්ගය	0+000 සිට 5+020 දක්වා	සිදුවෙමින් පවතී
කරඬුපන - රඹුක්කන මාර්ගය	කි.මී. 0+000 සිට කි.මී. 8+817 දක්වා	සිදුවෙමින් පවතී
අංගොඩ - කොස්වත්ත මාර්ගය	අංගොඩ සිට කොස්වත්ත දක්වා	ආරම්භ කර නොමැති
සිරිපුර හන්දිය සිට රාජාංගන වාන් දැමීම	කි.මී. 0 සිට කි.මී. 29.3 දක්වා	නිම කර ඇත
බුත්තල නගර සංවර්ධන මාර්ගය	හන්දිය	ආරම්භ කර නොමැති
රාජගිරියේ නව පාලම	මී. 700	නිම කර ඇත
කටුගස්තොට අතුරු මාර්ගය	කි.මී. 0+000 සිට කි.මී. 0+546 දක්වා	සිදුවෙමින් පවතී
නගර මධ්‍ය සංවර්ධන ව්‍යාපෘතිය - වරකාපොල	550 m	ආරම්භ කර නොමැති
වේලිකුලම - මාමඩුව මාර්ගය	කි.මී. 0+000 සිට කි.මී. 7+977 දක්වා	සිදුවෙමින් පවතී
හැටන් - මස්කෙළිය - ඩෙල්හවුස්	කි.මී. 0+000 සිට කි.මී. 1+800	සිදුවෙමින් පවතී

විස්තරය/මාර්ග නම	කොටස	ප්‍රගතියේ තත්ත්වය
	දක්වා	
වාලුක්කියාරු - පුංකුඩුතිව් මාර්ගය	කි.මී. 0+000 සිට කි.මී. 3+000 දක්වා	සිදුවෙමින් පවතී
විවිධ විදේශ ආධාර ව්‍යාපෘති		
ගාල්ල - දෙනියාය - මාදම්පේ මාර්ගය	කි.මී. 78+000 සිට කි.මී. 112+000 දක්වා	සිදුවෙමින් පවතී
අධිවේගී මාර්ග ව්‍යාපෘති		
මාකුඹුරේ කිරුම් පාලම	මාකුඹුර	නිම කර ඇත
CEP කොටස 3	0+000-32+450	සිදුවෙමින් පවතී
iRoad ව්‍යාපෘතිය		
නාවට්කුලම් - කර්ට්ව් - මන්නාරම මාර්ගය	කි.මී. 9+500 සිට කි.මී. 25+000 දක්වා	සිදුවෙමින් පවතී
මාන්කුලම් - වෙල්ලන්කුලම් මාර්ගය	කි.මී. 10+500 සිට කි.මී. 17+000 දක්වා	සිදුවෙමින් පවතී
කිලෝමීටර 100,000 ව්‍යාපෘතිය		
වෝටර්ස් එජ් හි යෝජිත විනෝද උද්‍යානය වෙත මහජන ප්‍රවේශය	මී. 170	නිම කර ඇත
දොන්ගල්පිටිය දොන් බොස්කෝ අභ්‍යන්තර මාර්ගය	අභ්‍යන්තර මාර්ගය (මී. 560)	නිම කර ඇත

(ii) 2021 වර්ෂය තුළ පාදිකා සැලසුම් සමාලෝචනය

2021 වර්ෂය තුළ පහත සඳහන් මාර්ග කොටස්වල පාදිකා සැලසුම් සමාලෝචනය කරන ලදී.

1. පේරාදෙණිය - ගලහ - දෙල්තොට මාර්ගය (කි.මී. 0+000 සිට කි.මී.5+000)\
2. ඇල්ලි කන්තලෙයි මාර්ග කොටස (කි.මී.13+000 සිට කි.මී.15+000 දක්වා)
3. කණ්ඩලම සිට හද්දලමුල්ල (AB 29) මාර්ගය
4. හද්දලමුල සිට ගිරිඋල්ල දක්වා (B 322) මාර්ගය
5. විලකටුවිට – ගනේවත්ත – කුඹුක්ගැටේ මාර්ගය
6. ගුළුගොල්ල - දොඹේමඩ - වහව (B 475) මාර්ගය
7. දනිකිත - අඹන්පොල (බී 089) මාර්ගය
8. ගල්ගමුව - නිකවැව (B 126) මාර්ගය
9. ගල්ටන්වැව - හිරිටිය (බී 423) මාර්ගය
10. නිකවැරටිය - මොරගොල්ලාගම - සියඹලන්ගමුව (බී 326) මාර්ගය
11. විලකටුපොත-ගණේවත්ත-කුඹුක්ගැටේ මාර්ගය
12. නිකවැරටිය - මොරගොල්ලාගම - සියඹලන්ගමුව (B 326) මාර්ගය (කි.මී.41+700 - කි.මී.45+300)
13. රට මැද මාර්ගය
14. පස්යාල – ගිරිඋල්ල මාර්ගය
15. කුරුණෑගල වටරවුම් මාර්ගය (කි.මී.6+315 – 9+610)
16. කෙරොලිනා - නෝටන් - වනරාජ මාර්ගය
17. කොහුවල ගුවන් පාලම
18. කොළඹ - හංවැල්ල මාර්ගය
19. මහකෙළිය – කටුපොත (කි.මී.0+000 – 5+000) මාර්ගය
20. ගැටඹේ ගුවන් පාලම
21. ලිඳුල – ආගරපතන (කි.මී.0+000 – 6+500) මාර්ගය
22. වාලුක්කියාරු – පුංකුඩතිව් මාර්ගය (AB -39, කි.මී.0+000 – 3+000)
23. පල්ලෙබැද්ද - මඩගංඔය - වැලිගෙපොල මාර්ගය

24. ආනන්ද බෝගහ හන්දිය සිට මඩලගම – මහල්වතුර මාර්ගය
25. ගල්බොඩ මහවෙලතැන්න ඉඹුලමුර රජවක මාර්ගය
26. අම්බලන්වත්ත කලලඇල්ල පනාපිටිය මාර්ගය
27. මදුරන්කුලිය – ආණ්ඩියගම මාර්ගය (9+700 – 21+900)

2021 වර්ෂය තුළ සිදු කළ මාර්ග සහ ක්ෂේත්‍ර රසායනාගාර පරීක්ෂා කිරීම

- පට්ටිවිල - සපුගස්කන්ද මාර්ගය
- නාගහමුල්ල සිට සපුගස්කන්ද දක්වා ගෝනවල මාර්ගය
- කණ්ඩලම - ගිරිඋල්ල මාර්ගය
- නිට්ටඹුව - ඌරාපොල මාර්ගය
- මීගමුව - අළුත්පොල මාර්ගය
- උඩුගම්පොල - දිවුලපිටිය මාර්ගය
- හොරණ සතිපොල
- ගාල්ල සහ මීගමුව ක්ෂේත්‍ර රසායනාගාරය පරීක්ෂා කිරීම
- අල්ලයි කන්තලේ මාර්ගය
- තුඩැල්ල - පමුණුගම - මීගමුව මාර්ගය
- ගාල්ල - බද්දේගම මාර්ගය
- තුඩැල්ල - පමුණුව - තලාහේන - මීගමුව මාර්ගය
- පෑලියගොඩ මත්ස්‍ය වෙළඳපොලට පිවිසීමේ මාර්ගය
- කුරණ - තල්දූව මාර්ගය
- මහනුවර සහ ගාල්ල ක්ෂේත්‍ර රසායනාගාරය පරීක්ෂා කිරීම
- කුලියාපිටිය - පාණ්ඩිවෙල මාර්ගයේ සිසිල් තාර මිශ්‍රණ ඇතිරීම පරීක්ෂා කිරීම
- කොළඹ-ගාල්ල-හම්බන්තොට - වැල්ලවාය මාර්ගය (කි.මී.293 සිට කි.මී.318 දක්වා)
- දෙතටුගම වැව මාර්ගය
- අවිස්සාවේල්ල - හැටන් මාර්ගය
- අම්පාර – උහන – මහඔය (කි.මී.37+500 -55+000) මාර්ගය
- දොන් බොස්කෝ පල්ලිය මාර්ගය
- කුලියාපිටිය - පාණ්ඩිවෙල මාර්ගය පරීක්ෂා කිරීම සහ හරස් කිරීම
- ගල්ගමුව - නිකවැව මාර්ගය
- මරදන්කඩවල - හබරණ - තිරික්කුණ්ඩියාඩුමඩු මාර්ගයේ අසාර්ථක කොටස් පරීක්ෂා කිරීම
- සංඝරාජ මාවත - මහනුවර
- හංවැල්ල - ඌරාපොල මාර්ගය (කි.මී.0+000 – 24+000)
- ගාල්ල අධිවේගී පිවිසුම සමාන්තර මාර්ගය
- මාදම්පේ - කුලිගොඩ මාර්ගය
- කිරිබත්ගොඩ - සපුගස්කන්ද මාර්ගය
- කටුනායක - වේයන්ගොඩ මාර්ගය
- අම්බලන්ගොඩ මගනැගුම තාර පරීක්ෂාව
- කරඩුපාන - රඹුක්කන මාර්ගය
- කටුගස්තොට අතුරු මාර්ගය
- කටුගස්තොට – කුරුණෑගල – පුත්තලම මාර්ගය (කි.මී.93+000 – 124+000)
- මාන්කුල - වෙල්ලන්කුලම් මාර්ගය (B 269)
- නාවට්කුලි - කාරතිව් - මන්නාරම මාර්ගය (A032)
- පරන්තන් - පූනකරි මාර්ගය (B357)
- මාතර - අකුරැස්ස මාර්ගය
- මාතර - මැද්දවත්ත - යටියන මාර්ගය
- මාවනැල්ල අතුරු මාර්ගයේ උණුසුම් තාර මිශ්‍රණ ඇතිරීම (පර්යේෂණ කටයුතු) පරීක්ෂා කිරීම

- කුලියාපිටිය - පාණ්ඩිවෙල මාර්ගයේ සිසිල් තාර මිශ්‍රණ ඇතිරීම (පර්යේෂණ කටයුතු) පරීක්ෂා කිරීම
- යාපනය - පොන්නුලෙයි පේදුරුතුඩුව මාර්ගය
- අගලවත්ත විධායක ඉංජිනේරු කොට්ඨාශයේ උතුම්ගම බොරළු මාර්ගය
- අගලවත්ත විධායක ඉංජිනේරු කොට්ඨාශයේ ඕමන්ත දේවගෙදර වත්ත බොරළු මාර්ගය

පර්යේෂණ ව්‍යාපෘති

i. ශ්‍රී ලංකාව තුළ යාන්ත්‍රික - ආනුභවික පාදම් සැලසුම් මාර්ගෝපදේශය (MEPDG) ක්‍රියාත්මක කිරීම සඳහා ස්ථානීය පරීක්ෂණ සහ දර්ශක ගුණාංගවලින් නොබැඳි පාදම් වේදිකාවේ මාපාංකය ඇගයීම.
ii. ශ්‍රී ලංකාවේ පස සහ පාරිසරික තත්ත්වය සඳහා DCP සහ CBR අතර සහසම්බන්ධතාව වර්ධනය කිරීම.
iii. උණුසුම් තාර මිශ්‍රණ සහ තුනී පටල තාර මිශ්‍ර කිරීමේ සහ සංයුක්ත කිරීමේ උෂ්ණත්වය තක්සේරු කිරීම (මාවනැල්ල අතුරු මාර්ගයේ උණුසුම් ඇස්ෆල්ට් මිශ්‍රණය ඇතිරීම සිදු කර ඇත)
iv. මාර්ග ඉදිකිරීම් කටයුතු සඳහා මුහුදු වැලි භාවිතා කිරීමේ හැකියාව ඇගයීම
v. LAAV, අංශු ප්‍රමාණය ව්‍යාප්තිය, සිදුරු සහිත ඇස්ෆල්ට් වල නිශ්චිත ගුරුත්වාකර්ෂණය ඇගයීම.
vi. බිටුමන් අන්තර්ගතය, ස්ථායීතාවය සහ සිසිල් ඇස්ෆල්ට් මිශ්‍රණ ප්‍රවාහනය ඇගයීම.
vii. මිශ්‍ර සැලසුම් ක්‍රියා පටිපාටිය සත්‍යාපනය කිරීම සඳහා සුපිරි පේව් මිශ්‍ර සැලසුම.
viii. මාර්ග ඉදිකිරීම් කටයුතු සඳහා උමාඔය උමං මඩ යොදා ගැනීම.
ix. අබලි ප්ලාස්ටික් සමඟ මිශ්‍ර වූ බිටුමන් ගුණාංග ඇගයීම - අබලි ප්ලාස්ටික් සමඟ නවීකරණය කරන ලද බොරුපන මාර්ගයේ කාර්ය සාධන ඇගයීම පරීක්ෂා කිරීම සඳහා හර කැපීම (Core cutting) සිදු කර ඇත.
x. සිසිල් මිශ්‍රණය සහ ඇස්පෝල්ට් කොන්ක්‍රීට් දැමීමේ පිරිවැය සංසන්දනය කිරීම (සිසිල් මිශ්‍රණය කුලියාපිටිය - පඩිවෙල මාර්ගයේ යොදා ගෙන ඇත).
xi. මාර්ග ඉදිකිරීම් කටයුතු සඳහා 'bottom ash' (අපද්‍රව්‍යවල සිට බලශක්ති බලාගාරය දක්වා) භාවිතා කිරීමේ හැකියාව.

පුහුණු වැඩසටහන්

පාදම් සැලසුම් කිරීම පිළිබඳව ඉංජිනේරුවන් සඳහා පුහුණු වැඩසටහනක් පැවැත්විණි.

ජයග්‍රහණ

- පර්යේෂණ හා සංවර්ධන අංශය විශ්වාසදායක සහ හොඳින් සන්නද්ධ මධ්‍යම රසායනාගාරයක් සමඟ අධිවේගී මාර්ග ඉදිකිරීමේ සහ නඩත්තු කිරීමේ තත්ත්ව පාලන සහ තත්ත්ව සහතික කිරීමේ අංගයන් සඳහා පහසුකම් සපයන ප්‍රධාන ආයතනය ලෙස ක්‍රියා කරන අතර කොන්ක්‍රීට් කියුබ් සම්පීඩ්‍යතා ශක්තිය පරීක්ෂා කිරීම, තාර විනිවිද යාම සහ මෘදු කිරීමේ ලක්ෂ්‍ය පරීක්ෂාව, පාංශු තෙතමනය අන්තර්ගතය පරීක්ෂා කිරීම සහ පොලිමර් නවීකරණය කරන ලද බිටුමන් සඳහා ගතික දුස්ශ්‍රාවිතව පරීක්ෂාව සඳහා ISO 17025:2005 ප්‍රතීතනය ලබා ගෙන ඇත. තවද, එය 2021 දී ඉහත පරීක්ෂණ සඳහා ISO 17025:2017 බලපත්‍රය අලුත් කර ඇත. මෙම බලපත්‍රය 2024 මැයි 30 දක්වා වලංගු වේ.
- යාන්ත්‍රික - ආනුභවික පදික වේදිකාවේ සැලසුම් ක්‍රියාත්මක කිරීමේ සැලැස්ම අදියර I දැනටමත් සම්පූර්ණ කර ඇති අතර II අදියර සහ III අදියර ADB ණය 3579/3580 SRI: දෙවන ඒකාබද්ධ මාර්ග ආයෝජන වැඩසටහන - RDA/ADB/I ROAD-2/ME/IC2 යටතේ ආරම්භ කරන ලදී.
- ක්‍රියාත්මක මාර්ග ඉදිකිරීමේ සහ නඩත්තු කිරීමේ නව පිරිවිතර ඇතුළුව නව පර්යේෂණ ප්‍රදේශ සංවර්ධනය වැනි පර්යේෂණ සහ සංවර්ධන අංශයේ ධාරිතාව වැඩි දියුණු කිරීම සඳහා I road ව්‍යාපෘතියේ අරමුදල් යටතේ ද්‍රව්‍ය පිළිබඳ උපදේශක ඉංජිනේරුවරයෙකු පත් කරන ලදී.

5. මාර්ග හා පාලම් වැඩවලදී තත්ත්ව ආරක්ෂණය හා ප්‍රගතිය අධීක්ෂණය කිරීම

තත්ත්ව සහතික හා ප්‍රගති අධීක්ෂණ අංශය මාර්ග සංවර්ධන අධිකාරිය යටතේ සිදු කරන සියලුම වැඩවල තත්ත්වය සහතික කිරීම හා ප්‍රගතිය අධීක්ෂණය කිරීමේ වගකීම දරයි. මෙම කාර්ය හා සම්බන්ධව පහත දැක්වෙන කාර්යයන් සිදු කරනු ලබයි;

- නිම කරන ලද සහ ක්‍රියාත්මක කරමින් පවතින වැඩ පිළිබඳ අහඹු පරීක්ෂාවන් සිදු කිරීම හා වැඩ කොන්ත්‍රාත් පිරිවිතරයන්ට අනුව සිදුවේ දැයි කොන්ත්‍රාත්කරුට සහතික කිරීම සඳහා ස්වාධීන පරීක්ෂාවන් සිදු කිරීම. පිරිවිතරයන්ට අනුව තත්ත්ව අවශ්‍යතාවයන්ට කිසියම් අනනුකූලවීමක් වේ නම් එය අදාළ අධ්‍යක්ෂ/ව්‍යාපෘති අධ්‍යක්ෂ/ පළාත්භාර අධ්‍යක්ෂ මෙන්ම මාර්ග සංවර්ධන අධිකාරියේ කළමනාකාරිත්වයට දැනුම් දීම.
- පිරිවිතර අවශ්‍යතාවයන්ට අනුව වැඩබිමට ගුණාත්මක ද්‍රව්‍යයන් සැපයීම අහඹු ලෙස පරීක්ෂාව.
- අධ්‍යක්ෂවරුන්, ව්‍යාපෘති අධ්‍යක්ෂවරුන් යටතේ ඇති ව්‍යාපෘති කළමනාකරණ ඒකක, පළාත්භාර අධ්‍යක්ෂවරුන් හා උපදේශකයන් විසින් පිළියෙළ කරන සියලුම ප්‍රගති වාර්තා ලබා ගෙන නිවැරදිතාවය පරීක්ෂා කර අහඹු ලෙස වාර්තා කිරීම.
- මාර්ග සංවර්ධන අධිකාරියේ ඒකාබද්ධ ප්‍රගති වාර්තා මාසිකව පිළියෙළ කිරීම හා මාර්ග සංවර්ධන අධිකාරියේ අධ්‍යක්ෂ මණ්ඩලය වෙත වාර්තා ඉදිරිපත් කිරීම.
- සියලුම කොන්ත්‍රාත්වල වැඩ ක්‍රියාත්මක කිරීම සඳහා කොන්ත්‍රත්වරුන් විසින් පිළියෙළ කරන ලද මූලික ඉදිකිරීම් වැඩසටහන පරීක්ෂාව, වැඩ සටහන සංශෝධනය කිරීමේ අවශ්‍යතාව තක්සේරු කිරීම හා කොන්ත්‍රාත්කරුවන් විසින් වැඩ සටහනට අනුකූල වීම පරීක්ෂා කිරීම ප්‍රගතියේ කිසියම් අඩුපාඩු වේ නම්, අධ්‍යක්ෂවරුන්ට, ව්‍යාපෘති අධ්‍යක්ෂවරුන්ට, පළාත්භාර අධ්‍යක්ෂවරුන්ට හා උපදේශකයන්ට වාර්තා කිරීම.

2021 වර්ෂය තුළ ක්‍රියාත්මක කළ කටයුතුවල ප්‍රගතිය

- අහඹු ලෙස තෝරාගත් ව්‍යාපෘති/අපේක්ෂිත ප්‍රගතියට අනුව දුර්වල ප්‍රගතිය සහිත ව්‍යාපෘති හෝ මාර්ග සංවර්ධන අධිකාරියේ අධ්‍යක්ෂ ජනරාල් හෝ සභාපති විසින් පවරන ලද ව්‍යාපෘති පරීක්ෂාවන් සිදු කිරීම හා තාක්ෂණික විගණන වාර්තා ඉදිරිපත් කිරීම.

වගුව 25: 2021 දී සිදු කරන ලද තාක්ෂණික විගණන

අංකය	ව්‍යාපෘතියේ නම	වැඩබිම් පරීක්ෂා දිනය
1	බුලත්කොහුපිටිය මාර්ග I අදියර වැඩිදියුණු කිරීම (කි.මී. 24+000 – 25+500)	08/02/2021
2	බුලත්කොහුපිටිය මාර්ග අදියර II වැඩිදියුණු කිරීම (කි.මී. 25+500 - 27+000)	08/02/2021
3	කෝට්ටේ - බෝපේ මාර්ගය වැඩිදියුණු කිරීම (කි.මී. 16+740- කි.මී. 28+0004) (බී240)	01/03/2021 සහ 12/03/2021
4	අවිස්සාවේල්ල - හොටන්-නුවරඑළිය මාර්ගය වැඩිදියුණු කිරීම (කි.මී. 98+900- කි.මී.108+490) (බී240)	30/03/2021
5	කොට්ටාව - තලගල්ල මාර්ගය වැඩිදියුණු කිරීම (කි.මී. 1+020 – කි.මී. 15+240 (බී239)	22/04/2021
6	නුවරඑළිය – රාගල – උඩපුස්සැල්ලාව මාර්ගය වැඩිදියුණු කිරීම (කි.මී. 19+000 සිට කි.මී 46+000)	09/12/2021
7	වැලිමඩ - කර්ක්ලීස් මාර්ගය වැඩිදියුණු කිරීම (කි.මී. 0+000 සිට කි.මී .17+500)	24/12/2021

- වැලිවේරිය - කිරිඳිවැල මාර්ගය (කි.මී. 0 සිට 6 දක්වා) සඳහා 2021.04.11 දින තත්ත්ව සමීක්ෂණය සිදු කරන ලදී.
- 2021 වර්ෂය තුළ කොවිඩ් -19 වසංගතය හේතුවෙන් මාර්ග සංවර්ධන අධිකාරියේ "මහනැගුම මහමඳුර" වෙත දැන් සනීපාරක්ෂක දියර සැපයීම සඳහා පහත සඳහන් සැපයුම් කොන්ත්‍රාත්තු දෙකක තත්ත්ව සහතික කිරීම සිදු කර ඇත.
    - Royal Paints Lanka (පුද්ගලික) විසින් මිලි ලීටර් 500 බෝතල්වල දැන් සනීපාරක්ෂක දියර බෝතල් 5000ක් සැපයීම.
    - MW Lifesciences (Pvt) Ltd විසින් මිලි ලීටර් 500 බෝතල්වල දැන් සනීපාරක්ෂක දියර බෝතල් 5000ක් සැපයීම.
- අධ්‍යක්ෂවරුන් විසින් සහ ව්‍යාපෘති අධ්‍යක්ෂවරුන් යටතේ ඇති ව්‍යාපෘති ක්‍රියාත්මක කිරීමේ ඒකක විසින් ඉදිරිපත් කරන ලද ප්‍රගතිය මත පදනම්ව ඒවායෙහි ඒකාබද්ධ ප්‍රගතිය සෑම මසකම අධ්‍යක්ෂ මණ්ඩලයට වාර්තා කරන ලදී.
- සියලුම කොන්ත්‍රාත්තු වල ප්‍රගති වාර්තා පරීක්ෂා කර කිසියම් අඩුපාඩුවක් පැවතියේ නම් ඒවා අධ්‍යක්ෂවරුන් / ව්‍යාපෘති අධ්‍යක්ෂවරුන් වෙත වාර්තා කරන ලදී.

6. මාර්ග ආරක්ෂාව සහ රථවාහන කළමනාකරණය

මාර්ග සංවර්ධන අධිකාරියේ හි "යටිතල පහසුකම්, මාර්ග ආරක්ෂාව සහ රථවාහන කළමනාකරණ අංශය (IRSTM)" 2021 අප්‍රේල් මාසයේදී පිහිටුවන ලද අතර, ශ්‍රී ලාංකේය ජාතික මාර්ග සහ අධිවේගී මාර්ගවල ගුණාත්මක භාවය ඉහළ නැංවීම සඳහා අත්‍යවශ්‍ය වැදගත්කමක් ඇති විෂයයන් ලෙස සලකනු ලබන මාර්ග දෙපස යටිතල පහසුකම්, මාර්ග ආරක්ෂාව සහ රථවාහන කළමනාකරණය සම්බන්ධ කාර්යයන් ඒකාබද්ධ කරයි. ඒ අනුව, මීට පෙර මාර්ග සංවර්ධන අධිකාරියේ හි අධිවේගී මාර්ග සැලසුම් අංශය යටතේ පැවති අදාළ කාර්යයන් මෙම නව අංශය වෙත පැවරිණි.

මෙම අංශය ජාතික මාර්ග ජාලය තම දෛනික කටයුතු සහ ක්‍රියාකාරකම් සඳහා භාවිත කරන්නන්ගේ ලාභදායිත්වය ඉහළ නැංවීම සඳහා මාර්ග යටිතල පහසුකම් උපායමාර්ගික සහ උපායශීලී කළමනාකරණය සඳහා කැපවී සිටී. සියලුම මාර්ග භාවිතා කරන්නන් සඳහා මාර්ග ප්‍රවාහනය ආශ්‍රිත පිරිවැය ප්‍රශස්ත කිරීම සහ රථවාහන අනතුරු සඳහා සාධකයක් විය හැකි මාර්ගවල දෝෂ අවම කිරීම සඳහා මාර්ග ආරක්ෂාව අඛණ්ඩව වැඩි දියුණු කිරීම, යටිතල පහසුකම්, මාර්ග ආරක්ෂාව සහ රථවාහන කළමනාකරණ අංශයේ විෂය පථය මගින් සමගාමීව ආමන්ත්‍රණය කෙරේ.

ජාතික මාර්ග ජාලයේ ආර්ථික හා ආරක්ෂිත භාවිතය වෙනුවෙන් යටිතල පහසුකම්, මාර්ග ආරක්ෂාව සහ රථවාහන කළමනාකරණ අංශයේ වගකීම් ඉටු කිරීමේදී අවධානම් කළමනාකරණ පද්ධති සහ ක්‍රියා පටිපාටි අවශ්‍ය වනු ඇත:

- නව මාර්ග වැඩ සඳහා සැලසුම් කිරීමේදී උපකල්පනය කරන ලද මාර්ග භාවිතා කරන්නන්ගේ හැසිරීම් මට්ටම සාක්ෂාත් කර ගැනීමට සහාය වීම;
- පවතින ජාලයේ ආරක්ෂිත සහ කාර්යක්ෂම ක්‍රියාකාරීත්වය සාක්ෂාත් කර ගැනීම සඳහා අවශ්‍ය හැසිරීම් මට්ටම පවත්වා ගැනීමට සහාය වීම;
- මාර්ග ජාල කළමනාකරණයේ ප්‍රධාන අරමුණු ලෙස මාර්ග ආරක්ෂාව සහ රථවාහන කළමනාකරණය පිළිගැනීම;
- මාර්ග ජාලයේ ප්‍රමාණවත් නිත්‍ය ආරක්ෂාව සහ රථවාහන කළමනාකරණ පරීක්ෂාවන් සඳහා සැපයීම;
- අනාරක්ෂිත හෝ අකාර්යක්ෂම රථවාහන කළමනාකරණ තත්ත්වයන් අනාවරණය වූ විට ගත යුතු පියවර සඳහන් කිරීම.

උපායමාර්ගික අරමුණු

- මාර්ග තදබදය සහ මාර්ග ආරක්ෂණ කළමනාකරණ කාර්යයන්/මෙවලම් සැලසුම් කිරීම, ක්‍රියාත්මක කිරීම සහ සංවර්ධනය කිරීමෙහි නිරත වීම
    - ස්වයංක්‍රීය රථවාහන කළමනාකරණ පද්ධතිය
    - මාර්ග ආරක්ෂාව සඳහා ජාත්‍යන්තර මාර්ග තක්සේරු වැඩසටහන
    - ප්‍රවාහන සම්බන්ධතා සහ වත්කම් කළමනාකරණ වැඩසටහන
        - බිඳවැටීම් දත්ත කළමනාකරණය සහ විශ්ලේෂණය
        - මාර්ග හා අදාළ භාණ්ඩ ඉන්වෙන්ටරි කළමනාකරණය

උපායික අරමුණු

- ජාතික මාර්ග ජාලයේ මාර්ග ගමනාගමනය සහ මාර්ග ආරක්ෂණ කටයුතු සම්බන්ධීකරණය සහ කළමනාකරණය.
    - වගකීම අර්ථ දැක්වීම: මෙයින් අදහස් කරන්නේ ජාතික මාර්ග ජාලයේ රථවාහන කළමනාකරණය සහ මාර්ග ආරක්ෂණ කළමනාකරණය සඳහා වගකිව යුතු ධූරාවලි තනතුරු නම් කිරීමයි.
    - රජයේ ක්‍රියාවන් ආරම්භ කිරීම හා සම්බන්ධීකරණය කිරීම සඳහා කාර්යය පැවරීම. පුද්ගලික අංශයේ ඉහළ මට්ටමේ සිවිල් සේවකයෙකු හෝ ඉහළ මට්ටමේ විධායක අධ්‍යක්ෂවරයෙකු විසින් මෙහෙයවනු ලබන බහුවිධ කණ්ඩායමක් පිහිටුවීම;
    - ක්‍රියාමාර්ග මෙහෙයවීම සඳහා ස්ථිර කණ්ඩායමක් පිහිටුවීම (උදා: ජාතික මාර්ග ආරක්ෂණ සභාවක් [NRSC] හෝ නිලධාරීන්ගේ කමිටුවක්);
    - NRSC සඳහා එහි කාර්යය ඉටු කිරීම සඳහා ප්‍රමාණවත් තාක්ෂණික හා මූල්‍ය සම්පත් සැලසුම් කිරීම සහ පැවරීම; සහ
    - ක්‍රියාවන්ගේ ප්‍රතිඵල ඇගයීම.

- මාර්ග යටිතල පහසුකම් ආරක්ෂාව, ඉඩම් පරිහරණය සහ මාර්ග වෙන්කිරීම් හා ඒවාට යාබද ඉඩමවලින් ප්‍රවේශ වීම පාලනය සහ වේග සීමාව සැකසීම,
- මාර්ග ගමනාගමනය සහ මාර්ග ආරක්ෂාව සම්බන්ධයෙන් ජාතික මාර්ග ජාලයේ තත්ත්ව කළමනාකරණය

අංශයේ කාර්යයන් සහ වගකීම්

අ) යටිතල පහසුකම් කළමනාකරණය

"යටිතල පහසුකම් කළමනාකරණය" කාර්යය යටතේ එන ප්‍රධාන වගකීම් වන්නේ;

- සුදුසු සහ අවශ්‍ය ස්ථානවල මාර්ග දෙපස යටිතල පහසුකම් ඉදිකිරීම මගින් පවතින මාර්ග ජාලයේ ගුණාත්මක භාවය ඉහළ නැංවීම,
- ජාතික මාර්ග ජාලයේ ඇති සියලුම මාර්ග භාවිතා කරන්නන් සඳහා පෙනෙන ඒකාකාරී බව සහ සෞන්දර්යාත්මක පෙනුමට ඉඩ සැලසෙන පරිදි ජාතික මාර්ගවල මාර්ග දෙපස සංවර්ධනය කිරීම,
- ආනතියෙන් තොර මාර්ග පරිශීලක අත්දැකීමක් සඳහා මාර්ග තදබදය අවම කිරීමේ පියවරයන් භාවිතා කිරීම.

යටිතල පහසුකම් කළමනාකරණ කාර්යය යටතේ සිදු කරනු ලබන මාර්ග සංවර්ධනවල ප්‍රධාන වර්ග පහත දැක්වේ.

- විවේක ගත හැකි ස්ථාන හෝ විවේක ස්ථාන
- නොදියුණු (ග්‍රාමීය) ප්‍රදේශ වල මාර්ග පැති
- සංවර්ධිත ප්‍රදේශ වල මාර්ග පැති
- නගර ප්‍රදේශවල මාර්ග දෙපස (මංසන්ධි/ මාරු ස්ථාන)
- බස් බේ පෙදෙස් සඳහා මාර්ග දෙපස සංවර්ධනය
- පදික මාරු ප්‍රදේශ සඳහා මාර්ග දෙපස සංවර්ධනය

ඉහත කරුණු වලට අමතරව, අදාළ ව්‍යාපෘති අංශ සමඟ සම්බන්ධීකරණය කිරීම සහ අවශ්‍ය මාර්ගෝපදේශ සහ නිර්දේශ සැපයීම IRSTM අංශය යටතේ යටිතල පහසුකම් කළමනාකරණ කාර්යයේ වගකීමකි.

ආ) මාර්ග ආරක්ෂාව කළමනාකරණය

"මාර්ග ආරක්ෂණ කළමනාකරණය" කාර්යය යටතේ ඇති ප්‍රධාන වගකීම් පහත දැක්වේ.

i. කළු ලප වැඩි දියුණු කිරීම

- ජාතික මාර්ග ජාලය ඔස්සේ අනතුරු දත්ත විශ්ලේෂණය
- කළු ලප සහිත ස්ථානයට ප්‍රමුඛත්වය දීම
- අවශ්‍ය ක්ෂේත්‍ර සමීක්ෂණ පැවැත්වීම
- වැඩිදියුණු කිරීම සඳහා අධ්‍යයන වාර්තාව සහ සැලසුම් සකස් කිරීම

ii. අනතුරුදායක ස්ථාන වැඩිදියුණු කිරීම

- අනතුරුදායක ස්ථානය සඳහා දත්ත රැස් කිරීම
- අනතුරුදායක ස්ථාන වර්ගීකරණය
- අවශ්‍ය ක්ෂේත්‍ර සමීක්ෂණ පැවැත්වීම
- වැඩිදියුණු කිරීම සඳහා අධ්‍යයන වාර්තාව සහ සැලසුම් සකස් කිරීම

iii. ආරක්ෂිත විගණනය පැවැත්වීම

- පවතින මාර්ග ජාලය සඳහා ආරක්ෂිත විගණනය
- ආරක්ෂාව සඳහා සැලසුම් විගණනය
- ඉදිකිරීමෙන් පසු ආරක්ෂක විගණනය
- අදහස් හෝ නිර්දේශ ලබා දී ඇත

iv. පර්යේෂණ සහ සංවර්ධනය

- ආරක්ෂක මාර්ගෝපදේශ සකස් කිරීම
- ආරක්ෂිත අත්පොත සකස් කිරීම
- ආරක්ෂාව වැඩි දියුණු කිරීම සඳහා සැලසුම් සකස් කිරීම
- සම්මන්ත්‍රණ පැවැත්වීම සහ සහභාගී වීම

v. එදිනෙදා කටයුතු

- ආරක්ෂාව සම්බන්ධ රැස්වීමට සහභාගී වීම
- මහජන ඉල්ලීම් සහ පැමිණිලි ඉදිරිපත් කිරීම
- අනෙකුත් අංශය සහ සංවිධානය සමග සම්බන්ධීකරණ කටයුතු
- ප්‍රගති වාර්තා සකස් කිරීම

ඇ) රථවාහන කළමනාකරණය

"රථවාහන කළමනාකරණය" යටතේ එන ප්‍රධාන වගකීම් පහත පරිදි වේ.

i. පවතින ජාතික මාර්ග ජාලයේ තදබදය සහිත නගර/ හන්දි/ මාර්ග කොටස් හඳුනා ගැනීම.

ii. සැලසුම්/ ඇස්තමේන්තු/ සැලසුම් ඇඳීම් ක්‍රියාත්මක කිරීම සහ සකස් කිරීම සඳහා රථවාහන කළමනාකරණ පියවර යෝජනා කිරීම.

iii. හඳුනාගත් තදබදය සහිත ස්ථානවල සංඥා ලාම්පු සවි කිරීම.

- සංඥාගත කිරීම, අදාළ සැලසුම්/ ඇස්තමේන්තු/ ඇඳීම් සකස් කිරීම සඳහා නව පෙලිකන් හරස් මාර්ග සහ මංසන්ධි හඳුනා ගැනීම
- දැනට පවතින සීබ්‍රා හරස් මාර්ග පෙලිකන් හරස් මාර්ග දක්වා වැඩිදියුණු කිරීම
- මංසන්ධි සංඥාපිත කිරීම
- සංඥා කාලය යාවත්කාලීන කිරීම/ ඇගයීම සහ වෙනස් කිරීම
- රථවාහන ආලෝක සංඥා නඩත්තු කිරීම සහ කළමනාකරණය (ආවර්තිතා/හදිසි)
- SD සහ CC වැනි ආධාරක සේවා සපයන්නන් සමඟ ගිවිසුම් කළමනාකරණය සහ සම්බන්ධීකරණය
- ගුවන් පාලම්/ යටි මාර්ග ලෙස වැඩිදියුණු කිරීමට අවශ්‍ය ස්ථාන මූලික හඳුනා ගැනීම
- ජාතික මාර්ගවල ආලෝක සංඥා සවි කිරීම සඳහා මාර්ගෝපදේශ සහ පිරිවිතර සකස් කිරීම සහ යාවත්කාලීන කිරීම

iv. මාර්ග සංඥා සහ සලකුණු කිරීම

- පවතින මාර්ග සංඥා සහ සලකුණු යාවත්කාලීන කිරීම.
- අධිවේගී මාර්ග සැලසුම්/ව්‍යාපෘති අංශ විසින් සකස් කරන ලද මාර්ග සැලසුම්වල යෝජිත සලකුණු සහ සංවර්ධනය කිරීම සහ සමාලෝචනය කිරීම.
- මාර්ග සංඥා සහ ලකුණු කිරීම සඳහා නව වැඩිදියුණු කිරීම්/ ක්‍රම පිළිබඳ පර්යේෂණ සහ සංවර්ධනය.
- ජාතික මාර්ගවල සලකුණු ක්‍රියාත්මක කිරීම සහ සලකුණු කිරීම සඳහා මාර්ගෝපදේශ සහ පිරිවිතර සකස් කිරීම සහ යාවත්කාලීන කිරීම.

v. රථවාහන ආකෘති නිර්මාණය සහ ආභාසනය

- රථවාහන ගැටළු හඳුනා ගැනීම (වාහන පරිමාව, පදිකයින් ප්‍රමාණය, වාහන නැවැත්වීමේ පරිමාව, පොදු ප්‍රවාහන ජාලය, හන්දි සහ නගර තුළ ප්‍රවේශය ආදිය)
- යෝජිත රථවාහන කළමනාකරණ පියවරවල ශක්‍යතාව අධ්‍යයනය කිරීම සඳහා ක්ෂුද්‍ර සමාකරණ ආකෘති සංවර්ධනය කිරීම
- සුදුසු විසඳුම් යෝජනා (රථවාහන කළමනාකරණ පියවර, ඉඩම් පරිහරණ රටාව වෙනස් කිරීම, අතුරු මාර්ග තෝරාගැනීම ආදිය)

vi. පළාත් , දිස්ත්‍රික්ක, ප්‍රධාන මාර්ගවල ප්‍රධාන නගර සහ අලුතින් හඳුන්වා දුන් නගර සහ මංසන්ධි සඳහා දත්ත සමුදායන් වෙන වෙනම කළමනාකරණය කිරීම.

vii. නව සංවර්ධන කටයුතු හේතුවෙන් ගමනාගමනයට සිදුවන බලපෑම් සහ තදබදයේ මට්ටම අධ්‍යයනය කිරීම.

- රථවාහන ප්‍රමාදයන් සහ තදබදය පිරිවැය ගණනය කිරීම
- නව සංවර්ධනයන් සැලකිල්ලට ගනිමින් සුළු නගර / නගර හෝ මංසන්ධි සඳහා රථවාහන වැඩිදියුණු කිරීමේ පියවර යෝජනා කිරීම

viii. ව්‍යාපෘති අංශය සමඟ සම්බන්ධීකරණය

- ව්‍යාපෘති අංශය මගින් ඉදිරිපත් කරන වාර්තාව සමාලෝචනය කිරීම
- උපදේශකයින් විසින් පවත්වනු ලබන ශක්‍යතා අධ්‍යයනයට සහභාගී වීම
- ජාතික මට්ටමේ ව්‍යාපෘතිය සම්බන්ධීකරණය කිරීම

2021 වර්ෂය තුළ මාර්ග ආරක්ෂාව සහ රථවාහන කළමනාකරණ ක්‍රියාකාරකම්වල ප්‍රගතිය

- පහත සඳහන් පළාත් සඳහා වැඩි දියුණු කළ දිශා සංඥා පුවරු සැලසුම් කිරීම.
  - දකුණු පළාත
  - වයඹ පළාත
  - බස්නාහිර පළාත
  - උතුරු මැද පළාත
  - සබරගමුව පළාත
  - ඌව පළාත
  - මධ්‍යම පළාත
- වැඩි දියුණු කළ දිශා සංඥා පුවරු සවි කිරීම - මධ්‍යම අධිවේගී මාර්ගය
- ස්ථාන හඳුනාගැනීමේ සංඥා පුවරු
- වැඩි දියුණු කළ සූර්ය පාදක පාසල් කලාප ආරක්ෂණ අනතුරු ඇඟවීමේ ‘LED blinkers’ සහ ‘Signature ‘පද්ධතිය සඳහා යෝජනාව.
- වැඩි දියුණු කළ සූර්ය පාදක පදික මාරු ආලෝකකරණය සහ අනතුරු ඇඟවීමේ දැල්වෙන ආලෝක පද්ධතිය සඳහා සැලසුම් කිරීම.
- බණ්ඩාරවෙල-ආර්ථික මධ්‍යස්ථානය (UDA) ඉදිකිරීම වෙනුවෙන් අවට මාර්ග ජාල වැඩිදියුණු කිරීම සඳහා සැලසුම් සහ අවශ්‍ය අධ්‍යයනයන් සකස් කිරීම.
- දෙනියාය නගර වැඩිදියුණු කිරීමේ ව්‍යාපෘතිය අවට මාර්ග ජාල වැඩිදියුණු කිරීම සඳහා සැලසුම් සහ අවශ්‍ය අධ්‍යයනයන් සකස් කිරීම.
- පිරිවිතර සකස් කිරීම
  - වැඩි දියුණු කළ දිශා සංඥා පුවරු සඳහා පිරිවිතර.
  - වැඩි දියුණු කළ සූර්ය පාදක පාසල් කලාප අනතුරු ඇඟවීමේ සංඥා පද්ධතිය සඳහා පිරිවිත
  - වැඩි දියුණු කළ සූර්ය පාදක පදික හරස් ආලෝකකරණය සහ අනතුරු ඇඟවීමේ ආලෝක පද්ධතිය සඳහා පිරිවිතර.
  - මාර්ග මධ්‍යයේ ආරම්භක/අවසාන ස්ථානවල සහ මාර්ග දූපත්වල (traffic islands) ස්ථාපනය කිරීමට ප්‍රත්‍යාවර්ත පරාවර්තක ස්වයං-නිවැරදි වීමේ නම්‍යශීලී බෝලඩ් (retro-reflective self-righting flexible bollards) සැපයීම සඳහා තාක්ෂණික පිරිවිතර.

වගුව 26: 2021 දී IRTM අංශය විසින් සිදු කරන ලද කාර්යයන්හි සාරාංශය

විෂය ප්‍රදේශය/ විස්තරය	*ලැබුණු මුළු ඉල්ලීම්*	*මුළු සම්පූර්ණ කළ ගණන*
යටිතල කටයුතු	10	10
මාර්ග ආරක්ෂාව	12	12
සංඥා සහ සලකුණු කිරීම	41	30
රථවාහන බලපෑම් තක්සේරු කිරීම්	22	22
මහජන ඉල්ලීම් සහ පැමිණිලි	47	30
රථවාහන කළමනාකරණ කමිටුව	10	8
වැඩි දියුණු කළ දිශා සංඥා පුවරු (පුවරු ගණන)	2	2



වැඩි දියුණු කළ දිශා සංඥා පුවරු තත්ත්වයෙන් උසස් කිරීම සඳහා පරීක්ෂා කිරීම (විධායක ඉංජිනේරු කොට්ඨාශය -හම්බන්තොට/ තංගල්ල)



නා.ස.අ. හි නගර 100 වැඩසටහන පරීක්ෂා කිරීමේදී මාර්ග සංවර්ධන අධිකාරියේ හි මාර්ග අද්දර යටිතල පහසුකම් සංවර්ධන මාර්ගෝපදේශ, 'නා.ස.අ., හම්බන්තොට' වෙත ඉදිරිපත් කිරීම.

7. ඉඩම් අත් කර ගැනීම හා නැවත පදිංචි කිරීම

ඉඩම් අත්පත් කර ගැනීමේ පනත (460 වන පරිච්ඡේදය) යටතේ සියලුම මාර්ග සංවර්ධන ව්‍යාපෘතිවලට අදාළව ඉඩම් අත්පත් කර ගැනීම සහ නැවත පදිංචි කිරීමේ කටයුතු කඩිනම් කිරීමේ අරමුණින් සහ මා. ස. අ. අයත් ඉඩම් ඉන්වෙන්ටරි දත්ත හැසිරවීම සඳහා මාර්ග සංවර්ධන අධිකාරියේ ඉඩම් අත්පත් කර ගැනීමේ හා නැවත පදිංචි කිරීමේ අංශය පිහිටුවන ලදී.

මාර්ග සංවර්ධන අධිකාරියේ ඉඩම් සම්බන්ධ ප්‍රධාන ක්‍රියාවලිය වන්නේ ඉඩම් අත්පත් කර ගැනීමේ යෝජනාවක් න්‍යාය පත්‍රයට පැමිණි දින සිට ඉඩම් අත්පත් කර ගැනීමේ පනතේ විධි විධානවලට අනුව ඉඩම් අත්පත් කර ගැනීමේ හා ගෙවීමේ ක්‍රියාවලිය ඉදිරියට ගෙන යාමයි.

ඉඩම් අත්පත් කර ගැනීමේ ක්‍රියාවලියට ඉඩම් පවරා ගැනීම, වන්දි ගෙවීම හා රජය යටතේ ලියාපදිංචි කිරීම ද ඇතුළත් වේ. ඇතැම් ව්‍යාපෘතිවල වැඩ කඩිනම් කිරීමේ අවශ්‍යතාවය මතු වූ විට අදාළ ව්‍යාපෘති කළමනාකරණ ඒකක මඟින් ඉඩම් අත්පත් කර ගැනීම් ක්‍රියාත්මක කරනු ලබයි. ඉඩම් සම්බන්ධ තවත් වැදගත් ක්‍රියාවලියක් වනුයේ, මාර්ග සංවර්ධන අධිකාරිය භාවිතා කරනු ලබන හෝ මාර්ග සංවර්ධන අධිකාරිය සතු ඉඩම් කළමනාකරණය කිරීමයි. මෙහිදී, මාර්ග සංවර්ධන අධිකාරිය විසින් අත්පත් කර ගෙන ඇති, මහාමාර්ග දෙපාර්තමේන්තුව හා අනෙකුත් පාර්ශවකාර සංවිධාන විසින් පවරන ලද, බදු දී ඇති, මිලදී ගත් සහ වෙනත් ඉඩම්වලට අදාළ සියලු දත්ත එක්රැස් කරමින් දත්ත සමුදායක් පවත්වාගෙන යයි.

කාර්යයන් සහ වගකීම්

- ව්‍යා.ක.ඒ., පළාත්භාර අධ්‍යක්ෂවරුන් වෙතින් ලැබෙන අත්පත් කර ගැනීමේ අයදුම්පත් 1950 අංක 9 දරණ ඉඩම් අත්පත් කර ගැනීමේ පනත යටතේ හදිසි හා සාමාන්‍ය අත්පත් කර ගැනීමේ පරිපාටිය යටතේ ක්‍රියා කිරීම සඳහා මහාමාර්ග, මාර්ග සංවර්ධන හා ඛනිජ සම්පත් අමාත්‍යාංශය වෙත ඉදිරිපත් කිරීම.
- ඉඩම් අමාත්‍යාංශය සමඟ සම්බන්ධීකරණය සහ ලියකියවිලි සඳහා සහාය ලබා දීම.
- මායිම් පෙන්වීම සහ අත්පත් කර ගැනීමේ මායිම් සලකුණු කිරීම සඳහා මිනුම් දෙපාර්තමේන්තුව සමඟ සම්බන්ධීකරණය.
- ඉඩම් අත්පත් කර ගැනීමේ පනත යටතේ 2 වන වගන්තිය, 5 වන වගන්තිය හා 7 වගන්තිය යටතේ නිවේදන ප්‍රකාශයට පත් කිරීමේ ලේඛන පිළියෙළ කිරීම සඳහා ප්‍රාදේශීය ලේකම්වරුන්ට සහාය වීම.
- තත්ත්ව වාර්තා පිළියෙළ කිරීම සඳහා තක්සේරු දෙපාර්තමේන්තුවට සහාය වීම හා ප්‍රාදේශීය ලේකම් හා අනෙකුත් අදාළ කොටස්කරුවන් සමඟ සම්බන්ධීකරණය වීම.
- ප්‍රාදේශීය ලේකම්වරුන්ට ඔවුන්ගේ විෂය පථය යටතේ ඇති ඉඩම්වල සන්තකය පවරා ගැනීම සඳහා සහාය වීම හා පළාතේ අදාළ විධායක ඉංජිනේරුවන් විසින් හිස් සන්තකය භාර ගැනීම සඳහා සුදානම් කිරීම.
- අත් කරගත් ඉඩම් සඳහා වන්දි / පොලී ගෙවීම, ජාතික මහාමාර්ග වැඩිදියුණු කිරීම / පුනරුත්ථාපනය කිරීම / පුළුල් කිරීම සඳහා අදාළ ප්‍රාදේශීය ලේකම්වරුන් සහ මහාමාර්ග අමාත්‍යාංශය සමඟ සම්බන්ධීකරණය කිරීම.
- මහාමාර්ග අමාත්‍යාංශයේ ලේකම් මඟින් අධ්‍යක්ෂ (අයවැය) වෙත අනුමැතිය ලබා ගැනීම සඳහා ඉදිරිපත් කරන අනාගත ඉඩම් අත්පත් කර ගැනීමේ වැඩ සටහන් සඳහා වන ක්‍රියාකාරී සැලැස්ම පිළියෙළ කිරීමට මාර්ග සංවර්ධන අධිකාරියේ සැලසුම් අංශය වෙත සහාය වීම.
- ගොඩනැගිලි පරිශ්‍ර හිමියන් විසින් මාර්ග සංවර්ධන අධිකාරියට එරෙහිව ගොනු කර ඇති අවස්ථාවල නීතිපති දෙපාර්තමේන්තුවේ උපදෙස් ලබා ගැනීම සඳහා ඉඩම් නඩු සම්බන්ධයෙන් නීතිපති දෙපාර්තමේන්තුවට සහාය වීම.
- මාර්ග සංවර්ධන කටයුතු සඳහා මාර්ග සංවර්ධන අධිකාරිය විසින් අත්පත් කර ගත් ඉඩම් පහසු ලෙස මෙහෙය වීම හා වාර්තා සාරාංශ කිරීම සඳහා දත්ත ගබඩාවක් පවත්වාගෙන යාම.
- වත්කම් පිළිබඳ ඉඩම් ඉන්වෙන්ටරි සම්බන්ධ ඉඩම්, ගොඩනැගිලි සහ අනෙකුත් ව්‍යුහයන් පිළිබඳ වාර්තා සහ සැලසුම් යාවත්කාලීන කිරීම සහ නඩත්තු කිරීම (වගුව 26)

වගුව 27: 2021 වර්ෂය අවසානයේ ඉඩම් තොගවල සාරාංශය

පළාත	පොදු වැඩ දෙපාර්තමේන්තුවේ (PWD) ඉඩම්	අත් කරගත් ඉඩම් සංඛ්‍යාව	මිලදී ගත් ඉඩම් ගණන	බදු දුන් ඉඩම් ගණන	වෙනත් ඉඩම් ගණන	පළාතේ ඇති මුළු ඉඩම්	මුළු භූමි ප්‍රමාණය (හෙක්.)
බස්නාහිර පළාත	94	15	6	12	7	134	23.8777
මධ්‍යම පළාත	144	22	1	1	10	178	48.1153
දකුණු පළාත	12	4	0	0	19	35	18.8597
උතුරු පළාත	32	1	0	0	3	36	16.3204
නැගෙනහිර පළාත	26	1	0	0	10	37	10.3031
අතිරේක පළාත් අධ්‍යක්ෂ කාර්යාලය, අක්කරෛපත්තුව	15	0	1	0	9	25	2.4421
උතුරු මැද පළාත	35	0	0	1	5	41	30.1369
වයඹ පළාත	64	1	0	0	8	73	17.6021
ඌව පළාත	59	16	1	1	1	78	27.1265
සබරගමුව පළාත	61	4	0	3	4	72	80.7099
එකතුව	**542**	**64**	**9**	**18**	**76**	**709**	**275.4937**

වගුව 28: නොමිලේ ප්‍රදාන අයදුම් කිරීමේ ක්‍රියාවලිය පිළිබඳ ප්‍රකාශය

පළාත / පළාත් කාර්යාලය	පොදු වැඩ දෙපාර්තමේන්තුවෙන් (PWD) ලද ඉඩම්	නොමිලේ ප්‍රදාන අයදුම් කිරීම සඳහා ඉඩම් අංශයට ලැබුණු අයදුම්පත්	සභාපති (RDA) විසින් ඉඩම් කොමසාරිස් ජෙනරාල් වෙත යවන ලද ඉල්ලීම්	ඉඩම් කොමසාරිස් ජනරාල් විසින් ප්‍රාදේශීය ලේකම් වෙත යවන ලද ඉල්ලීම්	ප්‍රාදේශීය ලේකම් විසින් පළාත් ඉඩම් කොමසාරිස් ජනරාල් වෙත යවන ලද ඉල්ලීම්	පළාත් ඉඩම් කොමසාරිස් ජනරාල් විසින් ඉඩම් කොමසාරිස් ජෙනරාල් වෙත යවන ලද ඉල්ලීම්	නොමිලේ ප්‍රදාන බලපත්‍රයක් සඳහා ඉල්ලුම් කිරීමට ඉතිරිව ඇති ඉඩම් කොටස් ගණන
බස්නාහිර පළාත	94	51	51	51	14	7	43
මධ්‍යම පළාත	144	40	40	40	33	3	104
දකුණු පළාත	12	12	12	12	5	4	0
උතුරු පළාත	32	2	2	2	-	-	30
නැගෙනහිර පළාත	26	5	5	5	0	0	21
අතිරේක පළාත් අධ්‍යක්ෂ කාර්යාලය, අක්කරෛපත්තුව	15	10	10	10	6	4	5
වයඹ පළාත	64	44	44	44	45	40	20
උතුරු මැද පළාත	35	35	35	35	29	21	0
ඌව පළාත	59	14	14	14	12	8	45
සබරගමුව පළාත	61	54	54	54	24	19	7
එකතුව	**542**	**267**	**267**	**267**	**168**	**106**	**275**

වගුව 29: පුළුල් කිරීමේ සහ වැඩිදියුණු කිරීමේ වැඩසටහන යටතේ ඉඩම් අත්පත් කර ගැනීම සහ වන්දි ගෙවීම

පළාත	දිස්ත්‍රික්කය	මාර්ග / ව්‍යාපෘති ගණන	ඉඩම් කොටස් ගණන	මුළු හෙක්ටයාර ගණන	වන්දි ගෙවීම් ප්‍රදානය (17 වන වගන්තිය නිකුත් කර ඇත)	අත්පත් කර ගැනීම සම්පූර්ණ කර ඇති ඉඩම් කොටස් ගණන (2020 දී)	අත් කර ගැනීම සම්පූර්ණ කරන ලද කැබලි අංක (2021 දී)	2020 දී සිදු කරන ලද ගෙවීම් (රු.)	2021 දී සිදු කරන ලද ගෙවීම් (රු.)
බස්නාහිර	කොළඹ	40	3,259	22.8654	3,125	2,857	1,304	605,789,665.87	494,297,812.77
	ගම්පහ	27	10,138	82.8316	4,967	4,636	4,677	308,906,941.68	288,600,575.78
	කළුතර	7	365	1.1280	0	46	0	21,325,730.00	19,812,082.96
මධ්‍යම	මහනුවර	15	2,171	13.3070	968	643	859	257,907,212.65	31,540,696.03
	මාතලේ	6	3,530	8.5412	775	581	583	490,773,991.59	249,081,937.21
	නුවරඑළිය	3	1,537	9.7727	1	1	1	59,000.00	
දකුණ	ගාල්ල	6	277	2.6767	155	150	150	7,677,740.39	59,916,221.15
	මාතර	27	1,675	7.8067	839	549	689	205,852,974.24	192,221,725.27
	හම්බන්තොට	23	4,995	317.8830	1,924	1,700	1,705	480,532,581.92	186,346,462.55
වයඹ	කුරුණෑගල	23	3,270	37.6541	219	169	170	98,606,143.62	366,162,167.16
	පුත්තලම	2	528	9.7176	10	1	1	95,000.00	1,829,632.00
උතුරු මැද	පොළොන්නරුව	3	1330	19,4911	335	209	223	318,536,025.00	
ඌව	බදුල්ල	8	763	12.2230	321	41	41	108,286.61	1,734,000.00
සබරගමුව	කෑගල්ල	16	1,029	19.2198	438	336	404	329,882,155.48	71,418,785.51
	රත්නපුරය	13	680	16.5898	3	1	1	124,230,291.68	132,546,225.98
එකතුව		219	35,547	581.7077	14,080	11,920	10,808	3,250,283,740.73	2,095,508,324.37

වගුව 30: ව්‍යාපෘති සඳහා ඉඩම් අත්පත් කර ගැනීම සහ ඒවාට වන්දි ගෙවීම

ව්‍යාපෘතියේ නම	ඉඩම් කොටස් ගණන	මුළු හෙක්ටයාර ගණන	වන්දි ගෙවීම් ප්‍රදානය (17 වන වගන්තිය නිකුත් කර ඇත)	අත්පත් කර ගැනීම සම්පූර්ණ කර ඇති ඉඩම් කොටස් ගණන (2020 දී)	අත්පත් කර ගැනීම සම්පූර්ණ කර ඇති ඉඩම් කොටස් ගණන (2021 දී)	2020 දී මාර්ග සංවර්ධන අධිකාරිය විසින් සිදු කරන ලද වන්දි ගෙවීම් (රු.)	2021 දී මාර්ග සංවර්ධන අධිකාරිය විසින් සිදු කරන ලද වන්දි ගෙවීම් (රු.)
මැරයින් ඩ්‍රයිව් මාර්ග ව්‍යාපෘතිය	228	4.0752	157	136	155	1,225,203,767.00	4,815,691.77
කොළඹ-කටුනායක අධිවේගී මාර්ග ව්‍යාපෘතිය	2,583	183.5793	2,018	1,818	1,821	3,659,033.00	5,710,756.85
දකුණු අධිවේගී මාර්ගය දීර්ඝ කිරීමේ ව්‍යාපෘතිය	12,215	876.2900	6,568	1,438	6,413	387,618,596.60	31,768,322.02
එකතුව	**15,026**	**1,063.9445**	**8,743**	**3,392**	**8,389**	**1,616,481,396.60**	**42,294,770.64**

වර්ෂය තුළ මුහුණ දීමට සිදු වූ දුෂ්කරතා

ඒ අනුව, ඉඩම් අංශය විසින් මාර්ග සංවර්ධන අධිකාරියේ ආයතනික සැලැස්ම යටතේ ක්‍රියාත්මක වන රටේ අඛණ්ඩ සංවර්ධනය සඳහා වැදගත් කාර්යභාරයක් ඉටු කළද, මෙම ක්‍රියාවලිය දුර්වල කරන සමහර අසාර්ථකත්වයන් ද නිරීක්ෂණය විය. මෙම කරුණු බොහෝ දුරට ක්‍රියාවලියේ කාර්ය සාධනය දුර්වල කරන අතර පහත ඒවා පරිදි සාකච්ඡා කළ හැකිය,

- මාර්ග අංශයේ වර්තමාන අවශ්‍යතාවයට අනුව පනත යාවත්කාලීන කිරීමට නොහැකි වීම.
- මාර්ග සංවර්ධන ක්‍රියාකාරකම් සමඟ සෘජුවම කටයුතු කරන ඉඩම් අමාත්‍යාංශය, තක්සේරු දෙපාර්තමේන්තුව, මැනුම් දෙපාර්තමේන්තුව සහ ප්‍රාදේශීය ලේකම් කාර්යාල වැනි පාර්ශවකරුවන් විසින් එම කටයුතුවලට ප්‍රමුඛතාවය ලබා නොදීම.
- අනෙකුත් දෙපාර්තමේන්තු සහ ප්‍රාදේශීය ලේකම් කාර්යාලවල ක්‍රියාවලිය සපුරාලීම සඳහා අවශ්‍ය ප්‍රමුඛ නිලධාරීන් සහ පුහුණු කාර්ය මණ්ඩලයක් නොමැති වීම.
- වන්දි ගෙවීම් සඳහා අරමුදල් නොමැතිකම සහ නෛතික ගැටළු හා හිමිකාරිත්වය තීරණය කිරීමේදී අධිකරණ ක්‍රියාමාර්ග ඔස්සේ කටයුතු කිරීමට සිදු වීම වැනි ඉඩම්වල හිමිකාරිත්වයේ සංකීර්ණතා පැවතීම.
- ඉඩම් අංශය, මාර්ග සංවර්ධන අධිකාරියේ මූල්‍ය අංශය හරහා වන්දි ගෙවීම ආරම්භ කරන අතර වාර්ෂික අයවැය ප්‍රතිපාදන මාර්ග හා මහාමාර්ග අමාත්‍යාංශය විසින් මාර්ග සංවර්ධන අධිකාරියේ මූල්‍ය අංශය වෙත පවරා ඇත. ඉඩම් අංශය තුළ ද ගිණුම් අංශයක් ද යොදවා ඇත. එහෙත් ඉඩම් අංශයේ ක්‍රියාත්මක ගිණුම් අංශයේ කාර්ය මණ්ඩල හිඟය එනම් ගිණුම් සහකාර සහ කළමනාකරණ සහාකාර තනතුරු 3 ක හිඟය සඳහා තවමත් විසඳී නොමැත.

ගෙන ඇති පිළියම් ක්‍රියාමාර්ග

- නිසි දිරිගැන්වීමේ යෝජනා ක්‍රම සකස් කරමින් සහ හැකි සෑම විටම අවශ්‍ය සම්පත් සැපයීම තුලින් අනෙකුත් දෙපාර්තමේන්තු හා ප්‍රාදේශීය ලේකම් කාර්යාල නිලධාරීන් සමඟ හොඳ සම්බන්ධතාවයක් ඇති කර ගැනීම සහ පවත්වාගෙන යාම.
- අදාළ පාර්ශවකරුවන් සමඟ ප්‍රගතිය අධීක්ෂණය හා පවත්වාගෙන යාම.(ප්‍රාදේශීය ලේකම්, තක්සේරු දෙපාර්තමේන්තුව, මැනුම් දෙපාර්තමේන්තුව වැනි ආයතන සමඟ)
- ඉඩම් අංශයේ ඊට අදාළ වාර්තා හැසිරවීමේදී සහ සොයා ගැනීමේදී පහසුවෙන් ඒවාට ප්‍රවේශ වීම සඳහා පළාත් පාලන ආයතන සමඟ ශක්තිමත් හවුල්කාරිත්වයක් තුළින් දත්ත පද්ධතියක් සහ ඉඩම් අත්පත් කර ගැනීමේ තොරතුරු පද්ධතියක් (LAIS) සකස් කිරීම.
- සහතික කළ වවුචර සහ මාර්ග අනුව සිදු කළ ගෙවීම් මත, ගිණුම් අංශයට දත්ත ගබඩාවක් (Database) හඳුන්වා දෙන ලදී.
- හිමිකාරිත්වය හඳුනා ගැනීම සහ මාර්ග සංවර්ධන අධිකාරිය වෙත හිමිකාරිත්වය පැවරීම සඳහා ක්‍රියාමාර්ග ගැනීමට වත්කම් ඉන්වෙන්ටරිය (මාර්ග සංවර්ධන අධිකාරිය විසින් අත්පත් කරගත් ඉඩම්) යාවත්කාලීන කිරීම.
- මේ දක්වා අත්පත් කර ගත් ඉඩම් සඳහා 44 වන වගන්තිය ප්‍රකාශයට පත් කිරීම.

තවද, තත්ත්වය පිළිගත හැකි මට්ටමකට ගෙන ඒම සඳහා පහත සඳහන් පියවරයන් ද නිර්දේශ කරන ලදී.

- සියලුම මාර්ග ව්‍යාපෘතිවල ඉඩම් අත්පත් කර ගැනීමේ කටයුතු මාර්ග සංවර්ධන අධිකාරියෙ හි ඉඩම් අංශයේ පරීක්ෂණ හා අධීක්ෂණය යටතේ සිදු කළ යුතුය.
- මාර්ග සංවර්ධන අධිකාරිය අත්පත් කර ගත් සියලුම ඉඩම්, GIS පහසුකම සමඟ පද්ධතිය ඒකාබද්ධ කිරීමෙන් වැලැක්වීම සඳහා ඉඩම් අංශයේ "මධ්‍යම දත්ත සමුදාය සහ ඉඩම් අත්පත් කර ගැනීමේ තොරතුරු පද්ධතිය" (LAIS) පිහිටුවීම.
- අවශ්‍ය කාර්ය මණ්ඩලයේ තොරතුරු තාක්ෂණ හැකියාවන් වැඩි දියුණු කිරීම.
- විශේෂයෙන් ඉඩම් නිලධාරී ආදී අවශ්‍ය සේවක සංඛ්‍යා පුරප්පාඩු පිරවීම.
- වර්තමාන අවශ්‍යතා අනුව ක්‍රියාවලි කාර්යක්ෂමතාව ඇති කිරීම.
- අත්පත් කරගත් සැලසුම් ගබඩා කිරීම සඳහා වාර්තා කාමර ධාරිතාව වැඩි දියුණු කිරීම.

8. පාරිසරික හා සමාජ ආරක්ෂණ පියවරයන් ක්‍රියාත්මක කිරීම

මාර්ග සංවර්ධන අධිකාරියේ පාරිසරික හා සමාජ සංවර්ධන අංශය (ESDD) ඉඩම් අත්පත් කර ගැනීමේ සහ නැවත පදිංචි කිරීමේ අංශයේ අධ්‍යක්ෂ මණ්ඩලය යටතේ 2006 ජූලි මාසයේදී පිහිටුවන ලදී. පාරිසරික හා සමාජ සංවර්ධන අංශය දැනට මාර්ග සංවර්ධන අධිකාරියේ පාරිසරික සහ සමාජ ආරක්ෂණ අංශය වශයෙන් තනි අංශයක් ලෙස ක්‍රියාත්මක වේ. ආසියානු සංවර්ධන බැංකුව විසින් අරමුදල් සපයනු ලබන තාක්ෂණික ආධාර ව්‍යාපෘතිය (TA 4736-Sri) හරහා ලබා දී ඇති මූලික මගපෙන්වීම අනුව, පාරිසරික හා සමාජ සංවර්ධන අංශය හොඳින් ස්ථාපිත වී ඇති අතර, එමඟින් මාර්ග සංවර්ධන ව්‍යාපෘති හා සම්බන්ධ පාරිසරික හා සමාජ ආරක්ෂණ ක්‍රියාමාර්ග ක්‍රියාත්මක කිරීමේදී සහ ඇස්ෆෝල්ට් යන්ත්‍රාගාර, ගල් කුඩු කම්හල් සහ ගල්වලවල් පිහිටුවීමේදී සැලසුම් අංශය, මහාමාර්ග සැලසුම් අංශය, ඉංජිනේරු සේවා අංශය සහ යාන්ත්‍රික අංශය ආදිය ඇතුළත් මාර්ග සංවර්ධන අධිකාරියේ සියලුම ප්‍රධාන අංශ සඳහා අඛණ්ඩව සහාය වීම සිදු කරයි. පාරිසරික හා සමාජ සංවර්ධන අංශය විසින් මාර්ග සංවර්ධන අධිකාරියේ පිහිටුවා ඇති ව්‍යාපෘති කළමනාකරණ ඒකක (PMUs) සඳහා අවශ්‍ය නම් පාරිසරික අනුමැතිය සහ පාරිසරික සහ සමාජ ඇගයීම් ලබා ගැනීමට සහාය වේ. ව්‍යාපෘතිවල පාරිසරික කළමනාකරණ සැලසුම් සහ සමාජ ආරක්ෂණ ක්‍රියාත්මක කිරීම අධීක්ෂණය කිරීම ද මෙම අංශයේ ප්‍රධාන කාර්යයකි.

පාරිසරික හා සමාජ සංවර්ධන අංශය හි කාර්යයන් සහ වගකීම් ප්‍රධාන වශයෙන් පහත පරිදි කොටස් 4කින් යුක්ත වේ;

- පාරිසරික සහ සමාජ ඇගයීම් වාර්තා සකස් කිරීම සහ සමාලෝචනය කිරීම
- පාරිසරික සහ සමාජ ආරක්ෂණයන් නිරීක්ෂණය කිරීම
- බාහිර ව්‍යාපෘති සඳහා විවිධ ව්‍යාපෘති අනුමත කරන ආයතන විසින් පිහිටුවන ලද තාක්ෂණික ඇගයීම් කමිටු සාමාජිකයෙකු ලෙස සහභාගී වීම.
- ජනාධිපති කාර්ය සාධක බලකායට පැවරී ඇති බලතල යටතේ භූ විද්‍යා සම්පත් සඳහා අනුමැතිය ලබා දීම

අ) පාරිසරික හා සමාජ ඇගයීම් වාර්තා සකස් කිරීම සහ සමාලෝචනය කිරීම

සාමාන්‍යයෙන්, මාර්ග සංවර්ධන අධිකාරියේ අදාළ ක්‍රියාකාරී අංශ සහ බාහිර විශේෂඥයින් සමඟ සහසම්බන්ධයෙන්, පාරිසරික හා සමාජ සංවර්ධන අංශය විසින් පාරිසරික බලපෑම් තක්සේරු (EIA) වාර්තා, මූලික පාරිසරික පරීක්ෂණ (IEE) වාර්තා සහ ශක්‍යතා වාර්තාවල අදාළ පරිච්ඡේද සකස් කරයි.

පාරිසරික හා සමාජ සංවර්ධන අංශය විසින් රටේ ආරක්ෂිත ආරක්ෂක පද්ධතියට අවශ්‍ය පරිදි පරිසරය සහ සමාජ මාර්ගෝපදේශ ලේඛන ඇතුළු බාහිර මූලාශ්‍ර උපදේශකයින් විසින් ඉදිරිපත් කරන ලද පාරිසරික සහ සමාජ වාර්තා සමාලෝචනය කර අවසන් කිරීම සහ දායක ආයතනවල අවශ්‍යතා සඳහා පාරිසරික හා සමාජ සංවර්ධන අංශය පාරිසරික හා සමාජ ආරක්ෂණ වාර්තා සකස් කරයි. පහත දැක්වෙන්නේ පාරිසරික හා සමාජ සංවර්ධන අංශය විසින් සකස් කරන ලද හෝ සමාලෝචනය කරන ලද ප්‍රධාන පාරිසරික සහ සමාජ ආරක්ෂණ අනුකූලතා ලේඛන ලැයිස්තුවකි.

පාරිසරික ආරක්ෂණයන්

- මූලික තොරතුරු ප්‍රශ්නාවලිය (BIQ) සකස් කිරීම
- කඩිනම් පාරිසරික ඇගයීම් පිරික්සුම් ලැයිස්තුව (REACL) සකස් කිරීම
- ව්‍යාපෘති පූර්ව ශක්‍යතා සහ ශක්‍යතා වාර්තාවල සමාජ පරිච්ඡේද සකස් කිරීම
- මූලික පරිසර විභාග වාර්තා (IEER) සකස් කිරීම
- පාරිසරික බලපෑම් තක්සේරු වාර්තා (EIAR) සකස් කිරීම
- පරිපූරක පාරිසරික ඇගයීම් (SEIA) වාර්තා සකස් කිරීම
- පරිසර කළමනාකරණ සැලසුම් (EMP) සහ පරිසර අධීක්ෂණ සැලසුම් (EMoP) සකස් කිරීම
- කොන්ත්‍රාත්තුවේ ලංසු ලේඛනවල පාරිසරික ක්‍රියාකාරී සැලසුම් සකස් කිරීම
- පාරිසරික හා සමාජීය යහපත් භාවිතයන් (CESGP) සංග්‍රහ සකස් කිරීම
- පරිසර පිරික්සුම් ලැයිස්තු සකස් කිරීම
- පාරිසරික ආරක්ෂණ අනුකූලතා පිළිබඳ මාසික සහ කාර්තුමය අධීක්ෂණ වාර්තා පරීක්ෂා කිරීම

සමාජීය ආරක්ෂණයන්

- සමාජ බලපෑම් තක්සේරු (SIA) වාර්තාව
- නිසි කඩිසර වාර්තාව හේතුවෙන් ස්වේච්ඡාවෙන් තොරව නැවත පදිංචි කිරීම්
- සමාජ පිරික්සුම් වාර්තා
- සමාජ කළමනාකරණ සැලැස්ම (ESMP)
- ව්‍යාපෘති පූර්ව ශක්‍යතා සහ ශක්‍යතා වාර්තා වල සමාජ පරිච්ඡේද
- පාර්ශවකරුවන්ගේ බැඳීම් සැලැස්ම (SEP)
- පාර්ශවකරුවන්ගේ බැඳීම් සැලැස්ම (SEP)
- කම්කරු කළමනාකරණ පටිපාටිය (LMP)
- නැවත පදිංචි කිරීමේ ප්‍රතිපත්ති රාමුව (RMP)
- නැවත පදිංචි කිරීමේ පිරිවැය වාර්තාව
- ස්ත්‍රී පුරුෂ සමාජභාවය ක්‍රියා සැලැස්ම

පාරිසරික හා සමාජ සංවර්ධන අංශය සඳහා සංවර්ධනය කරන ලද කළමනාකරණ තොරතුරු පද්ධතිය (MIS) මගින් මෙම ක්‍රියාකාරකම්වල ඵලදායිතාවයට බෙහෙවින් සහාය වන අතර, රටේ ජෛව-භූගෝලීය සහ සමාජ-ආර්ථික තොරතුරු සහ සමාජ ආර්ථික දත්ත විශ්ලේෂණය කිරීමේ පහසුකම අඩංගු වේ.

ආ) පාරිසරික හා සමාජ ආරක්ෂණයන් නිරීක්ෂණය කිරීම.

දැනට ක්‍රියාත්මක ව්‍යාපෘතිවල පරිසරය සහ සමාජ ආරක්ෂණය අධීක්ෂණය කිරීම,පාරිසරික හා සමාජ සංවර්ධන අංශයේ වගකීම් වලින් එකකි. එසේම, සම්පූර්ණ කරන ලද ව්‍යාපෘතිවල නොවිසඳුනු පාරිසරික හා සමාජීය ගැටළු විසඳීම පාරිසරික හා සමාජ සංවර්ධන අංශය වෙත පැවරී ඇති කාර්යයේ තවත් කොටසකි, එවැනි අවස්ථාවන් හා නඩුවවලට සම්බන්ධ ක්‍රියාකාරී අංශ හරහා ඒවා සමාලෝචනය කර විසඳීම සඳහා අවශ්‍ය නිර්දේශ ලබා දීම සඳහා පාරිසරික හා සමාජ සංවර්ධන අංශය වෙත යොමු කරනු ලැබේ.

ඇ) බාහිර ව්‍යාපෘති සඳහා විවිධ ව්‍යාපෘති අනුමත කරන ආයතන විසින් පිහිටුවන ලද තාක්ෂණික ඇගයීම් කමිටු සාමාජිකයෙකු ලෙස සහභාගී වීම

පාරිසරික හා සමාජ සංවර්ධන අංශය මධ්‍යම පරිසර අධිකාරිය, වෙරළ සංරක්ෂණ දෙපාර්තමේන්තුව, වන සංරක්ෂණ දෙපාර්තමේන්තුව, වනජීවී සංරක්ෂණ දෙපාර්තමේන්තුව, පුරාවිද්‍යා දෙපාර්තමේන්තුව සහ ප්‍රවාහන හා සිවිල් ගුවන් සේවා අමාත්‍යාංශය ඇතුළු විවිධ ව්‍යාපෘති අනුමත කිරීමේ ආයතන විසින් පිහිටුවන ලද තාක්ෂණික ඇගයීම් කමිටු සඳහා සහභාගී වේ. රාජ්‍ය අංශයේ මෙන්ම පෞද්ගලික අංශයේ බාහිර ආයතන විසින් සිදු කරනු ලබන ව්‍යාපෘති සඳහා මාර්ග ජාලයේ බලපෑම හඳුනා ගැනීමට සහ අවම කිරීමේ ක්‍රියාමාර්ග යෝජනා කිරීමට පාරිසරික හා සමාජ සංවර්ධන අංශය ක්‍රියාකාරීව සම්බන්ධ වේ.
තවද,පාරිසරික හා සමාජ සංවර්ධන අංශය විවිධ ප්‍රතිපත්ති, මාර්ගෝපදේශ සහ ජාතික වශයෙන් නිර්ණය කිරීම් කිරීමේදී දායකත්වයන් ආදිය සැපයීම සඳහා පරිසර අමාත්‍යාංශයේ මෙහෙයුම් කමිටුවේ සාමාජිකයෙකු වන අතර ආපදා කළමනාකරණ මධ්‍යස්ථානයේ තාක්ෂණික ක්‍රියාකාරී කණ්ඩායමේ සාමාජිකයෙකි.

ඈ) ජනාධිපති කාර්ය සාධක බලකාය විසින් පවරා ඇති බලතල යටතේ භූ විද්‍යා සම්පත් සඳහා අනුමැතිය ලබා දීම

භූ විද්‍යාත්මක සම්පත් සූරාකෑම පිළිබඳව අධ්‍යයනයක් කිරීම සඳහා ජනාධිපති කාර්ය සාධක බලකාය යටතේ ඇති තාක්ෂණික ඇගයීම් කමිටුවේ සාමාජිකයෙකු ලෙස පාරිසරික හා සමාජ සංවර්ධන අංශයේ අධ්‍යක්ෂවරයාව පත් කර ඇත. කමිටුව යටතේ, ඉදිකිරීම් කර්මාන්තයේ ද්‍රව්‍ය හිඟය විසඳීම සඳහා පහත සඳහන් කාර්යයන් පාරිසරික හා සමාජ සංවර්ධන අංශය විසින් සිදු කර ඇත.

- කාර්මික පතල් කැණීමේ බලපත්‍රය සඳහා ඉල්ලුම්පත්‍ර සකස් කිරීම සහ භූ විද්‍යා සමීක්ෂණ හා පතල් කාර්යාංශය වෙත යොමු කිරීම.
- ත්‍රිකුණාමලය, මඩකලපුව සහ අම්පාර දිස්ත්‍රික්කවල ගල් කුඩු කිරීමේ යන්ත්‍රාගාර සඳහා සුදුසු ස්ථාන පරීක්ෂා කිරීම.

- මාර්ග සංවර්ධන අධිකාරිය වෙනුවන් අවශ්‍ය සමස්ථ සැපයීම සඳහා පාෂාණ කැණීම සඳහා අවසර දීම සම්බන්ධයෙන් ප්‍රාදේශීය ලේකම් කොට්ඨාශ,භූ විද්‍යා සමීක්ෂණ හා පතල් කාර්යාංශය, වනජීවී දෙපාර්තමේන්තුව සහ වන සංරක්ෂණ දෙපාර්තමේන්තුව සමඟ සම්බන්ධීකරණය කිරීම.
- භූ විද්‍යා සම්පත් පිළිබඳ ජනාධිපති කාර්ය සාධක බලකාය විසින් සංවිධානය කරන ලද රැස්වීම් සඳහා සහභාගී වීම.

පාරිසරික හා සමාජ සංවර්ධන අංශය විසින් 2021 වර්ෂය තුළ සිදු කරන ලද සහ නිම කරන ලද කාර්යයන් පිළිබඳ සවිස්තරාත්මක විස්තරයක්.

අ) පාරිසරික හා සමාජ ඇගයීම් වාර්තා සකස් කිරීම සහ සමාලෝචනය කිරීම

- ගාල්ල - දෙනියාය - පල්මඩුල්ල මාර්ගය (A17) සඳහා මූලික පරිසර පරීක්ෂණය සකස් කිරීම සහ මධ්‍යම පරිසර අධිකාරියෙන් අනුමැතිය ලබා ගැනීම.
- ගම්පහ අන්තර් හුවමාරුව සඳහා පරිපූරක පාරිසරික ඇගයීම (SEIA) සකස් කිරීම.
- කොම්පඤ්ඤවීදියේ යෝජිත ගුවන් පාලම සඳහා මූලික තොරතුරු ප්‍රශ්නාවලිය (BIQ) සකස් කිරීම.
- මූලික පරිසර පරීක්ෂණය සකස් කිරීම සහ රත්නපුර බයිපාස් සඳහා මධ්‍යම පරිසර අධිකාරියෙන් අනුමැතිය ලබා ගැනීම.
- යෝජිත මඩුව පාලම සහ ඉත්තපාන පාලම සඳහා BIQ සහ මූලික පරිසර පරීක්ෂණය සකස් කිරීම.
- පිරික්සුම් ලැයිස්තු සකස් කිරීම, මාර්ග විශේෂිත පාරිසරික සහ සමාජ කළමනාකරණ සැලැස්ම (ESMP), පාරිසරික හා සමාජීය යහපත් භාවිතයන් (CESGP) සංග්‍රහය සහ ලෝක බැංකුව යටතේ අන්තර්ගත සම්බන්ධතා සහ සංවර්ධන ව්‍යාපෘතිය සඳහා පාරිසරික හා සමාජ රාමු සමාලෝචනය/සංස්කරණය කිරීම.
- යෝජිත මීරිගම අතුරු මාර්ගයේ සහ කුරුණෑගල අතුරු මාර්ගයේ ව්‍යාපෘතිය සඳහා සමාජ හා පාරිසරික ශක්‍යතා වාර්තාව සකස් කිරීම.
- iRoad දකුණ, සබරගමුව සහ මධ්‍යම පළාත් සඳහා සකස් කරන ලද පාරිසරික ආරක්ෂණ අනුකූලතා අධීක්ෂණ වාර්තාව (ESCMR) සමාලෝචනය කිරීම.
- iRoad වයඹ සහ උතුරු මැද පළාත් සඳහා සකස් කරන ලද පාරිසරික ආරක්ෂණ අනුකූලතා අධීක්ෂණ වාර්තාව (ESCMR) සමාලෝචනය - PIC II .
- කැලණි ගඟ හරහා නව පාලමක් ඉදිකිරීම සඳහා සකස් කරන ලද පාරිසරික ආරක්ෂණ අනුකූලතා අධීක්ෂණ වාර්තාව (ESCMR) සමාලෝචනය කිරීම.
- iRoad II - උඟව පළාත සඳහා සකස් කරන ලද පාරිසරික ආරක්ෂණ අනුකූලතා අධීක්ෂණ වාර්තාව (ESCMR) සමාලෝචනය.
- iRoad II - නැගෙනහිර පළාත සඳහා සකස් කරන ලද පාරිසරික ආරක්ෂණ අනුකූලතා අධීක්ෂණ වාර්තාව (ESCMR) සමාලෝචනය.
- A11 හි මරදන්කඩවල - හබරණ කොටස සඳහා සකස් කරන ලද පාරිසරික ආරක්ෂණ අනුකූලතා අධීක්ෂණ වාර්තාව (ESCMR) සමාලෝචනය කිරීම.
- මාර්ග කළමනාකරණ ගිවිසුම් (RMC)-ගාල්ල පැකේජය සඳහා සකස් කරන ලද පාරිසරික ආරක්ෂණ අනුකූලතා අධීක්ෂණ වාර්තාව (ESCMR) සමාලෝචනය.
- උස් කුලුනු මත ඉදිවෙන වරාය ප්‍රවේශ මහාමාර්ගය සඳහා සකස් කරන ලද පාරිසරික ආරක්ෂණ අනුකූලතා අධීක්ෂණ වාර්තාව (ESCMR) සමාලෝචනය.
- SRCP - B084 මාර්ගය සඳහා සකස් කරන ලද පාරිසරික ආරක්ෂණ අනුකූලතා අධීක්ෂණ වාර්තාව (ESCMR) සමාලෝචනය කිරීම.
- මහනුවර උමං ව්‍යාපෘතිය සඳහා පරීක්ෂණ වාර්තාව සමාලෝචනය කිරීම.
- මැරයින් ඩ්‍රයිව් හි සමාජ ආරක්ෂණ අනුකූලතා අධීක්ෂණ වාර්තාව (SCMR) සකස් කිරීම සහ සමාලෝචනය (අදියර 05 සහ 06).
- නව ගම්පහ අන්තර් හුවමාරුව සඳහා SEIA සකස් කිරීම.
- iRoad II සඳහා ස්ත්‍රී පුරුෂ සමාජභාවය සහ ප්‍රවාහනය පිළිබඳ පුහුණු අත්පොත සකස් කිරීම.
- iRoad දකුණු, සබරගමුව සහ මධ්‍යම පළාත් සඳහා සකස් කරන ලද සමාජ ආරක්ෂණ අනුකූලතා අධීක්ෂණ වාර්තාව (SCMR) සමාලෝචනය කිරීම.

- iRoad වයඹ සහ උතුරු මැද පළාත් සඳහා සකස් කරන ලද සමාජ ආරක්ෂණ අනුකූලතා අධීක්ෂණ වාර්තාව (SSCMR) සමාලෝචනය - PIC II.
- කැලණි ගඟ හරහා නව පාලමක් ඉදිකිරීම සඳහා සකස් කරන ලද සමාජ ආරක්ෂණ අනුකූලතා අධීක්ෂණ වාර්තාව (SSCMR) සමාලෝචනය.
- යෝජිත කොච්චිකඩේ අතුරු මාර්ගය සහ ගුවන් පාලම් තුනක් සඳහා ශක්‍යතා වාර්තාව සමාලෝචනය කිරීම.
- රුවන්පුර අධිවේගී මාර්ගයේ II සහ III අදියර සඳහා පාරිසරික බලපෑම් තක්සේරුව පිටතින් සහාය ලබා ගත් උපදේශකයින් සමඟ එක්ව සකස් කිරීම.

ඉහත කරුණු වලට අමතරව, පාරිසරික සහ සමාජ ආරක්ෂණ අංශවල ප්‍රසම්පාදන අරමුණු සඳහා අවශ්‍ය විවිධ ලියකියවිලි, එනම් උදාහරණයක් ලෙස යොමු නියමයන්(TORs), තාක්ෂණික ඇගයීම් කමිටු(TEC) වාර්තා, අමාත්‍ය උපදේශක ප්‍රසම්පාදන කමිටුව සඳහා ඇගයීම් වාර්තා සකස් කිරීමට පරිසර හා සමාජ සංවර්ධන අංශය සම්බන්ධ වේ.

ආ) පාරිසරික හා සමාජ ආරක්ෂණයන් නිරීක්ෂණය කිරීම

- පිටත වටරවුම් අධිවේගී මාර්ගයේ (OCH) III අනුකූලතා නිරීක්ෂණය ආරක්ෂා කිරීම.
- දක්ෂිණ අධිවේගී මාර්ග ව්‍යාප්ත කිරීමේ ව්‍යාපෘතියේ (ESSEP) I,II,III ආරක්ෂාව අනුකූලතාව පිළිබඳ පසු අධීක්ෂණය.
- iRoad දකුණු, සබරගමුව සහ මධ්‍යම පළාත්වල ආරක්ෂිත අනුකූලතාව පිළිබඳ පසු නිරීක්ෂණ.
- iRoad වයඹ සහ උතුරු මැද පළාත්වල ආරක්ෂිත අනුකූලතාව පිළිබඳ පසු නිරීක්ෂණ - PIC II.
- iRoad කළුතර දිස්ත්‍රික්කයේ ආරක්ෂාව අනුකූල වීම අධීක්ෂණය කිරීම.
- බදුල්ල වෙන්කලාඩි මාර්ග වැඩිදියුණු කිරීමේ ව්‍යාපෘතියේ ආරක්ෂිත අනුකූලතාවය නිරීක්ෂණය කිරීම.
- කැලණි ගඟ හරහා නව පාලම් ඉදිකිරීමේ ආරක්ෂාවට අනුකූල වීම පිළිබඳ පසු නිරීක්ෂණ.
- iRoad II - උඟව පළාතේ ආරක්ෂාව අනුකූල වීම අධීක්ෂණය කිරීම.
- iRoad II - නැඟෙනහිර පළාතේ ආරක්ෂාව අනුකූල වීම අධීක්ෂණය කිරීම.
- A011 හි මරදන්කඩවල - හබරණ කොටසේ ආරක්ෂිත අනුකූලතාවය නිරීක්ෂණය කිරීම.
- RMC-ගාල්ල පැකේජයේ ආරක්ෂණ අනුකූලතාවය නිරීක්ෂණය කිරීම.
- වරාය ප්‍රවේශ උස් අධිවේගී මාර්ගයේ ආරක්ෂිත අනුකූලතාවය නිරීක්ෂණය කිරීම.
- SRCP - B084 මාර්ග ආරක්ෂණ අනුකූලතාවය නිරීක්ෂණය කිරීම.
- A01 - කඩවත නිට්ටඹුව කොටසේ ආරක්ෂාව අනුකූලතා පසු අධීක්ෂණය
- මැරයින් ඩ්‍රයිව් හි ආරක්ෂාකාරී අනුකූලතාව නිරීක්ෂණය කිරීම (අදියර 05 සහ 06)
- මධ්‍යම අධිවේගී මාර්ග ව්‍යාපෘතිය (CEP)I හි ආරක්ෂාකාරී අනුකූලතාව නිරීක්ෂණය කිරීම
- කැලණි ගඟ හරහා නව පාලම් ඉදිකිරීමේ ඉඩම් අත් කර ගැනීම සහ නැවත පදිංචි කිරීම අධීක්ෂණය කිරීම.
- උස් කුළුණු මත දිවෙන වරාය ප්‍රවේශ මහා මාර්ගයේ ඉඩම් අත්පත් කර ගැනීම සහ නැවත පදිංචි කිරීම අධීක්ෂණය කිරීම
- මධ්‍යම අධිවේගී මාර්ග ව්‍යාපෘතිය (CEP)I හි ඉඩම් අත් කර ගැනීම සහ නැවත පදිංචි කිරීම අධීක්ෂණය කිරීම
- රාජගිරිජ නාවල අංගම්පිටිය පාලම ඉදිකිරීමේ ආරක්ෂාවට අනුකූල වීම අධීක්ෂණය කිරීම.

ඇ) බාහිර ව්‍යාපෘති සඳහා විවිධ ව්‍යාපෘති අනුමත කරන ආයතන විසින් පිහිටුවන ලද තාක්ෂණික ඇගයීම් කමිටු සාමාජිකයෙකු ලෙස සහභාගී වීම.

2021 වර්ෂයේ පරිසර හා සමාජ සංවර්ධන අංශය තාක්ෂණික ඇගයීම් කමිටු සාමාජිකයෙකු ලෙස සහභාගී වූ ව්‍යාපෘති;

- යෝජිත සීතාවක ගංගා ජල විදුලි ව්‍යාපෘතිය
- යෝජිත කුණ්ඩසාලේ හාරගම ජල සම්පාදන ව්‍යාපෘතිය
- යෝජිත බස්නාහිර කලාප සැහැල්ලු දුම්රිය සංක්‍රමණ ව්‍යාපෘතිය
- යෝජිත අඹතලේ ජල සම්පාදන පද්ධති ව්‍යාපෘතිය

- මීගමුව ව්‍යාපෘතිය සඳහා යෝජිත බැහැර කිරීමේ යටිතල පහසුකම්
- ඖෂධ නිෂ්පාදන කලාපය අනුරාධපුර ඔයාමඩුව ප්‍රදේශයේ ස්ථාපිත කිරීම.
- මිරිජ්ජවිල ප්‍රදේශය තුළ වානේ කර්මාන්තශාලා සහ ගල් අඟුරු භාවිතය
- ලෝටස් ෆාමා කලාපය, මිල්ලෑව, හොරණ
- යෝජිත බන්ධනාගාර නැවත ස්ථානගත කිරීමේ ව්‍යාපෘතිය, මිල්ලව, හොරණ
- නානුඔය සිට නුවරඑළිය කේබල් කාර් ව්‍යාපෘතිය
- කොග්ගල, ආයෝජන මණ්ඩලයේ අපනයන සැකසුම් කලාපයේ පිරිපහදු කළ අපජලය බැහැර කිරීම සඳහා යෝජිත මුහුදු මෝය (sea outfall) ඉදිකිරීම්.
- මහරගම සංවර්ධන සැලැස්ම.
- IIAS බහුවිධ ව්‍යාපෘතිය, කෙරවලපිටිය මාර්ගය, හැඳල, වත්තල.
- ප්‍රොජස්ඩ් කාර්මික කලාපය, කටුනායක.
- ජා-ඇල සඳහා අපජල බැහැර කිරීමේ පද්ධතිය, ඒකල අදියර-II
- යෝජිත කුලියට ගත හැකි බහු මහල් කාර්යාල ගොඩනැගිලි ව්‍යාපෘතිය අංක: 106 ගාලු පාර, කොළඹ.
- අංක: 353, ගාලු පාර කොළඹ-03 හි පිහිටි කුලියට ගත හැකි බහු මහල් කාර්යාල ගොඩනැගිලි ව්‍යාපෘතිය.
- මිරිජ්ජවිල අපනයන සැකසුම් කලාපයේ හම්බන්තොට ජාත්‍යන්තර වරායේ සිට ලංවා සිමෙන්ති කම්හල දක්වා නැව් බඩු බාන ස්ථාන දෙකක් ස්ථාපනය කිරීම සහ වාහක මාර්ගය ස්ථාපනය කිරීම.
- මැනිං වෙළඳපොළ පෑලියගොඩට ගෙන යාම.
- අඩු ආදායම්ලාභී සහ මධ්‍යම ආදායම්ලාභීන් සඳහා නිවාස ව්‍යාපෘතිය, කොහොලන්කොල, හම්බන්තොට (Victoria Residencies (PVT) Ltd)
- කුරුළු උද්‍යාන ව්‍යාපෘතිය මාදිවෙල.
- හම්බන්තොට, අරබක්ක ඖෂධ කලාපය
- යෝජිත මීගමුව කලපු මෝය සංවර්ධන ව්‍යාපෘතිය.
- මිශ්‍ර සංවර්ධන ව්‍යාපෘතිය, බුත්ගමුව.
- කැලණිවැලි දුම්රිය මාර්ගය වැඩිදියුණු කිරීමේ ව්‍යාපෘතිය.
- යෝජිත මොරගොල්ල ජල විදුලි ව්‍යාපෘතිය.
- කෙරවලපිටියේ සිට කැලණිතිස්ස දක්වා LNG නල මාර්ගය.

ඇ) ජනාධිපති කාර්ය සාධක බලකාය විසින් පවරා ඇති බලතල යටතේ භූ විද්‍යා සම්පත් සඳහා අනුමැතිය ලබා දීම.

පහත සඳහන් කාර්මික පතල් බලපත්‍ර (IML) අයදුම්පත් සකස් කර භූ විද්‍යා සමීක්ෂණ හා පතල් කාර්යාංශය (GSMB) වෙත යොමු කරන ලදී.

- බලංගොඩ කුඩු කම්හල සඳහා IML අයදුම්පත
- මීරිගම ගල්කොරිය සඳහා IML අයදුම්පත
- මඩකලපුව දිස්ත්‍රික්කයේ පෙරිලෙවෙල්, මඩකලපුව දිස්ත්‍රික්කයේ මැන්කර්නි සෙන්ට්‍රල්, ත්‍රිකුණාමලය දිස්ත්‍රික්කයේ ඉරංකර්නි, ත්‍රිකුණාමලය දිස්ත්‍රික්කයේ නිලාවේලි, ත්‍රිකුණාමලය දිස්ත්‍රික්කයේ සාම්පූර්, අම්පාර දිස්ත්‍රික්කයේ දමාන් වැනි පාෂාණ පවතින ස්ථාන සඳහා IML අයදුම්පත් 06ක් යොමු කරන ලදී.

වෙනත්

- iRoad කළුතර දිස්ත්‍රික්කය සඳහා දැනුවත් කිරීම් සහ පුහුණු වැඩසටහන්
- RNIP - එක්සිම් බැංකුවේ අරමුදල් සහිත හුනාන් ව්‍යාපෘතිය යටතේ මාර්ගවල පාරිසරික නිෂ්කාශන කොන්දේසිවලට අනුකූල වීම
- කොම්පඤ්ඤවීදියේ යෝජිත ගුවන් පාලම සඳහා තාක්ෂණික ඇගයීම් කමිටුවේ (TEC) සාමාජික
- කොච්චිකඩේ අතුරු මාර්ගය සඳහා තාක්ෂණික ඇගයීම් කමිටුවේ (TEC) සාමාජික
- ESEP කොටස 1 කපුදුව අන්තර් හුවමාරුව සඳහා පාරිසරික අනුමැතිය ලබා ගැනීමට සම්බන්ධ වීම
- මණ්ඩල පත්‍රිකා මාර්ග සංවර්ධන අධිකාරියේ අධ්‍යක්ෂ මණ්ඩලය වෙත යවා පහත සඳහන් දෑ සඳහා අනුමැතිය ලබා දෙන ලදී.

- සූරියවැව ක්‍රෂර් කම්හල මග නැගුම මාර්ග ඉදිකිරීම් උපකරණ (MNRCE) සමාගමට භාරදීම
- බලංගොඩ කෘෂර් කම්හල MNRCE සමාගමට පැවරීම
- මහව සිසිල් මිශ්‍ර කම්හල සහ පරිශ්‍රය මගනැගුම උපදේශන සහ ව්‍යාපෘති කළමනාකරණ සේවා සමාගම (පුද්ගලික) සමාගමට බදු දීම.

කළමනාකරණ තොරතුරු පද්ධතිය (MIS)

පෙර වර්ෂයේදී මෙන්, කළමනාකරණ තොරතුරු පද්ධතිය විසින්, ජෛව- භූගෝලීය දත්ත හා සමාජීය තොරතුරු රැස් කිරීම මෙම වර්ෂයේදී අඛන්ඩව සිදු කරනු ලැබිය. පාරිසරික හා සමාජීය ආරක්ෂණ ලේඛන පිළියෙළ කිරීමේදී මෙම තොරතුරු ඵලදායි ලෙස යොදා ගන්නා ලදී. කළමනාකරණ තොරතුරු පද්ධති කණ්ඩායම හා පාරිසරික හා සමාජීය සංවර්ධන අංශය විසින් පිළියෙළ කරන ලද ආරක්ෂණ වාර්තා සිතියම් පිළියෙළ කිරීමට සහාය විය. කළමනාකරණ තොරතුරු පද්ධතිය කණ්ඩායම පහත විස්තර කර ඇති පරිදි 2021 වර්ෂයේදී පහත සඳහන් ව්‍යාපෘති සඳහා දත්ත රැස් කිරීමට සහ විශ්ලේෂණය කිරීමට සහාය වී ඇත.

- පහත දැක්වෙන ව්‍යාපෘති යටතේ GPS දත්ත විශ්ලේෂණය, GPS සිතියම්ගත කිරීම, GPS මත පදනම් වූ වීඩියෝ ප්‍රස්ථාරකරණය සහ ඡායාරූප ප්‍රස්ථාරකරණය වැනි භූගෝලීය තොරතුරු රැස් කිරීම. ලෝක බැංකු මාර්ග - සබරගමුව පළාත - රත්නපුර දිස්ත්‍රික්කය, මධ්‍යම පළාත - මාතලේ දිස්ත්‍රික්කය උතුරු මැද පළාත - අනුරාධපුර සහ පොළොන්නරුව දිස්ත්‍රික්කය, වයඹ පළාත - කුරුණෑගල දිස්ත්‍රික්කය. රුවන්පුර අධිවේගී මාර්ගය, අංගම්පිටිය පාලම, මඩුව පාලම, ඉත්තපාන පාලම, ගිරිඋල්ල අතුරු මාර්ගය, කුරුණෑගල අතුරු මාර්ගය, මීරිගම අතුරු මාර්ගය, අනුරාධපුර ගුවන් පාලම, කොම්පඤ්ඤවීදිය ගුවන් පාලම, ලංකාගම මාර්ගය, පුත්තලම දිස්ත්‍රික් පාලම්, වක්වැල්ල පාලම, ක්‍රියාකාරකම් අයවැය වැඩසටහන.
- නැවත පදිංචි කිරීමේ ස්ථාන වල දත්ත ඇතුළත් කිරීම සහ විශ්ලේෂණය කිරීම - දක්ෂිණ ප්‍රවාහන සංවර්ධන ව්‍යාපෘතිය - ගෘහස්ථ ප්‍රශ්නාවලිය
- දත්ත ඇතුළත් කිරීම සහ ප්‍රතිලාභීන් තෘප්තිමත් කිරීමේ සමීක්ෂණය - අනුරාධපුර, රත්නපුර සහ මාතලේ දිස්ත්‍රික්ක සඳහා ඇතුළත් ග්‍රාමීය සම්බන්ධතා ව්‍යාපෘතිය
- රුවන්පුර අධිවේගී මාර්ග ව්‍යාපෘතියේ නියැදි දත්ත විශ්ලේෂණය

MIS කණ්ඩායම පහත කාර්යයන් සමඟ සම්බන්ධ වී කටයුතු කර ඇත.

- සියලුම පොත් සහ විමර්ශන ද්‍රව්‍ය ඉන්වෙන්ටරි ගත කිරීම සහ ලේඛන පහසුවෙන් යොමු කිරීම සහ කළමනාකරණය කිරීම සඳහා පුස්තකාල පද්ධතියක් සංවර්ධනය කිරීම.
- මහජන පැමිණිලි කළමනාකරණය කිරීම සඳහා දත්ත සමුදා කළමනාකරණ පද්ධතිය
- දැනට ක්‍රියාත්මක ව්‍යාපෘතිවල සමාජ ආරක්ෂණය සඳහා තොරතුරු දත්ත සමුදා පද්ධතිය
- GPS ස්ථාන සමඟ ජලයේ ගුණාත්මකභාවය, ශබ්දය, වාතයේ ගුණාත්මකභාවය වැනි සියලුම පාරිසරික දත්ත ගබඩා කිරීමට දේශීය සත්කාරක වෙබ් පාදක පද්ධතිය (local host web).
- ඩොමේන් නාම පරිගණක ජාලය පරිපාලනය කිරීම සහ අංශයේ පැවතී පරිගණක මෘදුකාංග සහ දෘඩාංග ගැටළු නිරාකරණය කිරීම



රුවන්පුර අධිවේගී මාර්ග II අදියර - ස්ථාන පරීක්ෂාව



ලෝක බැංකුව අරමුදල් සපයන අන්තර් සම්බන්ධිත සහ සංවර්ධන ව්‍යාපෘති මාර්ග සඳහා ක්ෂේත්‍ර සමීක්ෂණය

පිළියම් ගැනීමේ දී සිදු වන අවහිරතා සහ ඒවා මඟ හරවා ගැනීමට යෝජනා

අ) පාරිසරික හා සමාජ ආරක්ෂණවල වැදගත්කම මාර්ග සංවර්ධන අධිකාරිය විසින් හොඳින් හඳුනාගෙන ඇත. කෙසේ වෙතත්, පාරිසරික හා සමාජ ආරක්ෂණ පිළිපැදීම සතුටුදායක මට්ටමක නොමැති බැවින් පාරිසරික හා සමාජ ආරක්ෂණ පිළිපැදීම ඉදිකිරීම් කටයුතුවල ප්‍රගතියට නොගැලපේ. දේශීය අරමුදල් සපයන ව්‍යාපෘතිවල දී පාරිසරික හා සමාජ ආරක්ෂණ කටයුතු පිළිබඳව කිසිසේත්ම සැලකිලිමත් නොවන අතර ඒවා සලකා බලනු ලබන්නේ අරමුදල් සපයන ආයතනයන්හි මාර්ගෝපදේශවලට අනුව අවශ්‍ය යැයි හැඟෙන විදේශ අරමුදල් සහිත ව්‍යාපෘතිවල පමණි. ඉහත කරුණු මඟහරවා ගැනීම සඳහා, සියලු ව්‍යාපෘති සඳහා කොන්ත්‍රාත්තු ලේඛනවල කොටසක් ලෙස පාරිසරික හා සමාජ ආරක්ෂණ සැලැස්මක් සම්මත කිරීම යෝජනා කෙරේ.

ආ) පාරිසරික හා සමාජ ආරක්ෂණ ක්‍රමවේදයන් සමහරක් ඉදිකිරීම් කාලය තුළ ක්‍රියාත්මක කළ යුතු අතර එමඟින් පිරිවැය බලපෑම් ඇති වේ. ප්‍රමාණ බිල්පත් සඳහා මෙන්ම පිරිවැය පියවා ගැනීම සහ අපේක්ෂිත ප්‍රතිඵල ලබා ගැනීම සඳහා නව විධිවිධාන අවශ්‍ය විය හැකිය.

ඇ) ඇති වූ දුෂ්කරතා

- කොන්ත්‍රාත්කරු විසින්ම අවශ්‍ය අනුමැතිය ලබාගෙන යම් තොරතුරු ඉදිරිපත් කළ යුතු බැවින්, මාර්ග සංවර්ධන අධිකාරිය විසින් සෘජුවම සමහර විස්තර එකතු කිරීමේදී ඇති වන දුෂ්කරතා. බොහෝ විට පාරිසරික හා සමාජීය සංවර්ධන අංශය වෙතින් පාරිසරික නිෂ්කාශනය ඉල්ලා සිටින විටකදී කොන්ත්‍රාත්කරුවෙකු තෝරා නොගනී. උදා: අපද්‍රව්‍ය ඉවතලන ස්ථාන, තාවකාලිකව පාවිච්චියට ගන්නා වළවල්
- පාරිසරික අනුමත කිරීමේ ක්‍රියාවලිය සිදුවෙමින් පවතින අතරතුර සැලසුම් අවසන් කර නොමැත. සමහර පාර්ශවකරුවන්ගේ සම්බන්ධීකරණය නොමැතිකම සහ ඔවුන්ගේ ප්‍රතිපෝෂණ සැපයීම ප්‍රමාද කිරීම. උදා: වනජීවී සංරක්ෂණ දෙපාර්තමේන්තුව ඔවුන්ගේ අනුමැතිය සහ ප්‍රතිපෝෂණ ලබාදීමට බොහෝ විට ප්‍රමාද වේ.

ඈ) ආපදා කළමනාකරණය, සෞඛ්‍ය සහ මාර්ග ආරක්ෂාව, මාර්ග ආශ්‍රිත ආපදා කළමනාකරණය, මාර්ග භාවිතා කරන්නන්ගේ සෞඛ්‍යය සහ ආරක්ෂාව, මාර්ග උපාංග සහ තෙවන පාර්ශවීය දේපළ පිළිබඳව වර්තමානයේ විවිධ රාජ්‍ය ආයතන විසින් සිදු කරනු ලබන අතර ඒවා අතර කිසිදු සම්බන්ධයක් නොමැත.

ඉ) විශාල මුදලක් වැය කරමින් පසුගිය දශකය තුළ මාර්ග සහ මහාමාර්ග ව්‍යාපෘති සඳහා විවිධ වැළැක්වීමේ ක්‍රියාමාර්ග ක්‍රියාත්මක කර ඇතත්, මෙම ක්‍රියාමාර්ගවල සාර්ථකත්වය හෝ දුර්වලතා සොයා ගැනීමට නිසි ක්‍රමයක් නොමැත. අනාගත ව්‍යාපෘති සැලසුම් කිරීම සඳහා ප්‍රයෝජනවත් විය හැකි හඳුනාගැනීමේ කැමරාවක් අනුගමනය කිරීම, නිරන්තර අධීක්ෂණය සහ වාර්තා තබා ගැනීම සහ ප්‍රතිඵල අදාළ අංශ අතර බෙදා ගැනීම මෙයට පිළියම් වශයෙන් ක්‍රියාත්මක කළ හැකිය.

9. සැලසුම්කරණය

මාර්ග සංවර්ධන අධිකාරියේ සැලසුම් අංශය, මාර්ග සංවර්ධන අධිකාරිය විසින් ක්‍රියාත්මක කරනු ලබන ව්‍යාපෘති, ව්‍යාපෘති සංකල්පයේ සිට ක්‍රියාත්මක කිරීම දක්වා වන සමස්ත සැලසුම්කරණය පිළිබඳ වගකීම දරනු ලබයි.

රාජ්‍ය ප්‍රතිපත්ති සහ ප්‍රමුඛතා මත පදනම්ව රටේ සමාජ-ආර්ථික සංවර්ධනය සඳහා අනාගත අවශ්‍යතා සැලකිල්ලට ගනිමින් ජාතික මාර්ග ජාලයේ සාර්ව සැලසුම්කරණය, ජාතික මාර්ග ජාලය සංවර්ධනය සඳහා වූ ක්‍රියාකාරකම් සමස්ත සැලසුම්කරණයට ඇතුළත් වේ.

සැලසුම් අංශය පහත පරිදි අංශ හතරකින් සමන්විත වේ;
සැලසුම් කිරීම I - රථවාහන දත්ත එකතු කිරීම සහ ඇගයීම
සැලසුම් කිරීම II - සකස් කිරීම, අධීක්ෂණය, GIS සහ කළමනාකරණ තොරතුරු පද්ධතිය
සැලසුම් කිරීම III - ජාල සැලසුම් කිරීම සහ මාර්ග ආරක්ෂාව
සැලසුම් IV - අධිවේගී මාර්ග තොරතුරු සහ සංවර්ධන කළමනාකරණ පද්ධතිය

2021 මැද භාගයේදී, මාර්ගීය සංවර්ධන අධිකාරියේ "යටිතල පහසුකම්, මාර්ග ආරක්ෂාව සහ රථවාහන කළමනාකරණය" යනුවෙන් නව අංශයක් පිහිටුවන ලද අතර සැලසුම් අංශය යටතේ පැවරී ඇති මාර්ග ආරක්ෂණ කාර්යයන් අලුතින් පිහිටුවන ලද යටිතල පහසුකම්, මාර්ග ආරක්ෂාව සහ රථවාහන කළමනාකරණ අංශය වෙත පැවරිණි.

9.1 රථවාහන දත්ත රැස් කිරීම සහ ඇගයීම

රථවාහන දත්ත යනු මාර්ග සංවර්ධන අධිකාරියේ සැලසුම් කාර්යය සඳහා අත්‍යවශ්‍ය ආදානයකි. සැලසුම් අංශයේ රථවාහන දත්ත රැස්කිරීමේ සහ ඇගයීම් අංශයට, රථවාහන දත්ත රැස්කිරීම සහ මාර්ග සංවර්ධන අධිකාරියේ රථවාහන දත්ත-පද්ධති පවත්වාගෙන යාමේ කාර්යය පැවරී ඇත.

වාර්ෂික වැඩසටහන මත පදනම්ව වසර පුරා රථවාහන දත්ත එකතු කරනු ලැබේ. සාමාන්‍ය දෛනික ගමනාගමන (ADT) පරිමාවන්, වාර්ෂික සාමාන්‍ය දෛනික ගමනාගමනය (AADT), අතින් සිදු කරන වාහන වර්ගීකරණ ගණන (MCC) සහ ඇක්සල් ලෝඩ් ගණන වැනි රථවාහන සමීක්ෂණ සාමාන්‍යයෙන් සිදු කෙරේ. ADT සහ MCC වල සාමාන්‍ය සමීක්ෂණ සඳහා ස්ථිර ස්ථාන 193ක් පමණ හඳුනාගෙන ඇති අතර Axle Load සමීක්ෂණය සඳහා තවත් ස්ථාන 28ක් හඳුනාගෙන ඇත. හැරවුම් වලන (මංසන්ධිවල සිදුවන තදබදය) සමීක්ෂණ, නියම ගමනාන්ත සමීක්ෂණ, පදික සමීක්ෂණ, වාහන නැවැත්වීමේ සමීක්ෂණ ආදිය ඉල්ලුම මත සිදු කෙරේ.

වගුව 31 : 2021 වර්ෂය සඳහා රථවාහන පරිමා සමීක්ෂණ වැඩසටහනේ සාරාංශය

ක්‍රියාකාරකම	**මාසය**												**එකතුව**
	ජනවාරි	**පෙබරවාරි**	**මාර්තු**	**අප්‍රේල්**	**මැයි**	**ජූනි**	**ජූලි**	**අගෝස්තු**	**සැප්තැම්බර්**	**ඔක්තෝබර්**	**නොවැම්බර්**	**දෙසැම්බර්**	
සාමාන්‍ය දෛනික ගමනාගමනය	10	10	10	-	10	10	10	-	10	10	10	-	90
අතින් සිදු කරන වර්ගීකරණ ගණන (Manual Classification Count)	15	15	15	-	15	15	15	-	15	15	15	-	135
ඇක්සල් ලෝඩ් සමීක්ෂණය	1	1	1	1	1	1	1	1	1	1	1	1	12
AADT - A084 මාර්ගයේ 5 වන කි.මී. හි මාසික විචලනය	1	1	1	1	1	1	1	1	1	1	1	1	12



සිතියම 4: ගමනාගමන පරිමාව ගණන් කරන ස්ථාන

වගුව 32 : 2021 දී සිදු කරන ලද රථවාහන සමීක්ෂණවල සාරාංශය

විස්තරය	සමීක්ෂණ ගණන
ADT සමීක්ෂණ	27
AADT (මාසික විචලන සාධකය නිරීක්ෂණය කිරීම)	6
අතින් සිදු කරන වර්ගීකරණ ගණන (MCC)	70
Axle Load සමීක්ෂණ	-
හැරවුම් චලන සමීක්ෂණය (මංසන්ධි සමීක්ෂණ)	31
පදික සමීක්ෂණ	33
වාහන නැවැත්වීමේ සමීක්ෂණ	17
OD සමීක්ෂණ	2

මාර්ග පවරා ගැනීම

රටේ මාර්ග ජාලය විවිධ සංවිධාන මගින් පරිපාලනය සහ කළමනාකරණය කරනු ලැබේ. වරින් වර ජාල සම්බන්ධතා සහ ඇතැම් කොන්දේසි සැලකිල්ලට ගනිමින් වෙනත් (පළාත්/ප්‍රාදේශීය සභා) මාර්ග ජාතික මහාමාර්ග ලෙස පවරා ගනු ලැබේ. 2008 අංක 40 දරන ජාතික මංතීරු පනතේ අංක 8 දරන වගන්තියට අනුව මහාමාර්ග අමාත්‍යවරයා විසින් ගැසට් පත්‍රයේ ප්‍රකාශයට පත් කරන ලද නියෝගයක් මගින් ඕනෑම මාර්ගයක් ජාතික මහා මාර්ගයක් ලෙස ප්‍රකාශයට පත් කිරීමට අවසර දෙනු ලැබේ. 2021 වසර තුළ ජාතික මහාමාර්ග ලෙස නව මාර්ග ප්‍රකාශයට පත් කර නොමැත.

9.2 ජාල සැලසුම් කිරීම සහ වාර්තා කිරීම

සැලසුම් කිරීම සහ වාර්තා කිරීම, සැලසුම් අංශයේ සැලසුම්කරණයII අංශයේ ප්‍රධාන කාර්යයකි. අනෙකුත් අංශ, පළාත් අධ්‍යක්ෂවරුන් සහ ව්‍යාපෘති අධ්‍යක්ෂවරුන් සමඟ සාකච්ඡා කර රැස්කර ගන්නා තොරතුරු මත පදනම්ව සෑම වසරකම ආරම්භයේදී වාර්ෂික ක්‍රියාකාරී සැලැස්ම සකස් කෙරේ. වර්ෂය තුළ, සාමාන්‍යයෙන් වාර්ෂික ක්‍රියාකාරී සැලැස්මට අනුව වැඩ සිදු කරනු ලැබේ. කෙසේ වෙතත්, හදිසි අවශ්‍යතා සඳහා ප්‍රමුඛත්වය දෙනු ලබන අතර, මෙම අවශ්‍යතාවයට සරිලන පරිදි සෑම වසරකම මැද භාගයේදී වාර්ෂික ක්‍රියාකාරී සැලැස්ම සංශෝධනය කිරීමට කටයුතු කරනු ලැබේ. ආයතනික සැලැස්ම වසර 5 ක කාලයක් සඳහා සකස් කර ඇති අතර වත්මන් වර්ෂයේ පවතින අවශ්‍යතා සහ ඉතිරි කාලසීමාව සඳහා වාර්ෂිකව සමාලෝචනය කෙරේ. වර්ෂය සඳහා සම්පූර්ණ අයවැය ප්‍රතිපාදන ප්‍රශස්ත ලෙස භාවිතා කිරීම සහතික කිරීම සඳහා, මූල්‍ය රෙගුලාසි (FR) 66 ප්‍රකාරව, අදාළ හුවමාරු කිරීම සඳහා භාණ්ඩාගාරයෙන්අ වශ්‍ය අනුමැතිය ලබා ගන්නා ලදී.

2021 වර්ෂයේදී, 2021-2030 කාලය සඳහා ජාතික මාර්ග ප්‍රධාන සැලැස්ම (NRMP) කෙටුම්පත යාවත්කාලීන කිරීම ආරම්භ කරන ලදී.

අනුමැතිය ලබා ගැනීම සඳහා වන ව්‍යාපෘති යෝජනා

ව්‍යාපෘතිවල සංකල්පය ක්‍රියාත්මක කිරීමට එය රජය විසින් අනුමත කර ගැනීම සඳහා ජාතික සැලසුම් දෙපාර්තමේන්තුව වෙතත් විදේශ ආයතන වලින් අරමුදල් ලබා ගැනීම සඳහා සාකච්ඡා කිරීමට විදේශ සම්පත් දෙපාර්තමේන්තුව වෙතත් යොමු කෙරේ. විදේශීය අරමුදල් සපයන ආයතන සමඟ සම්බන්ධීකරණය සහ ණය සාකච්ඡා සම්බන්ධයෙන් විවිධ දූත මණ්ඩල සමඟ කටයුතු කිරීම සහ ලේඛන සකස් කිරීම ද මෙම ඒකකයට පැවරී ඇති කාර්යභාරයකි. මීට අමතරව, මෙම ඒකකය දැනටමත් ක්‍රියාත්මක කරන ලද ව්‍යාපෘති පිළිබඳ පශ්චාත් ඇගයීම් අධ්‍යයනය/ක්‍රියාවලිය සිදු වන අතරතුර විදේශ අරමුදල් පිලිබඳ දූත මණ්ඩල සමඟ අදාළ කටයුතු සම්බන්ධීකරණය කරයි.

2021 වර්ෂය තුළ, පහත සඳහන් ව්‍යාපෘති සම්බන්ධයෙන් ජාතික සැලසුම් දෙපාර්තමේන්තුව (NPD) වෙතින් ව්‍යාපෘති යෝජනා/සංකල්ප පත්‍රිකා සකස් කර ව්‍යාපෘති අනුමැතිය සඳහා ඉදිරිපත් කර ඇත.

- මඩකලපුව දිස්ත්‍රික්කයේ සන්නිවේලි-නිකිලිවඩ්ඩෙයි පාලම ඉදිකිරීම
- එක්සත් ජාතීන්ගේ මාර්ග ආරක්ෂණ අරමුදල -2020 සඳහා වගකිවයුතු ආයතන අතර වැඩිදියුණු කළ ඒකාබද්ධතාව හරහා ශ්‍රී ලංකාවේ මාර්ග ආරක්ෂණ කළමනාකරණය වැඩිදියුණු කිරීම.
- ආපදා / හදිසි අවස්ථා සඳහා භාවිතා කිරීම සඳහා පාලම් සංරචක (හදිසි පාලම් සඳහා) ලබා ගැනීම
- ලෝක බැංකුවේ අරමුදල් ඇතුළත් සම්බන්ධතා සහ සංවර්ධන ව්‍යාපෘතිය
- පාලම් ප්‍රතිසංස්කරණය කිරීම, පුළුල් කිරීම සහ නව ඉදිකිරීම් කුවේට් අරමුදල (KFAED)
- වරකාපොල අතුරු මාර්ගය
- කටුගස්තොට අතුරු මාර්ගය
- කොළඹ-කටුනායක අධිවේගී මාර්ගය කොච්චිකඩේ දක්වා දීර්ඝ කිරීම
- කොස්වත්ත සිට රත්මලාන දක්වා අධිවේගී මාර්ගය
- මත්තල - ලුණුගම්වෙහෙර - වැල්ලවාය - පොතුවිල් මාර්ග කොටස පුළුල් කිරීම සහ වැඩිදියුණු කිරීම
- අරාබි ආර්ථික සංවර්ධනය සඳහා වූ කුවේට් අරමුදල (KFAED) විසින් අරමුදල් සපයන ලද පාලම් 25 ක් නැවත ඉදිකිරීමේ ව්‍යාපෘතිය යටතේ ඒකල-කොටදෙණියාව (B111) මාර්ගයේ අංක 4/1 පාලම සහ කැලණිය - මුදුන්ගොඩ (B214) මාර්ගයේ අංක 30/1 පාලම ප්‍රතිසංස්කරණය කිරීම.
- අරාබි ආර්ථික සංවර්ධනය සඳහා වූ කුවේට් අරමුදලේ (KFAED) මූල්‍ය ආධාර ඇතිව නව පාලම් ප්‍රතිසංස්කරණය කිරීම, පුළුල් කිරීම සහ ඉදිකිරීම

වාර්තා ඉදිරිපත් කිරීම

2021 වර්ෂය තුළ, සැලසුම් අංශයේ සැලසුම්කරණ II අංශය විසින් පහත වාර්තා සකස් කර ඉදිරිපත් කිරීමට කටයුතු කරන ලදී.

- අයවැය ප්‍රතිපාදන අනුව ක්‍රියාකාරී සැලැස්ම 2021 සකස් කර මාර්ග සංවර්ධන අධිකාරියේ කළමනාකරණ මණ්ඩලය වෙත ඉදිරිපත් කරන ලදී.
- මාර්ග සංවර්ධන අධිකාරියේ 2020 වාර්ෂික වාර්තාව (ඉංග්‍රීසි අනුවාදය)
- ආයතනික සැලැස්ම 2022-2026
- සියලුම ප්‍රගති වාර්තා (මාසික සහ කාර්තුමය)
- 2020 සහ 2021 මැද භාගය සඳහා මහ බැංකුව වෙත මාර්ග සංවර්ධන අධිකාරියේ කාර්ය සාධන වාර්තාව ඉදිරිපත් කිරීම.

ශක්‍යතාව සහ වෙනත් අධ්‍යයන

යෝජිත පුනරුත්ථාපන / වැඩිදියුණු කිරීමේ කටයුතුවල ආර්ථික ශක්‍යතා සහතික කිරීම සඳහා සිදු කරනු ලබන ශක්‍යතා අධ්‍යයන් සඳහා මෙම ඒකකය ක්‍රියාකාරී සහභාගීත්වය සපයයි. නව ව්‍යාපෘති සම්බන්ධයෙන්, ශක්‍යතා අධ්‍යයනයේ දී හැකි සියලු විකල්ප සලකා බලනු ලැබේ. රථවාහන විශ්ලේෂණය සිදු කිරීමේදී, JICA STRADA රථවාහන පුරෝකථන ආකෘතිය භාවිතයෙන් මාර්ගවල අනාගත ගමනාගමන තත්ත්වයන් පුරෝකථනය කරනු ලැබේ. ව්‍යාපෘතිය ශක්‍යතා සහිත වන්නේ නම් හා එය පාරිසරික සංවේදී ප්‍රදේශයක් හරහා ගමන් කරන්නේ නම් ව්‍යාපෘතිය ක්‍රියාත්මක කිරීමට පෙර අදාළ අධිකරින්ගෙන් අනුමැතිය ලබා ගැනීමට පියවර ගන්නා ලෙස, මාර්ග සංවර්ධන අධිකාරියේ පාරිසරික හා සමාජීය සංවර්ධන අංශයෙන් ඉල්ලා සිටිනු ලැබේ.

2021 දී සිදු කරන ලද වැඩ

- අලව්ව දුම්රිය හරස් මාර්ගය, මුට්ටාටුගල දුම්රිය හරස් මාර්ගය, කොම්පඤ්ඤවීදිය දුම්රිය හරස් මාර්ගයේ ගුවන් පාලම සඳහා ශක්‍යතා අධ්‍යයනය
- කොච්චිකඩේ නගරයේ මාර්ග තදබදයට විසඳුම් සෙවීමේ ශක්‍යතා අධ්‍යයනය.
- කොළඹ - ගාල්ල - හම්බන්තොට - වැල්ලවාය (A002) මාර්ගයේ අංක 52/1 පාලම සහ මීගමුව - ගිරිඋල්ල (B322) මාර්ගයේ පාලම් අංක 25/1 ප්‍රතිසංස්කරණය කිරීම සඳහා ආර්ථික විශ්ලේෂණය.
- ඒකල - කොටදෙණියාව (බී 111) මාර්ගයේ අංක 4/1 පාලම සහ කැලණිය - මුදුන්ගොඩ (බී 214) මාර්ගයේ අංක 30/1 පාලම ප්‍රතිසංස්කරණය කිරීම සඳහා ආර්ථික විශ්ලේෂණය.
- යෝජිත සම්බන්ධතා මාර්ගය සඳහා පූර්ව ශක්‍යතා අධ්‍යයනය - ජංගල් බීච් සිට යද්දෙහිමුල්ලට පිවිසුම.

- මධ්‍යම අධිවේගී මාර්ගයේ ගම්පහ උතුර සහ දකුණු අන්තර් හුවමාරුව සඳහා වූ යෝජනාව ඇගයීම.
- කුරුණෑගල අතුරු මාර්ගය සඳහා පූර්ව ශක්යතා අධ්‍යයනය
- මීරිගම අතුරු මාර්ගය සඳහා පූර්ව ශක්‍යතා අධ්‍යයනය
- ගිරිඋල්ල මංසන්ධිය වැඩිදියුණු කිරීම සඳහා සැලසුම් සකස් කිරීම සහ අවශ්‍ය අධ්‍යයනයන්.
- කුරුපෙත්ත (නිකවලමුල්ල) සිට කෑගල්ල රුවන්වැල්ල දක්වා කැලණි ගඟ හරහා නව මාර්ග සම්බන්ධතාවය.
- නුවරඑළිය නගර අලංකරණ යෝජනාව සඳහා සැලසුම් සහ අවශ්‍ය අධ්‍යයනයන් සකස් කිරීම.

2020 දී ප්‍රමාණයෙන් වැඩි / බර වාහන සඳහා විශේෂ බලපත්‍ර නිකුත් කිරීම

- ඉල්ලුම්පත්‍ර ඇගයීමට ලක් කර ඇති අතර ප්‍රමාණයෙන් වැඩි භාණ්ඩ ප්‍රවාහනය සඳහා අවසර ලිපි දහඅටක් නිකුත් කරන ලදී.
- එක් තාවකාලික වාහන ලියාපදිංචියක් සඳහා නිර්දේශ ඉදිරිපත් කරන ලදී.
- විශාල වාහන තිස් හයක් ලියාපදිංචි කිරීම සඳහා නිර්දේශ ඉදිරිපත් කරන ලදී.

9.3 රථවාහන ආකෘති නිර්මාණය

JICA - STRADA වැඩසටහන භාවිතා කරමින් රථවාහන ඉල්ලුම පුරෝකථනය කිරීම.

ජාතික මහාමාර්ග හා වෙනත් මාර්ගවල රථවාහන පිළිබඳව ජාතික මහාමාර්ග ජාලය සඳහා මාර්ග සංවර්ධන අධිකාරිය විසින් වර්ධනය කරන ලද ජජාසනි යේ ස්ට්‍රාඩා මාදිලිය (3.5 සංස්කරණය) භාවිතා කරමින් පුරෝකථනය කරන ලදී. ස්ට්‍රාඩා යන්න (STRADA) **'රථවාහන ඉල්ලුම විශ්ලේෂණ පද්ධතිය'** සඳහා වේ. ජජාසනි විසින් 1997 දී ප්‍රවාහන අංශය සඳහා තාක්ෂණික සහාය වැඩසටහන සඳහා සම්පාදනය කරන ලද එය නිතර යාවත්කාලීන වූ මාදිලියකි.

අධ්‍යයන ක්ෂේත්‍රය හා රථවාහන විශ්ලේෂණ කලාප පද්ධතිය

කලාප ක්‍රමය, බස්නාහිර පළාත හා මහනුවර හා හාරිස්පත්තුව ප්‍රාදේශීය ලේකම් කොට්ඨාශ හැර අනෙකුත් පළාත් 8 සඳහා කොම්ට්‍රාන්ස් රථවාහන විශ්ලේෂණ කළාප සඳහා පිහිටුවන ලදී. මෙම ප්‍රාදේශීය ලේකම් කොට්ඨාශ දෙක තව දුරටත් සමස්ත කොටස් 14කට බෙදේ. අවසානයේ දිවයින අධ්‍යයන ප්‍රදේශ කොට්ඨාශ 749 බෙදෙන ලදී.

මාර්ග ජාලය

මාර්ග ජාලය, සියලුම අධිවේගී මාර්ග A, AB, AC හා B පංතියේ මාර්ග හා අධ්‍යයනයට බලපාන අධ්‍යයන ප්‍රදේශයේ පවතින සමහර වැදගත් මාර්ග නියෝජනය කරයි.

දැනට පුනරුත්ථාපනය කිරීමේ සිට නව ඉදිකිරීම් ව්‍යාපෘති දක්වා වන පරාසයේ පවතින මාර්ග ව්‍යාපෘති සැලකිය යුතු සංඛ්‍යාවක් ඇත.එවැනි ව්‍යාපෘති සැලසුම් කළ වර්ෂ වලදී නිමකර මෙහෙයුම් කරතැයි උපකල්පනය කෙරේ.

2021 තුළ සිදු කරන ලද ප්‍රධාන කාර්යයන්

පහත දැක්වෙන ව්‍යාපෘති / මාර්ග පුරෝකථනය කිරීම සඳහා JICA STRADA ආකෘතිය භාවිතා කරන ලදී.

පාදිකා සැලසුම් සඳහා

- මීරිගම දකුණු අන්තර් හුවමාරුවේ නව සබැඳිය
- කුරුණෑගල දිස්ත්‍රික්කයේ මාර්ග 10ක්
- ගම්පහ දිස්ත්‍රික්කයේ මාර්ග 6ක්
- මහනුවර දිස්ත්‍රික්කයේ මාර්ග 12ක්
- මාර්ග : AB 010 , B 425, B 246, B 152, B128, B 252, B005, A 027, B 464, A033, B445,B179,B152, B322, B324 , B146, B152, B154 B 324, B 146 , A 017, A001 (38 km - 100km), B 126, A010, B 201,B 141 ,A007, B445, A 007, B 038, B 010, B 208, B20, AB420

B56, , B 269, B 357 සහ A 032 , B 199, B 021, B 464, B 351, A 010, B 346, AB 001, B 486, B 442, A007,A002 B038, B101 විලියම් ගොපල්ලව මාවත සහ ඩුප්ලිකේෂන් මාර්ගය

- අංගම්පිටිය පාලම සහ අංගම්පිටිය පාලම පිවිසුම් මාර්ග
- අනෙකුත් මාර්ග 05 සමඟ කැලණි ගඟ හරහා නව පාලම් දෙකක්
- කොට්ටාවේ බර පාලම් මංතීරුව

ශක්‍යතා සහ වෙනත් අධ්‍යයනය සඳහා

- වේයන්ගොඩ අන්තර් හුවමාරුවේ සහ මීරිගම දකුණ අන්තර් හුවමාරුවේ හැරවුම් චලනය සහ මධ්‍යම අධිවේගී මාර්ග කොටස- 1 සඳහා ගම්පහ අන්තර් හුවමාරු ප්‍රදේශයේ රථවාහන අධ්‍යයනය.
- පෑලියගොඩ මත්ස්‍ය වෙළඳපොල සඳහා විකල්ප ප්‍රවේශ මාර්ගයක් අධ්‍යයනය කිරීම.
- නව කපුදුව අන්තර් හුවමාරුවක් සහිත අධිවේගී මාර්ග සඳහා ගාස්තු සහ මධ්‍යම අධිවේගී මාර්ග කොටස- 2 සඳහා ගාස්තු.
- B 410, B 05, රුවන්පුර අධිවේගී මාර්ගය (1 කොටස), උස් කුළුණු මත දිවෙන මහාමාර්ග ව්‍යාපෘතිය, B 365, කැලණිතිස්ස සහ ඔරුගොඩවත්ත හැරවුම් චලනයන් සඳහා රථවාහන පුරෝකථනයන්
- ආදර්ශ ජාලය පදනම් කරගත් MFSV දත්ත නිවැරදි කිරීම
- නව කැලණි පාලම අතුරු මාර්ග සමාකරණ කටයුතු
- ඔරුගොඩවත්ත මංසන්ධිය, ඉහුරුකඩේ මංසන්ධිය සහ කැලණිතිස්ස මංසන්ධියේ හැරවුම් චලනයන් සඳහා රථවාහන පුරෝකථනය
- නව කැලණි පාලම ව්‍යාපෘති ප්‍රදේශය සඳහා රථවාහන පුරෝකථනය
- රුවන්පුර අධිවේගී මාර්ග ශක්‍යතා අධ්‍යයනය
- මධ්‍යම අධිවේගී මාර්ග කොටස- 3 සඳහා රථවාහන අනාවැකි
- කැලණි පාලම, ගිරිඋල්ල නගරය, කුරුණෑගල අතුරු මාර්ගය හරහා පාලම් දෙකක් සඳහා රථවාහන අධ්‍යයනය
- මීරිගම අන්තර් හුවමාරු අධ්‍යයනය
- මීරිගම අතුරු මාර්ග සඳහා රථවාහන අධ්‍යයනය
- යෝජිත රුවන්පුර අධිවේගී මාර්ගය සඳහා සැලකිය යුතු සම්බන්ධතා සොයා ගැනීම
- කුරුණෑගල අතුරු මාර්ග විකල්ප පිළිබඳ රථවාහන අධ්‍යයනය
- ගිරිඋල්ල අතුරු මාර්ග විකල්ප පිළිබඳ රථවාහන අධ්‍යයනය
- රුවන්පුර අධිවේගී මාර්ගය සඳහා අන්තර් හුවමාරු ස්ථානය සහ අන්තර් හුවමාරු ආකාරයේ අධ්‍යයනය
- කි.මී.100,000 වැඩසටහන මත පදනම්ව STRADA මාදිලි ජාලය යාවත්කාලීන කරන ලදී
- රුවන්පුර අධිවේගී මාර්ගය සඳහා ආදර්ශ ක්‍රමාංකනය (වේගය සහ පරිමාව)
- ගාස්තු ගණනය කිරීම (මධ්‍යම අධිවේගී මාර්ග කොටස- 2)

'Vissim' මාදිලියේ කටයුතු

- කොට්ටාව - පන්නිපිටිය මාර්ග පද්ධතිය සඳහා සමාකරණ කටයුතු
- NKB අතුරු මාර්ග සමාකරණ කාර්යය
- කෙරවලපිටිය ගාස්තු දොරටු විකල්ප අධ්‍යයනය
- ගිරිඋල්ල නගර සංවර්ධන අධ්‍යයනය
- සමාකරණය සඳහා කොම්පඤ්ඤවීදිය දුම්රිය ගුවන් පාලමේ ජාල සකස් කිරීම

භූ ගෝලීය තොරතුරු පද්ධතියේ කාර්යයන්

සැලසුම්කරණය II කොටස යටතේ ඇති භූගෝලීය තොරතුරු පද්ධති (GIS) ඒකකය, 2021 වර්ෂය තුළ පහත සඳහන් ප්‍රධාන කාර්යයන් ඉටු කරන ලදී;

- ජාතික මාර්ග ජාලයට අදාළ භූගෝලීය දත්ත ගබඩාව (2007 න් පසු සංවර්ධනය කරන ලද ArcGIS 10.6 උසස් මෘදුකාංග සහ මිනින්දෝරු දෙපාර්තමේන්තුවෙන් ලබාගත් 1:50000 පරිමාණ ඩිජිටල් ස්ථර) GIS ව්‍යත්තිකයන් දෙදෙනෙකු විසින් යාවත්කාලීන කර නඩත්තු කර ඇත. මූලික වශයෙන් මාර්ග සම්බන්ධතා

දත්ත, මාර්ග ව්‍යාපෘති විස්තර, අධිවේගී ජාල, දෛනික රථවාහන හා ඇක්සල් බර සමීක්ෂණ ස්ථාන, සංඥාපිත මංසන්ධි හා පරිපාලන විස්තර (වි.ඉ., ප්‍ර.ඉ., ප.හා.අ. ආදී) මෙම භූ-දත්ත ගබඩාවේ ඇතුළත් වේ. ශ්‍රී ලංකාවේ අධිවේගී මාර්ග ජාලයේ භූ-දත්ත සමුදාය ව්‍යාපෘති නිලධාරීන් විසින් ලබා දී අවසන් කරන ලද CAD අනුරේඛන සමඟ යාවත්කාලීන කර ඇති අතර අධිවේගී මාර්ග සමඟ සම්බන්ධ දත්ත ගබඩාව යාවත්කාලීන කර ඇත (E01 සිට E09 දක්වා).

- භූ දත්ත ගබඩාව HDM- 4 හා ස්ට්‍රාඩා වැනි දත්ත ගබඩා සමඟ සහයෝගී වන බැවින්, ස්ට්‍රාඩා ජාලයේ මුල් ස්ථාන සමීක්ෂණ සඳහා නිවැරදි භූ.තො.ප. දත්ත සැපයීමට, ජාතික මාර්ග ජාලයේ සිතියම් විද්‍යාත්මක දෝෂ ඉවත් කරන ලදී. තවද STRADA ජාලය සඳහා ප්‍රාදේශීය ලේකම් කොට්ඨාශ මට්ටමින් මාර්ග දුර, ඇක්සල් බර සමීක්ෂණ ස්ථාන සහ MCC ස්ථාන වල රූපී ගොනු පිළියෙළ කරනු ලැබිය.

- 2021 දී, භූගෝලීය තොරතුරු පද්ධති ඒකකය මාර්ග ආරක්ෂාව සහ ජාල සැලසුම් ඒකකයට වඩා හොඳ තීරණ ගැනීමේ සහාය ලබා දීම සඳහා දැනට පවතින සහ යෝජිත මාර්ග, මාර්ග අත් කර ගැනීම, විකල්ප මාර්ග, අතුරු මාර්ග සහ පදික හරස් මාර්ග පිළිබඳ භූගෝලීය තොරතුරු පද්ධති සමීක්ෂණ කිහිපයක් සිදු කරන ලදී. (උදා. රුවන්වැල්ල අතුරු මාර්ගය, වැලිගම මාර්ගය පවරා ගැනීම, රුමස්සල සම්බන්ධක මාර්ගය). කොවිඩ්- 19 තත්ත්වය හේතුවෙන් 2021 තුළ භූගෝලීය තොරතුරු පද්ධති සමීක්ෂණ පැවැත්වීම සීමා විය.

- මාර්ග පුනරුත්ථාපන හා ඉදිකිරීම් වලදී ප්‍රශස්ථ මාර්ග, අතුරු මාර්ග සහ අපේක්ෂක මාර්ග හඳුනා ගැනීමට භූගෝලීය තොරතුරු පද්ධති ඒකකය මහාමාර්ග ඉංජිනේරුවන්ට පහසුකම් සපයන ලදී. (උදා. රුවන්වැල්ල අතුරු මාර්ගය). ඊට අමතරව භූගෝලීය තොරතුරු පද්ධති ඒකකය ජාතික මාර්ග ජාලයට අදාළ භූගෝලීය තොරතුරු පද්ධති දත්ත සමඟ කටයුතු කිරීමට භූගෝලීය තොරතුරු පද්ධති නොවන අනෙකුත් පරිශීලකයින්ට පහසුකම් සලසන මාර්ගගත ගූගල් සිතියම් සකස් කිරීම සහ බෙදා හරිම ආරම්භ කර ඇත (GIS නොවන වෙනත් පරිශීලකයින් සමඟ සබැඳි සිතියම් 10කට වඩා බෙදාගෙන ඇත).

- දුර ගණනය කිරීම, භූගෝලීය තොරතුරු පද්ධති ඒකකයේ ප්‍රධාන කාර්යයකි. අධිවේගී මාර්ග සම්බන්ධතා ව්‍යාපෘතිය යටතේ වැඩිදියුණු කළ යුතු මාර්ගය හඳුනා ගැනීම සඳහා මධ්‍යම අධිවේගී මාර්ගයේ අන්තර් හුවමාරුවලට ආසන්නතම නගරවලට ඇති දුර ගණනය කර ඇත. තවද එය පළාත් පහක මංසන්ධි 400කට වැඩි ප්‍රමාණයක් සඳහා වැඩි දියුණු කළ දිශානති පුවරු සවි කිරීමට අදාළ දුර ගණනය කර ඇත.

- 2021 වර්ෂය තුළ සැලසුම් අංශය මෙන්ම ව්‍යාපෘති ආවේක්ෂණ ඒකකයත් මහාමාර්ග අමාත්‍යාංශය, මාර්ග සංවර්ධන අධිකාරිය වෙනත් සියලු අංශ හා බාහිර ආයතනවලට සම්බන්ධව, ව්‍යාපෘති යෝජනා, අරමුදල් අයදුම්පත්, ශක්‍යතා වාර්තා, ගැසට් හා වෙනත් වාර්තා සඳහා භූගෝලීය තොරතුරු පද්ධති ඒකකය විසින්, ස්ථානීය සිතියම් හා විස්තරාත්මක සිතියම් 100ක් පිළියෙළ කරන ලදී. මීට අමතරව,2021 වර්ෂය තුළ භූගෝලීය තොරතුරු පද්ධති ඒකකය, 2020-2029 ප්‍රධාන සැලැස්ම සඳහා සිතියම් 25කට වඩා, 2021 ක්‍රියාකාරකම් අයවැය සඳහා සිතියම් 30කට වඩා, සහ "සුපිරි මගක්" - 2022 (අයවැය කතාව සඳහා ලේඛනය) සඳහා සිතියම් 40කට වැඩි ප්‍රමාණයක් සකස් කර ඇත.

- එසේම 2021 දී, GIS ඒකකය ස්ථාන 25ක් සඳහා නිෂ්කාශන සහතික නිකුත් කිරීම සඳහා අවකාශීය තොරතුරු සපයන ලද අතර බාහිර අවශ්‍යතා සපුරාලීම සඳහා අධිප්‍රමාණයේ වාහන ධාවන අවසරය ලබා දීම සඳහා ප්‍රවාහන මාර්ග 10ට වඩා හඳුනාගෙන ඇත.

- මාර්ග සංවර්ධන අධිකාරිය යනු ශ්‍රී ලංකාවේ ජාතික අවකාශීය දත්ත යටිතල පහසුකම් (NSDI) වැඩසටහනේ ප්‍රධාන පාර්ශවකරුවන්ගෙන් එකකි. මාර්ග සංවර්ධන අධිකාරිය නියෝජනය කරමින්, GIS ඒකකය විසින් ජාතික මාර්ග ජාලයට සහ අධිවේගී මාර්ග ජාලයට අදාළ අවකාශීය දත්ත NSDI හරහා අනෙකුත් සංවිධාන සමඟ බෙදාගැනීම සිදු කරයි.

- GIS ඒකකය, මාර්ග සංවර්ධන අධිකාරිය සඳහා GIS අදාළ මිලදී ගැනීම් සඳහා තාක්ෂණික ඇගයීම් කමිටුවේ (TEC) සාමාජිකයෙකු ලෙස සිය විශේෂඥ දැනුම ලබා දී ඇත (උදා. Arc GIS නඩත්තු ගිවිසුමේ තාක්ෂණික ඇගයීම් කමිටුව , ඉඩම් අංශය සඳහා GPS උපාංග මිලදී ගැනීමේ තාක්ෂණික ඇගයීම් කමිටුව).

- සමස්ත දිවයිනේම පවතින මාර්ග ජාලය 1: 50,000 පරිමාණයෙන් යාවත්කාලීන කිරීම සඳහා GIS ඒකකය වාර්ෂිකව මිනින්දෝරු දෙපාර්තමේන්තුව සමඟ සම්බන්ධීකරණය වෙමින් කටයුතු කරනු ලැබේ.

- 2021 දී GIS ඒකකය විසින් මොරටුව විශ්වවිද්‍යාලයේ උපාධි අපේක්ෂකයින් සඳහා පමණක් එක් සීමාවාසික වැඩසටහනක් පවත්වන ලදී. 2021 තුළ කොවිඩ් 19 තත්ත්වය හේතුවෙන් සීමාවාසික වැඩසටහන් සීමා විය.

9.4 කළමනාකරණ තොරතුරු පද්ධතිය නඩත්තු කිරීම

කළමනාකරණ තොරතුරු පද්ධතිය නඩත්තු කිරීම, සැලසුම් අංශයේ කළමනාකරණ තොරතුරු පද්ධති ඒකකය යටතේ සිදු වන අතර අධ්‍යක්ෂ (සැලසුම්) විසින් එහි ප්‍රධානත්වය දරනු ලබයි. අතිරේක අධ්‍යක්ෂ ජනරාල් (ජාල සැලසුම්) සහ අධ්‍යක්ෂ (සැලසුම්) සහාය කාර්ය මණ්ඩලයේ සහාය ඇතිව අධ්‍යක්ෂ ජනරාල්වරයාට ව්‍යූහීය සහාය ලබා දෙයි.

මාර්ග සංවර්ධන අධිකාරියේ ප්‍රධාන ස්ර්වරයන් සහ විද්‍යුත් තැපැල් ස්ර්වරය පිහිටුවීම, ප්‍රධාන කාර්යාලයේ ප්‍රාදේශීය ප්‍රදේශ ජාලයක් (Local Area Network) පිහිටුවීම, අන්තර්ජාල සහ විද්‍යුත් තැපැල් පහසුකම් සැපයීම, මාර්ග සංවර්ධන අධිකාරියේ වෙබ් අඩවිය සංවර්ධනය කිරීම සහ නඩත්තු කිරීම, මාර්ග සංවර්ධන අධිකාරියේ වෙබ් අඩවිය සංවර්ධනය කිරීම සහ නඩත්තු කිරීම, ශ්‍රී ලංකා රාජ්‍ය තොරතුරු කේන්ද්‍රයේ වෙබ් අඩවියේ මාර්ග සංවර්ධන අධිකාරියෙ හි පිටුව සංවර්ධනය කිරීම සහ නඩත්තු කිරීම, ශ්‍රී ලංකා මාර්ග වත්කම් කළමනාකරණ පද්ධතිය (SLRAMS) යාවත්කාලීන කිරීම සහ නඩත්තු කිරීම, ව්‍යාපෘති දත්ත ගබඩාවක් පවත්වාගෙන යාමෙන් මාර්ග සංවර්ධන අධිකාරිය විසින් සිදු කරන ලද ව්‍යාපෘති සඳහා ව්‍යාපෘති අධීක්ෂණ පද්ධතියක් සංවර්ධනය කිරීම සහ නඩත්තු කිරීම සහ මාර්ග සංවර්ධන අධිකාරියේ වැඩ කරන කාර්ය මණ්ඩලයේ තොරතුරු තාක්ෂණ දැනුම වැඩිදියුණු කිරීම සඳහා පුහුණු වැඩසටහන් පැවැත්වීම, මාර්ග සංවර්ධන අධිකාරියේකළමනාකරණ තොරතුරු පද්ධතිය නඩත්තු කිරීම යටතේ සිදු කරනු ලබන කාර්යයන් වේ.

ජාල පරිපාලනය

මාර්ග සංවර්ධන අධිකාරියේ ප්‍රධාන කාර්යාලයට පරිගණක 471ක පමණ පරිගණක ජාලයක් සහ ඩොමේන් සර්වරයන් දෙකක් (මූල්‍ය අංශය සඳහා වෙනම සර්වරයක් සහ අනෙකුත් සියලුම අංශ සඳහා එක් සර්වරයක්) ප්‍රධාන කාර්යාල පරිශ්‍රයේ ඇති අතර ශ්‍රී ලංකා ටෙලිකොම් අන්තර්ජාල දත්ත මධ්‍යස්ථානයේ එක් විද්‍යුත් තැපැල් සර්වරයක් ඇත. පරිගණක 471 න් පරිගණක 255 ක් සඳහා විද්‍යුත් තැපෑල සහ අන්තර්ජාල පහසුකම් සලසා ඇත. එම පරිගණක සියල්ල Local Area Network (LAN) මගින් අන්තර් සම්බන්ධිත වේ. අඛණ්ඩව පරිගණක ජාල ඩොමේනය වෙත නව පරිගණක සහ පරිශීලකයින් එක් කිරීමට සහ ඩොමේනයෙන් පරිගණක සහ පරිශීලකයින් ඉවත් කිරීම සහ වෙනස් කිරීම අවශ්‍ය වේ.

සෑම අංශයකම පරිශීලකයෙකුටම ප්‍රධාන සර්වරයන් වෙත ප්‍රවේශ වරප්‍රසාද විවිධ මට්ටම් ඇත. ජාලයේ පරිශීලක වින්‍යාසය සහ ඔවුන්ගේ වරප්‍රසාද අඛණ්ඩව නිරීක්ෂණය කෙරේ. සෑම අංශයකටම තමන්ගේම ජාලගත මුද්‍රණ යන්ත්‍ර ඇත. ප්‍රධාන කාර්යාලයේ තෝරාගත් කාර්ය මණ්ඩලය සඳහා අන්තර්ජාල පහසුකම් සපයා ඇත.

විද්‍යුත් තැපැල් පහසුකම සහ තැපැල් සර්වරය නඩත්තු කිරීම

වර්තමානයේ, මාර්ග සංවර්ධන අධිකාරියේ විද්‍යුත් තැපැල් ස්ර්වරය ප්‍රධාන කාර්යාලය සහ ප්‍රාදේශීය කාර්ය මණ්ඩලය සඳහා ආසන්න වශයෙන් විද්‍යුත් තැපැල් ගිණුම් 253ක් පවත්වාගෙන යන අතර අනිසි විද්‍යුත් තැපැල් ලිපි පෙරීමේ විසඳුම මඟින් අනිසි විද්‍යුත් තැපැල් ලිපි පෙරහන් කරන අතර පද්ධතියට පිටතින් අනවසරයෙන් ඇතුළුවන්නන් බොහොමයක් අවහිර කරයි. මාර්ග සංවර්ධන අධිකාරියේ විද්‍යුත් තැපැල් සර්වරය සියලුම පළාත්වල ප්‍රාදේශීය කාර්ය මණ්ඩලය සඳහා වෙනම විද්‍යුත් තැපැල් ගිණුම් පවත්වාගෙන යයි. ඔවුන්ගෙන් බොහෝ දෙනෙක් ඔවුන්ගේ විද්‍යුත් තැපැල පරීක්ෂා කිරීම සඳහා බ්‍රෝඩ්බෑන්ඩ් සම්බන්ධතා භාවිතා කරති.

මාර්ග සංවර්ධන අධිකාරියේ වෙබ් අඩවිය නඩත්තු කිරීම

කළමනාකරණ තොරතුරු පද්ධති ඒකකය, මාර්ග සංවර්ධන අධිකාරියේ වෙබ් අඩවිය (www.rda.gov.lk) සංවර්ධනය කිරීම, නඩත්තු කිරීම සහ යාවත්කාලීන කිරීම සිදු කරයි. ලංසු ඇරයුම්, දැන්වීම්, ඡායාරූප, සිතියම්, සම්බන්ධතා විස්තර සහ මාර්ග සංවර්ධන අධිකාරියේ පුහුණු අංශය විසින් පවත්වනු ලබන පුහුණු වැඩසටහන් සමඟ දැනට ක්‍රියාත්මක ව්‍යාපෘතිවල ප්‍රගති විස්තර, මාර්ග සංවර්ධන අධිකාරියේ වෙබ් අඩවියේ ප්‍රධාන යාවත්කාලීන/ප්‍රකාශන වේ.

රාජ්‍ය තොරතුරු කේන්ද්‍රයේ (GIC – 1919) වෙබ් අඩවිය නඩත්තු කිරීම

මහජනතාවට අදාළ තොරතුරු සහිත රාජ්‍ය තොරතුරු කේන්ද්‍රයේ (GIC – 1919) වෙබ් අඩවියේ (www.gic.gov.lk) RDA වෙබ් පිටුව පවත්වාගෙන යයි.

රාජ්‍ය ව්‍යවසාය දෙපාර්තමේන්තුව (මහා භාණ්ඩාගාරය - මුදල් අමාත්‍යාංශය යටතේ) වෙබ් අඩවිය නඩත්තු කිරීම

කළමනකරණ තොරතුරු පද්ධති ඒකකය විසින් මහජනතාවට අදාළ තොරතුරු සහිත රාජ්‍ය ව්‍යවසාය දෙපාර්තමේන්තුවේ (මහා භාණ්ඩාගාරය - මුදල් අමාත්‍යාංශය යටතේ) වෙබ් අඩවියේ (https://pedmis.gov.lk) මාර්ග සංවර්ධන අධිකාරියට අදාළ වෙබ් පිටුව පවත්වාගෙන යයි.

ජාල ආරක්ෂණ අධීක්ෂණය

පරිගණක ජාලයේ ජාල ආරක්ෂාවට එල්ල වන තර්ජනවලට එරෙහි ප්‍රධාන පූර්වාරක්ෂාවන් ලෙස, කළමනාකරණ තොරතුරු පද්ධති ඒකකය ජාල ෆයර්වෝල්ලයක් සහ ප්‍රති-වයිරස මෘදුකාංග පැකේජයක ව්‍යවසාය අනුවාදයක් ලබා දී ඇත. ප්‍රති-වයිරස පැකේජය ජාලයේ තෝරාගත් පරිගණක 450කට ස්ථාපනය කර ඇත. විද්‍යුත් තැපෑල සහ අන්තර්ජාල පහසුකම් ඇති පරිශීලකයින්ට ප්‍රමුඛත්වය ලබා දී ඇති අතර එසේ සිදු කර ඇත්තේ ඔවුන් ඕනෑම ජාල ප්‍රහාරයකට හෝ ආක්‍රමණයකට සැමවිටම ගොදුරු විය හැකි බැවිනි.

ගැටලු

- ප්‍රධාන කාර්යාලයේ තොරතුරු තාක්ෂණ සම්බන්ධ ක්‍රියාකාරකම්වල ඉල්ලුම සපුරාලීම සඳහා මෙහෙයුම් මට්ටමේ තොරතුරු තාක්ෂණ කාර්ය මණ්ඩලයේ (උදා: පරිගණක දෘඪාංග/ජාල කාර්මික ශිල්පීන්, තොරතුරු තාක්ෂණ සහායකයින්) හිඟයක් පවතී. (උදා. පරිශීලක උපකාරක සහාය, දෘඪාංග/මෘදුකාංග ගැටළු නිරාකරණය කිරීම, තොරතුරු තාක්ෂණ ආශ්‍රිත පර්යන්තවල සේවා සැපයීම යනාදිය)
- සියලුම කොට්ඨාශවල එදිනෙදා තොරතුරු තාක්ෂණ සම්බන්ධ ගැටළු සඳහා පරිශීලක කැපවීම නොමැතිකම.
- සංවිධානයේ වර්තමාන සහ අනාගත තාක්ෂණික ප්‍රවණතා සපුරාලීම සඳහා වෙනම තොරතුරු තාක්ෂණ අංශයක් කාලෝචිත ලෙස අවශ්‍ය වේ.

9.5 අධිවේගී මාර්ග තොරතුරු සහ සංවර්ධන කළමනාකරණ පද්ධතිය (HIDMS)

මෙම අංශයේ ප්‍රධාන කාර්යයන් වන්නේ;

- මාර්ග තත්ත්වය පිළිබඳ දත්ත රැස් කිරීම. (සාමාන්‍ය දත්ත එකතුව/ නිතිපතා නොකරන දත්ත එකතුව)
- මාර්ග ඉන්වෙන්ටරි සහ තත්ත්ව පරාමිතීන් උපුටා ගැනීම සඳහා අමු දත්ත සැකසීම.
- වෙබ් පාදක පද්ධතිය තුළ දත්ත සකස් කිරීම, උඩුගත කිරීම සහ ගබඩා කිරීම.
- පද්ධතිය සහ වාර්තාකරණය තුළ අවශ්‍ය විශ්ලේෂණ/සැකසුම් සිදු කිරීම.
- විවිධ ආර්ථික විශ්ලේෂණ සඳහා HDM-4 විශ්ලේෂණ මෙවලම භාවිතා කිරීම සහ මාර්ග නඩත්තු කිරීම සහ වැඩිදියුණු කිරීමේ සැලැස්ම සකස් කිරීම.
- මැනුම් යන්ත්‍ර සහ උපකරණ නඩත්තු කිරීම, ක්‍රමාංකනය කිරීම සහ වැඩිදියුණු කිරීම. (වාර්ෂික නඩත්තු හා ක්‍රමාංකන චාරිකා සහ නිරන්තර කටයුතු)
- වෙබ් පාදක පද්ධතියේ නඩත්තුව සහ සංවර්ධනය.
- විවිධ විශ්ලේෂණ සහ අධ්‍යයන අරමුණු සඳහා වන ඉල්ලීම් පිළිබඳ සමීක්ෂණ දත්ත ඉදිරිපත් කිරීම.

මාර්ග සංවර්ධන අධිකාරිය විසින් සිදු කරනු ලබන වත්කම් කළමනාකරණ ක්‍රියාකාරකම් ශක්තිමත් කිරීම සඳහා සහ වත්කම් කළමනාකරණයට අදාළ අවශ්‍ය ධාරිතා වර්ධනය අත්පත් කර ගැනීම සඳහා, මාර්ග සංවර්ධන අධිකාරිය විසින් ලෝක බැංකුවේ අරමුදල් සපයන ප්‍රවාහන සම්බන්ධතා සහ වත්කම් කළමනාකරණ ව්‍යාපෘතිය (TCAMP) වෙතින් අවශ්‍ය අරමුදල් සහාය ලබාගෙන ඇත.

ඒ අනුව, මෙම අංශයේ මාණ්ඩලික නිලධාරීන් සංඛ්‍යාව 28ක් ප්‍රවාහන සම්බන්ධතා සහ වත්කම් කළමනාකරණ ව්‍යාපෘතිය වෙත වැඩබලන පදනම මත අනුයුක්ත කරන ලදී.

මෙම කොටසෙහි පහත සඳහන් ප්‍රධාන කාර්යයන් ප්‍රවාහන සම්බන්ධතා සහ වත්කම් කළමනාකරණ ව්‍යාපෘතිය යටතේ ආවරණය කෙරේ.

- මාර්ග තත්ත්ව දත්ත රැස් කිරීම. (සාමාන්‍ය දත්ත එකතුව)
- මාර්ග ඉන්වෙන්ටරි සහ තත්ත්ව පරාමිතීන් උපුටා ගැනීම සඳහා අමු දත්ත සැකසීම. (සාමාන්‍ය දත්ත සැකසීම)
- වෙබ් පාදක පද්ධතිය තුළ දත්ත සකස් කිරීම, උඩුගත කිරීම සහ ගබඩා කිරීම.
- පද්ධතිය සහ වාර්තාකරණය තුළ අවශ්‍ය විශ්ලේෂණ/සැකසුම් සිදු කිරීම.
- මැනුම් යන්ත්‍ර සහ උපකරණ නඩත්තු කිරීම, ක්‍රමාංකනය කිරීම සහ වැඩිදියුණු කිරීම. (නිරන්තර කටයුතු)
- වෙබ් පාදක පද්ධතියේ නඩත්තුව සහ සංවර්ධනය.

අ. මාර්ග තත්ත්වය පිළිබඳ දත්ත රැස් කිරීම

මාර්ග තත්ත්ව දත්ත රැස් කිරීම (නිතිපතා නොකරන දත්ත රැස් කිරීම)

මාර්ග සංවර්ධන අධිකාරිය විසින් අනුමත කරන ලද අයකිරීම් ගාස්තුවලට අනුකූලව ව්‍යාපෘති අංශ සහ බාහිර සංවිධාන විසින් කරන ලද ඉල්ලීම් අනුව මාර්ග සංවර්ධන අධිකාරිය විසින් බහු-ක්‍රියාකාරී ජාල සමීක්ෂණ රථය (MFNSV) සහ පතිත බර උත්ක්‍රමණ මානය (FWD) යන්ත්‍ර දෙක භාවිතා කරමින් දත්ත රැස් කිරීම සිදු කරයි.

- පර්යේෂණ හා සංවර්ධන අංශය (R&D) සහ මාර්ග සංවර්ධන අධිකාරියේ පළාත් අධ්‍යක්ෂවරුන් විසින් නිර්මාණ කාර්යය සඳහා සහ සමහර ව්‍යාපෘති මගින් පාදිකාවල තත්ත්ව සහතික කිරීමේ අරමුණු සඳහා පතිත බර උත්ක්‍රමණ මාන සමීක්ෂණ ඉල්ලීම් කරනු ලැබේ.
- අධිවේගී මාර්ග, A පන්තියේ සහ B පන්තියේ මාර්ගවල ව්‍යාපෘති මගින් පදික වේදිකාවේ මතුපිට තත්ත්ව පරීක්ෂා කිරීමේ අරමුණු සඳහා MFNSV සමීක්ෂණ ඉල්ලීම් කරනු ලැබේ.

වගුව 33: සමීක්ෂණ ප්‍රගතිය -MFNSV සමීක්ෂණ 2021 සහ ආදායම් එකතු කිරීම.

සමීක්ෂණ වර්ගය	ඉල්ලා සිටින ලද්දේ	මුදල (රු.)
MFNSV	ව්‍යාපෘති අධ්‍යක්ෂ (i road)	237, 600.00
MFNSV	පුලෝලි - කොඩිකාමම් මාර්ග ව්‍යාපෘතිය	237, 600.00
MFNSV	ව්‍යාපෘති අධ්‍යක්ෂ (CEP-II) - C පැකේජය	237, 600.00
MFNSV	ව්‍යාපෘති අධ්‍යක්ෂ (CEP-II) - D පැකේජය	237, 600.00
MFNSV	ව්යාපෘති අධ්‍යක්ෂ (CEP-II) - A පැකේජය	237, 600.00
MFNSV	ව්‍යාපෘති අධ්‍යක්ෂ (i road)	237, 600.00
MFNSV	ව්‍යාපෘති අධ්‍යක්ෂ (CEP-II) - B පැකේජය	475, 200.00

2021 දී මුළු ආදායම = රු. 1,900,800.00
2020.12.31 දක්වා මුළු ආදායම = රු. 28,931,054.72
2021.12.31 දක්වා මුළු ආදායම = රු. 30,831,854.72

- සියලුම FWD සමීක්ෂණ ඉල්ලීම්, මාර්ග සංවර්ධන අංශයේ සැලසුම් කාර්යයන් සඳහා පර්යේෂණ හා සංවර්ධන අංශය සහ පළාත් අධ්‍යක්ෂවරුන් වෙතින් සිදු කළ අතර වසර තුළ FWD සමීක්ෂණවලින් කිසිදු ආදායමක් රැස් කර නොමැත.

MFNSV භාවිතා කරන සමීක්ෂණ, රථකම් සමීක්ෂණවල දත්ත සැකසීම සහ ප්‍රතිඵල පිළිබඳ වාර්තා ඉදිරිපත් කිරීම

- මරදන්කඩවල – හබරණ - තිරික්කොණ්ඩියාඩිමඩු (A11) මරදන්කඩවල සිට හබරණ කොටස දක්වා. (i Road)
- පුලොලි කොඩිකාමාම කච්චායි (AB031) පුල්ලි සිට කොඩිකාමාම දක්වා මාර්ග කොටස (0+000 සිට 14+300 km) සහ චාවකච්චේරි-පුල්ලි මාර්ගයේ (B075) මී.310. (උපායමාර්ගික නගර සංවර්ධන ව්‍යාපෘතිය-යාපනය)
- මැරයින් ඩ්‍රයිව් අදියර 5 (කොල්ලුපිටිය දුම්රිය ස්ථානයේ සිට ගාලු මුවදොර දෙසට) සහ අදියර 6 (ෆ්‍රේසර් මාවතේ සිට දෙහිවල දුම්රිය ස්ථානය දක්වා) (ව්‍යාපෘති අධ්‍යක්ෂ (බටහිර-ව්‍යාපෘතිය))
- මැදමුලන - දෙබොක්කාව (B 623) මාර්ගය. (මහාමාර්ග අමාත්‍යාංශය)
- මධ්‍යම අධිවේගී මාර්ග ව්‍යාපෘතිය (2 කොටස-A පැකේජය) මීරිගම සිට රිලොලුව දක්වා අලුතින් අතුරා ඇති තාර මතුපිට කොටසෙහි කි.මී. 37+100 සිට 38+920 කි.මී. (CEP - II)
- මධ්‍යම අධිවේගී මාර්ග ව්‍යාපෘතිය (2- C පැකේජය) තාර මතුපිට සම්පූර්ණ කරන ලද කොටස් (CH 57+000 සිට කි.මී. 62+330 සහ කි.මී. 63+950 සිට කි.මී. 69+500 දක්වා). (CEP -II))
- මධ්‍යම අධිවේගී මාර්ග ව්‍යාපෘතිය (දෙවන කොටස-D පැකේජය) මඩිතියවෙල සිට කුරුණෑගල දක්වා අලුතින් අතුරා ඇති තාර මතුපිට කොටසෙහි කි.මී. 69+500 සිට කි.මී. 78+000 දක්වා (CEP -II)
- මධ්‍යම අධිවේගී මාර්ග ව්‍යාපෘතිය (2 කොටස-B පැකේජය) නිම කරන ලද තාර මතුපිට කිලෝමීටර 46+800 සිට 57+000 කි.මී. (CEP -II)
- ලබුදුව - වඳුරඹේ - සඳරවෙල (B 248) මාර්ගය 1+950 සිට 6+950 දක්වා, නාගොඩ සිට ගෝනදෙණිය (B 303) මාර්ගය 0+000 සිට 3+600 දක්වා සහ උඩුගම - හිනිදුම (B 429) මාර්ගය 0+000 සිට 5+000.(i Road)

- නව කැලණි පාලම ව්‍යාපෘතිය යටතේ නිම කරන ලද අධිවේගී මාර්ග කොටස් සහ බෑවුම්. (නව කැලණි පාලම)
- අවිස්සාවේල්ල-හැටන්-නුවරඑළිය (A007) 0+800 සිට 42+640 දක්වා, බලංගොඩ-බෝවත්ත-කොට්ටාව (B038) 0+000 සිට 28+960 දක්වා, දික්වැල්ල – බෙලිඅත්ත (B101) 01+02 සිට 01+02 දක්වා සහ වීරවිල - තිස්ස - කතරගම (B464) 0+000 සිට 23+890 දක්වා. (i Road)
- පිටත වටරවුම් අධිවේගී මාර්ග කොටසේ කි.මී. 0+000 සිට කි.මී. 28+600 දක්වා සහ කොළඹ කටුනායක අධිවේගී මාර්ගයේ KR (21+100) හි ප්‍රවේශ ගාස්තු අය කරන ස්ථානයෙහි අලුතින් ඉදිකරන ලද කොන්ක්‍රීට් පදික වේදිකාව. (EOM&M)

පවතින සමීක්ෂණවලින් රළුබව දත්ත නිකුත් කිරීම

- දක්ෂිණ අධිවේගී මාර්ගය ගොඩගම (පාලටුව) සිට මත්තල - හම්බන්තොට දක්වා දීර්ඝ කිරීම සඳහා IRI දත්ත. (EOM&M)
- මහනුවර මාර්ග ජාලයේ මාර්ග ඉන්වෙන්ටරි විස්තර. (මහනුවර උමං ඉදිකිරීම් ව්‍යාපෘතිය)

FWD භාවිතයෙන් කළ සමීක්ෂණය සහ පහතට වැටෙන බර අපගමනය (Falling Weight Deflection Data) පිළිබඳ දත්ත ඉදිරිපත් කිරීම

- මීගමුව - ගිරිඋල්ල (B322) 3+700 සිට 28+800 දක්වා, මීගමුව - මීරිගම (B324) 0+000 සිට 32+280 දක්වා සහ හංවැල්ල - උරාපොල (B146) 0+000 සිට 24+000 දක්වා.(පර්යේෂණ සහ සංවර්ධන අංශය සඳහා)
- පේරාදෙණිය - හල්ඔළුව - කටුගස්තොට (B 365) 3+000 සිට 10+000 දක්වා.(ප්‍රධාන ඉංජිනේරු (මහනුවර) විසින් කරන ලද ඉල්ලීම මත)
- කටුගස්තොට-කුරුණෑගල-පුත්තලම මාර්ගය (AA010) කි.මී. 93.5 සිට කි.මී.124.70 දක්වා (පර්යේෂණ සහ සංවර්ධන අංශය සඳහා)
- මීගමුව - ගිරිඋල්ල (B322) කි.මී.1+900 සිට කි.මී. 29+500 දක්වා, කිරිබත්ගොඩ-සපුගස්කන්ද(B221) කි.මී.0+000 සිට කි.මී. 5+070 දක්වා, පැරණි මීගමුව මාර්ගය (AB028) කි.මී.0+000 සිට කි.මී.0+950 දක්වා , ජා ඇල-ඒකල-ගම්පහ-යක්කල (A033) කි.මී 0+000 සිට කි.මී.2+750 දක්වා, ඒකල-කොටදෙණියාව (B111) කි.මී.0+000 සිට කි.මී.27+000 දක්වා, කැලණිමුල්ල-අංගොඩ-කොස්වත්ත (B644) කි.මී.0+000 සිට කි.මී.4+600 දක්වා සහ කටුනායක EPZ ප්‍රවේශ මාර්ගය (AB09) කි.මී.0+000 සිට කි.මී.1+710 දක්වා. (පර්යේෂණ සහ සංවර්ධන අංශය සඳහා)
- අවිස්සාවේල්ල-හැටන්-නුවරඑළිය මාර්ගය (AA007) කි.මී.0+800 සිට කි.මී.42+640 දක්වා. (පර්යේෂණ සහ සංවර්ධන අංශය සඳහා)
- පේරාදෙණිය - බදුල්ල - වෙන්කලඩි (AA005) කි.මී 0+000 සිට කි.මී.0+945 දක්වා , අලදෙණිය - ඊරියගම (B005) කි.මී 0+000 සිට කි.මී.9+650 දක්වා, මහනුවර - මහියංගන - පදියතලාව (AA026) කි.මී 0+000 සිට කි.මී.4+000 දක්වා, ලුවි පෙරිස් මාවත (B551) කි.මී 0+000 සිට කි.මී.0+860 දක්වා, ගෙලි ඔය - ඇම්බැක්කේ (B135) කි.මී. 0+000 සිට කි.මී.1+500 දක්වා

  කඩුගන්නාව - ගම්පොල (B172) කි.මී.0+000 සිට කි.මී.17+300 දක්වා, නාවලපිටිය - දොලොස්බාගේ (B318) කි.මී.0+000 සිට කි.මී.10+500 දක්වා, අලකොලංග - පොතේපිටිය (B006) කි.මී.0+000 සිට කි.මී.9+250 දක්වා, කඩුගන්නාව - පොතේපිටිය (B173) කි.මී.0+000 සිට කි.මී.8+450 දක්වා සහ ගම්පොළ - ක්‍රෙග්හෙඩ් (B132) කි.මී. 0+000 සිට කි.මී.15+930 දක්වා. (ප්‍රධාන ඉංජිනේරු (මහනුවර) විසින් කරන ලද ඉල්ලීම මත)

MFNSV සහ FWD - සමීක්ෂණ යන්ත්‍රවල වාර්ෂික නඩත්තු සහ ක්‍රමාංකන චාරිකා

කොන්ත්‍රාත් ගිවිසුමට අනුව සැපයුම්කරු විසින් RDA විසින් එකඟ වූ පරිදි යන්ත්‍රය නඩත්තු කිරීම සහ අලුත්වැඩියා කිරීම සිදු කළ යුතුය. ඒ අනුව පහත වැඩසටහන ක්‍රියාත්මක කරන ලදී. ස්වීඩනයේ KUAB සමාගමේ විශේෂඥයා ශ්‍රී ලංකාවට පැමිණි අතර ඔවුන් FWD යන්ත්‍රයේ අදාළ ක්‍රමාංකනය, නඩත්තු කිරීම සහ අලුත්වැඩියා කටයුතු අපගේ කාර්ය මණ්ඩලය සමඟ සිදු කළහ.

වගුව 34 : FWD හි වාර්ෂික නඩත්තු හා ක්‍රමාංකනය

යන්ත්‍රයේ වර්ගය	**දිනය**	**සිදු කළ කාර්යය**	**විශේෂඥයාගේ නම**	**සමාගමේ නම**
FWD	05/12/2021 සිට 11/12/2021 දක්වා	(අ) FWD යන්ත්‍රය සම්පූර්ණ පරීක්ෂාව සහ අවශ්‍ය නඩත්තු කටයුතු සඳහා සහභාගී විය. (ආ) භූ කම්පන මාන පරීක්ෂා කිරීම සහ රබර් ඩැම්පර් ප්‍රතිස්ථාපනය කිරීම. (ඇ) සම්පූර්ණ යන්ත්‍ර ක්‍රමාංකනය සිදු කරන ලදී.	අෆ්ෂින් ලොට්ෆි මහතා	KUAB සමාගම, ස්වීඩනය

MFNSV (ARRB System Pty Ltd., Australia) හි සැපයුම්කරු කොවිඩ් -19 සංචාරක සීමාවන් හේතුවෙන් සේවා සංචාරයන් සංවිධානය නොකරන ලදී. නඩත්තු ගිවිසුමට අනුව, ඔවුන් දේශීය නියෝජිත ATA International (Pvt.) ltd හරහා මාර්ග සංවර්ධන අධිකාරියේ ක්ෂේත්‍ර කාර්ය මණ්ඩල කණ්ඩායම සඳහා මාර්ගගත සහාය ලබා දෙන ලදී.

ආ. මහාමාර්ග සංවර්ධන හා කළමනාකරණය (HDM – 4) හා ශ්‍රී ලංකා මාර්ග වත්කම් කලමනාකරණ පද්ධතිය (SLRAMS)

මහාමාර්ග සංවර්ධන හා කළමනාකරණය (HDM-4) සම්බන්ධ වැඩ කටයුතු

- ක්‍රියාකාරී සැලැස්ම සහ ක්‍රියාකාරකම් අයවැයට අනුව ජාතික මාර්ග ප්‍රධාන සැලැස්ම (NRMP) ප්‍රතිදානය සංශෝධනය කිරීම.
- ක්‍රියාකාරී සැලැස්ම, ක්‍රියාකාරකම් අයවැය සහ ආයතනික සැලැස්ම සඳහා මාර්ග සංවර්ධන අධිකාරියේ මාර්ග ලැයිස්තුව සකස් කිරීම.

ශක්‍යතා අධ්‍යයන අරමුණ සඳහා මාර්ග ව්‍යාපෘතිවල ආර්ථික ඇගයීම සඳහා HDM-4 විශ්ලේෂණය

- කැලණිය සහ පට්ටිවිල කැලණි ගඟ හරහා යෝජිත පාලම් දෙකක ආර්ථික විශ්ලේෂණය. (සම්පූර්ණ කර ඇත)
- වදුරගල සිට පිටත වටරවුම් මාර්ගය (කුරුණෑගල අතුරු මාර්ගය) දක්වා යෝජිත විකල්ප මාර්ගය පිළිබඳ ආර්ථික විශ්ලේෂණය. (සිදු වෙමින් පවතී)
- මීරිගම අතුරු මාර්ගය සඳහා යෝජිත විකල්ප ආර්ථික විශ්ලේෂණය (සිදු වෙමින් පවතී)
- රුවන්පුර අධිවේගී මාර්ගයේ ආර්ථික විශ්ලේෂණය අදියර 2. (සිදු වෙමින් පවතී)
- ගිරිඋල්ල අතුරු මාර්ගය සඳහා යෝජිත විකල්ප ආර්ථික විශ්ලේෂණය. (සිදු වෙමින් පවතී)

වෙනත් - සාමාන්‍ය

- 2021 වර්ෂය තුළ කොවිඩ්-19 වසංගත තත්ත්වයන් හේතුවෙන්, රජය සහ මාර්ග සංවර්ධන අධිකාරිය විසින් නිකුත් කරන ලද චක්‍රලේඛයට අනුව කාර්ය මණ්ඩලයට කාර්යාල වැඩවලට සහභාගී වීමට සිදු විය.

  පහත කාලසීමාවන්හි දී කාර්යාල කටයුතු සාමාන්‍ය පරිදි සිදුකෙරිණි.
  - ✓ 01.01.2021 – 27.04.2021
  - ✓ 02.08.2021 – 08.08.2021
  - ✓ 01.11.2021 – 31.12.2021

  රජය සහ මාර්ග සංවර්ධන අධිකාරිය විසින් නිර්දේශ කරන ලද ක්‍රමවේදය අනුව කාර්යාල කටයුතු කරගෙන යාම ඉතිරි කාල සීමාවන් තුළ සිදු කෙරුණි. එනම්, නිවසේ සිට වැඩ කිරීම, නාමලේඛන ක්‍රමය සහ පළාත් සීමා සීමා කිරීම වැනි ක්‍රම අනුගමනය කරන ලදී.

- මාර්ග සංවර්ධන අධිකාරියේ කළමනාකාරිත්වය මෙම අංශය සඳහා නිලධාරීන් තිදෙනෙකු (ඉංජිනේරුවරුන් දෙදෙනෙකු, එක් තොරතුරු තාක්ෂණ සහකාර) අනුයුක්ත කර ඇත.

- පහත සඳහන් මෙම අංශයේ මාණ්ඩලික නිලධාරීන් සංඛ්‍යාව 4 ක් වැඩබලන පදනම මත ප්‍රවාහන සම්බන්ධතා සහ වත්කම් කළමනාකරණ ව්‍යාපෘතියට (TCAMP) අනුයුක්ත කර ඇත.

  - ICT නිලධාරි: තනතුරු 2ක්
  - කළමනාකරණ සහකාර: 1 තනතුර
  - තොරතුරු තාක්ෂණ සහකාර: 1 තනතුර

- මෙම අංශයට අලුතින් එක් වූ කාර්ය මණ්ඩලයට නවාතැන් ගැනීම සඳහා මගනැගුම මහමැදුරේ, 3 වන මහලේ, සැලසුම් IV කොටසේ නැවත කොටස් කිරීමේ කටයුතු.
- පර්යේෂණ කටයුතු සඳහා විශ්වවිද්‍යාල උපාධිධාරීන්ට සමීක්ෂණ දත්ත ඉදිරිපත් කිරීම.
- සේවක සංඛ්‍යාව සහ බඳවා ගැනීමේ පරිපාටි සැලසුම් අංශය, වත්කම් කළමනාකරණ අංශය සහ මාර්ග සංවර්ධන අධිකාරියට සම්බන්ධ වැඩවලට සහභාගී වීම.
- මාර්ග සංවර්ධන අධිකාරියේ වත්කම් තක්සේරු කිරීම සඳහා ක්‍රියාකාරී සැලැස්ම ඉදිරිපත් කිරීම.
- රැස්වීම්වලට සහභාගී වීම
  - තාක්ෂණික ඇගයීම් කමිටුව
  - ශක්‍යතා සම්බන්ධීකරණය
  - ප්‍රගති සමාලෝචනය
  - විගණන සහ කළමනාකරණ කමිටුව
- පුහුණු වැඩසටහන්
  - *i.* ආසියානු සංවර්ධන බැංකුව විසින් දින දෙකක් පවත්වන ලද මාර්ග වත්කම් කළමනාකරණ අධ්‍යයනයේ අතථ්‍ය වැඩමුළුවට අතිරේක අධ්‍යක්ෂ සහභාගී විය.
  - *ii.* CEP 2 (මීරිගම-කුරුණෑගල) මාර්ගගත ඉදිරිපත් කිරීම සහ ක්ෂේත්‍ර නිරීක්ෂණයන් සඳහා ඉංජිනේරුවන් දෙදෙනෙකු සහභාගී විය.
  - *iii.* උස් කුළුණු මත ඉදිවන වරාය ප්‍රවේශ අධිවේගී මාර්ග ව්‍යාපෘතියේ මාර්ගගත ඉදිරිපත් කිරීම සහ ක්ෂේත්‍ර නිරීක්ෂණ සඳහා ඉංජිනේරුවරුන් තිදෙනෙකු සහභාගී විය.
  - *iv.* නව සාමාන්‍ය සේවා පරිසරය තුළ මාර්ග සංවර්ධන අධිකාරියේ කළමනාකරණ සහාකාරවරුන් සඳහා පැවැත්වුණු ස්වයං නායකකත්ව සංවර්ධන කුසලතා පිළිබඳ දින හයක මාර්ගගත පුහුණු වැඩසටහනකට එක් කළමනාකරණ සහකාරවරයෙක් සහභාගී විය.

ගැටළු / ප්‍රතිකර්ම ක්‍රම සහ යෝජනා

අ) බ.කා.ජා.ස.ර. සහ ප.බ.උ.මා. සමීක්ෂණයවලට අදාළ ගැටළු

- ***සමීක්ෂණ ප්‍රමාදයන්***

i) බ.කා.ජා.ස.ර. (MFNSV)

-කොවිඩ් 19 හේතුවෙන් : 2021 මැයි මස ආරම්භයේ සිට 2021 ජුනි මස අවසානය දක්වා
-DIMO හි යන්ත්‍ර අලුත්වැඩියාවක් හේතුවෙන් : 2021 ජූලි මස මුල සිට 2021 සැප්තැම්බර් මැද දක්වා

පිළියම් පියවර

පසුබෑම් හඳුනා ගැනීමට MFNSV සමීක්ෂණ 2021 සැප්තැම්බර් මැද සිට දෙසැම්බර් දක්වා පූර්ණ සෞඛ්‍ය ආරක්ෂණ පියවරයන් සමඟ සංවිධානය කරන ලදී. මධ්‍යම අධිවේගී මාර්ග (දෙවන අදියර) විවෘත කිරීමේ අවසන් අදියරේ පවතින බැවින් පැකේජ අනුව IRI පරීක්ෂණය සඳහා CEP-II වෙතින් නිතර ඉල්ලීම් සිදු කරන ලදී. සමීක්ෂණවල පසුබෑම ඉවත් කිරීමට, MFNSV කණ්ඩායමේ නිලධාරීන්ට 2021 ඔක්තෝම්බර් සිට දෙසැම්බර් දක්වා මසකට දින 20 සීමාව ඉක්මවීමට ඉඩ ලබා දීම සඳහා මාර්ග සංවර්ධන අධිකාරියේ අධ්‍යක්ෂ ජනරාල්වරයාගෙන් විශේෂ අනුමැතිය ලබා ගන්නා ලදී.

ii) ප.බ.උ.මා (FWD)

- කොවිඩ් 19 හේතුවෙන් : 2021 මැයි මස මුල සිට 2021 ජුනි මස අවසානය දක්වා
  : 2021 අගෝස්තු මැද සිට 2021 සැප්තැම්බර් මැද දක්වා
- ඇදගෙන යන වාහන අක්‍රිය වීම නිසා: 2021 සැප්තැම්බර් අග සිට 2021 ඔක්තෝබර් මැද දක්වා
- සමීක්ෂණ කණ්ඩායම් ගැටලුව හේතුවෙන්: 2021 දෙසැම්බර් මැද සිට 2021 දෙසැම්බර් අවසානය දක්වා

පිළියම් පියවර

පසුබෑම් හඳුනා ගැනීම සඳහා 2021 සැප්තැම්බර් මැද සිට දෙසැම්බර් මැද දක්වා පූර්ණ සෞඛ්‍ය ආරක්ෂණ පියවරයන් සමඟ FWD සමීක්ෂණ සංවිධානය කරන ලදී. කෙසේ වෙතත්, පර්යේෂණ සහ සංවර්ධන අංශයෙන් සහ පළාත් අධ්‍යක්ෂවරුන්ගෙන් FWD සමීක්ෂණය සඳහා ලද දිගු ඉල්ලීම් ලැයිස්තුව හේතුවෙන්, සමීක්ෂණවල පවතින පසුබෑම ඉවත් කිරීම සඳහා 2021 ඔක්තෝබර් සිට දෙසැම්බර් දක්වා FWD කණ්ඩායමේ නිලධාරීන්ට මසකට දින 20 සීමාව ඉක්මවීමට අවසර දීමට මාර්ග සංවර්ධන අධිකාරියේ අධ්‍යක්ෂ ජනරාල් වෙතින් විශේෂ අනුමැතියක් ගන්නා ලදී.

ආ) දත්ත රැස් කිරීම සම්බන්ධ ගැටළු

- 2021 ජූනි මාසයේදී TCAMP ව්‍යාපෘතිය යටතේ FWD යන්ත්‍රය සඳහා ඇදගෙන යන වාහනය සැපයීම සඳහා කොන්ත්‍රාත්තුවක් ලබා දී ඇත. කෙසේ වෙතත්, ආනයනයේ යම් ප්‍රමාදයන් හේතුවෙන් වාහනය තවමත් මාර්ග සංවර්ධන අධිකාරිය වෙත ලැබී නොමැත.
- වර්තමාන බ.කා.ජා.ස.ර. ධාවනය කළ නොහැකි / ධාවනය කිරීමට නිර්දේශ නොකරන පටු සහ දුර්වල තත්ත්වයේ මාර්ගවල සමීක්ෂණ සිදු කිරීම සඳහා ජාල සමීක්ෂණ වාහනයක සරල කළ අනුවාදයක් අවශ්‍ය වේ. මෙය ප්‍රවාහන සම්බන්ධතා සහ වත්කම් කළමනාකරණ ව්‍යාපෘතිය (TCAMP) යටතේ මිලදී ගැනීමට යෝජනා කර ඇත.
- වරින් වර බ.කා.ජා.ස.ර. ක්‍රමාංකනය කිරීමට තල්ලු කරගෙන යා හැකි පැතිකඩක් (walking profiler) අවශ්‍ය වේ. මෙම උපකරණ ප්‍රවාහන සම්බන්ධතා සහ වත්කම් කළමනාකරණ ව්‍යාපෘතිය (TCAMP) යටතේ මිලදී ගැනීමට ද යෝජනා කර ඇත.

- සැලකිය යුතු වේගයකින් චලනය වන මෙහෙයුමකදී පදික ස්ථරයේ ඝනකම දත්ත රැස් කිරීම සඳහා බිම විනිවිද යන රේඩාර් (GPR) අවශ්‍ය වේ. GPR යනු සාමාන්‍ය භූ මතුපිට පරීක්ෂා කිරීම් සඳහා වඩාත්ම නිර්දේශිත විනාශකාරී නොවන ක්‍රමවලින් එකකි. මෙම උපකරණ ප්‍රවාහන සම්බන්ධතා සහ වත්කම් කළමනාකරණ ව්‍යාපෘතිය (TCAMP) යටතේ මිලදී ගැනීමට ද යෝජනා කර ඇත.
- බ.කා.ජා.ස.ර. රථයේ (MFNSV) සහ ප.බ.උ.මා. රථයේ (FWD) රියදුරන් සඳහා විශේෂ දීමනාවක් සඳහා ඉල්ලා සිටීම. මෙම වාහන ද්විත්වයේම රියදුරන් දෙදෙනාම සාමාන්‍ය රිය පැදවීමේ ක්‍රියාකාරිත්වයට අමතරව උපකරණවල ආරක්ෂාව කෙරෙහි විශේෂ අවධානයක් යොමු කරමින් අමතර වෙහෙසකින් රිය පැදවිය යුතුය. සාමාන්‍ය මාර්ග වාහනවල අනෙකුත් රියදුරන්ගේ වගකීම හා සසඳන විට මෙය අමතර වගකීමකි. එබැවින්, 2020 සැප්තැම්බර් 23 වන දින මණ්ඩල පත්‍රිකාවක් ඉදිරිපත් කරන ලද අතර කළමනාකරණ සේවා දෙපාර්තමේන්තුවේ (MSD) අනුමැතියට යටත්ව මණ්ඩලය විසින් මණ්ඩල පත්‍රිකාව අනුමත කර ඇත.

ඇ) ශ්‍රී ලංකා මාර්ග වත්කම් කළමනාකරණ පද්ධතිය (SLRAMS) සාර්ථකව ක්‍රියාත්මක කිරීම සඳහා යෝජනා

- ශ්‍රී ලංකා මාර්ග වත්කම් කළමනාකරණ වෙබ් පද්ධතිය සම්පූර්ණයෙන් ප්‍රයෝජනයට ගැනීම සඳහා මහ නැගුම කාර්යාල ගොඩනැගිල්ලේ තොරතුරු තාක්ෂණ යටිතල පහසුකම් වැඩිදියුණු කිරීමේ අවශ්‍යතාවය.
  - අඛණ්ඩ සේවාව ලබා ගැනීම සඳහා සේවා සපයන්නන්, දෘඪාංග උපකරණ මෙන්ම බලපත්‍ර මෘදුකාංග සමඟ නඩත්තු ගිවිසුම් අලුත් කිරීමේ වැදගත්කම.
  - දත්ත රැස් කිරීම, පද්ධති උඩුගත කිරීම සහ සැකසීම පිළිබඳ අදාළ කාර්ය මණ්ඩලය පුහුණු කරන්න.
  - ශ්‍රී ලංකා මාර්ග වත්කම් කළමනාකරණ පද්ධතිය (SLRAMS) සඳහා ArcGIS සේවාදායක පහසුකම ලබා ගැනීම.
  - මාර්ග සංවර්ධන අධිකාරිය සඳහා LGN පහසුකම ලබා ගැනීම.
  - මාර්ග යටිතල පහසුකම් ක්‍රමානුකූලව තක්සේරු කිරීම සඳහා වත්කම් තක්සේරු මොඩියුලය (AVM) ඇතුළත් කිරීම සඳහා ශ්‍රී ලංකා මාර්ග වත්කම් කළමනාකරණ පද්ධතිය (SLRAMS) වැඩිදියුණු කිරීම.

10. අධිවේගී මාර්ග කළමනාකරණය

ක්‍රියාත්මක වන අධිවේගී මාර්ග ජාලයේ සුමට ක්‍රියාකාරිත්වය සඳහා මෙහෙයුම් කටයුතු, නඩත්තු කිරීම සහ කළමනාකරණය යන ක්‍රියාකාරකම් ක්‍රියාත්මක කිරීම අධිවේගී මාර්ග මෙහෙයුම්, නඩත්තු සහ කළමනාකරණ (EOM&M) අංශය මගින් සිදු කරනු ලැබේ. 2021 වර්ෂය තුළ දක්ෂිණ අධිවේගී මාර්ගය (E01), පිටත වටරවුම් අධිවේගී මාර්ගය (E02), කොළඹ-කටුනායක අධිවේගී මාර්ගය (E03) සහ අන්දරවැව-හම්බන්තොට අධිවේගී මාර්ගය (E06) ක්‍රියාත්මක විය.

අංශයේ වගකීම්

- අයවැය විගණනය සමඟ අධිවේගී මාර්ගවල මූලික සැලසුම්කරණය, කළමනාකරණය සහ ගමනාගමන කටයුතු, ගාස්තු අයකිරීම් සහ නඩත්තු කටයුතු.
- අධිවේගී මාර්ග සුමටව ක්‍රියාත්මක කිරීම සහ භාවිතා කරන්නන්ගේ ආරක්ෂාව සහතික කිරීම සඳහා රාජ්‍ය ආයතන සහ අනෙකුත් සංවිධාන සමඟ සම්බන්ධ වීම.
- පරිශීලක ගාස්තු, ගමනාගමනය, නඩත්තුව, පරිපාලනය සහ මූල්‍ය අංශවලට අනුයුක්ත නව කාර්ය මණ්ඩලය පුහුණු කිරීම.
- රථවාහන කළමනාකරණය, ගාස්තු ක්‍රියාත්මක කිරීම සහ නඩත්තු කටයුතු සඳහා ප්‍රමිති සැකසීම.
- රථවාහන අධ්‍යයනය, පරිශීලක ගාස්තු අංශයට අදාළ අධ්‍යයන සහ නඩත්තු කටයුතු සම්බන්ධ අධ්‍යයන පැවැත්වීම.
- මෙහෙයුම වෙනුවෙන් අධිවේගී මාර්ග කොටස් සම්පූර්ණ කිරීම භාර ගැනීම සඳහා අවශ්‍ය කටයුතු සම්පාදනය කිරීම.

මාර්ග භාවිත කිරීමේදී ගාස්තු අය කිරීමේ ක්‍රියාවලිය

දක්ෂිණ අධිවේගී මාර්ගය (E01), පිටත වටරවුම් මාර්ගය (E02), අන්දරවැව- හම්බන්තොට (E06) හා කොළඹ - කටුනායක අධිවේගී මාර්ගය (E03) භාවිතා කිරීමේදී ගාස්තු අය කිරීමේ ක්‍රියාවලිය පැය - දින 24 x 7 මෙහෙයුමක් වන අතර එය පැය 13-12 දෛයිනික වැඩමුර ක්‍රමයකි. මෙම මෙහෙයුම ප්‍රධාන වශයෙන් භාවිතා කිරීමේදී ගාස්තු අය කිරීමේ අංශය, තො.ත. හා විදුලි සංදේශ අංශය හා විදුලි විද්‍යුත් හා ඉලෙක්ට්‍රොනික අංශය විසින් ඉංජිනේරුවන්ගේ ප්‍රධානත්වයෙන් සිදු කෙරේ.

දක්ෂිණ අධිවේගී මාර්ගය භාවිත කිරීමේදී ගාස්තු රැස්කිරීමේ ක්‍රියාවලිය තාප ටිකටපත් භාවිත කරමින් පොදු රේඩියෝ පද්ධතියක් මඟින් සක්‍රිය කරන ලද විකුණුම් ලක්ෂයක් සහිතව සිදු කෙරේ. අතින් ටිකටපත් නිකුත් කිරීම, පද්ධතිය බිඳ වැටුණු අවස්ථාවල මඟින්ට බාධා නොවීම පිණිස ක්‍රියාත්මක කෙරේ. එහෙත්, අතින් ගාස්තු එකතු කිරීමේ (MTC) ක්‍රමයක් මුලින් ක්‍රියාත්මක වන්නේ කොළඹ - කටුනායක අධිවේගී මාර්ගයේ ය. පසුව, අතින් ගාස්තු රැස් කිරීමේ පද්ධතිය සමඟ එක්ව 2015 ජූලි 9 වන දින ඉලෙක්ට්‍රොනික ගාස්තු එකතු කිරීම (ETC) හඳුන්වා දෙන ලද අතර, දැනට ඉ.ගා.රැ.ග්‍රාහකයන් 34,492ක් පමණ ලියාපදිංචි වී ඇත. ඉලෙක්ට්‍රොනික ගාස්තු ගෙවීම භාවිතා කිරීම දිරිමත් කිරීම සහ වැඩි කිරීම සඳහා ඉලෙක්ට්‍රොනික ගාස්තු ගෙවීම භාවිතා කරන්නන් සඳහා පරිශීලක ගාස්තු ගාස්තු මත 10% වට්ටමක් හඳුන්වා දෙන ලදී. ගාස්තු රැස් කිරීම ඉ.ගා.රැ. ක්‍රමය යටතේ ලංකා බැංකු රැස් කිරීමේ ගිණුමක් මඟින් සිදු කරන ලද අතර, පසුව මාර්ග සංවර්ධන අධිකාරියේ ගිණුමකට මාරු කරන ලදී. ඉ.ගැ.රැ.සඳහා සියලුම ගාස්තු කුටිවල වෙනම මංතීරුවක් වෙන් කර ඇති අතර, අදාළ පහසුකම් තව දුරටත් වැඩි දියුණු කිරීම කොන්ත්‍රාත්කරු හා සම්බන්ධීකරණය වීමෙන් ඉදි කෙරෙමින් පවතී.

අ. අධිවේගී මාර්ගවල ගමනාගමන පරිමාවන්

වගුව 35: ක්‍රියාත්මක වන අධිවේගී මාර්ග ජාලයේ 2021 වර්ෂය සඳහා වන මාසික රථවාහන පරිමාව

මාසය	රථවාහන පරිමාව (වාහන ගණන)				
	E01, E02 සහ E06	E03			මුළු එකතුව
		අතින් ගාස්තු රැස් කිරීම	ඉලෙක්ට්‍රොනික ගාස්තු රැස් කිරීම	එකතුව	
ජනවාරි	2,305,955	569,346	88,934	658,280	2,964,235
පෙබරවාරි	2,169,850	535,628	86,042	621,670	2,791,520
මාර්තු	2,635,701	689,105	112,229	801,334	3,437,035
අප්‍රේල්	2,480,980	613,120	94,512	707,632	3,188,612
මැයි	854,278	315,692	60,648	376,340	1,230,618
ජූනි	1,188,585	323,917	56,953	380,870	1,569,455
ජූලි	2,056,735	582,358	90,958	673,316	2,730,051
අගෝස්තු	1,541,142	430,147	69,660	499,807	2,040,949
සැප්තැම්බර්	1,437,699	397,072	63,605	460,677	1,898,376
ඔක්තෝබර්	2,370,047	685,064	99,171	784,235	3,154,282
නොවැම්බර්	2,522,220	770,244	113,727	883,971	3,406,191
දෙසැම්බර්	2,902,911	964,117	131,059	1,095,176	3,998,087
එකතුව	**24,466,103**	**6,875,810**	**1,067,498**	**7,943,308**	**32,409,411**

සටහන: - ග්‍රාහක ගාස්තු පද්ධතියෙන් ලබාගත් දත්ත



සටහන:- වාහන කාණ්ඩ, අංක 2166/49 දරණ 13/03/2020 දිනැතිව ප්‍රකාශයට පත් කරන ලද ගැසට් නිවේදනයට අනුකූල වේ.

1 කාණ්ඩය: ඇක්සෙල් දෙකක් සහ රෝද හතරක් සහිත වාහන

2 කාණ්ඩය: ඇක්සෙල් දෙකක් සහ රෝද හයක් සහිත වාහන

3 කාණ්ඩය: ඇක්සල් දෙකකට වඩා වැඩි වාහන

රූපය 1 : 2021 වර්ෂය තුළ දක්ෂිණ අධිවේගී මාර්ගයේ වාහන පිටවීම කාණ්ඩ පදනම මත බෙදා දැක්වීම.



රූපය 2 : 2021 වර්ෂය තුළ කොළඹ-කටුනායක අධිවේගී මාර්ගයේ වාහන පිටවීම කාණ්ඩ පදනම මත බෙදා දැක්වීම

2021 වර්ෂය තුළ ද අධිවේගී මාර්ගවල ගමන් කළ වාහනවලින් බහුතරයක් 1 කාණ්ඩයට අයත් වේ.

ආ. අධිවේගී මාර්ග වලින් ලැබෙන ආදායම

වගුව 36: 2021 වර්ෂය තුළ අධිවේගී මාර්ග ජාලයෙන් ලද ගාස්තු ආදායම්

මාසය	ආදායම (රු.මිලියන)				
	E01, E02 සහ E06	E03			මුළු එකතුව
		MTC	ETC	Total	
ජනවාරි	591.665	117.296	21.353	138.649	730.31
පෙබරවාරි	567.058	112.452	20.866	133.318	700.38
මාර්තු	685.070	144.281	27.408	171.689	856.76
අප්‍රේල්	682.997	127.909	23.151	151.06	834.06
මැයි	218.542	82.037	14.831	96.868	315.41
ජූනි	304.965	68.258	13.994	82.252	387.22
ජූලි	507.510	121.932	22.160	144.092	651.60
අගෝස්තු	398.864	91.220	17.447	108.667	507.53
සැප්තැම්බර්	374.576	89.297	15.707	105.004	479.58
ඔක්තෝබර්	605.660	151.274	24.374	175.648	781.31
නොවැම්බර්	660.828	163.652	28.292	191.944	852.77
දෙසැම්බර්	768.060	203.658	32.077	235.735	1003.80
එකතුව	6,365.795	**1,473.264**	**261.660**	**1,734.926**	**8,100.72**

සටහන: අංක 2166/49 දරණ 13/03/2020 දින ප්‍රකාශයට පත් කරන ලද ගැසට් නිවේදනයට අනුව පරිශීලක වාහන කාණ්ඩ සකස් කර ඇත.

2021 වර්ෂයේ අධිවේගී මාර්ග ජාලය සඳහා වාර්ෂික සාමාන්‍ය දෛනික පරිශීලක ගාස්තු ආදායම මිලියන 22.2 කි.

ඇ. රථවාහන මෙහෙයුම්

දක්ෂිණ අධිවේගී මාර්ගය, පිටත වටරවුම් අධිවේගී මාර්ගය සහ කොළඹ - කටුනායක අධිවේගී මාර්ගයේ රථවාහන මෙහෙයුම් ක්‍රියාකාරිත්වය 24 x7 පුරා අඛණ්ඩව දිනකට පැය 13- 12 ක වැඩමුර ක්‍රමය යටතේ ක්‍රියාත්මක වන මෙහෙයුමකි. මෙමගින් ප්‍රධාන වශයෙන් සිදු කරන්නේ අධිවේගී මාර්ග රථවාහන ආරක්ෂාව හා කාර්යක්ෂම රථවාහන ප්‍රවාහනය සහතික කරමින් ප්‍රශස්ථ තත්ත්වයක පවත්වා ගැනීම සඳහාය. රථවාහන පාලකවරුන් පහත දැක්වෙන කාර්යයන් ඉටු කරමින් සාමාන්‍ය හා හදිසි තත්ත්වයන් යටතේ අධිවේගී මාර්ග පරීක්ෂාවන්වල නිරත වෙයි.

- විවිධ වර්ගයේ හදිසි අනතුරුවලදී ක්ෂණිකව මැදිහත්වීම හා රථවාහන මෙහෙයුම් මධ්‍යස්ථානවලට තත්‍ය තොරතුරු ලබා දෙමින් ආරක්ෂාකාරීව කළමනාකරණය කිරීම.
- වාහන ආපදා වලදී පැමිණීම, ඒවා අධිවේගී මාර්ගයෙන් පිටතට ගෙන යාමට හෝ ආරක්ෂාකාරීව අධිවේගී මාර්ගයේ ධාවනය කිරීම සඳහා කටයුතු කිරීම.
- අධිවේගී මාර්ගවල තිබෙන බාධක ඉවත් කිරීම.
- අධිවේගී මාර්ගයේ ගමන්ගන්නන් විසින් හෝ වෙනත් පාර්ශවයක් විසින් සිදු කරන නීති විරෝධී කටයුතු පිළිබඳව පරීක්ෂා කර පියවර ගැනීම.
- අධිවේගී මාර්ගයේ වත්කම්වලට හෝ කාර්යක්ෂම ක්‍රියාකාරිත්වයට අහිතකර ලෙස බලපාන අසාමාන්‍ය තත්ත්වයන්, අධිවේගී මාර්ග පරිශ්‍රයන් තුළ හෝ බාහිර පරිශ්‍රයන් තුළ සිදු වන්නේ දැයි පරීක්ෂා කිරීම. අධිවේගී මාර්ගවල හදිසි අනතුරු කළමනාකරණය පහත පරිදි විස්තර කළ හැකිය.



රූපය 3: හදිසි සිදුවීම් කළමනාකරණ පද්ධතිය

ඇ. අධිවේගී මාර්ගවල සිදුවුණු අනතුරු පිළිබඳ තොරතුරු

(i) දක්ෂිණ අධිවේගී මාර්ගය

වගුව 37 : 2021 වර්ෂයේදී දක්ෂිණ අධිවේගී මාර්ගයේ සිදු වූ අනතුරුවල සාරාංශය

මාසය	*මාරාන්තික*	*බරපතල*	*බරපතල නොවන*	*දේපල හානි*	*මුළු අනතුරු ගණන*
ජනවාරි	0	1	8	119	128
පෙබරවාරි	1	2	12	108	123
මාර්තු	1	1	10	154	166
අප්‍රේල්	0	0	12	181	193
මැයි	1	1	5	87	94
ජූනි	0	2	2	74	78
ජූලි	0	2	6	91	99
අගෝස්තු	0	1	6	73	80
සැප්තැම්බර්	0	2	4	80	86
ඔක්තෝබර්	0	2	11	120	133
නොවැම්බර්	0	2	8	132	142
දෙසැම්බර්	2	3	8	145	158
එකතුව	*5*	*19*	*92*	*1364*	*1480*

(ii) පිටත වටරවුම් මාර්ගය

වගුව 38 : 2021 වර්ෂයේ දී පිටත වටරවුම් අධිවේගී මාර්ගයේ සිදු වූ අනතුරුවල සාරාංශය

මාසය	*මාරාන්තික*	*බරපතල*	*බරපතල නොවන*	*දේපල හානි*	*එකතුව*
ජනවාරි	0	0	1	24	25
පෙබරවාරි	0	0	0	24	24
මාර්තු	0	0	3	35	38
අප්‍රේල්	0	0	0	33	33
මැයි	0	0	1	20	21
ජූනි	0	0	0	16	16

ජූලි	0	0	0	25	25
අගෝස්තු	0	0	0	15	15
සැප්තැම්බර්	1	0	0	21	22
ඔක්තෝබර්	0	0	0	24	24
නොවැම්බර්	0	0	0	40	40
දෙසැම්බර්	0	0	0	28	28
එකතුව	*1*	*0*	*5*	*305*	*311*

(iii) *කොළඹ - කටුනායක අධිවේගී මාර්ගය*

වගුව 39 : 2021 වර්ෂයේ දී කොළඹ - කටුනායක අධිවේගී මාර්ගයේ සිදු වූ අනතුරුවල සාරාංශය

මාසය	***මාරාන්තික***	***බරපතල***	***බරපතල නොවන***	***දේපල හානි***	***එකතුව***
ජනවාරි	0	0	1	6	7
පෙබරවාරි	0	0	1	11	12
මාර්තු	0	0	1	15	16
අප්‍රේල්	0	0	0	14	14
මැයි	0	0	0	12	12
ජූනි	0	1	0	2	3
ජූලි	0	0	0	13	13
අගෝස්තු	0	0	0	6	6
සැප්තැම්බර්	0	0	0	8	8
ඔක්තෝබර්	0	0	0	18	18
නොවැම්බර්	0	0	0	26	26
දෙසැම්බර්	0	0	0	19	19
එකතුව	*0*	*1*	*3*	*150*	*154*

(iv) අන්දරවැව - හම්බන්තොට අධිවේගී මාර්ගය

වගුව 40: 2021 වර්ෂයේ දී අන්දරවැව - හම්බන්තොට අධිවේගී මාර්ගයේ සිදු වූ අනතුරුවල සාරාංශය

මාසය	***මාරාන්තික***	***බරපතල***	***බරපතල නොවන***	***දේපල හානි***	***එකතුව***
ජනවාරි	0	0	0	0	0
පෙබරවාරි	0	0	0	3	3
මාර්තු	0	0	0	2	2
අප්‍රේල්	0	0	0	3	3
මැයි	0	0	0	3	3
ජූනි	0	0	0	0	0
ජූලි	0	0	0	0	0
අගෝස්තු	0	0	0	1	1
සැප්තැම්බර්	0	0	0	2	2
ඔක්තෝබර්	0	0	1	1	2
නොවැම්බර්	0	0	0	1	1
දෙසැම්බර්	0	0	0	38	38
එකතුව	0	0	1	54	55

අධිවේගී මාර්ගවල සිදුවන අනතුරුවලින් 82%කට වැඩි ප්‍රමාණයක් "දේපල හානි" ගණයට අයත් බව ඉහත දත්ත අනුව පෙනී යයි.

ඉ. තොරතුරු තාක්ෂණ සහ විදුලි සංදේශ කටයුතු

අධිවේගී මාර්ගවල ගාස්තු අය කිරීම, අධීක්ෂණ සහ සන්නිවේදන පද්ධති අඛණ්ඩව ක්‍රියාත්මක වීම සහතික කිරීම සඳහා තොරතුරු තාක්ෂණ සහ විදුලි සංදේශ කටයුතු වැදගත් වේ. මෙහි සේවා විෂය පථයට පරිශීලක ගාස්තු එකතු කිරීමේ පද්ධතිය, රථවාහන කළමනාකරණ (VMS) පද්ධති, CCTV පද්ධති, අන්තර්ගත කළමනාකරණ පද්ධතිය, වත්කම් කළමනාකරණ පද්ධතිය වැනි අධිවේගී මාර්ගවල කාර්යක්ෂම හා ඵලදායී ක්‍රියාකාරිත්වය සඳහා එදිනෙදා මෙහෙයුම් වලදී යොදා ගැනෙන පරිගණක සහ ජාල පදනම් වූ පද්ධතිවල අවශ්‍යතා හඳුනා ගැනීම, සැලසුම් කිරීම, ක්‍රියාත්මක කිරීම සහ නඩත්තු කිරීම ඇතුළත් වේ. ඉහත වගකීම්වලට අමතරව, අවදානම් විශ්ලේෂණය සිදු කිරීම, දත්ත පද්ධතියේ අසාර්ථක ප්‍රතිසාධන සිදුවීම් කළමනාකරණය සහ මෙහෙයුම් සඳහා නව ජාල සහ තොරතුරු පද්ධති සහ විද්‍යුත් සහ ඉලෙක්ට්‍රොනික පද්ධති පර්යේෂණ හා සංවර්ධනය වැනි කාර්යයන් මෙම අංශය විසින් හසුරුවනු ලබයි.

ඉහත කරුණු වලට අමතරව, අවදානම් විශ්ලේෂණය සිදු කිරීම, දත්ත පද්ධතියේ අසාර්ථක ප්‍රතිසාධන සිදුවීම් කළමනාකරණය සහ නව ඉලෙක්ට්‍රොනික පද්ධති, ජාල සහ තොරතුරු පද්ධති පර්යේෂණ හා සංවර්ධනය සහ ඉලෙක්ට්‍රොනික ගාස්තු එකතු කිරීමේ (ETC) පද්ධතිය, ETC ලියාපදිංචිය සහ ETC පාරිභෝගික සේවා කටයුතු ප්‍රවර්ධන වැඩසටහන් වැනි කාර්යයන් මෙම අංශය විසින් හසුරුවනු ලබයි. කොවිඩ් - 19 ගෝලීය වසංගතය හේතුවෙන්, ප්‍රධාන වශයෙන් සම්පත් හිඟය හේතුවෙන් වැඩ ප්‍රගතියේ කැපී පෙනෙන අඩුවීමක් දක්නට ලැබේ.

නිකිපතා නඩත්තු කිරීම

- රථවාහන කළමනාකරණ පද්ධතියේ (VMS), පිටත කැමරා, මංතීරු කැමරා, ප්ලාසාවල ලසාමාන්‍ය නඩත්තු කටයුතු.
- MTC සහ ETC මංතීරු පද්ධතිවල (බාධක, ප්‍රදර්ශක පුවරු, මංතීරු පරිගණක, ඇන්ටනා, රීඩර් සහ අනාවරක පද්ධතිය ඇතුළුව) සාමාන්‍ය නඩත්තු
- රවුටර සහ ස්විච, අධීක්ෂණ පද්ධතිය (CCTV කැමරා සහ CMS, SMT සහ NVR ඇතුළුව පටිගත කිරීමේ සර්වර් පද්ධතිය) සහ FCMS CMS VMS කාලගුණ අනාවරක වාහන අනාවරක/කවුන්ටර ඇතුළු ක්ෂේත්‍ර උපාංග ඇතුළුව ප්‍රධාන ජාලයේ සාමාන්‍ය නඩත්තුව සහ දෝෂ නිරාකරණය.
- ETC සහ MTC සේවාදායක පද්ධතිය, ETC මාස්ටර්/ස්ලේව් සර්වර් පද්ධතිය, MTC ස්ථාන සර්වර්යන්, මධ්‍යම සර්වර්යන් සහ වෙබ් සර්වර්යන්වල සාමාන්‍ය නඩත්තු කටයුතු.
- පරිගණක සහ රැහැන් රහිත උපාංග සහ සාමාන්‍ය සහ ETC ඇමතුම් මධ්‍යස්ථාන උපාංග සහ කාර්යයන් සමඟ අභ්‍යන්තර කාර්යාල ජාලය සාමාන්‍ය පරිදි නඩත්තු කිරීම.




වැඩිදියුණු කිරීම් සහ සංවර්ධනයන්

- ලංකා බැංකුව විසින් හඳුන්වා දුන් කාඩ්පත් ගෙවීම් (මුදල් රහිත ගෙවීම්) ක්‍රමය MTC පරිශීලකයින් සඳහා හඳුන්වා දීමට නියමිතය.
- නව කැලණි පාලම කොටසේ නිරීක්ෂණ පද්ධතිය සඳහා CCTV කැමරා සහ විකේතන යන්ත්‍ර, නව කැලණි පාලම ව්‍යාපෘතිය මගින් මිලදී ගනු ලබන අතර කොළඹ - කටුනායක අධිවේගී මාර්ගයේ අධීක්ෂණ මධ්‍යස්ථානයේ CCTV අධීක්ෂණයට පහසුකම් සැලසේ.
- කොළඹ - කටුනායක අධිවේගී මාර්ගයේ වත්මන් CCTV නිරීක්ෂණ පද්ධතිය යාවත්කාලීන කිරීම සිදු වෙමින් පවතී.
- සම්පූර්ණ වර්ණ LED මොඩියුල 300ක් ලබාගෙන ඇති අතර පණිවිඩ ලකුණ (FCMS) වෙනස් කළ හැකි F- වර්ගයේ 01ක් මොඩියුලයක් අලුත්වැඩියා කරන ලදී.
- පවතින FCMS 02ක් අවශ්‍යතාවය සඳහා අලුත්වැඩියා කර ඉහුරුකඩේ හන්දියේ ස්ථානගත කරනු ලැබේ.
- සම්පූර්ණ වර්ණ LED මොඩියුල 350ක් ප්‍රසම්පාදන ක්‍රියාවලිය යටතේ පවතී.
- සර්වරයේ කාර්ය සාධනය වැඩි දියුණු කිරීම සඳහා Ram කාඩ්පත් ලබාගෙන එය සර්වරය වෙත ස්ථාපනය කර ඇත.
- සීදුව සහ පැලියගොඩ නව පිවිසුම් වේදිකාව සඳහා ගාස්තු අය කිරීම, අධීක්ෂණ සහ සන්නිවේදන පද්ධති සම්බන්ධ ස්ථාපනය සහ වින්‍යාස කිරීමේ කටයුතු සිදු වෙමින් පවතී.
- ETC ගාස්තු අය කිරීමේ පද්ධතිය වැඩිදියුණු කිරීමේ යෝජනාව, තාක්ෂණික ඇගයීම් කමිටුව විසින් ඇගයීමට ලක් කරනු ලබන අතර එය කොළඹ - කටුනායක අධිවේගී මාර්ගයේ ගාස්තු අයකිරීමේ අවස්ථාවක් ලෙස ක්‍රියාත්මක කරනු ඇත.
- 10 KVA UPS 02ක් සහ බැටරි බෑන්ක් 1 මිලදී ගෙන කටුනායක IC බල කාමරය තුළ (power room) ස්ථාපනය කරන ලදී.
- කටුනායක IC හි 40 KVA UPS සඳහා බැටරි බැංකුවක් මිලදී ගැනීමට මිලදී ගැනීමේ ඇණවුම නිකුත් කර ඇත.
- ජංගම දුරකථන හරහා සන්නිවේදනය වැඩිදියුණු කිරීම සඳහා කෙරවලපිටිය IC කාර්යාලයට රිපීටර් ඇන්ටනා සවිකිරීම අවසන් කර ඇත.
- කටුනායක IC හි ගාස්තු, රථවාහන, මූල්‍ය අංශ සඳහා අභ්‍යන්තර රැහැන්ගත කාර්යාල ජාලයේ කටයුතු අවසන් කර ඇත.
- MTC සහ ETC විදුලි බාධක මිලදී ගැනීම ප්‍රසම්පාදන ක්‍රියාවලිය යටතේ පවතී.
- තීරු සංකේත හඳුනා ගන්නා යන්ත්‍ර (Barcode readers) 05ක් ලබා ගන්නා ලදී.

- ETC පාරිභෝගික සේවා මධ්‍යස්ථානය පාරිභෝගිකයාගේ පහසුව සඳහා සීදුව අන්තර් හුවමාරුවේ ක්‍රියාත්මක වේ.
- දක්ෂිණ අධිවේගී මාර්ගයේ තොරතුරු තාක්ෂණ යටිතල පහසුකම් අළුත්වැඩියා කිරීම, සේවා කිරීම සහ නඩත්තු කිරීම සඳහා නව තොරතුරු තාක්ෂණ - කාර්මික ශිල්පීන් වෙන් කිරීම මගින් තොරතුරු තාක්ෂණ සහ විදුලි සංදේශ නඩත්තු වැඩිදියුණු කිරීම.
- ගාස්තු අය කිරීම, අධීක්ෂණ සහ සන්නිවේදන පද්ධතිය සහ අදාළ සියලුම උප පද්ධති සඳහා නිවාරක සහ නිවැරදි කිරීමේ නඩත්තු සැසි 760ක් පැවැත්වීම.

ඊ. විදුලි හා ඉලෙක්ට්‍රොනික වැඩ

අධිවේගී මාර්ගවල ගාස්තු අය කිරීම, අධීක්ෂණ සහ සන්නිවේදන පද්ධති බාධාවකින් තොරව ක්‍රියාත්මක වීම සහතික කිරීම සඳහා විදුලි හා ඉලෙක්ට්‍රොනික අංශය ද වැදගත් වේ.විදුලි පද්ධතිවල අවශ්‍යතා හඳුනා ගැනීම, සැලසුම් කිරීම, ක්‍රියාත්මක කිරීම සහ නඩත්තු කිරීම මෙයට ඇතුළත් වේ. ඉහත වගකීම්වලට අමතරව, අවදානම් විශ්ලේෂණය සිදු කිරීම, විදුලි පද්ධතියේ අසාර්ථක ප්‍රතිසාධන සිදුවීම් කළමනාකරණය සහ අධිවේගී මාර්ගයේ ක්‍රියාකාරීත්වයේ ගුණාත්මක භාවය ඉහළ නැංවීම සඳහා නව තාක්ෂණ පර්යේෂණ හා සංවර්ධනය වැනි කාර්යයන් මෙම අංශය විසින් හසුරුවනු ලබයි.

නිතිපතා නඩත්තු කිරීම

- දක්ෂිණ අධිවේගී මාර්ගයේ ස්ථාන තුනක නඩත්තු ඒකක හතරක් පිහිටුවා ඇති අතර පිටත වටරවුම් අධිවේගී මාර්ගයට සහ පැලියගොඩ කාර්යාලය - කොළඹ කටුනායක අධිවේගී මාර්ගයට අදාළ කාර්යාල කාර්ය මණ්ඩලය පැය 24 සඳහා රාජකාරී ඉටු කිරීම සඳහා වෙන් කරන ලදී.

- වීදි ලාම්පු, රථවාහන සංඥා ලාම්පු, විදුලි ජනක යන්ත්‍ර, කාර්යාල බල පද්ධති සහ වායු සමීකරණ පද්ධතිවල විදුලි නඩත්තු කටයුතු සාමාන්‍ය නඩත්තුව යටතේ සිදු කරන ලදී.




- පදික වේදිකා, වාහන අධිවේගී මාර්ග, උමං මාර්ග, පාලම්වල වීදි ලාම්පුවල විදුලි නඩත්තු කටයුතු.

වැඩිදියුණු කිරීම් සහ සංවර්ධනයන්

- සීදුව අන්තර් හුවමාරුවේ සහ පැලියගොඩ අන්තර් හුවමාරුවේ අලුතින් සාදන ලද අතිරේක ගාස්තු කුටි සඳහා විදුලි සැපයුම ලබා දීම. ඊට අමතරව එම නිපදවන ලද කුටිවල අභ්‍යන්තර රැහැන් ඇදීම විදුලි අංශයෙන් සිදු කරන ලදී.
- අතේ ගෙන යා හැකි LED පණිවිඩ සංඥා පුවරු තුනක් (03) කොළඹ-කටුනායක අධිවේගී මාර්ගය වෙත ලබාගෙන ඇති අතර, දක්ෂිණ අධිවේගී මාර්ගය සඳහා එවැනිම තවත් පුවරු දොළහක් (12) සඳහා මිලදී ගැනීමේ ඇණවුම නිකුත් කර ඇති අතර, අවසන් කරන ලද ඒකක මෙම වසර අවසානයේ මාර්ග සංවර්ධන අධිකාරිය වෙත භාර දෙනු ලැබේ.
- අනතුරු බහුල ස්ථාන ලෙස හඳුනාගෙන ඇති විවිධ ස්ථාන දහසයක (16) දුරස්ථ නිරීක්ෂණ පද්ධතිය ඇතුළු උසස් අනතුරු ඇඟවීමේ දැල්වීමේ පද්ධති ස්ථාපනය කර ඇත.





- අධිවේගී මාර්ගයේ සිට මත්තල ගුවන්තොටුපළ හන්දිය දක්වා පවතින මාර්ග ආලෝක පද්ධතිය ප්‍රතිසංස්කරණය කිරීම සහ නව ස්ථාපනය කිරීමේ ව්‍යාපෘතියට අදාළ ප්‍රසම්පාදන කටයුතු සිදු වෙමින් පවතී.
- දක්ෂිණ අධිවේගී මාර්ගය දීර්ඝ කිරීමේදී අලි වැට නිරීක්ෂණ කටයුතුවල යෙදෙන වාහන සමූහය සඳහා GPS අධීක්ෂණ පද්ධතිය ස්ථාපිත කරන ලදී.
- ටෝල් බාධක යන්ත්‍ර 45ක් මිලදී ගැනීමේ කටයුතු ක්‍රියාත්මක වෙමින් පවතී.
- කහතුඩුව, දොඩන්ගොඩ සිට වැලිපැන්න දක්වා රථවාහන සංඥා ලාම්පු ප්‍රතිසංස්කරණය කිරීමට අදාළ ප්‍රසම්පාදන කටයුතු සිදු කෙරෙමින් පවතී.
- ඉහත කරුණු වලට අමතරව පහත සඳහන් ප්‍රසම්පාදන ක්‍රියාකාරකම් ද සිදු වෙමින් පවතී.
    - ඩිජිටල් තිර සඳහා අමතර උපාංග මිලදී ගැනීම
    - ESEP හි LED මාර්ග ආලෝකකරණය සඳහා අමතර උපාංග මිලදී ගැනීම.
    - දක්ෂිණ අධිවේගී මාර්ග දිගුවේ විදුලි අලි වැට පද්ධතිය සඳහා දුරස්ථ නිරීක්ෂණ පද්ධතියක් ස්ථාපිත කිරීම.
- පැලියගොඩ (K5+420) සහ සීදුව (K21+100) හිදී කොළඹ කටුනායක අධිවේගී මාර්ගයට ඇතුල්වීමේ ටෝල් ප්ලාසා සහ ආශ්‍රිත පහසුකම් 3ක් ඉදිකිරීමේදී විදුලි ස්ථාපන කටයුතු.
    - සීදුව අන්තර් හුවමාරුවෙහි බල සැපයුම් කේබල් මාරු කිරීම.
    - ටෝල් ප්ලාසා ආලෝක පද්ධතිය සැපයීම සහ ස්ථාපනය කිරීම.
    - බෑවුම් පුවරු (Ramp Distribution boards) සැපයීම සහ ස්ථාපනය කිරීම.
    - ඇතුල්වීමේ ටෝල් ප්ලාසා සහ සාදන ලද ගාස්තු අය කිරීමේ කුටි සඳහා අමු බල සැපයුම සහ UPS බල සැපයුම සැපයීම
    - ගාස්තු කුටිවල විදුලි උපකරණ සවි කිරීම සහ සාදන ලද කුටිවල අභ්‍යන්තර රැහැන් ඇදීම සම්පූර්ණ කිරීම.
    - ගාස්තු කුටිවල වායු සමීකරණ යන්ත්‍ර සවි කිරීම.

- ඇතුල්වීමේ ගාස්තු අය කිරීමේ බැවුමේ වීදි ආලෝක පද්ධතියේ සැපයුම් සහ ස්ථාපන කටයුතු (සිදු කෙරෙමින් පවතී)
- ඇතුල්වීමේ ටෝල් ප්ලාසා සඳහා අකුණු ආරක්ෂණ පද්ධතිය සැපයීම සහ ස්ථාපනය කිරීම (සිදු කෙරෙමින් පවතී)

උ. අධිවේගී මාර්ග නඩත්තු කිරීම

අධිවේගී මාර්ග නඩත්තු කිරීම පහත පරිදි අනු ඒකක 11ක් පිහිටුවීමෙන් සිදු කෙරේ.

- දක්ෂිණ අධිවේගී මාර්ගය - බණ්ඩාරගම, දොඩංගොඩ, මීගම, පින්නදූව, උඩුකාව
- දක්ෂිණ අධිවේගී මාර්ග දිගුව - අපරැක්ක, අහුණකොළපැලැස්ස, සූරියවැව
- පිටත වටරවුම් අධිවේගී මාර්ගය - කඩුවෙල
- කොළඹ-කටුනායක අධිවේගී මාර්ගය - පාලියගොඩ

සෑම ඒකකයක්ම නඩත්තු ඉංජිනේරුවරයාගේ මගපෙන්වීම යටතේ තාක්ෂණික සහකාරවරුන් සහ කාර්මික නිලධාරින් විසින් අධීක්ෂණය කරනු ලැබේ. 2021 සැප්තැම්බර් වන විට මුළු ශ්‍රම බලකාය කොන්ත්‍රාත් කම්කරුවන් ඇතුළුව කම්කරුවන් 890 ක් පමණ වේ. මෙම කම්කරුවන් වෘක්ෂලතා පාලක, පෑස්සුම්කරුවන්, වඩු කාර්මිකයන්, කම්මල්කරුවන්, පෙදරේරුවන්, කාර්මිකයන්, රථවාහන පාලන සහායකයන්, වගා කරුවන්, අලි වැට නඩත්තු කිරීම ආදී වශයෙන් සේවය කරති.

නිතිපතා නඩත්තු කිරීම

- වෘක්ෂලතා පාලනය
  කඩවත - අතුරුගිරිය, අතුරුගිරිය - ගැලනිගම, ගැලනිගම - වැලිපැන්න සහ වැලිපැන්න - බද්දේගම, බද්දේගම - ගොඩගම සහ පැලියගොඩ නව කැලණි පාලම - කටුනායක ගුවන් තොටුපළ අන්තය ඇතුළු ප්‍රධාන අධිවේගී මාර්ග ප්‍රදේශ, සේවා ප්‍රදේශය, අන්තර් හුවමාරු, ප්‍රධාන කාර්යාල පරිශ්‍රය, බණ්ඩාරගම, මීගම සහ උඩුකාව නඩත්තු කාර්යාල පරිශ්‍රය සහ පෝද්දල ගබඩා පරිශ්‍රයේ සාමාන්‍ය වෘක්ෂලතා පාලන කටයුතු අධිවේගී මාර්ග මෙහෙයුම් නඩත්තු හා කළමනාකරණ අංශය විසින් පිහිටුවා ඇති අංක 11 නඩත්තු ඒකක මගින් සිදු කෙරේ. එය මාර්ග දෙපස, මංතීරු හයක් පුළුල් කරන කොටස, බැම් බැවුම්, කැපූ බැවුම් සහ මධ්‍ය දූපත (කොළඹ - කටුනායක අධිවේගී මාර්ගය සහ පිටත වටරවුම් අධිවේගී මාර්ගය සඳහා පමණි) ඇතුළුව ප්‍රධාන මාර්ග ආවරණය කරයි. තවද ව්‍යුහවල වෘක්ෂලතා පාලනය සහ කැපීමෙන් පාලනය කිරීමට අපහසු "මාන" සහ "ඉලුක්" පැල උදුරා දැමීම සඳහා විශේෂ අවධානයක් යොමු කර ඇත.

- අනතුරු හානි අලුත්වැඩියා කිරීම
  අධිවේගී මාර්ග මෙහෙයුම් නඩත්තු හා කළමනාකරණ අංශයේ මගපෙන්වීම සහ අධීක්ෂණය යටතේ කුලියට ගත් කොන්ත්‍රාත්කරුවෙකු හරහා හදිසි අනතුරු අලුත්වැඩියා කටයුතු සිදු කෙරේ.වෙන වෙනම කොන්ත්‍රාත්තු දෙකක් යටතේ අලුත්වැඩියා කටයුතු සිදු කෙරෙන අතර වැඩ සඳහා ප්‍රමාණවත් සංඥා පුවරු සංඛ්‍යාවක් දැන් පවතින අතර ප්‍රගතිය සතුටුදායක මට්ටමක පවතී. අනතුරු හේතුවෙන් හානියට පත් සංඥා පුවරු වෙනුවට නව සංඥා පුවරු සවි කිරීම, කොන්ත්‍රාත්තුවක් හරහා එම පුවරු සකස් කිරීමෙන් පසු සෘජු ශ්‍රමය යොදා ගැනීම හරහා සිදු කරන ලදී.

- ජලාපවහන නඩත්තුව

  මාර්ග භාවිතා කරන්නන්ගේ ආරක්ෂාව සහතික කිරීම සඳහා ප්‍රවාහන මාර්ගයෙන් සහ බැවුම් වලින් (කැපුම් බැවුම් සහ බැම්) ජලය බැස යාමට ප්‍රමුඛත්වය ලබා දී ඇත. දෘශ්‍ය පරීක්ෂණ සහ මහජන පැමිණිලි මගින් රොන්මඩ සහිත බෝක්කු සහ ඇළ මාර්ග හඳුනා ගන්නා ලදී. මේවා කුලියට ගත් කුඩා කැණීම් යන්ත්‍ර මගින් හෝ අතින් පිරිසිදු කෙරේ. සමහර අවස්ථාවලදී ඇළ

පිරිසිදු කිරීමේ කටයුතු අධිවේගී මාර්ග කොරිඩෝවෙන් ඔබ්බට (රෝ වැටෙන් පිටත) දීර්ඝ කර ඇත්තේ කාර්යයේ ඵලදායීතාවය වැඩි දියුණු කිරීම සඳහාය. අධිවේගී මාර්ගයේ කාණු, ශ්‍රම බලකාය සහ කැනීම් යන්ත්‍ර මගින් පිරිසිදු කෙරේ.

- ඉරිතැලීම් මුද්‍රා තැබීම

  කොළඹ කටුනායක අධිවේගී මාර්ගයේ ස්ථාන කිහිපයක ඉරිතැලීම් මුද්‍රා තැබීම සිදු කරන ලදී. මාර්ග පදික වේදිකාවට ජලය කාන්දු වීම වැළැක්වීම සඳහා ක්ෂණික ක්‍රියාමාර්ගයක් ලෙස මෙය සිදු කරන ලදී.

- පදික වේදිකාව පිරිසිදු කිරීම

  අංශය සතුව ඇති මාර්ග අතුගා දැමීමේ යන්ත්‍රය භාවිතයෙන් දක්ෂිණ අධිවේගී මාර්ගය, පිටත වටරවුම් අධිවේගී මාර්ගය සහ කොළඹ කටුනායක අධිවේගී මාර්ගයේ (කි.මී.170) පදික වේදිකා පිරිසිදු කිරීම සිදු කෙරේ.

- පාෂාණ කැපුම් ආරක්ෂා කිරීම

  අධිවේගී මාර්ගයේ ගමනාගමනයට තර්ජනයක් වන ඇතැම් කැපුම් කොටස්වල ගල් පෙරළීම් හඳුනාගෙන ඇත. එම නිසා අධිවේගී මාර්ග මෙහෙයුම් නඩත්තු හා කළමනාකරණ අංශය විසින් පාෂාණ දැල් ක්‍රමයක් භාවිතා කරමින් මාර්ගයට පාෂාණ කොටස් වැටීම වැළැක්වීම සඳහා තාවකාලික පියවර ගෙන ඇත.

- ගාස්තු කුටිවල බිම් පිරිසිදු කිරීම

  හැකිතාක් දුරට දූවිලි හා තෙල් පැල්ලම් ඉවත් කිරීම සඳහා ගාස්තු කුටි සහ බිම් පිරිසිදු කරනු ලැබේ.කොට්ටාව සහ පින්නදූව ගාස්තු කුටි සහ බිම් පිරිසිදු කිරීම කුලියට ගත් කොන්ත්‍රාත්කරුවෙකු හරහා සිදු කරන ලදී. කොළඹ කටුනායක අධිවේගී මාර්ගයේ ගාස්තු ගෙවන ප්‍රදේශවල ආරක්ෂාව සහ වඩා හොඳ පෙනුම සඳහා ගාස්තු කුටි බිම සහ ETC පිරිසිදු කිරීම සහ පින්තාරු කිරීම නිතිපතා සිදු කෙරේ.

- සංඥා පුවරු පිරිසිදු කිරීම

  අධිවේගී මාර්ගවල 100km/h සහ කිලෝමීටර් සලකුණු කණු ඇතුළුව සියලුම සංඥා පුවරු සහ දිශා පුවරු අවශ්‍ය විටදී පිරිසිදු කෙරේ.

- කුටියේ ඉහළ ඇති මල් පැල නඩත්තු කිරීම

  කුටිවල මල් පැල නඩත්තු කිරීම, වල් පැලෑටි ඉවත් කිරීම සහ පැල සඳහා පොහොර යෙදීම මගින් මාසිකව නඩත්තු කරන ලදී.

- මාධ්‍ය උද්‍යානවල ඇති පැලවලට ජලය සැපයීම සහ නඩත්තු කිරීම

  මධ්‍ය උද්‍යාන, RoW වැට අසල සහ අන්තර් හුවමාරු ස්ථානවල පැලවලට වතුර දැමීම, "ක්‍රිස්ටිනා" සහ "බෝගන්විලා " පැල නඩත්තු කිරීම, මධ්‍ය උද්‍යාන U - කාණු පිරිසිදු කිරීම සහ RoW වැට අසල බාදනය වූ ප්‍රදේශ සඳහා සුන්බුන් නිසි ලෙස සකස් කිරීම සහ පරීක්ෂා කිරීම සහ තණතිලි අඩු හෝ නොමැති බෑවුම් කොළඹ-කටුනායක අධිවේගී මාර්ගයේ සිදු කෙරෙන ප්‍රධාන නඩත්තු කටයුතු කිහිපයකි. හරිතකරණය පැහැදිලිව පවත්වා ගැනීම සහ රියදුරන්ට දෘශ්‍ය බාධාව අවම කිරීමට මධ්‍ය තීරුවේ සිටුවා ඇති ක්‍රිස්ටිනා පැල නිතිපතා කප්පාඩු කිරීම සිදු කෙරේ.

- මහජන පැමිණිලි ඉදිරිපත් කිරීම

  වගාවන්, ප්‍රවේශ මාර්ග ගැටළු, ජලාපවහන ගැටළු යනාදිය සම්බන්ධයෙන් මහජන පැමිණිලි වලට ප්‍රතිචාර දැක්වීම සහ නිරතුරුව සහභාගී වීම සිදු කෙරේ. තවද, විශාල ගොඩනැගිලි

සංඛ්‍යාවක් විශාල පිරිසක් භාවිතා කරන බැවින් අධිවේගී මාර්ග ආශ්‍රිත ගොඩනැගිලි නඩත්තු කටයුතු ද නිසි අවධානයෙන් සිදු කෙරේ.

කලින් කලට කරනු ලබන නඩත්තු කිරීම්

- ගැලනිගම සිට පින්නදූව දක්වා වියැකී ගිය තාප ප්ලාස්ටික් මංතීරු සලකුණු යෙදීම
  ගැලනිගම සිට පිනදූව දක්වා කොටස දක්වා වූ මංතීරු සලකුණු මැකී වියැකී ගොස් ඇති නිසා රියැදුරන්ට රාත්‍රී කාලයේ විශේෂයෙන් වර්ෂා කාලය තුළ මංතීරුව වෙන්කර හඳුනාගත නොහැකි විය. ඒ අනුව ගැලනිගම සිට පින්නදූව දක්වා වූ මුළු මාර්ග දිග සඳහාම මැකී ගිය තාප ප්ලාස්ටික් රේඛාව නැවත යෙදීම සඳහා රු.12,602,400.00 කොන්ත්‍රාත්තුවක් ලබා දෙන ලද අතර 2021.06.11 දින වන විට එම වැඩ නිම කරන ලදී. එයට රු.12,450,583.00 වැය විය.

- කුරුඳුගහහැතැක්ම සිට ගොඩගම දක්වා විබාදනයට ලක් වූ ලෝහ ආරුක්කු ව්‍යුහයන් පින්තාරු කිරීම
  අධිවේගී මාර්ග මෙහෙයුම් නඩත්තු හා කළමනාකරණ අංශය විසින් ලෝහ තහඩුවල ඇති විබාදන ප්‍රමාණය අනුව සියලුම ලෝහ ආරුක්කු ව්‍යුහයන් ලැයිස්තුගත කර ඇති අතර විශාල නිවැරදි කිරීම් හෝ ප්‍රතිස්ථාපනය පවා අවශ්‍ය දැඩි විබාදනයකින් යුත් ව්‍යුහ හය (06) හඳුනාගෙන ඇත. තවත් දහයක් (10) අතරමැදි විබාදන මට්ටමක් ඇති ව්‍යුහයන් ලෙස තෝරාගෙන ඇති අතර තවදුරටත් විබාදනයෙන් ආරක්ෂා වීමට නිසි පින්තාරු කිරීම සිදු කිරීමට යෝජනා කරන ලදී. ඒ අනුව පිරිවිතරයන් සහ ලංසු ලේඛන සකස් කර ජාතික තරඟකාරී ලංසු තැබීම යටතේ ලංසු තැබීම සිදු කරන ලද අතර M/s Dock Yard General Engineering (Pvt) Ltd වෙත මිලියන 99ක මුදලකට කොන්ත්‍රාත්තුව ප්‍රදානය කර ඇත. වසර 4 ක නඩත්තු කාලයක් සහිතව කොන්ත්‍රාත්තුව ප්‍රදානය කරන ලද අතර 2021.04.06 වන විට සියලුම පින්තාරු කිරීමේ කටයුතු නිම කරන ලද අතර වෙනස්කම් සහිතව සිදු කරන ලද මුළු කාර්යය මිලියන 92.8 කි. තවද ඉදිකිරීම් 10 සඳහාම නඩත්තු කාලය ආරම්භ කර ඇත. මෙම කාල පරිච්ඡේදය තුළ කොන්ත්‍රාත්කරු කිසියම් දෝෂයක් නිවැරදි කිරීමට සහ පින්තාරු කරන ලද මතුපිට පිරිසිදු කිරීමට සහ අධීක්ෂණය කිරීමට සහභාගී විය යුතුය. ඉතිරි සියලුම ලෝහ ආරුක්කු ව්‍යුහවල (52) තීන්ත ආලේප කිරීම සඳහා මාස 18 + වසර 5 ක නඩත්තු කාලය සඳහා සම්පූර්ණ කොන්ත්‍රාත්තු මුදල වන රු. මිලියන 197.3 ක මුදලකට නව කොන්ත්‍රාත්තුවක් ප්‍රදානය කර ඇත. මෙය 2021 සැප්තැම්බර් මාසයේදී ප්‍රදානය කර ඇති අතර 2021 ඔක්තෝම්බර් මාසයේදී වැඩ ආරම්භ කිරීමට නියමිතය.





- 91 + 000 RHS හි ගැබියම බිත්තිය ඉදිකිරීම.

  අයහපත් කාලගුණික තත්ත්වය හේතුවෙන්, 91 + 000 RHS හි බෑවුමේ කඩා වැටීමක් සිදුවී ඇති අතර, බැම්මේ පාමුල වූ නිවාසවලට බාධා ඇති විය. ඒ අනුව බැම්මේ පාමුල ගැබියම තාප්පයක් ඉදිකර බෑවුම නිවැරදි කිරීමට සහ බෑවුම ආරක්ෂා කිරීමට කොන්ත්‍රාත්තුවක් ලබා දෙන ලදී.

  කොන්ත්‍රාත් මුදල – රු. 4,944,637.00
  සිදු කළ සම්පූර්ණ වැඩ ප්‍රමාණය – රු. 3,747,137.22
  නිම කළ දිනය – 18.03.2021




- කුරුඳුගහහැතැක්මෙහි ඉදිකරන ලද කාණු ඉදිකිරීම.
  කුරුඳුගහහැතැක්ම ප්‍රදේශයේ මීට පෙර පස් කාණුවක් වූ ස්ථානයකින් අධිවේගී මාර්ගයේ සිට අධික ජල ප්‍රවාහයක් නිවසකට ගලා යන්නට වීම ප්‍රශ්නයක් වී තිබුණි. එබැවින් එම ගැටළුව අවම කිරීම සඳහා කාණු ඉදි කරන ලදී.

  කොන්ත්‍රාත් මුදල – රු 2,733,225.00
  සිදු කළ සම්පූර්ණ වැඩ ප්‍රමාණය – රු 2,206,872.00
  නිම කළ දිනය – 14.08.2021



වැඩිදියුණු කිරීම්

නව කැලණි පාලමේ ක්‍රියාකාරීත්වය ආරම්භ කිරීමත්, පසුව උස් කුළුණු මත දිවෙන වරාය ප්‍රවේශ අධිවේගී මාර්ගයේ මෙහෙයුම් ආරම්භයත් සමඟ කොළඹ - කටුනායක අධිවේගී මාර්ගය සංචාත පද්ධතියක් ලෙස ක්‍රියාත්මක විය යුතුය. එබැවින් අනාගත අවශ්‍යතා සපුරාලීම සඳහා කොළඹ - කටුනායක අධිවේගී මාර්ගයේ පැලියගොඩ සහ සීදුව අන්තර් හුවමාරු මධ්‍යස්ථානය හඳුන්වාදීමේ අවශ්‍යතාවය මතුව ඇත. එබැවින්, අනාගත අවශ්‍යතා සපුරාලීම සඳහා කොළඹ - කටුනායක අධිවේගී මාර්ගයේ පැලියගොඩ සහ සීදුව අන්තර් හුවමාරු ප්‍රවේශ ප්ලාසාව හඳුන්වාදීමේ අවශ්‍යතාවය මතුව ඇත.

- **කොළඹ - කටුනායක අධිවේගී මාර්ගයේ පැලියගොඩ (k5+420) හි ඇතුල්වීමේ ගාස්තු ප්ලාසා සහ අදාළ පහසුකම් ඉදිකිරීම.**

  මෙම ව්‍යාපෘතියට ගාස්තු ප්ලාසා ඉදිකිරීම සහ ඒ ආශ්‍රිත පහසුකම් හා අතින් ගාස්තු එකතු කිරීමේ මංතීරු දෙකක් සහ ඉලෙක්ට්‍රොනික ගාස්තු එකතු කිරීමේ මංතීරුවක් ඇතුළත් වේ. ටෝල් ප්ලාසා සැහැල්ලු බර, ඉවත් කළ හැකි ආකාරයේ වානේ සහ ඇලුමිනියම් ව්‍යුහයක් ලෙස ඉදිකර ඇත.
  කොන්ත්‍රාත්තුවේ දත්ත: පැලියගොඩ (k5+420) හි කොළඹ - කටුනායක අධිවේගී මාර්ගයට ඇතුළුවීමේ ගාස්තු ප්ලාසා සහ අදාළ පහසුකම් ඉදිකිරීම.
  කොන්ත්‍රාත් මුදල : රු.198,265,485.11 (VAT රහිත)
  කොන්ත්‍රාත්කරු: RR Construction (PVT) LTD
  කොන්ත්‍රාත් කාලය : දින 90
  ආරම්භක දිනය: 2020 දෙසැම්බර් 18
  අවසන් කළ දිනය : 2021 සැප්තැම්බර් 05

- **සීදුව (K21+100) හි කොළඹ - කටුනායක අධිවේගී මාර්ගයට ඇතුළුවීමේ ගාස්තු ප්ලාසා සහ අදාළ පහසුකම් ඉදිකිරීම.**

  මෙම ව්‍යාපෘතියට ගාස්තු ප්ලාසා ඉදිකිරීම සහ ඒ ආශ්‍රිත පහසුකම් හා අතින් ගාස්තු එකතු කිරීමේ මංතීරු දෙකක් සහ ඉලෙක්ට්‍රොනික ගාස්තු එකතු කිරීමේ මංතීරුවක් ඇතුළත් වේ. ටෝල් ප්ලාසා සැහැල්ලු බර, ඉවත් කළ හැකි ආකාරයේ වානේ සහ ඇලුමිනියම් ව්‍යුහයක් ලෙස ඉදිකර ඇත.
  කොන්ත්‍රාත්තුවේ දත්ත: සීදුව (K21+100) හි කොළඹ - කටුනායක අධිවේගී මාර්ගයට ඇතුල්වීමේ ගාස්තු ප්ලාසා සහ අදාළ පහසුකම් ඉදිකිරීම.
  කොන්ත්‍රාත් මුදල: රු.230,780,982.85 (VAT වැට් රහිත)
  කොන්ත්‍රාත්කරු: RR Construction (PVT) LTD
  කොන්ත්‍රාත් කාලය : දින 91
  ආරම්භක දිනය : 2020 දෙසැම්බර් 18
  අවසන් කළ දිනය : 2021 අගෝස්තු 31

- පැලියගොඩ සහ සීදුව පිටවීමේ ප්‍රදේශයේ පිටත මංතීරුවේ හාඩ් ෂෝල්ඩර් ඉදිකිරීම මීට පෙර ගාස්තු කුටි සංඛ්‍යාව වැඩි කිරීම මගින් කාර්යබහුල වේලාවන්හි රථවාහන පෝලිම අවම කිරීම

සඳහා පිටවීමේ ගාස්තු මධ්‍යස්ථානයේ හදිසි මංතීරුව ඉදිකර තිබුණි. තවද, මංතීරුවේ පළල වැඩි දියුණු කිරීම සඳහා හාඩ් ෂෝල්ඩර් ඉදිකරන ලද අතර අතිරේක ගාස්තු කුටියේ ආරක්ෂාව වැඩි දියුණු කිරීම සඳහා ගාස්තු කුටිය තැබීම සඳහා වේදිකාවක් ඉදිකරන ලදී. පැලියගොඩ පිටවීමේ වේදිකාවේ පිටත මංතීරුවේ හාඩ් ෂෝල්ඩර් ඉදිකිරීම. මෙම හාඩ් ෂෝල්ඩර් සහ උස් වූ වේදිකාවේ ඉදිකිරීම් පිරිවැය මිලියන 3.2 ක් පමණ වන අතර, "කොළඹ - කටුනායක අධිවේගී මාර්ගයට පැලියගොඩ (k5+420) ඇතුල්වීමේ ගාස්තු ප්ලාසා සහ ඒ ආශ්‍රිත පහසුකම් ඉදිකිරීම" ව්‍යාපෘතිය යටතේ විවිධ කාර්යයක් ලෙස ක්‍රියාත්මක විය.

- පැලියගොඩ පිටත මංතීරුවේ හාඩ් ෂෝල්ඩර් ඉදිකිරීම.සීදුව පිටවීමේ වේදිකාවේ පිටත මංතීරුවේ හාඩ් ෂෝල්ඩර් ඉදිකිරීම. මෙම හාඩ් ෂෝල්ඩර් සහ උස් වූ වේදිකාවේ ඉදිකිරීම් පිරිවැය මිලියන 0.5 ක් පමණ වන අතර “සීදුව (k21+100)හි කොළඹ – කටුනායක අධිවේගී මාර්ගයට ඇතුළුවීමේ ගාස්තු ප්ලාසා සහ ඒ ආශ්‍රිත පහසුකම් ඉදිකිරීම” ව්‍යාපෘතිය යටතේ විවිධ කාර්යයක් ලෙස ක්‍රියාත්මක විය.

- පැලියගොඩ සහ සීදුව ටෝල් ප්ලාසා ප්‍රදේශයේ අධිවේගී මාර්ග පාරිභෝගිකයන් සඳහා වැසිකිළියක් ඉදිකිරීම. අධිවේගී මාර්ගයේ මෙහෙයුම් ක්‍රියාවලියේදී හොඳ පාරිභෝගික සේවාවක් පවත්වාගෙන යාමේ වැදගත්කම සැලකිල්ලට ගනිමින්, පිවිසුම් ප්ලාසා ඉදිකිරීම් ව්‍යාපෘතියේ අංගයක් ලෙස අමුත්තන්ගේ වැසිකිළිය ඉදිකිරීමට අදහස් කෙරේ. අධිවේගී මාර්ග පාරිභෝගිකයන් සඳහා පැලියගොඩ වැසිකිළිය ඉදිකිරීම අධිවේගී මාර්ගයේ පවතින ගොඩනැගිලිවලට බාහිර පෙනුමට ගැලපෙන පරිදි පිරිමි සහ ගැහැණු ලෙස වෙන් වූ වැසිකිළි සහිතව ඉදිකරන ලදී. වැසිකිළියේ ඉදිකිරීම් පිරිවැය රුපියල් මිලියන 1.5 ක් පමණ වන අතර පැලියගොඩ අධිවේගී මාර්ග පාරිභෝගිකයන් සඳහා වැසිකිළියක් ඉදිකිරීම "කොළඹ - කටුනායක අධිවේගී මාර්ගයට පැලියගොඩ (k5+420) ඇතුළුවීමේ ගාස්තු ප්ලාසා සහ ඒ ආශ්‍රිත පහසුකම් ඉදිකිරීම" ව්‍යාපෘතිය යටතේ විවිධ කාර්යයක් ලෙස ක්‍රියාත්මක විය.

- සීදුව අධිවේගී මාර්ග පාරිභෝගිකයන් සඳහා වැසිකිළියක් ඉදිකිරීම. අධිවේගී මාර්ගයේ දැනට පවතින ගොඩනැගිලිවලට බාහිර පෙනුමට ගැළපෙන පරිදි වැසිකිළි ඉදිකරන ලද අතර එය පිරිමි සහ ගැහැණු වශයෙන් වෙන් වෙන් වශයෙන් වැසිකිලි ඉදි කරන ලදී. වැසිකිළියේ ඉදිකිරීම් පිරිවැය රුපියල් මිලියන 2.7 ක් පමණ වන අතර, "කොළඹ - කටුනායක අධිවේගී මාර්ගයට පැලියගොඩ (k21+100) ඇතුල්වීමේ ගාස්තු ප්ලාසා සහ ඒ ආශ්‍රිත පහසුකම් ඉදිකිරීම" ව්‍යාපෘතිය යටතේ විවිධ කාර්යයක් ලෙස ක්‍රියාත්මක විය.







තවද, 2021 වර්ෂය තුළ අධිවේගී මාර්ග කළමනාකරණ පුද්ගලයින් සඳහා පහසුකම් සම්බන්ධයෙන් යම් යම් වැඩිදියුණු කිරීම් සිදු කරන ලදී.

කොක්මාදුවේ වාහන නැවැත්වීමේ රථ ගාල් ඉදිකිරීම
කොන්ත්‍රාත්කරු - පිවුම් කන්ට්‍රැක්ටර්ස්
කොන්ත්‍රාත් මුදල - රු 8,310,900.40
කොන්ත්‍රාත්තුව ආරම්භක දිනය - 06.02.2020
කොන්ත්‍රාත් කාලය - දින 154
වත්මන් තත්ත්වය - 100% - භෞතික ප්‍රගතිය අත්කරගෙන ඇත.
විශේෂ සටහන් - කොරොනා වසංගතයෙන් සහ වර්ෂාවෙන් බලපෑමට ලක් විය. සම්පූර්ණ කරන විට ප්‍රකාශයේ සඳහන් වූ මුදල - රු. 5,918,476.38 කි.

- කුරුදුගහහැතැම්ම අන්තර් හුවමාරුවේ හි STF සහ පොලිස් නවාතැන් ගොඩනැගිලි ප්‍රතිසංස්කරණය කිරීම. කොන්ත්‍රාත්කරු - V K කන්ස්ට්‍රක්ෂන් කොන්ත්‍රාත් මුදල - රු. 4,908,381.50 කොන්ත්‍රාත්තුව ආරම්භක දිනය - 02.09.2020 කොන්ත්‍රාත් කාලය - දින 91 වත්මන් තත්ත්වය - 100% - අවසන් කර ඇත විශේෂ සටහන් - කොරොනා වසංගතයෙන් බලපෑමට ලක් විය. සම්පූර්ණ කරන විට ප්‍රකාශයේ සඳහන් වූ මුදල - රු. 3,529,581.07 – ගෙවීම් අවසන් කර ඇත.

- පින්නදූව අන්තර් හුවමාරුවේ හි STF සහ පොලිස් නවාතැන් ගොඩනැගිලි ප්‍රතිසංස්කරණය කිරීම. කොන්ත්‍රාත්කරු - ශාන්ත කන්ස්ට්‍රක්ෂන් කොන්ත්‍රාත් මුදල - රු. 2,060,792.58 කොන්ත්‍රාත්තුව ආරම්භක දිනය - 18.08.2020 කොන්ත්‍රාත් කාලය - දින 91 වත්මන් තත්ත්වය - 100% - අවසන් කර ඇත විශේෂ සටහන් - කොරොනා වසංගතයෙන් බලපෑමට ලක් විය. සම්පූර්ණ කරන විට ප්‍රකාශයේ සඳහන් වූ මුදල - රු. 1,742,727.49 – ගෙවීම් අවසන් කර ඇත.

11. දේපළ කළමනාකරණය සහ ආදායම් එකතු කිරීම

මාර්ග සංවර්ධන අධිකාරියට තමන්ගේම සම්පත් වලින් ආදායමක් උපයා ගැනීමේ අරමුණින් දේපළ කළමනාකරණ හා ආදායම් අංශය (PM&R) 2004 අගෝස්තු මාසයේදී මාර්ග සංවර්ධන අධිකාරියෙ හි පිහිටුවන ලදී. මෙම ආදායම, ජාතික මහාමාර්ග ජාලය නඩත්තු කිරීම සහ වැඩිදියුණු කිරීම සඳහා මාර්ග සංවර්ධන අධිකාරියට භාණ්ඩාගාරයෙන් වාර්ෂිකව ලැබෙන අරමුදල්වලට අතිරේක වේ.

වත්කම් කළමනාකරණ හා ආදායම් අංශය විසින් ප්‍රචාරණ පුවරු, දැන්වීම් පුවරු, මාර්ග තොරණ්, කැන්ටි ලිවර් පුවරු, දුරකථන කුටි, බස් ආවරණ, ලොතරැයි කුටි, වටරවුම්, රූපවාහිනී රැහැන් කණු, රැහැන් ඇතිරීම ආදිය සඳහා කුලී අය කිරීමෙන් මාර්ග සංවර්ධන අධිකාරිය සඳහා ආදායම් උපයනු ලබයි. අනාගතයේදී වැඩි ආදායමක් උපයා ගැනීම සඳහා මාර්ග සංවර්ධන අධිකාරියේ ඉඩම් සහ ගොඩනැගිලි තවදුරටත් සංවර්ධනය කිරීම ඥානාන්විත වේ. මාර්ග වෙන්කිරීම් භාවිතා කරන උපයෝගිතා සේවා සපයන්නන් (SLT, NWSDB සහ CEB) වෙතින් කුලී අයකර ගැනීමේ හැකියාව සොයා ගැනීමට පියවර ගෙන තිබේ. වාණිජමය අරමුණු සඳහා සුදුසු ස්ථානවල ගොඩනැගිලි, සාප්පු ඉදිකිරීම, වාහන නැවැත්වීම ආදිය සඳහා ඉඩම් බදු දීමද සිදු කරයි.

දේපල කළමනාකරණය සහ ආදායම් අංශය විසින් මාර්ග මධ්‍ය දූපත්, වටරවුම සහ වැදගත් ස්ථානවල පිහිටි මාර්ග වෙන්කිරීම් වල මාර්ග අලංකරණ කටයුතු මාර්ග සංවර්ධන අධිකාරියේ සෘජු ශ්‍රමය භාවිතා කරමින් සහ නිෂ්පාදන ප්‍රචාරණය සඳහා උනන්දුවක් දක්වන පුද්ගලික පාර්ශවයන්ගෙන් ලබාගත් අනුග්‍රහයෙන් මෙහෙයවනු ලබයි. 2015 ජනවාරි මස සිට දේපල කළමනාකරණය සහ ආදායම් අංශය "වනරෝපා" රුක් රෝපණ වැඩසටහන යටතේ අනෙකුත් ආයතන සමඟ එක්ව මාර්ග දෙපස ගස් සිටුවීම සම්බන්ධීකරණය කරයි. එසේම මාර්ග සංවර්ධන අධිකාරිය, ග්‍රාමීය මාර්ග සහ අනෙකුත් යටිතල පහසුකම් රාජ්‍ය අමාත්‍යාංශය විසින් මෙහෙයවනු ලබන “මග දෙපස තුරු සෙවණ- සුරකුමට පරිසරය” රුක් රෝපණ ව්‍යාපෘතියට සම්බන්ධ විය.

අංශයේ කාර්යයන් සහ වගකීම්

- මාර්ග සංවර්ධන අධිකාරියේ කළමනාකාරිත්වයේ අනුමැතිය සඳහා ප්‍රචාරණ පුවරු, දැන්වීම් පුවරු, මාර්ග තොරණ්, කැන්ටි ලිවර් පුවරු/ දුරකථන කුටි / බස් නැවතුම් පොළවල් සහ දිශා පුවරු ඉදිකිරීම සහ නඩත්තු කිරීම සඳහා පුද්ගලික පාර්ශ්වයන්ගෙන් අය කළ යුතු විවිධ කුලී / ගාස්තු පිළිබඳ ප්‍රතිපත්ති, ක්‍රියා පටිපාටි සැකසීම සහ ගාස්තු යෝජනා කිරීම.
- මාර්ග සංවර්ධන අධිකාරියෙන් අනුමත කරවා ගැනීම සඳහා ප්‍රචාරණ පුවරු, දැන්වීම් පුවරු, මාර්ග තොරණ්, කැන්ටි ලිවර් පුවරු/ දුරකථන කුටි /ෆයිබර් ඔප්ටිකල් කේබල් සහ රූපවාහිනී කණු / බස් නැවතුම් පොළවල් සහ දිශා පුවරු සවි කිරීම සහ නඩත්තු කිරීම සඳහා බලපත්‍ර නිකුත් කිරීමේදී මාර්ග සංවර්ධන අධිකාරියේ හි පළාත් කාර්ය මණ්ඩලයට අධීක්ෂණය සහ සහාය වීම.
- ජාතික මහාමාර්ගවල මාර්ග සංවර්ධන අධිකාරියේ වෙන්කිරීම්/ ඉඩම්වල මාර්ග දෙපස විවේක ස්ථාන සංවර්ධනය කිරීම ප්‍රවර්ධනය කිරීම.
- උමං මාර්ග/ගුවන් මාර්ගවල ඉදිකරන ලද සාප්පු ඒකක සහ අනෙකුත් පහසුකම් කුලියට දීම.
- ඉදිරි ආදායම් උත්පාදනය සඳහා වෙනත් සුදුසු පියවරයන් ගවේෂණය කිරීම.
- වටරවුම් සහ මධ්‍ය දූපත් නඩත්තු කිරීම සඳහා අනුමැතිය ලබා දීම සහ 2011 වසරේ සිට මාර්ග අලංකරණ කටයුතු සඳහා විදේශීය ශාක අවශ්‍යතා සැපයීම සඳහා පැල තවාන් පිහිටුවීම.
- "මග දෙපස තුරු සෙවණ- සුරකුමට පරිසරය" වසර හතරක් පුරාවට ගස් මිලියන 2ක් රෝපනය කරමින් මාර්ග දෙපස සෙවණ කිරීමට රුක් රෝපණ වැඩසටහන දිවයින පුරා ක්‍රියාත්මක කිරීම.
- දිවයින වටා ඇති මූල බෝල තවාන (root ball nursery) නඩත්තු කිරීම.
- මාර්ග වෙන් කිරීම් තුළ, මාර්ගය පුළුල් කිරීම සඳහා අවශ්‍ය ඉඩම්වල ඇති අතහැර දැමූ සහ භාවිතයට නොගත් සහ හිස් ඉඩම් කොටස් ලෙස ඉතිරිව ඇති ඉඩම් කොටස් (වාහනවලට/රථවාහනයට/පදිකයින්ට බාධාවක් නොවන පරිදි) නාගරික සංවර්ධන අධිකාරිය සමඟ සහයෝගයෙන් ආදායම් උත්පාදනය සඳහා තෝරා ගනු ලැබේ.
- තවද දේශීය වෛද්‍ය රාජ්‍ය අමාත්‍යාංශය, ග්‍රාමීය හා ආයුර්වේද රෝහල් සංවර්ධන සහ ප්‍රජා සෞඛ්‍ය ප්‍රවර්ධන අමාත්‍යාංශය සමඟ සහයෝගයෙන් හිස් ඉඩම් තෝරාගෙන ආදායම් උත්පාදනය සඳහා යොදා ගත හැකිය.
- සමස්ත දිවයිනේ විධායක ඉංජිනේරු කොට්ඨාශවල ඇති ඉඩම් හා මාර්ග වෙන් කිරීම් හඳුනා ගැනීම සහ පහත සඳහන් යෝජනා ක්‍රියාත්මක කිරීමෙන් සහ අධීක්ෂණය කිරීමෙන් ඒවා අනවසර පුද්ගලයින්ගෙන් සුරක්ෂිත කිරීම.

නැරඹුම් ස්ථාන	විවේක කුටි
වෙළඳ කුටි	රුක් රෝපණය
රථ ගාල්	සංචාරක බංගලා
විවේක උද්‍යාන	ඖෂධීය ශාක රෝපණය

2021 වර්ෂය තුළ දේපල කළමනාකරණ හා ආදායම් අංශයේ කාර්ය සාධනය

(i) දැන්වීම් පුවරු/ප්‍රචාරණ පුවරු/මාර්ග තොරණ් පුවරු/කැන්ටිලිවර් පුවරු සඳහා බලපත්‍ර නිකුත් කිරීම

දැන්වීම් පුවරු/ප්‍රචාරණ පුවරු/කැන්ටිලිවර් පුවරු/ බැනර/ බස් නැවතුම් සහ මාර්ග දෙපස වෙනත් වෙළඳ දැන්වීම් උපකරණ / උපාංග සඳහා බලපත්‍ර නිකුත් කිරීම 2021 වර්ෂය තුළ අඛණ්ඩව සිදු කරන ලදී. මාර්ග සංවර්ධන අධිකාරියේ මාර්ගෝපදේශයන්ට අනුව එම අනුමැතීන් ලබා දෙන අතරම අනුමත පුවරු / බැනර් පිළිබඳ විස්තර අදාළ විධායක ඉංජිනේරුවන් / ප්‍රධාන ඉංජිනේරුවන් සහ අනෙකුත් අදාළ අංශ ප්‍රධානීන් වෙත යවා ඇත. මීට අමතරව, වරින් වර විවිධ අනුමත කිරීම්වල සාරාංශය අදාළ බලධාරීන් වෙත යවනු ලැබේ.

වගුව 41 : වර්ෂය සඳහා ප්‍රදානය කරන ලද අනුමත කිරීම් / අලුත් කිරීම් පිළිබඳ විස්තර

සේවයේ ස්වභාවය	2020 වර්ෂය තුළ එකතුව		
	නව අනුමැතීන්	අළුත් කිරීම්	සමස්ත අනුමතින් ගණන
බැනර	1,809	-	1,809
ප්‍රචාරණ පුවරු	326	901	1,227
ප්‍රචාරණ පුවරු (නොමිලේ)	14	-	14
ප්‍රචාරණ පුවරු (තාවකාලික)	22	-	22
මාර්ග තොරණ්/ කැන්ටිලිවර්	28	11	39
බස් නැවතුම්	47	64	111
ලොතරැයි කුටි	14	40	54
වටරවුම් සහ මාධ්‍ය දූපත්	8	11	19
වෙළඳ කුටි	22	-	22
දෘශ්‍ය තන්තු රැහැන් කණු	9,178	80,204	89,382
බහුකාර්ය ලාම්පු කණු	9	4	13
කානු කැපීම්	-	254	254
කුඩා කුටි	-	3	3
ඉඩම්	1	-	1
එකතුව	**11,478**	**81,492**	**92,970**

2020 වර්ෂයේ ආදායම් රැස් කිරීම

2021 වර්ෂය තුළ මාර්ග සවර්ධන අධිකාරියේ හි දේපල කළමනාකරණය කිරීමෙන් විවිධ මූලාශ්‍රවලින් දේපල කළමනාකරණ හා ආදායම් අංශය විසින් උපයාගත් මුළු ආදායම පහත වගුවේ දක්වා ඇති පරිදි රු.382,210,897.77 කි.

වගුව 42 : 2019-2021 කාල සීමාව තුළ දේපල කළමනාකරණ හා ආදායම් අංශයේ ආදායම් වර්ගීකරණය කිරීම

අයිතමයේ විස්තරය	2019 (රු.)	2020 (රු.)	2021 (රු.)
බැනර	4,021,521.35	636,246.30	1,793,361.11
වෙළඳ දැන්වීම් පුවරු	93,253,640.16	63,566,437.86	59,051,125.84
බස් නැවතුම්	7,655,265.68	2,635,540.24	3,875,393.16
මාර්ග තොරණ් / කැන්ටි ලිවර්	34,356,584.11	18,004,294.41	35,603,865.00
වෙළඳ හා ලොතරැයි කුටි	911,975.53	677,296.06	930,747.22
වටරවුම්, රථවාහන දූපත් නඩත්තුව හා අලංකරණය	1,055,439.28	939,777.61	793,830.29
දෘෂ්‍ය තන්තු කණු /රූපවාහිනී රැහැන් ජාල සහ	129,622,916.87	141,684,404.09	130,668,258.35
කානු කැනීම්	44,570,589.33	62,892,054.68	28,418,643.48
ඉඩම්		2,768,000.00	2,335,952.00
බහු ලාම්පු පොලු	-	1,549,800.00	965,484.00
ගුවන් පාලම් (ටෙන්ඩර් ගාස්තු)	751,734.69	2,099,966.08	-
බෝක්කු	89,339.98	90,446.24	330,263.65
බොරැල්ල උමං මාර්ගය	3,458,017.07	3,659,101.62	2,571,513.83
විවේක උද්‍යාන	30,078.57	28,712.18	143,026.96
නුවරඑලිය උත්සම සාමය තුළ වෙළඳ කුටි	-	-	
බෙන්තොට සාප්පු සංකීර්ණය	-	-	
ක්‍රිස්ටිනා පැල අලෙවිය	-	-	121,340.00
ලැබිය යුතු මුදල	93,627,257.17	52,016,871.29	114,608,092.88
එකතුව	**413,404,359.79**	**353,248,948.66**	**382,210,897.77**

වෙළඳ දැන්වීම් පුවරු, බැනර හා මාර්ග වෙන්කිරීම් සඳහා වන නාම පුවරු ආදිය ප්‍රදර්ශනය කිරීම සඳහා පරිසර බලධාරීන් විසින් පනවා ඇති ඇතැම් සීමාවන් මේ ආකාරයේ ආදායම් උත්පාදනයට අහිතකර ලෙස බලපා ඇත. බොරැල්ල සාප්පු සංකීර්ණය සඳහා කල්බදු ගිවිසුම් අළුත් කර ඇති අතර, බදු ගෙවීම පැහැර හරින ලද වෙළඳසැල් අංක 01 සහ 02 හි අයිතිකරුවන්ට එරෙහිව නීතිමය පියවර ගෙන තිබේ.

(ii) මාර්ග අලංකරණ කටයුතු

මෙම ව්‍යාපෘතියේ ඉලක්කය වන්නේ, වැදගත් ස්ථානයන්හි පිහිටා ඇති මධ්‍ය දූපත්, වටරවුම් හා මාර්ග රක්ෂිතයන් ගැන උනන්දුවක් දක්වන අනුග්‍රාහකයන් මාර්ගයෙන් අලංකරණය කිරීම හා නඩත්තු කිරීමයි. මෙමඟින්, අනුග්‍රාහකයන්ට ඔවුන්ගේ කුඩා ප්‍රමාණයේ දැන්වීම්, මාර්ග සංවර්ධන අධිකාරියේ අනුමත ගාස්තු අනුපාතයන්ට අනුව ප්‍රදර්ශනය කිරීම සඳහා අවස්ථාව ලබා දීමෙන්, මාර්ග සංවර්ධන අධිකාරියට ආදායම් ඉපැයිය හැකි මූලාශ්‍රයක් වශයෙන් හඳුනාගෙන ඇත. මෙම ගාස්තු අනුපාතයන් හා රෙගුලාසි, අනුග්‍රාහකයන් අලංකරණ කටයුතුවලට ආකර්ෂණය කර ගැනීම සඳහා වරින් වර සංශෝධනය කරන ලදී. මීට අමතරව, වටරවුම්, මධ්‍ය දූපත්, අලංකරණ හා නඩත්තු කිරීම, වත්කම් කළමනාකරණය හා ආදායම් අංශය විසින් සිදු කරන අතර, එය 'වනරෝපා' වැඩසටහන යටතේ, දේවි බාලිකා විද්‍යාලයේ සිට ආයුර්වේද මංසන්ධිය, කොටා පාර හා කට්ටිය හංදියේ සිට පරණ කැස්බෑව මාර්ගයේ නුගේගොඩ දුම්රිය ගේට්ටුව දක්වා, ජපන් මිත්‍රත්ව පාර, බත්තරමුල්ල සිට පන්නිපිටිය මාර්ගය දක්වා පාර්ලිමේන්තු ප්‍රවේශ මාර්ග (සුනිල් මාවත) හමුදා මූලස්ථාන ප්‍රවේශ මාර්ගයේ මල් පැල සිටුවීම සිදු කරන ලදී.

(iii) "මග දෙපස තුරු සෙවණ- සුරකුමට පරිසරය" වැඩසටහන යටතේ ජාතික මහාමාර්ග දෙපස මීලියන දෙකක සෙවණ සහිත රුක් රෝපණ වැඩසටහන

තල්දූව - මීවිටිගම්මන පාර (පැල 1000)

මෙම ව්‍යාපෘතියට අනුව වගා කරන ලද වගාවට කොම්පෝස්ට් පොහොර යෙදීම, වල් නෙලීම, තණකොළ කැපීම සහ ජලය දැමීම ආදිය සිදු කිරීමට අවශ්‍ය කටයුතු යොදා ඇත. 2021 වර්ෂය තුළ මෙම ව්‍යාපෘතිය යටතේ දිවයිනේ සියලුම පළාත්වල, අධිවේගී මාර්ගවල සහ රාජ්‍ය ආයතනවල සම්පූර්ණයෙන් ශාක 68,000ක් රෝපණය කර ඇත.

නිදහස් දින රුක් රෝපණ වැඩසටහනට සමගාමීව 2021 පෙබරවාරි 04 වන දින කෝට්ටේ - බෝපේ මාර්ගයේ දී රුක් රෝපණ වැඩසටහනක් පැවැත්වුණු අතර, එහිදී මී පැල 22, කරඳ පැල 23 සහ කුඹුක් පැල 07ක් රෝපණය කරන ලදී.





මාර්ග සංවර්ධන අධිකාරිය, රාජ්‍ය අමාත්‍යාංශය විසින් පවත්වනු ලැබූ අලුත් අවුරුදු නැකත් වෙනුවෙන් රුක් රෝපණ වැඩසටහන 2021.04.16 දින (රාගම) රාගම නගරයේ දී පැවැත්විණි. මේ සඳහා පහත සඳහන් පැල ලබා දෙන ලදී.

මී	- 58	මාදං	- 50	කුඹුක්	- 50
කරඳ	- 33	දවල්කුරුඳු	- 02	ඇත්දෙමට	- 02
බුළු	- 07	මූණමල්	- 03	කොබෝනීල	- 15

මැරයින් ඩ්‍රයිව් ඔස්සේ කොල්ලුපිටිය සිට ගාලුමුවදොර සහ දෙහිවල

කොල්ලුපිටියේ සිට ගාලු මුවදොර දක්වා සහ මැරීන් ඩ්‍රයිව් ඔස්සේ දෙහිවල දක්වා මුදිල්ල පැල අංක 150ක් සිටුවා, බාහිර ආයතනවල අනුග්‍රහය ලබාගෙන ඒවා වටා රාමු සවි කර ඇත.





රූට් බෝල් තාක්ෂණයෙන් යුත් පැල තවාන

තල්දූව - මීවිටිගම්මන මාර්ගයේ මී, කුඹුක්, කරඳ අඩංගු ගස් 200ක් සිටුවා නඩත්තු කරන අතර ඩෙන්සිල් කොබෙකඩුව මාවතේ වල් ඇහැල පැල 22ක් මුල් බෝල තාක්ෂණය යොදා ගනිමින් සිටුවා ඇත.





(iv) මාර්ග අලංකරණ කටයුතු සඳහා පැල තවාන

දේපල කළමනාකරණ සහ ආදායම් අංශය මගින් සිදු කරනු ලබන අලංකරණ කටයුතු සඳහා වන පැල අවශ්‍යතා සපුරාලීම සඳහා මාර්ග සංවර්ධන අධිකාරියට අයත් හෝමාගම ඩිපෝවේ සහ ගලගෙදර ඩිපෝවේ මල් පැල තවානක් ස්ථාපිත කර ඇත. 2021 වසර අවසන් වන විට විදේශීය ශාක සහ අනෙකුත් ගස් පැල 4361ක් (නා, නදුන්, පිහිබිය, ගොරකා, කටු අත්ත, මාදන්, කොහොඹ, ලී ඇපල්, අඹ, පේර, ඇඹරැල්ල, දෙළුම්, කරඳ, ගම්මාළු, රබුටන්, සියඹලා) රාජ්‍ය දැව සංස්ථාවෙන් සහ කෘෂිකර්ම දෙපාර්තමේන්තුවෙන් ලැබී ඇත. මෙම පැල මාර්ග සංවර්ධන අධිකාරියේ විධායක ඉංජිනේරු කාර්යාල සහ අධිවේගී මාර්ග වෙත නිකුත් කරන ලදී.

රාජ්‍ය දැව සංස්ථාවෙන් පැල 342ක් ලැබී ඇති අතර, එහි නා පැල 200ක් ද, හෝමාගම පැල තවානෙන් එවන ලද දිවුල් පැල 142ක්ද විය.

කොබෝනීල පැල 100 ක්, කොහොඹ පැල 300 ක්, කුඹුක් පැල 400 ක්, කරඳ පැල 700 ක්, මී අංක පැල1300 ක්, තිඹිරි පැල 37 ක්, ඇහැල පැ 100 ක් සහ මයිල පැල 63 ක් ඇතුළත් මුළු පැල

3000 ක් ද මෙහෙයුම් නඩත්තු සහ කළමනාකරණ ඒකකය විසින් මීපේ-ගලගෙදර පැල තවාන වෙත ලබා දී ඇත.

පරිසර හා වනජීවී සම්පත් අමාත්‍යාංශයෙන් උණ පැල 2000ක් ලබාගෙන කඩුවෙල අධිවේගී මාර්ග මෙහෙයුම් නඩත්තු හා කළමනාකරණ ඒකකයට නිකුත් කර ඇත.

2021 වසරේ තල්දූව - මීවිටිගම්මන මාර්ගයේ මී පැල 43ක් , කරද පැල 07, කුඹුක් පැල 25 සහ කෝට්ටේ - බෝපේ මාර්ගයේ කරඳ පැල 31 , මී පැල 14, කුඹුක් පැල 07 සහ පාර්ලිමේන්තු පිවිසුම් මාර්ගයේ කොබෝනීල පැල 10 ක් ද සිටුවා ඇත. මගනැගුම මහමැදුරට පැල 15ක් නිකුත් කර ඇත.
බස්නාහිර පළාත් අධ්‍යක්ෂ කාර්යාලය සඳහා පහත පැල නිකුත් කරන ලදී.

කුඹුක්	02	මී	02	මැංගුස්	01
කරඳ	08	කොහොඹ	02	දෙළුම්	01
කොබොනීල	03	අඹ	02	කොළ දොඩම්	02
මාදං	02	කාමරංගා	02		

නව කැලණි පාලම පාර අසල සිටුවීමට ගම්පහ විධායක ඉංජිනේරු කාර්යාලයට ක්‍රිස්ටීන් පැල 100ක් නිකුත් කර ඇති අතර විකුණුම් මධ්‍යස්ථානය ලෙස ගලගෙදර තවාන භාවිත විය. ක්‍රිස්ටිනා පැල 221ක් අලෙවි කර 2021 තුළ රු.133,740.00ක් උපයා ඇත.
තවද, දේපල කළමනාකරණ සහ ආදායම් අංශය විසින් බොරැල්ල කොටා මාර්ගයේ -මාධ්‍ය උද්‍යාන, නුගේගොඩ පරණ කැස්බෑව මාර්ගය, බත්තරමුල්ල-පන්නිපිටිය මාර්ගය, පාර්ලිමේන්තු ප්‍රවේශ මාර්ගය (සුනිල් මාවත), ජපාන මිත්‍රත්ව මාර්ගය දෙපස, බත්තරමුල්ල යුධ හමුදා මූලස්ථාන ප්‍රවේශ මාර්ගයෙහි මාර්ග දෙපස, මගනැගුම මහ මැදුර වාහන නැවතුම්පල සහ බත්තරමුල්ල ඇතුල් වටරවුම අලංකරණ කටයුතු යටතේ භූමි අලංකරණ කටයුතු පවත්වාගෙන යයි.

දේපල කළමනාකරණ සහ ආදායම් අංශය විසින් මාර්ග සංවර්ධන අධිකාරිය සඳහා ආදායම් උත්පාදනය මත වැඩි ආදායමක් ලබා දීමට, ඉදිරි වසරවලදී එහි ක්‍රියාකාරකම් පුළුල් කිරීමට සැලසුම් කරයි.

12. යාන්ත්‍රික සේවා

යාන්ත්‍රික අංශය, මාර්ග ඉදිකිරීම, නඩත්තුව හා වැඩි දියුණු කිරීමේ කටයුතු සඳහා පවත්නා සම්පත් භාවිතා කර වාහන, ඉදිකිරීම් යන්ත්‍ර හා උපකරණ, නිෂ්පාදන යන්ත්‍රාගාර සැපයීමේ වගකීම උසුලයි. තවද, යාපනය අර්ධ ද්වීපයේ දුපත් අතර, මගී හා භාණ්ඩ ප්‍රවාහනය සඳහා මගී යාත්‍රා හා පාරු සැපයීම සිදු කරනු ලබයි.

යාන්ත්‍රික අංශය ප්‍රධාන කාර්යාලයේ අධ්‍යක්ෂ කාර්යාලය, ප්‍රවාහන අංශය හා සහ අහුලාන, උඩුකාව සහ අනුරාධපුර නඩත්තු වැඩපල වලින් සමන්විතය. අධ්‍යක්ෂ යාන්ත්‍රික හට අතිරේක අධ්‍යක්ෂවරයෙකු සහ යාන්ත්‍රික ඉංජිනේරුවන් සහ අනෙකුත් සහායක කාර්ය මණ්ඩලයේ සහාය ලැබේ. තවද යාන්ත්‍රික අංශය මාර්ග සංවර්ධන අධිකාරියට අයත් වාහන, යන්ත්‍ර හා රටේ විවිධ ස්ථාවල පිහිටා ඇති අස්පෝල්ට් පෙරමුසු යන්ත්‍රාගාර, ගල් ඇඹරුම් යන්ත්‍රාගාර හා තාර පිරිපහදු යන්ත්‍රාගාර නඩත්තු කිරීම ඉහත සඳහන් වැඩපල පහසුකම් භාවිතා කරමින් සිදු කරනු ලබයි.

යාන්ත්‍රික අංශය විසින් අහුලාන, උඩුකාව හා අනුරාධපුර පිහිටි වැඩපළවල් පාලනය කෙරේ. යාන්ත්‍රික අංශය, අධිවේගී මාර්ග මෙහෙයුම් නඩත්තු හා කලමනාකරණ අංශය හා ග්‍රාමීය පාලම් පුනරුත්ථාපන වැඩපල වෙත ප්‍රධාන වාහන හා යන්ත්‍ර අලුත්වැඩියාව සඳහා අවශ්‍ය සහාය හා උපදෙස් සපයනු ලබයි. තවද, යාපනය අර්ධ ද්වීපයේ පාරු සේවය මෙහෙය වීම සඳහා ශ්‍රී ලංකා නාවික හමුදාවේ සහාය ලබා ගනිමි.

යාන්ත්‍රික අංශයේ මූලික කාර්යයන් පහත පරිදි වේ;

- මාර්ග සංවර්ධන අධිකාරියට අයත් ඉදිකිරීම් යන්ත්‍රෝපකරණ, උපකරණ සහ වාහන සමූහයේ මෙහෙයුම් හා අධීක්ෂණය, නඩත්තුව සහ කළමනාකරණය, මාර්ග සංවර්ධන අධිකාරියට අයත් කර්මාන්තශාලා සහ පළාත්බද මාර්ග සංවර්ධන අධිකාරිය, ජාතික උපකරණ හා යන්ත්‍රෝපකරණ ආයතනය සහ මහනැගුම සමාගම් වැනි රාජ්‍ය ආයතන පහසුකම් සහ පෞද්ගලික ආයතනවල පහසුකම් යටතේ සිදු කිරීම.
- යන්ත්‍රෝපකරණ, උපකරණ සහ වාහන ප්‍රසම්පාදනය කිරීමේ ක්‍රියාකාරකම්.
- යන්ත්‍රෝපකරණ, උපකරණ සහ වාහන ප්‍රසම්පාදනය සඳහා පිරිවිතර සකස් කිරීමේදී ව්‍යාපෘති කළමනාකරණ ඒකක සහ අධිවේගී මාර්ග මෙහෙයුම් සහ නඩත්තු සහ කළමනාකරණ අංශයට සහාය වීම.
- පවත්නා යන්ත්‍රෝපකරණ, උපකරණ සහ වාහන සහ තොටුපළවල් සඳහා අවශ්‍ය අමතර කොටස් මිලදී ගැනීමේ ක්‍රියාවලිය
- මාර්ග ඉදිකිරීම සහ නඩත්තු කටයුතු සඳහා සම්පූර්ණ යන්ත්‍රෝපකරණ සඳහා වන බඳවා ගැනීම් කළමනාකරණය සහ නඩත්තු කිරීම සහ පිරිවැය සහ ඉන්ධන පරිභෝජන ආදිය සඳහා භාවිතා කිරීම සහ අළුත්වැඩියා කිරීම සම්බන්ධයෙන් පරිගණක ගත දත්ත පද්ධතිය නඩත්තු කිරීම.
- බඳවා ගැනීම කළමනාකරණය: අවශ්‍ය විටෙක යන්ත්‍රෝපකරණ හා උපකරණ, වාහන සහ සේවාවන් බාහිරින් ලබා ගැනීම සහ අදාළ ක්‍රියාකාරකම් කළමනාකරණය කිරීම (පිරිවැය සහ ගෙවීම් සඳහා අදාළ වාර්තා පවත්වා ගැනීම)
- මාර්ග සංවර්ධන අධිකාරිය සතු වාහන සමූහය සඳහා ආදායම් බලපත්‍රය සහ රක්ෂණ ආවරණයක් ලබා ගැනීම සහ යම් අනතුරක් සිදුවුවහොත් පසු විපරම් කිරීම.
- සමීක්ෂණ පැවැත්වීමෙන් පසු ලාභදායී නොවන වාහන සහ යන්ත්‍ර සූත්‍ර බැහැර කිරීම.
- මාර්ග සමඟ සම්බන්ධයක් නොමැති කලපු හරහා තොටුපල සේවාව සඳහා තොටුපළ පහසුකම් සැපයීම. මේ වන විට, යාපනය දිස්ත්‍රික්කයේ කයිට්ස්-කරෙයිනගර් සහ කුරිකට්ටුවාන් -නයිනාතිව් හි තොටුපල සේවා සහ කුරිකට්ටුවන්-ඩෙල්ෆ් අතර මගී යාත්‍රා සේවා දෙකක් පළාත් කාර්යාල හරහා ක්‍රියාත්මක වේ.
- යාන්ත්‍රික නිලධාරීන් පුහුණු කිරීම.
- ප්‍රවාහන අංශ හරහා ප්‍රවාහන පහසුකම් සැපයීම හා අදාළ කටයුතු කළමනාකරණය කිරීම.

- වාහන නඩත්තු කිරීම සහ රක්ෂණ ආවරණ ආදිය ලබා ගැනීම සඳහා මහාමාර්ග අමාත්‍යාංශය, ග්‍රාමීය මාර්ග සහ අනෙකුත් යටිතල පහසුකම් සහ ව්‍යාපෘති කළමනාකරණ ඒකක සඳහා සහය වීම.
- වත්කම් හා තක්සේරු වාර්තා යාවත්කාලීන කිරීම සඳහා මූල්‍ය අංශයට සහාය වීම.

2021 සඳහා ක්‍රියාකාරකම් වැඩසටහන

i. වාර්ෂික අයවැයෙන් පහත සඳහන් යන්ත්‍රෝපකරණ හා උපකරණ මිලදී ගැනීම් යෝජනා කරන ලදී.

- තල්ලු කළ හැකි කම්පන රෝලර් - 43
- බෑමරය සහිත රෝද ට්‍රැක්ටර - 07
- භාණ්ඩ ප්‍රවාහන ට්‍රක් රථ (බර) - 1
- ප්ලේට් කොම්පැක්ටර්ස් - 53
- ස්කීඩ් ස්ටියර් ලෝඩර්ස් - 05
- ෆෝක්ලිෆ්ට් ට්‍රක් - 1
- කර්මාන්තශාලා උපකරණ - තොගයක්
- මගී තොටුපළ (බාර්ජ් වර්ගය) - 1

ii. අවශ්‍යතා මත වාහන හා යන්ත්‍රෝපකරණ කුලියට ගැනීම.

iii. 2022 ජනවාරි 26 වන දින සිට ආරම්භ වන වසරක කාලයක් සඳහා මාර්ග සංවර්ධන අධිකාරියේ වාහන සඳහා රක්ෂණ සපයන්නා තෝරා ගැනීම සහ රක්ෂණ ආවරණ සහ අදාළ ක්‍රියාකාරකම් ක්‍රියාත්මක කිරීම සඳහා ලංසු කැඳවීම.

iv. කර්මාන්තශාලා සඳහා ආරක්ෂක සේවා සැපයුම්කරුවන් තෝරා ගැනීම සඳහා ලංසු කැඳවීම.

v. බැහැර කිරීම සඳහා වත්කම් සමීක්ෂණය (වාහන, යන්ත්‍රෝපකරණ සහ උපකරණ).

vi. අභුලාන කර්මාන්ත ශාලාවේ ප්‍රධාන ගොඩනැගිල්ල ප්‍රතිසංස්කරණය කිරීම.

vii. අභුලාන සේවා ස්ථානය වැඩිදියුණු කිරීම සහ තත්ත්වයෙන් උසස් කිරීම.

viii. අනුරාධපුර කර්මාන්තශාලාව ප්‍රතිසංස්කරණය කිරීම.

ix. මෙහෙයුම් නැවත ආරම්භ කිරීම සඳහා උඩුකාව කර්මාන්තශාලාව ප්‍රතිසංස්කරණය කිරීම.

2021 වර්ෂය තුළ ප්‍රගතිය සහ ක්‍රියාකාරිත්වය

i. මූල්‍ය ගැටළු හේතුවෙන්, සැලසුම් කළ පරිදි ප්‍රාග්ධන වත්කම් කිසිවක් සපයා ගත්තේ නැත.

ii. උඩුකාව වැඩමුළුව ක්‍රියාත්මක කිරීම නැවත ආරම්භ කරන ලදී.

iii. එක් ඒක ව්‍යාපෘති මගින් පහත සඳහන් වාහන මාර්ග සංවර්ධන අධිකාරිය වෙත භාර දෙන ලද අතර ඒවා තෝරාගත් විවිධ අංශ හා වෙනත් සඳහා බෙදා හරින ලදී.

- මෝටර් කාර් - 10
- SUV (ජීප් රථ) - 10
- ඩබල් කැබ් පිකප් රථ - 61
- වෑන් - 10
- යතුරු පැදි - 62

iv. මාර්ග සංවර්ධන අධිකාරිය විසින් මහනැගුම මාර්ග ඉදිකිරීම් උපකරණ (පුද්) සමාගම වෙත මුදා හරින ලද වාහන, යන්ත්‍රාගාර හා යන්ත්‍ර සඳහා ඉන්වොයිසි වටිනාකම රු. 27,527,360.32 දක්වා ඉහළ නංවනු ලැබිය.

v. මාර්ග සංවර්ධන අධිකාරිය විසින් මහනැගුම උපදේශන ව්‍යාපෘති කළමනාකරණ සේවා සමාගම වෙත මුදා හරින ලද වාහන, යන්ත්‍රාගාර හා යන්ත්‍ර සඳහා ඉන්වොයිසි වටිනාකම රු. 2,177,275.36 දක්වා ඉහළ නංවනු ලැබිය.

vi. මාර්ග සංවර්ධන අධිකාරිය විසින් වෙනත් ආයතන වෙත මුදා හරින ලද වාහන, යන්ත්‍රාගාර හා යන්ත්‍ර සඳහා ඉන්වොයිසි වටිනාකම රු. 9,301,895.10 දක්වා ඉහළ නංවනු ලැබිය.

vii. රු.5,226,000.00 ක මුළු වියදමින් වාහන 04 ක් නවීකරණය කරන ලද අතර ඒවා විවිධ අංශ අතර බෙදා දෙන ලදී.

viii. 2021 වර්ෂය තුළ මෝටර් රථ රක්ෂණ සහ ආදායම් බලපත්‍ර, ආරක්ෂක සේවා, පිරිසිදු කිරීමේ සේවාව සහ වාහන සහ යන්ත්‍ර සූත්‍ර අළුත්වැඩියා කිරීම සඳහා වන වියදම් පහත වගුවේ දක්වා ඇත;

වගුව 43: 2021 වර්ෂය තුළ වියදම

විස්තරය	වියදම් / රු.	සේවා සපයන්නා
ආදායම් බලපත්‍ර	8,060,030.00	මෝටර් රථ ප්‍රවාහන කොමසාරිස්
මෝටර් රථ රක්ෂණය	13,118,105.37	ජාතික රක්ෂණ භාර අරමුදල (NITF)
කර්මාන්තශාලා සඳහා ආරක්ෂක සේවා	5,287,850.00	Delve Guard ආරක්ෂක සේවා
අභුලාන කර්මාන්තශාලාව සඳහා පිරිසිදු කිරීමේ සේවාව	1,431,769.00	ජයෂයින් පිරිසිදු කිරීමේ සේවා
වාහන සහ යන්ත්‍රෝපකරණ අලුත්වැඩියා කිරීම	23,432,859.57	

ix. වාහන දහනවයක් (19) බැහැර කරන ලද අතර මුළු මුදල රු. 61,313,912.82 ක ආදායමක් ලැබිණි.

x. 2021 වර්ෂය තුළ රිය අනතුරු 183ක් වාර්තා වී ඇත.

ප්‍රගතියට ඇති බාධක

- මාර්ග නඩත්තු කටයුතු සඳහා නව උපකරණ මිලදී ගැනීම සඳහා ප්‍රමාණවත් අරමුදල් වෙන් නොකිරීම නිසා අවශ්‍ය යන්ත්‍රෝපකරණ ලබා ගැනීමට නොහැකි වූ අතර අවශ්‍ය ප්‍රමිතීන්ට අනුකූලව මාර්ග නඩත්තු කිරීමේදී ප්‍රාදේශීය කාර්යාල දුෂ්කරතාවයන්ට මුහුණ දෙනු ලැබේ.
- අළුත්වැඩියාව සහ මිලදී ගැනීම් සම්බන්ධයෙන් ගෙවීම් කිරීම ප්‍රමාද වීම.
- වාහන සහ යන්ත්‍ර සූත්‍ර ඒකක 1750 කට වැඩි ප්‍රමාණයක අලුත්වැඩියා හා නඩත්තු කටයුතු සඳහා ඇති ඉල්ලුම සපුරාලීම සඳහා ප්‍රමාණවත් පහසුකම් නොමැති වීම.
- උඩිස් ගැන්ට්‍රි දොඹකරය, හයිඩ්‍රොලික් උත්කර්ෂණ යන්ත්‍රය, ගැටළු හඳුනා ගන්නා උපකරණ වැනි විශේෂිත උපකරණ ආදිය
- කර්මාන්තශාලාවේ ගබඩා කිරීමේ පහසුකම්
- කර්මාන්තශාලා ගොඩනැගිල්ලේ ඉඩ අවකාශය
- ප්‍රවාහන අංශයේ වාහනවල සුළු අලුත්වැඩියාවන් සහ විධිමත් නඩත්තු කටයුතු සිදු කිරීම සඳහා ප්‍රවාහන අංශයට එක් යාන්ත්‍රික අධිකාරීවරයෙකු අවශ්‍ය වේ.
- විධායක ඉංජිනේරු කොට්ඨාශවල තල්ලු කළ හැකි රෝලර්, තලනය සහ ප්ලේට් කොම්පැක්ටර් වැනි සැහැල්ලු යන්ත්‍රෝපකරණ ක්‍රියාත්මක කිරීම සඳහා යොදවා ඇති කම්කරුවන් නිතර වෙනස් කරනු ලබන අතර මෙය උපයෝගීතාවයට සහ අමතර අලුත්වැඩියාවන්ට මග පාදයි.

- අඟුලාන වැඩමුළුව: ප්‍රධාන වැඩමුළු ගොඩනැගිල්ලේ, විඛාදනයට ලක් වූ යකඩ ඔක්සයිඩ් අංශු පහළට ඇද වැටීම නිසා වෙළඳසැල් තට්ටුවේ සේවකයින් අවදානම් තත්ත්වයක පවතින බැවින් ප්‍රධාන වැඩමුළු ගොඩනැගිල්ල කඩිනමින් ප්‍රතිසංස්කරණය කළ යුතුය.

- අඟුලාන ප්‍රධාන කර්මාන්තශාලාවේ ගොඩනැගිල්ලේ බල මෙවලම් ක්‍රියාත්මක කිරීම සඳහා නැවත රැහැන් ඇදීම අවශ්‍ය වන අතර වායුමය මෙවලම් ක්‍රියාත්මක කිරීමට සහ පිරිසිදු කිරීමේ කටයුතු සඳහා වාතරෝධක රේඛා සවි කිරීමට අවශ්‍ය වේ.

- කර්මාන්තශාලා සඳහා ප්‍රමාණවත් පරිපාලන කාර්ය මණ්ඩලය සහ නිපුණතා සේවකයින් නොමැති වීම.

- කාර්ය මණ්ඩලය සහ වාර්තා කාමර සඳහා ඉඩ පහසුකම් සැපයීමට යාන්ත්‍රික අංශයේ ඇති ඉඩ ප්‍රමාණවත් නොවීම.

- අනුරාධපුර කර්මාන්තශාලාවට සහ උඩුකාව කර්මාන්තශාලාවට අවශ්‍ය කාර්ය මණ්ඩලය පත් කිරීමට පරිපාලන අංශයෙන් කිසිදු ක්‍රියාමාර්ගයක් ගෙන නොතිබීම නිසා අලුත්වැඩියා කටයුතුවලට පැමිණීම ප්‍රමාද වී, එම වාහන අඟුලාන කර්මාන්ත ශාලාවට යැවීමට සහ බාහිර සහාය ලබා ගැනීමට ඔවුන්ට සිදු විය.

අවහිරතා මඟහරවා ගැනීමට ගත් ක්‍රියාමාර්ග හා යෝජනා

- මාර්ග නඩත්තු කටයුතු සඳහා උපකරණ මිලදී ගැනීමට සහ කර්මාන්ත ශාලාවල පහසුකම් වැඩි දියුණු කිරීමට ප්‍රමාණවත් මුදල් වෙන් කිරීම.
- යාන්ත්‍රික අංශයට (අළුත්වැඩියා සහ නඩත්තු) අදාළ ගෙවීම් කටයුතුවල සුමට ක්‍රියාකාරිත්වය සඳහා මූල්‍ය අංශයේ ගණකාධිවරයෙකු පත් කිරීමට යෝජනා කිරීම.

- අඟුලාන කර්මාන්තශාලාව ශක්තිමත් කිරීම සඳහා පහත සඳහන් කාර්ය මණ්ඩලය පත් කිරීමට යෝජනා කිරීම.

    - යාන්ත්‍රික ඉංජිනේරු 02
    - යාන්ත්‍රික අධිකාරීවරුන් 03
    - කළමනාකරණ සහකාර 03
    - කාර්යාල සහායක 01
    - යන්ත්‍ර ශිල්පීන් 10
    - ස්වයංක්‍රිය විදුලි කාර්මික 03
    - වෙල්ඩර්වරුන් 02
    - ෆිල්ටර් කරන්නන් (Fitter) 01
    - සේවා කටයුතු සිදු කරන්නන් 06
    - උදව්කරුවන් 20 (ට්‍රක්, කර්මාන්තශාලා සහ සේවා ස්ථානය)

- අනුරාධපුර කර්මාන්තශාලාවේ ක්‍රියාකාරිත්වය ශක්තිමත් කිරීම සඳහා අවශ්‍ය කාර්ය මණ්ඩලය පත් කිරීමට කඩිනම් පියවර ගත යුතුය.
- උඩුකාව කර්මාන්තශාලාවේ මෙහෙයුම් කටයුතු ආරම්භ කිරීම සඳහා අවශ්‍ය කාර්ය මණ්ඩලය පත්කිරීමට පරිපාලන අංශය මගින් කඩිනම් පියවර ගත යුතුය.
- මෙහෙයුම් හා නඩත්තුව පිළිබඳ සැහැල්ලු උපකරණ ක්‍රියාත්මක කරන කම්කරුවන් සඳහා වරින් වර පුහුණු වැඩසටහන් සංවිධානය කිරීමට අපි යෝජනා කරමු.
- ප්‍රවාහන අංශයේ වාහන සංචිතවල සුළු අලුත්වැඩියාවන් සඳහා යාන්ත්‍රික අධිකාරීවරයෙකු පත් කිරීමට අපි යෝජනා කරමු.

- අඟුලාන සහ අනුරාධපුර කර්මාන්තශාලා ගොඩනැගිලි ප්‍රතිසංස්කරණය කර අවශ්‍ය මුදල් කඩිනමින් වෙන් කිරීම.
- කාර්ය මණ්ඩල වැඩ අවකාශය සහ වාර්තා කාමර පහසුකම් සඳහා ප්‍රධාන කාර්යාලයේ යාන්ත්‍රික අංශයට තවත් වර්ග අඩි 1000 ක ඉඩක් ලබා දීම.
- කර්මාන්තශාලාවලට පුහුණු ආධුනිකයින් සැපයීම: පුහුණුවීමේ ක්‍රියාවලිය NAITA වෙතින් සංවිධානය කළ යුතු අතර මෙය මාර්ග සංවර්ධන අධිකාරියට මෙන්ම පුහුණුවන්නන්ට ද ප්‍රයෝජනවත් වනු ඇත.
- පවතින සැහැල්ලූ වාහන ගණන සහ සේවක සංඛ්‍යාව තුළ සැහැල්ලු වාහන රියදුරන්ගේ පවතින හිඟය සලකා බලා ඒ අනුව, සේවක සංඛ්‍යාව වැඩි කිරීමට පරිපාලන අංශය කටයුතු කළ යුතුය.
- ට්‍රක් රථ කාණ්ඩයේ වාහන සඳහා බර වාහන රියදුරන්ගේ හිඟයක් පවතින අතර බර වාහන රියදුරන් කිහිප දෙනෙකු සැහැල්ලු වාහන ධාවනය කරන බව නිරීක්ෂණය වන අතර එබැවින් පරිපාලනය විසින් මෙය විධිමත් කළ යුතුය.

13. මිනිස්බල සංවර්ධනය

රටේ ප්‍රමුඛ මහාමාර්ග අධිකාරිය වශයෙන්, පවරණ ලද කාර්යයන් ක්‍රියාත්මක කිරීම සඳහා හැකියාව සහිත වඩාත් ක්‍රියාශීලි මහාමාර්ග ආයතනයක් වශයෙන් වර්ධනය වීම සඳහා ප්‍රමාණවත් පුහුණු හා තෘප්තිමත් සේවක බලකායක් සිටීම අත්‍යවශ්‍ය වේ.

පුහුණුව සංවිධානයේ ඉතා වැදගත් කාර්යයක් ලෙස සහ ආයෝජනයක් ලෙස මාර්ග සංවර්ධන අධිකාරිය සලකන අතර එය සංවර්ධනය වෙමින් පවතින තාක්ෂණික ලෝකයක අත්‍යවශ්‍ය සාධ්‍යකයකි. පුහුණු අංශයේ ප්‍රධාන පරමාර්ථය වනුයේ මාර්ග සංවර්ධන අධිකාරියේ සියලුම කාණ්ඩවල සේවකයින්ට දැනුම වැඩි දියුණු කිරීම සඳහා පුහුණු පහසුකම් සැපයීම සහ ඔවුන්ගේ කුසලතා ඉහළ නැංවීම සහ රැකියාවේ කාර්යක්ෂමතාව සහ නිපුණත්වය වැඩි දියුණු කිරීම සඳහා සුදුසු ආකල්ප වර්ධනය කිරීමයි.

පුහුණු අංශයේ කාර්යයන් සහ වගකීම්

පුහුණු අංශයේ වාර්ෂික වැඩසටහන පහත ක්‍රියාකාරකම් වලින් සමන්විත විය;

- පහත දැක්වෙන පරිදි නිතිපතා අභ්‍යන්තර පුහුණු වැඩසටහන් සංවිධානය කිරීම සහ පැවැත්වීම.
  - දේශනා
  - සම්මන්ත්‍රණ
  - භාෂා පුහුණු වැඩසටහන්
  - පරිගණක යෙදවුම්
  - ක්ෂේත්‍ර නිරීක්ෂණ
  - විභාග පැවැත්වීම (ඇගයීම්/අභ්‍යන්තර උසස් වීම්)
- මාර්ග සංවර්ධන අධිකාරියට අලුතින් බඳවා ගන්නා ලද සියලුම සේවකයින් සඳහා ප්‍රේරණ පාඨමාලා පැවැත්වීම.
- අභ්‍යන්තරව උසස් කරන ලද කාර්ය මණ්ඩලය සඳහා පුහුණුව පැවැත්වීම.
- පූර්ණ වෘත්තීය සුදුසුකම් ලබා ගැනීම සඳහා කනිෂ්ඨ ඉංජිනේරුවන් මාර්ග සංවර්ධන අධිකාරියෙ හි විවිධ සැලසුම් කාර්යාල වෙත නම් කිරීම.
- විදේශ පුහුණු වැඩසටහන් සඳහා සේවකයින් නම් කිරීම.
- වෙනත් දේශීය ආයතනවල අදාළ පුහුණු පාඨමාලා සඳහා සේවකයින් නම් කිරීම.

- දේශීය විශ්වවිද්‍යාල / ආයතනවල, ඩිප්ලෝමා / පශ්චත් උපාධි ඩිප්ලෝමා / ශාස්ත්‍රපති උපාධි වැනි දිගු කාලීන පාඨමාලා සඳහා සේවකයින් නම් කිරීම.
- වෙනත් ආයතනවල උපාධි අපේක්ෂකයින් සහ ආධුනිකයින් සඳහා පුහුණු අවස්ථා ලබා දීම.
- ලබා දිය යුතු පුහුණුවීම් සම්බන්ධයෙන් අවශ්‍ය තොරතුරු දැන ගැනීමට සමීක්ෂණ පැවැත්වීම සහ මාර්ග සංවර්ධන අධිකාරියේ සියලුම කාණ්ඩවල සේවකයින් සඳහා පුහුණු වැඩසටහන් සංවර්ධනය කිරීම.

2020 වර්ෂය තුළ පුහුණු අංශයේ කාර්යසාධනය;

i. නේවාසික පුහුණු වැඩසටහන්

2021 වර්ෂය තුළ පුහුණු අංශය විසින් සිදු කළ නේවාසික පුහුණු වැඩසටහන් පිළිබඳ කෙටි විස්තරයක් පහත දැක්වේ.

වගුව 44 : නේවාසික පුහුණු වැඩසටහන්

අංකය	පුහුණු විස්තර	කණ්ඩායම් ගණන	කණ්ඩායමකට සහභාගී වන්නන් ගණන	කණ්ඩායමකට දින ගණන
i	"කාර්ය සාධනය වැඩි දියුණු කිරීම" පිළිබඳව මාර්ග සංවර්ධන අධිකාරියේ කාර්ය මණ්ඩලය සඳහා එක් දින අධ්‍යාපනික වැඩසටහන	2	110	1
ii	පාෂාණ පිපිරවීමේ කාර්ඩොක්ස් පද්ධතිය පිළිබඳ ඉදිරිපත් කිරීම	1	20	පැය 1.5
iii	“මාර්ග සංවර්ධනය නිසා සිදුවන පාරිසරික බලපෑම”	1	90	පැය 1.5
iv	ඉංජිනේරුවන් සඳහා AutoCAD Civil 3D	1	12	5
v	සම්පූර්ණ කරන ලද / නිම කිරීමට ආසන්න ව්‍යාපෘතිවල ලබාගත් අත්දැකීම් බෙදාගැනීම (අ) මධ්‍යම අධිවේගී මාර්ගය - 02 කොටස (ආ) නව කැළණි පාලම ව්‍යාපෘතිය	1	25	1
vi	කොළඹ වරාය නගර සංවර්ධන ව්‍යාපෘතිය නිරීක්ෂණයට මාර්ග සංවර්ධන අධිකාරියේ ජ්‍යෙෂ්ඨ කළමනාකාරීත්ව කාර්ය මණ්ඩලය සිදු කළ සංචාරය	1	21	පැය 2.5
vii	පදික වේදිකා සැලසුම් කිරීම සහ තත්ත්ව කළමනාකරණය සඳහා මාර්ගගත පුහුණු වැඩසටහන	1	25	5
viii	නව කැලණි පාලම ව්‍යාපෘතියේ ක්ෂේත්‍ර නිරීක්ෂණය - (2020 නොවැම්බර් කාණ්ඩය) - 2021 ඔක්තෝබර් 10 වැනි දින	3	92	1
ix	CEP - II ක්ෂේත්‍ර නිරීක්ෂණය (මීරිගම-කුරුණෑගල) - (නොවැම්බර් 2020 කණ්ඩායම) - 2021 ඔක්තෝබර් 23 වැනි දින	3	92	1
x	වරාය ප්‍රවේශයේ ක්ෂේත්‍ර නිරීක්ෂණය - (නොවැම්බර් 2020 කාණ්ඩය) - 2021 නොවැම්බර් 06 වැනි දින	3	92	1
xi	CEP - II ක්ෂේත්‍ර නිරීක්ෂණය (මීරිගම-කුරුණෑගල) - (සැප්තැම්බර් 2021 කණ්ඩායම) - 2021 දෙසැම්බර් 03 වැනි දින	3	110	1
xii	වරාය ප්‍රවේශය ක්ෂේත්‍ර නිරීක්ෂණය - (සැප්තැම්බර් 2021 කණ්ඩායම) - 2021 දෙසැම්බර් 10 වැනි දින	3	110	1
	සහභාගී වූ මුළු ගණන		**799**	

ii. බාහිර ආයතනවල පුහුණුව

ඉහත විස්තර කරන ලද පුහුණු කටයුතුවලට අමතරව 2021වර්ෂය තුල පුහුණු අංශය විසින්, බාහිර ආයතනවල පවත්වන ලද පුහුණුව සඳහා සේවකයන් 244 දෙනෙකු අදාළ පුහුණු පාඨමාලා, වැඩමුළු හා සම්මන්ත්‍රණ සඳහා නම්කර යවන ලදී. විස්තර පහත දැක්වේ.

වගුව 45 : බාහිර ආයතනයන් පැවැත්වූ පුහුණු පාඨමාලා

අංකය	ආයතනයේ නම	පුහුණු විස්තර	පුහුණු කළ නිලධාරීන් ගණන
1	සීමාසහිත පාරිසරික යුක්තිය පිළිබඳ මධ්‍යස්ථානය	ශ්‍රී ලංකාවේ පාරිසරික බලපෑම් ඇගයීම් ක්‍රියාවලිය පිළිබඳ නේවාසික පුහුණු වැඩමුළුව	1
2	ශ්‍රී ලංකා නීතිඥ සංගමය	ජාතික නීති සම්මේලනය 2021	1
3	ඉදිකිරීම් කර්මාන්ත සංවර්ධන අධිකාරිය (CIDA)	"CETRAC" මාර්ගගත පාඨමාලාව, ඉදිකිරීම් උපකරණවල උපරිම කාර්ය සාධනය සාක්ෂාත් කර ගැනීම	3
4	ජාතික කම්කරු අධ්‍යයන ආයතනය (NILS)	ප්‍රසම්පාදන ක්‍රියා පටිපාටි පිළිබඳ පුහුණු වැඩසටහන	7
5	නිවාස සැලසුම් සහ සංවර්ධන මධ්‍යස්ථානය (CHPB)	රජයේ සහ පෞද්ගලික අංශයේ කොන්ත්‍රාත්තුවේ ප්‍රමාදයන්, ආරවුල්, ගැටළු, හිමිකම්, දූෂණ වගන්ති, නීති විරෝධී වගන්ති, ප්‍රායෝගික නොවන පිරිවිතරයන් නිර්මාණය කරන්නේ කවුරුන්ද යන්න පිළිබඳ එක්දින සම්මන්ත්‍රණය	4
6	ශ්‍රී ලංකා වරලත් ගණකාධිකාරී ආයතනය	ශ්‍රී ලංකා රාජ්‍ය අංශයේ ගිණුම්කරණ ප්‍රමිති පිළිබඳ දැනුවත් කිරීමේ වැඩසටහන (SLPSAS)	5
7	මොරටුව විශ්වවිද්‍යාලය	මාර්ග සහ ගුවන් තොටුපල පදික තාක්ෂණය පිළිබඳ 12 වැනි ජාත්‍යන්තර සමුළුව (ICPT) – 2021	101
8		මාර්ග ආරක්ෂාව පිළිබඳ විගණනය සහ ගැටුම් අධ්‍යයනය පිළිබඳ පුහුණු වැඩසටහන	16
9	කොළඹ ව්‍යාපාර සහ කළමනාකරණ විද්‍යායතනය (CSBM)	නව සාමාන්‍ය වැඩකරන පරිසරයේ කළමනාකරණ සහකාරවරුන් සඳහා ස්වයං නායකත්ව සංවර්ධන කුසලතා	100
10	ශ්‍රී ලංකා භූ තාක්ෂණික සංගමය	ප්‍රචාරණය සඳහා SLGS ඉල්ලීම මගින් සංවිධානය කරන ලද ජාත්‍යන්තර සම්මන්ත්‍රණය	3
11	පේරාදෙණිය විශ්වවිද්‍යාලය	ව්‍යුහාත්මක ඉංජිනේරු සහ ඉදිකිරීම් කළමනාකරණය පිළිබඳ 12 වැනි ජාත්‍යන්තර සමුළුව	3
සහභාගීවූවන්ගේ මුළු සංඛ්‍යාව			**244**

iii. දේශීය විශ්වවිද්‍යාල / ආයතනවල දිගු කාලීන පාඨමාලා හැදෑරීමට ලබා දුන් අවස්ථා

2021 දී දේශීය විශ්වවිද්‍යාලවල M.Eng/M.Sc/PG ඩිප්ලෝමාව වැනි දිගුකාලීන පාඨමාලා හැදෑරීමට මාර්ග සංවර්ධන අධිකාරිය වෙතින් නිලධාරීන් 9 දෙනෙකු නම් කරන ලදී.

වගුව 46: දේශීය විශ්වවිද්‍යාල / ආයතනවල දිගු කාලීන පාඨමාලා

අංකය	ආයතනය	පුහුණු විස්තර	පුහුණුව ලැබූ නිලධාරීන් සංඛ්‍යාව
1	මොරටුව විශ්වවිද්‍යාලය	ඉදිකිරීම් ව්‍යාපෘති කළමනාකරණය පිළිබඳ විද්‍යාපති උපාධිය	2
2		භූ තාක්ෂණික ඉංජිනේරු විද්‍යාව පිළිබඳ විද්‍යාපති උපාධිය	3
3		මහාමාර්ග සහ රථවාහන ඉංජිනේරු විද්‍යාව පිළිබඳ ඉංජිනේරුපති උපාධිය	1
4	රුහුණ විශ්වවිද්‍යාලය	ව්‍යුහාත්මක ඉංජිනේරු විද්‍යාව පිළිබඳ ඉංජිනේරුපති උපාධිය	2
5	ශ්‍රී ජයවර්ධනපුර විශ්වවිද්‍යාලය	සමාජ විද්‍යාව පිළිබඳ ශාස්ත්‍රපති උපාධිය	1
සහභාගී වූ මුළු ගණන			**9**

iv. විදේශීය පුහුණු වැඩසටහන්

2021 වර්ෂය අතරතුර, මාර්ග සංවර්ධන අධිකාරියේ එක් නිලධාරියෙක් කොරියාවේ සෝල් විශ්වවිද්‍යාලයේ නාගරික ප්‍රාදේශීය සංවර්ධනය පිළිබඳ ශාස්ත්‍රපති උපාධි වැඩසටහන සඳහා සම්බන්ධ විය. (2021 අගෝස්තු 10 සිට 2023 ජනවාරි 07 දක්වා)

v. වෘත්තීය සමාලෝචනය සඳහා ඉංජිනේරුවන් පුහුණු කිරීම

ඉංජිනේරුවන් සැලසුම් කාර්යාල පුහුණුව සඳහා නම් කිරීම, පුහුණු අංශයේ පවත්වාගෙන යන ප්‍රමුඛතා ලේඛනය අනුව සිදු කෙරේ. 2021 වර්ෂය තුල පහත සඳහන් පරිදි සැලසුම් පුහුණුව සඳහා ඉංජිනේරුවන් 09ක් නම් කරන ලදී.

වගුව 47 : වෘත්තීය සමාලෝචනය සඳහා ඉංජිනේරුවන් පුහුණු කිරීම

සැලසුම් කාර්යාලයේ නම	නම් කරන ලද ඉංජිනේරුවන් ගණන
මාර්ග සැලසුම් කාර්යාලය	04
පාලම් සැලසුම් කාර්යාලය	02
මහනුවර සැලසුම් කාර්යාලය	-
රත්නපුර සැලසුම් කාර්යාලය	01
කුරුණෑගල සැලසුම් කාර්යාලය	02
අනුරාධපුර සැලසුම් කාර්යාලය	-
එකතුව	**09**

vi. උපාධි අපේක්ෂකයන් හා ආධුනිකයන් සඳහා පුහුණු අවස්ථා

ජාතික ආධුනික හා කාර්මික පුහුණු අධිකාරිය (NAITA) සමඟ එක්ව විශ්වවිද්‍යාල, කාර්මික විද්‍යාල සහ ආයතනවල උපාධි අපේක්ෂකයින් සහ ආධුනිකයින් සඳහා පුහුණු අංශය විසින් මාර්ග සංවර්ධන අධිකාරියේ ඔවුන්ගේ සේවාස්ථ පුහුණුව ලබා ගැනීමට අවස්ථාව ලබා දෙන ලදී. 2021 වර්ෂය තුළ උපාධි අපේක්ෂකයින් පහත පරිදි පුහුණු කරන ලදී.

වගුව 48 : දේශීය විශ්වවිද්‍යාල/ආයතනවල උපාධි අපේක්ෂකයන් හා ආධුනිකයන් සඳහා පුහුණු අවස්ථා

අංකය	දේශීය විශ්වවිද්‍යාල/ආයතනවල	ශිෂ්‍ය සංඛ්‍යාව
1	මොරටුව විශ්වවිද්‍යාලය	19
2	ශ්‍රී ලංකා අග්නිදිග විශ්වවිද්‍යාලය	10
3	යාපනය විශ්වවිද්‍යාලය	8
4	ශ්‍රී ලංකා නැගෙනහිර විශ්වවිද්‍යාලය	3
5	ශ්‍රී ලංකා දක්ෂිණ විශ්වවිද්‍යාලය	3
6	ශ්‍රී ලංකා වයඹ විශ්වවිද්‍යාලය	2
7	ශ්‍රී ලංකා සබරගමුව විශ්වවිද්‍යාලය	1
8	ශ්‍රී ජයවර්ධනපුර විශ්වවිද්‍යාලය	1
9	කොළඹ විශ්වවිද්‍යාලය	1
10	රුහුණ විශ්වවිද්‍යාලය	1
11	ලංකා තොරතුරු තාක්ෂණ ආයතනය (SLIIT)	52
12	තාක්ෂණ ආයතන	17
13	ජාතික ආධුනික හා කාර්මික පුහුණු අධිකාරිය (NAITA)	18
14	බටංගල විශ්වවිද්‍යාල විද්‍යායතනය (මාතර, යාපනය, කුලියාපිටිය)	18
15	ජාත්‍යන්තර ව්‍යාපාර සහ තාක්ෂණ විද්‍යාලය (ICBT Campus)	14
16	කාර්මික විද්‍යාල (කුරුණෑගල,යාපනය,ගාල්ල ආදී)	12
17	ජාතික ව්‍යාපාර කළමනාකරණ ආයතනය (NSBM)	10
18	ශ්‍රී ලංකා ජර්මානු පුහුණු ආයතනය	9
19	උසස් තාක්ෂණ ආයතනය	8
20	CINEC විශ්වවිද්‍යාලය	6
21	ඉංජිනේරු තාක්ෂණ ආයතනය -කටුනායක	4
22	ශ්‍රී ලංකා වෘත්තීය පුහුණු අධිකාරිය (අම්පාර, කෑගල්ල, ආදිය)	4
23	ලලිත් ඇතුලත්මුදලි වෘත්තීය පුහුණු මධ්‍යස්ථානය	4
24	කාර්මික ඉංජිනේරු පුහුණු ආයතනය	4
25	කොළඹ ඉදිකිරීම් තාක්ෂණ පාසල	2
26	ශ්‍රී ලංකා වරලත් ගණකාධිකාරීවරුන්ගේ ආයතනය	2
27	නිපුණතා තාක්ෂණ විද්‍යාලය	1
28	ශ්‍රී ලංකා AAT ආයතනය	1
29	ජාතික ව්‍යාපාර කළමනාකරණ ආයතනය	1
30	ජාතික තරුණ සේවා සභාව	1
31	ව්‍යවහාරික අධ්‍යයන පිළිබඳ බ්‍රිටිෂ් විද්‍යාලය	1
32	වෙනත්	6
	මුළු අභ්‍යාසලාභීන් සංඛ්‍යාව	**244**

14. නීති සේවා

අධිකාරියේ හා මහාමාර්ග අමාත්‍යාංශයේ ව්‍යාපෘති කළමනාකරණ ඒකක වලට සම්බන්ධ සියලුම නීති කටයුතු ක්‍රියාත්මක කිරීමේ ප්‍රමුඛ වගකීම නීති අංශය වෙත පැවරී ඇත. උසාවිවල පෙනී සිටීමේ සාමාන්‍ය රාජකාරි වලට අමතව, මාර්ග සංවර්ධන අධිකාරියේ සභාපති, අධ්‍යක්ෂ ජනරාල්, අතිරේක අධ්‍යක්ෂ ජනරාල්, අධ්‍යක්ෂවරුන්, ඉංජිනේරුවරුන් හා සම්පූර්ණ කාර්ය මණ්ඩලය වෙත සියලුම නීති කටයුතු වලදී උපදෙස් දීම මෙම අංශයේ වගකීමයි. තවද, සියලුම සේවකයන් වෙත නෛතික කටයුතුවලට අදාළ කාරණා සම්බන්ධයෙන් දැනුවත් කිරීමේ වගකීම මෙම අංශයට පැවරී ඇත.
නීති අංශය මගින් ගිවිසුම් කෙටුම්පත්, ගැසට් පත්‍ර, කැබිනට් පත්‍රිකා කෙටුම්පත්, අවබෝධතා ගිවිසුම් විශ්ලේෂණය කරන අතර කළමනාකාරිත්වය වෙත නීතිමය ඉදිරිදර්ශන පිළිබඳ අදහස් සපයයි. මහේස්ත්‍රාත් අධිකරණයේ සිට ශ්‍රේෂ්ඨාධිකරණය දක්වා වූ සියලුම සංසදවල සහ මාර්ග සංවර්ධන අධිකාරිය පාර්ශවයක් වන බේරුම්කරණයන්හි නීතිමය කටයුතුවලදී මාර්ග සංවර්ධන අධිකාරියෙ හි කළමනාකාරිත්වය නියෝජනය කරයි.
නීතිමය කටයුතු සහ නඩු වලදී මාර්ග සංවර්ධන අධිකාරිය නියෝජනය කිරීමේදී නීති අංශය, නීතිපති දෙපාර්තමේන්තුව සමඟ සම්බන්ධීකරණය කරයි.

නීති අංශයේ කාර්යභාරය සහ කාර්යයන්

- මාර්ග සංවර්ධන අධිකාරිය වෙනුවෙන්, ශ්‍රේෂ්ඨාධිකරණය, අභියාචනාධිකරණය, සිවිල් අභියාචනාධිකරණය, වාණිජ මහාධිකරණය, මහාධිකරණය, දිස්ත්‍රික් අධිකරණය, මහේස්ත්‍රාත් අධිකරණය, කාර්මික අධිකරණය සහ කම්කරු විනිශ්චය සභාවන්වල මාර්ග සංවර්ධන අධිකාරිය විසින් ගොනු කරන ලද සහ මාර්ග සංවර්ධන අධිකාරියට එරෙහිව අනෙකුත් පාර්ශවයන් විසින් ගොනු කර ඇති නඩු සඳහා වෙනුවෙන් පෙනී සිටීම.
- මහාමාර්ග අමාත්‍යාංශය විසින් සිදු කරනු ලබන ව්‍යාපෘති සහ මාර්ග සංවර්ධන අධිකාරිය විසින් සිදු කරනු ලබන ව්‍යාපෘති සම්බන්ධයෙන් කොන්ත්‍රාත් ගිවිසුම් උල්ලංඝනය කිරීම සම්බන්ධයෙන් පැන නගින ආරවුල් සඳහා මාර්ග සංවර්ධන අධිකාරිය වෙනුවෙන් බේරුම්කාර විනිශ්චය සභාවල පෙනී සිටීම.
- මානව හිමිකම් කොමිෂන් සභාව සහ ඔම්බුඩ්ස්මන්වරයා ඉදිරියේ මාර්ග සංවර්ධන අධිකාරිය වෙනුවෙන් පෙනී සිටීම.
- නීති සහාය සපයන කේන්ද්‍රස්ථානය වශයෙන්, නීති අංශය, මහාමාර්ග අමාත්‍යාංශය යටතේ පවතින සියලුම සියලුම ව්‍යාපෘතිවලට නීති සහාය ලබාදෙන අතර, කොන්ත්‍රාත් ලේඛන හා ණය ගිවිසුම් සඳහා නීතිපති දෙපාර්තමේන්තුවේ නිෂ්කාශනය ලබා ගනු ලබයි.
- ජාතික මංමාවත් පනත යටතේ මාර්ග රක්ෂිතයේ අනවසර ඉදිකිරීම් කඩා ඉවත් කිරීම සඳහා මහේස්ත්‍රාත් උසාවි නියෝග ලබා ගැනීම සඳහා නීති ක්‍රියාමාර්ග සිදු කරනු ලැබේ.
- ජාතික මංමාවත් පනත යටතේ මහාමාර්ග සීමාව තුළ ඉදිකරන ලද අනවසර ගොඩනැගිලි කඩා ඉවත් කිරීම සඳහා අනිවාර්ය නියෝග ලබා ගැනීම සඳහා මහේස්ත්‍රාත් අධිකරණයේ නීති ක්‍රියා මාර්ග සිදු කරනු ලැබේ.
- මාර්ග භාවිතා කරන්නන් විසින් මාර්ග සංවර්ධන අධිකාරියේ දේපලවලට සිදු කළ හානිය නැවත අය කර ගැනීම සඳහා දිස්ත්‍රික් උසාවිවල ලේඛන සහ නීතිමය ක්‍රියාමාර්ග සකස් කිරීම.
- මාර්ග සංවර්ධන අධිකාරියට එරෙහිව නියෝගයක් / තීන්දුවක් ලබා දෙන සෑම අවස්ථාවකම උසාවි සහ අධිකරණවල ගොනු කිරීමට අවශ්‍ය පැමිණිලි, පෙත්සම්, විරෝධතා, ලිඛිත ඉදිරිපත් කිරීම් සකස් කිරීම සහ අභියාචනා ලේඛන සකස් කිරීම.
- මාර්ග සංවර්ධන අධිකාරිය අනෙකුත් පාර්ශව සමඟ එළඹෙන ගිවිසුම්/ අවබෝධතා ගිවිසුම් කෙටුම්පත් කිරීම/ අනුමත කිරීම.
- මාර්ග භාවිතා කරන්නන් විසින් මාර්ග සංවර්ධන අධිකාරියේ දේපලවලට සිදු කළ හානිය නැවත අය කර ගැනීම සඳහා දිස්ත්‍රික් උසාවිවල ලේඛන සහ නීතිමය ක්‍රියාමාර්ග සකස් කිරීම.

- මාර්ග සංවර්ධන අධිකාරියට එරෙහිව නියෝගයක් / තීන්දුවක් ලබා දෙන සෑම අවස්ථාවකම උසාවි සහ අධිකරණවල ගොනු කිරීමට අවශ්‍ය පැමිණිලි, පෙත්සම්, විරෝධතා, ලිඛිත ඉදිරිපත් කිරීම් සකස් කිරීම සහ අභියාචනා ලේඛන සකස් කිරීම.
- මාර්ග සංවර්ධන අධිකාරිය එළඹෙන ගිවිසුම්/ අවබෝධතා ගිවිසුම් කෙටුම්පත් කිරීම/ අනුමත කිරීම.

2021 වර්ෂය තුළ අංශයේ කටයුතුවල ප්‍රගතිය

- විධායක ඉංජිනේරුවරුන් විසින් නිරීක්ෂණය කරන ලද ගොඩනැගිලි සීමාවන් සඳහා 2008 අංක 40 දරන ජාතික මංමාවත් පනතේ 45(3) සහ 50(3) වගන්ති යටතේ නඩු පැවරීමේ කාර්යය නීති අංශයට පවරා ඇත. ඒ සම්බන්ධයෙන් විවිධ පළාත්වල මහේස්ත්‍රාත් අධිකරණයේ නඩු 272ක් ගොනු කර ඇති නීති අංශය මගින් අනවසර ඉදිකිරීම් ඉවත් කිරීමට නියෝග ලබා ගැනීමට හැකි වී තිබේ.

- මහාධිකරණ සහ දිස්ත්‍රික් උසාවි කටයුතුවලදී පෙත්සම් කෙටුම්පත් කිරීම, පැමිණිලි හා විරෝධතා ඉදිරිපත් කිරීම සහ පිළිතුරු සැපයීම.
- ශ්‍රේෂ්ඨාධිකරණය, අභියාචනාධිකරණය, සිවිල් අභියාචනා සහ වාණිජ මහාධිකරණයේ අභියාචනා ගොනු කිරීම සඳහා අභියාචනා කෙටුම්පත් සකස් කිරීම.

- මාර්ග සංවර්ධන අධිකාරියේ (රජයේ ඉඩම්) මෙන්ම රජයේ නිල නිවාසවල ඉඩම් ආපසු අත්කර ගැනීම සඳහා මහේස්ත්‍රාත් අධිකරණවල ලේඛන සකස් කිරීම සහ නීතිමය ක්‍රියාමාර්ග ගැනීම.

ඉහත සඳහන් කළ ක්‍රියාකාරකම්, මාර්ග සංවර්ධනයට පහසුකම් සපයන මාර්ග වෙන් කිරීම් නිරවුල් කර ගැනීමට සහ ගොඩනැගිලි සීමාවන්හි ඇති අනවසර ව්‍යුහයන් ඉවත් කිරීමට මාර්ග සංවර්ධන අධිකාරියට උපකාර කරයි.

- සාමාන්‍යයයෙන් මාර්ග ඉදිකිරීම සඳහා අවශ්‍ය ඉඩම්වල හිස් සන්තකය අධිකාරියට භාර දීම ප්‍රාදේශීය ලේකම්වරුන් විසින් සිදු කළ යුතුය. ඇතැම් අයිතිකරුවන් විසින් සන්තකය භාර දීම ප්‍රතික්ෂේප කරන අවස්ථාවල අංශයේ නීතිඥයින් විසින්, සේවා අවශ්‍යතාවය මත ඉවත් කිරීමේ නියෝග ලබා ගැනීම සඳහා උසාවියේ නඩු පැවරීම් සිදු කරනු ලබයි.
- හදිසි අනතුරුවලින් මාර්ග භාණ්ඩ වලට සිදුවන අලාභ හානි ගෙවීම බොහෝ රියදුරන් විසින් පැහැර හරින බැවින් රථවාහන අනතුරුවලින් සිදුවන අලාභයන් වෙනුවෙන් වන්දි ගෙවීමට හිමිකරුවන්, රියදුරන් හා රක්ෂණකරුවන් පොලඹවා ගැනීමට නීති අංශයට හැකියාව ලැබී ඇත.

වගුව 49: 2020 වර්ෂය තුළ මාර්ග සංවර්ධන අධිකාරියට එරෙහිව ගොනු වූ නඩු හා මාර්ග සංවර්ධන අධිකාරිය විසින් ගොනු කරන ලද නඩු පිළිබඳ සාරාංශය

විස්තරය	**2020/12/31 දක්වා සමුච්චිත සංඛ්‍යාව**	**2021 වර්ෂය තුළ මාර්ග සංවර්ධන අධිකාරියට එරෙහිව පවරා ඇති නඩු**	**2021 වර්ෂය තුළ මාර්ග සංවර්ධන අධිකාරිය විසින් බාහිර පාර්ශවයන්ට එරෙහිව පවරණ ලද නඩු**	**2021 තුළ නිම කළ නඩු**	**2021 අවසානයේ එකතුව**
ශ්‍රේෂ්ඨාධිකරණය	17	14	0	04	27
අභියාචනාධිකරණය	27	18	0	15	30
මහාධිකරණය	19	9	8	9	36

දිස්ත්‍රික් අධිකරණය	134	10	6	17	133
මහේස්ත්‍රාත් අධිකරණය	215	0	147	105	257
කම්කරු විනිශ්චය සභා	01	03	01	0	05
බේරුම්කරණ අධිකරණය	03	01	01	01	04
මානව හිමිකම් කොමිෂන් සභාව	01	0	0	0	01

15. ප්‍රසම්පාදන කළමනාකරණ සේවා

සෘජු හා වක්‍ර භාණ්ඩ, වැඩ සහ සේවා මිලදී ගැනීම සඳහා ආයතනික ප්‍රසම්පාදන සහ ද්‍රව්‍ය කළමනාකරණ ක්‍රියාවලිය සඳහා උපාය මාර්ගික ප්‍රවේශයක් වර්ධනය කිරීම සඳහා ප්‍රසම්පාදන අංශය වගකීම දරයි. මෙම නායකත්ව භූමිකාව තුළ, මාර්ග සංවර්ධන අධිකාරිය සඳහා වැඩ, භාණ්ඩ හා සේවා ප්‍රසම්පාදනය මෙහෙයවනු ඇත; ප්‍රසම්පාදන ක්‍රියාවලි සඳහා ප්‍රසම්පාදන කණ්ඩායම් සාමාජිකයින්ට සහ සගයන්ට සහාය වීම, ප්‍රසම්පාදනය ආශ්‍රිත අනෙකුත් ක්‍රියාකාරකම් වෙනස් කිරීම සහ යාවත්කාලීන කිරීම; ප්‍රසම්පාදන ප්‍රතිපත්ති සහ ක්‍රියා පටිපාටි සංවර්ධනය කිරීම සහ/හෝ යාවත්කාලීන කිරීම; මාර්ග සංවර්ධන අධිකාරිය වෙත වටිනාකමක් සහ කාර්යක්ෂමතාවයක් එක් කරන මධ්‍යගත ප්‍රසම්පාදන වැඩසටහනක් සංවර්ධනය කිරීම සිදු කරනු ලබයි.

වඩා හොඳ මහජන සේවාවන් සැපයීමේදී කොන්ත්‍රාත් බලධාරීන් ඔවුන්ගේ ප්‍රතිපත්ති සහ ව්‍යාපාරික අරමුණු සපුරාලීම සහතික කිරීම සහ සක්‍රීය කිරීම, රාජ්‍ය ප්‍රසම්පදනයේ මෙහෙයුම වේ. රාජ්‍ය ප්‍රසම්පාදන ක්‍රියාවලිය, මූලික සංකල්පයේ සිට රාජ්‍ය සේවයේ අවශ්‍යතා අර්ථ දැක්වීමේ සිට වත්කමක ප්‍රයෝජනවත් ආයු කාලය හෝ කොන්ත්‍රාත්තුවේ අවසානය දක්වා වන සමස්ත ව්‍යාපෘති ජීවන චක්‍රය පුරා විහිදේ.

ප්‍රසම්පාදනය යනු භාණ්ඩ, වැඩ, වෙනත් සේවා සහ උපදේශන සේවා නිසි පරිදි ලබා ගන්නා ක්‍රියාවලියකි.

රාජ්‍ය ප්‍රසම්පාදන පද්ධතිය අර්ථ දැක්වීම

ප්‍රසම්පාදන ක්‍රමය යනු රජයේ අවශ්‍යතා සපුරාලීම සඳහා රජය විසින් පුරවැසියන් වෙත සිය වගකීම් ඉටු කිරීමට භාණ්ඩ, වැඩ සහ සේවා ලබා ගැනීම සඳහා රජයේ සම්පත් (මහජන අරමුදල්) භාවිතා කිරීම සම්බන්ධ රජයේ කාර්යයකි.

රාජ්‍ය ප්‍රසම්පාධනයේ අරමුණු සහ ඉලක්ක

- ප්‍රසම්පාදනයේ ආර්ථිකය, කාලෝචිත බව සහ ගුණාත්මක බව උපරිම කිරීම හා එහි ප්‍රතිඵලයක් ලෙස ඉහළ ගුණාත්මකභාවය සමඟින් අවම පිරිවැයක් ඇති කිරීම;
- නියමිත ප්‍රමිතීන්, පිරිවිතර, රීති, රෙගුලාසි සහ යහපාලනය පිළිපැදීම;
- ප්‍රසම්පාදනයට සහභාගී වීමට සුදුසුකම් ලත් උනන්දුවක් දක්වන පාර්ශ්වයන්ට සාධාරණ, සමාන සහ උපරිම අවස්ථාව ලබා දීම;
- වැඩ කඩිනමින් ක්‍රියාත්මක කිරීම සහ භාණ්ඩ හා සේවා බෙදා හැරීම;
- දේශීය නීති සහ රෙගුලාසි සහ ජාත්‍යන්තර බැඳීම්වලට අනුකූල වීම;
- ඇගයීම් සහ තෝරා ගැනීමේ පටිපාටියේ විනිවිදභාවය සහ අනුකූලතාව සහතික කිරීම;
- ලංසුකරුවන් විසින් සපයනු ලබන තොරතුරු වල රහස්‍යභාවය රැක ගැනීම.
- සියලුම ප්‍රසම්පාදන ක්‍රියාකාරකම් වලදී මුදල් සඳහා වටිනාකමක් ලබා ගැනීම;
- සියලුම පාර්ශ්වකරුවන් සඳහා සමාන අවස්ථා ප්‍රවර්ධනය කිරීම
- මුදලට සරිලන වටිනාකමක්, ගුණාත්මක භාවයක් සහ ඵලදායී සේවා සැපයීමක් ලබා ගැනීම සඳහා පුද්ගලික අංශය සහ අනෙකුත් සංවිධාන සමඟ සහයෝගයෙන් කටයුතු කිරීම;
- නවෝත්පාදන ප්‍රවර්ධනය;
- ඵලදායී ප්‍රසම්පාදන ප්‍රතිපත්ති සහ භාවිතයන් තුළින් පාරිසරික සහ සමාජ තිරසාරත්වය දිරිමත් කිරීම.

සියලුම භාණ්ඩ, සේවා සහ වැඩ ප්‍රසම්පාදනය මුදල් වටිනාකම (VFM) මත පදනම් විය යුතුය, එනම්:

- *නිවැරදි භාණ්ඩ, සේවා, සහ/හෝ වැඩ*
- *නිවැරදි ගුණාත්මක භාවයෙන්*
- *නියම ප්‍රමාණයෙන්*
- *නියම වේලාවට*
- *නියම මිලට*
- *සහ නියම ස්ථානයට භාර දෙනු ලැබේ.*

මෙම අංශය වෙත පවරා ඇති වගකීමෙන් අපේක්ෂා කරනුයේ රජයේ අරමුදල් යටතේ ප්‍රසම්පාදන කටයුතු මෙහෙය වීම සහ ප්‍රසම්පාදන අංශයේ වැඩ, ලිපි ද්‍රව්‍ය, භාණ්ඩ හා සේවා ප්‍රසම්පාදනය කිරීම වේ. ඒ අනුව පහත සඳහන් කාර්යයන් සිදු කරනු ලබයි;

- මධ්‍යගත ප්‍රසම්පාදන සැලැස්මක් සහ ප්‍රධාන සැලැස්මක් වාර්ෂිකව සංවර්ධනය කිරීම සහ සන්නිවේදනය කිරීම; සඵලතාවය සහ කාර්යක්ෂමතාව ප්‍රවර්ධනය කිරීම සඳහා මාර්ග සංවර්ධන අධිකාරිය වෙනුවෙන් දිගුකාලීන ඉලක්ක ස්ථාපිත කිරීම, සන්නිවේදනය කිරීම සහ ක්‍රියාත්මක කිරීම.
- ප්‍රසම්පාදන කණ්ඩායම් කාර්ය සාධනය සහ සංවර්ධන සැලසුම් සහ ඇගයීම් සංවර්ධනය කිරීම, සන්නිවේදනය කිරීම සහ පරිපාලනය කිරීම.
- සියලුම දෙපාර්තමේන්තු මගින් සිදු කරන ප්‍රසම්පාදන සම්බන්ධ ප්‍රශ්න, පුහුණුව, ප්‍රතිපත්ති සහ ක්‍රියා පටිපාටි අර්ථ නිරූපණය සහ පෙළගැස්වීම සඳහා මූලික සම්බන්ධීකරණ කටයුතු සිදු කිරීම.
- කොන්ත්‍රාත් සංවර්ධනය සහ පරිපාලනය අධීක්ෂණය කිරීම.
- ආයතනික වටිනාකම සහ කාර්යක්ෂමතාව ඉහළ නැංවීමට ඇති හැකියාව කෙරෙහි අවධානය යොමු කරමින් වත්මන් ප්‍රසම්පාදන ප්‍රතිපත්ති, ක්‍රියා පටිපාටි සහ වැඩසටහන් කළමනාකරණය කිරීම; ප්‍රතිපත්ති, ක්‍රියා පටිපාටි වැඩිදියුණු කිරීම සහ අවශ්‍ය පරිදි නව/සංශෝධිත ප්‍රතිපත්ති, ක්‍රියා පටිපාටි සහ වැඩසටහන් සංවර්ධනය කිරීම, සන්නිවේදනය කිරීම සහ ක්‍රියාත්මක කිරීම සඳහා ඔවුන්ගේ අවබෝධය සහ/හෝ නිර්දේශ සඳහා ප්‍රසම්පාදන සම්බන්ධයෙන් අදාළ දෙපාර්තමේන්තු සමඟ නිතිපතා කටයුතු කිරීම සහ මාර්ග සංවර්ධන අධිකාරියේ අධ්‍යක්ෂ මණ්ඩලයෙන් අවශ්‍ය අනුමැතිය ලබා ගැනීම.
- ආයතනයට වටිනාකමක් සහ කාර්යක්ෂමතාවයක් එක් කරන මධ්‍යගත ප්‍රසම්පාදන වැඩසටහනක් සංවර්ධනය කිරීම.
- මිලදී ගැනීම් ඇණවුම් කිරීමේ ක්‍රියාවලි; ලංසු සහ යෝජනා සංවර්ධනය කිරීම; සහ ඕනෑම ඉන්වොයිසියක ඇති විෂමතා විසඳීම.
- කොන්ත්‍රාත්කරුවන්, සැපයුම්කරුවන්, සේවා සපයන්නන් සහ වාහන කුලියට ගන්නන්ගේ ලැයිස්තුව සඳහා දත්ත පදනමක් සකස් කිරීමෙන් වාර්ෂික ලියාපදිංචිය සිදු කිරීම.
- ප්‍රසම්පාදන ක්‍රියා පටිපාටි සකසන්න
- මාර්ග සංවර්ධන අධිකාරිය සඳහා අපේක්ෂිත අයවැය යටතේ ක්‍රියාකාරී සැලැස්ම සමඟ ඇතුළත් කර ඇති වාර්ෂික ප්‍රසම්පාදන සැලැස්ම සකස් කිරීම.
- දෙපාර්තමේන්තු ප්‍රසම්පාදන කමිටුවේ (RDAPC) සීමාව යටතේ වැඩ, භාණ්ඩ, උපදේශන සේවා සහ අනෙකුත් සේවාවන්හි සියලුම ප්‍රසම්පාදනය හසුරුවීම.
- සියලුම මාර්ග සංවර්ධන අධිකාරියේ ව්‍යාපෘති කළමනාකරණ ඒකක හට ඔවුන්ගේ ප්‍රසම්පාදන කටයුතු වැඩිදියුණු කිරීමට සහාය වීම (විශේෂයෙන් ලෝක බැංකුව, ආසියානු සංවර්ධන බැංකුව සහ අනෙකුත් විවිධ අරමුදල් සහිත ව්‍යාපෘති මගින් අරමුදල් සපයනු ලබන).
- සියලුම ප්‍රසම්පාදන කටයුතු හැසිරවීමට RDAPC ට සහාය වීම.
- විශේෂිත ක්ෂේත්‍රයන්හි සියලුම තාක්ෂණික ඇගයීම් කමිටු කළමනාකරණය කිරීම (ප්‍රධාන වැඩ, පාලම් වැඩ, සිදුරු, බිටුමන් සැපයීම, ඉමල්ෂන්, ශක්‍යතා අධ්‍යයනය, රථවාහන

අධ්‍යයනය, රථවාහන සමීක්ෂණ, යාන්ත්‍රික අලුත්වැඩියා කටයුතු, ලිපි ද්‍රව්‍ය සැපයීම, කාටිරිජ්, ටෝනර් සහ සියලු භාණ්ඩ සහ අනෙකුත් මෙහි ඇතුළත් නොවන ඕනෑම අයිතමක්.)

- මාර්ග සංවර්ධන අධිකාරියෙහි විෂය පථය යටතේ ඇති සියලුම ස්ථාවර ප්‍රසම්පාදන කමිටු කළමනාකරණය කිරීම.
- ප්‍රසම්පාදන ආයතනයට/ජාතියට ආර්ථික ප්‍රතිලාභ අහිමි නොකර අනුමත අනුපාතවල යම් විෂමතාවයක් වළක්වා ගැනීම සඳහා බහු විකුණුම්කරුවන්ගෙන් බහුවිධ මිලදී ගැනීම් සඳහා කළමනාකරණය කළ හැකි එකම සංවිධානය වන මාර්ග සංවර්ධන අධිකාරිය වෙත ගැලපෙන පරිදි මාර්ගෝපදේශ ගිවිසුම් සකස් කිරීම.
- විද්‍යුත් ප්‍රසම්පාදන ක්‍රමය (විශේෂයෙන් භාණ්ඩ සහ උපදේශක නොවන සේවා) හඳුන්වාදීම සහ විද්‍යුත් වශයෙන් සකස් කරන ලද ලියකියවිලි සමඟ සම්බන්ධ වී ඇති මාර්ග සංවර්ධන අධිකාරියේ වෙබ් අඩවි ද්වාරය හරහා එයට පසුබිම සකස් කිරීම.
- ලිපිද්‍රව්‍ය, කාට්‍රිජ්, ටෝනර්, සියලුම භාණ්ඩ සහ අනෙකුත් ඇතුළත් කර නොමැති ඕනෑම අයිතම සැපයීම.
- ආයතනික ප්‍රසම්පාදන හා වැඩ සඳහා ප්‍රසම්පාදන කළමනාකරණ ක්‍රියාවලිය සඳහා උපායමාර්ගික ප්‍රවේශයක් සංවර්ධනය කිරීම සහ මාර්ග සංවර්ධන අධිකාරිය වෙත වටිනාකමක් සහ කාර්යක්ෂමතාවයක් එක් කරන මධ්‍යගත ප්‍රසම්පාදන වැඩසටහනක් සංවර්ධනය කිරීම සඳහා වගකිව යුතු වේ.
- දැනට ප්‍රසම්පාදන අංශය විසින් වාර්ෂික ලියාපදිංචිය (කොන්ත්‍රාත්කරු, සැපයුම්කරු, වාහන කුලියට ගැනීම) හසුරවනු ලබයි.
- මාර්ග සංවර්ධන අධිකාරියෙ හි විෂය පථය යටතේ ඇති සියලුම ස්ථාවර ප්‍රසම්පාදන කමිටු කළමනාකරණය කිරීම.
- අධ්‍යක්ෂ මණ්ඩලය විසින් අනුමත කරන ලද ප්‍රසම්පාදන අංශයේ අපගේ අනාගත සැලැස්ම: ශ්‍රී ලංකා රජය විසින් සියලුම ප්‍රසම්පාදන කටයුතු හා ක්‍රියාකාරී මූල්‍ය කටයුතු සම්පූර්ණයෙන් හෝ අර්ධ වශයෙන් සිදු කිරීමේදී, පරිශීලක-හිතකාමී මාර්ගෝපදේශ, ප්‍රසම්පාදන අත්පොත්, ස්ථාවර ලේඛන, සියලු වර්ගවල වැඩ ප්‍රසම්පාදන සඳහා සම්මත සැකිලි, සියලු උපදේශක සේවා සහ අනෙකුත් සේවාවන්, PE-RDA ප්‍රසම්පාදන ක්‍රියාවලියට අනුගත විය යුතුය.
- බහු විකුණුම්කරුවන්ගෙන් බහු මිලදී ගැනීම් සඳහා රාමු ගිවිසුම් සකස් කිරීම.

2021 වර්ෂය තුළ කාර්යයන් සහ ප්‍රගතිය

වගුව 50: ප්‍රසම්පාදන අංශය මගින් සිදු කළ ප්‍රසම්පාදන කටයුතුවල සාරාංශය -2021

අයිතම විස්තර	කළ මුළු වැඩ ප්‍රමාණය
වත්කම්, ලිපිද්‍රව්‍ය සහ පරිභෝජන ද්‍රව්‍ය	121,743,193.59
භාණ්ඩ, වැඩ සහ සේවා	3,118,564,517.41
සිදු කරන ලද කාර්යයේ සම්පූර්ණ වටිනාකම (VAT හැර)	**3,240,307,711.00**

වගුව 51 : භාණ්ඩ, වැඩ සහ සේවා ප්‍රසම්පාදනය පිළිබඳ විස්තර

අංකය	ප්‍රසම්පාදන අයිතමයේ විස්තර	කොන්ත්‍රාත් මුදල රු.
1	2018 වාර්ෂික වාර්තාව මුද්‍රණය කිරීම	3,000,000.00
2	උඩුමුල්ල ගබඩා සඳහා පිරිසිදු කිරීමේ සේවාව සඳහා ශ්‍රමය සැපයීම - සැලසුම් අංශය	102,000.00
3	මාර්ග සංවර්ධන අධිකාරියේ සේවකයින් සඳහා PCR පරීක්ෂණය	1,636,500.00

අංකය	ප්‍රසම්පාදන අයිතමයේ විස්තර	කොන්ත්‍රාත් මුදල රු.
4	නුවරඑළියේ මාර්ග සංවර්ධන අධිකාරියේ බංගලාව සඳහා යෝජිත ප්‍රතිසංස්කරණ ව්‍යාපෘතිය	43,189,879.99
5	මගනැගුම මහමැදුර සඳහා ආරක්ෂක සේවය	1,184,425.00
6	සුභසාධක සංගමය විසින් ප්‍රධාන ආපනශාලා සේවය 2021	-
7	මාර්ග සංවර්ධන අධිකාරියේ ඇස්පෝල්ට් යන්ත්‍රාගාරය සඳහා නුපුහුණු කම්කරුවන් සැපයීම	28,542,312.00
8	ග්‍රාමීය ඉදිකිරීම් අංශයට තෙත් බදු පදනම මත බූම් ට්‍රක් රථය සැපයීම	982,500.00
9	මාර්ග සංවර්ධන අධිකාරියේ "මගනැගුම මහමැදුර" සඳහා පළිබෝධ පාලන සේවා සැපයීම	258,000.00
10	මාර්ග සංවර්ධන අධිකාරියේ සේවකයින් සඳහා බස් සේවාව	37,492,492.00
11	මාර්ග සංවර්ධන අධිකාරියේ මගනැගුම මහමැදුර පරිශ්‍රය සඳහා විස්තීර්ණ රක්ෂණ ප්‍රතිපත්තිය	1,184,597.73
12	කාගම බුල්නෑව හෙලබොදුගම මාර්ගයේ කාගම කලාඔය හරහා පාලමේ ශේෂ ඉදිකිරීම	43,555,916.80
13	බෝල්ඩර් ද්‍රව්‍ය සූරියවැව කුඩු කම්හල දක්වා ප්‍රවාහනය කිරීම	30,000,000.00
14	බෝල්ඩර් ද්‍රව්‍ය අඹන්පොල කුඩු කම්හල දක්වා ප්‍රවාහනය කිරීම	30,000,000.00
15	මාර්ග සංවර්ධන අධිකාරියේ වාහන/ යන්ත්‍රෝපකරණ සඳහා 2021-2022 වෙනුවන් වාහන රථ වාහන රක්ෂණ ආවරණයක් සැපයීම	8,828,549.75
16	බලංගොඩ ඇස්පෝල්ට් කම්හලට සමස්ථ ද්‍රව්‍ය සැපයීම	87,825,000.00
17	ඉංගිරිය ඇස්පෝල්ට් කම්හලට සමස්ථ ද්‍රව්‍ය සැපයීම	9,490,000.00
18	කැරගල ඇස්පෝල්ට් කම්හලට සමස්ථ ද්‍රව්‍ය සැපයීම	10,640,500.00
19	කෙහෙල්කොටුව මැදගම බිබිල කෙහෙල්කොටුව කලංගහවාඩිය මාර්ගයේ ධන්මල්ඔය හරහා පාලමක් ඉදිකිරීම	43,555,916.80
20	කැරගල යන්ත්‍රාගාරයට තොග බිටුමන් (60/70) සැපයීම – 100MT	8,500,000.00
21	ඉංගිරිය යන්ත්‍රාගාරයට තොග බිටුමන් (60/70) සැපයීම – 100 MT	8,500,000.00
22	කොටදෙණියාව යන්ත්‍රාගාරයට තොග බිටුමන් (60/70) සැපයීම – 100 MT	8,500,000.00
23	මැදයාය යන්ත්‍රාගාරයට තොග බිටුමන් (60/70) සැපයීම – 100 MT	8,500,000.00
24	කොත්මලේ යන්ත්‍රාගාරයට තොග බිටුමන් (60/70) සැපයීම – 100 MT	8,500,000.00
25	සූරියවැව යන්ත්‍රාගාරයට තොග බිටුමන් (60/70) සැපයීම – 100 MT	8,500,000.00
26	කැරගල යන්ත්‍රාගාරයට තොග බිටුමන් (60/70) සැපයීම – 100 MT	8,500,000.00
27	මැදවච්චිය යන්ත්‍රාගාරයට තොග බිටුමන් (60/70) සැපයීම – 100 MT	8,500,000.00
28	බළන්ගොඩ යන්ත්‍රාගාරයට තොග බිටුමන් (60/70) සැපයීම – 100 MT	8,500,000.00
29	පොළොන්නරුව යන්ත්‍රාගාරයට තොග බිටුමන් (60/70) සැපයීම – 100 MT	8,500,000.00
30	බිටුමන් මෙ.ටොන් 1,400ක තොගයක් සැපයීම (60/70) – 100 MT	124,180,000.00
31	මාර්ග සංවර්ධන අධිකාරියේ සූරියවැව ක්‍රෂර් කම්හලේ ගල් ප්‍රවාහනය සඳහා ප්‍රවාහන පහසුකම් සැපයීම	3,000,000.00
32	මාර්ග සංවර්ධන අධිකාරියේ අඹන්පොල ක්‍රෂර් කම්හලේ ගල්	3,000,000.00

අංකය	ප්‍රසම්පාදන අයිතමයේ විස්තර	කොන්ත්‍රාත් මුදල රු.
	ප්‍රවාහනය සඳහා ප්‍රවාහන පහසුකම් සැපයීම	
33	බිබිල මැදගම කෙහෙල්කොටුව කළුගහවාඩිය මාර්ගයේ දහමල්ඔය හරහා පාලමක් ඉදිකිරීම	33,292,275.00
34	කැරගල ඇස්පෝල්ට් යන්ත්‍රාගාරයේ සිට ඇස්පෝල්ට් ප්‍රවාහනය	30,000,000.00
35	කොටදෙණියාව ඇස්පෝල්ට් යන්ත්‍රාගාරයේ සිට ඇස්පෝල්ට් ප්‍රවාහනය	30,000,000.00
36	මැදයාය ඇස්පෝල්ට් යන්ත්‍රාගාරය සඳහා සමස්ත ද්‍රව්‍ය සැපයීම	122,103,000.00
37	සූරියවැව ඇස්පෝල්ට් යන්ත්‍රාගාරයේ සිට ඇස්පෝල්ට් ප්‍රවාහනය	93,020,000.00
38	බෝගස්වැව සිට සපුමල් ගස්කඩ රජමහා විහාර පාර සහ බෝගස්වැව-නැඩුන්කේනි මාර්ගය දක්වා 500m3 සමස්ථ මූලික ද්‍රව්‍ය සැපයීම	877,032.95
39	බෝගස්වැව සිට සපුගස්කඩ රජමහා විහාරය දක්වා අඩි 2 ක විෂ්කම්භයකින් යුත් හියුම් පයිප්පය 12 සැපයීම	165,000.00
40	බිටුමන් තොග මිලදී ගැනීම (80/100)	17,900,000.00
41	ඌව පළාත සඳහා මාර්ග සලකුණු කිරීමේ ද්‍රව්‍ය මිලදී ගැනීම	30,111,200.00
42	(60/70) ශ්‍රේණියේ බිටුමන් තොග මිලදී ගැනීම- 1500 MT	134,250,000.00
43	බස්නාහිර පළාත සඳහා මාර්ග සලකුණු කිරීමේ ද්‍රව්‍ය මිලදී ගැනීම	72,834,925.00
44	මධ්‍යම පළාත සඳහා මාර්ග සලකුණු ද්‍රව්‍ය මිලදී ගැනීම	52,713,600.00
45	උතුරු පළාත සඳහා මාර්ග සලකුණු කිරීමේ ද්‍රව්‍ය මිලදී ගැනීම	39,457,175.00
46	සබරගමුව පළාත සඳහා මාර්ග සලකුණු කිරීමේ ද්‍රව්‍ය මිලදී ගැනීම	55,786,087.00
47	පොලොන්නරුවේ අස්පොල්ට් යන්ත්‍රාගාරයට සමස්ථ ද්‍රව්‍ය සැපයීම	175,579,500.00
48	කොටදෙණියාව අස්පොල්ට් යන්ත්‍රාගාර සඳහා ප්‍රවාහන පහසුකම් සැපයීම	50,000,000.00
49	කැරගල අස්පොල්ට් යන්ත්‍රාගාර සඳහා ප්‍රවාහන පහසුකම් සැපයීම	50,000,000.00
50	ඉංගිරිය අස්පොල්ට් යන්ත්‍රාගාර සඳහා ප්‍රවාහන පහසුකම් සැපයීම	50,000,000.00
51	කොත්මලේ අස්පොල්ට් යන්ත්‍රාගාර සඳහා ප්‍රවාහන පහසුකම් සැපයීම	50,000,000.00
52	මැදවච්චිය අස්පොල්ට් යන්ත්‍රාගාර සඳහා ප්‍රවාහන පහසුකම් සැපයීම	50,000,000.00
53	පොලොන්නරුව අස්පොල්ට් යන්ත්‍රාගාර සඳහා ප්‍රවාහන පහසුකම් සැපයීම	50,000,000.00
54	සූරියවැව ක්‍රෂර් කම්හලට බෝල්ඩර් ද්‍රව්‍ය ප්‍රවාහනය කිරීම	3,000,000.00
55	සූරියවැව ක්‍රෂර් කම්හලට බෝල්ඩර් ද්‍රව්‍ය ප්‍රවාහනය කිරීම	3,000,000.00
56	ප්‍රධාන පාලම්වල දිය යට විමර්ශනය සඳහා සේවා සපයන්නන් ප්‍රසම්පාදනය කිරීම	5,380,000.00
57	පාලම් කළමනාකරණ තක්සේරු ඒකකය, සෙත්සිරිපාය II අදියරෙහි සාමාන්‍ය විගණනය	312,000.00
58	නැගෙනහිර පළාත සඳහා මාර්ග සලකුණු කිරීමේ ද්‍රව්‍ය මිලදී ගැනීම	18,804,400.00
59	වයඹ පළාත සඳහා මාර්ග සලකුණු කිරීමේ ද්‍රව්‍ය මිලදී ගැනීම	62,891,587.50
60	උතුරු මැද පළාත සඳහා මාර්ග සලකුණු කිරීමේ ද්‍රව්‍ය මිලදී ගැනීම	13,152,015.00
61	දකුණු පළාත සඳහා මාර්ග සලකුණු කිරීමේ ද්‍රව්‍ය මිලදී ගැනීම	68,246,806.50
62	බලංගොඩ ඇස්පෝල්ට් යන්ත්‍රාගාරය සඳහා ප්‍රවාහන පහසුකම් සැපයීම	50,000,000.00
63	සූරියවැව ඇස්පෝල්ට් යන්ත්‍රාගාරයට සමස්ථ ද්‍රව්‍ය සැපයීම	190,732,063.39
64	මැදයාය ඇස්පෝල්ට් යන්ත්‍රාගාරය සඳහා ප්‍රවාහන පහසුකම් සැපයීම	50,000,000.00
65	බිටුමන් තොග සැපයීම - 750MT	91,500,000.00

අංකය	ප්‍රසම්පාදන අයිතමයේ විස්තර	කොන්ත්‍රාත් මුදල රු.
66	කොළඹ සහ මහනුවර සඳහා බිටුමන් ඉමල්ෂන් CSS-1 සහ CRS-1 සැපයීම	7,144,000.00
67	කොළඹ ප්‍රධාන ඉංජිනේරු කාර්යාලයට වීදි ලාම්පු 400ක් සැපයීම	17,198,800.00
68	අඹන්පොල ඇස්පෝල්ට් යන්ත්‍රාගාරය සඳහා ප්‍රවාහන පහසුකම් සැපයීම	50,000,000.00
69	සූරියවැව ඇස්පෝල්ට් යන්ත්‍රාගාරය සඳහා ප්‍රවාහන පහසුකම් සැපයීම	50,000,000.00
70	ග්‍රාමීය පාලම් ඉදිකිරීම් අංශයට ද්විත්ව කැබ් රථ සැපයීම	5,000,000.00
71	මාර්ග සංවර්ධන අධිකාරියේ ඇස්පෝල්ට් යන්ත්‍රාගාරය සඳහා බිටුමන් තොග 1500 MT මිලදී ගැනීම	194,850,000.00
72	මාර්ග සංවර්ධන අධිකාරියේ මැදවච්චිය යන්ත්‍රාගාරය සඳහා ඩ්‍රම් බිටුමන් 5000ක් මිලදී ගැනීම	116,820,000.00
73	මාර්ග සංවර්ධන අධිකාරියේ සූරියවැව යන්ත්‍රාගාරය සඳහා ඩ්‍රම් බිටුමන් 2500 ක් මිලදී ගැනීම	58,387,500.00
74	මාර්ග සංවර්ධන අධිකාරියේ අඹන්පොල යන්ත්‍රාගාරය සඳහා ඩ්‍රම් බිටුමන් 2500 ක් මිලදී ගැනීම	58,275,000.00
75	මගනැගුම මහමැදුර සඳහා සනීපාරක්ෂක සේවා සැපයීම	20,701,000.00
76	බිටුමන් තොග සැපයීම – 1750 MT	191,625,000.00
77	පාලම්වල දිය යට විමර්ශනය - කැබලි අංක 1, 2 සහ 3	5,380,000.00
78	තුඩැල්ල - පමුණුගම - තලාහේන - මීගමුව මාර්ගයේ (බී 425) පාලම අංක 20/4 හි දිය යට විමර්ශනය	1,425,960.00
	එකතුව	3,118,564,517.41

2021 වර්ෂය තුළ, -2021 වර්ෂය සඳහා සැපයුම්කරුවන්, කොන්ත්‍රාත්කරු ලියාපදිංචි කිරීම ප්‍රකාශයට පත් කරන ලද අතර ප්‍රසම්පාදන සැලැස්ම - 2022 සම්පූර්ණ කර මණ්ඩල අනුමැතිය සඳහා ඉදිරිපත් කරන ලදී.

16. පිරිස් කළමනාකරණය

පිරිස් සහ කාර්යාල කළමනාකරණයට අදාළ ප්‍රතිපත්ති, රීති, රෙගුලාසි, ක්‍රියා පටිපාටි, අත්පොත් සහ උපදෙස් සැකසීම පිරිස් කළමනාකාරණය යටතේ සිදු කෙරේ. තවද, සේවක පරිසරය වැඩිදියුණු කිරීම සඳහා නීති රීති සහ ක්‍රියා පටිපාටි පනවන චක්‍රලේඛ නිකුත් කිරීම මෙන්ම චක්‍රලේඛ ක්‍රියාත්මක කිරීම අධීක්ෂණය කිරීම පුද්ගල කළමනාකරණය යටතේ සිදු කරන වැදගත් කාර්ය භාරයකි. මාර්ග සංවර්මධන අධිකාරියේ සමස්ත පුද්ගල කළමනාකරණ කාර්යයන් සඳහා මානව සම්පත් හා පරිපාලන අංශය වගකිව යුතුය.

අංශයේ ප්‍රධාන වගකීම

- සේවක උසස්වීම් සඳහා නිර්ණායක සැකසීම සහ සම්මුඛ පරීක්ෂණ පැවැත්වීම
- සේවකයින් සමඟ තොරතුරු හුවමාරු කර ගැනීම
- කළමනාකරණ අවශ්‍යතා පිළිබඳ සමීක්ෂණ පැවැත්වීම
- රැකියා සබඳතා
- මානව සම්පත් / උපාය මාර්ගික සැලසුම්
- වැඩ අධ්‍යයන මානව සම්පත් සැලසුම් සකස් කිරීම
- සේවක අවශ්‍යතා අධ්‍යයනය සහ තක්සේරු කිරීම
- බඳවා ගැනීමේ පරිපාටි සකස් කිරීම / සංශෝධනය කිරීම
- ප්‍රතිසංස්කරණ / ව්‍යුහාත්මක වෙනස්කම්
- අභ්‍යන්තර හා බාහිර බඳවා ගැනීම් සඳහා අවශ්‍ය පියවර පැවැත්වීම
- නව බඳවා ගැනීම් සඳහා ප්‍රේරක පුහුණුව ලබා දීම
- රාජකාරි ලැයිස්තුව / රැකියා විස්තරය සකස් කිරීම
- පැමිණීම සහ නිවාඩු කළමනාකරණය
- කාර්ය සාධන කළමනාකරණය / කාර්ය සාධන ඇගයීම් පද්ධතිය සකස් කිරීම සහ ක්‍රියාත්මක කිරීම
- සේවක නියැලීම - කාර්ය මණ්ඩලය වැඩ කිරීමට සම්බන්ධ කර ගැනීමට මූලිකත්වය ගැනීම
- ශ්‍රම බලකාය කළමනාකරණය - සේවක අතෘප්තිමත් බව / සේවකයා සම්බන්ධ ගැටළු විසඳීම
- ව්‍යවස්ථාපිත අනුකූලතා අවම වැටුප, නිවාඩු හිමිකම් ආදිය
- සේවක අභිප්‍රේරණය- විශිෂ්ටතා කාර්ය සාධනය, කාර්මික සබඳතා, අමතර සුදුසුකම් ආදිය සඳහා ප්‍රතිවර්තනය කිරීම
- සාර්ථක සැලසුම් - විශ්‍රාම ගැනීම, ඉල්ලා අස්වීම භාර ගැනීම, භාරදීම
- සේවක සුබසාධන වන්දි සහ ප්‍රතිලාභ
- EPF/ETF, පාරිතෝෂික ආදිය ගෙවීම
- මාර්ග සංවර්ධන අධිකාරියේ නිලධාරීන්ට සහ සේවකයන්ට සුබසාධන කටයුතු සංවිධානය කිරීම

පරිපාලන අංශය විසින් සිදු කරනු ලබන පරිපාලන කාර්යයන් පහත පරිදි දැක්විය හැක;

- පරිපාලන සැලසුම්
- සියලුම සේවකයින්ගේ තොරතුරු සහ දත්ත කළමනාකරණය
- ප්‍රතිපත්ති සැකසීම
- චක්‍රලේඛ සහ ස්ථාවර නියෝග නිකුත් කිරීම
- ප්‍රතිපත්ති, චක්‍රලේඛ සහ නියෝග ක්‍රියාත්මක කිරීම
- විනය සහ ආරක්ෂාව පවත්වා ගැනීම
- තැපෑල් නඩත්තු කිරීම - නියමිත වේලාවට ලිපි ලැබීම හා යැවීම සිදු කිරීම
- වත්කම් ප්‍රසම්පාදනය සහ සියලු වත්කම් නඩත්තු කිරීම

- වෙනත් අදාළ බලධාරීන් / සංවිධානය සමඟ සන්නිවේදනය පවත්වා ගැනීම
- විනය පටිපාටිය ක්‍රියාත්මක කිරීම
- අධිකරණ ආයතනය සමඟ නීතිමය කටයුතු හැසිරවීම
- කාර්යාල ගොඩනැගිලි ආදිය සහ අනෙකුත් පහසුකම් පවත්වාගෙන යාම
- රජය සහ පළාත් පාලන ආයතන විසින් ප්‍රකාශයට පත් කරන ලද පොදු සමාජ ආගමික ක්‍රියාකාරකම්වලට සහභාගී වීම
- ආපදා ආදියේ හදිසි අවස්ථාවන්ට ප්‍රතිචාර දැක්වීම.
- වෙනත් ආයතනවල ධනාත්මක සබඳතාවයක් පවත්වා ගැනීම
- ගබඩා ඇතුළු සැපයුම් කටයුතු හැසිරවීම
- පාර්ලිමේන්තු, පළාත් සභා මැතිවරණ ආදියේ රාජකාරි.
- සංචාරක බංගලාවේ, නිල නිවාසවල සේවය සැපයීම
- අවශ්‍ය විටදී කාර්යයන් සංවිධානය කිරීම

වගුව 52: 2021 වර්ෂය අවසානයේ මාර්ග සංවර්ධන අධිකාරියේ සේවක බලකාය

අනු අංකය	තනතුරු	අනුමත සේවක සංඛ්‍යා ගණන		සිටින කාර්ය මණ්ඩලය	
		ස්ථිර	කොන්ත්‍රාත්	ස්ථිර	කොන්ත්‍රාත්
(i)	ජ්‍යෙෂ්ඨ කළමනාකරණ සේවය	88	0	66	0
(ii)	ඉංජිනේරු සේවය	777	35	739	46
(iii)	පරිපාලන නිලධාරී සේවය	19	0	10	0
(iv)	තොරතුරු තාක්ෂණ සේවය	19	1	18	4
(v)	ගණකාධිකාරී සේවය	31	4	29	0
(vi)	නීති නිලධාරී සේවය	6	0	6	0
(vii)	කණිෂ්ඨ පරිපාලන නිලධාරී සේවය	47	1	31	0
(viii)	ගිණුම්/ විගණන සහකාර සේවය	70	2	55	0
(ix)	ආශ්‍රිත නිලධාරී සේවය	78	0	67	0
(x)	තාක්ෂණික සේවය - I	103	0	64	0
(xi)	තාක්ෂණික සේවය - II	1,145	54	975	4
(xii)	ලිපිකරු හා සමාන්තර සේවා	2,266	112	2,353	48
(xiii)	සහායක සේවා	2,604	0	2,310	99
	උප එකතුව	**7,253**	**209**	**6,723**	**201**
(xiv)	කම්කරු (ස්ථිර)	4,024	0	2,881	1,267
(xv)	කම්කරු (අනියම්)				
	එකතුව	**11,277**	**209**	**9604**	**1,468**

පරිපාලන අංශයේ වාර්ෂික වැඩසටහන, අනුමත බඳවා ගැනීමේ පරිපාටි සහ සේවක සංඛ්‍යාව මත පදනම්ව පහත සඳහන් ක්ෂේත්‍ර මත වසර ආරම්භයේදී තීරණය කරනු ලැබේ.

- බඳවා ගැනීම්
- උසස් වීම්
- කළමනාකරණය සේවා දෙපාර්තමේන්තුව වෙතින් අනුමැතිය ලබා ගැනීම සඳහා සංශෝධිත බඳවා ගැනීමේ පරිපාටි කෙටුම්පත් අවසන් කිරීම

2021 වර්ෂය තුළ ක්‍රියාකාරකම්වල ප්‍රගතිය

වගුව 53: 2021 වර්ෂය තුළ ක්‍රියාකාරකම්වල ප්‍රගතිය

විස්තරය	**සේවකයන් ගණන**
බාහිර බඳවා ගැනීම්	239
අභ්‍යන්තර බඳවා ගැනීම්	45
උසස් වීම්	662
විශ්‍රාම ගැනීම්	96
මරණ	19
ඉල්ලා අස්වීම්	20
වැටුප් රහිත නිවාඩු (විදේශීය/දේශීය රැකියා සඳහා)	7
තනතුර අතහැර යාම	8
වැඩ තහනම් කිරීම/සේවය අවසන් කිරීම	1

වගුව 54: 2021 වර්ෂය තුළ මාර්ග සංවර්ධන අධිකාරියේ විනය පරීක්ෂණ පිළිබඳ විස්තර

විමර්ශනය	**සිදු කරමින් පවතින**	**නිම කළ ගණන**
මූලික විමර්ශන	70	16
විධිමත් විනය පරීක්ෂණ	15	04

- අධ්‍යක්ෂ පරිපාලනය විසින් ස්ථාන මාරු ක්‍රියාත්මක කරන අතර අධ්‍යක්ෂ ජනරාල්වරයාගේ අනුමැතියට අනුව ස්ථාන මාරු නියෝග නිකුත් කරයි.
- සේවකයින්ට සේවා සහතික නිකුත් කිරීම
- 2021 වර්ෂය තුළ, ශිෂ්‍යත්ව ප්‍රදානය කිරීම සම්බන්ධයෙන් මාර්ග සංවර්ධන අධිකාරියේ නිලධාරියා සඳහා ගරු අග්‍රාමාත්‍යවරයා සහ විදේශ සම්පත් දෙපාර්තමේන්තුවේ අනුමැතිය ලබා ගන්නා ලදී.
  ශිෂ්‍යත්ව වැඩසටහන් 5 ක් සඳහා සේවකයන් 9ක් නම් කරන ලද අතර ඉන් සේවකයන් 2ක් සහභාගී විය.
- 2018 සහ 2019 වාර්ෂික වාර්තාව සිංහල සහ දෙමළ භාෂාවලට පරිවර්තනය කර මහාමාර්ග අමාත්‍යාංශයට ඉදිරිපත් කරන ලදී.
- පරිපාලන චක්‍රලේඛ ලිපි සහ පරිපාලන චක්‍රලේඛ 104ක් නිකුත් කර ඇත.
- වාහන බලපත්‍ර නිකුත් කිරීම සඳහා වන අයදුම්පත් සකස් කර මහාමාර්ග අමාත්‍යාංශය වෙත යොමු කරන ලදී.
- වටිනාකම රු.162,325,922.46 ක් වූ සේවක පාරිතෝෂික හිමිකම් 138 ක් පියවීමට කටයුතු කර ඇත.
- සේවකයින්ට භාෂා දීමනාව ගෙවීමට සහ සේවකයින්ට අමතර වර්ධක දීමනාවක් ගෙවීමට කටයුතු කරන ලදී.
- කළමනාකරණ සේවා චක්‍රලේඛයට අනුව සේවකයින්ගේ වැටුප් පරිවර්තනය
- පහත සඳහන් සේවා නියුක්තයන්ගේ භාර අරමුදල සහ සේවක අර්ථසාධක අරමුදලේ ප්‍රතිලාභ ලබා ගැනීම සඳහා සේවකයින්ට සහාය වීම;
  - සේවක අර්ථසාධක අරමුදල් ආපසු ගෙවීමේ අයදුම්පත්
  - සේවා නියුක්තයන්ගේ භාර අරමුදල් ආපසු ගෙවීමේ අයදුම්පත

- සේවක අර්ථසාධක අරමුදලේ සඳහන් නම/හැඳුනුම්පත/අරමුදල් ප්‍රමාණය(අනුව්‍යාජ අංක) නිවැරදි කිරීම
- සේවා නියුක්තයන්ගේ භාර අරමුදලේ සඳහන් නම/හැඳුනුම්පත/ අරමුදල් ප්‍රමාණය (අනුව්‍යාජ අංක) නිවැරදි කිරීම
- බී කාඩ්පත් හා ඒබීඑව් අයදුම්පත් ලියාපදිංචිය

වගුව 55 : සේවක අර්ථසාධක අරමුදල / සේවා නියුක්තයන්ගේ භාර අරමුදල් අයදුම්පත් – 2021

විස්තරය	සංඛ්‍යාව
සේවක අර්ථසාධක අරමුදල් (K) ප්‍රතිලාභ ගෙවීමේ අයදුම්පත්	138
සේවා නියුක්තයන්ගේ භාර අරමුදලේ ප්‍රතිලාභ ගෙවීමේ අයදුම්පත්	141
'බී' කාඩ්පත් හා ඒබීඑව් ලියාපදිංචි කිරීම	397
එකතුව	676

වගුව 56: සීමාසහිත මාර්ග ඉදිකිරීම් සහ සංවර්ධන සමාගම සඳහා 2021 වර්ෂය තුළ සිදු කළ කටයුතු

විස්තරය	සංඛ්‍යාව
සේවක අර්ථසාධක අරමුදලේ (K) ප්‍රතිලාභ ගෙවීමේ අයදුම්පත්	89
සේවා නියුක්තයන්ගේ භාර අරමුදලේ ප්‍රතිලාභ ගෙවීමේ අයදුම්පත්	36
'බී' කාඩ්පත් හා ඒබීඑව් ලියාපදිංචි කිරීම	44
එකතුව	169

- පරිපාලන අංශය විසින් මාර්ග සංවර්ධන අධිකාරිය වෙත ආදායමක් ලබා ගැනීම සඳහා සංචාරක බංගලා වෙන්කරවා ගැනීම සහ සකස් කිරීම සම්බන්ධීකරණය කරනු ලබයි.
- ඇඟිලි සලකුණු මුද්‍රණ යන්ත්‍ර භාවිතයෙන් පැමිණීම පිටවීම සලකුණු කරනු ලැබේ.
  දැනට මාර්ග සංවර්ධන අධිකාරියේ පරිපාලන අංශය, සැලසුම් අංශයේ ප්‍රධාන කාර්යාලයේ සහාය ඇතිව ප්‍රධාන කාර්යාල පරිශ්‍රයේ පිහිටි සියලුම අංශවල පැමිණීමේ වාර්තා බාගත කරයි.

ප්‍රගතියට ඇති බාධාවන්

- මානව සම්පත් කළමනාකරණ තොරතුරු පද්ධතිය මෙතෙක් හඳුන්වා දී නොමැති අතර මෙම අංශය සඳහා කිසිදු මෘදුකාංගයක් ස්ථාපනය කිරීමේ හැකියාවක් නොමැත.
- දැනුම සහ පළපුරුදු කාර්ය මණ්ඩලය නොමැති වීම.
- පරිපාලන හා මානව සම්පත් කටයුතු වලදී තොරතුරු තාක්ෂණ යාන්ත්‍රණය භාවිතා නොකිරීම.
- වැදගත් පුරප්පාඩු මෙතෙක් පුරවා නොමැති අතර එවැනි පුරප්පාඩු පිරවීමට අනුප්‍රාප්තික සැලසුමක් නොමැත.
- ස්ථාන මාරු ප්‍රතිපත්තිය නිසි ලෙස ක්‍රියාත්මක නොවේ.
- කාර්ය මණ්ඩලයට පුහුණු පහසුකම් නොමැතිකම.
- නිසි බඳවා ගැනීමේ පරිපාටි නොමැති වීම.
- කොවිඩ් 19 ගැටලු හේතු නිසා වාර්ෂික ස්ථාන මාරුවීම් සුමටව ක්‍රියාත්මක කිරීමේ අපහසුතාව.
- නාමයෝජනා ප්‍රමාද වීම හේතුවෙන් මහාමාර්ග අමාත්‍යාංශයට සහ විදේශ සම්පත් දෙපාර්තමේන්තුවට අයදුම්පත් යොමු කිරීමේ අපහසුතාව.

- බිල්පත් ඉදිරිපත් කිරීම ප්‍රමාද වීම සහ රෝග විනිශ්චය කාඩ්පත, බදු ඉන්වොයිසිය වැනි වැදගත් ලියකියවිලි නොමැති වීම සහ වෛද්‍ය යෝජනා ක්‍රමය පිළිබඳ නිසි දැනුමකින් තොරව එහි සාමාජිකත්වය ලබා ගැනීම.

සුභසාධන කටයුතු

2021 වර්ෂය තුළදී ද සේවකයින් සඳහා මෝටර් සයිකල් ණය සහ ආපදා ණය නිකුත් කරන ලදී.

වගුව 57: 2021 වසර සඳහා මාර්ග සංවර්ධන අධිකාරියේ ණය පිළිබඳ විස්තර

ණය වර්ගය	සේවකයන් ගණන	ණය ප්‍රමාණය
මෝටර් සයිකල් ණය	09	රු.1,350,000.00
ආපදා ණය	294	රු. 60,542,450.00

වර්ෂය තුළ, ස්වයං රක්ෂණ යෝජනා ක්‍රමයේ ප්‍රතිලාභ වෛද්‍ය රක්ෂණ හිමිකම් 190 ක් සහ විශ්‍රාමිකයින් සඳහා පියවීම් 10 ක් ලෙස සේවකයින්ට ගෙවන ලදී.

කළමනාකරණය විසින් සංවිධානය කරනු ලබන පහත සඳහන් සුබසාධන යෝජනා ක්‍රම, පරිපාලන අංශය විසින් මෙහෙයවයි.

- කාර්ය මණ්ඩලයට සහන ගාස්තු යටතේ ප්‍රවාහන පහසුකම් සැපයීම.
- මාර්ග සංවර්ධන අධිකාරියේ සේවකයින්ගේ යහපැවැත්ම සොයා බැලීම සඳහා සුභසාධන මධ්‍යස්ථානයක් ක්‍රියාත්මක කිරීම.
- සේවකයින්ගේ යහපත් සෞඛ්‍යයක් පවත්වා ගැනීම සඳහා ශරීර සුවතා මධ්‍යස්ථානයක් ක්‍රියාත්මක කිරීම.
- කාර්ය මණ්ඩලයට සහනදායී මිල ගණන් යටතේ ආහාර සැපයීම සඳහා ආපනශාලා ක්‍රියාත්මක කිරීම.
- සිසිල් බීම, යුෂ ආදිය සැපයීම සඳහා යුෂ බාර් සහ කුල් බාර් ක්‍රියාත්මක කිරීම.
- මාර්ග සංවර්ධන අධිකාරියේ සේවකයින්ගේ දරුවන් සහනදායී මිල ගණන් යටතේ රැකබලා ගැනීම සඳහා දිවා සුරැකුම් මධ්‍යස්ථාන ක්‍රියාත්මක කිරීම.

17. මූල්‍ය කළමනාකරණය

මාර්ග සංවර්ධන අධිකාරියේ ප්‍රධාන කාර්යාලයේ මූල්‍ය අංශය මගින් මූල්‍ය කළමනාකරණ ක්‍රියාකාරකම් සිදු කරනු ලැබේ. අධ්‍යක්ෂ මූල්‍ය හට අතිරේක අධ්‍යක්ෂවරුන් දෙදෙනෙකු, ජ්‍යෙෂ්ඨ හා කණිෂ්ඨ ගණකාධිකාරීන් කණ්ඩායමකගේ හා සහාය කාර්ය මණ්ඩලයේ සහයෝගය ලැබේ. දිවයිනේ සියලුම කලාප ආවරණය වන පරිදි ප්‍රාදේශීය ගණකාධිකාරීවරුන් දස දෙනෙකු සහ අදාළ කාර්ය මණ්ඩලය ක්‍රියාත්මක වේ.

මාර්ග සංවර්ධන අධිකාරියේ සමස්ත මූල්‍ය කළමනාකරණයේ වගකීම මූල්‍ය අංශයට පැවරේ. මාර්ග ඉදිකිරීම් හා නඩත්තුව සඳහා අමාත්‍යාංශය වෙතින් ලැබෙන අරමුදල්, උපයෝගිතා වැඩ සඳහා මාර්ගයේ සිදුවන හානි ප්‍රතිස්ථාපනය සඳහා විවිධ රජයේ හා පුද්ගලික ආයතන හා පුද්ගලයන් වෙතින් ලැබෙන අරමුදල්, මුදල් අංශය විසින් කළමනාකරණය කරනු ලබයි.

ග්‍රාමීය පාලම් ඉදිකිරීම් ඒකකය, ඇස්පෝල්ට් යන්ත්‍රාගාර නඩත්තු ඒකක, අධිවේගී මාර්ග මෙහෙයුම් සහ නඩත්තු අංශය, පර්යේෂණ හා සංවර්ධන අංශය, දේශීය බැංකු ව්‍යාපෘති අංශය, ඉඩම් අංශය, ඉදිකිරීම් අංශය, විශේෂ ව්‍යාපෘති අංශය යන ස්ථානවල ගණකාධිකාරීන් පරිපාලනමය වශයෙන් අදාළ ඒකකයේ / අංශයේ අධ්‍යක්ෂ යටතේ ක්‍රියාත්මක වේ.

ඉහත දෑ වලට අමතරව, සියලුම ප්‍රධාන ඉංජිනේරුවන් සිවිල් වැඩ සහ පොදු කාර්ය පිරිවැය සඳහා වන සුළු ගෙවීම් වෙනුවෙන් නිල බැංකු ගිණුම් සඳහා මුදල් අංශය විසින් නිදහස් කරන අරමුදල් භාවිතා කරනු ලබයි. නියමිත මූල්‍ය අධිකාරියේ සීමාවන්ට යටත්ව අරමුදල් භාවිතා කරමින් ද්‍රව්‍ය හා සේවා මිලදී ගැනීමට බලය ඇති බැවින් ප්‍රධාන ඉංජිනේරුවන් විසින් මෙහෙයවන මාර්ග නඩත්තු හා සංවර්ධන කටයුතු වල මනා කාර්ය සාධනයක් පෙන්නුම් කරයි.

පහත විස්තර කර ඇති පරිදි මූල්‍ය අංශය ඒකක 9 කින් සමන්විත වේ;

ආදායම් ඒකකය

දැන්වීම් පුවරු, යන්ත්‍රෝපකරණ හා උපකරණ කුලියට දීම, මාර්ග තොරණ් ආදියෙන් ලැබෙන ආදායම් එකතු කිරීම හා තැන්පත් කිරීම ආදායම් රැස් කිරීමේ ඒකකයට පැවරී ඇත. ආදායම් වෙන් කිරීම මුදල් අංශයේ ආදායම් ඒකකය හරහා සිදු කෙරෙන අතර අරමුදල් කළමනාකරණය ද මෙම ඒකකය විසින් සිදු කරනු ලැබේ. වර්ෂය තුළ ඔවුන්ගේ අරමුදල් කළමනාකරණ කටයුතු වලින් පොළිය ලෙස රුපියල් මිලියන 655.6 ක් උපයා ඇත.

වැටුප් ඒකකය

වැටුප් ඒකකය විසින් වැටුප් සකස් කිරීම, වැටුප් ගෙවීම සැකසීම සහ නියමිත වේලාවට වැටුප් ගෙවීම සිදු කරයි. සේවක අර්ථසාධක අරමුදලේ සහ සේවා නියුක්තිකයන්ගේ භාර අරමුදලේ වාර්තා පවත්වා ගැනීම සහ කාර්ය මණ්ඩල ණය ගෙවීම සහ එය අයකර ගැනීමේ ක්‍රියාවලිය වැටුප් ඒකකයේ සහභාගීත්වයෙන් සිදු වේ.

වත්කම් හා ගබඩා ඒකකය

මුදල් අංශයේ වත්කම් හා ගබඩා ඒකකය, ප්‍රධාන කාර්යාලයේ අංශවලට හා ඇතැම් විට ප්‍රාදේශීය කාර්යාලයන් වෙත කාර්යාල උපකරණ හා ලිපිද්‍රව්‍ය සැපයීම සිදු කරයි. තවද මෙම අංශය විසින් වත්කම් හා තොග පාලන පියවරයන් ක්‍රියාත්මක කරන අතර, කාර්යාල ලීබඩු, යන්ත්‍ර, ඉඩම් හා ගොඩනැඟිලි ආදී සියලු වත්කම් සඳහා වත්කම් ලේඛනයක් නඩත්තු කරනු ලැබේ. ස්ථාවර වත්කම් සමීක්ෂණය වාර්ෂිකව දිවයින පුරා සිදු කෙරේ.

2021 වර්ෂය සඳහා වාර්ෂික තොග සමීක්ෂණය 2021 සැප්තැම්බර් මාසයේදී සිදු කරන ලද අතර නියමිත පරිදි සම්පූර්ණ කරන ලදී. තොග / ගබඩා භාණ්ඩවල භෞතික සමීක්ෂණය ද වසර අවසානයේ ආරම්භ කර අවසන් කරනු ලැබීය. තවද, සම්පූර්ණ කරන ලද ව්‍යාපෘතිවල වත්කම් පවරා

ගැනීම භාවිතා කළ නොහැකි මට්ටමේ පවතින වත්කම් හා තොග බැහැර කිරීමට අදාළ ක්‍රියාකාරකම් ද මෙම ඒකකය විසින් සිදු කරන ලදී.

අවසන් ගිණුම් ඒකකය

මුදල් අංශයේ අවසාන ගිණුම් ඒකකය, මාසික ගිණුම්, වාර්ෂික මූල්‍ය ප්‍රකාශන හා වෙනත් මූල්‍ය තොරතුරු පිළියෙල කිරීම, කළමනාකාරිත්වයට හා අධ්‍යක්ෂ මණ්ඩලය වෙත ඉදිරිපත් කිරීමේ වගකීම දරයි. මූල්‍ය අංශයේ ප්‍රාදේශීය ගිණුම්කරණ ඒකකයෙන් සහ අනෙකුත් ක්‍රියාකාරී ඒකකවලින් අදාළ තොරතුරු ලබා ගැනීමෙන් සාමාන්‍ය ලෙජර ගිණුම් පවත්වාගෙන යාමේ වගකීම මෙම ඒකකය සතුය. මීට අමතරව, විගණන විමසුම් හා විගණන වාර්තා වලට පිළිතුරු සැපයීම සඳහා ප්‍රධාන කාර්යාලයේ සහ පළාත් කාර්යාලවල ක්‍රියාකාරී අංශවලින් තොරතුරු එක්රැස් කිරීම මෙම ඒකකයට පවරා ඇත.

ප්‍රාදේශීය ගිණුම් ඒකකය

ප්‍රධාන කාර්යාලයේ ප්‍රාදේශීය ගිණුම් ඒකකය, අරමුදල් අවශ්‍යතාවයන් හා බිල්පත් නිරවුල් කිරීම සඳහා සියලුම ප්‍රාදේශිය හා අධිවේගී මාර්ග ගණකාධිකාරීන් සමඟ සම්බන්ධීකරණය වන අතර මූල්‍ය වාර්තාකරණය සඳහා ප්‍රාදේශීය හා අධිවේගී මාර්ග ගණකාධිකාරීන් වෙතින් සියලු ගිණුම් තොරතුරු රැස් කරනු ලබයි.

ගෙවීම් ඒකකය

මුදල් අංශයේ ගෙවීම් ඒකකය ප්‍රධාන කාර්යාලයේ සියලුම අංශවලට සම්බන්ධ සියලු ගෙවීම් නිරවුල් කිරීම සිදු කරයි. (ඉදිකිරීම් අංශයේ ගණකාධිකාරී විසින් නිරවුන් කරන වැඩ බිල්පත් හැර) මෙම ගෙවීම් වලට සිවිල් වැඩ සඳහා, ඉන්ධන හා කාර්යාල උපකරණ, වාහන අළුත්වැඩියාව හා නඩත්තුව, කුලී, කාර්යාල අවශ්‍යතා, කාර්ය මණ්ඩල වැටුප්, සේවක ණය ආදී පොදු කාර්ය ගෙවීම් ආදිය අයත් වේ.

අයවැය හා බදු ඒකකය

මුදල් අංශයේ බදු ඒකකයට මාර්ග සංවර්ධන අධිකාරියේ පොදු කාර්ය පිරිවැය ඇස්තමේන්තු පිළියෙළ කිරීමේ වගකීම පැවරී ඇත. තවද, මෙම ඒකකය, මුදල් පනත අනුව මාර්ග සංවර්ධන අධිකාරියේ සමස්ත අයවැය පිළියෙළ කිරීම හා එය අධ්‍යක්ෂ මණ්ඩලය වෙත පැවරීමේ වගකීම දරයි. එය මාර්ග සංවර්ධන අධිකාරියේ අංශ සහ කලාප සඳහා පොදු කාර්ය ප්‍රතිපාදන බෙදා හැරීමේ නිරත වේ.
ඊට අමතරව, සියළුම බදු ගණනය කිරීම් සකස් කිරීම සහ ප්‍රතිලාභ දේශීය ආදායම් දෙපාර්තමේන්තුවට ඉදිරිපත් කිරීම සහ බදු පරිපාලන කටයුතු සඳහා සහභාගී වීම සඳහා මෙම ඒකකය වගකිව යුතුය.

විවිධ ගෙවීම් ඒකකය

මුදල් අංශයේ විවිධ ගෙවීම් ඒකකයට ප්‍රධාන වශයෙන් සහභාගිත්ව වෛද්‍ය රක්ෂණ යෝජනා ක්‍රමය මෙහෙය වීමේ වගකීම පවරා ඇත. ඊට අමතරව, මෙම ඒකකය ඒකාබද්ධ දීමනාව, පරිවර්තිත දීමනාව, අතිකාල දීමනාව, නිවාඩු දින දීමනාව හා සහනදායී ණය සඳහා පොලිය ප්‍රතිපූර්ණය කිරම වැනි විවිධ ගෙවීම් සිදු කරනු ලබයි.

පරිපාලන ඒකකය

මූල්‍ය අංශයේ පරිපාලන ඒකකය, අංශයේ සේවයේ නියුතු කාර්ය මණ්ඩලයට අදාළ කාර්යාල පරිපාලන කටයුතු සිදු කිරීමට සහාය වේ. පුද්ගලික ලිපිගොනු නඩත්තු කිරීම, වාර්ෂික වැටුප් වර්ධක ලබා දීමට අවශ්‍ය වන නිවාඩු වාර්තා, අභ්‍යන්තර හා බාහිර ලිපි හුවමාරුව හැසිරවීම පරිපාලන ඒකකය විසින් කරනු ලබන ක්‍රියාකාරකම් වේ.

18. අභ්‍යන්තර විගණන කාර්ය සාධනය

අභ්‍යන්තර විගණන දෙපාර්තමේන්තුව (IAD) මාර්ග සංවර්ධන අධිකාරියේ සභාපති වෙත වාර්තා කරන අංශයක් ලෙස පිහිටුවා ක්‍රියාත්මක වේ. එමගින් අධිකාරිය අභ්‍යන්තර විගණන කාර්යයේ නියුතු නිලධාරීන්ගේ ස්වාධීනත්වය සහතික කර ඇත.
අභ්‍යන්තර විගණනය සාමාන්‍යයෙන් පද්ධති සමාලෝචනය කිරීම, ඒවායේ ක්‍රියාකාරිත්වය අධීක්ෂණය කිරීම සහ එහි වැඩිදියුණු කිරීම් නිර්දේශ කිරීම සඳහා කළමනාකරණය විසින් පවරනු ලබන වගකීම් වේ. මාර්ග සංවර්ධන අධිකාරියට අමතරව මාර්ග සංවර්ධන අධිකාරියේ අනුබද්ධ සමාගම්වල අභ්‍යන්තර විගණකවරුන් ලෙස ද ඔවුන්ගේ විෂය පථය පුළුල් කර ඇත.
ඒ අනුව අභ්‍යන්තර විගණන කටයුතුවලට පහත දැ ඇතුළත් වේ.

- මාර්ග සංවර්ධන අධිකාරියේ සහ අනුබද්ධ සමාගම්වල ගිණුම්කරණ සහ අභ්‍යන්තර පාලන පද්ධතිය සමාලෝචනය කිරීම.
- මූල්‍ය හා මෙහෙයුම් තොරතුරු පරීක්ෂා කිරීම.
  එවැනි තොරතුරු හඳුනා ගැනීම, මැනීම, වර්ගීකරණය කිරීම සහ වාර්තා කිරීම සඳහා භාවිතා කරන මාධ්‍යයන් සමාලෝචනය කිරීම සහ ගනුදෙනු, ශේෂයන් සහ ක්‍රියා පටිපාටි සවිස්තරාත්මකව පරීක්ෂා කිරීම ඇතුළුව තනි අයිතම පිළිබඳ නිශ්චිත විමර්ශනය.
- මාර්ග සංවර්ධන අධිකාරියේ මූල්‍ය නොවන පාලනය ඇතුළුව මෙහෙයුම්වල ආර්ථිකය, කාර්යක්ෂමතාව සහ කාර්යක්ෂමතාව පිළිබඳ සමාලෝචනය.
- නීති, රෙගුලාසි සහ අනෙකුත් බාහිර අවශ්‍යතා, මාර්ග සංවර්ධන අධිකාරියේ අධ්‍යක්ෂ ජනරාල් විසින් නිකුත් කරන ලද චක්‍රලේඛ සහ කළමනාකරණ ප්‍රතිපත්ති සහ අනෙකුත් අභ්‍යන්තර අවශ්‍යතා සමඟ අනුකූල වීම සමාලෝචනය කිරීම.
- විශේෂිත අවශ්‍යතා සඳහා විශේෂ විමර්ශන.

මෙහෙයුම් අවදානම සලකා සකස් කරන ලද අනුමත වාර්ෂික අභ්‍යන්තර විගණන සැලැස්මට අනුව අභ්‍යන්තර විගණනය සිදු කෙරේ. අනුමත අභ්‍යන්තර විගණන සැලැස්මට අනුව සකස් කරන ලද සවිස්තරාත්මක අභ්‍යන්තර විගණන වැඩසටහන, මාසික පදනමින් අභ්‍යන්තර විගණන සිදු කිරීම සඳහා ක්‍රියාත්මක කරන ලියවිල්ලයි.

අභ්‍යන්තර විගණන අංශය කාර්තුමය වශයෙන් විගණන සහ කළමනාකරණ කමිටුව (AMC) රැස්වීම කැඳවීමේ වගකීම දරයි. මෙම රැස්වීම මුදල් අමාත්‍යාංශයේ කළමනාකරණ සේවා දෙපාර්තමේන්තුවේ අතිරේක අධ්‍යක්ෂ ජනරාල් විසින් මෙහෙයවනු ලබන අතර කාර්තුමය ප්‍රගතිය මහාමාර්ග අමාත්‍යාංශයේ අභ්‍යන්තර විගණන අංශය වෙත වාර්තා කරයි.

වගුව 58: 2021 වර්ෂය සඳහා වන විගණන වැඩසටහන

විගණන කාර්යය / කාර්යාලය	**සැලසුම් කළ ක්‍රියාකාරකම් ගණන**	**සම්පූර්ණ කරන ලද ක්‍රියාකාරකම් ගණන**	**ලබා ගත් ප්‍රතිශතය**
පළාත් අධ්‍යක්ෂ කාර්යාලය	10	3	30
ප්‍රධාන ඉංජිනේරු කාර්යාලය	13	5	38.5
විධායක ඉංජිනේරු කාර්යාලය	46	12	26.1
පළාත් අධ්‍යක්ෂ බස්නාහිර ව්‍යාපෘති කාර්යාලය	1	1	100
ප්‍රධාන ඉංජිනේරු ව්‍යාපෘති කාර්යාලය	4	1	25
ඇස්පෝල්ට්/ ගල් ඇඹරුම් යන්ත්‍රාගාර	11	1	9.1
අධිවේගී මාර්ග මෙහෙයුම්, නඩත්තු හා කළමනාකරණ අංශය (EOM&M)	7	3	42.9

මූල්‍ය අංශය	3	1	33.3
මාර්ග සංවර්ධන අධිකාරියේ අනෙකුත් ප්‍රධාන අංශ	16	3	18.8
මාර්ග සංවර්ධන අධිකාරිය හා අනුබද්ධ ආයතන පිළිබඳ විගණන	3	1	33.3
විමර්ශන	33	33	100
එකතුව	**147**	**64**	**43.5**

2021 වර්ෂය තුළදී, කොවිඩ් – 19 වසංගතය දිවයින පුරා සමස්ත සමාජ හා ආර්ථික කටයුතුවලට බලපෑ බැවින් අභ්‍යන්තර විගණන අංශය විසින් මෙම වසරේ වැදගත් විගණන කාර්යයන් කිහිපයක් සම්පූර්ණ කර ඇත. අංශයට 43% කට වැඩි සමස්ත ප්‍රගතියක් ලබා ගැනීමට හැකි වූ අතර සංචරණ සීමා හේතුවෙන් සැලසුම් කර ඇති පරිදි බොහෝ කාර්යයන් ඉටු කර ගැනීමට නොහැකි විය.

ප්‍රගතියට ඇති බාධාවන් සහ ඒ සඳහා ගෙන ඇති පියවර

නව වසරෙන් පසු අප්‍රේල් මාසයේදී කොවිඩ් වසංගතය නැවත ආරම්භ වූ අතර රට තුළ සංචලනය සීමා විය. තවද, වසර ආරම්භයේදී අභ්‍යන්තර විගණන කාර්ය මණ්ඩලයේ සමහරක් මෙම වසංගතයට ගොදුරු විය. මේ නිසා අප සැලසුම් කළ පරිදි පළාත් අධ්‍යක්ෂ, ප්‍රධාන ඉංජිනේරු, විධායක ඉංජිනේරු අංශ මෙන්ම ප්‍රධාන කාර්යාලයේ අංශ වෙත යාමට නොහැකි වූ අතර අපගේ මෙම කාර්යයේ ප්‍රගතිය අඩු විය.

ප්‍රතිකර්ම ක්‍රියාමාර්ගයක් ලෙස, වසංගතයේ ප්‍රබලත්වය අඩු වී සංචලන බාධක ඉවත් කිරීමෙන් පසු 4 වන කාර්තුවේ ප්‍රමාද වන විට පළාත් අධ්‍යක්ෂ, ප්‍රධාන ඉංජිනේරු, විධායක ඉංජිනේරු අංශ හැකිතාක් ආවරණය කිරීමට අපි උත්සාහ කළෙමු. මෙම සියලු සීමාවන් අවම කිරීම සඳහා, කොවිඩ් - 19 වසංගතය දිගු කාලයක් පැවතියද සියලු අභ්‍යන්තර විගණන ක්‍රමානුකූල ප්‍රවේශයකින් 2022 වර්ෂයේ කාර්ය සාධනය ඉහළ නැංවීම අපගේ අරමුණයි. ප්‍රතිකර්ම ක්‍රියාමාර්ගයක් ලෙස, වසංගතයේ ප්‍රබලත්වය අඩු වන 3 වැනි කාර්තුවේදී හැකිතාක් පළාත් අධ්‍යක්ෂ, ප්‍රධාන ඉංජිනේරු, විධායක ඉංජිනේරු අංශ ආවරණය කිරීමට අපි උත්සාහ කළෙමු. මෙම සියලු බාධාවන් අවම කිරීම සඳහා, කොවිඩ් - 19 වසංගතය දිගු කාලයක් පැවතියද, සියලු අභ්‍යන්තර විගණන ක්‍රමානුකූල ප්‍රවේශයකින් 2021 වසරේ කාර්ය සාධනය වැඩි දියුණු කිරීමට අපි අපේක්ෂා කරමු.

ආ. විදේශ අරමුදල් සහිත ව්‍යාපෘති

මාර්ග සංවර්ධන අධිකාරියේ ආයතන ව්‍යුහය එහි දැක්ම, මෙහෙවර, ඉලක්ක හා අරමුණු සාධනය කිරීම සඳහා විදේශ නියෝජිතායතන අරමුදල් සපයන වෙනම ව්‍යාපෘති, කළමනාකරණය කිරීම සඳහා වූ ව්‍යාපෘති කළමනාකරණ ඒකක වලින් සමන්විතය.

ව්‍යාපෘති කළමනාකරණ ඒකක (PMU), විදේශ අරමුදල් යටතේ ඉදි කෙරෙන අධිවේගී මාර්ග, මහාමාර්ග සහ පාලම්වල ඉදිකිරීමේ කටයුතුවල නිරත වන අතර විශේෂිත ව්‍යාපෘති සඳහා නිශ්චිත කාල සීමාවන් සඳහා පමණක් මෙම ඒකක තාවකාලිකව පිහිටුවා ඇත. සෑම ව්‍යාපෘති කළමනාකරණ ඒකකයක්ම ව්‍යාපෘති අධ්‍යක්ෂකවරයෙකු විසින් මෙහෙයවනු ලබන අතර ඔවුන් මහාමාර්ග හා මාර්ග සංවර්ධන අමාත්‍යාංශය යටතේ ස්වාධීන ව්‍යාපෘති කළමනාකරණ ඒකක ලෙස කටයුතු කරයි. ව්‍යාපෘතිය සාර්ථකව ක්‍රියාත්මක කිරීම සඳහා නියෝජ්‍ය අධ්‍යක්ෂවරුන්, ව්‍යාපෘති ඉංජිනේරුවන් සහ සහායක කාර්ය මණ්ඩලය අධ්‍යක්ෂවරයාට වෘත්තීය සහාය ලබා දෙනු ලැබේ.

1. මධ්‍යම අධිවේගී මාර්ගය

මධ්‍යම අධිවේගී මාර්ගය කඩවත පිටත වටරවුම් අධිවේගී මාර්ගයේ (OCH) සිට ආරම්භ වී ගම්පහ, මීරිගම, පොතුහැර, කුරුණෑගල, රිදීගම, මැල්සිරිපුර සහ ගලේවෙල හරහා දඹුල්ල දක්වා ගමන් කරන අතර පොතුහැර සිට ගලගෙදර දක්වා අධිවේගී මාර්ග සම්බන්ධතාවයක් ද පවතී. මෙම ව්‍යාපෘතියේ මූලික ප්‍රතිපලය වනුයේ ජාතික මාර්ග ජාලයේ ධාරිතාව වැඩි කිරීමයි. දැනට පවතින අධිවේගී මාර්ග ජාලය කිලෝමීටර 169.09 කින් ව්‍යාප්ත කිරීම හරහා මෙම ව්‍යාපෘතිය මඟින් කොළඹ සහ මධ්‍යම කොටස අතර ඉහළ සංචලනයක් සහතික කරමින් ආරක්ෂාව වැඩි කරන අතර ගමන් කාලය, රථවාහන තදබදය, වාහන මෙහෙයුම් පිරිවැය, නඩත්තු පිරිවැය සහ පාරිසරික දූෂණය අවම කරයි.



සිතියම 4: මධ්‍යම අධිවේගී මාර්ගය

මධ්‍යම අධිවේගී මාර්ග ව්‍යාපෘතිය ක්‍රියාත්මක කිරීම සඳහා පහත වගුවේ විස්තර දක්වා ඇති පරිදි කොටස් 04කට බෙදන ලදී :

වගුව 59 : මධ්‍යම අධිවේගී මාර්ගයේ කොටස් පිළිබඳ විස්තර

කොටස් අංකය	කොටසේ නම	දිග පරතරය	දිග(කි.මී)
1 කොටස	කඩවත- මීරිගම	0+500 සිට 37+090 දක්වා	36.59
2 කොටස	මීරිගම-කුරුණෑගල	37+090 සිට 78+000 දක්වා	40.91
3 කොටස	පොතුහැර- ගලගෙදර	0+800 සිට 32+480 දක්වා	31.70
4 කොටස	කුරුණෑගල- දඹුල්ල	78+000 සිට 136+600 දක්වා	58.60
එකතුව			167.80

1.1 මධ්‍යම අධිවේගී මාර්ගය 1 කොටස

මධ්‍යම අධිවේගී මාර්ග කොටස - 1 කඩවත සිට මීරිගම දක්වා කිලෝමීටර් 36.59 ක් දිග වන අතර ගම්පහ දකුණ, ගම්පහ උතුර, වේයන්ගොඩ සහ මීරිගම දකුණ අන්තර් හුවමාරු හතරක් ඇත. මෙම අධිවේගී මාර්ගය දෙපස මංතීරු පළල මීටර් 3.6ක් සහ මංතීරු පළල 2.5ක් සහිත ද්විත්ව මංතීරු සහිත මාර්ග දෙකක් සපයයි. කි.මී.13.28 දිග බෝක්කු මාර්ග සහ කි.මී.0.48 දිග පාලම් කොටස් මෙම කොටසට ඇතුළත් වේ. පහත වගුවේ දක්වා ඇති විස්තර අනුව මෙම කොටසේ ඉදිකිරීම් කොන්ත්‍රාත් යෝජනාවලී දෙකක් යටතේ ක්‍රියාත්මක වේ.

වගුව 60 : මධ්‍යම අධිවේගී මාර්ගයේ 1 කොටසේ කොන්ත්‍රාත් යෝජනාවලී

පැකේජ අංකය	කොටස	දිග (කි.මී.)
1 යෝජනවාලිය	කඩවත සිට කොස්සින්න දක්වා (කි.මී.0+500-4+540)	4.04
2 යෝජනවාලිය	කොස්සින්න සිට මීරිගම දක්වා (කි.මී.4+540-37+090)	32.55
	එකතුව	**36.59**



සිතියම 5: මධ්‍යම අධිවේගී මාර්ගය - I කොටස

ව්‍යාපෘති මූල්‍යකරණය

අරමුදල් නියෝජිතායතනය	-	චීන අපනයන ආනයන බැංකුව
ණය ප්‍රමාණය	-	ඇ.ඩො. 989,448,556.31
ණය අත්සන් කළ දිනය	-	22.03.2019
ණය ක්‍රියාත්මක වන දිනය	-	23.09.2020
ණය කල් ඉකුත් වන දිනය	-	22.09.2025

උපදේශන කටයුතු

උපදේශක	-	RDC - CEA JV
කොන්ත්‍රාත් මුදල	-	රු. බිලියන 2.549 බදු හැර
කොන්ත්‍රාත් කාලය	-	මාස 48
උපදේශකයා ව්‍යාපෘතියට යෙදවූ දිනය	-	01.06.2017
අරමුදල්	-	ලංකා බැංකුවෙන් ණය

සිවිල් වැඩ කොන්ත්‍රාත් දත්ත

පැකේජය 1

කොන්ත්‍රාත්කරු	-	Metallurgical Cooperation of China Limited (MCC)
කොන්ත්‍රාත් මුදල	-	රු.බිලියන 12.58 බදු හැර
ගිවිසුම අත්සන් කළ දිනය	-	2016 ජූනි 20
කොන්ත්‍රාත් කාලය	-	මාස 30
කොන්ත්‍රාත්තුවේ ආරම්භක දිනය	-	2020.09.15
කොන්ත්‍රාත්තුව අවසන් වන දිනය	-	2023.03.14

පැකේජය 2

කොන්ත්‍රාත්කරු	-	Metallurgical Cooperation of China Limited (MCC)
කොන්ත්‍රාත් මුදල	-	රු.බිලියන 145.7 බදු හැර
ගිවිසුම අත්සන් කළ දිනය	-	2015 අගෝස්තු 04
කොන්ත්‍රාත් කාලය	-	මාස 48
කොන්ත්‍රාත්කරු බලමුලු ගැන්වූ දිනය	-	2016.06.12
කොන්ත්‍රාත්තුවේ ආරම්භක දිනය	-	2020.09.15
කොන්ත්‍රාත්තුව අවසන් වන දිනය	-	2024.09.14

කාර්යයේ ප්‍රගතිය

ප්‍රධාන මාර්ගය සඳහා ඉඩම් අත්පත් කර ගැනීමේ ප්‍රගතිය : 97.5%

අත්පත් කර ගත යුතු මුළු කැබලි ගණන	: 4210
මුදල් ගෙවූ මුළු කැබලි ගණන	: 3534
ගෙවූ ගණන	: රු.මිලියන 9,587.8
හිඟ බිල්පත්	: රු.54,275.86
ලබා ගත යුතු ඉතිරි කැබලි	: 676

සැලසුමේ ප්‍රගතිය

ජ්‍යාමිතික සැලසුම් ප්‍රගතිය	: 95.2%
ජලාපවහන සැලසුම් ප්‍රගතිය	: 58.3%
අන්තර් හුවමාරුවල ජ්‍යාමිතික නිර්මාණය	: සියල්ල සම්පූර්ණ කර ඇත

වගුව 61: ව්‍යුහාත්මක සැලසුම් ප්‍රගතිය

ව්‍යුහ වර්ගය	මුළු ගණන	සැලසුම් ප්‍රගතිය
බෝක්කු මාර්ග	18	උප ව්‍යුහයෙන් 43%
පාලම්	08	6.5%
ගුවන් පාලම	11	4%
උමං මාර්ග	13	2.4%
කානු සහිත බෝක්කු	87	15.2%

සිවිල් ඉදිකිරීම් ප්‍රගතිය - 19.43%

- නියමු මාර්ග ඉදිකිරීම - හැකි සියලුම කොටස් වලින් නිම කර ඇත
- තාවකාලික පාලම් හතරක් නිම කරන ලදී (79%)
- බෝඩිඉ ෆයිල් ඉදිකිරිම - 1368 සම්පූර්ණ කර ඇත, මුළු 3000 යි.
- මෘදු බිම් ප්‍රතිකාර අත්හදා බැලීමේ කි.මී.31+390 සහ කි.මී.31+510
- කි.මී.31+525 සහ කි.මී.31+600 හි පෙට්ටි බෝක්කුවේ ගල් ප්‍රතිස්ථාපන කටයුතු. පෙට්ටි බෝක්කු ඉදිකිරීම පවා අවසන් කර ඇත.

වගුව 62 : ප්‍රගති සාරාංශය

අධිවේගී මාර්ග කොටස	තා.ඇ.ක. (රු.මිලියන)	ආරම්භක දිනය	සම්පූර්ණ කිරීමට අපේක්ෂිත දිනය	2020 අවසානය දක්වා භෞතික ප්‍රගතිය	2020 අවසානය දක්වා සමුච්චිත වියදම්	2021 අවසන් වන විට භෞතික ප්‍රගතිය	2021 වර්ෂය තුළ වියදම් (රු. මිලියන)
මධ්‍යම අධිවේගී මාර්ග ව්‍යාපෘතිය - 1කොටස	176,785	15.09.2020	14.09.2024	ඉඩම් 89.2% සිවිල් කටයුතු 5.38%	26,187.00	ප්‍රධාන මාර්ගය සඳහා ඉඩම් අත්පත් කර ගැනීම: 97.5% සිවිල් කටයුතු 19.43%	25,962.32









1.2 මධ්‍යම අධිවේගී මාර්ග ව්‍යාපෘතිය - 2 කොටස

මෙම කොටසේ ඉදිකිරීම් කටයුතු (මීරිගම සිට කුරුණෑගල දක්වා) 2017 ජනවාරි මස ආරම්භ වූ අතර ජාතික තරඟකාරී ලංසු තැබීමේ ක්‍රියාවලිය මත තෝරාගත් දේශීය කොන්ත්‍රාත්කරුවන් පහළොස් දෙනෙකුගෙන් සමන්විත කොන්ත්‍රාත් පැකේජ හතරක් යටතේ ආරම්භ කරන ලදී. අධීක්ෂණ උපදේශන කටයුතු දේශීය ඒකාබද්ධ ව්‍යාපාර සමූහය වෙත එනම් – MG Consultants – Engineering Consultants ltd- Resources Development Consultants Pvt Ltd පැවරී ඇත. අධිවේගී මාර්ගයට ප්‍රවේශය සපයනු ලබන්නේ මීරිගම, නාකලගමුව, දම්බොක්ක, කුරුණෑගල සහ යග්ගපිටිය යන අන්තර් හුවමාරු හරහා පමණක් වන අතර පොතුහැර පද්ධති හුවමාරුව මධ්‍යම අධිවේගී මාර්ග ව්‍යාපෘතිය 03 වෙත කිසිදු ඇතුල්වීමක් හෝ පිටවීමක් නොමැතිව සබැඳියක් සපයයි. ඉදිකිරීම් කටයුතු සහ අධීක්ෂණ උපදේශන සඳහා අරමුදල් දේශීය බැංකු ණය මගින් රැස්කරනු ලබන අතර ඉඩම් අත්පත් කර ගැනීම් සහ පරිපාලන වියදම් සඳහා භාණ්ඩාගාර ප්‍රතිපාදන නිකුත් කෙරේ.
අධිවේගී මාර්ගය මංතීරු හතරකට බෙදුණු අධිවේගී මාර්ගයක් වන අතර මංතීරු පළල මීටර් 3.6 ක් සහ මීටර් 3.0 ක මධ්‍ය පළල සහ මාර්ග දෙපස පළල මීටර් 3.25 කි. ආරුක්කු බෝක්කු (35) කොටස්වල සම්පූර්ණ දිග මීටර් 9825 කි. ප්‍රධාන පාලම් 13ක්, බෝක්කු 130ක්, යටි පාලම් සහ ගුවන් පාලම් 46ක් ඇත.

වගුව 63: ව්‍යාපෘති තොරතුරු

පැකේජය	A පැකේජය	B පැකේජය	C පැකේජය	D පැකේජය
දිග	කි.මී.9.71	කි.මී.10.20	කි.මී.10.88	කි.මී.8.50
ආරම්භක දිනය	1.16.2017	1.16.2017	02.01.2017	2/14/2017
මුල් සම්පූර්ණ කිරීම	7.15.2019	7.15.2019	7.31.2019	8.13.2019
සංශෝධිත සම්පූර්ණ කිරීම	15.11.2021	15.11.2021	15.11.2021	15.11.2021
කොන්ත්‍රාත් මුදල (රු.මිලි.)	34,149.47	34,592.23	32,084.80	36,271.64
කොන්ත්‍රාත්කරුවන්	ICC-ACCESS-(NAWALOKA – KDESH JV) Consortium	Sierra - Olympus-Tudawe- CEC JV	KDAW-NEM – E&C Consortium	MAGA,CML-MTD, VVK -HOVAEL JV Consortium
ආරුක්කු පාලම්	මී.3,607 (8)	මී.2,415 (13)	මී.1,200 (5)	මී.2,603 (9)
පාලම්	3 (මී.75)	4 (මී.250)	4 (මී.85)	2 (මී.60)
බෝක්කු/Up/ OP (ගණන)	31	48	46	61



සිතියම 6: මධ්‍යම අධිවේගී මාර්ගය - II කොටස

2021.11.15 වන විට සියලුම වැඩ සැලකිය යුතු ලෙස අවසන් කර පවරාගෙන ඇත. මෙම අධිවේගී මාර්ග කොටස 2022.01.15 දින මහජනතාව සඳහා විවෘත කරන ලදී.

වගුව 64: 2021 අවසානයේ ප්‍රගතිය

අධිවේගී මාර්ගය	ත.ඇ.ක. (රු. මිලි.)	ආරම්භක දිනය	සම්පූර්ණ කළ දිනය	2020 අවසානය දක්වා භෞතික ප්‍රගතිය	2020 අවසානය දක්වා සමුච්චිත වියදම් (රු. මිලියන)	2021 අවසන් වන විට භෞතික ප්‍රගතිය	2021 වර්ෂය තුළ වියදම් (රු. මිලියන)
මධ්‍යම අධිවේගී මාර්ග ව්‍යාපෘතිය II (මීරිගම සිට කුරුණෑගල දක්වා)	148,521	16.01.2017	15.11.2021	82.62%	113,335.59	100%	19,667.16

වගුව 65: 2021 අවසන් වන විට ඉඩම් අත්පත් කර ගැනීමේ ප්‍රගතිය

ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසය	ඉඩම් ගණන (පුද්ගලික)	ඉඩම් ගණන (රජයේ)	9(I) විමසීම්		10(I) නිකුත් කළ		තක්සේරුව ලැබුණු		LARC පැවැත්වීම		ගෙවීම්		
			ඉඩම් ගණන	ප්‍රගතිය (%)	ඉඩම් ගණන	ප්‍රගතිය (%)	ඉඩම් ගණන	ප්‍රගතිය (%)	ඉඩම් ගණන	ප්‍රගතිය (%)	ගෙවූ ඉඩම් ගණන	මුදල රු.	මූල්‍ය ප්‍රගතිය (%)
මීරිගම	511	81	473	93%	473	93%	468	92%	468	92%	463	909,714,290.77	91%
අලව්ව	398	172	394	99%	394	99%	394	99%	394	99%	388	365,325,936.99	97%
නාරම්මල	1212	259	1130	93%	1130	93%	1130	93%	1130	93%	1122	1,217,684,251.90	93%
පොල්ගහවෙල	572	58	513	90%	513	90%	513	90%	513	90%	513	458,583,504.66	90%
වීරඹුගෙදර	379	85	362	95.5%	362	95.5%	362	95.5%	362	95.5%	362	508,474,352.42	96%
කුරුණෑගල	1119	234	1011	90%	1011	90%	978	87%	978	87%.	934	4,566,644,778.88	83%
මල්ලවපිටිය	208	23	188	90%	188	90%	72	35%	71	34%	57	29,565,599.52	27%
එකතුව	4399	912	4071	93	4071	93	3917	89%	3916	89%	3839	8,055,992,715.14	87%

ගැටළු

2021 අගෝස්තු සිට 2021 ඔක්තෝබර් දක්වා සිදු කරන ලද වැඩ සඳහා මිලියන 2,362 ක හිඟ බිල්පත් කොන්ත්‍රාත්කරුවන් සහ අධීක්ෂණ උපදේශකයින් සඳහා තවමත් ගෙවීමට පවතී.

1.3 මධ්‍යම අධිවේගී මාර්ග ව්‍යාපෘතිය - 3 කොටස

අධිවේගී මාර්ගයේ 3 වන කොටස පොතුහැරින් ආරම්භ වී රඹුක්කන හරහා ගලගෙදර දක්වා ගමන් කරන අතර එහි දිග ආසන්න වශයෙන් කිලෝමීටර 31.7 කි.



සිතියම 7: මධ්‍යම අධිවේගී මාර්ග ව්‍යාපෘතිය – III කොටස

ක්‍රියාකාරකම්වල ප්‍රගතිය

වගුව 66: ව්‍යාපෘති සූදානම් කිරීමේ ක්‍රියාකාරකම්වල තත්ත්වය

අයිතම අංකය	විස්තරය	ප්‍රගතිය
1	ශක්‍යතා අධ්‍යයනය	උතුරු අධිවේගී මාර්ග ව්‍යාපෘතියේ (NEP) පළමු අදියරෙහි ශක්‍යතා අධ්‍යයනය සඳහා වූ උපදේශන සේවා කොන්ත්‍රාත්තුව අමාත්‍ය මණ්ඩලයේ අනුමැතිය ඇතිව M/s SMEC International Pty Ltd වෙත ප්‍රදානය කරන ලදී. අධ්‍යයනය 2014 අවසන් වන විට අවසන් කරන ලදී.
		මධ්‍යම අධිවේගී මාර්ගයේ ආර්ථික ශක්‍යතා අධ්‍යයනය සඳහා වන කොන්ත්‍රාත්තුව මොරටුව විශ්වවිද්‍යාලයට ලබා දෙන ලදී. ආර්ථික ශක්‍යතා අධ්‍යයනය 2016 අප්‍රේල් වන විට අවසන් කරන ලදී.
2	පාරිසරික බලපෑම් තක්සේරු කිරීම් (EIA)	මධ්‍යම අධිවේගී මාර්ගය පිළිබඳ පාරිසරික අධ්‍යයනය සඳහා වන කොන්ත්‍රාත්තුව ජයවර්ධනපුර විශ්වවිද්‍යාලයට ලබා දෙන ලදී. EIA වාර්තා 2017 අප්‍රේල් වන විට අවසන් කරන ලදී. මධ්‍යම පරිසර අධිකාරිය විසින් අනුමැතිය ලබා දී ඇත.
	සවිස්තරාත්මක පාරිසරික අධ්‍යයනය	මෙම අධ්‍යයනය අවසන් කර වාර්තාව සමාලෝචනය සඳහා මධ්‍යම පරිසර අධිකාරිය වෙත ඉදිරිපත් කර ඇත.

අයිතම අංකය	විස්තරය	ප්‍රගතිය
3	මූලික දත්ත එකතු කිරීම	පවතින ජලයේ ගුණාත්මකභාවය, ශබ්දය සහ කම්පන මට්ටම් සහ වාතයේ ගුණාත්මකභාවය සඳහා මූලික දත්ත රැස් කිරීම සඳහා අධ්‍යයනයන් අවසන් කර ඇති අතර අවසාන වාර්තා සමාලෝචනය සඳහා මධ්‍යම පරිසර අධිකාරිය වෙත ඉදිරිපත් කරන ලදී.
4	සවිස්තරාත්මක ජල විද්‍යා අධ්‍යයනය	මධ්‍යම අධිවේගී මාර්ගයේ සවිස්තරාත්මක ජල විද්‍යාව අධ්‍යයනය සඳහා වන කොන්ත්‍රාත්තුව ශ්‍රී ලංකා ඉඩම් ගොඩකිරීමේ සංස්ථාවට ලබා දී ඇති අතර අධ්‍යයනය 2017 නොවැම්බර් මාසයේදී අවසන් කරන ලදී.

මූලික ව්‍යාපෘති විස්තර

- ව්‍යාපෘතියේ දිග : ආසන්න වශයෙන් කි.මී. 31.7
- මංතීරු ගණන : හතරයි (04)
- අන්තර්හුවමාරු : පොතුහැර පද්ධති අන්තර් හුවමාරුව, පොල්ගහවෙල, රඹුක්කන ගලගෙදර
- කැපුම් පරිමාව : 4,085,750 Cu.m
- පිරවුම් පරිමාව : 4,065,640 Cu.m
- විවේක පහසුකම් : කුඩාඔය, රඹුක්කන ප්‍රධාන මාර්ගය දෙපස විවේක ගන්නා ස්ථාන
- පාලම් ගණන : 20
- ආරුක්කු පාලම් ගණන : 20
- ආරුක්කු පාලම් දිග : කි.මී.6.85
- බෝක්කු ගණන : 92
- යටි මාර්ග ගණන : 25
- ගුවන් පාලම් ගණන : 13
- උමං මාර්ග ගණන : 1
- මුළු උමං මාර්ග දිග : මී.295

ඉඩම් අත්කර ගැනීමේ ක්‍රියාවලිය (සිදු වෙමින් පවතී)

මධ්‍යම අධිවේගී මාර්ගය - 3 වන කොටසේ ඉඩම් අත්කර ගැනීමේ වැඩසටහන, මාර්ග සංවර්ධන අධිකාරියේ ව්‍යාපෘති කළමනාකරණ ඒකකය විසින් සිදු කරනු ලබන අතර පහත වගුවේ දක්වා ඇත. 2021 අවසන් වන විට ඉඩම් අත්පත් කර ගැනීමේ ප්‍රගතිය 89.07% කි.

වගුව 67: ඉඩම් අත්කර ගැනීමේ වැඩසටහන

කොටස	පරතරය	දිග (කි.මී.)	සම්පූර්ණ කළ දිනය
1	0+840 – 12+890	12.05	04.08.2021
2	12+890 – 17+950	05.06	31.12.2021
3	17+950 – 32+500	14.55	30.04.2022
එකතුව		31.66	

උපදේශකයින් සහ කොන්ත්‍රාත්කරුවන්ගේ අංශ සඳහා ප්‍රසම්පාදන ක්‍රියාවලිය (සිදු කරමින් පවතී)

සිවිල් වැඩ ඉදිකිරීම්

මහාමාර්ග අමාත්‍යවරයා විසින් ඉදිරිපත් කරන ලද 2020.12.18 දිනැති අංක 20/2072/319/021 කැබිනට් පත්‍රිකාවට අනුව සහ 2021.01.11 දින අමාත්‍ය මණ්ඩලය විසින් අනුමත කරන ලදුව කි.මී.0+840 සිට මධ්‍යම අධිවේගී මාර්ගයේ කොටසක් (පොතුහැර ලිහිණිගිරිය), කි.මී.12+890 (රඹුක්කන) දක්වා- පැකේජය1, ආරම්භ කිරීමට මාර්ග සංවර්ධන අධිකාරිය විසින් හඳුනා ගෙන ඇත.

කි.මී.12+890 සිට කි.මී. 32+450 ඉතිරි කොටස සැලසුම්, ගොඩනැගීම, මුල්‍ය, ක්‍රියාත්මක කිරීම, නඩත්තු කිරීම සහ මාරුකිරීම යන පදනම මත ක්‍රියාත්මක කිරීමට නියමිතය.

කැබිනට් තීරණයට අනුව, මධ්‍යම අධිවේගී මාර්ගයේ 3 වන කොටසේ මූලික කටයුතු (ක්ෂේත්‍ර පිරිසිදු කිරීම සහ නියමු මාර්ගය ඉදිකිරීම වැනි) කි.මී. 0+840 සිට කි.මී.12+890 අතර ව්‍යාපෘති කළමනාකරණ ඒකකය විසින් ශ්‍රී ලංකා රජයේ මාර්ගෝපදේශ අනුව ලබා ගත් සම්පත් යොදාගෙන ආරම්භ කරන ලදී.

කෙසේ වෙතත්, ඉදිකිරීම් කටයුතු කඩිනම් කිරීම සඳහා I අදියර (කි.මී.0+840 සිට කි.මී.12+890 දක්වා) ඉදිකිරීම් පැකේජ 17කට බෙදා උප මූලික මට්ටමට අධිවේගී මාර්ග කොටස ඉදිකිරීම සඳහා තරඟකාරී ක්‍රියාවලියක් සඳහා දේශීය කොන්ත්‍රාත්කරුවන්ගෙන් ලංසු කැඳවන ලදී.

2021.06.14 දින පැවති අමාත්‍ය මණ්ඩල රැස්වීමේදී මධ්‍යම අධිවේගී මාර්ගය -3 කොටසේ හි ඉතිරි කොටස රඹුක්කන (කි.මී.12+890) සිට ගලගෙදර (කි.මී. 32+450) දක්වා සැලසුම්, ගොඩනැගීම, මූල්‍ය කටයුතු, ක්‍රියාත්මක කිරීම, නඩත්තු කිරීම සහ මාරු කිරීම (DBFOMT) පදනම මත ආයෝජකයින් හරහා ක්‍රියාත්මක කිරීමට තීරණය කර ඇත.

ඒ අනුව ඉහත වගන්තිය ක්‍රියාත්මක කිරීම සඳහා උනන්දුවක් දක්වන ආයෝජකයින්ගෙන් යෝජනා කැඳවා 2021.10.04 දින යෝජනා විවෘත කරන ලදී.

උපදේශන සේවා

උපදේශන සේවාවක් තෝරාගැනීම සිවිල් වැඩ කොන්ත්‍රාත්කරු තෝරා ගැනීම සඳහා අනුගමනය කරනු ලබන ප්‍රසම්පාදන ක්‍රමය මත රඳා පවතී. කෙසේ වෙතත්, කි.මී.0+840 සිට කි.මී.12+890 දක්වා කොටස මාර්ග සංවර්ධන අධිකාරිය විසින් අධීක්ෂණය කරනු ලැබේ.

DBFOMT පදනම හරහා ක්‍රියාත්මක කිරීමට නියමිත ඉතිරි කොටස සඳහා (කි.මී.12+890 සිට කි.මී.32+450 දක්වා) ස්වාධීන ඉංජිනේරුවරයෙකු තෝරා ගැනීම සාර්ථක අනුග්‍රාහකයෙකු තෝරා ගැනීමෙන් පසුව සිදු කරනු ලැබේ.

ව්‍යාපෘති මූල්‍යකරණය (සිදු වෙමින් පවතින)

කි.මී.0+840 සිට කි.මී.12+890 දක්වා කොටස සඳහා රජය විසින් අරමුදල් සපයනු ලබන අතර ඉතිරි කොටස සාර්ථක අනුග්‍රාහකයෙකු විසින් මූල්‍යකරණය කරනු ලැබේ.

මධ්‍යම අධිවේගී මාර්ගය ඉදිකිරීම - 03 කොටස (සිදු වෙමින් පවතින)

ව්‍යාපෘතියේ යෝජිත කාලසීමාව ආරම්භ කළ දින සිට වසර 3.6 කි.

වගුව 68 : ලිහිණිගිරිය සිට රඹුක්කන දක්වා කොටස සඳහා කොන්ත්‍රාත්තුවේ ප්‍රගතිය

පැකේජය	කොන්ත්‍රාත්කරුගේ නම	දිග (කි.මී.)	ක.ඇ.ක (රු.මිලියන)	ආරම්භක දිනය	සම්පූර්ණ කිරීමට අපේක්ක්ෂිත දිනය	2021 අවසන් වන විට භෞතික ප්‍රගතිය	2021 වර්ෂය තුළ වියදම් (රු. මිලියන)
පැකේජය 1A (කි.මී. 0+840 සිට කි.මී.1+580 දක්වා) කොන්ත්‍රාත් අංකය RDA/CEP3/PACK1A	එඩ්වඩ් ඇන්ඩ් ක්‍රිස්ටී පුද්. සමාගම	කි.මී. 0.74	859.30	20.08.2021	19.08.2022	16.00	162.76
පැකේජය 1B (කි.මී. 1+580 සිට කි.මී. 2+400 දක්වා) කොන්ත්‍රාත් අංකය RDA/CEP3/PACK1B	එඩ්වඩ් ඇන්ඩ් ක්‍රිස්ටී පුද්. සමාගම	කි.මී. 0.82	743.62	20.08.2021	19.08.2022	7.60	132.54
පැකේජය 1C (කි.මී.2+400 සිට කි.මී. 3+090 දක්වා) කොන්ත්‍රාත් අංකය RDA/CEP3/PACK1C	එඩ්වඩ් ඇන්ඩ් ක්‍රිස්ටී පුද්. සමාගම	කි.මී.69	912.00	20.08.2021	19.08.2022	11.30	155.27
පැකේජය 1D (කි.මී. 3+090 සිට කි.මී. 4+400 දක්වා) කොන්ත්‍රාත් අංකය RDA/CEP3/PACK1D	K.D.A. වීරසිංහ සහ පුද්. සමාගම	කි.මී. 1.31	3,587.39	24.12.2021	23.06.2023	0.00	469.24
පැකේජය 1E (කි.මී. 4+400 සිට කි.මී. 4+920 දක්වා) කොන්ත්රාත් අංකය RDA/CEP3/PACK1E	එඩ්වඩ් ඇන්ඩ් ක්‍රිස්ටී පුද්. සමාගම	කි.මී. 0.52	997.59	06.12.2021	05.12.2022	0.50	131.15
පැකේජය 1F (කි.මී. 4+920 සිට කි.මී. 5+140 දක්වා) කොන්ත්‍රාත් අංකය RDA/CEP3/PACK1F	තුඩාවේ බ්‍රදර්ස් පුද්.සමාගම	කි.මී. 0.22	992.83	06.12.2021	05.12.2022	0.82	117.46

පැකේජය	කොන්ත්‍රාත්කරුගේ නම	දිග (කි.මී.)	ක.ඇ.ක (රු.මිලියන)	ආරම්භක දිනය	සම්පූර්ණ කිරීමට අපේක්ක්ෂිත දිනය	2021 අවසන් වන විට භෞතික ප්‍රගතිය	2021 වර්ෂය තුළ වියදම් (රු. මිලියන)
පැකේජය 1G (කි.මී. 5+140 සිට කි.මී. 5+820 දක්වා) කොන්ත්‍රාත් අංකය RDA/CEP3/PACK1G	සෙනුර සිවිල් ඉංජිනේරු (පුද්ගලික) සමාගම	කි.මී. 0.68	944.77	06.12.2021	05.12.2022	0.00	62.73
පැකේජය 1H (කි.මී.5+820 සිට කි.මී. 6+270) කොන්ත්‍රාත් අංකය RDA/CEP3/PACK1H	PND කන්ස්ට්‍රක්ෂන් (පුද්ගලික) සමාගම	කි.මී.0.45	872.57	03.12.2021	02.12.2022	2.00	116.66
පැකේජය 1I (කි.මී. 6+270 සිට කි.මී. 6+900) කොන්ත්‍රාත් අංකය RDA/CEP3/PACK1I	K.D. ඊබට් ඇන්ඩ් සන්ස් හෝල්ඩින්ග්ස් (පුද්.) සමාගම	කි.මී. 0.63	938.49	06.12.2021	05.12.2022	4.00	120.11
පැකේජය 1J (කි.මී. 6+900 සිට කි.මී. 8+050) කොන්ත්‍රාත් අංකය RDA/CEP3/PACK1J	NEM කන්ස්ට්‍රක්ෂන් (පුද්ගලික) සමාගම	කි.මී.1.15	3,963.43	24.12.2021	23.06.2023	0.00	503.37
පැකේජය 1K (කි.මී. 8+050 සිට කි.මී. 8+850 දක්වා) කොන්ත්‍රාත් අංකය RDA/CEP3/PACK1K	රුහුණු ඩිවලොප්මන්ට් කන්ට්‍රැක්ටර්ස් ඇන්ඩ් ඉංජිනියරින් (පුද්ගලික) සමාගම	කි.මී.0.8	961.48	23.11.2021	22.11.2022	2.70	125.68
පැකේජය 1L (කි.මී. 8+850 සිට කි.මී. 9+100 දක්වා) කොන්ත්‍රාත් අංකය RDA/CEP3/PACK1L	නවලෝක කන්ස්ට්‍රක්ෂන් (පුද්ගලික) සමාගම	කි.මී. 0.25	621.55	30.11.2021	29.11.2022	0.00	79.87
පැකේජය 1M (කි.මී. 9+100 සිට කි.මී. 9+900 දක්වා) කොන්ත්‍රාත් අංකය RDA/CEP3/PACK1M	ඇක්සස් ඉංජිනියරින් (පුද්ගලික) සමාගම	කි.මී. 0.8	3,884.10	03.01.2022	02.07.2023	0.00	468.73

පැකේජය	කොන්ත්‍රාත්කරුගේ නම	දිග (කි.මී.)	ක.ඇ.ක (රු.මිලියන)	ආරම්භක දිනය	සම්පූර්ණ කිරීමට අපේක්ක්ෂිත දිනය	2021 අවසන් වන විට භෞතික ප්‍රගතිය	2021 වර්ෂය තුළ වියදම් (රු. මිලියන)
පැකේජය 1N (කි.මී. 9+900 සිට කි.මී. 11+230 දක්වා) කොන්ත්‍රාත් අංකය RDA/CEP3/PACK1N	ඉන්ටනැෂනල් කන්ස්ට්‍රක්ෂන් කන්සෝටියම් (පුද්ගලික) සමාගම	කි.මී. 1.33	4,497.80	23.12.2021	22.06.2023	0.00	578.43
පැකේජය 1O (කි.මී.11+230 සිට කි.මී. 11+480 දක්වා) කොන්ත්‍රාත් අංකය RDA/CEP3/PACK1O	RR කන්ස්ට්‍රක්ෂන් (පුද්ගලික) සමාගම	කි.මී. 0.25	851.90	03.01.2022	02.01.2023	0.00	
පැකේජය 1P (කි.මී.11+480 සිට කි.මී. 12+000 දක්වා) කොන්ත්‍රාත් අංකය RDA/CEP3/PACK1P	සෙල්ටෙක් ගෘප් (පුද්ගලික) සමාගම	කි.මී. 0.52	508.83	23.11.2021	22.11.2022	4.00	65.16
පැකේජය 1Q (කි.මී.12+000 සිට කි.මී. 12+890 දක්වා) කොන්ත්‍රාත් අංකය RDA/CEP3/PACK1Q	මාගා ඉංජිනියරින් (පුද්ගලික) සමාගම	කි.මී. 0.89	2,757.99	27.12.2021	26.06.2023	0.00	355.87

1.4 මධ්‍යම අධිවේගී මාර්ග ව්‍යාපෘතිය 4 කොටස

මධ්‍යම අධිවේගී මාර්ගයේ කුරුණෑගල සිට දඹුල්ල දක්වා IV කොටස වයඹ පළාත (කුරුණෑගල දිස්ත්‍රික්කය) සහ මධ්‍යම පළාත (මාතලේ දිස්ත්‍රික්කය) හරහා දිවෙන අතර දළ වශයෙන් දිග කිලෝමීටර 58 කි.

මෙම කොටස –IV ඉදි කිරීමට රිදීගම (B409 : සම්බන්ධ කරමින් තලගොඩපිටිය- යටවත්ත - දඹුල්ල මාර්ගය) කි.මී.: 93+150 ,මැල්සිරිපුර (A006: අඹේපුස්ස – කුරුණෑගල – ත්‍රිකුණාමලය මාර්ගය) කි.මී.:102+300, ගලේවෙල (A006: අඹේපුස්ස – කුරුණෑගල –ත්‍රිකුණාමලය මාර්ගය) කි.මී.: 115+750, දඹුල්ල (A 09 : මහනුවර - යාපනය මාර්ගය) කි.මී.: 129+800 ද සහ දඹුල්ල (A 06: දඹුල්ල -ත්‍රිකුණාමලය මාර්ගය) කි.මී. :136+700 ද සම්බන්ධ කරමින් අන්තර්මාරු 05ක් ඉදි කිරීම අයත් වේ. මෙම ව්‍යාපෘතිය BOT ව්‍යාපෘතිය යටතේ ක්‍රියාත්මක කිරීමට නියමිත අතර ප්‍රසම්පාදන කටයුතු සිදු වෙමින් පවතී. කුරුණෑගල සිට දඹුල්ල දක්වා ව්‍යාපෘතියේ ඉංජිනේරු ඇස්තමේන්තුව රු.බිලියන 166.56 කි (වැට් බදු හැර).

2021 වර්ෂය තුළ, 10 (I) ගැසට් නිවේදනය මත පදනම්ව ඉඩම් අත්පත් කර ගැනීමේ ක්‍රියාවලිය ක්‍රියාත්මක වෙමින් පැවතුනි.



සිතියම 8: මධ්‍යම අධිවේගී මාර්ග ව්‍යාපෘතිය 4 කොටස

වගුව 69: ව්‍යාපෘති සාරාංශය

විස්තරය	දිග	ක්‍රියාකාරකම	තා.ඇ.ක. රු.මි.	ආරම්භ කළ දිනය	නිම කිරීමට අපේක්ෂිත දිනය	2020 දක්වා ප්‍රගතිය	2020 දක්වා වියදම් (රු. මිලියන)	2021 අවසන් වන විට ප්‍රගතිය	2021 දී වියදම් (රු. මිලියන)
ම.අ.ම.ව්‍යා. IV කොටස	කි.මී. 58.6	ඉඩම් අත්පත් කර ගැනීම සහ නැවත පදිංචි කිරීම	10,000	2016 ජුනි	දෙසැම්බර් 2022 (ඉඩම් අත්පත් කර ගැනීම පමණි)	64.8%	179.13	70.7%	292.44
		සිවිල් වැඩ	166,557	ප්‍රසම්පාදන කටයුතු සිදු වෙමින් පවතී					
		උඩිස්	776	2016 ජූලි	ව්‍යාපෘතිය අවසන් කිරීම		352.72		96.15
		උපදේශනය	2,500	ප්‍රසම්පාදන කටයුතු සිදු වෙමින් පවතී					

2. රුවන්පුර අධිවේගී මාර්ගය

බස්නාහිර පළාත සහ සබරගමුව පළාත අතර කහතුඩුව සිට පැල්මඩුල්ල දක්වා රත්නපුර හරහා දිවෙන(කිලෝමීටර් 73.9) රුවන්පුර අධිවේගී මාර්ගය "මහින්ද චින්තනය ඉදිරි දැක්ම" ප්‍රතිපත්ති ප්‍රකාශය යටතේ 2014 වසරේ යෝජනා කර ඇත. මෙම අධිවේගී මාර්ගය ප්‍රධාන වශයෙන් හොරණ, ඉංගිරිය, කිරිඇල්ල, රත්නපුර සහ පැල්මඩුල්ල වැනි නගරවලට ප්‍රතිලාභ සලසන අතර, උඟව පළාතේ සහ නැගෙනහිර පළාතේ නගරවලට ගමන් කිරීමට මෙම අධිවේගී මාර්ගය පහසු මාර්ගයක් වනු ඇත.

මූලික ශක්‍යතා අධ්‍යයනය සිදු කරන ලද්දේ "M/S මගනැගුම උපදේශන සහ ව්‍යාපෘති කළමනාකරණ සේවා (පුද්) සමාගම විසින් වන අතර පාරිසරික, සමාජීය, ආර්ථික සහ ඉංජිනේරු අවශ්‍යතා වැනි අංශ සලකා බැලීමෙන් අනතුරුව මාර්ගය තෝරා ගන්නා ලදී.

වත්මන් රජයේ ප්‍රතිපත්ති රාමුව යටතේ රත්නපුර අධිවේගී මාර්ගයට ඉහළ ප්‍රමුඛතාවයක් ලබා දී ඇත. එමගින් ගමනාගමනයට පහසුකම් සැලසීමට සහ ආර්ථික වර්ධනයට අනුබල දෙන මාර්ග පද්ධතියක් ලෙස "රුවන්පුර අධිවේගී මාර්ගය" හැකි ඉක්මනින් නිම කිරීමට තෝරාගෙන ඇත. රුවන්පුර අධිවේගී මාර්ගයේ පළමු අදියර කහතුඩුව සිට ඉංගිරිය දක්වා (කිලෝමීටර් 24.3 දිග) ඉදිකිරීම් කොන්ත්‍රාත් පැකේජ යටතේ 2021 මැයි 3 වන දින ආරම්භ කරන ලදී.

මේ අතර, ඉංගිරිය - පැල්මඩුල්ල කොටස සඳහා ලාභදායී ලෙස මෙන්ම අවම පාරිසරික හා සමාජීය බලපෑම් ඇතිව කළ හැකි හොඳම නව පෙළගැස්ම තෝරා ගැනීමේ අරමුණින් ශක්‍යතා අධ්‍යයන වාර්තාව නැවත බැලීමට මහාමාර්ග අමාත්‍යාංශය තීරණය කළේය. මෙම පැවරුම සිදු කරනු ලැබුවේ මොරටුව විශ්වවිද්‍යාලයේ උපදේශක කණ්ඩායමක් විසිනි. ඉහත අධ්‍යයනයේ ප්‍රතිඵලයක් ලෙස ඉංගිරිය සහ රත්නපුර අතරේ මුල් මාර්ගයෙන් ආසන්න වශයෙන් කිලෝමීටර් 19ක දිග අපගමනය වී ඇත. මුල් සහ යාවත්කාලීන කළ මාර්ග සටහන පහත සිතියමේ දැක්වේ.



සිතියම 9: රුවන්පුර අධිවේගී මාර්ගය

ඉහත අධ්‍යයනයෙන් පසු රුවන්පුර අධිවේගී මාර්ග ව්‍යාපෘතියේ අදියර තුන මෙසේ නැවත අර්ථ දක්වා ඇත.

අදියර	තත්ත්වය
අදියර 1– කහතුඩුව සිට ඉංගිරිය දක්වා (කි.මී.: 0+000 – කි.මී: 25+000)	මේ වන විට ඉදිකිරීම් කටයුතු සිදු වෙමින් පවතී
අදියර 2 – ඉංගිරිය සිට ගොරකඇළ දක්වා (කි.මී: 25+000- 44+000)	මාර්ගය, මුලින් සලසුම් කළ මාර්ගයෙන් අපගමනය වී ඇත
අදියර 3 – ගොරකඇළ සිට පැල්මඩුල්ල දක්වා (කි.මී: 44+000 – 76+250)	මාර්ගය නොවෙනස්ව පවතී

I අදියරේ ප්‍රගතිය (කහතුඩුව සිට ඉංගිරිය දක්වා)

උපදේශක : මාර්ග සංවර්ධන අධිකාරිය
කොන්ත්‍රාත්කරු : මාගා ඉංජිනියරින් පුද්.සමාගම
අදියර 1 හි ඉදිකිරීම් කටයුතු (කහතුඩුව සිට ඉංගිරිය දක්වා) පහත පරිදි කොන්ත්‍රාත් පැකේජ 4ක් යටතේ ප්‍රදානය කරන ලදී. ;

- පැකේජය 1 – රුවන්පුර අධිවේගී මාර්ගය (කි.මී.0+000 සිට 7+300 දක්වා) - කි.මී.7.3
- පැකේජය 2 – රුවන්පුර අධිවේගී මාර්ගය (කි.මී.7+300 සිට 13+800 දක්වා) - කි.මී.6.5
- පැකේජය 3 – රුවන්පුර අධිවේගී මාර්ගය (කි.මී.13+800 සිට 20+300 දක්වා) - කි.මී.6.5
- පැකේජය 4 – රුවන්පුර අධිවේගී මාර්ගය (කි.මී.20+300 සිට 24+300 දක්වා) - කි.මී. 4.0

වගුව 70 : 2021 අවසානය දක්වා සාරාංශ ප්‍රගතිය

අධිවේගී මාර්ග කොටස	ත.ඇ.ක. (රු.මිලියන)	ආරම්භක දිනය	අවසන් කිරීමට අපේක්ෂිත දිනය	2021 අවසානයේ භෞතික ප්‍රගතිය	2021 වර්ෂය තුළ වියදම (රු. මිලියන)
අදියර 1 (කහතුඩුව සිට ඉංගිරිය දක්වා) කි.මී. 24.3	54,695.16	03.05.2021	01.11.2023	4%	3,571

2 සහ 3 අදියරවල ප්‍රගතිය (ඉංගිරියේ සිට පැල්මඩුල්ල දක්වා)

රුවන්පුර අධිවේගී මාර්ග ව්‍යාපෘතියේ 2 සහ 3 අදියර සඳහා ශක්‍යතා අධ්‍යයනය සහ පාරිසරික බලපෑම් ඇගයීම මාර්ග සංවර්ධන අධිකාරිය මගින් සිදු කෙරේ.

වගුව 71: සමීක්ෂණ සහ විමර්ශනවල ප්‍රගතිය

ක්‍රියාකාරකම	**ප්‍රගතිය**
අපගමනය කරන ලද කොටස සඳහා සිදුරු විමර්ශනය	100%
අපගමනය කරන ලද කොටස සඳහා භූලක්ෂණ ඩ්‍රෝන සමීක්ෂණය	100%
ජල විද්‍යාව අධ්‍යයනය සඳහා ගංවතුර සරල ඩ්‍රෝන සමීක්ෂණය	70%
මිනින්දෝරු දෙපාර්තමේන්තුව මගින් බිම් මැනීම	10%

වගුව 72 : ශක්‍යතා අධ්‍යයනයේ සහ ඒ ආශ්‍රිත අධ්‍යයනවල ප්‍රගතිය

ක්‍රියාකාරකම	**ප්‍රගතිය**
රථවාහන අධ්‍යයනය	90%
ආර්ථික අධ්‍යයනය	20%
මූල්‍ය අධ්‍යයනය	10%
පූර්ව ජ්‍යාමිතික නිර්මාණය	20%
භූ තාක්ෂණික අධ්‍යයන වාර්තාව	උපදේශකයින් තෝරා ගැනීම සඳහා ප්‍රසම්පාදනය සිදු වෙමින් පවතී
සවිස්තරාත්මක ජල විද්‍යාව අධ්‍යයනය	SLLDC වෙත ප්‍රදානය කරන ලදී
උමං විමර්ශන අධ්‍යයන වාර්තාව	35%

වගුව 73: පාරිසරික බලපෑම් ඇගයීමේ ප්‍රගතිය

ක්‍රියාකාරකම	**ප්‍රගතිය**
කණ්ඩායම් නායක	සුදුසු උපදේශකයින් තෝරා ගැනීම අවසන් කර ඇත
මහජනතාව දැනුවත් කිරීමේ රැස්වීම	ක්‍රියාත්මක වෙමින් පවතී
පරිසර විද්‍යා අධ්‍යයනය	සුදුසු උපදේශකයින් තෝරා ගැනීම අවසන් කර ඇත
SIA, RAP	සුදුසු උපදේශකයින් තෝරා ගැනීම අවසන් කර ඇත
ශබ්ද ආකෘති නිර්මාණය, මූලික දත්ත එකතු කිරීම	කාර්මික තාක්ෂණ ආයතනය සමඟ මූලික පරීක්ෂණය ආරම්භ විය

පැකේජය 1 – කි.මී.: 0+000 සිට කි.මී.: 7+300 දක්වා



කි.මී.: 3+500 හි බැම්ම පිරවීම



කි.මී.: 3+240 හි ගල් තොග ගොඩ ගැසීම

පැකේජය 2 – කි.මී.: 7+300 සිට කි.මී.: 13+800 දක්වා



කොන්ත්‍රාත්කරුවන් බලමුලු ගැන්වීම - ප්‍රධාන අංගනය සකස් කිරීම



9+200 හි ඉහළ පස ඉවත් කිරීම

පැකේජය 3 – කි.මී.: 13+800 සිට කි.මී.: 20+300 දක්වා



කි.මී.: 19+650 හි වර්ගීකරණය නොකළ කැණීම්



කි.මී.14+280 හි නියමු මාර්ග ඉදිකිරීම

පැකේජය 4 – කි.මී.: 20+300 සිට කි.මී.: 24+300 දක්වා



කි.මී.: 20+750 හි වර්ගීකරණය නොකළ



කි.මී.: 21+700 හි නියමු මාර්ග ඉදිකිරීම

3. කුළුණු මත ඉදිවන වරාය පිවිසුම් අධිවේගී මාර්ග ව්‍යාපෘතිය

කොළඹ නගරයේ මාර්ග පද්ධතියේ කාර්යක්ෂමතාව ඉහළ නැංවීම සඳහා කුළුණු මත ඉදිවන වරාය පිවිසුම් අධිවේගී මාර්ගය සැලසුම් කර ඇත. මෙම අධිවේගී මාර්ගය නව කැලණි පාලම ව්‍යාපෘතියේ ඉඟුරුකඩේ අන්තර් හුවමාරුවට වරාය නගරය සහ ගාලු මුවදොර සම්බන්ධ කරමින් පරිසර හිතකාමී ලෙස කුළුණු මත ඉදිකර ඇත. ව්‍යාපෘතියේ ඉදිකිරීම් කටයුතු ආසියානු සංවර්ධන බැංකුවේ ණයක් යටතේ සිදු කෙරේ.

ව්‍යාපෘතියේ අරමුණු

- කොළඹ නගරයේ පවතින දැඩි රථවාහන තදබදයට ස්ථිර විසඳුමක් ලෙස ඉඟුරුකඩේ අන්තර් හුවමාරුවේ සිට නව වරාය නගරය දක්වා කුළුණු මත අධිවේගී මාර්ගයක් ඉදිකිරීම.
- එය පිටකොටුව අන්තර් හුවමාරුව හරහා යෝජිත ප්‍රධාන බහුවිධ ප්‍රවාහන මධ්‍යස්ථානය වෙත යොමු කර ඇති බැවින්, අධිවේගී මාර්ග ජාලයට ඇතුළු වීමට පහසුව සැලසේ.
- වරායේ සිට බහාලුම් ප්‍රවාහනය සඳහා නව ප්‍රවේශ මාර්ගයක් ලබා දීම.

අපේක්ෂිත ප්‍රතිලාභ

- කොළඹ සහ තදාසන්න ප්‍රදේශවල මාර්ග තදබදය අවම කිරීම, ප්‍රවාහන පහසුකම්වල කාර්යක්ෂමතාව වැඩි කිරීම සහ ගමන් කාලය ඉතිරි කිරීම.
- නව රැකියා මාර්ග විවෘත කිරීම සහ ආයෝජන අවස්ථා ප්‍රවර්ධනය කිරීම.
- පරිසර දූෂණය අවම කිරීම සහ ඉන්ධන කාර්යක්ෂමතාව වැඩි කිරීම.

ව්‍යාපෘති සංරචක

මෙම ව්‍යාපෘතිය පහත ව්‍යාපෘති සංරචක වලින් සමන්විත වේ;

- උස් කුළුණු මත දිවෙන වරාය ප්‍රවේශ අධිවේගී මාර්ගය ඉදිකිරීම
- ශ්‍රී ලංකා වරාය අධිකාරිය සඳහා සමුද්‍රීය පහසුකම් මධ්‍යස්ථානයක් ඉදිකිරීම
- බහු මංතීරු ප්‍රවාහ ඉලෙක්ට්‍රොනික ගාස්තු එකතු කිරීමේ පද්ධතියක් ස්ථාපනය කිරීම (MLFF-ETC)

(i) උස් කුළුණු මත දිවෙන වරාය ප්‍රවේශ අධිවේගී මාර්ගය ඉදිකිරීම

වගුව 74 : උස් කුළුණු මත දිවෙන වරාය ප්‍රවේශ අධිවේගී මාර්ගය ඉදිකිරීම සඳහා වන සිවිල් කටයුතු පිළිබඳ මූලික විස්තර

අයිතමය	විස්තරය
විෂය පථය	කුළුණු මත ඉදිවන වරාය ප්‍රවේශ අධිවේගී මාර්ගය ඉදිකිරීම සහ වරාය ප්‍රවේශ මාර්ගය ප්‍රතිසංස්කරණය කිරීම
කොන්ත්‍රාත් අංකය	RDA/ADB/OCB/PAEH/CW/01
සේවායෝජකයා	මහාමාර්ග අමාත්‍යාංශය, මාර්ග සංවර්ධන අධිකාරිය
මූල්‍ය සහාය	ආසියානු සංවර්ධන බැංකුව
කොන්ත්‍රාත්කරු	China Civil Engineering Construction Corporation, Hubei Provincial Road and Bridge Group Co. Ltd සහ Henan Provincial Communications Planning and Design Institute Co., Ltd. (CCECC-HPRB-HNRBI JV)
ඉංජිනේරු	ෂෙලාඩියා ඇසෝසියේට්ස් ඉන්කෝපරේෂන්, රෑටන් ඉන්ටර්නැෂනල් සහ එම්ජී කන්සල්ටන්ට්ස් සමඟ හවුල් ව්‍යාපාරයක් ලෙස (SRM JV)
ණය ගිවිසුම අත්සන් කළ දිනය	2019 ජනවාරි 17

අයිතමය	විස්තරය		
කොන්ත්‍රාත් ගිවිසුම අත්සන් කළ දිනය	2019 සැප්තැම්බර් 10		
ආරම්භක දිනය	2019 සැප්තැම්බර් 27		
මුලින් අවසන් කිරීමට නියමිතව තිබූ දිනය	2022 සැප්තැම්බර් 25		
සංශෝධිත නිම කිරීමේ දිනය	2023 මැයි 30		
මුල් කොන්ත්‍රාත්තුවේ මුදල	රුපියල් මිලියන 28,002.22 කි		
උස් අධිවේගී මාර්ගයේ දිග	කි.මී.5.27		
අන්තර් හුවමාරු	බෑවුම් මහ 1	ඇතුල්වීම – අළුත් මාවත පිට වීම – අළුත් මාවත	විචලනය
	බෑවුම් මහ 2	ඇතුල්වීම – විමලධර්ම වටරවුම – පිට වීම – අබ්දුල් කාදර් මාර්ගය	විචලනය
	බෑවුම් මහ 3	ඇතුල්වීම – වරාය පිට වීම – වරාය	
	බෑවුම් මහ 4	ඇතුල්වීම – ගාලු මුවදොර / වරාය නගරය පිට වීම – ගාලු මුවදොර / වරාය නගරය	
මංතීරු ගණන	මංතීරු 4 (මී.3.5 x 4)		
මාර්ගය දෙපස මංතීරු	ඇතුළත – මී.1.25 පිටත – මී.2.5		
වරාය ප්‍රවේශ මාර්ගය සහ වරාය අභ්‍යන්තර මාර්ගය ඉදිකිරීම සඳහා දිග	කි.මී.4.14		



සිතියම 10: උස් කුළුණු මත ඉදිවන වරාය ප්‍රවේශ අධිවේගී මාර්ගය

(ii) සමුද්‍රීය පහසුකම් මධ්‍යස්ථානයක් ඉදිකිරීම

ශ්‍රී ලංකාවේ ජාත්‍යන්තර වෙළෙඳ මෙහෙයුම්වලින් 95% කට පමණ වරාය මෙහෙයුම් දායකත්වය සපයයි. කොළඹ වරාය ඉන්දියානු උපමහාද්වීපයේ සහ ජාත්‍යන්තර වෙළඳපොලේ මධ්‍යම ස්ථානයක පිහිටා ඇති අතර එබැවින් එය වඩාත් ලාභදායී ප්‍රතිනැව්ගත කිරීමේ මධ්‍යස්ථානයක් ලෙස උපායමාර්ගික ප්‍රතිලාභයක් ලබා ඇත.

ශ්‍රී ලංකා වරාය අධිකාරියේ කාර්ය මණ්ඩලය මේ වන විට ස්ථාන කිහිපයක රැඳී සිටින අතර, මෙම තත්ත්වය ඵලදායිතාව අඩුවීමට හේතුවක් වී තිබේ. මේ සඳහා වරායේ ඉඩම් විශාල ප්‍රමාණයක් යොදාගෙන ඇත. තවද, ඇතැම් නැව් මාර්ග සහ අනෙකුත් වරාය ආශ්‍රිත ආයතන කොළඹ වරායට ආසන්න තාවකාලික ස්ථානවල තම කාර්යාල පහසුකම් පවත්වාගෙන යයි.

යෝජිත සමුද්‍රීය පහසුකම් මධ්‍යස්ථානය ශ්‍රී ලංකා වරාය අධිකාරියට අයත් කොළඹ 01, ලෝටස් පාරේ ඉඩමක ඉදිකරන ලද මහල් 17 කින් යුත් ගොඩනැගිල්ලකි. මෙම මධ්‍යස්ථානය ශ්‍රී ලංකා වරාය අධිකාරිය විසින් සපයනු ලබන වරාය සේවාවේ කාර්යක්ෂමතාවය වැඩිදියුණු කිරීමට දායක වන අතරම අධිකාරියේ සියලුම කාර්ය මණ්ඩලයට සහ අනෙකුත් අදාළ ආයතනවලට එක ස්ථානයක නවාතැන් සලසනු ඇත. එය වරාය භාවිතා කරන්නන්ට වැඩිදියුණු කළ පහසුකම් සැපයීම සඳහා කඩදාසි රහිත මාර්ගගත කාර්යාල පද්ධති සඳහා පහසුකම් සපයනු ඇත.
වරාය පරිශ්‍රය හරහා උස් කුළුණු මත ඉදිවන වරාය ප්‍රවේශ මාර්ගය ඉදිකිරීම මාර්ග සංවර්ධන අධිකාරිය මගින් ක්‍රියාත්මක කරයි. යෝජිත සමුද්‍රීය පහසුකම් මධ්‍යස්ථානය ආසියානු සංවර්ධන බැංකුවේ අරමුදල් යටතේ ශ්‍රී ලංකා වරාය අධිකාරිය සහ මාර්ග සංවර්ධන අධිකාරිය එක්ව ක්‍රියාත්මක කරයි.

වගුව 75 : සමුද්‍රීය පහසුකම් මධ්‍යස්ථානයක් ඉදිකිරීම සඳහා වන සිවිල් කටයුතු පිළිබඳ මූලික විස්තර

අයිතමය	විස්තරය
වැඩ විෂය පථය	***අදියර I - උප ව්‍යුහය ඉදිකිරීම***
	බිම් සිදුරු කිරීම් [171 අංක]: වෙනම කොන්ත්‍රාත්තුවක් හරහා සම්පූර්ණ කර ඇත
	II අදියර - සුපිරි ව්‍යුහය ඉදිකිරීම
	සැලසුම් සහ ඉදිකිරීම් කොන්ත්‍රාත්තුව: 17 මහල් ගොඩනැගිල්ල මුළු බිම් ප්‍රමාණය: වර්ග මීටර් 35,000
කොන්ත්‍රාත් අංකය	RDA/ADB/OCB/PAEH/CW/02
සේවායෝජකයා	මහාමාර්ග අමාත්‍යාංශය, මාර්ග සංවර්ධන අධිකාරිය
අරමුදල් නියෝජිතායතනය	ආසියානු සංවර්ධන බැංකුව
කොන්ත්‍රාත්කරු	China Civil Engineering Construction Corporation සමඟ China Railway Construction Group Co. Ltd ඒකාබද්ධ ව්‍යාපාරයක් ලෙස (CCECC – CRCG JV)
ඉංජිනේරු	ෂෙලාඩියා ඇසෝසියේට්ස් ඉන්කෝපරේෂන්, රෑටන් ඉන්ටර්නැෂනල් සහ එම්ජී කන්සල්ටන්ට්ස් සමඟ හවුල් ව්‍යාපාරයක් ලෙස (SRM JV)
ණය ගිවිසුම අත්සන් කළ දිනය	2019 ජනවාරි 17
පිළිගැනීමේ ලිපිය නිකුත් කළ දිනය	2021 ජූනි 23
ආරම්භක දිනය	2021 ජූලි 07
සම්පූර්ණ කරන දිනය	2023 ජූලි 06
කොන්ත්‍රාත් මුදල	රු. මිලියන 4,999.43 කි



යෝජිත සමුද්‍රීය පහසුකම් මධ්‍යස්ථානය



සමුද්‍රීය පහසුකම් මධ්‍යස්ථානයේ ඉදිකිරීම් ප්‍රගතිය

(iii) බහු මංතීරු ප්‍රවාහ ඉලෙක්ට්‍රොනික ගාස්තු එකතු කිරීමේ පද්ධතියක් ස්ථාපනය කිරීම (MLFF-ETC)

මෙම ව්‍යාපෘතිය යටතේ අධිවේගී මාර්ග ජාලය සඳහා බහු මංතීරු ප්‍රවාහ ඉලෙක්ට්‍රොනික ගාස්තු එකතු කිරීමේ පද්ධතියක් ලබාදීමට සැලසුම් කර ඇත. ව්‍යාපෘතියේ ආසන්න ඇස්තමේන්තු මුදල ඇමරිකානු ඩොලර් මිලියන 34 කි. ව්‍යාපෘතිය 2021 නොවැම්බර් 3 වන දින ආරම්භ කරන ලද අතර එය 2024 දී අවසන් කිරීමට අපේක්ෂා කෙරේ.

අපේක්ෂිත ප්‍රතිලාභ

- අධිවේගී මාර්ග භාවිතා කරන්නන්ට පෙර ගෙවුම් ගිණුමක් හරහා ගෙවීම් කිරීමට හැකි වේ.
- ගෙවීම් ප්‍රේෂණය කරනු ලබන්නේ විද්‍යුත් ගිණුම හරහා බැවින්, ගනුදෙනුකරුවන්ට ඕනෑම වේලාවක ගිණුම් ශේෂය පරීක්ෂා කර ගිණුම් වෙත නැන්පතු කිරීමට හැකි වේ.
- යෝජිත නව ක්‍රමය හරහා ගාස්තු ගෙවීමේ කවුන්ටරවල දැනට පවතින ප්‍රමාදයන් අවම කෙරෙනු ඇති අතර එම නිසා අවම ඉන්ධන දහනය හේතුවෙන් අඩු වූ කාබන් විමෝචනය හරහා පරිසර හිතකාමී ප්‍රවාහනයක් නිර්මාණය කළ හැකිය.
- දැනට පවතින ක්‍රමය භාවිතා කරමින් සිදු කරන පැයකට වාහන 350 වෙනුවට නව ක්‍රමය භාවිතා කර පැයකට වාහන 1200ක් පමණ ධාවනය කිරීමට හැකි වනු ඇත. එබැවින් ගාස්තු ගෙවීමේ කවුන්ටරවල තදබදය අවම කර ගත හැකිය.

වර්ෂය තුළ ප්‍රගතියට ඇති බාධා සහ ගෙන ඇති හෝ යෝජිත ප්‍රතිකර්ම ක්‍රියාමාර්ග

බාධක		ගෙන ඇති/ යෝජිත ප්‍රතිකර්ම ක්‍රියාමාර්ග
විශේෂයෙන් කොටස් ගබඩා කිරීම සඳහා පූර්ව විකාශන අංගනය සඳහා ප්‍රමාණවත් ඉඩමක් නොමැත.	-	කොළඹ වරාය නගර කොමිෂන් සභාව සමඟ අවබෝධතා ගිවිසුම් අත්සන් කිරීමෙන් පසුව, කොන්ත්‍රාත්කරුට වරාය නගරයට අයත් ප්‍රිකාස්ට් අංගනයේ යාබද ඉඩම ලබා දෙන ලදී.
අධික ගල් කැණීම් හේතුවෙන් ගොඩකිරීමේ කටයුතු ප්‍රමාද වීම.	-	මහාචාර්ය සමන් තිලකසිරි සහ ආචාර්ය ආසිරි කරුණාවර්ධන යන අයගේ සහයෝගය ඇතිව සැලසුම් නිවැරදි ලෙස සකස් කරන ලදී.
කොවිඩ් -19 වසංගත තත්ත්වය	-	බලපෑම අවම කිරීමට පියවර ගෙන ඇත.
සිමෙන්ති සැපයුමේ හිඟය (සාමාන්‍ය මාසික හිඟය: ටොන් 2800)	-	සිමෙන්ති ආනයනික බද්දෙන් නිදහස් කරන ලෙස ඉල්ලීමක් කර ඇත.
ශ්‍රී ලංකා වරාය අධිකාරියේ ගොඩනැගිලි වෙනත් ස්ථානයකට ගෙන යාමේ ප්‍රමාදය	-	වරාය පරිශ්‍රයෙන් පිටත කාර්යාල අවකාශය කුලියට දීමට කටයුතු කර ඇත.

වගුව 76 : උස් කුළුණු මත දිවෙන වරාය ප්‍රවේශ අධිවේගී මාර්ග ව්‍යාපෘතියේ සාරාංශ ප්‍රගතිය

ක්‍රියාකාරකම් විස්තරය	මුළු ඇස්තමේන්තුගත පිරිවැය (රු. මිලියන)	ආරම්භක දිනය	නිම කිරීමට අපේක්ෂිත දිනය	2020 අවසානය දක්වා ප්‍රගතිය	2020 අවසානය දක්වා වියදම්	2021 අවසානයේ ප්‍රගතිය (%)	2021 වර්ෂය තුළ වියදම් (රු. මිලියන)
උස් කුළුණු මත දිවෙන වරාය ප්‍රවේශ අධිවේගී මාර්ගය ඉදිකිරීම	28,002	සැප්.-19	මැයි -23	6%	5,141.10	23.3	3,028.73
සමුද්‍රීය පහසුකම් මධ්‍යස්ථානය (ගොඩනැගිල්ල) ඉදිකිරීම	4,999	ජූලි -21	මාර්තු -23	0%	-	6.1	928.66
සමුද්‍රීය පහසුකම් මධ්‍යස්ථානය සඳහා ගොඩකිරීමේ කටයුතු (Piling)	624	ජූනි -19	අප්‍රේල් -20	100%	414.87	100.0	-
ඉලෙක්ට්‍රොනික ගාස්තු එකතු කිරීමේ පද්ධතිය සඳහා කොන්ත්‍රාත්කරු	4,480	දෙසැ -22	දෙසැ -23	0%	-		-
PAEH හි ඉදිකිරීම් අධීක්ෂණය	1,290	ඔක් -19	සැප් -25		218.35	26%	331.57
ඉලෙක්ට්‍රොනික ගාස්තු එකතු කිරීමේ පද්ධති කළමනාකරණය සඳහා උපදේශක	552	ඔක් -21	මාර්තු -23		-		27.27
තනි පුද්ගල උපදේශක-ව්‍යුහාත්මක උපදේශක	65	දෙසැ -20	දෙසැ-22		-		-
තනි පුද්ගල උපදේශක-කොන්ත්‍රාත් ඉංජිනේරු	20	දෙසැ -20	දෙසැ -24		-		-
වරාය ගොඩනැගිලි සැලසුම් කිරීම සහ ඉදිකිරීම් අධීක්ෂණය	141	ජූනි -19	ජූලි -25		41.45	90%	48.6
ආසියානු සංවර්ධන බැංකුවේ පොලී සහ කැපවීම් ගාස්තු							148.15
ව්‍යාපෘති කළමනාකරණ ඒකකවල වියදම්							40.21
VAT සහ අනෙකුත් ගාස්තු							0.52
එකතුව							**4,553.71**

4. නව කැලණි පාලමේ සිට අතුරුගිරිය දක්වා අධිවේගී මාර්ගය

කොළඹ නගරාසන්න ප්‍රදේශයේ මාර්ග පද්ධතිය එහි ධාරිතාවයට ආසන්න වීම හෝ ඉක්මවා යාම නිසා කොළඹ නගරයේ සහ තදාසන්න ප්‍රදේශවල දැනට පවතින රථවාහන තදබදය කාර්යබහුල වේලාවන්හිදී බරපතළ වී ඇත. කොළඹ නගරාසන්න ප්‍රදේශයේ මාර්ග පද්ධතිය එහි ධාරිතාවයට ආසන්න වීම හෝ ඉක්මවා යාම නිසා කොළඹ නගරයේ සහ තදාසන්න ප්‍රදේශවල දැනට පවතින රථවාහන තදබදය කාර්යබහුල වේලාවන්හිදී බරපතළ වී ඇත. දක්ෂිණ අධිවේගී මාර්ගය, කොළඹ - කටුනායක අධිවේගී මාර්ගය සහ පිටත වටරවුම් අධිවේගී මාර්ගය මේ වන විට ක්‍රියාත්මකයි. පිටත වටරවුම් අධිවේගී මාර්ගය මඟින් කොළඹ නගරය හරහා ගමන් නොකර ගමනාගමනයට ඉඩ සලසයි. නමුත් කොළඹ නගරයට ඇතුළු වීමට වාහන විශාල ප්‍රමාණයක් පවතී.

මහා පරිමාණ ඉඩම් අත්පත් කර ගැනීම් සහ නැවත පදිංචි කිරීමේ අවශ්‍යතා හේතුවෙන් දැනට පවතින මාර්ග පුළුල් කිරීමේ විකල්පය අතිශය දුෂ්කර වී ඇත. එබැවින්, උපාය මාර්ගික ස්ථාන සම්බන්ධ කරන උස් මාර්ග සංවර්ධනය කිරීමෙන් මාර්ග ධාරිතාව වැඩි කිරීමේ විකල්පය අවම ඉඩම් අත්පත් කර ගැනීමක් සහිත එක් විකල්පයක් ලෙස හඳුනාගෙන ඇත.

එසේම දැනට පවතින අධිවේගී මාර්ග ජාලය කොළඹ ප්‍රදේශයේ ආර්ථික, පරිපාලන සහ ප්‍රවාහන මධ්‍යස්ථානවලට සම්බන්ධ කිරීමේ අවශ්‍යතාවය සමස්ත ප්‍රවාහන කාර්යක්ෂමතාවය ඉහළ නැංවීම සඳහා අවශ්‍යතාවයක් වී ඇත.

එබැවින් නව කැලණි පාලමේ සිට අතුරුගිරිය දක්වා උස් කුළුණු මත දිවෙන අධිවේගී මාර්ගය, සැලසුම්-ගොඩනැගීම-මූල්‍ය-ක්‍රියාත්මක කිරීම -නඩත්තු සහ මාරු (DBFOMT) පදනම මත ක්‍රියාත්මක කිරීමට යෝජනා කර ඇත.ඇස්තමේන්තුගත පිරිවැය බිලියන 171.7 ක් වන අතර සහන කාලය ඉදිකිරීම් කාලය සඳහා වසර 3 ක් ඇතුළුව වසර 18 කි.

ප්‍රධාන මාර්ගය සහ ප්‍රවේශ මාර්ගවල ආසන්න දිග පිළිවෙලින් කිලෝමීටර් 16.4 සහ කිලෝමීටර් 15.3 කි. මෙම ව්‍යාපෘතිය ඔරුගොඩවත්තෙන් ආරම්භ වන අතර නව කැලණි පාලම හා සම්බන්ධ වේ. දෙමටගොඩදී බේස්ලයින් මාර්ගයට ප්‍රවේශයක් යෝජනා කර ඇත. ඉන්පසු යෝජිත මාර්ගය රාජගිරිය, කොස්වත්ත සහ හෝකන්දර අන්තර් හුවමාරු හරහා ගමන් කර අතුරුගිරියේ පිටත වටරවුම් අධිවේගී මාර්ගයට සම්බන්ධ වේ.

නව කැළණි පාලමේ සිට අතුරුගිරිය දක්වා වූ මෙම උස් අධිවේගී මාර්ගය දෙමටගොඩ ඇළ දිගේ සහ අතහැර දැමූ කුඹුරු ප්‍රදේශ හරහා බොහෝ දුරට දිව යයි. එබැවින් ඉඩම් අත්පත් කර ගැනීමේ අවශ්‍යතාව අවම වේ. මෙම උස් අධිවේගී මාර්ගය පැයට කිලෝමීටර 80 ක සැලසුම් වේගයකින් යුත් ප්‍රවේශ පාලනයකින් යුත් මංතීරු 4 මාර්ගයක් ලෙස සැලසුම් කෙරේ.

ව්‍යාපෘතියේ ප්‍රතිලාභ

- බත්තරමුල්ල පරිපාලන අගනුවර, පාර්ලිමේන්තුව සහ මාලඹේ අධ්‍යාපන මධ්‍යස්ථානය වෙත කොළඹ නාගරික ප්‍රදේශයෙන් පහසු ප්‍රවේශයක් ලබා දීම සහ අධිවේගී මාර්ග ජාලය සම්බන්ධ කරමින් නව කැලණි පාලමේ සිට පිටත වටරවුම් අධිවේගී මාර්ගයට පහසුවෙන් ප්‍රවේශ වීම.
- උස් කුළුණු මත දිවෙන වරාය ප්‍රවේශ අධිවේගී මාර්ගය නිම කිරීමත් සමඟ කොළඹ වරාය සහ වරාය නගරය අධිවේගී මාර්ග ජාලයට සම්බන්ධ කිරීම මගින් භාණ්ඩ ප්‍රවාහනයට ඇති මාර්ග තදබදය ලිහිල් කිරීම.
- මාලඹේ, අතුරුගිරිය, කොස්වත්ත, බත්තරමුල්ල සහ රාජගිරිය ප්‍රදේශවල ජනනය වන මාර්ග තදබදය අවම කිරීම.

ව්‍යාපෘති කළමනාකරණ ඒකකවල වගකීම්

පූර්ව ඉදිකිරීම් අදියර

- සමාජීය, පාරිසරික හා ආර්ථික වශයෙන් ශක්‍ය පෙළගැස්මක් තෝරා ගැනීමට ශක්‍යතා අධ්‍යයනය.
- ව්‍යාපෘතියේ බලපෑමට ලක් වූ ප්‍රදේශයේ පදිංචිකරුවන් බිම් මැනීම සඳහා ඔවුන්ගේ කැමැත්ත ලබා ගැනීම සඳහා දැනුවත් කිරීමේ වැඩසටහන.

- ව්‍යාපෘති සම්බන්ධයෙන් මහජනතාව දැනුවත් කිරීමේ රැස්වීම්.
- අවශ්‍ය පරිදි අදාළ බලධාරීන්ගෙන් අනුමැතිය ලබා ගැනීම සහ ඔවුන් සමඟ සම්බන්ධීකරණය කිරීම.
- මධ්‍යම පරිසර අධිකාරියේ (CEA) අනුමැතිය ලබා ගැනීම සඳහා පාරිසරික බලපෑම් තක්සේරු (EIA) වාර්තාව අවශ්‍ය වේ.
- බිම් මැනුම් කටයුතු
- ව්‍යාපෘතිය සඳහා නැවත පදිංචි කිරීමේ ක්‍රියාකාරී සැලැස්ම (RAP).
- මාර්ගය (ROW) සඳහා ඉඩම් අත්පත් කර ගැනීම සහ වන්දි ගෙවීම.
- උපදේශන කටයුතු හා ආයෝජකයින් තෝරා ගැනීම සම්බන්ධ ප්‍රසම්පාදන කටයුතු. ආයෝජකයාගේ ප්‍රසම්පාදනය සඳහා EOI, තාක්ෂණික උපලේඛන, RFP සහ සහන ගිවිසුම සකස් කිරීම. ඇගයීම් කමිටු/ප්‍රසම්පාදන කමිටුව/CANC වල කාර්යයන් සඳහා පහසුකම් සැලසීම සහ නියමිත පරිදි නියමිත වේලාවට කාර්යයන් නිම කිරීම සහතික කිරීම සඳහා ප්‍රසම්පාදන සැලැස්ම සමඟ ක්‍රියාකාරකම්වල ප්‍රගතිය අධීක්ෂණය කිරීම.
- බලපෑමට ලක් වූ නිවැසියන් නැවත පදිංචි කිරීම සඳහා නැවත පදිංචි කිරීමේ ස්ථාන සංවර්ධනය කිරීම.

ඉදිකිරීම් අදියර

- බාධාවන් රහිත සහ හිස් අවකාශ මාර්ගය සඳහා ලබා දීම.
- සහන ගිවිසුමේ නියමයන්ට අනුව, ව්‍යාපෘතිය ක්‍රියාත්මක කිරීමට පෙර සහ අතරතුර පුද්ගලික හවුල්කරුට සාධාරණ සහය ලබා දීම.
- සහන ගිවිසුමට අනුකූලව ලබා ගත හැකි ගෙවීම් සැපයීම.
- වෙනත් අදාළ ආයතනවලින් ව්‍යාපෘති වාර්තා එකතු කිරීම සහ තොරතුරු පද්ධතියක සහ අධීක්ෂණ මෙවලමක පදනම ලෙස ක්‍රියා කළ හැකි නිරන්තර යාවත්කාලීන කිරීම් සමඟ ඒකාබද්ධ ව්‍යාපෘති දත්ත බැංකුවක් පිහිටුවීම.
- ගිවිසුම්ගත බැඳීම්වලට අනුකූලව ඔවුන්ට අදාළ රාජකාරි ඉටුවීම තහවුරු කර ගැනීම සඳහා ව්‍යාපෘතියේ නියැලී සිටින උපදේශකයින්ගේ කාර්ය සාධනය අධීක්ෂණය කිරීම.
- තනි කොන්ත්‍රාත්තුවේ ප්‍රගතිය වරින් වර සමාලෝචනය කිරීම, අඩුපාඩු, ගැටළු හඳුනා ගැනීම සහ ඉහළ බලධාරීන් සමඟ සාකච්ඡා කර විසඳුම් සඳහා පහසුකම් සැලසීම.



සිතියම 11: ව්‍යාපෘති ස්ථාන සිතියම

වගුව 77: සාරාංශ ප්‍රගතිය

විස්තරය	ත.ඇ.ක. (රු.මි.)	ආරම්භක දිනය	සම්පූර්ණ කරන දිනය	2020 අවසානය දක්වා වියදම් (රු. මිලියන)	2021 අවසානයේ භෞතික ප්‍රගතිය (%)	2021 වර්ෂය තුළ වියදම් (රු. මිලියන)
නව කැලණි පාලමේ සිට අධිවේගී මාර්ගය - අතුරුගිරිය (කි.මී. 16.4)	201,907.19	අගෝස්තු 2017	ජනවාරි 2025	274.94	-	766.5

තවමත් එහි ඉදිකිරීම් කටයුතු ආරම්භ කර නැත. මේ දක්වා සිදුවෙමින් පවතින සහ අවසන් කරන ලද එක් එක් ක්‍රියාකාරකම්වල ප්‍රගතිය පහත වගුවේ දක්වා ඇත.

වගුව 78 : ව්‍යාපෘති ප්‍රගතිය

විස්තරය	**ප්‍රගතිය**	
ශක්‍යතා අධ්‍යයනය (නව කැළණි පාලම - අතුරුගිරිය)	නිම කර ඇත	
නව කැළණි පාලමේ සිට රාජගිරිය දක්වා EIA සහ RAP වාර්තා	නිම කර ඇත	
ඉඩම් අත්පත් කර ගැනීම (නව කැළණි පාලම - අතුරුගිරිය)	**නව කැළණි පාලමේ සිට රාජගිරිය දක්වා කොටස:** ගැසට් පත්‍ර 15ක් (කොටස් 38) ප්‍රකාශයට පත් කර ඇත : PP සමීක්ෂණ 15 අවසන් කර ඇත. PP සැලසුම් 12 ක් ලබා ගන්නා ලදී. ආරාමය පෙදෙසේ PP සමීක්ෂණය අවසන් කර ඇත. තත්ත්ව වාර්තා ලබා ගැනීම ක්‍රියාත්මකයි. 9 වැනි වගන්තියේ පරීක්ෂණ ක්‍රියාත්මකයි. කොටස් 254ක් සඳහා තක්සේරු දෙපාර්තමේන්තුවෙන් තක්සේරු කිරීම සඳහා ඉල්ලීම. සම්පූර්ණ කරන ලද CR සංඛ්‍යාව - කැබලි 1170 සම්පූර්ණ කර ඇති විමසීම් ගණන - 717	**රාජගිරිය සිට අතුරුගිරිය දක්වා කොටස:** 6+400 - 9+800 : උසස් අනුරේඛන (Advanced tracing) ලැබී ඇති අතර අදහස් සඳහා අධිවේගී මාර්ග අංශය වෙත යොමු කර ඇත. 9+800 - 12+000 : සැලසුම් ඇඳීම සඳහා වන මැනුම් ක්ෂේත්‍ර වැඩ නිම කර ඇත. AT සැලසුම් සකස් කිරීම සිදු වෙමින් පවතී. 12+000-14+000: සැලසුම් සැකසීම සඳහා සමීක්ෂණ ක්ෂේත්‍ර කටයුතු සිදු වෙමින් පවතී. 14+000-15+340 : සැලසුම් සඳහා වන මැනුම් ක්ෂේත්‍ර කටයුතු අවසන්. AT සැලසුම් සකස් කිරීම සිදු වෙමින් පවතී. 15+340-16+400 : සැලසුම් සඳහා මැනුම් ක්ෂේත්‍ර කටයුතු අවසන් කර ඇත. සැලසුම් සැකසීම සිදු වෙමින් පවතී. ඇළ මාර්ගය - AT සැලසුම් සකස් කිරීම සඳහා

විස්තරය	ප්‍රගතිය	
		මිනින්දෝරු ක්ෂේත්‍ර කටයුතු ආරම්භ කිරීමට නියමිතය.
උපයෝගිතා මාරු කිරීම (නව කැලණි පාලම - අතුරුගිරිය)	**නව කැලණි පාලමේ සිට රාජගිරිය දක්වා කොටස :**132 kv සම්ප්‍රේෂණ මාර්ගය කොළොන්නාව සිට කැලණිතිස්ස දක්වා මාරු කිරීම සඳහා කොළොන්නාව-කැලණිතිස්ස- අවබෝධතා ගිවිසුම අත්සන් කර පළමු වාරිකය (රු. මිලියන 480) ලංවිමට ගෙවා ඇත. ඇස්තමේන්තුව සඳහා MPC වෙතින් අනුමැතිය ලබා ගැනීම. මීතොටමුල්ල-කොළොන්නාව (33kv)-33kv සම්ප්‍රේෂණ මාර්ගය මාරු කිරීම සඳහා ගෙවීම. මීතොටමුල්ල - කොළොන්නාව මාර්ගය ගෙවා ඇත (රු. මිලියන 60) සහ මාරු කිරීම සඳහා කොන්දේසි වාර්තා. පන්නිපිටිය බියගම 220kv මාර්ගය සඳහා කොළොන්නාව - පන්නිපිටිය ඇස්තමේන්තුව ලැබී ඇත. කණු පිහිටීම අවසන් කිරීම සඳහා පරීක්ෂා කිරීම සහ සාකච්ඡා සිදුවෙමින් පවතී.	**රාජගිරිය සිට අතුරුගිරිය දක්වා කොටස:** පන්නිපිටිය බියගම 220kv මාර්ගය සඳහා ඇස්තමේන්තුව ලැබී ඇති අතර ගෙවීම සඳහා තාක්ෂණික ඇගයීම් කමිටු අනුමැතිය ලැබී ඇත. ගෙවීම් කටයුතු සිදුකළ යුතු වුවද ගෙවීමට මුදල් නොමැත. HT සහ LT මාරුවීම් සඳහා ඇස්තමේන්තුව ලංකා විදුලිබල මණ්ඩලය වෙතින් ලැබී ඇත. තාක්ෂණික ඇගයීම් කමිටුවේ ඇගයීම් කටයුතු සිදු වෙමින් පවතී.
ප්‍රසම්පාදන කටයුතු (නව කැලණි පාලම - අතුරුගිරිය)	2020.11.06 දින අයදුම්කරුවන් හත් දෙනෙකු සඳහා RFP නිකුත් කරන ලදී. මූල්‍ය යෝජනා සහ තාක්ෂණික යෝජනාවේ නියමයන් සහ කොන්දේසි සම්බන්ධයෙන් සැලකිය යුතු ප්‍රතිචාර දක්වන සහ තාක්ෂණික වශයෙන් සුදුසුකම් ලත් ලංසුකරුවෙක් සිටින CHEC සමඟ සාකච්ඡා කිරීමට අමාත්‍ය මණ්ඩලය අවසර දී ඇත. සංශෝධිත සහන කාලය (වසර 18) සඳහා සහ CANC විසින් පිළිගත් අර්ධ වාර්ෂික වාර්ෂික ගෙවීම සඳහා අමාත්‍ය මණ්ඩල අනුමැතිය ලැබී ඇත. ආයෝජකයා සමඟ සහන ගිවිසුම අවසන් කිරීමට සාකච්ඡා සිදුවෙමින් පවතී. නව සහන ගිවිසුම සම්බන්ධයෙන් නීතිපති දෙපාර්තමේන්තුව අදහස් සහ නිරීක්ෂණ ලබා දී ඇත. RFP සමඟ නිකුත් කරන ලද සහන ගිවිසුම් කෙටුම්පත හා සසඳමින් නව සහන ගිවිසුම අවසන් කිරීම සඳහා ව්‍යාපෘති කමිටුව සමඟ සාකච්ඡා කරමින් සිටී.	

විස්තරය	ප්‍රගතිය
රාජගිරියේ සිට අතුරුගිරිය දක්වා කොටස සඳහා පාරිසරික බලපෑම් තක්සේරුව	පාරිසරික නිෂ්කාශනය සඳහා නව අයදුම්පතක් මධ්‍යම පරිසර අධිකාරිය වෙත 27/07/2021 දින ඉදිරිපත් කර ඇත. මධ්‍යම පරිසර අධිකාරියේ අනුමැතිය ලබා ගැනීම සඳහා විකාශන රැස්වීම මාර්ගගතව පැවැත්විණි. උස් කුළුණු මත දිවෙන අධිවේගී මාර්ග ව්‍යාපෘතිය EPA ප්‍රදේශයේ සිදු කෙරෙන අවසර ලත් ඉදිකිරීමේ කටයුත්තක් ලෙස 2021.07.19 දිනැති අංක 2237/07දරන ගැසට් පත්‍රය යටතේ ගැසට් කර ඇත. පාරිසරික ආරක්ෂණ ප්‍රදේශයට අදාළ තෙත්බිම් කළමනාකරණ වැඩසටහන සඳහා UDA, CEA සහ SLLDC සමඟ සාකච්ඡා පවත්වයි. EIA පැවරුම සඳහා උපදේශන සේවා සිදු කිරීමට කැලණිය විශ්වවිද්‍යාලයට ලබා දී ඇත. EIA වාර්තාව සඳහා කැලණිය විශ්වවිද්‍යාලය, SLLDC සහ ITI ඔවුන්ගේ පැවරුම් සිදු කරයි.
නව කැළණි පාලම - රාජගිරිය කොටසට අදාලව නැවත පදිංචි කිරීම	පවුල් 1100ක් පමණ නිවාස යෝජනා ක්‍රමයට නැවත පදිංචි කිරීමට UDA සමඟ අවබෝධතා ගිවිසුමක් අත්සන් කර ඇත. 2021/06/07 දින බලපෑමට ලක් වූ නිවාස වෙනුවෙන් නිවාස ඒකක 1100ක් ලබාදීමට අමාත්‍ය මණ්ඩල අනුමැතිය ලැබී ඇත. ඉඩම් අත්පත් කර ගැනීමේ පනත යටතේ 9 වැනි වගන්තියට අදාළ පරීක්ෂණ ක්‍රියාත්මකයි. නිවාස යෝජනා ක්‍රම දෙකක් ක්‍රියාත්මක වීමට නියමිතය. කැබිනට් අනුමැතියට අනුව 1 සහ 2 කමිටු අවසන් කිරීමෙන් පසු නැවත පදිංචි කිරීමේ කටයුතු ආරම්භ කෙරේ.
ස්වාධීන ඉංජිනේරුවෙකු තෝරා ගැනීම	EOI ලේඛනය 29/09/2021 දින ප්‍රකාශයට පත් කරන ලදී. CACPC හි සාමාජිකයින් EoI කෙටි ලැයිස්තුගත අයදුම්කරු සම්බන්ධයෙන් ඔවුන්ගේ වාර්තාව අනුමැතිය සඳහා CACPC සභාපති වෙත යවන ලදී. BOI ඇගයීම් ක්‍රියාවලිය සිදුවෙමින් පවතී.

5. විශේෂ ව්‍යාපෘති කළමනාකරණය

මෙම ව්‍යාපෘති කළමනාකරණ ඒකකය යටතේ පහත සඳහන් ව්‍යාපෘති දෙක ක්‍රියාත්මක වේ;

- අරාබි ආර්ථික සංවර්ධනය සඳහා කුවේට් අරමුදල විසින් අරමුදල් සපයන ජාතික මහාමාර්ගවල පාලම් 25 ක් ප්‍රතිසංස්කරණය කිරීම (KFAED)
- බෙස්ලයින් මාර්ගයේ දකුණු දිගුව ඉදිකිරීම (III පියවර - 1 අදියර)

5.1 පාලම් 25ක් ප්‍රතිසංස්කරණය කිරීමේ ව්‍යාපෘතිය (කුවේට් අරමුදල)

ව්‍යාපෘතිය පැකේජ තුනකට බෙදන ලද අතර, එහි විස්තර පහත දැක්වේ;

- **උපදේශන සේවා**

පැකේජය 1 සඳහා උපදේශන සේවා

- මාර්ග සංවර්ධන අධිකාරිය හා 'අබුල්ජෙබයින් ඉංජිනියරින් කන්සල්ටින් ඔෆිස් (AECO)' 2015 ජූලි 20 දින කොන්ත්‍රාත් ගිවිසුමට අත්සන් තබන ලදී.
- කෙසේ වෙතත්, කොන්ත්‍රාත්කරුගේ දුර්වල කාර්යක්ෂමතාවය නිසා 2016 අගෝස්තු මාසයේ දී උපදේශන සේවාව අත්හිටුවනු ලැබිය. පැකේජය 1 සඳහා මාර්ග සංවර්ධන අධිකාරිය විසින්, ඉදිකිරීම් අධීක්ෂණය ක්‍රියාත්මක කිරීම අමාත්‍ය මණ්ඩලය විසින් අමාත්‍ය මණ්ඩලය විසින් අනුමත කරනු ලැබූ අතර, වී.ව්‍යා.ක.ඒ. විසින් 2018.01.04 දක්වා අධීක්ෂණය සිදු කරනු ලැබිය.
- ආර්.එම්.ජේ.එන්. රත්නායක මහතා (නියෝජ්‍ය ව්‍යාපෘති අධ්‍යක්ෂ - MFAP) 2018.01.05 සිට පැකේජ 01 හි උපදේශක ලෙස සේවය කළේය.

පැකේජය 2 සඳහා උපදේශන සේවා

- කොන්ත්‍රාත් සේවා ගිවිසුම අබ්දුල් රහීම් කන්සල්ටන්ස් (NARCO)/ / රිසෝසස් ඩිවලොප්මන්ට් කන්සල්ටන්ස් සමාගම වෙත ප්‍රදානය කරන ලදී.
- කොන්ත්‍රාත් ගිවිසුම 2018.09.25 දින අත්සන් තබනු ලැබූ අතර උපදේශන සේවාව 2018/10/05 දින සිට ආරම්භ කර ඇත.

පැකේජය 3 සඳහා උපදේශන සේවා

- කොන්ත්‍රාත්තුව M/s Al - Abdulhadi Engineering Consultancy (AEC) සහ Consulting Engineers & Architects Associated (Pvt) Ltd වෙත ලබා දෙන ලදී.
- කොන්ත්‍රාත් ගිවිසුම 2020/05/15 දින අත්සන් කරන ලදී. උපදේශන සේවාව 2020/07/01 දින සිට ආරම්භ කර ඇත.

- **සිවිල් වැඩ**

පැකේජය 1 හි සිවිල් වැඩ

- 2015 ජූලි 20 වැනි දින මාර්ග සංවර්ධන අධිකාරිය සහ 'KDESH-BMG' හවුල් ව්‍යාපාරය අතර ගිවිසුම් ගිවිසුම අත්සන් කරන ලදී.
- පැකේජය 01 සඳහා වන විෂය පථය වන්නේ පාලම් 8ක් ප්‍රතිසංස්කරණය කිරීම/පුළුල් කිරීමය.

- සිවිල් කටයුතු අවසන් කර 2020 ජුනි 19 වන දින මාර්ග සංවර්ධන අධිකාරිය වෙත භාර දෙන ලදී.

පැකේජය 2 හි සිවිල් වැඩ

- මාර්ග සංවර්ධන අධිකාරිය සහ ELS Construction PVT (Ltd.) අතර ගිවිසුම 2020 මැයි 15 වන දින අත්සන් කරන ලදී.
- සිවිල් කටයුතු 2020 ජනවාරි 23 වැනි දින ආරම්භ කරන ලදී.
- පැකේජය 02 හි සිවිල් කටයුතුවල වත්මන් ප්‍රගතිය, එහි ඉලක්ක ගත ප්‍රගතිය වන 98.91% ට සාපේක්ෂව 98.91% කි.
- ගලිගමුව - රුවන්වැල්ල මාර්ගයේ (B127) පාලම් අංක 20/2, 16/1, දෙහිඕවිට - දැරණියගල - නූරි මාර්ගයේ (B093) පාලම් අංක 2/2, 7/1, 8/9, 14/1 හි ඉදිකිරීම් කටයුතු නිම කර මාර්ග සංවර්ධන අධිකාරිය වෙත භාර දෙන ලදී.

පැකේජය 3 හි සිවිල් වැඩ

- මාර්ග සංවර්ධන අධිකාරිය සහ M/s කන්සල්ටින් ඉංජිනියරින් ඇන්ඩ් කන්සට්‍රක්ටර්ස් (CEC) JV සහ Sanken Construction (Pvt.) Ltd සමඟ 2020 ජුනි 24 වැනි දින ගිවිසුම් ගිවිසුම අත්සන් කරන ලදී.
- සිවිල් කටයුතු 2020 ජූලි 20 වන දින ආරම්භ විය.
- පැකේජය 03 හි සිවිල් කටයුතුවල වත්මන් ප්‍රගතිය, එහි ඉලක්ක ගත ප්‍රගතිය වන 87.98% ට සාපේක්ෂව 71.20% කි.
- කටුගස්තොට - කුරුණෑගල - පුත්තලම මාර්ගයේ (A 010) අංක 76/1 පාලම මාර්ග සංවර්ධන අධිකාරිය වෙත භාර දෙන ලදී.

වගුව 79 : 2021 වසර තුළ පාලම් 25 ව්‍යාපෘතිය ප්‍රතිසංස්කරණය කිරීමේ ප්‍රගතිය

මාර්ගයේ හෝ පාලමේ නම	පාලම අංකය	පාල මේ දිග (මී.)	ත.ඇ.ක. (රු.මි.)	ආරම්භක දිනය	සම්පූර්ණ කළ දිනය හෝ නිම කිරීමට අපේක්ෂිත දිනය	2020 අවසානය දක්වා ප්‍රගතිය	2020 අවසානය දක්වා සමුච්චිත වියදම් (රු. මි.)	2021 අවසන් වන විට භෞතික ප්‍රගතිය	2021 වර්ෂය තුළ වියදම් (රු. මි.)
පැකේජය 01									
උපදේශන සේවා	-		26.00	04.09.2015	අවසන් කරන ලදී	-	25.68	-	-
කඩුවෙල-බියගම මාර්ගය (AB04)	1/1	92.76	1,165.84	07.09.2015	19.06.2020	100%	1,160.07	100%	38.60
ගලගෙදර-හොරණ මාර්ගය (B123)	14/3	11.5							
ගලගෙදර-හොරණ මාර්ගය (B123)	14/8	11.5							
කැගල්ල-බුලත්කොහුපිටිය-කරවනැල්ල මාර්ගය (A021)	11/4	31.6							
වේයන්ගොඩ-රුවන්වැල්ල මාර්ගය (B445)	32/1	19.3							
තංගල්ල-වීරකැටිය මාර්ගය (B410)	2/2	6.92							
තංගල්ල-වීරකැටිය මාර්ගය (B410)	2/3	13.9							
අම්පිලන්තුරේ-වීරමුනෙයි මාර්ගය (B018)	10/2	50.4							
පැකේජය 02									
උපදේශන සේවා			231.41	05.10.2018	22.01.2023		100.76	-	64.04
කැගල්ල-බුලත්කොහුපිටිය-කරවනැල්ල මාර්ගය (A021)	39/4	9.55	1,289.76	23.01.2020	10.02.2022	37.3%	495.52	97.65%	351.92
ගලිගමුව-රුවන්වැල්ල මාර්ගය (B127)	20/2	9.55				46.7%		100%	
ගලිගමුව-රුවන්වැල්ල මාර්ගය (B128)	16/1	19.35				54.3%		100%	
දෙහිඕවිට - දැරණියගල - නුවර මාර්ගය (B093)	2/2	7.14				59.6%		100%	
දෙහිඕවිට - දැරණියගල - නුවර මාර්ගය (B093)	5/1	32.45				38.5%		96.84%	
දෙහිඕවිට - දැරණියගල - නුවර මාර්ගය (B093)	7/1	20.13				54.3%		100%	
දෙහිඕවිට - දැරණියගල - නුවර මාර්ගය (B093)	8/9	20.385				51.6%		100%	

මාර්ගයේ හෝ පාලමේ නම	පාලම අංකය	පාලමේ දිග (මී.)	ත.ඇ.ක. (රු.මි.)	ආරම්භක දිනය	සම්පූර්ණ කළ දිනය හෝ නිම කිරීමට අපේක්ෂිත දිනය	2020 අවසානය දක්වා ප්‍රගතිය	2020 අවසානය දක්වා සමුච්චිත වියදම් (රු. මි.)	2021 අවසන් වන විට භෞතික ප්‍රගතිය	2021 වර්ෂය තුළ වියදම් (රු. මි.)
දෙහිඕවිට - දැරණියගල - නූරි මාර්ගය (B093)	14/1	21.01				50.6%		100%	
මාවනැල්ල - හෙම්මාතගම - සිංහපිටිය මාර්ගය (B279)	17/1	31.08				35.9%		98.36%	
පැකේජය 03									
උපදේශන සේවා			353.74	01.07.2020	01.03.2023		35.41	-	113.83
කටුගස්තොට - කුරුණෑගල - පුත්තලම මාර්ගය (A010)	75/1	124.53	2,057.61	20.07.2020	19.01.2022	35%	271.26	83%	970.01
කටුගස්තොට - කුරුණෑගල - පුත්තලම මාර්ගය (A010)	76/1	16.5				36%		99.8%	
තෝප්පුව - මාදම්පේ මාර්ගය (B419)	16/1	19				6.2%		55.4%	
නාවත්කුලි - කාරතිව් - මන්නාරම මාර්ගය (A032)	78/5	57				29%		81%	
පරන්තන් - කරච්චි - මුලතිව් මාර්ගය (A035)	53/1	22				18%		94%	
කොළඹ - නුවර මාර්ගය (A001)	31/3	25.34				6%		67%	
කොළඹ-නුවර මාර්ගය (A001)	32/2	38.08				2.5%		47.5%	
බත්තුලුඔය - උඩප්පුව - ආදිමුනෙයි පාර (B614)	3/5	38.75				7.2%		73%	
ව්‍යාපෘති කළමනාකරණ ඒකකවල වියදම් සහ බදු (GOAL අරමුදල්)							136.27	-	42.00
ඉඩම් අත් කර ගැනීම (GOSL අරමුදල්)							24.31	-	29.44

5.2 බෙස්ලයින් මාර්ගයේ දකුණු දිගුව ඉදි කිරීම (III අදියර)

බෙස්ලයින් මාර්ගය III වැනි අදියර වන්නේ කිරුළපන සිට රත්මලාන දක්වා කොටසයි. III අදියරෙහි පළමු පියවර කිරුළපන සිට කොළඹ-හොරණ මාර්ගය දක්වා වේ. මෙම කොටසෙහි දිග කිලෝමීටර 0.86 ක් වන අතර කිරුළපන මංසන්ධියේ ගුවන් මාරුවක් හා තනි කුටි පෙට්ටි පාලමක් සහිත මංතීරු 3ක ද්විත්ව මාර්ගයක් ලෙස ඉදි කෙරේ.

වගුව 80: බෙස්ලයින් මාර්ගයේ දකුණු දිගුව සඳහා සාරාංශ ප්‍රගතිය (අදියර III)- 1 පියවර

විස්තරය	ත.ඇ.ක. (රු.මි.)	ආරම්භක දිනය	2020 අවසානය දක්වා වියදම් (රු. මිලියන)	2020 අවසන් වන විට ප්‍රගතිය	2021 අවසන් වන විට ප්‍රගතිය	2021 වර්ෂය තුළ වියදම් (රු. මිලියන)
ඉඩම් අත් කර ගැනීමේ කටයුතු සිදු වෙමින් පවතී (GOSL අරමුදල්)	4,950	2009	1,505.62	නිරවුල් කොටස් 48.57%	නිරවුල් කොටස් 67.45%	977.32
යටි පාලම ඉදිකිරීම (මීටර් 25)	701.74 (වැට බද්ද නොමැතිව ඉංජිනේරු ඇස්තමේන්තුව ලෙස)	ප්‍රසම්පාදන කටයුතු සිදු වෙමින් පවතී				
තනි කුටි පෙට්ටි පාලම ප්‍රතිසංස්කරණය කිරීම (මීටර් 4.2)						
ව්‍යාපෘති කළමනාකරණ ඒකකවල වියදම් සහ බදු (GOAL අරමුදල්)			22.63			9.46

ඉඩම් අත්පත් කර ගැනීමේ ප්‍රගතිය



යොමුව	කොටස් ගණන	පර්චස් ගණන	මුළු ප්‍රදේශය ප්‍රතිශතයක් ලෙස	ප්‍රමාණය රු.මිලියන
ගෙවන සහ නිෂ්කාශනය කරන ලද කොටස්	70	475.45	43.90	1,528.839
මුදල් ගෙවා නිරවුල් කිරීම සිදු වෙමින් පවතී	28	255.17	23.56	904.601
17 වන වගන්තිය අනුව නිකුත් කල කොටස්	31	128.02	11.82	606.085
ප්‍රතිස්ථාපනය කිරීම් අවශ්‍ය කොටස්	55	81.70	7.54	180.00
අත්පත් කරගැනීම් සිදු කරමින් පවතින කොටස්	16	142.80	13.18	704.217
38 A ඵුකාරව පොලිය 7%	-	-	-	745.674
මුළු කොටස් ගණන	200	1,083.14	100	4,669.416
---------- අත් කර ගැනීමේ මායිම්				

6 විවිධ විදේශාධාර ව්‍යාපෘති

විදේශ ආධාර ව්‍යාපෘතිය (MFAP) නිර්මාණය කරන ලද්දේ බොහෝ දුරට ද්විපාර්ශ්වික ආයතන වන විදේශ ආධාර සහිත ව්‍යාපෘති හැසිරවීමටය. 2021 දී, සංවර්ධනය සඳහා වූ සෞදි අරමුදල (SFD-II) විසින් අරමුදල් සපයන මාර්ග ජාල සංවර්ධන ව්‍යාපෘති යටතේ MFAP ඒකකය, ජාත්‍යන්තර සංවර්ධනය සඳහා වන ඔපෙක් අරමුදල මගින් අරමුදල් සපයන ජාතික මාර්ග වැඩිදියුණු කිරීමේ ව්‍යාපෘතිය (OFID1), ජාත්‍යන්තර සංවර්ධනය සඳහා වන ඔපෙක් අරමුදල (OFID -2) මගින් අරමුදල් සපයන කොළඹ ජාතික මහාමාර්ග ව්‍යාපෘතිය යටතේ මාර්ග ප්‍රතිසංස්කරණය කිරීම සහ වැඩිදියුණු කිරීම සහ බස්නාහිර පළාත් මාර්ග සංවර්ධන ව්‍යාපෘතිය (OFID-3) යටතේ මාර්ග ප්‍රතිසංස්කරණය කිරීම සහ වැඩිදියුණු කිරීම,ඔපෙක් අරමුදල් සහිත ගාල්ල - දෙනියාය - මාදම්පේ මාර්ග ව්‍යාපෘතිය (OFID -4), හංගේරියානු අරමුදල් යටතේ කොහුවල සහ ගැටඹේ ගුවන් පාලම් දෙකක් ඉදිකිරීම, GOSL අරමුදල යටතේ කොම්පඤ්ඤවීදියේ ගුවන් පාලම් ඉදිකිරීම ආදී ආධාර ලබා දෙන ආයතන 5 ක් යටතේ ව්‍යාපෘති සහ ශ්‍රී ලංකා රජයේ ව්‍යාපෘති හසුරුවන ලදී.

6.1 සංවර්ධනය සඳහා සෞදි අරමුදල (SFD-2) විසින් අරමුදල් සපයන ලද මාර්ග ජාල සංවර්ධන ව්‍යාපෘතිය යටතේ මාර්ග ප්‍රතිසංස්කරණය කිරීම සහ වැඩිදියුණු කිරීම

මෙම ව්‍යාපෘතිය යටතේ මධ්‍යම, නැගෙනහිර, සබරගමුව සහ බස්නාහිර පළාත්වල සමස්ත දුර ප්‍රමාණය කි.මී. 83.6 කින් යුත් මාර්ග 7 ක් පුනරුත්ථාපනය හා වැඩිදියුණු කිරීම 2017 වසර අවසන් වන විට අවසන් කරන ලදී.

ඉහත සඳහන් මාර්ග ව්‍යාපෘති අවසන් වීමත් සමඟ එම අරමුදලේ ඉතිරිකිරීම් යොදා ගනිමින් නාඋල නගර කොටස කිලෝමීටර් 53+740 සිට 58+000 දක්වා වැඩි දියුණු කිරීමට තීරණය කළ අතර එය 2021 වන විට නිම කරන ලදී. තවද, ඔරුගොඩවත්ත - අඹතලේ මාර්ගයේ පාලම් තුනක් (පාලම අංක 4/3, 6/1 සහ 6/2) පුළුල් කිරීම සඳහා ණය ශේෂය භාවිතා කරන ලදී. වන්දි ගෙවීම අවසන් කිරීම සඳහා ඉඩම් අත්පත් කර ගැනීමේ ක්‍රියාවලිය තවමත් සිදු වෙමින් පවතී. ජාතික ජල සම්පාදන හා ජලාපවහන මණ්ඩලයෙ හි දැනට පවතින ජල නල නිසා පාලම ඉදිකිරීමට බාධා එල්ල වේ.



පාලම් අංක 4/3



පාලම් අංක 6/1



පාලම් අංක 6/2

වගුව 81: සංවර්ධනය සඳහා සෞඳි අරමුදල (SFD-2) විසින් අරමුදල් සපයන මාර්ග ජාල සංවර්ධන ව්‍යාපෘතියේ ප්‍රගතිය

මාර්ගයේ/පාලමේ වැඩ	දිග (කි.මී.)	තා.ඇ.ක. (රු.මී.)	ආරම්භක දිනය	නිම කිරීමට අපේක්ෂිත දිනය	2020 දක්වා ප්‍රගතිය (%)	2020 වර්ෂය දක්වා වියදම (රු. මිලියන)	2021 අවසානය වන විට ප්‍රගතිය (%)	2021 වර්ෂය තුළ වියදම් (රු. මිලියන)
A009 මහනුවර සිට යාපනය මාර්ග කොටස කටුගස්තොට සිට අලවතුගොඩ දක්වා (කි.මී. 4+600- කි.මී. 15+570) දක්වා පුනරුත්ථාපනය / වැඩිදියුණු කිරීම්	10.97	767.04	03/06/2013	12/08/2014 නිම කර ඇත	100.0	0.00	100.0	-
A009 මහනුවර සිට යාපනය මාර්ග කොටස අලවතුගොඩ සිට පලාපත්වෙල දක්වා (කි.මී. 15+570 - කි.මී. 32+540)	16.97	949.16	03/06/2013	25/11/2014 නිම කර ඇත	100.0	0.00	100.0	-
A009 මහනුවර සිට යාපනය මාර්ග කොටස අලවතුගොඩ සිට පලාපත්වෙල දක්වා (කි.මී. 15+570 - කි.මී. 32+540)දක්වා පුනරුත්ථාපනය / වැඩිදියුණු කිරීම් RDA/MFAP/ICB/SFD-2/02-A		334.03				14.12		-
B541 තම්පලගාමම් - කින්නියා මාර්ග කොටස තඹලගමුව සිට සුරංගල් හන්දිය දක්වා (කි.මී.0+000- කි.මී.8+500) පුනරුත්ථාපනය / වැඩිදියුණු කිරීම්	8.50	875.85	07/06/2013	02/09/2015 නිම කර ඇත	100.0	0.00	100.0	-
B093 දෙහිඕවිට - දැරණියගල - නූරි මාර්ග කොටස දෙහිඕවිට සිට දැරණියගල දක්වා (කි.මී.0+000- කි.මී.14+000) පුනරුත්ථාපනය / වැඩිදියුණු කිරීම්	14.00	1254.09	05/06/2013	24/12/2015 නිම කර ඇත	100.0	34.85	100.0	-
A009 මහනුවර - යාපනය මාර්ග කොටස පලාපත්වෙල සිට නාඋල දක්වා (කි.මී.32+540- කි.මී.54+180) පුනරුත්ථාපනය / වැඩිදියුණු කිරීම්	21.64	1396.49	13/03/2014	08/10/2015 නිම කර ඇත	100.0	54.18	100.0	-
A001 කොළඹ - නුවර මාර්ග කොටසේ පෑලියගොඩ සිට කිරිබත්ගොඩ දක්වා (කි.මී.5+860- කි.මී.13+100) පුනරුත්ථාපනය / වැඩිදියුණු කිරීම්	7.24	1,939.93	13/12/2013	12/12/2014 නිම කර ඇත	100.0	0.00	100.0	-
නාඋල නගරය ඇතුළුව කි.මී.53+740 - කි.මී.58+000 සිට මහනුවර - යාපනය මාර්ග කොටසේ පුනරුත්ථාපනය සහ	4.260	590.62	04/12/2018	03/08/2020	99.8	480.04	100.0	71.23

වැඩිදියුණු කිරීම්								
B435 ඔරුගොඩවත්ත - අඹතලේ මාර්ගයේ 4/3 පාලම වැඩි දියුණු කිරීම	මී.9.5	251.1	19/09/2019	10/09/2021	56.4	124.63	100.0	80.98
B435 ඔරුගොඩවත්ත - අඹතලේ මාර්ගයේ 6/1 පාලම වැඩි දියුණු කිරීම	මී.8.5	257.26	19/09/2019	17/09/2021	62.0	118.2	96.4	58.34
B435 ඔරුගොඩවත්ත - අඹතලේ මාර්ගයේ 6/2 පාලම වැඩිදියුණු කිරීම	මී.12.5	317.2	11/10/2019	30/04/2021	26.0	98.41	52.6	50.40

6.2 ජාත්‍යන්තර සංවර්ධනය සඳහා වන ඔපෙක් අරමුදල (OFID-1) විසින් අරමුදල් සපයන ජාතික මාර්ග වැඩිදියුණු කිරීමේ ව්‍යාපෘතිය යටතේ මාර්ග ප්‍රතිසංස්කරණය කිරීම සහ වැඩිදියුණු කිරීම

කි.මී. 39.3 ක දිගකින් යුත් මාර්ග 4 ක් පුනරුත්ථාපනය කිරීම හා වැඩිදියුණු කිරීම සහ ජාතික මාර්ග වැඩිදියුණු කිරීමේ ව්‍යාපෘති යටතේ පොල්ගහවෙල - කෑගල්ල මාර්ගයේ මා ඔය හරහා පාලම් අංක 3/2 ප්‍රතිසංස්කරණය කිරීම සඳහා ශ්‍රී ලංකා රජය (ඔපෙක්) ජාත්‍යන්තර සංවර්ධනය සඳහා වූ ඔපෙක් අරමුදලෙන් ඇමරිකානු ඩොලර් මිලියන 40 ණයක් ලබා ගන්නා ලදී.
2017 අවසානයේ පොල්ගහවෙල සිට කෑගල්ල දක්වා (A019) මාර්ගයේ පාලම් අංක 3/2 (කරඳන පාලම) ප්‍රතිසංස්කරණය කිරීම, ඇතුල්කෝට්ටේ-මිරිහාන-කොහුවල (බී-120) මාර්ගයේ ඇතුල්කෝට්ටේ - කොහුවල කොටස, ගාල්ල - දෙනියාය - මාදම්පේ මාර්ගයේ රක්වාන සිට මාදම්පේ දක්වා කොටස සහ ඇහැලියගොඩ - දෙහිඕවිට (බී-110) මාර්ගයේ ඇහැලියගොඩ - දෙහිඕවිට කොටස නිම කර ඇත.

6.3 සංවර්ධනය සඳහා ඔපෙක් අරමුදල (OFID -2) ණය අංක 1511 PB මගින් අරමුදල් සපයන කොළඹ ජාතික මහාමාර්ග ව්‍යාපෘතිය යටතේ මාර්ග ප්‍රතිසංස්කරණය කිරීම සහ වැඩිදියුණු කිරීම

කි.මී. 60 ක දිගකින් යුත් කොළඹ මාර්ග 13 ක් පුනරුත්ථාපනය කිරීමේ හා වැඩිදියුණු කිරීමේ සහ පාලම් අංක පුළුල් කිරීම සහ කොළඹ ජාතික මහාමාර්ග ව්‍යාපෘතිය යටතේ නාවල - නාරහෙන්පිට - නුගෙගොඩ මාර්ගයේ පාලම් අංක 2/1 පුළුල් කිරීමේ පිරිවැය සඳහා ශ්‍රී ලංකා රජය (GOSL) ජාත්‍යන්තර සංවර්ධනය සඳහා වූ ඔපෙක් අරමුදලෙන් (OFID) ඇමරිකානු ඩොලර් මිලියන 50 ක ණයක් ලබා ගන්නා ලදී.

ශ්‍රී ජයවර්ධනපුර රෝහලට ප්‍රවේශ මාර්ගය, දෙමටගොඩ - වැල්ලම්පිටිය මාර්ගය , කොළොන්නාව - යක්බැද්ද මාර්ගය, වැලිකඩ - කොහිලවත්ත මාර්ගය, අලුත්මාවත සහ මධ්‍ය මාර්ගය (මට්ටක්කුලිය) සහ නාරාහේන්පිට - නාවල - නුගේගොඩ මාර්ගයේ අංක 2/1 පාලම දැනටමත් පුළුල් කිරීම සහ වැඩිදියුණු කිරීම අවසන් කර ඇති අතර කොට්ටාව - තලගල මාර්ගය, කෝට්ටේ - බෝපේ මාර්ගය, ඔරුගොඩවත්ත - අඹතලේ මාර්ගය (I සහ II අදියර) පුළුල් කිරීම සහ වැඩිදියුණු කිරීම සිදු වෙමින් පවතින අතර වල්ගම - දියගම මාර්ගය සහ පිළියන්දල - මහරගම මාර්ගය පුළුල් කිරීම සහ පුළුල් කිරීම ආරම්භ කිරීමට නියමිතය.

i). කොට්ටාව-තලගල මාර්ගයේ (B239) වැඩි දියුණු කිරීම (කි.මී. 1+000 සිට කි.මී. 15+480 දක්වා කොටස)

ඉන්ටර්නැෂනල් කන්ස්ට්‍රක්ෂන් කන්සෝටියම් (පුද්).සමාගම මෙම ව්‍යාපෘතියේ කොන්ත්‍රාත්කරු වන අතර 2021.12.31 දිනට එහි භෞතික ප්‍රගතිය 97.5% කි. ඉඩම් අත්පත් කර ගැනීමේ ප්‍රමාදය හේතුවෙන් (10/08/2021) දක්වා කාලය දීර්ඝ කර ඇත. තවද, කොන්ත්‍රාත්තුව සඳහා ඉංජිනේරුවරයා විසින් කාලය දීර්ඝ කිරීම විශ්ලේෂණය කරනු ලැබේ.
ඉඩම් අත්පත් කර ගැනීම සිදු වෙමින් පවතින අතර මහරගම, කැස්බෑව, හෝමාගම, පාදුක්ක සහ හොරණ ප්‍රාදේශීය ලේකම් කොට්ඨාශ තුළ ඉඩම් අත්පත් කර ගැනීම් සිදු වේ. වන්දි ගෙවීම සිදු වෙමින් පවතී. එය ගෙවා ඇත්තේ රු. මිලියන 1445.1 කි. ඉඩම් අත්පත් කර ගැනීම සඳහා වන්දි වශයෙන් සහ ඉඩම් අත්පත් කර ගැනීම් ප්‍රමාදය ප්‍රධාන වශයෙන් ව්‍යාපෘති ප්‍රගතියට බලපානු ලබයි. කිලෝමීටර 0.75 හි ඉඩම් අත්පත් කර ගැනීම තවමත් අවසන් නැත.

ii). කෝට්ටේ - බෝපේ මාර්ගය (B240) වැඩි දියුණු කිරීම (කි.මී. 16+740 සිට කි.මී. 28+004 දක්වා කොටස)

ඉන්ටර්නැෂනල් කන්ස්ට්‍රක්ෂන් කන්සෝටියම් (පුද්).සමාගම විසින් 2021/03/31 දින ඉදිකිරීම් කටයුතු නිම කරන ලදී. ඉඩම් අත්පත් කර ගැනීම් සිදුවෙමින් පවතින අතර හෝමාගම සහ පාදුක්ක ප්‍රාදේශීය ලේකම් කොට්ඨාස තුළ මෙම ඉඩම් අත්පත් කර ගැනීම් සිදු වේ. ප්‍රාදේශීය ලේකම් කොට්ඨාස දෙකෙහිම වන්දි ගෙවීම ආරම්භ කෙරේ. රු. මිලියන 1202.25 ක් ඉඩම් අත්පත් කර ගැනීම සඳහා වන්දි වශයෙන් ගෙවා ඇත.



කි.මී.7+125 ආසන්නයේ පාදුක්ක නගරයේ නිම කරන ලද වටරවුම (ගෑස් පහන - පුරාවිද්‍යාත්මක ස්ථානයක්)



බෝපේ හන්දියේ කි.මී.11+260 හි මාර්ගය නිම කිරීමෙන් පසු

iii). ඔරුගොඩවත්ත - අඹතලේ මාර්ගය (B435) වැඩි දියුණු කිරීම (කි.මී. 0+000 සිට කි.මී. 7+700 දක්වා කොටස)

මෙම ව්‍යාපෘතිය යටතේ ඔරුගොඩවත්ත - අඹතලේ මාර්ගය මංතීරු හතරකට පුළුල් කෙරේ. මෙම මාර්ග වැඩිදියුණු කිරීම අදියර දෙකකින් සිදු කිරීමට සැලසුම් කර ඇත;

අදියර I: කි.මී.2+900 සිට කි.මී. 4+200 දක්වා සහ කි.මී. 5+440 සිට කි.මී. 7+700 දක්වා වන කොටස්
අදියර II: කි.මී 0+000 සිට කි.මී 2+900 දක්වා සහ කි.මී 4+200 සිට කි.මී 5+440 දක්වා වන කොටස්

ඉඩම් අත්පත් කර ගැනීම:
5107	මානව සම්පත් සංවර්ධනය		5,722,000.00	2,524,691.14
5119D	සෞභාග්‍ය රුක් රෝපණ වැඩසටහන		-	201,065.00
511	ගාස්තු සහ වෙනත් දීමනා		22,139,947.34	22,985,326.31
515	සන්නිවේදන		62,119,523.16	57,177,650.28
516	කුලිය, කල්බදු කුලිය සහ ගාස්තු සහ බදු		39,011,627.37	30,783,927.98
517 & 51053	උපයෝගිතා සහ වෙනත්		167,985,504.80	171,931,122.10
513	ඉන්ධන සහ ලිහිසි තෙල්		187,501,919.75	129,646,094.03
514	බලපත්‍ර රක්ෂණ වාහන		18,028,609.84	20,051,264.17
5185	මෝටර් වාහන අලුත්වැඩියා කිරීම සහ නඩත්තු කිරීම		137,380,857.18	113,163,370.32
5181-88	වෙනත් අලුත්වැඩියා හා නඩත්තු		66,463,015.13	51,928,883.21
519	විගණන ගාස්තු		2,829,827.48	2,660,050.80
521	බැංකු ගාස්තු		3,249,412.00	2,990,631.00
5232	අනුමත නොකළ වැටී බදු		50,498,605.17	23,172,232.48
5235	මුද්දර ගාස්තු		33,830.00	17,525.00
5243	ඔරුගොඩවන්න ඒකකය මාරු කිරීමේ වියදම්		-	148,378.80
5262	ලියාපදිංචි කැමැත්තු ගෙවීම්		25,000.00	7,477,462.28
52623	ආපසු ලියා හල රඳවා ගත් මුදල් නිදහස් කිරීම		3,750,326.80	
52624	පෙර වසරවල ලියා හල දූවඟිලි හානි මුදා හැරීම		2,153,753.10	
5266	බලමුලු ගැන්වීමේ අත්තිකාරම් අඩු කිරීම		-	6,081,144.98
5269	කාර්ය මණ්ඩල ණය ගැනියන් සඳහා ප්‍රතිපාදන	සටහන 50 A	-	704,476.31
5271	අධිභාර සහ දඩ		8,827.50	-
52821	මාර්ග වෙන්කිරීමේ තක්සේරු ගාස්තු		76,255.00	-
52822	ගොඩනැගිල්ලේ තක්සේරු ගාස්තු		632,585.39	-
52831	දිවා සුරැකුම් මධ්‍යස්ථානයේ වියදම්		33,000.00	-
			880,944,662.16	748,685,875.27
5269	**සටහන 50 A කාර්ය මණ්ඩල ණය ගැනියන් සඳහා ප්‍රතිපාදන**			
	ගිණුම්වල පෙන්වා ඇති මුදල			863,344.30
	අඩු කළ			
	වැඩිපුර සඳහන් කළ මුදල සඳහා ගැලපීම			(158,867.99)
	ප්‍රති ප්‍රකාශිත මුදල			704,476.31
	සටහන 51 ක්ෂයවීම් සහ ක්ෂය කිරීම් වියදම්			
53	ක්ෂය වීම්	සටහන 51-A	27,968,688,091.72	26,389,030,809.19
54	ක්ෂය කිරීම්	සටහන 51-B	16,928,219,487.20	16,330,860,486.51
			44,896,907,578.92	42,719,891,295.70
53	**සටහන 51-A ක්ෂය වීම්**			
	ගිණුම්වල පෙන්වා ඇති මුදල			23,379,434,295.04
	අඩු කළ			
	වැඩිපුර සඳහන් කළ මුදල සඳහා ගැලපීම			3,009,596,514.15
	ප්‍රති ප්‍රකාශිත මුදල			26,389,030,809.19
54	**සටහන 51-B ක්ෂය කිරීම**			
	ගිණුම්වල පෙන්වා ඇති මුදල			16,389,789,413.43

		සටහන වෙත යොමුව	2021 (රු.)	2020 ප්‍රතිප්‍රකාශිත (රු.)
	එකතු කළ			
	සඳහන් කර ඇති අඩු මුදල සඳහා ගැලපීම			(58,928,926.92)
	ප්‍රති ප්‍රකාශිත මුදල			16,330,860,486.51
	සටහන 52 මූල්‍ය පිරිවැය			
638	දේශීය බැංකු ණය සඳහා පොලී		14,177,469,655.23	13,551,363,730.89
528	විදේශ මුදල්වල විනිමය අනුපාත වෙනස මත පාඩුව		360,742,413.19	176,394,343.05
			14,538,212,068.42	13,727,758,073.94
	සටහන 53 භාණ්ඩාගාරයට බද්ද ශුද්ධ ප්‍රේෂණය කිරීම			
5244	බද්ද භාණ්ඩාගාරයට ප්‍රේෂණය කිරීම		4,000,000,000.00	4,000,000,000.00
			4,000,000,000.00	4,000,000,000.00
	සටහන 54 බද්ද භාණ්ඩාගාරයට ප්‍රේෂණය කිරීම			
5245	අමාත්‍යාංශයට පැවරූ වත්කම්වල ලියා හල වටිනාකම	සටහන 54-A	38,732,599.00	-
4828	ආදායම් සඳහා බැර කරන ලද අමාත්‍යාංශය වෙත මාරු කල වත්කම් සංචිත නැවත තක්සේරු කිරීම	සටහන 54-B	(38,731,089.00)	-
			1,510.00	-
	සටහන 55 ආදායම් බදු වියදම්			
55	ආදායම් බදු	සටහන 55-A	585,899,563.00	1,552,108,597.00
			585,899,563.00	1,552,108,597.00
	සටහන 55-A ආදායම් බදු			
	ගිණුමට අනුව වත්මන් බදු වියදම්			1,551,424,342.00
	එකතු කළ			
	2020/2021 දී ප්‍රතිපාදන යටතේ			684,255.00
	ප්‍රති ප්‍රකාශිත මුදල			1,552,108,597.00
	සටහන 56 කල් දැමූ බදු වියදම්			
55B	කල් දැමූ බදු වියදම්		(12,498,590.00)	70,662,478.00
			(12,498,590.00)	70,662,478.00
	සටහන 56-A ආදායම් බදු			
	ගිණුම්වල පෙන්වා ඇති මුදල			(311,893,339.00)
	අඩු කළ			
	Y/A 2020/2021 සඳහා ඉක්මවා ඇති ප්‍රතිපාදන			382,555,817.00
	ප්‍රති ප්‍රකාශිත මුදල			70,662,478.00
	සටහන 57 ඉදිරියට ගෙන එන ලද සමුච්චිත (හිඟය)			
			2020	2019 ප්‍රති ප්‍රකාශිත
35222	ජනවාරි 01 දින ඉදිරියට ගෙන එන ලද සමුච්චිත අතිරික්තය/ (හිඟය)		503,428,650,648.88	487,835,037,110.57
	කල් දැමූ බද්දෙන් පසු පෙර ගිණුමේ පෙන්වා ඇති පරිදි 2020 වර්ෂය සඳහා අතිරික්තය/(හිඟය)		179,150,903,852.90	-
353	පෙර වසර ගැලපීම්			-
	අධිවේගී මාර්ග පිරිවැය ප්‍රාග්ධනීකරණය අධික ලෙස ප්‍රකාශ කිරීම හේතුවෙන් ප්‍රදානයේ වැඩිපුර සඳහන් කර ඇති මුදල් සඳහා ගැලපීම්		(1,479,107,733.43)	-

	සටහන වෙත යොමුව	2021 (රු.)	2020 ප්‍රතිප්‍රකාශිත (රු.)
OCH-III (කෙලවරාපිටිය සිට කඩවත දක්වා) සහ ESEP හි උපචිත වැඩ බිල්පත් හේතුවෙන් ප්‍රදානයේ අධික ලෙස දක්වා ඇති මුදල සඳහා ගැලපීම් ප්‍රදාන ලෙස ගිණුම්ගත කර ඇත		(4,753,745,861.79)	-
PMMU විසින් භාර දෙන ලද මාර්ග ප්‍රාග්ධනීකරණය හේතුවෙන් මාර්ග සහ පාලම් සම්බන්ධ ප්‍රදානයන්හි අඩුවෙන් දක්වා ඇති මුදල සඳහා ගැලපීම		12,428,391,801.09	38,616,241,392.25
ගොඩනැගිල්ල සඳහා ලැබුණු ප්‍රදානයේ අඩුවෙන් දක්වා ඇති මුදල සඳහා ගැලපීම		185,000,000.00	-
2020 දී ලැබුණු ප්‍රදානයට එරෙහිව අත්තිකාරම් ප්‍රතිසාධන පිහිටුවීම ආපසු හැරවීම සඳහා ගැලපීම්		874,269,714.77	-
2019 දී මාර්ග ප්‍රාග්ධනීකරණය කිරීමේදී ප්‍රදානයක් ලෙස වැරදි ලෙස ගිණුම්ගත කර ඇති NSB ණය යටතේ ඉදිකරන ලද මාර්ගය සඳහා ගැලපීම		-	(1,632,287,371.98)
එක්සත් රාජධානියේ වානේ පාලම් ව්‍යාපෘතියේ ගෙවිය යුතු මුදල් රඳවා තබා ගැනීම හේතුවෙන් ලැබුණු ප්‍රදානයේ වැඩි ප්‍රමාණය ආපසු හැරවීම, ප්‍රදානයක් ලෙස වැරදි ලෙස ගිණුම් ගත කිරීම සඳහා ගැලපීම්		(10,539,709.63)	-
පෙර වර්ෂවල ක්ෂයවීම්වල සඳහන් කර ඇති වැඩි/අඩු මුදල සඳහා ගැලපීම		(3,009,596,514.15)	(22,060,389,002.99)
පෙර වර්ෂවල ක්‍රමාංකනකරණයේදී සඳහන් කර ඇති වැඩි/අඩු මුදල සඳහා ගැලපීම		58,928,926.92	85,033,999.68
අපහායනය සඳහා ප්‍රතිපාදන වැඩිපුර ප්‍රකාශ කර ඇති මුදල් ආපසු හැරවීම		-	8,250,000.00
2003 දී බැහැර කළ 2003 ගිණුම්ගත නොකළ වාහන සඳහා ගැලපීම්		-	(9.00)
කල් දැමූ වියදම්වලට ඇතුළත් කර ඇති, RWI වැය ශීර්ෂ යටතේ මාර්ග වැඩිදියුණු කිරීම් මත වියදම් සඳහා පෙර වසර තුළ අය කරන ලද මුදල් සඳහා ගැලපීම්		131,240,937.57	3,140,117,642.29
2020/2021 තක්සේරු වර්ෂය සඳහා ආදායම් බදු ප්‍රතිපාදන යටතේ ගැලපීම්		(684,255.00)	-
පෙර වසර තුළ විලම්බිත බදු සඳහා වූ ප්‍රතිපාදන ආපසු හැරවීම් සඳහා ගැලපීම්		(382,555,817.00)	(688,132,985.00)
කල් දැමූ වියදම්වලට ඇතුළත් කර ඇති, RDA නොවන මාර්ගවල පෙර වසරවල තාර උණු කිරීම් සහ තාර දැමීම් සඳහා වූ ඉදිකිරීම් පිරිවැය සඳහා ගැලපීම්		-	(839,373,759.44)
2013 සිට 2020 දක්වා BOI සහ හම්බන්තොට ප්‍රාදේශීය ලේකම් කොට්ඨාශය හා සම්බන්ධ සේවාලාභියාගේ වැඩවල වටිනාකම්වල වැඩි ප්‍රමාණය සඳහා ගැලපීම්		(1,215,977.42)	(93,275,855.70)
පෙර වර්ෂවල ප්‍රකාශිත RWI වියදම්වලට වඩා වැඩි/අඩු මුදල සඳහා ගැලපීම්		8,768,008.59	(927,874,058.08)
පෙර වර්ෂවල මාර්ග නඩත්තු වියදම්වල දක්වා ඇති වැඩි/අඩු මුදල සඳහා ගැලපීම්		2,010,395.88	3,633,471.61
වැටි බද්ද ගැලපීම් හේතුවෙන් RMTF වියදම්වල වැඩිපුර සඳහන් කර ඇති මුදල් සඳහා ගැලපීම්		(41,985.83)	-
2016 දී RMTF සඳහා ලැබුණු රජයේ ප්‍රදානයේ වැඩිපුර සඳහන් කළ මුදල් සඳහා ගැලපීම්		-	(16,905,738.82)
සබරගමුව පළාතේ අධීක්ෂණ ආදායමේ දක්වා ඇති මුදල් සඳහා ගැලපීම්		50,475,064.33	-
2020 දී දක්ෂිණ අධිවේගී මාර්ගයේ හදිසි අනතුරු හානිවල ප්‍රකාශිත ආදායමට අඩු/ඉක්මවූ මුදල් සඳහා ගැලපීම්		4,099,255.23	(1,265,318.52)
2020 වර්ෂය තුළ අනෙකුත් අමාත්‍යාංශවලට අදාළ කාර්ය මණ්ඩල ණය ගැනියන් සඳහා ප්‍රතිපාදනවල වැඩිපුර සඳහන් කර ඇති මුදල් සඳහා ගැලපීම්		158,867.99	-
2020 වසර සඳහා ස්ථාවර නැන්පතු මත පොලී වැඩිපුර දක්වා ඇති මුදල් සඳහා ගැලපීම්		(420,561.12)	-
ඒකාබද්ධ වැටුපෙහි වැඩි/ අඩුවෙන් දක්වා ඇති මුදල් සඳහා ගැලපීම්		199,031.74	(158,867.99)

	සටහන වෙත යොමුව	2021 (රු.)	2020 ප්‍රතිප්‍රකාශිත (රු.)
2020 වසර සඳහා වෛද්‍ය නිවාඩු මුදල් ගෙවීමට අදාළව EPF සහ ETF මත වැඩිපුර සඳහන් කළ වියදම් සඳහා ගැලපීම		101,418,633.28	-
2020 වර්ෂය සඳහා අඛලන් පාලම් සඳහා වියදම්වල වැඩි ප්‍රමාණය සඳහා ගැලපීම (NCP)		4,726,640.40	-
2020 වර්ෂය සඳහා ESEP හි කුලියට ගැනීමේ වියදම් ඉක්මවා ගිය මුදල සඳහා ගැලපීම		4,038,783.32	-
		686,795,372,147.52	503,428,650,648.88

මාර්ග සංවර්ධන අධිකාරිය

2021 දෙසැම්බර් 31 න් අවසන් වර්ෂය සඳහා අධිවේගී මාර්ග ආදායම් සහ වියදම් ප්‍රකාශය

විස්තර	සටහනට යොමුව	2021	2020 ප්‍රති ප්‍රකාශිත
ආදායම්			
- පරිශීලක ආදායම		7,847,395,612.15	6,525,459,522.22
- ETC ආදායම		244,151,332.31	253,086,378.61
- ඇදගෙන යාමේ ආදායම		54,333,070.98	27,311,165.11
- හදිසි අනතුරු ප්‍රතිසාධනය	සටහන 01	22,645,148.09	18,984,353.50
		8,168,525,163.53	**6,824,841,419.44**
වියදම්			
සුදුගල පඩිනඩි			
වැටුප් සහ වේතන	සටහන 02	1,274,545,719.14	1,126,601,920.64
සේවක අර්ථසාධක අරමුදල	සටහන 03	173,565,285.24	164,587,085.44
සේවා නියුක්තිකයන්ගේ භාර අරමුදල	සටහන 04	43,391,334.65	41,146,784.92
පාරිතෝෂික	සටහන 05	32,544,798.74	123,948,669.53
ප්‍රසාද දීමනා	සටහන 06	22,752,126.97	17,041,460.94
වෛද්‍ය නිවාඩු සහ නිවාඩු	සටහන 07	72,332,051.43	96,220,747.29
වන්දි		-	-
අතිකාල/නිවාඩු දින සේවයට ගෙවීම		392,129,194.37	324,580,059.90
		2,011,260,510.54	1,894,126,728.66
නඩත්තු වියදම්			
අලංකාර තුරුලිය කටයුතු		14,380,529.02	10,578,244.75
මාර්ග නඩත්තු කිරීම		597,134,917.72	353,407,178.29
		611,515,446.74	**363,985,423.04**
වෙනත් පරිපාලන වියදම්			
ලිපිද්‍රව්‍ය සහ කාර්යාල අවශ්‍යතා		76,173,333.08	52,134,774.86
පුහුණුව		496,500.00	31,500.00
කුලිය		485,849.00	998,640.00
ගමන් සහ කුලී ගාස්තු	සටහන 08	171,575,668.00	103,778,415.08
සන්නිවේදන		16,822,132.73	76,349,089.11
ඉන්ධන		103,957,367.90	72,850,748.60
උපයෝගිකා		240,235,124.93	201,801,543.61
වෙනත්		138,656,305.18	96,422,068.81
අළුත්වැඩියා කිරීම සහ නඩත්තු කිරීම් වෙනත්		43,560,299.53	34,834,430.18
අලුත්වැඩියා සහ නඩත්තු වාහන		70,484,027.38	32,083,137.26
පොලිසියට පහසුකම් සැලසීම		106,081,552.28	90,806,428.02
බැංකු ගාස්තු		11,615,503.25	10,984,049.00
ETC ගනුදෙනු පිරිවැය සහ වට්ටම		35,516,118.89	33,258,598.89
පොදු කාර්ය එකතුව		1,015,659,782.15	806,333,423.42
මුළු පිරිවැය		**3,638,435,739.43**	**3,064,445,575.12**
ක්ෂයවීම් සහ ආදායම් බදු වලට පෙර වර්ෂය සඳහා අධිවේගී මාර්ග වලින් ශුද්ධ ලාභය		**4,530,089,424.10**	**3,760,395,844.32**

4902	සටහන 01- අධිවේගී මාර්ග හානි සඳහා ගාස්තු		
	ගිණුම්වල පෙන්වා ඇති මුදල		14,885,098.27
	එකතු කළා		
	සඳහන් කර ඇති මුදල සඳහා ගැලපීම		4,099,255.23
	ප්‍රති ප්‍රකාශිත මුදල		18,984,353.50
	සටහන 02- වැටුප් සහ වේතන		
61413526	ගිණුම්වල පෙන්වා ඇති මුදල		81,571,103.75
	එකතු කළා		
	EMU කාර්ය මණ්ඩල වැටුප් සඳහා ගැලපීම, 2020 දී පුද්ගල පඩිනඩි සඳහා ඇතුළත් කර ඇත -සටහන 45	සටහන 48(i)	1,045,030,816.89
	ප්‍රති ප්‍රකාශිත මුදල		1,126,601,920.64
61413524	සටහන 03- සේවක අර්ථසාධක අරමුදල (EPF)		
	ගිණුම්වල පෙන්වා ඇති මුදල		23,516,713.85
	එකතු කළා		
	EMU කාර්ය මණ්ඩල EPF සඳහා ගැලපීම, 2020 දී පුද්ගල පඩිනඩි සඳහා ඇතුළත් කර ඇත -සටහන 45	සටහන 48(ii)	141,070,371.59
	ප්‍රති ප්‍රකාශිත මුදල		164,587,085.44
61413525	සටහන 04 - සේවා නියුක්තිකයන්ගේ භාර අරමුදල (ETF)		
	ගිණුම්වල පෙන්වා ඇති මුදල		5,879,178.52
	එකතු කළා		
	EMU කාර්ය මණ්ඩල ETF සඳහා ගැලපීම, 2020 දී පුද්ගල පඩිනඩි සඳහා ඇතුළත් කර ඇත -සටහන 45	ස්ටහන 48(ii)	35,267,606.40
	ප්‍රති ප්‍රකාශිත මුදල		41,146,784.92
61413501	සටහන 05- පාරිතෝෂික		
	ගිණුම්වල පෙන්වා ඇති මුදල		-
	එකතු කළා		
	EMU කාර්ය මණ්ඩල පාරිතෝෂික සඳහා ගැලපීම, 2020 දී පුද්ගල පඩිනඩි සඳහා ඇතුළත් කර ඇත -සටහන 45	සටහන 48(iii)	123,948,669.53
	ප්‍රති ප්‍රකාශිත මුදල		123,948,669.53
61413503	සටහන 06-ප්‍රසාද දීමනා		
	ගිණුම්වල පෙන්වා ඇති මුදල		554,960.94
	එකතු කළා		
	EMU කාර්ය මණ්ඩල ප්‍රසාද දීමනා සඳහා ගැලපීම, 2020 දී පුද්ගල පඩිනඩි සඳහා ඇතුළත් කර ඇත -සටහන 45	සටහන 48(iv)	16,486,500.00
	ප්‍රති ප්‍රකාශිත මුදල		17,041,460.94
61413504	සටහන 07- වෛද්‍ය නිවාඩු සහ නිවාඩු මුදල් අය කිරීම		
	ගිණුම්වල පෙන්වා ඇති මුදල		96,000,400.86
	එකතු කළා		
	EMU කාර්ය මණ්ඩල නිවාඩු මුදල් සඳහා ගැලපීම, 2020 දී පුද්ගල පඩිනඩි සඳහා ඇතුළත් කර ඇත -සටහන 45	සටහන 48(v)	220,346.43
	ප්‍රති ප්‍රකාශිත මුදල		96,220,747.29
61413505/6	සටහන 08 - ගමන් සහ කුලී ගාස්තු		
	ගිණුම්වල පෙන්වා ඇති මුදල		107,817,198.40
	අඩු කළා		
	කුලී ගාස්තුවල වැඩිපුර සඳහන් කර ඇති මුදල සඳහා ගැලපීම		(4,038,783.32)
	ප්‍රති ප්‍රකාශිත මුදල		103,778,415.08

මාර්ග සංවර්ධන අධිකාරිය

2021 දෙසැම්බර් 31 න් අවසන් වූ වසර සඳහා ආදායම් බදු සඳහා වගකිව යුතු ව්‍යාපාරික ආදායම් පිළිබඳ ප්‍රකාශය

රු. '000

	2021	2020
පොලී ආදායම්		
භාණ්ඩාගාර බිල්පත් සඳහා පොලිය	756,295,293	919,990,320
වෙනත් මත පොලිය	2,628,522	3,066,469
දළ පොලී	758,923,815	923,056,789
ව්‍යාපාර ආදායම්		
ගනුදෙනුකරුවන්ගේ වැඩවලින් ලැබෙන ආදායම්		
කරන ලද කාර්යයේ වටිනාකම්	651,707,448	789,180,645
අඩු කළ සෘජු වියදම්	(557,192,596)	(676,088,092)
ගනුදෙනුකරුවන්ගේ වැඩවලින් ලද දළ ලාභය	94,514,852	113,092,553
සේවා සඳහා ගාස්තු	241,891,817	213,251,878
කුලී ආදායම් සහ බදු කුලිය	446,872,024	277,564,169
පොදු කාර්ය ප්‍රතිසාධන	34,868,664	51,338,908
කාර්ය මණ්ඩල ණය සඳහා පොලී	14,786,667	13,946,094
වෙනත් ආදායම්	490,267,245	400,183,447
මග්ම වැඩසටහන සඳහා ලැබුණු මුදල්	-	(33,497)
MRRDP සඳහා පොදු කාර්ය ආපසු අයකර ගැනීම්	-	(81,090)
ලියා හල රඳවා තබා ගැනීමේ මුදල්	(3,556,008)	(50,432,731)
ලියා හල ප්‍රතිපාදන	(1,038,536)	-
	485,672,301	349,636,129
වාක්තු අංගනයේ ශුද්ධ ආදායම්	1,821,023	1,135,803
ඇස්ෆල්ට් අලෙවියෙන් ශුද්ධ ආදායම්	1,169,456	2,140,064
ඉන්ටර්ලොක් බ්ලොක්වලින් ලද ශුද්ධ ආදායම්	22,208	7,623
අධිවේගී මාර්ග ආදායම්		
අධිවේගී මාර්ග වලින් ලැබෙන ආදායම්	8,168,525,164	6,820,742,164
අඩු කළා		
සෘජු වියදම් අධිවේගී මාර්ග	(3,638,435,739)	(1,706,460,048)
බද්ද භාණ්ඩාගාරයට ප්‍රේෂණය කිරීම	(4,000,000,000)	-
	530,089,425	5,114,282,116
වර්ෂය සඳහා සම්පූර්ණ වගකීම් සහිත ව්‍යාපාර ආදායම්	**2,610,632,252**	**7,059,452,126**

ඇමුණුම -III

මාර්ග සංවර්ධන අධිකාරිය

2021 දෙසැම්බර් 31න් අවසන් වර්ෂය සඳහා

අයවැයට එදිරිව තථ්‍ය දක්ත සමඟ මූල්‍ය කාර්ය සාධනය පිළිබඳ ප්‍රකාශය

රු.'000

	අයවැය 2021	සංශෝධිත අයවැය 2021	නැවත සංශෝධිත අයවැය 2021	තථ්‍ය 2021	විචලනය
ආවර්තක නොවන ගනුදෙනු වලින් ලැබෙන ආදායම්					
පුනරාවර්තන දීමනාව	288,333,363	134,768,953	137,105,381	83,848,708	53,256,673
ප්‍රාග්ධන දීමනාව	301,259,620	313,577,593	335,247,167	82,272,569	252,974,598
ආවර්තක ගනුදෙනුවෙන් ලැබෙන ප්‍රාග්ධන ප්‍රදාන ආදායම	12,365,769	12,365,769	9,069,507	11,017,207	(1,947,700)
මුළු ආදායම	**601,958,752**	**460,712,315**	**481,422,055**	**177,138,484**	**304,283,571**
මෙහෙයුම් පුනිඵල					
පුනරාවර්තන ආදායම					
ආවර්තක නොවන ගනුදෙනු	288,333,363	134,768,953	137,105,381	83,848,708	53,256,673
ආවර්තක					
අධිවේගී මාර්ග වලින් ශුද්ධ ආදායම	7,118,394	6,486,780	3,113,285	4,530,089	(1,416,804)
ගනුදෙනුකරුවන්ගේ වැඩවලින් අතිරික්තය	25,242	25,242	25,242	94,514	(69,272)
සේවා සඳහා ගාස්තු	324,753	324,753	211,950	241,892	(29,942)
කුලී ගාස්තු සහ බදු කුලිය	713,824	713,824	323,850	446,872	(123,022)
පොලී අනුපාතය	519,000	519,000	378,000	773,711	(395,711)
ලාභාංශ ආදායම්	100	100	-	-	-
පොදු කාර්ය ප්‍රතිසාධන	60,000	60,000	18,000	34,869	(16,869)
වාත්තු අංගනවලින් ලැබෙන ආදායම්	1,000	1,000	1,000	1,821	(821)
ඉන්ටර් ලෝකින්ග් කොන්ක්‍රීට් ඔල්වලින් ලැබෙන ආදායම්	100	100	100	22	78
ඇස්ෆල්ට්බහිර විකුණුම් වලින් අතිරික්තය	1,000	1,000	1,000	1,170	(170)
වෙනත් ආදායම්	71,425	71,425	38,590	119,719	(81,129)
ප්‍රතිපාදන ආපසු හැරවීම් සහ ආපසු ලියා හල ණයගැතීමියන්	1,000	1,000	1,000	409,279	(408,279)
විනිමය ගනුදෙනු වලින් මුළු ශුද්ධ පුනරාවර්තන ආදායම	8,835,838	8,204,224	4,112,017	6,653,958	(2,541,941)
සම්පූර්ණ පුනරාවර්තන ආදායම	**297,649,201**	**143,473,177**	**141,217,398**	**90,502,666**	**50,714,732**
ප්‍රාග්ධන වියදම්					
සංවර්ධන සහ නඩත්තු වියදම් - රේඛීය අමාත්‍යාංශය	17,175,000	17,595,000	17,095,000	6,872,930	10,222,070
සංවර්ධන සහ නඩත්තු වියදම් කිලෝමීටර් 100000 වැඩසටහන RDA නොවන	122,092,542	46,351,048	119,390,005	4,685,599	114,704,406
සංවර්ධන සහ නඩත්තු වියදම් - රාජ්‍ය අමාත්‍යාංශය	480,000	500,000	7,691,943	1,029,182	6,662,761
සංවර්ධන සහ නඩත්තු වියදම් - වෙනත් අමාත්‍යාංශය				54,791	(54,791)
සංවර්ධන සහ නඩත්තු වියදම් - RDA අරමුදල්				38,669	(38,669)
මූල්‍ය පිරිවැය	16,097,023	16,097,023	11,979,395	14,538,212	(2,558,817)
එකතුව	155,844,565	80,543,071	156,156,344	27,219,383	128,936,961
පොදු කාර්ය වියදම්					
පුද්ගල පඩිනඩි	10,092,778	9,541,003	10,270,005	8,857,747	1,412,258
භාවිතා කරන ලද සැපයුම් සහ පරිභෝජන ද්‍රව්‍ය	100,000	100,000	100,000	116,305	(16,305)
වෙනත් පරිපාලන වියදම්	1,001,497	1,001,497	1,074,497	919,678	154,819
එකතුව	11,194,275	10,642,500	11,444,501	9,893,730	1,550,771
මුළු වියදම්	167,038,840	91,185,571	167,600,845	37,113,113	130,487,732
වර්ෂය සඳහා වත්මන් අතිරික්තය / (හිඟය).	130,610,361	52,287,606	(26,383,447)	53,389,553	(79,773,000)
බද්ද භාණ්ඩාගාරයට ප්‍රේෂණය කිරීම				(4,000,000)	4,000,000
වත්මන් අතිරික්තය / (හිඟය) මහා භාණ්ඩාගාරයට බදු ශුද්ධ	130,610,361	52,287,606	(26,383,447)	49,389,553	(75,773,000)
දේපල, පිරියත සහ උපකරණ සඳහා ආවර්තක නොවන ප්‍රාග්ධන ප්‍රදාන	301,259,620	313,577,593	335,247,167	82,272,569	252,974,598
ක්ෂයවීම් සහ ක්ෂය කිරීම් වියදම්	(8,565,155)	(8,565,155)	(44,115,616)	(44,896,908)	781,292
අත්පත් කරගත් වත්කම් විකිණීමෙන් ලැබෙන ලාභය සහ අලාභය	5,000	5,000	5,000	2,104	2,896
					-
ප්‍රාග්ධන ප්‍රදාන PPE මත වර්ෂයට අදාළ අතිරික්තය / (හිඟය)	292,699,465	305,017,438	291,136,551	37,377,765	253,758,786
ආදායම් බද්දට පෙර ප්‍රාග්ධන ප්‍රදාන ගිණුම්ගත කිරීමෙන් පසු කාලය සඳහා අතිරික්තය /(හිඟය)	423,309,826	357,305,044	264,753,104	86,767,318	177,985,786
					-
අඩු ආදායම් බදු වියදම්	(1,827,945)	(1,000,979)	(983,880)	(585,899)	(397,981)
විලම්බිත බදු	(1,190,595)	(1,190,595)	(1,170,013)	12,499	(1,182,512)
ආදායම් බද්දෙන් පසු කාලය සඳහා අතිරික්තය	420,291,287	355,113,470	262,599,211	86,193,918	176,405,293

මාර්ග සංවර්ධන අධිකාරිය

2021 දෙසැම්බර් 31වන් අවසන් වර්ෂය සඳහා

අයවැය ආදායම් ප්‍රතිවිවරණ ප්‍රකාශය

රු.'000

ඡේදය	විස්තරය	අයවැය 2021	2021 සංශෝධිත අයවැය	නැවත සංශෝධිත අයවැය 2021	තථ්‍ය 2021	විචලනය
	මූල්‍යමය නොවන ගනුදෙනු වලින් ලැබෙන ආදායම්					
	සුනෙරාවර්ජන දීමනාව					
	නඩත්තු සහ වැඩිදියුණු කිරීම් කටයුතු සඳහා ලැබුණු අතුරු අයවැය අරමුදල්	272,236,340	117,571,930	117,405,986	60,991,088	56,414,898
	දේශීය බැංකු ප්‍රාග්ධනය සහ පොලී ගෙවීම සඳහා ලැබුණු / ලැබිය යුතු අයවැය අරමුදල්	16,097,023	17,197,023	11,979,395	15,109,149	(3,129,754)
	පොදු කාර්ය සඳහා ලැබුණු අයවැය අරමුදල්	12,374,789	7,439,000	7,720,000	7,748,471	(28,471)
		288,333,363	134,768,953	137,105,381	83,848,708	53,256,673
	ඉදිපල, පිරියත සහ උපකරණ සඳහා ප්‍රාග්ධන ප්‍රදානය					
	පිටත වටරවුම් අධිවේගී මාර්ගය III අදියර කඩවත සිට කෙරවලපිටිය දක්වා			1,099,000		1,099,000
	මාර්ග අංශයේ ආධාර ව්‍යාපෘතිය II ප්‍රතිසංස්කරණය ගාල්ල දෙනියාය මාර්ගය			340,000		340,000
	මැරයින් ඩ්‍රයිව් දිගුව පානදුර දක්වා	850,000	500,000	500,000		500,000
	මැරයින් ඩ්‍රයිව් දිගුව පානදුර දක්වා	1,500,000	1,500,000	1,500,000		1,500,000
	නිම කරන ලද සහ දැනට පවතින ව්‍යාපෘති සඳහා ඉඩම් අත්පත් කර ගැනීම	3,000,000	17,458,655	15,458,655		15,458,655
	ප්‍රාග්ධන වත්කම් අත්පත් කර ගැනීම	261,000	261,000	50,000	21,529	28,471
	ජාතික ඉතිරිකිරීමේ බැංකුවේ අරමුදල් සහිත ව්‍යාපෘති	500,000	500,000	500,000		500,000
	ප්‍රාග්ධන ආපසු ගෙවීම CKE			409,437		409,437
	වත්කම් එකතු කිරීමේ ව්‍යාපෘති	279,980,653	279,980,653	231,649,000		231,649,000
	ප්‍රධාන මාර්ග සහ අධිවේගී මාර්ගවලට ප්‍රවේශ වීම සඳහා විකල්ප මාර්ග කිලෝමීටර් 100,000ක් සංවර්ධනය කිරීම	2,234,097	443,415	362,302		362,302
	සම්පූර්ණ කරන ලද අධිවේගී මාර්ගයට මාරු කරන ලද අදාළ ප්‍රදානය			10,380,863	5,050,375	5,330,488
	සම්පූර්ණ කරන ලද මාර්ග සහ පාලම් සම්බන්ධ මාරු කරන ලද ප්‍රදානය			54,915,409	60,937,298	(6,021,889)
	පවතින ව්‍යාපෘතිවලට අදාළ ණය ගැනීමේ පිරිවැය පියවීමට අදාළ ප්‍රදානය	12,933,870	12,933,870	18,082,501	12,727,225	5,355,276
	ව්‍යාපෘතිවලින් මාරු කරන ලද මාර්ග සහ පාලම් සම්බන්ධ ප්‍රදානය				726,679	(726,679)
	ව්‍යාපෘතිවලින් පැවරූ ඉඩකඩනැගිලිවලට අදාළ ප්‍රදානය				2,086,277	(2,086,277)
	ව්‍යාපෘති වලින් මාරු කරන ලද මෝටර් රථයට අදාළ ප්‍රදානය				715,491	(715,491)
	ව්‍යාපෘති වලින් මාරු කරන ලද මෝටර් බයිසිකල් සම්බන්ධ ප්‍රදාන				7,695	(7,695)
		301,259,620	313,577,593	335,247,167	82,272,569	252,974,598
	මූල්‍යමය ගනුදෙනු වලින් ලැබෙන ආදායම්					
	වැඩ කරන ලද ගනුදෙනුකරුවන්ගේ වටිනාකම	252,337	252,337	252,337	651,707	(399,370)
	දක්ෂිණ අධිවේගී මාර්ගයෙන් සහ පිටත වටරවුම් අධිවේගී මාර්ගයෙන් ලැබෙන ආදායම	10,400,000	10,400,000	7,800,000	8,168,525	(368,525)
	පාංශු පරීක්ෂණය සඳහා ගාස්තු	152,421	152,421	120,000	178,868	(58,868)
	උපදේශන ගාස්තු	3,000	3,000	3,000	2,791	209
	අධීක්ෂණය සඳහා ගාස්තු	88,606	88,606	70,000	49,811	20,189
	ප්‍රවාහන ගාස්තු	500	500	500	523	(23)
	මාර්ග ප්‍රතිසංස්කරණ ගාස්තු	98,445	98,445	60,000	61,883	(1,883)
	විවිධ සේවා	500	500	100	4	96
	මාර්ග සම්මීක්ෂණ ආදායම	100	100	30	81	(51)
	සැලසුම් ගාස්තු	2,000	2,000	1,000	-	1,000
	භූ සියුරු විමර්ශනය සඳහා ගාස්තු	1,000	1,000	1,600	848	752
	පාරිසරික බලපෑම් තක්සේරුව සඳහා ගාස්තු	100	100	100	-	100
	කුලී ගාස්තු සහ බදු කුලිය	713,824	713,824	323,850	446,872	(123,022)
	පොලිය	519,000	519,000	378,000	773,711	(395,711)
	පොදු කාර්ය ප්‍රතිසාධන	60,000	60,000	18,000	34,869	(16,869)
	වාන්තු අංගනය-බාහිර විකුණුම්	1,200	1,200	1,200	4,248	(3,048)
	ඉන්ටර්ලොක් කොන්ක්‍රීට් ගල් -බාහිර විකුණුම්	110	110	-	133	(133)
	ඇස්ෆල්ට් යන්ත්‍රාගාරය -බාහිර විකුණුම්	1,200	1,200	1,200	102,232	(101,032)
	වෙනත් ආදායම්	66,425	66,425	33,590	537,630	(504,040)
	ඉදිපල, පිරියත සහ උපකරණ බැහැර කිරීම් මත විකුණුම් ආදායම්	5,000	5,000	5,000	2,471	2,529
		12,365,769	12,365,769	9,069,507	11,017,207	(1,947,700)
	නඩත්තු සහ වැඩිදියුණු කිරීම් කටයුතු සඳහා ලැබුණු වැය ශීර්ෂ අරමුදල්					
	සමීක්ෂණ සහ විමර්ශන, අබලන් පාලම් සහ වෙනත්	1,575,000	1,995,000	1,495,000	52,766,126	(51,271,126)
	මාර්ග නඩත්තු කටයුතු	8,000,000	8,000,000	8,000,000	4,104,025	3,895,975
	මරදීය අමාත්‍යාංශයේ වැය ශීර්ෂවලින් අරමුදල් යවයන ලද මාර්ග පුළුල් කිරීම සහ වැඩිදියුණු කිරීමේ කටයුතු	7,600,000	7,600,000	7,600,000	2,973,340	4,626,660
	ප්‍රධාන මාර්ගවලට ප්‍රවේශ වීම සඳහා විකල්ප මාර්ග කිලෝමීටර් 100,000ක් සංවර්ධනය කිරීම	242,686,551	92,537,930	92,619,043	-	92,619,043
	වෙනත් අමාත්‍යාංශ වැය ශීර්ෂවලින් අරමුදල් යවයන මාර්ග පුළුල් කිරීම සහ වැඩිදියුණු කිරීමේ කටයුතු				54,791	(54,791)
	ග්‍රාමීය පාලම්, ග්‍රාමීය මාර්ග සහ අනෙකුත් යටිතල පහසුකම් සඳහා ලැබුණු අරමුදල්	480,000	500,000	7,691,943	1,092,806	6,599,137
		272,236,340	117,571,930	117,405,986	60,991,088	56,414,898
	දේශීය බැංකු ප්‍රාග්ධනය සහ පොලී ගෙවීම් සඳහා ලැබුණු / ලැබිය යුතු වැය ශීර්ෂ අරමුදල්					
	දේශීය බැංකු පොලී සඳහා ලැබුණු / ලැබිය යුතු අරමුදල්	16,097,023	17,197,023	11,979,395	14,181,424	(2,202,029)
	දේශීය බැංකුවේ ප්‍රාග්ධන ආපසු ගෙවීම් සඳහා ලැබුණු/ලැබිය යුතු අරමුදල්				927,725	379,692
		16,097,023	17,197,023	11,979,395	15,109,149	(1,822,337)
	පොදු කාර්ය සඳහා ලැබුණු වැය ශීර්ෂ අරමුදල්					
	මාර්ග සංවර්ධන අධිකාරියේ පොදු කාර්ය	12,374,789	7,439,000	7,720,000	7,748,471	(28,471)

රු.'000

සටහන	විස්තරය	අයවැය 2021	2021 සංශෝධිත අයවැය	නැවත සංශෝධිත අයවැය 2021	තථ්‍ය 2021	විචලනය
		12,374,789	7,439,000	7,720,000	7,748,471	(28,471)
						Cont....
R	ආදායම					
R-1	අධිවේගී මාර්ග ආදායම					
	අධිවේගී මාර්ග ආදායම	7,118,394	6,486,780	3,113,285	4,530,089	(1,416,804)
		7,118,394	6,486,780	3,113,285	4,530,089	(1,416,804)
	දක්ෂිණ අධිවේගී මාර්ගය සහ OCH සහ CKE					
	ආදායම	10,400,000	10,400,000	7,800,000	8,168,525	(368,525)
	අඩු කල පොදු කාර්ය සහ නඩත්තු වියදම්	(1,369,074)	(1,830,669)	(2,101,789)	(3,638,436)	1,536,647
	වැවුප් සහ වෙනත EMU	(1,912,532)	(2,082,551)	(2,087,051)	-	(2,087,051)
	ක්ෂය වීම්			(497,875)	-	(497,875)
		7,118,394	6,486,780	3,113,285	4,530,089	(1,416,804)
R-2	ඉදිකිරීම් කටයුතු - ගනුදෙනුකරුවන්					
	කරන ලද කාර්යයේ වටිනාකම	252,337	252,337	252,337	651,707	(399,370)
	සංවර්ධන සහ නඩත්තු කටයුතු	(227,095)	(227,095)	(227,095)	(557,193)	330,098
	ගනුදෙනුකරුවන්ගේ වැඩවලින් අතිරික්කය	25,242	25,242	25,242	94,514	(69,272)
R-3	සේවා සඳහා ගාස්තු					
R3-1	පාංශු පරීක්ෂණයෙන් ශුද්ධ ආදායම	148,952	148,952	117,500	171,963	(54,463)
R3-2	උපදේශන ගාස්තු	2,500	2,500	2,000	1,513	487
R3-3	ශුද්ධ අධීක්ෂණ ගාස්තු	80,120	80,120	50,000	32,601	17,399
	ප්‍රවාහන ගාස්තු	500	500	500	523	(23)
R3-4	ශුද්ධ මාර්ග ප්‍රතිස්ථාපන ගාස්තු	90,000	90,000	40,000	34,656	5,344
R3-5	ශුද්ධ සැලසුම් ගාස්තු	1,500	1,500	900	-	900
	විවිධ සේවා	500	500	100	4	96
R3-6	මාර්ග පරීක්ෂණ ගාස්තු	90	90	10	-	10
R3-7	පාරිසරික බලපෑම් තක්ෂේරුව සඳහා ගාස්තු	90	90	90	-	90
R3-8	භූ සිදුරු විමර්ශනය සඳහා ගාස්තු	500	500	850	632	3,438
		324,753	324,753	211,950	241,892	(29,942)
	පාංශු පරීක්ෂණවලින් ශුද්ධ ආදායම					
R-3-1	පාංශු පරීක්ෂණය සඳහා ගාස්තු	152,421	152,421	120,000	178,868	(58,868)
	අඩු පරීක්ෂණ වියදම්	(3,469)	(3,469)	(2,500)	(6,905)	4,405
		148,952	148,952	117,500	171,963	(54,463)
	ශුද්ධ උපදේශන ගාස්තු					
R-3-2	උපදේශන ගාස්තු	3,000	3,000	3,000	2,791	209
	උපදේශන ගාස්තු සඳහා අඩු වියදම්	(500)	(500)	(1,000)	(1,278)	278
		2,500	2,500	2,000	1,513	487
	ශුද්ධ අධීක්ෂණ ගාස්තු					
R-3-2	අධීක්ෂණ ගාස්තු	88,606	88,606	70,000	49,811	20,189
	අඩු වියදම්	(8,486)	(8,486)	(20,000)	(17,210)	(2,790)
		80,120	80,120	50,000	32,601	17,399
	ශුද්ධ මාර්ග ප්‍රතිස්ථාපන ගාස්තු					
R-3-3	මාර්ග ප්‍රතිසංස්කරණ ගාස්තු	98,445	98,445	60,000	61,883	(1,883)
	අඩු කළ වියදම්	(8,445)	(8,445)	(20,000)	(27,227)	7,227
		90,000	90,000	40,000	34,656	5,344
	ශුද්ධ සැලසුම් ගාස්තු					-
R-3-4	ගාස්තු	2,000	2,000	1,000		1,000
	අඩු කළ වියදම්	(500)	(500)	(100)		(100)
		1,500	1,500	900	-	900
	මාර්ග පරීක්ෂණ ආදායම් සඳහා ශුද්ධ ගාස්තු					-
R-3-5	ගාස්තු	100	100	30	81	(51)
	අඩු කළ වියදම්	(10)	(10)	(20)	(81)	61
		90	90	10	-	10
	පාරිසරික බලපෑම් තක්ෂේරුව සඳහා ශුද්ධ ගාස්තු					-
R-3-6	ගාස්තු	100	100	100	-	100
	අඩු කළ වියදම්	(10)	(10)	(10)	-	(10)
		90	90	90	-	90
	භූ සිදුරු විමර්ශනය සඳහා ශුද්ධ ගාස්තු					-

රු.'000

සටහන	විස්තරය	අයවැය 2021	2021 සංශෝධිත අයවැය	නැවත සංශෝධිත අයවැය 2021	තථ්‍ය 2021	විචලනය
R-3-7	ගාස්තු	1,000	1,000	1,600	848	752
	අඩු කළ වියදම්	(500)	(500)	(750)	(216)	(534)
		500	500	850	632	3,438
						Cont....
	කුලී ගාස්තු සහ බදු කුලිය					
R-4	පිරියත සහ යන්ත්‍රෝපකරණ කුලියට ගැනීම	16,000	16,000	16,000	27,504	(11,504)
	කුලී ගාස්තු වෙනත්	500	500	2,000	9,737	(7,737)
	දැන්වීම් පුවරු කුලියට දීම	223,000	223,000	50,000	53,778	(3,778)
	නිල නිවාස කුලියට දීම	18,076	18,076	19,500	18,770	730
	සංචාරක බංගලාව	3,181	3,181	500	831	(331)
	බදු කුලියට - ඉඩම	19,802	19,802	5,000	15,200	(10,200)
	ලොතරැයි අලෙවිසැල් ගාස්තු	26,000	26,000	250	945	(695)
	බදු කුලිය - ගෑන්ට්‍රි	118,000	118,000	26,000	19,713	6,287
	රූපවාහිනී කේබල් ජාල කුලිය	268,000	268,000	200,000	293,227	(93,227)
	උමං මාර්ගයේ කුලිය	9,000	9,000	3,000	5,172	(2,172)
	බැනර් ගාස්තු	11,000	11,000	1,000	1,367	(367)
	මඟනැඟුම මහමිදුර ගොඩනැඟිල්ලේ කුලිය	665	665	600	622	(22)
	ගොඩනැඟිලි කුලියට දීම	100	100		-	-
	දුරකථන කුටී කුලිය	500	500		2	(2)
	වෙළඳ කුටිවලින් ලද ආදායම				4	(4)
		713,824	713,824	323,850	446,872	(123,022)
	පොලී ආදායම					
R-5	තාවකාලික අතිරික්ත මුදල් සඳහා පොලිය	500,000	500,000	365,000	756,295	(391,295)
	පොලිය වෙනත්	2,000	2,000	2,000	2,629	(629)
	කාර්ය මණ්ඩල ණය සඳහා පොලී	17,000	17,000	11,000	14,787	(3,787)
		519,000	519,000	378,000	773,711	(395,711)
	පොදු කාර්ය ප්‍රතිසංධන					
	පොදු කාර්ය ප්‍රතිසාධන අරමුදල් ව්‍යාපෘති	60,000	60,000	18,000	34,869	(16,869)
		60,000	60,000	18,000	34,869	(16,869)
	වාත්තු අංශනයෙන් ලැබෙන ආදායම					
	බාහිර විකුණුම්	1,200	1,200	1,200	4,248	(3,048)
	අඩු කළා					-
	වාත්තු අංශනයේ බාහිර විකුණුම් පිරිවැය	(200)	(200)	(200)	(2,427)	2,227
		1,000	1,000	1,000	1,821	(821)
	ඉන්වර් ලෝකින්ග් කොන්ක්‍රීට් ගල්වලින් ලැබෙන ආදායම්					
	බාහිර විකුණුම්	110	110	-	133	(133)
	අඩු කළා					-
	විකුණුම් මිල -	(10)	(10)		(111)	111
		100	100	-	22	(22)
	ඇෂ්ෆල්ට් කම්හලෙන් ලැබෙන ආදායම					
	බාහිර විකුණුම්	1,200	1,200	1,200	102,232	(101,032)
	අඩු කළා					-
	විකුණුම් මිල -	(200)	(200)	(200)	(101,062)	100,862
	දළ ලාභය	1,000	1,000	1,000	1,170	(170)
	වෙනත් ආදායම්					
R-6	විවිධ ආදායම්	40,602	40,602	19,990	436,418	(416,428)
	ආපසු නොගෙවන වෙන්ඩර් තැන්පතු	20,833	20,833	12,500	41,610	(29,110)
	අයකර ගත් දුවිකරණය කළ හානිය	4,990	4,990	1,000	12,239	(11,239)
	වත්කම් බැහැර කිරීමේ ලාභය	5,000	5,000	5,000	-	5,000
	පොදු කාර්ය සේවාලාභියා MRRDP අයකර ගැනීම	-	-	100		100
	ආදායමට මාරු කල නැවත නක්ශේරු කිරීමේ සංචිතය				38,731	(38,731)
		71,425	71,425	38,590	528,998	(490,408)
						Cont....

මාර්ග සංවර්ධන අධිකාරිය

2021 දෙසැම්බර් 31 න් අවසන් වර්ෂය සඳහා අයවැය වියදම් හා කරාර වියදම් පිළිබඳ ප්‍රකාශය

රු..'000

පූර්ණ පඩිනාඩ්	අයවැය 2021	2021 සංශෝධිත අයවැය	සංශෝධිත අයවැය 2021	කරාර 2021	වීචලනය
වැටුප් සහ වේතන	8,092,644	8,092,644	7,024,463	6,257,318	767,145
EPF සහ ETF	1,121,620	1,121,620	1,010,843	1,013,576	(2,733)
පාරිතෝෂික	1,467,369	1,467,369	1,369,888	631,943	737,945
වන්දි	26,800	26,800	26,300	1,036	25,264
අතිකාල සහ නිවාඩු දින සේවයට ගෙවීම	388,998	388,998	397,408	558,386	(160,978)
නිවාඩු මුදල්, දිරි දීමනා ආදිය.	526,953	526,953	441,102	395,488	45,614
	11,624,384	**11,624,384**	**10,270,005**	**8,857,747**	**1,412,258**
භාවිතා කරන ලද සැපයුම් සහ පරිභෝජනා ද්‍රව්‍ය	100,000	100,000	100,000	116,305	(16,305)
වෙනත් පරිපාලන වියදම්					-
පුනුණු දීමනාව	5,000	5,000	5,000	3,893	1,107
වෛද්‍ය රක්ෂණය	15,000	15,000	15,000	7,597	7,403
ගමන් සහ ප්‍රවාහනය	181,074	181,074	181,074	103,703	77,371
මානව සම්පත් සංවර්ධනය	15,000	15,000	15,000	5,722	9,278
ගාස්තු සහ වෙනත් දීමනා	15,000	15,000	15,000	18,247	(3,247)
සන්නිවේදන	75,000	75,000	75,000	62,120	12,880
කුලී ගාස්තු සහ බදු	18,000	18,000	18,000	39,012	(21,012)
උපයෝගිතා සහ වෙනත්	150,000	150,000	150,000	167,985	(17,985)
ඉන්ධන සහ ලිහිසි තෙල්	170,000	170,000	170,000	187,502	(17,502)
බලපත්‍ර සහ රක්ෂණ වාහන	30,000	30,000	30,000	18,029	11,971
අලුත්වැඩියාව සහ නඩත්තුව - වාහන	150,000	150,000	150,000	137,381	12,619
වෙනත්	118,500	118,500	191,500	66,463	125,037
විගණන ගාස්තු	4,000	4,000	4,000	2,830	1,170
බැංකු ගාස්තු	4,000	4,000	4,000	3,249	751
අවසර නොලත් ආදාන VAT	50,000	50,000	50,000	50,499	(499)
මුද්දර ගාස්තු	573	573	573	34	539
උත්සව ගාස්තු	350	350	350		350
ලීයා හල අමාත්‍යාංශයට පැවරූ වත්කම්				38,733	(38,733)
ලියා හල තැන්පතු ගෙවීම්				25	(25)
ලියාහල රඳවා තබා ගැනීමේ මුදල් නිදහස් කිරීම්				3,750	(3,750)
අධිභාර සහ දඩ				9	(9)
ලියා හල ද්‍රවීකරණය කළ හානි මුදා හැරීම				2,154	(2,154)
තක්සේරු ගාස්තු				708	(708)
වෘ සුරැකුම් මධ්‍යස්ථානයේ වියදම්				33	(33)
	1,001,497	**1,001,497**	**1,074,497**	**919,678**	**154,819**
මූල්‍ය පිරිවැය					
දේශීය බැංකු ණය සඳහා පොලී	16,097,022	16,097,023	11,979,395	14,538,212	13,727,758
	16,097,022	**16,097,023**	**11,979,395**	**14,538,212**	**13,727,758**

ජාතික විගණන කාර්යාලය
தேசிய கணக்காய்வு அலுவலகம்
NATIONAL AUDIT OFFICE

මගේ අංකය எனது இல. My No. } ආර්ඒඑච්/බී/ආර්ඩීඒ/01/21/01 ඔබේ අංකය உமது இல. Your No. } දිනය திகதி Date } 2022 නොවැම්බර් 11 දින

FINANCE DIVISION
17 NOV 2022
Road Development Authority
"Maga Neguma"
Battaramulla

සභාපති

මාර්ග සංවර්ධන අධිකාරිය

මාර්ග සංවර්ධන අධිකාරියේ 2021 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය ප්‍රකාශන සහ වෙනත් නෛතික හා නියාමන අවශ්‍යතා පිළිබඳව 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 12 වන වගන්තිය ප්‍රකාරව විගණකාධිපති වාර්තාව

---

1. මූල්‍ය ප්‍රකාශන

1.1 තත්ත්වාගණනය කළ මතය

මාර්ග සංවර්ධන අධිකාරියේ 2021 දෙසැම්බර් 31 දිනට මූල්‍ය තත්ත්ව ප්‍රකාශනය සහ එදිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය කාර්යසාධන ප්‍රකාශනය, හිමිකම් වෙනස්වීමේ ප්‍රකාශනය සහ එදිනෙන් අවසන් වර්ෂය සඳහා මුදල් ප්‍රවාහ ප්‍රකාශනය සහ මූල්‍ය ප්‍රකාශන වලට අදාළ සටහන්, සාරාංශගත වැදගත් ගිණුම්කරණ ප්‍රතිපත්ති වලින් සමන්විත 2021 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය ප්‍රකාශන ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 154(1) ව්‍යවස්ථාව සමඟ සංයෝජිතව කියවිය යුතු 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ සහ 1971 අංක 38 දරන මුදල් පනතේ විධිවිධාන ප්‍රකාර මාගේ විධානය යටතේ විගණනය කරන ලදී. ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 154 (6) ව්‍යවස්ථාව ප්‍රකාරව මාගේ වාර්තාව යථා කාලයේදී පාර්ලිමේන්තුවේ සභාගත කරනු ලැබේ.

මාගේ වාර්තාවේ තත්ත්වාගණනය කළ මතය සඳහා පදනම කොටසේ විස්තර කර ඇති කරුණු වලින් වන බලපෑම හැර, අධිකාරියේ මූල්‍ය ප්‍රකාශන තුළින් 2021 දෙසැම්බර් 31 දිනට මූල්‍ය තත්ත්වය සහ එදිනෙන් අවසන් වර්ෂය සඳහා එහි මූල්‍ය ක්‍රියාකාරිත්වය හා මුදල් ප්‍රවාහ ශ්‍රී ලංකා රාජ්‍ය අංශයේ ගිණුම්කරණ ප්‍රමිතිවලට අනුකූලව සත්‍ය හා සාධාරණ තත්ත්වයක් පිළිබිඹු කරන බව මා දරන්නා වූ මතය වේ.

අංක 306/72, පොල්දූව පාර, බත්තරමුල්ල, ශ්‍රී ලංකාව. இல. 306/72, பொல்துவ வீதி, பத்தரமுல்லை, இலங்கை. No. 306/72, Polduwa Road, Battaramulla, Sri Lanka.
+94 11 2 88 70 28 - 34 +94 11 2 88 72 23 ag@auditorgeneral.gov.lk www.naosl.gov.lk

1.2 තත්ත්වාගණනය කල මතය සඳහා පදනම

(අ) අධිකාරියට අයත් A සහ B ශ්‍රේණි වලට අදාල මහා මාර්ගයන්ගේ මුළු දුර ප්‍රමාණය කිලෝමීටර් 12,225 ක් වුවත් ජාතික මහාමාර්ග ප්‍රාග්ධනිත කිරීම ආරම්භ කරන ලද 2018 වර්ෂයේ සිට 2021 දෙසැම්බර් 31 දිනට මාර්ග 144 කට අයත් කිලෝමීටර් 3,179 ක් පමණක් ප්‍රාග්ධනිත කර තිබුණි. ඒ අනුව, මාර්ග සංවර්ධන අධිකාරිය සතු A සහ B ශ්‍රේණි වලට අයත් කිලෝමීටර් 9,046 ක දුර ප්‍රමාණය සඳහා වූ වටිනාකම මූල්‍ය තත්ත්ව ප්‍රකාශනයෙන් තවදුරටත් බැහැර වී තිබෙන අතර මෙය සමස්ථ මාර්ග පද්ධතියේ දුර ප්‍රමාණයෙන් සියයට 74 ක ප්‍රතිශතයකි. එසේම, 2021 දෙසැම්බර් 31 දිනට අධිකාරියේ මූල්‍ය ප්‍රකාශනවල දැක්වෙන රු. මිලියන 605,646 ක්වූ අධිවේගී මාර්ග කිලෝ මීටර් 271 ක පිරිවැය රේඛීය අමාත්‍යාංශය මගින් දරා තිබූ අතර එම මුළු ඉදිකිරීමේ වටිනාකම අධිවේගී මාර්ග ලෙස ප්‍රාග්ධනිත කර තිබුණි. එසේ වුවත් එම වත්කම් වලට ප්‍රාග්ධනිත කිරීම සඳහා භාණ්ඩාගාරයේ අනුමැතිය ලබාගැනීමට අදාල උපයෝගී ලියවිලි විගණනය වෙත ඉදිරිපත් නොකෙරුණි. එසේම, ශ්‍රී ලංකා රාජ්‍ය අංශ ගිණුම්කරණ ප්‍රමිත අංක 07 හි නියමයන්ට පටහැනිව එකිනෙකට වෙනස් වූ ඵලදායී ජීවිත කාලයන් සහිත අධිවේගී මාර්ග වල විවිධ උප කොටස් වෘත්තීමය තක්සේරුවක් මත ක්ෂය අනුපාත තීරණය කර ක්ෂය කිරීමට කටයුතු කර නොතිබුණි. ඒ අනුව එම වත්කම්වල සැබෑ මූල්‍ය තත්ත්වය මූල්‍ය ප්‍රකාශණ වලින් නිරූපණය වී නොතිබුණි.

(ආ) සමාලෝචිත වර්ෂයේදී, අධිකාරියේ මෙහෙයුම් ප්‍රතිඵලය රු.මිලියන 53,389 ක් වීම සඳහා අධිකාරිය වෙත රේඛීය අමාත්‍යාංශය හරහා මාර්ග කිලෝමීටර් 100,000 වැඩ සටහන සඳහා ලද රු.මිලියන 47,498 ක් සහ අත්පත් කරගත් ඉඩම් සඳහා ගෙවිය යුතු ව තිබූ වන්දි වගකීම නිරවුල් කිරීමට හා නව වන්දි ගෙවීම් සඳහා සමාලෝචිත වර්ෂයේ දී අධිකාරියට ලද රු.මිලියන 4,387 ක් ප්‍රධාන වශයෙන් හේතු වී තිබුණි.මෙම මුදල් කෙරිගෙන යන වැඩතුල,වැඩ ආරම්භ කිරීමේ අත්තිකාරම් තුල හා ගෙවිය යුතු වන්දි ගිණුම් තුල අඩංගු වීම නිසා සමාලෝචිත වර්ෂයේ මෙහෙයුම් ප්‍රතිඵලය ඉහල යාමට බලපෑමක් වී තිබුණි.තවද මෙම මාර්ග කිලෝමීටර් 100,000 වැඩ සටහන යටතේ අධිකාරියට අයත් නොවන මාර්ග ඉදිකිරීම සඳහා සමාලෝචිත වර්ෂයේ දෙසැම්බර් 31 දින දක්වා දරණ ලද රු. මිලියන 82,692ක් ඒ ඒ වර්ෂයේ වියදම් ලෙස ලියා නොහැර කෙරිගෙන යනවැඩ යටතේ නිරූපණය කර තිබුණි.

(ඇ) ශ්‍රී ලංකා රාජ්‍ය ගිණුම්කරණ ප්‍රමිත අංක 01 හි සඳහන් නියමයන් ට පටහැනිව වගකීම් කාලසීමාව 2022 වර්ෂයේ හෝ ඊට පෙර අවසන් වීමට නියමිත වූ ව්‍යාපෘති 54 කට අදාළ රු.මිලියන 21.37 ක රඳවා ගැනීමේ මුදල් සහ වර්ෂයේදී පියවීමට නියමිත රු.මිලියන 659 ක ගෙවිය යුතු ණය වාරික ජංගම නොවන වගකීම් යටතේ මූල්‍ය ප්‍රකාශන වල පෙන්වා තිබුණි. එසේම ඉදිරි වර්ෂයේදී පියවීමට නියමිත රු.මිලියන 51.53 ක් වූ වැඩ ආරම්භ කිරීමේ අත්තිකාරම් සහ ජංගම නොවන

වත්කම් යටතේද අධිකාරිය මගින් ක්‍රියාත්මක කරන ලද කි.මී 100,000 මාර්ග ව්‍යාපෘතිය යටතේ වූ ගෙවිය යුතු රඳවා ගැනීමේ මුදල් වූ රු.මිලියන 3,671 න් සියයට 60 ක් ජංගම වගකීම් ලෙසත් ඉතිරි සියයට 40 ජංගම නොවන වගකීම් ලෙසත් එම ව්‍යාපෘතියට අදාළ වැඩ ආරම්භ කිරීමේ අත්තිකාරම් මුදල් වූ රු. මිලියන 13,347.5 න් පිළිවෙලින් සියයට 75 ක් හා සියයට 25 ක් ජංගම හා ජංගම නොවන වත්කම් ලෙසත් පදනම්කින් තොරව බෙදා වෙන් කර මූල්‍ය ප්‍රකාශන වල දක්වා තිබුණි.

(ඇ) අධිකාරියට අයත් පිරිවැය රු. මිලියන 394.9 ක් වූ වාහන 155 ක් හා පිරිවැය රු.මිලියන 56.6 ක් වූ ගොඩනැගිලි 2021 ජනවාරි 01 දින වන විට සම්පූර්ණයෙන්ම ක්ෂය කර තිබුණි. එම වාහන හා ගොඩනැගිලි තවදුරටත් අධිකාරිය භාවිතා කරමින් පැවති නමුත් රාජ්‍ය අංශ ගිණුම්කරණ ප්‍රමිත අංක 07 ප්‍රකාරව එම වත්කම් පිළිබඳ මූල්‍ය ප්‍රකාශනවල අවශ්‍ය අනාවරණයන් කර නොතිබුණු අතර රාජ්‍ය අංශ ගිණුම්කරණ ප්‍රමිත අංක 03 ප්‍රකාරව එම වත්කම්වල ඵලදායී ජීවිත කාලය පිළිබඳව වූ ඇස්තමේන්තුගත දෝෂය නිවැරදි කර ගිණුම්වල ගැලපීමට ද කටයුතු කර නොතිබුණි.

(ඉ) ශ්‍රී ලංකා රාජ්‍ය අංශ ගිණුම්කරණ ප්‍රමිත අංක 07 හි වත්කම් හඳුනා ගැනීමේ මූලධර්මයන්ට අනුව වත්කමක් ලෙස හඳුනා ගෙන ප්‍රාග්ධනිත කළ යුතුව තිබුණු , පානදුර දක්වා වූ මුහුදුබඩ මාර්ගය ඉදිකිරීම් සඳහා දරා තිබුණු රු.මිලියන 556.8 ක මුදල සමාලෝචිත වර්ෂයේ අයභාර වියදමක් ලෙස සලකා ආදායමෙන් කපා හැර තිබුණි. එම නිසා සමාලෝචිත වර්ෂයේ අතිරික්තය එම ප්‍රමාණයෙන් අඩුවෙන් මූල්‍ය ප්‍රකාශන වල දැක්වුණි.

(ඊ) අධිකාරියේ වත්කම් ලේඛණයේ වටිනාකමක් සඳහන් නොවූ මෝටර් වාහන 258 ක් පැවති අතර එම මෝටර් වාහන ප්‍රත්‍යාගණනය කර මූල්‍ය ප්‍රකාශනවල දැක්වීමට කටයුතු කර නොතිබුණි. තවද 2022 / 2023 වර්ෂ සඳහා මාර්ග සංවර්ධන අධිකාරිය සතු වාහන රක්ෂණය කිරීමේ දී රු.මිලියන 492.95 ක වියදමක් දරා රක්ෂණය කරන ලද වාහන 54ක් අධිකාරියේ වාහන පිළිබඳ වත්කම් ලේඛනය තුළ ඇතුලත්ව නොතිබුණි.

(උ) මාර්ග සංවර්ධන අධිකාරිය විසින් මාර්ග සංවර්ධන කටයුතු වලදී අවතැන් වූවන් නැවත පදිංචි කිරීම සඳහා මිල දී ගෙන 2016 සහ 2017 වර්ෂ වලදී ලියාපදිංචි කරන ලද රු.මිලියන 34 ක් පිරිවැය වූ අක්කර 07 ක භූමි ප්‍රමාණයක් සහිත ඉඩම් කැබලි 04 ක් හා පිටත වටරවුම් අධිවේගී මාර්ග ව්‍යාපෘති - **II** අදියර විසින් අධිකාරිය වෙත භාර දී තිබෙන රු.මිලියන 8.2 ක් වටිනා ඉඩම් අධිකාරියේ වත්කම් ලෙස මූල්‍ය ප්‍රකාශන වල දක්වා නොතිබුණි.

(ඌ) ගිණුම් අංශය විසින් විගණනය වෙත ලබා දුන් උපලේඛණ අනුව, ඉඩම් අංශය විසින් හා ව්‍යාපෘති වලින් අත්කරගත් ඉඩම් සඳහා ගෙවිය යුතු වන්දි හා ඊට අදාළ පොළිය රු.මිලියන 585.19 ක්

වූවද, ඉඩම් අංශය විසින් මේ සම්බන්ධයෙන් විගණනය වෙත ඉදිරිපත් කරන ලද තොරතුරු අනුව, ඊට අනුරූපී ගෙවිය යුතු වන්දි හා පොළිය රු.මිලියන 958 ක් විය. එසේ වූවත්, මෙම ශේෂයන් වල වෙනසට හේතු සසඳා බලා මූල්‍ය ප්‍රකාශන වල ගැලපීමට කටයුතු කර නොතිබුණි.

(එ) ඉඩම් අත්කර ගැනීමේ නිතිරීති හා රෙගුලාසි ප්‍රකාරව අධිකාරිය විසින් 2021 දෙසැම්බර් 31 දිනට ගෙවීමට බැඳී සිටින සම්පූර්ණ ව්‍යවස්ථාපිත වන්දි මුදල හා ඊට අදාළ පොළී මුදල හඳුනාගෙන ගිණුම්ගත කර නොතිබුණි. නියැදි විගණන පරීක්ෂාවකට අනුව, 2021 දෙසැම්බර් 31 දිනට එලෙස ගිණුම්ගත නොකළ ගෙවිය යුතු පොළිය රු.මිලියන 307.07 ක් බව විගණයේ දී නිරීක්ෂණය විය. තවද, දක්ෂිණ අධිවේගී මාර්ග දිගුව - II ව්‍යාපෘතියට අදාලව ගෙවිය යුතු වන්දි හා පොළිය ලෙස 2020 වර්ෂයේ වෙන්කර තිබුණු රු.මිලියන 135.8 ක මුදල 2021 වර්ෂය තුළ ගෙවීම් කිරීමේ දී නැවත වියදමක් ලෙස ගිණුම්ගත වීම හේතුවෙන් සහ මාර්ග පුළුල් කිරීම හා වැඩි දියුණු කිරීමට අදාළව ගෙවිය යුතු රු. මිලියන 308.92 පොළි මුදලක් වැඩියෙන් ගිණුම්ගත වීම නිසා සමාලෝචිත වර්ෂයේ පොළී වියදම් රු.මිලියන 444.72 වැඩියෙන් මූල්‍ය ප්‍රකාශනය වල දැක්වුනි. එසේම, අධිකාරියේ 2021 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය ප්‍රකාශන වල අත්කර ගත් ඉඩම් සඳහා ගෙවිය යුතු වන්දි හා පොළියෙහි එකතු වටිනාකම ලෙස රු.මිලියන 932.10 ක් ලෙස දක්වා තිබූ නමුත් මෙම අයිතමයෙහි ප්‍රමාණාත්මකතාවය සලකා මූල්‍ය ප්‍රකාශන තුළ වන්දි හා පොළිය වෙන් වෙන්ව ඉදිරිපත් කිරීමට කටයුතුකර නොතිබුණි.

(ඒ) විදේශාධාර ව්‍යාපෘති වලින් සහ වෙනත් ක්‍රම වලින් අධිකාරියට ලැබී තිබුණු එකතුව රු.මිලියන 1,400.15 ක් වූ තොරතුරු පද්ධතීන් හා පිරිවැය රු.මිලියන 3,958 ක් වූ පාලම් හා ලී බඩු උපකරණ යනාදී ස්ථාවර වත්කම් අධිකාරියේ ගිණුම් වලට ඇතුළත් කරමූල්‍ය ප්‍රකාශන වල දැක්වීමට කටයුතු කර නොතිබුණි.

(ඔ) සමාලෝචිත වර්ෂය තුළ දුර්වල පාලම් නැවත ඉදිකිරීම් වෙනුවෙන් දරා තිබුණු වූ රු.මිලියන 362.11 ක පිරිවැය පොදුවේ සංවර්ධන හා නඩත්තු වියදම් යටතේ මූල්‍ය ප්‍රකාශනවල දක්වා තිබුණි.

(ඕ) සමාලෝචිත වර්ෂයේ දෙසැම්බර් 31 දිනට අධිකාරියේ මූල්‍ය ප්‍රකාශන වල ජංගම නොවන වත්කම් යටතේ දක්වා තිබුණු පිරිවැය රු. මිලියන 4.3 ක ගොඩනැගිලි සහ පිරිවැය රු.මිලියන 525 ක් වූ වෙනත් වත්කම් ස්ථාවර වත්කම් ලේඛනයට ඇතුළත් කර නොතිබුණු අතර, එම වත්කම් හඳුනා ගැනීමට අදාළ වෙනත් විස්තරද විගණනය වෙත ඉදිරිපත් නොකෙරුණි. එම නිසා මෙකී වත්කම් වල පැවැත්ම හා අගය කිරීම විගණනයේ පරීක්ෂා කළ නොහැකි විය.

(ක) මගනැගුම ඉමල්ෂන් සමාගමේ සියයට 99 ක සෘජු පාලන හිමිකමක් අධිකාරියට තිබෙන බව අධිකාරියේ මූල්‍ය ප්‍රකාශණ තුළ හෙළිදරව් කර තිබුණ ද, ඒ සඳහා වන කොටස් සහතික

විගණනයට ඉදිරිපත් නොකෙරුණි. මෙම සමාගමේ රු. 1,000,100 ක කොටස් අධිකාරිය මිලට ගෙන ඇති බව අධිකාරියේ මූල්‍ය ප්‍රකාශන වල සඳහන් වූවද, ඊට අනුරූපීව සමාගමේ මූල්‍ය ප්‍රකාශන වල අධිකාරියට අයත් කොටස් වටිනාකම රු. 100 ක් පමණක් බව දක්වා රු. මිලියන 01 ක මුදල අධිකාරිය විසින් සාමාගම වෙත ලබාදුන් ණයක් ලෙස මතභේදයට තුඩු දෙන අයුරින් පරිපාලිත සමාගමේ මූල්‍ය ප්‍රකාශණවල දක්වා තිබුණි. කෙසේ වූවත්, මෙම කොටස් අයිතිය පිළිබඳ වූ ව්‍යාකූල තත්ත්වය නිරාකරණය කර ගැනීමට අධිකාරිය මෙම වාර්තාවේ දිනය දක්වා කටයුතු කර නොතිබුණි.

(ඛ) මාර්ග සංවර්ධන අධිකාරිය සහ සී/ස මඟ නැගුම මාර්ග ඉදිකිරීම් හා යන්ත්‍රෝපකරණ (පුද්) සමාගම අතර වූ ජංගම ගිණුම් අතර, හර හා බැර ශේෂවල එකතුව රු.මිලියන 2,268.30 ක වෙනසක් නිරීක්ෂණය විය. එසේම සමාලෝචිත වර්ෂයේ දෙසැම්බර් 31 දිනට ඉටුකලයුතු සේවාදායක තැන්පතු ශේෂය වූ රු.මිලියන 3,070.9 ක මුදල සහ එයින් නිරූපණය කෙරුණු වත්කම් අතර, රු.මිලියන 1,730.7 ක වෙනසක් නිරූපණය වූ අතර, යථෝක්ත වෙනස සම්බන්ධව සැසඳීමක් සිදුකර නොතිබුණි.

ශ්‍රී ලංකා විගණන ප්‍රමිතිවලට (ශ්‍රී.ලං.වි.ප්‍ර) අනුකූලව මා විගණනය සිදු කරන ලදී. මෙම විගණන ප්‍රමිති යටතේ වූ මාගේ වගකීම, මෙම වාර්තාවේ මූල්‍ය ප්‍රකාශන විගණනය සම්බන්ධයෙන් විගණකගේ වගකීම යන කොටසේ තවදුරටත් විස්තර කර ඇත. මාගේ තත්ත්වාගණනය කළ මතය සඳහා පදනමක් සැපයීම උදෙසා මා විසින් ලබාගෙන ඇති විගණන සාක්ෂි ප්‍රමාණවත් සහ උචිත බව මාගේ විශ්වාසයයි.

1.3 කරුණු අවධාරණය කිරීම

(අ) මූල්‍ය ප්‍රකාශණවල 2.බී යටතේ විස්තර කර ඇති අධිකාරියේ පරිපාලිත සමාගම් සමඟ ඒකාබද්ධ මූල්‍ය ප්‍රකාශණ පිළියෙල නොකිරීමට හේතුවන කරුණ කෙරෙහි අවධානය යොමුකරවන අතර ඒ හේතුව නිසා පැනනැගෙන ප්‍රතිඵලය හේතුවෙන් මාගේ මතය විකරණය නොකෙරේ.

(ආ) මූල්‍ය ප්‍රකාශන සමඟ වූ සටහන් අංක 2.F.(iii) හි දැක්වෙන පරිදි ශ්‍රී ලංකා රාජ්‍ය අංශ ගිණුම්කරණ ප්‍රමිති අංක 11 අනුව, මාර්ග සංවර්ධන අධිකාරිය විසින් භාණ්ඩාගාර ඇපකර මත දේශීය බැංකු වලින් ලබා ගන්නා ලද ණය පියවීම් සඳහා වාර්ෂිකව රේඛීය අමාත්‍යාංශය හරහා භාණ්ඩාගාරයෙන් ලැබෙන මුදල් රාජ්‍ය ප්‍රධාන ලෙස ගිණුම්ගත කිරීම නිසා එම ප්‍රමාණයෙන් අධිකාරියේ වාර්ෂික මෙහෙයුම් ප්‍රතිඵලය ඉහල යාමට බලපෑමක් සිදු වේ. සමාලෝචිත වර්ෂයේ දී පමණක් මෙහි බලපෑම රු.මිලියන 927 ක් විය.

1.4 මාර්ග සංවර්ධන අධිකාරියේ 2021 වාර්ෂික වාර්තාවේ ඇතුළත් අනෙකුත් තොරතුරු

මෙම විගණන වාර්තාවේ දිනට පසුව මට ලබා දීමට බලාපොරොත්තු වන අධිකාරියේ 2021 වාර්ෂික වාර්තාවේ ඇතුළත් විය හැකි නමුත් මූල්‍ය ප්‍රකාශන සහ ඒ පිළිබඳව වූ මගේ විගණන වාර්තාවේ ඇතුළත් නොවන තොරතුරු, අනෙකුත් තොරතුරු යන්නෙන් අදහස් වේ. මෙම අනෙකුත් තොරතුරු සඳහා කළමනාකරණය වගකිව යුතුය.
මූල්‍ය ප්‍රකාශන සම්බන්ධයෙන් වූ මගේ මතයෙන් අනෙකුත් තොරතුරු ආවරණය නොකරන අතර මම ඒ පිළිබඳ කිසිදු ආකාරයක සහතිකවීමක් හෝ මතයක් ප්‍රකාශ නොකරමි.

මූල්‍ය ප්‍රකාශන පිළිබඳ මගේ විගණනයට අදාළව, මගේ වගකීම වන්නේ ඉහත අනෙකුත් තොරතුරු ලබා ගත හැකි වූ විට කියවීම සහ එසේ කිරීමේදී අනෙකුත් තොරතුරු මූල්‍ය ප්‍රකාශන සමඟ හෝ විගණනයේදී හෝ වෙනත් ආකාරයකින් ලබාගත් මගේ දැනුම අනුව ප්‍රමාණාත්මක වශයෙන් නොගැලපෙනවාද යන්න සලකා බැලීමයි.

මෙම විගණක වාර්තාවේ දිනට පෙර මා ලබාගත් අනෙකුත් තොරතුරු මත හා මා විසින් කරන ලද කාර්යයන් මත පදනම්ව, මෙම අනෙකුත් තොරතුරු ප්‍රමාණාත්මක වශයෙන් වැරදි ලෙස දක්වා ඇති බව මම නිගමනය කරන්නේ නම්, එම කරුණ මා විසින් වාර්තා කිරීමට අවශ්‍ය වේ.

අධිකාරියේ 2021 වාර්ෂික වාර්තාව කියවන විට, එහි ප්‍රමාණාත්මක වරදවා දැක්වීම් ඇති බව මම නිගමනය කළහොත්, නිවැරදි කිරීම සඳහා පාලනය කරන පාර්ශවයන් වෙත එම කරුණු සන්නිවේදනය කළ යුතුය. තව දුරටත් නිවැරදි නොකළ වරදවා දැක්වීම් තිබේ නම්, ඒවා ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 154(6) ව්‍යවස්ථාව ප්‍රකාරව මා විසින් යථා කාලයේදී පාර්ලිමේන්තුවේ සභාගත කරනු ලබන වාර්තාවට ඇතුළත් කරනු ඇත.

1.5 මූල්‍ය ප්‍රකාශන පිළිබඳ කළමනාකරණයේ සහ පාලනය කරන පාර්ශවයන්ගේ වගකීම්

මෙම මූල්‍ය ප්‍රකාශන ශ්‍රී ලංකා රාජ්‍ය අංශයේ ගිණුම්කරණ ප්‍රමිතිවලට අනුකූලව පිළියෙල කිරීම හා සාධාරණ ලෙස ඉදිරිපත් කිරීම සහ වංචා හෝ වැරදි හේතුවෙන් ඇතිවිය හැකි ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන්ගෙන් තොරව මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමට හැකිවනු පිණිස අවශ්‍ය වන අභ්‍යන්තර පාලනයන් තීරණය කිරීම කළමනාකරණයේ වගකීම වේ.
මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමේදී, අධිකාරිය අඛණ්ඩව පවත්වාගෙන යාමේ හැකියාව තීරණය කිරීම කළමනාකරණයේ වගකීමක් වන අතර, කළමනාකාරිත්වය අධිකාරිය ඇවර කිරීමට අදහස් කරන්නේ නම් හෝ වෙනත් විකල්පයක් නොමැති විටදී මෙහෙයුම් නැවැත්වීමට කටයුතු කරන්නේ නම් හැර අඛණ්ඩ පැවැත්මේ පදනම මත ගිණුම් තැබීම හා අධිකාරියේ අඛණ්ඩ පැවැත්මට අදාළ කරුණු අනාවරණය කිරීමද කළමනාකරණයේ වගකීමකි.

අධිකාරියේ මූල්‍ය වාර්තාකරණ ක්‍රියාවලිය සම්බන්ධ වගකීම, පාලනය කරන පාර්ශවයන් විසින් දරනු ලබයි.

2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 16 (1) උප වගන්තිය ප්‍රකාරව, අධිකාරියේ වාර්ෂික සහ කාලීන මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමට හැකිවන පරිදි ස්වකීය ආදායම්, වියදම්, වත්කම් හා බැරකම් පිළිබඳ නිසි පරිදි පොත්පත් හා වාර්තා පවත්වාගෙන යා යුතුය.

1.6 මූල්‍ය ප්‍රකාශන විගණනය සම්බන්ධයෙන් විගණකගේ වගකීම

සමස්තයක් ලෙස මූල්‍ය ප්‍රකාශන, වංචා සහ වැරදි නිසා ඇතිවන ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන්ගෙන් තොර බවට සාධාරණ තහවුරුවක් ලබාදීම සහ මාගේ මතය ඇතුළත් විගණකගේ වාර්තාව නිකුත් කිරීම මාගේ අරමුණ වේ. සාධාරණ සහතිකවීම උසස් මට්ටමේ සහතිකවීමක් වන නමුත්, ශ්‍රී ලංකා විගණන ප්‍රමිති ප්‍රකාරව විගණනය සිදු කිරීමේදී එය සෑමවිටම ප්‍රමාණාත්මක අවප්‍රකාශනයන් අනාවරණය කරගන්නා බවට වන තහවුරු කිරීමක් නොවනු ඇත. වංචා සහ වැරදි තනි හෝ සාමූහික ලෙස බලපෑම නිසා ප්‍රමාණාත්මක අවප්‍රකාශනයන් ඇතිවිය හැකි අතර, මෙම මූල්‍ය ප්‍රකාශන පදනම් කරගනිමින් පරිශීලකයන් විසින් ගනු ලබන ආර්ථික තීරණ කෙරෙහි බලපෑම මත රඳා පවතී.

ශ්‍රී ලංකා විගණන ප්‍රමිති ප්‍රකාරව විගණනයේ කොටසක් ලෙස මා විසින් විගණනයේදී වෘත්තීය විනිශ්චය සහ වෘත්තීය සැකමුසුබවින් යුතුව ක්‍රියා කරන ලදී. මා විසින් තවදුරටත්,

- ප්‍රකාශ කරන ලද විගණන මතයට පදනමක් සපයා ගැනීමේදී වංචා හෝ වැරදි හේතුවෙන් මූල්‍ය ප්‍රකාශනවල ඇති විය හැකි ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන් ඇතිවීමේ අවදානම් හඳුනාගැනීම හා තක්සේරු කිරීම සඳහා අවස්ථාවෝචිතව උචිත විගණන පරිපාටි සැලැසුම් කර ක්‍රියාත්මක කරන ලදී. වරදවා දැක්වීම හේතුවෙන් සිදුවන ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන්ගෙන් සිදුවන බලපෑමට වඩා වංචාවකින් සිදුවන්නා වූ බලපෑම ප්‍රබල වන්නේ ඒවා දුස්සන්ධානයෙන්, ව්‍යාජ ලේඛන සැකසීමෙන්, චේතනාන්විත මඟහැරීමෙන්, වරදවා දැක්වීමෙන් හෝ අභ්‍යන්තර පාලනයන් මඟ හැරීමෙන් වැනි හේතු නිසා වන බැවිනි.
- අභ්‍යන්තර පාලනයේ සඵලදායිත්වය පිළිබඳව මතයක් ප්‍රකාශ කිරීමේ අදහසින් නොවුවද, අවස්ථාවෝචිතව උචිත විගණන පරිපාටි සැලසුම් කිරීම පිණිස අභ්‍යන්තර පාලනය පිළිබඳව අවබෝධයක් ලබාගන්නා ලදී.
- භාවිතා කරන ලද ගිණුම්කරණ ප්‍රතිපත්තිවල උචිතභාවය, ගිණුම්කරන ඇස්තමේන්තුවල සාධාරණත්වය සහ කළමනාකරණය විසින් කරන ලද සම්බන්ධිත හෙළිදරව් කිරීම් අගයන ලදී.

- සිද්ධීන් හෝ තත්ත්වයන් හේතුවෙන් අධිකාරියේ අඛණ්ඩ පැවැත්ම පිළිබඳ ප්‍රමාණාත්මක අවිනිශ්චිතතාවයක් තිබෙද යන්න සම්බන්ධයෙන් ලබාගත් විගණන සාක්ෂි මත පදනම්ව ගිණුම්කරණය සඳහා ආයතනයේ අඛණ්ඩ පැවැත්ම පිළිබඳ පදනම යොදා ගැනීමේ අදාලත්වය තීරණය කරන ලදී. ප්‍රමාණවත් අවිනිශ්චිතතාවයක් ඇති බවට මා නිගමනය කරන්නේ නම් මූල්‍ය ප්‍රකාශනවල ඒ සම්බන්ධයෙන් වූ හෙළිදරව්කිරීම් වලට මාගේ විගණන වාර්තාවේ අවධානය යොමු කළ යුතු අතර, එම හෙළිදරව්කිරීම් ප්‍රමාණවත් නොවන්නේ නම් මාගේ මතය විකරණය කළ යුතුය. කෙසේ වුවද, අනාගත සිද්ධීන් හෝ තත්ත්වයන් මත අඛණ්ඩ පැවැත්ම අවසන් වීමට හැකිය.

- මූල්‍ය ප්‍රකාශනවල ව්‍යුහය හා අන්තර්ගතය සඳහා පාදක වූ ගනුදෙනු හා සිද්ධීන් උචිත හා සාධාරණව ඇතුළත් වී ඇති බව සහ හෙළිදරව් කිරීම් ඇතුලත් මූල්‍ය ප්‍රකාශනවල සමස්ථ ඉදිරිපත් කිරීම අගයන ලදී.

මාගේ විගණනය තුළදී හඳුනාගත් වැදගත් විගණන සොයාගැනීම්, ප්‍රධාන අභ්‍යන්තර පාලන දුර්වලතා හා අනෙකුත් කරුණු පිළිබඳව පාලනය කරනු ලබන පාර්ශවයන් දැනුවත් කරමි.

2. වෙනත් නෛතික හා නියාමන අවශ්‍යතා පිළිබඳ වාර්තාව

2.1 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ පහත සඳහන් අවශ්‍යතාවයන් සම්බන්ධයෙන් විශේෂ ප්‍රතිපාදන ඇතුලත් වේ.

2.1.1 මාගේ වාර්තාවේ තත්ත්වාගණනය කළ මතය සඳහා පදනම කොටසේ විස්තර කර ඇති කරුණු වලින් වන බලපෑම හැර, 2018 අංක 19 දරණ ජාතික විගණන පනතේ 12 (අ) වගන්තියේ සඳහන් අවශ්‍යතාවන් අනුව, විගණනය සඳහා අවශ්‍ය සියලු තොරතුරු සහ පැහැදිලි කිරීම් මා විසින් ලබාගන්නා ලද අතර, මාගේ පරීක්ෂණයෙන් පෙනී යන ආකාරයට නිසි මූල්‍ය වාර්තා අධිකාරිය පවත්වාගෙන ගොස් තිබුණි.

2.1.2 2018 අංක 19 දරණ ජාතික විගණන පනතේ 6 (1) (ඇ) (iii) වගන්තියේ සඳහන් අවශ්‍යතාවය අනුව අධිකාරියේ මූල්‍ය ප්‍රකාශන ඉකුත් වර්ෂය සමඟ අනුරූප වේ.

2.1.3 2018 අංක 19 දරණ ජාතික විගණන පනතේ 6 (i) (ඇ) (iv) වගන්තියේ සඳහන් අවශ්‍යතාවය අනුව ඉකුත් වර්ෂයේදී මා විසින් සිදුකරන ලද 1.2 ඡේදයේ සඳහන් (අ),(ආ),(ඇ),(ඊ),(එ),(ඒ) යනාදී නිර්දේශයන් හැර ඉදිරිපත් කරන ලද මූල්‍ය ප්‍රකාශනවල ඇතුළත්ව ඇත.

2.2 අනුගමනය කරන ලද ක්‍රියාමාර්ග සහ ලබා ගන්නා ලද සාක්ෂි මත හා ප්‍රමාණාත්මක කරුණුවලට සීමා කිරීම තුල, පහත සඳහන් ප්‍රකාශ කිරීමට තරම් කිසිවක් මාගේ අවධානයට ලක් නොවීය.

2.2.1 2018 අංක 19 දරණ ජාතික විගණන පනතේ 12 (ඇ) වගන්තියේ සඳහන් අවශ්‍යතාවය අනුව අධිකාරියේ පාලක මණ්ඩලයේ යම් සාමාජිකයෙකුට අධිකාරිය සම්බන්ධවී යම් ගිවිසුමක් සම්බන්ධයෙන් සෘජුව හෝ අන්‍යාකාරයකින් සාමාන්‍ය ව්‍යාපාරික තත්ත්වයෙන් බැහැරව සම්බන්ධයක් ඇති බව.

2.2.2 2018 අංක 19 දරණ ජාතික විගණන පනතේ 12 (ඊ) වගන්තියේ සඳහන් අවශ්‍යතාවය අනුව පහත සඳහන් නිරීක්ෂණ හැර යම් අදාල ලිඛිත නීතියකට හෝ අධිකාරියේ පාලක මණ්ඩලය විසින් නිකුත් කරන ලද වෙනත් පොදු හෝ විශේෂ විධානවලට අනුකූල නොවන ලෙස ක්‍රියා කර ඇති බව.

නීතිරීති / විධානයට යොමුව	විස්තරය
(අ) 1983 අංක 12 දරන පාරිතෝෂික ගෙවීම් පනත	වර්ෂ 05 ක අඛණ්ඩ සේවා කාලයක් සම්පූර්ණ කර සේවය අවසන් කරන ලද නිලධාරීන්ට හිමි පාරිතෝෂික දීමනාව ඔවුන් සේවයෙන් ඉවත් වූ දින සිට දින 30 ක් ඇතුළත ගෙවිය යුතු වුවද, 2021 වර්ෂය තුළ සේවයෙන් විශ්‍රාම ගිය, ඉල්ලා අස්වූ, මියගිය සහ තනතුර අතහැර ගිය නිලධාරීන් 32 දෙනෙකු සඳහා 2021 වර්ෂය තුළ දී පාරිතෝෂික ගෙවීම් සිදු කර නොතිබුණි. එසේ ප්‍රමාද කාලය පදනම් කරගෙන පොළී මුදලක්ද ගෙවිය යුතුවේ.
(ආ) 2018 ජනවාරි 24 දිනැති අංක 02/2018 දරණ රාජ්‍ය පරිපාලන චක්‍රලේඛය:	
(i) 1 වගන්තිය	අධිකාරිය විසින් මානව සම්පත් සංවර්ධනය කිරීමේ ක්‍රමවේදයක් හඳුන්වා දී නොතිබුණ අතර කාර්ය මණ්ඩලය සඳහා වාර්ෂික කාර්යසාධන ගිවිසුම් අත්සන් කිරීමට හෝ කාර්ය සාධනය ඇගයීමේ ක්‍රමවේදයක් හඳුන්වා දීමට කටයුතු කර නොතිබුණි.
(ii) 5 වගන්තිය	මානව සම්පත් සංවර්ධන සැලැස්මක් පිළියෙල කර නොතිබුණි.
(ඇ) 2006 සැප්තැම්බර් 22 දිනැති අංක 30 සහ 2009 ජුනි 01 දිනැති අංක 30(I) දරණ රාජ්‍ය ව්‍යාපාර චක්‍රලේඛය:	කළමනාකරණ සේවා දෙපාර්තමේන්තුවේ නියමයන්ට හා මාර්ගෝපදේශයන්ට අනුව සකස් කරන ලද බඳවා ගැනීමේ හා උසස් කිරීම් පරිපාටියක් සකසා ගැනීමට යටත්ව එම දෙපාර්තමේන්තුව විසින් ඉදිරිපත් කර තිබුණු කාර්යමණ්ඩල ප්‍රතිව්‍යුහගතකරණ නිර්දේශයන් ක්‍රියාත්මක කිරීම වෙනුවට එකී නියමයන් නොසලකා හැර අධ්‍යක්ෂ මණ්ඩල තීරණමත තනතුරු 23 කට අදාල නිළධාරීන් 287 ක් සඳහා වැරදි වැටුප් පරිමාණයන් අනුව වැටුප් සකස්කර ඒ අනුව ගෙවීම්කර තිබුණි.

(ඇ) **2006 ජාතික ප්‍රසම්පාදන මාර්ගෝපදේශ සංග්‍රහය:**

(i) 4.2.1 (අ), (ආ), සහ (ඉ) වගන්තීන් සහ 4.2.2 (අ) වගන්තිය,	අවම වශයෙන් වර්ෂ 03 ක කාලයක් සඳහා සකස් කර මාස 06 කට වැඩි නොවන කාලයක් තුළ නිතිපතා යාවත්කාලීන කළ යුතු ප්‍රධාන ප්‍රසම්පාදන සැලැස්මක් හා ප්‍රසම්පාදන ක්‍රියාවන්හි පියවර ක්‍රමානුකූලව විස්තර කෙරෙන ප්‍රසම්පාදන කාලසටහනක් මාර්ග සංවර්ධන අධිකාරිය විසින් සකස් කර නොතිබුණි.
(ii) 8.10.1 වගන්තිය සහ 8.11.4 (අ)(i) වගන්තිය,	අධිකාරිය විසින් ප්‍රදානය කර තිබූ කොන්ත්‍රාත් පිළිබඳ තොරතුරු අධිකාරියේ වෙබ් අඩවියේ හෝ වෙනත් උචිත මාධ්‍යයක හෝ ප්‍රසිද්ධියට පත් කර නොතිබූ අතර, කොන්ත්‍රාත් පැහැර හැරි සැපයුම්කරුවන් පිළිබඳ දත්ත මූලාශ්‍රයක් නඩත්තු කර නොතිබුණි.

(ඉ) **මාර්ග සංවර්ධන අධිකාරි චක්‍රලේඛ**

(i) RDA/GM/10/169 දරණ හා 2010 ජුනි 10 දිනැති චක්‍රලේඛයේ (එ) වගන්තියේ (III) ඡේදය	ප්‍රවාහන පහසුකම් සලසාදීමේදී කොන්ත්‍රාත්තුවට සෘජුවම සම්බන්ධවන ඉංජිනේරුවරයාට ප්‍රවාහන පහසුකම් සලසා දීම සඳහා පමණක් අනුමැතිය ලබා දී තිබුණද, ඊට අනුකූල නොවී කොන්ත්‍රාත් සඳහා සෘජු සම්බන්ධතාවයක් නොදැක්වූ මාර්ග සංවර්ධන අධිකාරියේ දකුණු පළාත් කාර්යාලවල ඉංජිනේරුවරුන් සහ කාර්මික නිලධාරීන් සඳහා ප්‍රවාහන පහසුකම් සැපයීමට වෑන් රථ, කැබ් රථ හා කාර් රථ කුලියට ලබාගෙන තිබුණු අතර, ඒ වෙනුවෙන් එකතුව රු.මිලියන 23.3 ක කුලී ගෙවා තිබුණි.

2.2.3 2018 අංක 19 දරණ ජාතික විගණන පනතේ 12 (උ) වගන්තියේ සඳහන් අවශ්‍යතාවය අනුව පහත සඳහන් නිරීක්ෂණ හැර අධිකාරියේ බලතල , කර්තව්‍ය සහ කාර්යයන්ට අනුකූල නොවන ලෙස කටයුතු කර ඇති බව.

(අ) 2008 අංක 40 දරන ජාතික මංමාවත් පනතේ 13 හා 14 වැනි වගන්ති සහ 2011 නොවැම්බර් 18 දිනැති අංක 1732/12 දරන අති විශේෂ ගැසට් පත්‍රයේ 07 ඡේදය ප්‍රකාරව ගාස්තු අයකරන ජාතික මහාමාර්ග වලින් ලැබෙන මුදල් අධිකාරියේ අරමුදලට බැරකල යුතු අතර, සමාලෝචිත වර්ෂයේ දෙසැම්බර් 31 දිනට අධිවේගී මාර්ග වලින් එකතු කරගත් රු.මිලියන 61,435 ක ආදායමෙන්, අධිකාරියේ සියලු ආදායම් ප්‍රභව මත

බදු ගෙවීම සඳහා දරා ඇති වියදම රු. මිලියන 18,473 ක් විය. තවද ගැසට් පත්‍රයේ නියමයන්ට පරිබාහිර ව අධිකාරියේ සේවකයන් වෙනුවෙන් වැටුප් හා දීමනා ගෙවීම සඳහා රු.මිලියන 10,713 ක් ද පොදු වියදම් හා ව්‍යාපෘති වලට ගෙවීම් සඳහා රු.මිලියන 3,402.3 ක් සහ සහ පොලිස් දෙපාර්තමේන්තුවේ නිළධාරීන්ට පහසුකම් සැපයීම සඳහා රු.මිලියන 650 කට අධික මුදලක් වැයකර තිබුණි.

(ආ) 2008 අංක 40 දරන ජාතික මංමාවත් පනතේ 4(3) වගන්තිය ප්‍රකාරව, "ඒකාබද්ධ මාර්ග පද්ධති සංවර්ධනය සහ නඩත්තුව සඳහා ක්‍රියාකාරී සැලැස්මක්" සකස් කර නොතිබුණු අතර, පනතේ 6(1) සහ 7(1) වගන්ති ප්‍රකාරව පිළිවෙලින් "මාර්ග පද්ධති සංවර්ධන උපදේශක සභාව" සහ "දිස්ත්‍රික් මාර්ග පද්ධති සංවර්ධන සම්බන්ධීකරණ කමිටු" පිහිටුවා නොතිබුණි.

2.2.4 2018 අංක 19 දරණ ජාතික විගණන පනතේ 12(ඌ) වගන්තියේ සඳහන් අවශ්‍යතාවය අනුව පහත සඳහන් නිරීක්ෂණ හැර සම්පත් සකසුරුවම් ලෙස, කාර්යක්ෂම ලෙස සහ ඵලදායී ලෙස කාලසීමාවන් තුළ අදාළ නීතිරීති වලට අනුකූලව ප්‍රසම්පාදනය කර භාවිතා කර නොමැති බව.

(අ) මාර්ග සංවර්ධන අධිකාරියේ විවිධ අංශ විසින් ක්‍රියාත්මක කරන ලද කොන්ත්‍රාත් අතරින් කොන්ත්‍රාත් 05 කට අදාළව 2021 දෙසැම්බර් 31 ට අයවිය යුතු වැඩ ආරම්භ කිරීමේ අත්තිකාරම් ශේෂය රු.මිලියන 59.60 ක් වූ අතර එයින් ඇතැම් කොන්ත්‍රාත් සඳහා රජයේ ප්‍රසම්පාදන මාර්ගෝපදේශ සංග්‍රහයේ 5.4.4 ට අනුව වැඩ ආරම්භ කිරීමේ අත්තිකාරම් සුරක්ෂණයක් හෝ ලබා ගෙන නොතිබුණි.

(ආ) ප්‍රසම්පාදන මාර්ගෝපදේශ සංග්‍රහයේ 3.4 සහ ප්‍රසම්පාදන කාර්ය සංග්‍රහයේ 2.14.1 සඳහා වන 35 අතිරේඛය අනුව වටිනාකම රු.මිලියන 01 - 05 ත් අතර ප්‍රසම්පාදනයන් ප්‍රාදේශීය ප්‍රසම්පාදන කමිටුව මගින් සිදුකළ යුතු වුවත් එම ප්‍රසම්පාදන සීමාවට ගැනෙන,ප්‍රවාහන පහසුකම් සලසා ගැනීම වෙනුවෙන් මාතර ප්‍රධාන ඉංජිනේරු කාර්යාලය වෙත මෝටර් රථයක් ලබා ගැනීම ප්‍රධාන ඉංජිනේරුගේ ප්‍රසම්පාදන සීමාවන්ට යටත්ව සිදුකර තිබුණි. ඒ අනුව, මෙම ප්‍රසම්පාදනය සම්බන්ධව ප්‍රසම්පාදන මාර්ගෝපදේශ සංග්‍රහයට අනුකූල නොවූ අතර මෙම ප්‍රසම්පාදන කාර්යයේ දී ප්‍රසම්පාදන මාර්ගෝපදේශ සංග්‍රහයේ 5.4.10 අනුව කාර්ය සාධන සුරක්ෂණයක් හෝ ලබා ගෙන නොතිබුණි.

(ඇ) මාර්ග සංවර්ධන අධිකාරියේ දකුණු පළාත් කාර්යාල සතුව කැබ් රථ 48 ක්, කාර් රථයක් හා ජීප් රථ 02 ක් වශයෙන් වාහන 51 ක් තිබියදී, සලකා බලන කාල සීමාව තුලදී කුලී පදනම් මත කැබ් රථ 10 ක්, වෑන් රථ 13 ක් සහ කාර් රථ 03 ක් වශයෙන් එකතුව වාහන

26 ක් කුලි පදනම මත ලබාගෙන තිබුණි. කාර්මික නිලධාරීන් සහ වැඩ සුපරීක්ෂකයින් සඳහා අධිකාරිය විසින් මෝටර් සයිකල් ලබා දී තිබුණු බැවින් ඔවුන්ට කුලී පදනම මත වාහන ලබාදීමේ අවශ්‍යතාවයක් නොමැති බවනිරීක්ෂණය වූ අතර ඒ අනුව අමතර වශයෙන් දරන ලද රු.මිලියන 23.3 ක් වූ වාහන කුලි වියදම් නිෂ්කාර්ය වියදම් ස්වරූපයක් ගෙන තිබුණි.

(ඇ) 2021 දෙසැම්බර් 31 දිනට කළ වැඩ වටිනාකම රු.මිලියන 1,142.81ක් සඳහා කොන්ත්‍රාත්කරුවන් වෙත රු.මිලියන 1,217.19 ක් ගෙවා තිබීම නිසා කල වැඩ වටිනාකම ඉක්මවා රු.මිලියන 167.92 ක් ගෙවා තිබුණි.කිසිදු ප්‍රගතියක් නොමැති ව්‍යාපෘතීන් සඳහා නිදහස්කර තිබූ වැඩ ආරම්භ කිරීමේ අත්තිකාරම් ද මේ අතර විය.

(ඉ) පළාත්බද මාර්ග සංවර්ධන අධිකාරියට අයත් මාර්ග සංවර්ධනයේදී එකී ආයතනය විසින් ඉඩ නොදෙන වියදම් ඇතුළත් කිරීම, අසාමාන්‍ය ප්‍රමාණයකින් සාමාන්‍ය අපතයන් ඇතුළත් කිරීම, තෝරාගෙන තිබූ මිල අනුපාතයන් දෝෂ සහගත වීම, අවශ්‍යතාවය හඳුනා ගැනීමෙන් තොරව වියදම් ඇස්තමේන්තු කිරීම සහ අවශ්‍යතාවය සපුරාගත හැකි ප්‍රශස්ත ක්‍රමය තෝරා නොගැනීම වැනි හේතූන් නිසා මාතර, පොළොන්නරුව, මහනුවර සහ නුවර එළිය දිස්ත්‍රික්ක වලට අයත් මාර්ග කිහිපයක ඇස්තමේන්තු රු.මිලියන 326.2 කින් අධිගණනය වී තිබුණි. මෙලෙස වැරදි ඇස්තමේන්තු මත පදනම්ව කොන්ත්‍රාත්කරුවන්ට ගෙවීම් කිරීම නිසා රු.මිලියන 61 ක් වැඩිපුර ගෙවා තිබූ අවස්ථා කිහිපයක් විගණනයේදී නිරීක්ෂණය විය. එසේම, ඇස්තමේන්තුවේ සඳහන් වැඩ විෂයයන් නිසි පරිදි ඉටු නොකිරීම සහ නියමිත ප්‍රමිතියෙන් තොරව ABC සහ ඇස්පෝල්ට් ඇතිරීම වැනි තත්වයන් තිබියදී මාතර දිස්ත්‍රික්කය තුළ ක්‍රියාත්මක ව්‍යාපෘති කිහිපයක් වෙනුවෙන් කොන්ත්‍රාත්කරුවන්ට රු.මිලියන 14.2 ක් වැඩිපුර ගෙවා තිබුණි.

2.3 වෙනත් කරුණු

(අ) අධිකාරිය සතු පරිපාලිත සමාගම් අතුරින් අධීවේගී මාර්ග ප්‍රවාහන සමාගම 2016 සිට මූල්‍ය ප්‍රකාශන විගණනය වෙත ඉදිරිපත් කර නොතිබුණි. අධිකාරිය සතු පරිපාලිත සමාගම් අතුරින් මහ නැගුම ඉදිකිරීම් හා යන්ත්‍රෝපකරණ සමාගමේ මූල්‍ය ප්‍රකාශන පිළිබඳව විගණන මතය 2017 වර්ෂයේ සිට ව්‍යාවනය වෙමින් පවතින අතර, මහ නැගුම උපදේශන සහ ව්‍යාපෘති කළමනාකරණ සේවා සමාගමේ විගණන මතය ද 2019 වර්ෂයේ ව්‍යාවනය විය. එසේම, 2007 අංක 07 දරන සමාගම් පනතේ 133 වගන්තිය ප්‍රකාරව, සමාගමක් විසින් සෑම වර්ෂයකට වරක්ම කොටස්කරුවන්ගේ වාර්ෂික මහා සභා රැස්වීම පැවැත්විය යුතු වුවත්, අධිකාරියට අයත් සියලු සමාගම් ඊට අනුකූලව කටයුතු කර නොතිබුණි. තවද, සමාගම්වල මූල්‍ය, පරිපාලන, මිළදී ගැනීම හා මෙහෙයුම් කටයුතු

සම්බන්ධයෙන් විධිමත් හා ඒකාකාරී බවක් ඇතිකරනු පිණිස අදාල ක්ෂේත්‍ර සම්බන්ධයෙන් ආකෘතිකමය රාමුවක් හෝ මාර්ගෝපදේශයක් හඳුන්වා දීමට අධිකාරිය හා රේඛීය අමාත්‍යාංශය මැදිහත්ව කටයුතු කර නොතිබූ අතර ඒ ඒ සමාගම්වල අධ්‍යක්ෂ මණ්ඩල තීරණ මතම කටයුතු කර තිබුණි.

(ආ) සමාලෝචිත වර්ෂයේ දෙසැම්බර් 31 දිනට නොපියවා ඇති සමස්ථ ණය ශේෂය රු.මිලියන 359,479 ක් වූ අතර එය රු.මිලියන 268,313 ක බැංකු ණය වලින් හා රු.මිලියන 91,166ක ණයකර වලින් සමන්විත විය. මාර්ග කිලෝමීටර් 100,000 වැඩසටහන, මධ්‍යම අධිවේගී මාර්ගය ඉදිකිරීම, මහා මාර්ග පුළුල් කිරීම හා වැඩිදියුණු කිරීම හා අධිකාරියේ කාරක ප්‍රාග්ධන අවශ්‍යතා වෙනුවෙන් මෙම ණය ලබාගෙන තිබූ අතර ණය සඳහා පොළිය බර තබන ලද ප්‍රාථමික ණය අනුපාතයට උපරිම වශයෙන් සියයට 2 සිට 2.8 වැනි පරාසයක අගයක් එකතුකොට පොළිය නියම කොට තිබුණි. මෙම සියලු ණය ලබා ගැනීමේ දී භාණ්ඩාගාර ඇපකර නිකුත් කර තිබුණි.

(ඇ) කොළඹ කටුනායක අධිවේගී මාර්ගයේ ඉලෙක්ට්‍රොනික ගාස්තු අය කිරීම සඳහා 2014 දෙසැම්බර් 18 දින මාර්ග සංවර්ධන අධිකාරිය හා ලංකා බැංකුව සමඟ එළඹී ගිවිසුමේ ගිවිසුම්ගත කාලය 2020 ජුනි 08 දිනෙන් අවසන් වී තිබුණ ද, නව ගිවිසුමකට එළඹීමට කටයුතු කර නොතිබුණි. එසේම, මෙම අධිවේගී මාර්ගයේ ඉලෙක්ට්‍රොනික ගාස්තු ගෙවීමේ ක්‍රමය භාවිතා කරන්නන් දිරිමත් කිරීමට අයකරන ගාස්තු වලින් සියයට 10 ක වට්ටමක් ඉලෙක්ට්‍රොනික ගාස්තු ගෙවීමේ ක්‍රමයට මාරු වන මුල් මාස 06 ක කාලයක් දක්වා පමණක් එම භාවිතකරුවන්ට ලබා දීමට අවසර ලබා දී තිබුණි. මාස 06 ඉකුත් වීමෙන් පසු ද මෙම සියයට 10 වට්ටම ලබා දීම හේතුවෙන් 2021 සහ 2020 වර්ෂ වලට අදාළව පිළිවෙළින් රු.මිලියන 29 ක් සහ රු. මිලියන 27 ක් වශයෙන් එකතුව රු.මිලියන 56 ක් අධිකාරියට අහිමිව තිබුණි. තවද, දෛනිකව එකතු වන ඉලෙක්ට්‍රොනික ගාස්තු අධිකාරියේ ආදායම් රැස්කිරීමේ ගිණුමට ප්‍රේෂණය වීමේ කාල ප්‍රමාදයක් ද පැවතුණි.

(ඈ) මාර්ග සංවර්ධන අධිකාරියේ ප්‍රධාන අංශ වශයෙන් සැලකෙන පාලන අංශය, මුදල් අංශය, පුහුණු අංශය, ප්‍රසම්පාදන අංශය, ඉඩම් අංශය යනාදී උපකාරක අංශ හා ඉදිකිරීම් අංශය, නඩත්තු හා කළමනාකරණ අංශය, සැලසුම් අංශය, මහා මාර්ග සැලසුම් අංශය, පාලම් නිර්මාණ අංශය යනාදී මෙහෙයුම් අංශ වලින් පාලම් නිර්මාණ අංශය හැර අනෙකුත් කිසිදු අංශයක් එකී අංශවල පරිපාලන හා මෙහෙයුම් කටයුතු වලට අදාල අත්පොත් සකස් කර නොතිබුණි. අධිකාරියේ අංශවල අපේක්ෂිත අරමුණු ඉටුකර ගැනීම සහතික කරනුවස්

කාර්සාධන දර්ශක හඳුනාගෙන නොතිබූ අතර කිසිදු අංශයක කාර්ය සාධන ඇගයීම් කමිටුවක් හෝ පිහිටුවා නොතිබුණි.

(ඉ) 2021 දෙසැම්බර් 31 දිනට අනුමත කාර්ය මණ්ඩලය 11,277 ක් වූ අතර සමස්ථ පුරප්පාඩු සංඛ්‍යාව 1,044 ක් ද, නිළධාරීන් 630 දෙනෙකුගේ අතිරික්තයක් ද පැවතුණි. මෙයින් ජ්‍යෙෂ්ඨ කළමනාකරණ මට්ටමේ තනතුරු 26 ක පුරප්පාඩු පැවති අතර, තනතුරු 04 ක අතිරික්තයන් ද පැවතුණි. 2021 වර්ෂයේ සේවක වැටුප් හා චේතන වෙනුවෙන් අධිකාරිය දරා තිබූ සමස්ථ වියදම රු.මිලියන 11,877 ක් වූ අතර, ඒ සඳහා මහා භාණ්ඩාගාරයෙන් ලබා දී තිබූ ප්‍රතිපාදන වලට අමතරව රු.මිලියන 4,129 ක් අධිකාරියේ අරමුදල් වලින් වැටුප් හා චේතන සඳහා දරා තිබුණි. අධිකාරිය සඳහා මේ දක්වා කළමනාකරණ සේවා දෙපාර්තමේන්තුව අනුමත කරන ලද බඳවාගැනීමේ පටිපාටියක් නොතිබුණි.

(ඊ) එවකට ආර්ථික සංවර්ධන අමාත්‍යාංශය විසින් 2012/13 වර්ෂවල දකුණු පළාත තුළ ඉටු කරන ලද ව්‍යාපෘති වෙනුවෙන් අධිකාරිය වෙත ආර්ථික සංවර්ධන අමාත්‍යාංශය, ආයෝජන මණ්ඩලය වෙතින් පිළිවෙලින් රු.මිලියන 306 ක්, රු.මිලියන 124 ක් තවදුරටත් අය වී නොතිබුණ නමුත්, එම ණය අයකර ගැනීමට අවශ්‍ය පියවර අධිකාරිය විසින් ගෙන නොතිබුණි.

(උ) අධිකාරිය සතු පිරිවැය රු.මිලියන 122 ක් වූ වාහන 45 ක් සහ කිසිදු පිරිවැයක් සඳහන් නොවූ වාහන 15 ක් වශයෙන් වාහන 60 ක් පිළිවෙලින් මහා මාර්ග අමාත්‍යාංශයට සහ රාජ්‍ය අමාත්‍යාංශය වෙත හා ජනාධිපති ලේකම් කාර්යාලය වෙත ලබා දී තිබුණි. තවද අධිවේගී මාර්ග මෙහෙයුම්, නඩත්තු හා කළමනාකරණ අංශය අධිවේගී මාර්ග පොලිස් කොට්ඨාශය සඳහා වාහන 49 ක් අධිවේගී මාර්ග පොලිස් කොට්ඨාශය සඳහා ම ලබාදී තිබූ අතර ඒ සඳහා දරණ ලද වියදම රු.මිලියන 189.5 ක් විය. එමෙන්ම මාර්ග සංවර්ධන අධිකාරියට අයත් අධිකාරියේ මූලස්ථාන ගොඩනැගිල්ලේ 72,400 ක වර්ග අඩි ප්‍රමාණයක් මාර්ග අමාත්‍යාංශය සහ රාජ්‍ය අමාත්‍යාංශය භාවිතා කරනු ඊට අදාළ වාර්ෂික ක්ෂය රු.මිලියන 11.87 ක් හා ඒ අනුව පැන නගින විදුලිය, ජලය, දුරකථන, ආරක්ෂක වියදම් හා ඉන්ධන වියදම් ඇතුළු පොදුකාර්ය වියදම්ද අධිකාරිය විසින් දරා තිබුණි.

(ඌ) මාර්ග සංවර්ධන අධිකාරියේ ඉදිකිරීම් අංශය විසින් ඉදිරිපත් කරන ලද තොරතුරු අනුව 2018 වර්ෂයේ සිට 2021 දෙසැම්බර් 31 දින දක්වා මාර්ග පුළුල් කිරීම හා වැඩිදියුණු කිරීම යටතේ රු. මිලියන 36,349 ක පමණ ඇස්තමේන්තුගත වටිනාකමක් සහිත කොන්ත්‍රාත් වැඩ 239 ක් ක්‍රියාත්මක කිරීමට සැලසුම් කර තිබුණි. මේ අතුරින් කොන්ත්‍රාත් 24 ක පමණක් 2021 දෙසැම්බර් 31 දිනට ඉදිකිරීම් කටයුතු අවසන් කර තිබූ අතර එය මුළු කොන්ත්‍රාත් ප්‍රමාණයෙන් සියයට 10 ක් පමණක් වේ. තවත් කොන්ත්‍රාත් 38 ක්

කෙරීගෙන යන තත්වයේ පැවති අතර එක් කොන්ත්‍රාත්තුවක් අරමුදල් නොමැති නිසා අතරමඟ නතර කර තිබුණි. තවත් කොන්ත්‍රාත් 32 ක් ප්‍රතිපාදන නොමැති වීම නිසා ප්‍රදානය කර නොතිබුණි.

(එ) 2021 දෙසැම්බර් 31 දිනට හේතු දැක්වීමකින් තොරව රු.මිලියන 3,360.9 ක් රඳවාගෙන සිට තිබූ අතර රු. මිලියන 99.4 ක් කොන්ත්‍රාත්කරුවන් විසින් ඉල්ලුම් නොකිරීම නිසා රඳවා ගෙන තිබුණි. මාර්ගවල ඉදිකිරීම් ප්‍රමිතිය පිළිබඳ නැවත සමාලෝචනය කර විධිමත් පටිපාටි අනුගමනය කර මෙම ශේෂය ආදායමට ගැනීමට ක්‍රියාකල යුතු වුවත් 2021 දෙසැම්බර් 31 දිනට ගෙවිය යුතු රඳවා ගැනීම් මුදල් වලින් ලියා හැරීමට යෝජනා කරන ලද වටිනාකම රු.මිලියන 81.8 ක් විය. එසේම, 2021 දෙසැම්බර් 31 දිනට ගෙවිය යුතු රඳවා ගැනීම් මුදලින් ඉදිකිරීම් අංශය, පළාත් අධ්‍යක්ෂ කාර්යාල හා ගෙවීම් අංශයට අදාළව සිදු කරන ලද නියැදි පරීක්ෂාවේ දී කොන්ත්‍රාත් සමාගම් 04 කට අදාළව දෝෂ වගකීම් කාලය ද ඉක්මවා ඇති නමුත් ගෙවිය යුතු රඳවා ගැනීම් මුදල රු.මිලියන 95 ක් විය. මේ සම්බන්ධයෙන් නිසි විමර්ශණයක් කිරීමෙන් අනතුරුව ආදායමට ගැනීමට ක්‍රියාකර නොතිබුණි.

(ඒ) 2021 දෙසැම්බර් 31 දිනට කොන්ත්‍රාත් 26 ක වැඩ අවසන් කිරීමේ ඉලක්කගත දිනයන් ඉක්මවා ගොස් තිබූ අතර එකී කොන්ත්‍රාත් වල වැඩ ආරම්භ කිරීමේ අත්තිකාරම් සුරක්ෂණයන්ගේ වලංගු කාලය ද ඉක්මවා ගොස් තිබුණි. 2021 දෙසැම්බර් 31 දිනට එම කොන්ත්‍රාත් වලින් තවදුරටත් අයවිය යුතුව තිබූ අත්තිකාරම් ශේෂය රු.මිලියන 11.93 ක් විය. ඉහත කොන්ත්‍රාත් වලට අදාළ අත්තිකාරම් සුරක්ෂණ වල වලංගු කාලය දීර්ඝ කර ගැනීමට හෝ අවසානාත්මක වශයෙන් අත්තිකාරම් සුරක්ෂණය මුදල් කර ගැනීමට හෝ කළමනාකරණය කටයුතුකර නොතිබුණි. තවද 2021 දෙසැම්බර් 31 දිනට අයවිය යුතු වැඩ ආරම්භ කිරීමේ අත්තිකාරම් ශේෂයෙන් වසර 02 ත්, වසර 05 ත් අතර ශේෂය රු.මිලියන 53.25 ක් හා වසර 05 ඉක්මවා ඇති ශේෂය රු.මිලියන 58.11 ක් විය.

(ඔ) 2021 දෙසැම්බර් 31 දිනට ඉදිකිරීම් අංශයේ විසින් මග නැගුම ඉදිකිරීම් හා යන්ත්‍රෝපකරණ (පුද්) සමාගම හා මගනැගුම උපදේශන හා ව්‍යාපෘති කළමනාකරණ සේවා පුද්ගලික සමාගම වෙත ගෙවිය යුතු රැඳවුම් මුදලින් වසර 5 කට වඩා වැඩි කාලයක සිට නිරවුල් නොවී පවතින මුදල රු. මිලියන 687.9 ක් ද වසර 4-5 ත් අතර කාලයක තුළ පවතින මුදල රු. මිලියන 126.7 ක් විය.

(ඕ) දේශීය බැංකු අරමුදල් සහ ග්‍රාමීය මාර්ග ව්‍යාපෘතිය යටතේ ක්‍රියාත්මක වන ජාතික, ප්‍රාදේශිය හා ග්‍රාමීය වශයෙන් කි.මී 100,000 ක විකල්ප මාර්ග පුනරුත්ථාපනය කිරීමේ

වැඩසටහන යටතේ මෙම වැඩසටහන යටතේ 2021 දෙසැම්බර් 31 දින වන විට කිලෝමීටර් 53,517.39 කින් යුත් ග්‍රාමීය මාර්ග ව්‍යාපෘති 71,468 ක් සංවර්ධනය කිරීම සඳහා හඳුනා ගෙන තිබූ අතර කිලෝමීටර් 24,785.04 ක් වූ මාර්ග ව්‍යාපෘති 16,705 ක් සඳහා ඇස්තමේන්තු සකස් කර තිබුණි. කොන්ත්‍රාත් වටිනාකම රු.බිලියන 356.44 ක් වූ මාර්ග ව්‍යාපෘති 11,595 ක් සඳහා කොන්ත්‍රාත් ප්‍රදානය කිරීම් අවසන්ව තිබුණි. එදිනට මෙම වැඩසටහන වෙනුවෙන් රු.බිලියන 92.25 ක වියදමක් දරා තිබූ අතර, රු.බිලියන 15.65 ක බිල්පත් සඳහා තවදුරටත් ගෙවිය යුතුව තිබුණි. මෙම වාර්තාවේ දිනට නොපියවා ඇති බිල්පත් වටිනාකම රු.මිලියන 52,500 ක් වූ අතර මෙයින් රු.මිලියන 25,491ක් මාස 3 ක් ඉක්මවා තිබුණි.

(ක) මෙම වැඩසටහන යටතේ දිස්ත්‍රික්ක 04 කට අදාළව කාර්යසාධනක් නොමැති කොන්ත්‍රාත්කරුවන් 11 දෙනකු ව්‍යාපෘතිය විසින් හඳුනාගෙන තිබුණි. ඒ අනුව ඔවුන් විසින් අතහැර දමන ලද ව්‍යාපෘති සංඛ්‍යාව 18 ක් වූ අතර එහි කොන්ත්‍රාත් වටිනාකම රු.මිලියන 593.88 ක් විය. එම කොන්ත්‍රාත්කරුවන් වෙත ප්‍රදානය කරන ලද කොන්ත්‍රාත් අතුරින් කොන්ත්‍රාත් වටිනාකම රු.මිලියන 147.45 ක් වූ කොන්ත්‍රාත් 04 ක් උක්ත කොන්ත්‍රාත්කරුවන් විසින් ආරම්භ කර නොතිබුණි. වරින් වර මුහුණ දෙන මෙවැනි තත්ත්වයන් වළකා ගැනීම සඳහා අපේක්ෂික කාර්යසාධනයක් පෙන්නුම් නොකරන කොන්ත්‍රාත්කරුවන්ව අසාධු ලේඛනගත කිරීම සඳහා අවශ්‍ය කරන නෛතික රාමුවක් සකස් කිරීමට කළමනාකරණ අවධාරණය මෙතෙක් යොමුව නොතිබුණි.

(ඛ) ඉහත ව්‍යාපෘතියට අදාළව සකස්කරන ලද ඉංජිනේරු ඇස්තමේන්තු සංශෝධනය කිරීම හා නිවැරදි කිරීම සිදුකරන ලෙස සියලු පළාත් අධ්‍යක්ෂකවරු, ප්‍රධාන ඉංජිනේරුවරු හා විධායක ඉංජිනේරුවරු වෙත අදාල ව්‍යාපෘති අධ්‍යක්ෂක විසින් දන්වා තිබුණද, විගණිත දිනය වනවිටත් එකතුව රු.මිලියන 15,690.5 ක් වටිනා ව්‍යාපෘති 146 ක් සම්බන්ධයෙන් අදාල නිවැරදි කිරීම් සිදුව නොමැති අතර ඒ අනුව අනාගතයේදී කොන්ත්‍රාත්කරුවන්ට සම්මත අනුපාතයට වඩා වැඩි මිල අනුපාතයක් ගෙවීමෙන් රජයට විශාල මූල්‍ය පාඩුවක් සිදුවීමට අවස්ථා පවතින බව නිරීක්ෂණය විය.

(ග) මෙම වැඩසටහන යටතේ වූ මාර්ග සංවර්ධනයේ දී මහා මාර්ග සංවර්ධනය සඳහා භාවිතා කරනු ලබන මහා මාර්ග රේට උපලේඛනයන් (HSR) සහ පිරිවිතරයන් භාවිතා කර තිබීම ආර්ථික සහ ඵලදායී නොවන බැවින් ග්‍රාමීය මාර්ග සඳහාම වූ පිරිවිතරයන් සකස් කර අනුගමනය කළ යුතුව තිබුණි.

(ඍ) ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ප්‍රසම්පාදන කාර්ය සංග්‍රහය ප්‍රකාරව ලංසු කැඳවීමේ ලේඛනයේ ප්‍රතිපාදන සලසා නොමැති උප කොන්ත්‍රාත් සඳහා ඉඩදීම නීත්‍යානුකූල නොවූව ද, රු.මිලියන 165.9 ක වටිනාකමක් මත ගිවිසුම්ගතව තිබූ පොළොන්නරුව දිස්ත්‍රික්කය තුළ ක්‍රියාත්මක ව්‍යාපෘතියක් වෙනත් පුද්ගලික සමාගමක් වෙත උප කොන්ත්‍රාත් දී තිබුණි. මාතර දිස්ත්‍රික්කය තුළ ක්‍රියාත්මක රු. මිලියන 234.7 ක ඇස්තමේන්තුගත වටිනාකමක් සහිත ව්‍යාපෘතියක, ව්‍යාපෘති කාලය අවසන් වී දින 290 ක් ඉක්මවා තිබුණද, කොන්ත්‍රාත්තුවෙන් සියයට 76.58 ක් තවදුරටත් ඉටුකිරීමට ඉතිරිව ඇති බැවින් ප්‍රමාද හා දඩ අයකර ගතයුතුව තිබුණි. එසේම, රජයේ ප්‍රසම්පාදන මාර්ගෝපදේශ සංග්‍රහයේ 5.4.8 (ආ) ප්‍රකාරව, කාර්යසාධන සුරක්ෂණය වැඩ නිම කිරීමට අපේක්ෂිත දිනයෙන් පසුව දින 28 ක් දක්වා වූ කාලයකට වලංගු විය යුතු වුව ද, පොළොන්නරුව දිස්ත්‍රික්කය තුළ ක්‍රියාත්මක ව්‍යාපෘති කිහිපයක් සම්බන්ධයෙන් එසේ කටයුතු කර නොතිබුණි. එසේම, මාතර දිස්ත්‍රික්කය තුළ ක්‍රියාත්මක ව්‍යාපෘතියක් සඳහා ලබාදී තිබූ තිබූ රු.මිලියන 8.18 ක කාර්යසාධන බැඳුම්කරය කල් ඉකුත් වී තිබුණද, එය අලුත් කර ගැනීමට කටයුතු කර නොතිබුණි.

ඩබ්ලිව්.පී.සී. වික්‍රමරත්න
විගණකාධිපති

මාර්ග සංවර්ධන අධිකාරියේ 2021 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය ප්‍රකාශන සහ වෙනත් නෛතික හා නියාමන අවශ්‍යතා පිළිබඳව 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 12 වන වගන්තිය ප්‍රකාරව විගණකාධිපති වාර්තාවේ සඳහන් කරුණු සඳහා ගත් ක්‍රියාමාර්ග සහ වර්තමාන තත්ත්වය

1. මූල්‍ය ප්‍රකාශන

1.2 තත්ත්වාගණනය කල මතය සඳහා පදනම

ඡේද අංකය	විගණන ඡේදය	පිළිතුරු
(අ)	අධිකාරියට අයත් A සහ B ශ්‍රේණි වලට අදාල මහා මාර්ගයන්ගේ මුළු දුර ප්‍රමාණය කිලෝමීටර් 12,225 ක් වුවත් ජාතික මහාමාර්ග ප්‍රාග්ධනිත කිරීම ආරම්භ කරන ලද 2018 වර්ෂයේ සිට 2021 දෙසැම්බර් 31 දිනට මාර්ග 144 කට අයත් කිලෝමීටර් 3,179 ක් පමණක් ප්‍රාග්ධනිත කර තිබුණි. ඒ අනුව, මාර්ග සංවර්ධන අධිකාරිය සතු A සහ B ශ්‍රේණි වලට අයත් කිලෝමීටර් 9,046 ක දුර ප්‍රමාණය සඳහා වූ වටිනාකම මූල්‍ය තත්ත්ව ප්‍රකාශනයෙන් තවදුරටත් බැහැර වී තිබෙන අතර මෙය සමස්ථ මාර්ග පද්ධතියේ දුර ප්‍රමාණයෙන් සියයට 74 ක ප්‍රතිශතයකි. එසේම, 2021 දෙසැම්බර් 31 දිනට අධිකාරියේ මූල්‍ය ප්‍රකාශනවල දැක්වෙන රු. මිලියන 605,646 ක්වූ අධිවේගී මාර්ග කිලෝ මීටර් 271 ක පිරිවැය රේඛීය අමාත්‍යාංශය මගින් දරා තිබූ අතර එම මුළු ඉදිකිරීමේ වටිනාකම අධිවේගී මාර්ග ලෙස ප්‍රාග්ධනිත කර තිබුණි. එසේ වුවත් එම වත්කම් වලට ප්‍රාග්ධනිත කිරීම සඳහා භාණ්ඩාගාරයේ අනුමැතිය ලබාගැනීමට අදාල උපයෝගී ලියවිලි විගණනය වෙත ඉදිරිපත් නොකෙරුණි. එසේම, ශ්‍රී ලංකා රාජ්‍ය අංශ ගිණුම්කරණ ප්‍රමිත අංක 07 හි නියමයන්ට පටහැනිව එකිනෙකට වෙනස් වූ ඵලදායී ජීවිත කාලයන් සහිත අධිවේගී මාර්ග වල විවිධ උප කොටස් වෘත්තීමය තක්සේරුවක් මත ක්ෂය අනුපාත තීරණය කර ක්ෂය කිරීමට කටයුතු කර නොතිබුණි. ඒ අනුව එම වත්කම්වල සැබෑ මූල්‍ය තත්ත්වය මූල්‍ය ප්‍රකාශණ වලින් නිරූපණය වී නොතිබුණි.	මාර්ග ප්‍රාග්ධනිත කිරීම සම්බන්ධයෙන් විශේෂ කමිටු 02 ක් සහ TCAM ව්‍යාපෘතිය මඟින් හඳුන්වා දීමට නියමිත ක්‍රමවේදයක් 2022 වර්ෂයේ සිට ක්‍රියාත්මක කිරීමට නියමිතය. 2021 – 2023 වර්ෂ තුළ දී මාර්ග, ඉඩම් හා ගොඩනැගිලි තක්සේරු කර ප්‍රාග්ධනිත කිරීම සඳහා සකස් කළ ක්‍රියාකාරී සැලැස්මට අධ්‍යක්ෂ මණ්ඩල අනුමැතිය ලැබී ඇත. යෝජිත ක්‍රියාකාරී සැලැස්මට අනුව ප්‍රවාහන සම්බන්ධතා හා වත්කම් කළමනාකරණ ව්‍යාපෘතිය (TCAMP) යටතේ පහත සඳහන් වැඩ අයිතම දැනට පවතින සහ යෝජිත ක්‍රියාමාර්ග ලෙස හඳුනාගෙන ඇති අතර එම වැඩ අයිතම වල වර්තමාන තත්ත්වය පහත පරිදි වේ. (i) මාර්ග සංවර්ධන අධිකාරියේ මාර්ග වත්කම් තක්සේරු කිරීම සඳහා උපදේශන සේවාවක් ගිවිසුම් ප්‍රදානය කර එහි කාර්යයන් අරඹා ඇත. ආරම්භක වර්තාව සහ SLRAMS සමාලෝචන වාර්තාව සඳහා RDA හි අනුමැතිය ලැබී ඇත. (ii) MFNSV ඡායාරූප වලින් මාර්ග උපාංග හඳුනා ගැනීම සඳහා පිරිනමන ලද සේවා කොන්ත්‍රාත්තුව නිම කර ඇත. (iii) බෝක්කු/පැති කාණු / වෙනත් ව්‍යුහ තොරතුරු රැස් කිරීම සඳහා වූ ජංගම යෙදවුම සැකසීමේ කටයුතු අවසන් අවස්ථාවේ පවතී. (iv) SLRAMS හි වත්කම් තක්සේරු මොඩියුලය නිර්මාණය කිරීමට අභිලාශ කැඳවීම සඳහා තාක්ෂණික ඇගයීම් කමිටුවේ අවසාන නියමයන් ඉදිරිපත් කර ඇත. (v) බිම විනිවිදීමේ රේඩාර් යන්ත්‍රය (GPR) ප්‍රසම්පාදනයට තාක්ෂණික පිරිවිතර අවසන් කර ඇත. මෙම සවිස්තරාත්මක සැලැස්ම සඳහා මාර්ග, ගොඩනැගිලි, ඉඩම් හා රසායනාගාර යන්ත්‍ර හා උපකරණ ප්‍රාග්ධනිත කිරීමට අයත් වේ.අධ්‍යක්ෂ මණ්ඩලය අනුමත කරන ලද සැලසුම් ක්‍රියාත්මක කිරීමේ වගකීම SOR යටතේ යෝජනා කර ඇති මාර්ග වත්කම් කළමනාකරණ අංශයට පැවරෙන බවත්, වත්මන් තත්ත්වය යටතේ මාර්ග තක්සේරු කිරීමට අදාල තොරතුරු සත්‍යාපනය කිරීම, සකස් කිරීම හා ඉදිරිපත් කිරීමට අධ්‍යක්ෂ (සැලසුම්) බැදී සිටින බවත්, එසේම අධ්‍යක්ෂ මූල්‍ය, අධ්‍යක්ෂ ඉඩම් සහ අධ්‍යක්ෂ පර්යේෂණ හා සංවර්ධන සමස්ථ ප්‍රගතිය සකස් කිරීම සඳහා ඔවුන්ගේ වත්කම්වලට අදාල තොරතුරු අධ්‍යක්ෂ (සැලසුම්) වෙත ලබාදීමට බැදී සිටින බවත් දක්වා ඇත.

		රාජ්‍ය ප්‍රදාන ගිණුමට බැර කිරීම සම්බන්ධයෙන් මුදල් අමාත්‍යාංශයේ රාජ්‍ය ව්‍යාපාර දෙපාර්තමේන්තුවේ අධ්‍යක්ෂ ජනරාල්වරයා විසින් නිකුත් කරන ලද ලිපි අංක PEO/I/RDA/3/11(i) සහ 2021.05.07 දරණ ලිපිය ප්‍රමාණවත් නොවන බව විගණක විසින් දැන්වීමෙන් අනතුරුව නැවතත් අධිකාරී බලය පැවරීමේ ලිපියක් නිකුත් කරන ලෙස මහා මාර්ග අමාත්‍යාංශයේ ලේකම් විසින් මහා භාණ්ඩාගාරයේ රාජ්‍ය ව්‍යාපාර දෙපාර්තමේන්තුවේ අධ්‍යක්ෂ ජනරාල්වරයා වෙත යොමු අංක MOH/ACC/13/2022/02 සහ 2022.04.21 දිනැති ලිපිය මගින් ඉල්ලීම් කරන ලදී. ඊට පිළිතුරු වශයෙන් රාජ්‍ය ව්‍යාපාර දෙපාර්තමේන්තුවෙන් මෑතකදී ලද අංක PED/I/RDA/B/11(i) සහ 2022.07.25 දිනැති ලිපිය ලැබී ඇත. ඒ අනුව විදේශ ණය වලින් මූල්‍යනය කර ඉදිකරන ලද අධිවේගී මාර්ග හා අනෙකුත් ව්‍යාපෘති නිම වීමෙන් පසු අදාල රේඛීය අමාත්‍යාංශය විසින් එම වත්කම් මාර්ග සංවර්ධන අධිකාරියට නීත්‍යානුකූලව පැවරීම සිදුකල යුතු බව සඳහන් කර ඇත. යෝජිත TCAM ව්‍යාපෘතිය යටතේ අදාල මාර්ග වත්කම් තක්සේරු කිරීමේදී අදාල ක්ෂය අනුපාත සඳහාද වෘත්තීයමය තක්සේරුවක් ලබා ගැනීම සඳහා උපදේශන සේවාවක් සඳහා ගිවිසුම් ප්‍රදානය කර ඇති අතර උපදේශකවරුන් දැනටමත් වැඩ කටයුතු ආරම්භ කර ඇත.
(ආ)	සමාලෝචිත වර්ෂයේදී, අධිකාරියේ මෙහෙයුම් ප්‍රතිඵලය රු.මිලියන 53,389 ක් වීම සඳහා අධිකාරිය වෙත රේඛීය අමාත්‍යාංශය හරහා මාර්ග කිලෝමීටර් 100,000 වැඩ සටහන සඳහා ලද රු.මිලියන 47,498 ක් සහ අත්පත් කරගත් ඉඩම් සඳහා ගෙවිය යුතු ව තිබූ වන්දි වගකීම් නිරවුල් කිරීමට හා නව වන්දි ගෙවීම් සඳහා සමාලෝචිත වර්ෂයේ දී අධිකාරියට ලද රු.මිලියන 4,387 ක් ප්‍රධාන වශයෙන් හේතු වී තිබුණි.මෙම මුදල් කෙරීගෙන යන වැඩතුල,වැඩ ආරම්භ කිරීමේ අත්තිකාරම් තුල හා ගෙවිය යුතු වන්දි ගිණුම් තුල අඩංගු වීම නිසා සමාලෝචිත වර්ෂයේ මෙහෙයුම් ප්‍රතිඵලය ඉහල යාමට බලපෑමක් වී තිබුණි.තවද මෙම මාර්ග කිලෝමීටර් 100,000 වැඩ සටහන යටතේ අධිකාරියට අයත් නොවන මාර්ග ඉදිකිරීම සඳහා සමාලෝචිත වර්ෂයේ දෙසැම්බර් 31 දින දක්වා දරණ ලද රු. මිලියන 82,692ක් ඒ ඒ වර්ෂයේ වියදම් ලෙස ලියා නොහැර කෙරීගෙන යනවැඩ යටතේ නිරූපණය කර තිබුණි.	කි.මී. 100,000 යටතේ ජාතික මහාමාර්ග වලට අයත් නොවන මාර්ග පූර්ණ වශයෙන් නිම කිරීම සම්බන්ධව ගිණුම්ගත කිරීමට අදාල ලියවිලි කිසිවක් කි.මී. 100,000 ක විකල්ප මාර්ග පුනරුත්ථාපනය කිරීමේ ව්‍යාපෘතියේ ගිණුම් අංශයට ලැබී නොතිබූ බැවින් 2021 දෙසැම්බර් 31 දින වන විට සියළු මාර්ග (Working Progress) කෙරීගෙන යන වැඩ යටතේ ගිණුම්ගත කරන ලදී. 2022 වසරේ අවසන් ගිණුම් සැකසීමේදී වැඩ අවසන් වූ අධිකාරියට අයත් මාර්ග ප්‍රාග්ධනිත කිරීමටත්, අධිකාරියට අයත් නොවන මාර්ග වලට අදාල වියදම පෙර වර්ෂයනට බලපාන අයුරින් වියදමට එරෙහිව කපා හැරීමටත් තීරණය කර ඇත. එමෙන්ම මේ සම්බන්ධව රජයේ විගණන අංශය සමග සාකච්ඡා කරන ලද අතර පවත්නා ගිණුම් ක්‍රමවේදය සම්බන්ධයෙන් එකඟතාවය පල කර ඇත.
(ඇ)	ශ්‍රී ලංකා රාජ්‍ය ගිණුම්කරණ ප්‍රමිත අංක 01 හි සඳහන් නියමයන් ට පටහැනිව වගකීම් කාලසීමාව 2022 වර්ෂයේ හෝ ඊට පෙර අවසන් වීමට නියමිත වූ ව්‍යාපෘති 54 කට අදාළ රු.මිලියන 21.37 ක රඳවා ගැනීමේ මුදල් සහ වර්ෂයේදී පියවීමට නියමිත	ජංගම වත්කම්/වගකීම් සහ ජංගම නොවන වත්කම්/වගකීම් සම්බන්ධයෙන් පැහැදිලි උපදෙස් අවසන් ගිණුම් වාර්තා චක්‍රලේඛය මගින් අදාල නිළධාරීන් වෙත ලබා දී ඇත. 2022-12-31 දිනට ගෙවිය යුතු රදවා ගැනීම් නිදහස් කිරීමට නියමිත සහ අයකර

	රු.මිලියන 659 ක ගෙවිය යුතු ණය වාරික ජංගම නොවන වගකීම් යටතේ මූල්‍ය ප්‍රකාශන වල පෙන්වා තිබුණි. එසේම ඉදිරි වර්ෂයේදී පියවීමට නියමිත රු.මිලියන 51.53 ක් වූ වැඩ ආරම්භ කිරීමේ අත්තිකාරම් සහ ජංගම නොවන වත්කම් යටතේද අධිකාරිය මගින් ක්‍රියාත්මක කරන ලද කි.මී 100,000 මාර්ග ව්‍යාපෘතිය යටතේ වූ ගෙවිය යුතු රඳවා ගැනීමේ මුදල් වූ රු.මිලියන 3,671 න් සියයට 60 ක් ජංගම වගකීම් ලෙසත් ඉතිරි සියයට 40 ජංගම නොවන වගකීම් ලෙසත් එම ව්‍යාපෘතියට අදාළ වැඩ ආරම්භ කිරීමේ අත්තිකාරම් මුදල් වූ රු. මිලියන 13,347.5 න් පිළිවෙලින් සියයට 75 ක් හා සියයට 25 ක් ජංගම හා ජංගම නොවන වත්කම් ලෙසත් පදනම්කින් තොරව බෙදා වෙන් කර මූල්‍ය ප්‍රකාශන වල දක්වා තිබුණි.	ගැනීමට නියමිත වැඩ ආරම්භ කිරීමේ අත්තිකාරම් අයකර ගතයුතු කාල රාමුව අනුව වර්ගීකරණය කිරීම සිදු කරනු ලැබේ. 2022 වර්ෂයේ සම්පත් බැංකු ණය ගිවිසුම ප්‍රතිව්‍යුහගත කිරීමේ අදහසක් අධිකාරියට තිබූ බැවින් 2022 වර්ෂයට ගෙවිය යුතු ණය වාරිකය ජංගම වගක්ම වලින් බැහැරව පෙන්නුම් කරන ලදී.
(ඇ)	අධිකාරියට අයත් පිරිවැය රු. මිලියන 394.9 ක් වූ වාහන 155 ක් හා පිරිවැය රු.මිලියන 56.6 ක් වූ ගොඩනැගිලි 2021 ජනවාරි 01 දින වන විට සම්පූර්ණයෙන්ම ක්ෂය කර තිබූණි. එම වාහන හා ගොඩනැගිලි තවදුරටත් අධිකාරිය භාවිතා කරමින් පැවති නමුත් රාජ්‍ය අංශ ගිණුම්කරණ ප්‍රමිත අංක 07 ප්‍රකාරව එම වත්කම් පිළිබඳ මූල්‍ය ප්‍රකාශනවල අවශ්‍ය අනාවරණයන් කර නොතිබුණු අතර රාජ්‍ය අංශ ගිණුම්කරණ ප්‍රමිත අංක 03 ප්‍රකාරව එම වත්කම්වල ඵලදායී ජීවිත කාලය පිළිබඳව වූ ඇස්තමේන්තුගත දෝෂය නිවැරදි කර ගිණුම්වල ගැලපීමට ද කටයුතු කර නොතිබුණි.	මෙම වාහන 155 හි සාරාංශය පහත දැක් වේ. අපහරිත 48, යුධ සමයේ පැහැර ගත්-05, යාන්ත්‍රික අංශයේ සඳහන් නොවූ-22, පිහිටීම සත්‍යාපනය නොවූ-12, සත්‍යාපනය වූ තක්සේරු කලයුතු-64, ව්‍යාපෘති වලින් හාර නොදුන්-04 ලෙස වේ. මෙම වාහන සඳහා තක්සේරු තොරතුරු යාන්ත්‍රික අංශයෙන් ලැබී ඇති අතර ලද තොරතුරු පරීක්ෂා කර අදාල ගැලපුම් ගිණුම්වල සිදු කරනු ලැබේ. ගොඩනැගිලි ප්‍රත්‍යාගණනය කිරීම සඳහා තොරතුරු තක්සේරු දෙපාර්තමේන්තුව වෙත දැනටමත් ලබා දී ඇති අතර තක්සේරු දෙපාර්තමේන්තුවෙන් තක්සේරු කර 2022.11.30 දින වන විට අධිකාරිය වෙත ලද රු. මිලියන 168.86 ක ගොඩනැගිලි වලට අදාල ගිණුම් ගැලපුම් ගිණුම්වල සිදු කර ඇත.
(ඉ)	ශ්‍රී ලංකා රාජ්‍ය අංශ ගිණුම්කරණ ප්‍රමිත අංක 07 හි වත්කම් හඳුනා ගැනීමේ මූලධර්මයන්ට අනුව වත්කමක් ලෙස හඳුනා ගෙන ප්‍රාග්ධනිත කළ යුතුව තිබුණු , පානදුර දක්වා වූ මුහුදුබඩ මාර්ගය ඉදිකිරීම සඳහා දරා තිබුණු රු.මිලියන 556.8 ක මුදල සමාලෝචිත වර්ෂයේ අයභාර වියදමක් ලෙස සලකා ආදායමෙන් කපා හැර තිබුණි. එම නිසා සමාලෝචිත වර්ෂයේ අනිරික්තය එම ප්‍රමාණයෙන් අඩුවෙන් මූල්‍ය ප්‍රකාශන වල දැක්වුණි.	පානදුර දක්වා මුහුදුබඩ මාර්ග දිගුව, 2022 ඔක්තොම්බර් මස 105/J10 සහ 2022 නොවැම්බර් මස 63/J11 යන ජර්නල් මගින් මෙම මාර්ගයේ පිරිවැය ප්‍රාග්ධනිත කිරීමට පියවර ගෙන ඇත.
(ඊ)	අධිකාරියේ වත්කම් ලේඛණයේ වටිනාකමක් සඳහන් නොවූ මෝටර් වාහන 258 ක් පැවති අතර එම මෝටර් වාහන ප්‍රත්‍යාගණනය කර මූල්‍ය ප්‍රකාශනවල දැක්වීමට කටයුතු කර නොතිබුණි. තවද 2022 / 2023 වර්ෂ සඳහා මාර්ග සංවර්ධන අධිකාරිය සතු වාහන රක්ෂණය කිරීමේ දී රු.මිලියන 492.95 ක වියදමක් දරා රක්ෂණය කරන ලද වාහන 54ක්	2022/2023 වර්ෂ සඳහා මාර්ග සංවර්ධන අධිකාරිය සතු වාහන රක්ෂණය කිරීමේදී අධිකාරියේ වත්කම් ලේඛනය තුළ ඇතුළත්ව නොතිබූ ලෙස දක්වා ඇති වාහන 54 ම යාන්ත්‍රික අංශයේ වාහන ලැයිස්තුවේ අන්තර්ගතව ඇති අතර එම වාහන මේ වන විට මාර්ග සංවර්ධන අධිකාරියේ විවිධ අංශවල සේවයේ යොදවා ඇත. යාන්ත්‍රික අංශයෙන් තොරතුරු කැඳවා එම තොරතුරු පරීක්ෂා කර මෙම වාහන 54 ට අදාලව ගිණුම් ගැලපුම් 2022 දෙසැම්බර් මස

	අධිකාරියේ වාහන පිළිබඳ වත්කම් ලේඛනය තුළ ඇතුලත්ව නොතිබුණි.	ජර්නල් සටහන් අංක 314,315,316 සහ 317/J12 මඟින් සිදු කර ඇත.
(උ)	මාර්ග සංවර්ධන අධිකාරිය විසින් මාර්ග සංවර්ධන කටයුතු වලදී අවතැන් වූවන් කැඩත පදිංචි කිරීම සඳහා මිල දී ගෙන 2016 සහ 2017 වර්ෂ වලදී ලියාපදිංචි කරන ලද රු.මිලියන 34 ක් පිරිවැය වූ අක්කර 07 ක භූමි ප්‍රමාණයක් සහිත ඉඩම් කැබලි 04 ක් හා පිටත වටරවුම් අධිවේගී මාර්ග ව්‍යාපෘති - II අදියර විසින් අධිකාරිය වෙත භාර දී තිබෙන රු.මිලියන 8.2 ක් වටිනා ඉඩම් අධිකාරියේ වත්කම් ලෙස මූල්‍ය ප්‍රකාශන වල දක්වා නොතිබුණි.	OCH-II ව්‍යාපෘතියේ අවතැන්වූවන්ට බෙදා දීම සඳහා මිලදී ගත් පිඹුරු අංක 08/2017 දරණ රුක්අත්තනගහ වත්ත ඉඩමෙන් අවතැන් වූවන්ට බෙදා දී ව්‍යාපෘතිය විසින් අධිකාරිය වෙත භාරදෙනු ලැබූ රු. මිලියන 8.26 වටිනා ඉතිරි ඉඩම් කැබලි 16 අධිකාරියේ පොත් වල ගිණුම්ගත කර ඇති අතර එම ඉඩම් කැබලි වලින් රු. මිලියන 3.14 වටිනා ඉඩම් කැබලි 04 ක් මධ්‍යම අධිවේගී මාර්ග ව්‍යාපෘතිය-I අදියරෙහි අවතැන් වූවන් සඳහා ලබා දී ඇත. මේ සම්බන්ධ ගිණුම් ගැලපුම් 2022 මැයි මස ජර්නල් සටහන් අංක 184/J05 මඟින් සිදු කර ඇත.
(ඌ)	ගිණුම් අංශය විසින් විගණනය වෙත ලබා දුන් උපලේඛණ අනුව, ඉඩම් අංශය විසින් හා ව්‍යාපෘති වලින් අත්කරගත් ඉඩම් සඳහා ගෙවිය යුතු වන්දි හා ඊට අදාළ පොළිය රු.මිලියන 585.19 ක් වූවද, ඉඩම් අංශය විසින් මේ සම්බන්ධයෙන් විගණනය වෙත ඉදිරිපත් කරන ලද තොරතුරු අනුව, ඊට අනුරූපී ගෙවිය යුතු වන්දි හා පොළිය රු.මිලියන 958 ක් විය. එසේ වූවත්, මෙම ශේෂයන් වල වෙනසට හේතු සෘජුව බලා මූල්‍ය ප්‍රකාශන වල ගැලපීමට කටයුතු කර නොතිබුණි.	ඉඩම් අංශය පිහිට වූ දා සිට අවසන් ගිණුම් පිළියෙල කිරීමේදී උපචිත වියදම් ගණනය කරනු ලැබුවේ, ගිණුම් වර්ෂය අවසානයේ ගිණුම් අංශය වෙත ලබා දී ඇති ගෙවීම් කිරීමට ඉතිරිව ඇති වවුචර් පත්‍රිකා පදනම් කර ගෙන වේ. ඒ අනුව 2021 වර්ෂයේ අවසන් ගිණුම් වාර්තාවල ඇත්තේ ගිණුම් අංශය වෙත ලැබී ඇති වවුචර් පත්‍රිකාවල වටිනාකම් අනුව ගණනය කරනු ලැබූ වවුචර්පත්වල සඳහන් වටිනාකම් වල එකතුවයි. නමුත් විගණන නිරීක්ෂනයන්හි දක්වා ඇති පරිදි උපචිත පදනම අනුව ඉඩම් වන්දි හා පොලී සඳහා උපචිත වියදම් ගණනය කිරීම ප්‍රායෝගික වශයෙන් තොරතුරු ලබා ගැනීමට ඇති දුෂ්කරතා මත සිදු කිරීමට අපොහොසත් වී ඇත. එබැවින් මෙම ගණනය කිරීම 2021 වර්ෂයේ ද පැරණි ක්‍රමවේදය අනුගමනය කරමින් ගිණුම්වල තොරතුරු ඉදිරිපත් කර ඇත. ඉඩම් සඳහා ගෙවිය යුතු වන්දි හා පොළියට අදාල තොරතුරු ප්‍රාදේශීය ලේකම් කාර්යාල මඟින් ලබා ගැනීමෙන් අනතුරුව අදාල නිවැරදි කිරීම් සිදු කිරීමටත්, විගණන වාර්තාවේ සඳහන් නිරීක්ෂණයන් මඟින් පෙන්වා දී ඇති පරිදි උපචිත වියදම් ගණනය කර ඉදිරිපත් කිරීමට යෝජනා කර ඇති පදනම අනුව පවත්නා ගිණුම් වර්ෂයේ සිට ක්‍රියාත්මක කිරීමටත් කටයුතු කරනු ලැබේ.
(එ)	ඉඩම් අත්කර ගැනීමේ නිතිරීති හා රෙගුලාසි ප්‍රකාරව අධිකාරිය විසින් 2021 දෙසැම්බර් 31 දිනට ගෙවීමට බැඳී සිටින සම්පූර්ණ ව්‍යවස්ථාපිත වන්දි මුදල හා ඊට අදාළ පොළී මුදල හඳුනාගෙන ගිණුම්ගත කර නොතිබුණි. නියැදි විගණන පරීක්ෂාවකට අනුව, 2021 දෙසැම්බර් 31 දිනට එලෙස ගිණුම්ගත නොකළ ගෙවිය යුතු පොළිය රු.මිලියන 307.07 ක් බව විගණයේ දී නිරීක්ෂණය විය. තවද, දක්ෂිණ අධිවේගී මාර්ග දිගුව - II ව්‍යාපෘතියට අදාලව ගෙවිය යුතු වන්දි හා පොළිය ලෙස 2020 වර්ෂයේ වෙන්කර තිබුණු රු.මිලියන 135.8 ක මුදල 2021 වර්ෂය තුළ ගෙවීම් කිරීමේ දී නැවත වියදමක් ලෙස ගිණුම්ගත වීම හේතුවෙන් සහ මාර්ග පුළුල්	දැනට සිදුකරනු ලබන ක්‍රමවේදය අනුව අත්පත්කර ගනු ලබන ඉඩම් වලට අදාල 38 (අ) ගැසට් නිවේදනය නිකුත් කරන අවස්ථාවේ සිට වන්දි මුදල් ගෙවන දිනය දක්වා පොළී මුදල් ගණනය කරනු ලබයි. කෙසේ වුවද කිසියම් ඉඩම් අත්පත් කර ගැනීමක් සඳහා අදාල ව්‍යවස්ථාපිත වන්දි මුදල නියමිත වර්ෂය තුල ගෙවීම් නොකරන අවස්ථාවලදී දැනට පවතින ක්‍රමවේදය තුල ගෙවිය යුතු පොළී මුදල් අදාල වර්ෂය තුල ගිණුම්ගත කිරීමක් සිදු නොවේ. මෙම තත්වය නිවැරදි කිරීම සඳහා ඉදිරියේදී ප්‍රාදේශීය ලේකම්වරුන් සමග සාකච්ඡා කර සුදුසු ක්‍රමවේදයක් සකස් කිරීමට කටයුතු කරනු ලැබේ. එහෙත් එම ක්‍රමවේදය හඳුන්වාදීමෙන් පසු අධිකාරියේ පොත්වල ගිණුම්ගත කල හැක්කේ මාර්ග පුළුල්කිරීම් හා වැඩිදියුණු කිරීම් ව්‍යාපෘති සහ අධිකාරිය විසින් සෘජුව ක්‍රියාත්මක කරනු ලබන මාර්ග පුළුල් කිරීම වැනි ව්‍යාපෘති සඳහා අත්පත් කරගත් ඉඩම් වෙනුවෙන් පමණි.

	කිරීම හා වැඩි දියුණු කිරීමට අදාළව ගෙවිය යුතු රු. මිලියන 308.92 පොළී මුදලක් වැඩියෙන් ගිණුම්ගත වීම නිසා සමාලෝචිත වර්ෂයේ පොළී වියදම් රු.මිලියන 444.72 වැඩියෙන් මූල්‍ය ප්‍රකාශනය වල දැක්වුනි. එසේම, අධිකාරියේ 2021 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය ප්‍රකාශන වල අත්කර ගත් ඉඩම් සඳහා ගෙවිය යුතු වන්දි හා පොළියෙහි එකතු වටිනාකම ලෙස රු.මිලියන 932.10 ක් ලෙස දක්වා තිබූ නමුත් මෙම අයිතමයෙහි ප්‍රමාණාත්මකභාවය සලකා මූල්‍ය ප්‍රකාශන තුළ වන්දි හා පොළිය වෙන් වෙන්ව ඉදිරිපත් කිරීමට කටයුතුකර නොතිබුණි.	තවද ප්‍රාදේශීය ලේකම් කාර්යාල මඟින් ප්‍රාදේශීය ලේකම් අත්පත්කරගත් නිළධාරියා වශයෙන් කටයුතු කරමින් අත්පත්කර ගනු ලබන මාර්ග සංවර්ධන හා වැඩිදියුණු කිරීම් සඳහා වූ ඉඩම් වෙනුවෙන් නියමිත තොරතුරු නිසියාකාරයෙන් මෙම කාර්යාලය වෙත නොලැබෙන බැවින් එම තොරතුරු ද මූල්‍ය වාර්තාවල නිසිපරිදි ඇතුලත් කිරීමට ප්‍රායෝගික ගැටලුවක්ව පවතී. ව්‍යාපෘති කළමනාකරණ ඒකක වලින් ක්‍රියාත්මක කරනු ලබන ව්‍යාපෘති වෙනුවෙන් අත්පත්කරනු ලබන ඉඩම් වලට අදාල ගෙවියයුතු පොලී මුදල් ඒ ඒ ව්‍යාපෘතිවල මූල්‍ය වාර්තාවල ඇතුලත් කල යුතු බැවින් එම ව්‍යාපෘති අවසන් වන තෙක් අධිකාරියේ මූල්‍ය වාර්තා වල ඇතුලත් කිරීම සිදුකල නොහැකි වේ. එනමුත් ව්‍යාපෘති අවසන් වීමේදී තවදුරටත් ගෙවියයුතු පොළී මුදලක් වේ නම් අධිකාරියට, අදාල ව්‍යාපෘති භාරදීමෙන් පසුව අධිකාරියේ මූල්‍ය වාර්තා වලට ඇතුලත් කිරීමට ඉදිරියේදී කටයුතු කරනු ලැබේ.අවසන් කරන ලද ව්‍යාපෘතිවල ගෙවිය යුතුවන පොලී වවුවර්පත් ඉඩම් අංශය වෙත නිසියාකාරව ලබා දී නොමැත. එම තොරතුරු ඉඩම් අංශය වෙත ලැබුනු පසු ඊට අදාල තොරතුරු ගිණුම්ගත කිරීමට අපේක්ෂිතය. දක්ෂිණ අධිවේගී මාර්ග දිගුව - II (ESEP - II) ව්‍යාපෘතියට අදාලව 2020 වර්ෂයේ වෙන්කර තිබූ රුපියල් මිලියන 135.8 වැඩියෙන් ගිණුම් ගත වූ වන්දි සහ පොළිය 2022 වසරේදී නිවැරදි කරන ලදී. ඉඩම් අත්කර ගැනීම සඳහා ගෙවිය යුතු වන්දි හා පොළි වලට අදාළව කෙරීගෙන යන මාර්ග පුළුල් කිරීම හා වැඩි දියුණු කිරීම් වල අදාල වවුවර්පත් නැවත පරීක්ෂා කරමින් සිදු වී ඇති දෝෂයට අයි ගණනය වූ ප්‍රමාණය සඳහා ලැයිස්තුවක් පිළියෙල කරමින් පවතී. උපලේඛන අංක-224 යටතේ විගණනය වෙත ඉදිරිපත් කරන ලද උපලේඛනයන්හි වන්දි හා පොළී වෙන් වෙන් වශයෙන් දක්වා ඇත. හසේ වුවද, 2022 වර්ෂය සඳහා මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමේදී ඉඩම් සඳහා ගෙවිය යුතු වන්දි හා පොළිය වෙන් වෙන් වශයෙන් හෙලිදරව් කිරීම සිදු කරනු ලැබේ.
(ඒ)	විදේශාධාර ව්‍යාපෘති වලින් සහ වෙනත් ක්‍රම වලින් අධිකාරියට ලැබී තිබුණු එකතුව රු.මිලියන 1,400.15 ක් වූ තොරතුරු පද්ධතීන් හා පිරිවැය රු.මිලියන 3,958 ක් වූ පාලම් හා ලී බඩු උපකරණ යනාදී ස්ථාවර වත්කම් අධිකාරියේ ගිණුම් වලට ඇතුළත් කර මූල්‍ය ප්‍රකාශන වල දැක්වීමට කටයුතු කර නොතිබුණි.	රු. මිලියන 1,302.13න් රු. මිලියන 2.13 ක් වටිනා තොරතුරු පද්ධතීන් මූල්‍ය වාර්තා වල දැනටමත් පෙන්වා ඇත. ඉතිරි වටිනාකමට අදාල තොරතුරු පද්ධති පිළිබඳ ලේඛණ රැස්කරමින් පවති. ඒ මගින් සහ අදාළ ව්‍යාපෘතින් හි ගිණුම් වාර්තා සමග සැසඳීමෙන් මූල්‍ය අගයන් තහවුරු කර ගත යුතුව ඇත. පාලම් පද්ධති ජයිකා (JICA) ප්‍රදානයක් ලෙස ලැබී ඇති අතර ඒ සම්බන්ධ ලේඛණ /වටිනාකම් පාළම් සැලසුම් අංශය විසින් ලබා දී ඇති අතර ඒ සඳහා ගිණුම් ගැලපුම් 2022 වසරේදී සිදු කරනු ලැබේ. රුපියල් මිලියන 3958 ට අදාළ තොරතුරු ව්‍යාපෘතිවලින් විමසීම් කර ඇති අතර ව්‍යාපෘතිවල ප්‍රාග්ධනිත කල යුතු වටිනාකම් හඳුනාගෙන ඒවා ප්‍රාග්ධනිත කිරීමට කටයුතු කරනු ලැබේ.
(ඔ)	සමාලෝචිත වර්ෂය තුළ දුර්වල පාලම් නැවත ඉදිකිරීම් වෙනුවෙන් දරා තිබුණු රු.මිලියන 362.11 ක පිරිවැය පොදුවේ සංවර්ධන හා නඩත්තු වියදම් යටතේ මූල්‍ය ප්‍රකාශන වල දක්වා තිබුණි.	දුර්වල පාලම් නැවත ඉදිකිරීම්, වැඩිදියුණු කිරීම්, අලුත්වැඩියාව සහ නඩත්තු කිරීම වෙනුවෙන් දරන ලද පිරිවැය වෙන් වෙන් වශයෙන් හඳුනාගෙන 2021 සහ 2022 වර්ෂයනට අදාල පිරිවැය පිලිබඳව තොරතුරු අංක RDA/DF/434/2022 සහ 2022.11.24 දිනැති ලිපිය

		මගින් කැඳවා ඇති අතර 2022 වර්ෂයේ අවසන් ගිණුම් සැකසීමේදී සිදු කිරීමට නියමිතය.
(ඕ)	සමාලෝචිත වර්ෂයේ දෙසැම්බර් 31 දිනට අධිකාරියේ මූල්‍ය ප්‍රකාශන වල ජංගම නොවන වත්කම් යටතේ දක්වා තිබුණු පිරිවැය රු. මිලියන 4.3 ක ගොඩනැගිලි සහ පිරිවැය රු.මිලියන 525 ක් වූ වෙනත් වත්කම් ස්ථාවර වත්කම් ලේඛනයට ඇතුළත් කර නොතිබුණු අතර, එම වත්කම් හඳුනා ගැනීමට අදාළ වෙනත් විස්තරද විගණනය වෙත ඉදිරිපත් නොකෙරුණි. එම නිසා මෙකී වත්කම් වල පැවැත්ම හා අගය කිරීම විගණනයේ පරීක්ෂා කළ නොහැකි විය.	රු. මිලියන 4.3 ක ගොඩනැගිලි, මාර්ග සංවර්ධන අමාත්‍යාංශය විසින් මීට වසර ගණනාවකට ඉහතදී දෙනු ලැබූ කුට්ටිගල් නිෂ්පාදන යන්ත්‍රය (interlocking Block Machineries) ස්ථාපිත කිරීම සඳහා එම අමාත්‍යාංශයේ වැය ශීර්ෂය යටතේ අධිකාරිය වෙත දෙනු ලැබූ අරමුදල්වලින් ඉදිකරන ලද කුඩාරම් (Hut) සහ වතුර ටැංකි මාර්ග සංවර්ධන අමාත්‍යාංශය (RDM) වර්ගීකරණය යටතේ ඇති වත්කම් වේ. මහාමාර්ග දෙපාර්තමේන්තු (HW) වර්ගීකරණය යටතේ වූ රු. මිලියන 525 ක ගොඩනැගිලි වහා මාර්ග දෙපාර්තමේන්තුට අවසන් කිරීමේදී අධිකාරිය වෙත පවරන ලද වත්කම් වේ. මෙය මීට වසර-30- 35 ට පෙර සිදුවූ ගණුදෙනුවක් බැවින් අදාල ලේඛන සොයා ගැනීමට අපහසුය. එසේ වුවද තක්සේරු දෙපාර්තමේන්තුව හරහා සියලු ගොඩනැගිලි තක්සේරු කර ගිණුම්වලට ගැනීමේ ක්‍රියාවලිය දැනටමත් සිදු වෙමින් පවතී.
(ක)	මගනැගුම ඉමල්ෂන් සමාගමේ සියයට 99 ක සෘජු පාලන හිමිකමක් අධිකාරියට තිබෙන බව අධිකාරියේ මූල්‍ය ප්‍රකාශන තුළ හෙළිදරව් කර තිබුණ ද, ඒ සඳහා වන කොටස් සහතික විගණනයට ඉදිරිපත් නොකෙරුණි. මෙම සමාගමේ රු. 1,000,100 ක කොටස් අධිකාරිය මිලට ගෙන ඇති බව අධිකාරියේ මූල්‍ය ප්‍රකාශන වල සඳහන් වූවද, ඊට අනුරූපීව සමාගමේ මූල්‍ය ප්‍රකාශන වල අධිකාරියට අයත් කොටස් වටිනාකම රු. 100 ක් පමණක් බව දක්වා රු. මිලියන 01 ක මුදල අධිකාරිය විසින් සාමාගම වෙත ලබාදුන් ණයක් ලෙස මතභේදයට තුඩු දෙන අයුරින් පරිපාලිත සමාගමේ මූල්‍ය ප්‍රකාශන වල දක්වා තිබුණි. කෙසේ වුවත්, මෙම කොටස් අයිතිය පිළිබඳ වූ ව්‍යාකූල තත්ත්වය නිරාකරණය කර ගැනීමට අධිකාරිය මෙම වාර්තාවේ දිනය දක්වා කටයුතු කර නොතිබුණි.	මගනැගුම ඉමල්ෂන් සමාගමේ කොටස් අයිතිය පිළිබඳව නීතිමය ක්‍රියාමාර්ග අදාල සමාගම විසින් ගනු ලැබුව ද විසඳීමකින් තොරව එය අවසන් විය. ඉදිරියේදී පරිපාලිත සමාගම් ප්‍රතිසංවිධානය කිරීමට කටයුතු කරන අතර එමගින් මෙම ගැටළුව නිරාකරණය කර ගැනීමට කටයුතු කරනු ලැබේ.
(ඛ)	මාර්ග සංවර්ධන අධිකාරිය සහ සී/ස මහ නැගුම මාර්ග ඉදිකිරීම් හා යන්ත්‍රෝපකරණ (පුද්) සමාගම අතර වූ ජංගම ගිණුම් අතර, හර හා බැර ශේෂවල එකතුව රු.මිලියන 2,268.30 ක වෙනසක් නිරීක්ෂණය විය. එසේම සමාලෝචිත වර්ෂයේ දෙසැම්බර් 31 දිනට ඉටුකලයුතු සේවාදායක තැන්පතු ශේෂය වූ රු.මිලියන 3,070.9 ක මුදල සහ එයින් නිරූපණය කෙරුණු වත්කම් අතර, රු.මිලියන 1,730.7 ක වෙනසක් නිරූපණය වූ අතර, යථෝක්ත වෙනස සම්බන්ධව සැසඳීමක් සිදුකර නොතිබුණි. ශ්‍රී ලංකා විගණන ප්‍රමිතිවලට (ශ්‍රී.ලං.වි.ප්‍ර) අනුකූලව මා විගණනය සිදු කරන ලදී. මෙම විගණන ප්‍රමිති යටතේ වූ මාගේ වගකීම, මෙම	සී/ස මහ නැගුම මාර්ග ඉදිකිරීම් හා යන්ත්‍රෝපකරණ (පුද්) සමාගම සහ අධිකාරිය අතර ගිණුම් සැසඳුම් කෙරී ගෙන යන අතර එය අවසන් අදියරේ පවතී. සේවාදායකයන් වෙනුවෙන් කරනු ලැබූ වැඩ වල දල වටිනාකම (එනම් විදුලිබල මණ්ඩලය, ජාතික ජලසම්පාදන සහ ජලාපවාහන මණ්ඩලය, ටෙලිකොම් සමාගම යනාදී විශේෂ ව්‍යාපෘති වෙනුවෙන් සිදුකරනු ලැබූ මාර්ග හානි පිලිසකර කරනු ලැබූ වැඩ) සහ ඒ වෙනුවෙන් ආදායම ඒ වෙනුවෙන් සෘජුව හඳුනාගන්නා ලද වියදම් සේවාදායක වැඩ වෙනුවෙන් කරනු ලැබූ වියදම් ලෙස ද මූල්‍ය ප්‍රකාශන වල දක්වා ඇත. විදුලි සම්බන්ධතා, ජල සම්බන්ධතා යනාදී සේවා දායක වැඩ සම්බන්ධයෙන් මාර්ග වලට සිදු වූ හානි පිළිසකර කිරීමේදී මාර්ග නඩත්තු අරමුදල් වැය ශීර්ෂය යටතේ සිදු කර ඇති අවස්ථාවලදී බිල්පත් ගෙවීම් හා ගිණුම්ගත කිරීම් සම්බන්ධයෙන් උපදෙස් RDA/FD/DDF/54 සහ 2022.08.01 දිනැති ලිපිය මගින්

	වාර්තාවේ මූල්‍ය ප්‍රකාශන විගණනය සම්බන්ධයෙන් විගණකගේ වගකීම යන කොටසේ තවදුරටත් විස්තර කර ඇත. මාගේ තත්ත්වාගණනය කළ මතය සඳහා පදනමක් සැපයීම උදෙසා මා විසින් ලබාගෙන ඇති විගණන යාක්ෂි ප්‍රමාණවත් සහ උචිත බව මාගේ විශ්වාසයයි.	සභාපතිතුමා විසින් සියළු පළාත්භාර අධ්‍යක්ෂවරු සහ ගණකාධිකාරීවරුන් වෙත උපදෙස් ලබා දී ඇත. අනෙකුත් කාර්යයන් සම්බන්ධයෙන් 2023 වසරේ සිට ක්‍රියාත්මක කල හැකි වන ලෙස සුදුසු ගිණුම් ප්‍රතිපත්තියක් හඳුන්වා දීමට කටයුතු කරනු ලැබේ.

2.2.2 2018 අංක 19 දරණ ජාතික විගණන පනතේ 12 (ඊ) වගන්තියේ සඳහන් අවශ්‍යතාවය අනුව පහත සඳහන් නිරීක්ෂණ හැර යම් අදාල ලිඛිත නීතියකට හෝ අධිකාරියේ පාලක මණ්ඩලය විසින් නිකුත් කරන ලද වෙනත් පොදු හෝ විශේෂ විධානවලට අනුකූල නොවන ලෙස ක්‍රියා කර ඇති බව.

ඡේද අංකය	විගණන ඡේදය	පිළිතුරු
(අ)	**1983 අංක 12 දරන පාරිතෝෂික ගෙවීම් පනත** වර්ෂ 05 ක අඛණ්ඩ සේවා කාලයක් සම්පූර්ණ කර සේවය අවසන් කරන ලද නිලධාරීන්ට හිමි පාරිතෝෂික දීමනාව ඔවුන් සේවයෙන් ඉවත් වූ දින සිට දින 30 ක් ඇතුළත ගෙවිය යුතු වුවද, 2021 වර්ෂය තුළ සේවයෙන් විශ්‍රාම ගිය, ඉල්ලා අස්වූ, මියගිය සහ තනතුර අතහැර ගිය නිලධාරීන් 32 දෙනෙකු සඳහා 2021 වර්ෂය තුළ දී පාරිතෝෂික ගෙවීම් සිදු කර නොතිබුණි. එසේ ප්‍රමාද කාලය පදනම් කරගෙන පොළී මුදලක්ද ගෙවිය යුතුවේ.	2021 වර්ෂය තුළ සේවයෙන් විශ්‍රාම ගිය මෙම නිලධාරීන් 32 ගෙන් 22 ක් හට මේ වන විට පාරිතෝෂික ගෙවීම් සිදුකර ඇත. මොවුන් කිසිවෙකු හට අධිභාර මුදල් ගෙවා නැති අතර අධිභාර ගෙවීම වැළැක්වීම සඳහා ගැටලූ සහගත ගෙවීම් සම්බන්ධයෙන් කම්කරු දෙපාර්තමේන්තුවෙන් උපදෙස් ඉල්ලා ඇත. එමෙන්ම ධූරය අතහැර ගිය එක් සේවයකයෙක් සහ සේවයෙන් ඉල්ලා අස් වූ එක සේවකයෙක් පාරිතෝෂික හිමිකම ලැබීම සඳහා සුදුසුකම් වන වසර 05 ක සේවා කාලයක් සම්පූර්ණ කර නැත. ඉතිරි නිලධාරීන් 08 දෙනා හට මෙතෙක් පාරිතෝෂික ගෙවා නොමැති අතර ඒ සඳහා අවශ්‍ය ලේඛන මේ වන තෙක් ඉදිරිපත් කර නැත. එකී ලිපි ලේඛන ඉදිරිපත් කරන ලෙස ඔවුන් දැනුවත් කිරීමට කටයුතු කර ඇති අතර ඒවා ලද වහාම ගෙවීම් කටයුතු කරනු ලැබේ. මේ වන විට අධිකාරියෙන් සේවයෙන් ඉවත්ව යන නිලධාරීන් හට දින 30 ක් තුළ පාරිතෝෂික ගෙවීමට සිදු කරනු ලැබේ.
(ආ)	**2018 ජනවාරි 24 දිනැති අංක 02/2018 දරණ රාජ්‍ය පරිපාලන චක්‍රලේඛය:** (i) 1 වගන්තිය අධිකාරිය විසින් මානව සම්පත් සංවර්ධනය කිරීමේ ක්‍රමවේදයක් හඳුන්වා දී නොතිබුණ අතර කාර්ය මණ්ඩලය සඳහා වාර්ෂික කාර්යසාධන ගිවිසුම් අත්සන් කිරීමට හෝ කාර්ය සාධනය ඇගයීමේ ක්‍රමවේදයක් හඳුන්වා දීමට කටයුතු කර නොතිබුණි.	මේ වන විට බඳවා ගැනීමේ පටිපාටිය කළමනාකරණ සේවා දෙපාර්තමේන්තුවේ අනුමැතිය සඳහා ඉදිරිපත් කර ඇත. අදාල අනුමැතිය ලැබීමෙන් අනතුරුව මාර්ග සංවර්ධන අධිකාරියට අදාළ වන පරිදි කාර්ය සාධන ගිවිසුම් අත්සන් කිරීමට සහ කාර්ය සාධන ඇගයීමේ ක්‍රමවේදයක් සකස් කිරීමට කටයුතු කරනු ලැබේ.
	(ii) 5 වගන්තිය මානව සම්පත් සංවර්ධන සැලැස්මක් පිළියෙල කර නොතිබුණි.	මානව සම්පත් සංවර්ධන සැලැස්මක් ලෙස දැනට සකස් කර නොමැති අතර, අවස්ථානුකූලව ආයතනයේ නිලධාරීන්ගේ / සේවකයන්ගේ වෘත්තීය සුදුසුකම් මෙන්ම හැකියාව ඉහල නැංවීමට අවශ්‍ය පුහුණුව ප්‍රමුඛත්වය අනුව පුහුණු අංශයට වාර්ෂිකව වෙන් කරන ලද ප්‍රතිපාදන මත සිදු කිරීමට කටයුතු කර ඇත. මේ වන විට අධිකාරියේ සේවකයන්ගේ පුහුණු අවශ්‍යතා පුහුණු අංශය මගින් සම්පිණ්ඩණය කර ඇත. 2022 වර්ෂයේදී පුහුණු ප්‍රතිපාදනයන් සීමා කිරීම නිසා ඉතා සීමිත පුහුණු වැඩසටහන් සංඛ්‍යාවක් පමණක් සිදු කර ඇති අතර මාර්ග සංවර්ධන අධිකාරියේ මානව සම්පත් සංවර්ධන

		සැලැස්මෙහි කටයුතු 2023 වසරේ පළමු කාර්තුවේදී අවසන් කිරීමට කටයුතු කරනු ලැබේ.
(ඇ)	2006 සැප්තැම්බර් 22 දිනැති අංක 30 සහ 2009 ජූනි 01 දිනැති අංක 30(I) දරණ රාජ්‍ය ව්‍යාපාර චක්‍රලේඛය: කළමනාකරණ සේවා දෙපාර්තමේන්තුවේ නියමයන්ට හා මාර්ගෝපදේශයන්ට අනුව සකස් කරන ලද බඳවා ගැනීමේ හා උසස් කිරීම් පරිපාටියක් සකසා ගැනීමට යටත්ව එම දෙපාර්තමේන්තුව විසින් ඉදිරිපත් කර තිබුණු කාර්යමණ්ඩල ප්‍රතිව්‍යුහගතකරණ නිර්දේශයන් ක්‍රියාත්මක කිරීම වෙනුවට එකී නියමයන් නොසලකා හැර අධ්‍යක්ෂ මණ්ඩල තීරණමත තනතුරු 23 කට අදාල නිළධාරීන් 287 ක් සඳහා වැරදි වැටුප් පරිමාණයන් අනුව වැටුප් සකස්කර ඒ අනුව ගෙවීම්කර තිබුණි.	තනතුරු 23ට අදාල සේවකයන් 287 ක් අනුමත වැටුප් කේතයන්හි පිහිටුවා නැති බව සඳහන් කර ඇතත් මෙම තනතුරු 23ට අදාලව 2021.12.31 දිනට නිත්‍ය සේවකයින් සංඛ්‍යාව 268 දෙනෙකු වේ. අධ්‍යක්ෂ මණ්ඩල තීරණ මත 3:2 අනුපාතයට ලබාදුන් බොහෝ උසස්වීම් 2020.01.04 දින සිට අත්හිටුවා ඇත. ඒ අනුව කළමනාකරණ සේවා දෙපාර්තමේන්තුව විසින් අනුමත කරන ලද වැටුප් කේතාංක සහ වැටුප් පරිමාණයන් පමණක් නව බඳවා ගැනීම් සහ උසස් කිරීම් වලදී ලබා දීමට කටයුතු කර ඇත. කළමනාකරණ සේවා දෙපාර්තමේන්තුව විසින් අනුමත කරන ලද වැටුප් කේතාංක හා වැටුප් පරිමාණයන් නොසලකා උසස්වීම් ලබා දීම සම්බන්ධයෙන් කරුණු සොයා බැලීම සඳහා කමිටුවක් පත් කර ඇත. කමිටු නිර්දේශයන් ඇතුලත් වාර්තාව ලබා ගැනීමෙන් අනතුරුව ඒ පිළිබඳව කළමනාකාරීත්වය විසින් තීරණයක් ගනු ලැබේ.
(ඈ)	2006 ජාතික ප්‍රසම්පාදන මාර්ගෝපදේශ සංග්‍රහය: 4.2.1 (අ), (ආ), සහ (ඉ) වගන්තීන් සහ 4.2.2 (අ) වගන්තිය 8.10.1 වගන්තිය සහ 8.11.4 (අ)(i) වගන්තිය	ඉතාමත් කෙටි කාලයක් තුළ ප්‍රධාන ප්‍රසම්පාදන සැලැස්මක් සහ ප්‍රසම්පාදන කාල සටහන සම්පූර්ණ කර අධ්‍යක්ෂ මණ්ඩල අනුමැතිය සඳහා මේ වන විටත් ඉදිරිපත් කර ඇත. අධිකාරිය විසින් ප්‍රදානය කර තිබූ කොන්ත්‍රාත් පිළිබඳ තොරතුරු අධිකාරියේ වෙබ් අඩවියේ ප්‍රසිද්ධ කිරීම දැනටමත් ක්‍රියාත්මක වෙමින් පවතී. කොන්ත්‍රාත් පැහැර හරින සැපයුම්කරුවන් පිළිබඳ දත්ත මූලාශ්‍ර ලේඛනය දැනටමත් පිළියෙල කර ඇත.
(ඉ)	මාර්ග සංවර්ධන අධිකාරි චක්‍රලේඛ (i) <u>RDA/GM/10/169 දරණ හා 2010 ජූනි 10 දිනැති චක්‍රලේඛයේ (එ) වගන්තියේ (III) ඡේදය</u> ප්‍රවාහන පහසුකම් සලසාදීමේදී කොන්ත්‍රාත්තුවට සෘජුවම සම්බන්ධවන ඉංජිනේරුවරයාට ප්‍රවාහන පහසුකම් සලසා දීම සඳහා පමණක් අනුමැතිය ලබා දී තිබුණද, ඊට අනුකූල නොවී කොන්ත්‍රාත් සඳහා සෘජු සම්බන්ධතාවයක් නොදැක්වූ මාර්ග සංවර්ධන අධිකාරියේ දකුණු පළාත් කාර්යාලවල ඉංජිනේරුවරුන් සහ කාර්මික නිලධාරීන් සඳහා ප්‍රවාහන පහසුකම් සැපයීමට වැන් රථ, කැබ් රථ හා කාර් රථ කුලියට ලබාගෙන තිබුණු අතර, ඒ වෙනුවෙන් එකතුව රු.මිලියන 23.3 ක කුලී ගෙවා තිබුණි.	මාර්ග කිලෝමීටර් 100,000 ව්‍යාපෘතිය රාජ්‍ය ප්‍රතිපත්ති ප්‍රකාශයේ "රට හදන සෞභාග්‍යයේ දැක්ම"යටතේ දිවයින පුරා කඩිනමින් දියත්කල වැඩසටහනකි. එහිදී, මාර්ග සංවර්ධන අධිකාරියේ සියළුම ඉංජිනේරුවරුන් මෙන්ම බොහෝ කාර්මික නිලධාරීන්ද ව්‍යාපෘතියේ මාර්ග අධීක්ෂණය, ඇස්තමේන්තු පිළියෙළ කිරීම යන කාර්යන් සඳහා සෘජුවම සේවයේ යෙදවීමට සිදුවිය. එබැවින්, මාර්ග කි.මී. 100,000 ව්‍යාපෘතිය සඳහා ඉංජිනේරුවන් මෙන්ම, තාක්ෂණික/කාර්මික නිලධාරීන්ගේද සෘජු සේවා අවශ්‍යතාවයක් තිබූ බැවින් හා එකවර ව්‍යාපෘති විශාල සංඛ්‍යාවක් ක්‍රියාත්මක වන බැවින් එම අදාළ නිලධාරීන් සඳහා, රාජකාරී කටයුතු සිදුකිරීමට ප්‍රවාහන පහසුකම් සැලසීම උදෙසා, වාහන කුලී පදනම මත ලබාගැනීම ප්‍රසම්පාදන කමිටු තීරණ වලට අනුව සිදුකරන ලදී. දකුණු පළාත තුල අධිකාරිය සතු සියලුම වාහන පිළිබඳ පූර්ණ අධීක්ෂණයක් දකුණු පළාත් කාර්යාලය මගින් සිදුකර ඒ සම්බන්ධ මනා අභ්‍යන්තර පාලනයක් ස්ථාපිත කර ඒ තුලින් අධිකාරිය සතු හා කුලි පදනම මත ලබාගන්නා ලද වාහන මනා පරිහරනයකින් යුත්තව භාවිතා කිරීමට හැකිවන පරිදි ඉදිරි ක්‍රියාමාර්ග ගැනීමට කටයුතු කරනු ලැබේ.

2.2.3 2018 අංක 19 දරණ ජාතික විගණන පනතේ 12 (උ) වගන්තියේ සඳහන් අවශ්‍යතාවය අනුව පහත සඳහන් නිරීක්ෂණ හැර අධිකාරියේ බලතල , කර්තව්‍ය සහ කාර්යයන්ට අනුකූල නොවන ලෙස කටයුතු කර ඇති බව.

ඡේද අංකය	විගණන ඡේදය	පිළිතුරු
(අ)	2008 අංක 40 දරන ජාතික මංමාවත් පනතේ 13 හා 14 වැනි වගන්ති සහ 2011 නොවැම්බර් 18 දිනැති අංක 1732/12 දරන අති විශේෂ ගැසට් පත්‍රයේ 07 ඡේදය ප්‍රකාරව ගාස්තු අයකරන ජාතික මහාමාර්ග වලින් ලැබෙන මුදල් අධිකාරියේ අරමුදලට බැරකල යුතු අතර, සමාලෝචිත වර්ෂයේ දෙසැම්බර් 31 දිනට අධිවේගී මාර්ග වලින් එකතු කරගත් රු.මිලියන 61,435 ක ආදායමෙන්, අධිකාරියේ සියලු ආදායම් ප්‍රභව මත බදු ගෙවීම සඳහා දරා ඇති වියදම රු. මිලියන 18,473 ක් විය. තවද ගැසට් පත්‍රයේ නියමයන්ට පරිබාහිර ව අධිකාරියේ සේවකයන් වෙනුවෙන් වැටුප් හා දීමනා ගෙවීම සඳහා රු.මිලියන 10,713 ක් ද පොදු වියදම් හා ව්‍යාපෘති වලට ගෙවීම් සඳහා රු.මිලියන 3,402.3 ක් සහ සහ පොලිස් දෙපාර්තමේන්තුවේ නිළධාරීන්ට පහසුකම් සැපයීම සඳහා රු.මිලියන 650 කට අධික මුදලක් වැයකර තිබුණි.	• අධිවේගී මාර්ග වලින් එකතු කර ගත් ආදායමෙන් රු. මිලියන 4,052.0 ක් මධ්‍යම අධිවේගී මාර්ගයේ ඉදිකිරීම් කටයුතු සඳහා ලංකා බැංකුවෙන් හා මහජන බැංකුවෙන් ලබාගත් ණය මුදලේ වාරික ලෙස ගෙවා ඇත (අමාත්‍ය මණ්ඩල අනුමත පත්‍රිකා අංක 19/2547/119/068 1 හා 04.09.2019 දිනැති අනුමත පත්‍රිකා මගින් අධිවේගී මාර්ග ආදායම යොදා ගන්නා ලෙසට දක්වා ඇත.) • 2017.09.15 දිනැති ජාතික අයවැය දෙපාර්තමේන්තුව මගින් එවන ලද ලිපිය අනුව 2017.09.20 දින රු. මිලියන 4,000.0 ක් ද 2021.12.28 දිනැති රාජ්‍ය ව්‍යාපාර දෙපාර්තමේන්තුව මගින් එවන ලද ලිපියට අනුව රු. මිලියන 4,000.0 ක් ද ඒකාබද්ධ අරමුදල වෙත ලබා දී ඇත. • තවද VAT,NBT,IT , වශයෙන් අධිවේගී මාර්ග ආදායම මත මිලියන 18,473 මුදලක් ද ආදායම් බදු දෙපාර්තමේන්තුවට ගෙවා ඇත. • අධිවේගී මාර්ග වලින් ලැබෙන ආදායම මහා භාණ්ඩාගාරයේ අවසරය ඇතිව වැටුප් ගෙවීමේදී ඇති වන අරමුදල් ඌණතාවය සඳහා භාවිතා කරන ලදී. අධිවේගී මාර්ග වල මෙහෙයුම් හා නඩත්තු කටයුතු සඳහා වන වියදම් අධිවේගී මාර්ග ආදායමින් පියවා ගන්නා අතර පොලිස් කොට්ඨාසයේ රාජකාරී කටයුතු සෘජුවම අධිවේගී මාර්ගයේ මෙහෙයුම් කටයුත්තක් වන බැවින් එම වියදමද අධිවේගී මාර්ග ආදායමින් දරා ඇත.
(ආ)	2008 අංක 40 දරන ජාතික මංමාවත් පනතේ 4(3) වගන්තිය ප්‍රකාරව, "ඒකාබද්ධ මාර්ග පද්ධති සංවර්ධනය සහ නඩත්තුව සඳහා ක්‍රියාකාරී සැලැස්මක්" සකස් කර නොතිබුණු අතර, පනතේ 6(1) සහ 7(1) වගන්ති ප්‍රකාරව පිළිවෙලින් "මාර්ග පද්ධති සංවර්ධන උපදේශක සභාව" සහ "දිස්ත්‍රික් මාර්ග පද්ධති සංවර්ධන සම්බන්ධීකරණ කමිටු" පිහිටුවා නොතිබුණි.	ඒකාබද්ධ මාර්ග පද්ධති සංවර්ධනය සහ නඩත්තුව සඳහා ක්‍රියාකාරී සැලැස්ම සකස් කිරීම, මාර්ග පද්ධති සංවර්ධන උපදේශක සභාව පිහිටුවීම සහ දිස්ත්‍රික් මාර්ග පද්ධති සංවර්ධන සම්බන්ධීකරණ කමිටු පිහිටුවීම අවශ්‍ය කටයුතු වසරක් තුල සිදු කරනු ලැබේ.

2.2.3 2018 අංක 19 දරණ ජාතික විගණන පනතේ 12(ඌ) වගන්තියේ සඳහන් අවශ්‍යතාවය අනුව පහත සඳහන් නිරීක්ෂණ හැර සම්පත් සකසුරුවම් ලෙස, කාර්යක්ෂම ලෙස සහ ඵලදායී ලෙස කාලසීමාවන් තුළ අදාළ නීතිරීති වලට අනුකූලව ප්‍රසම්පාදනය කර භාවිතා කර නොමැති බව.

ඡේද අංකය	විගණන ඡේදය	පිළිතුරු
(අ)	මාර්ග සංවර්ධන අධිකාරියේ විවිධ අංශ විසින් ක්‍රියාත්මක කරන ලද කොන්ත්‍රාත් අතරින් කොන්ත්‍රාත් 05 කට අදාළව 2021 දෙසැම්බර් 31 ට අයවිය යුතු වැඩ ආරම්භ කිරීමේ අත්තිකාරම් ශේෂය රු.මිලියන	2021 දෙසැම්බර් 31 ට අයවිය යුතු වැඩ ආරම්භ කිරීමේ අත්තිකාරම් ශේෂය වන රු. මිලියන 59.60 හි වර්තමාන තත්ත්වය පහත පරිදි වේ. RDA/DW/EP/GOSL/2021/118 - රු. 31,687,354.50

	59.60 ක් වූ අතර එයින් ඇතැම් කොන්ත්‍රාත් සඳහා රජයේ ප්‍රසම්පාදන මාර්ගෝපදේශ සංග්‍රහයේ 5.4.4 ට අනුව වැඩ ආරම්භ කිරීමේ අත්තිකාරම් සුරක්ෂණයක් හෝ ලබා ගෙන නොතිබුණි.	මා.සං.අධිකාරියේ දේශීය බැංකු අරමුදල් ව්‍යාපෘතිය විසින් පළාත් බද මාර්ග සංවර්ධන අධිකාරියට ගෙවිය යුතු බිල්පත්වලින් මෙම වැඩ ආරම්භ කිරීමේ අත්තිකාරම් මුදල අයකරගන්නා මෙන් අධ්‍යක්ෂ ජනරාල් , මා.සං.අ. ගේ 2022.08.02 දිනැති ලිපි අංක RDA/FD/Pay/F/Accounta'21 මඟින් දැනුම් දී ඇති අතර 2022 සැප්තැම්බර් මස ජර්නල් සටහන් අංක 213/J09 මඟින් ගිණුම් ගැලපුම් සිදු කර ඇත. RDA/DW/E/17- රු. 3,862,451.25 ආයතනය වෙත ගෙවීම් කිරීම සඳහා මේ වනවිට කිසිදු බිල්පතක් ගෙවීම් අංශය සතුව නොමැත. ඉදිරියේ දී බිල්පත් ලදහොත් , මෙම අත්තිකාරම් මුදල අයකර ගැනීමට කටයුතු කරනු ලැබේ. RDA/MM/CP/GOSL/2016/049 -රු. 13,144,910/- කොන්ත්‍රාත්කරු වෙත ගෙවීමට ඇති බිල්පත්වලින් අත්තිකාරම් මුදල අයකර ගැනීම සඳහා සියළු ලේඛන සකස්කර අවසන් කර ඇති අතර මාසයක කාලයක් තුලදී අන්‍යොන්‍ය අවසන් කිරීමේ ගිවිසුම් අත්සන් කර කොන්ත්‍රාත්තුව අවසන් කිරීමට කටයුතු කරනු ලැබේ. RDA/DPR/EOM&M/GOSL/2020/Metal Arch/1 - රු. 9,904,275 - අයකර ගෙන ඇත. RDA/EOM&M/PRC/2021/ETE/19- රු. 610,000 - අයකර ගෙන ඇත.
(ආ)	ප්‍රසම්පාදන මාර්ගෝපදේශ සංග්‍රහයේ 3.4 සහ ප්‍රසම්පාදන කාර්ය සංග්‍රහයේ 2.14.1 සඳහා වන 35 අතිරේඛය අනුව වටිනාකම රු.මිලියන 01 - 05 ත් අතර ප්‍රසම්පාදනයන් ප්‍රාදේශීය ප්‍රසම්පාදන කමිටුව මඟින් සිදුකළ යුතු වුවත් එම ප්‍රසම්පාදන සීමාවට ගැනෙන,ප්‍රවාහන පහසුකම් සලසා ගැනීම වෙනුවෙන් මාතර ප්‍රධාන ඉංජිනේරු කාර්යාලය වෙත මෝටර් රථයක් ලබා ගැනීම ප්‍රධාන ඉංජිනේරුගේ ප්‍රසම්පාදන සීමාවන්ට යටත්ව සිදුකර තිබුණි. ඒ අනුව, මෙම ප්‍රසම්පාදනය සම්බන්ධව ප්‍රසම්පාදන මාර්ගෝපදේශ සංග්‍රහයට අනුකූල නොවූ අතර මෙම ප්‍රසම්පාදන කාර්යයේ දී ප්‍රසම්පාදන මාර්ගෝපදේශ සංග්‍රහයේ 5.4.10 අනුව කාර්ය සාධන සුරක්ෂණයක් හෝ ලබා ගෙන නොතිබුණි.	ප්‍රසම්පාදන මාර්ගෝපදේශ සංග්‍රහයේ 3.4 සහ ප්‍රසම්පාදන කාර්ය සංග්‍රහයේ 2.14.1 සඳහා වන 35 අතිරේඛයට අනුව ප්‍රාදේශීය ප්‍රසම්පාදන කටයුතු සඳහා රු.මිලියන 25 ක සීමාවට යටත්ව ප්‍රසම්පාදන කටයුතු සිදු කිරීම සඳහා අනුමැතිය ලබා දී ඇත. එහිදි එම රු.මිලියන 25 ක සීමාවට යටත්ව ලබා දි ඇති ප්‍රසම්පාදන කටයුතු සඳහා අධ්‍යක්ෂ ජනරාල් විසින් අංක RDA/DPR/AD/01/06 හා 2020/06/08 දිනැති ලිපිය මඟින් ප්‍රසම්පාදන කටයුතු වෙනුවෙන් පළාත්භාර අධ්‍යක්ෂ සඳහා රු. මිලියන 25 සීමාව දක්වා ද ප්‍රධාන ඉංජිනේරු සඳහා රු. මිලියන 10 සීමාව දක්වා ද හා විධායක ඉංජිනේරු සඳහා රු. මිලියන 05 සීමාව දක්වා ද වශයෙන් අධ්‍යක්ෂ ජනරාල්ගේ අනුමැතිය ලබා දී ඇත. ඒ අනුව මාතර ප්‍රධාන ඉංජිනේරු විසින් ප්‍රධාන ඉංජිනේරුගේ ප්‍රසම්පාදන සීමාව තුල ප්‍රසම්පාදන කටයුතු සිදු කර මෙම මෝටර් රථය සපයා ගැනීම සිදුකර ඇත. ඉදිරියට කුලී පදනම මත වාහන සපයා ගැනීමේදී විගණනය විසින් පෙන්වා ඇති පරිදි ප්‍රසම්පාදන මාර්ගෝපදේශ සංග්‍රහයේ 5.4.10 ට අනුව කාර්ය සාධන සුරක්ෂණයන් ලබා ගනිමින් ප්‍රසම්පාදන කටයුතු සිදු කරන බවට මාතර ප්‍රධාන ඉංජිනේරු විසින් දන්වා ඇත.
(ඇ)	මාර්ග සංවර්ධන අධිකාරියේ දකුණු පළාත් කාර්යාල සතුව කැබ් රථ 48 ක්, කාර් රථයක් හා ජීප් රථ 02 ක් වශයෙන් වාහන 51 ක් තිබියදී, සලකා බලන කාල සීමාව තුලදී කුලී පදනම මත කැබ් රථ 10 ක්, වෑන් රථ 13 ක් සහ කාර් රථ 03 ක් වශයෙන් එකතුව වාහන 26 ක් කුලී පදනම මත ලබාගෙන තිබුණි. කාර්මික නිලධාරීන් සහ වැඩ සුපරීක්ෂකයින් සඳහා අධිකාරිය විසින්	කි.මී.100,000 යේ මාර්ග සංවර්ධන වැඩසටහන ඇතුලු අනෙකුත් සංවර්ධන ව්‍යාපෘතීන් හා මාර්ග නඩත්තු කටයුතු සඳහා ද හදිසි හා අත්‍යාවශ්‍ය ඕනෑම රාජකාරී කටයුතු සඳහා සියලු නිළධාරීන් රාජකාරියේ යෙදවීමට ද කොවිඩ් වසංගත තත්ත්වය පැවති කාලය තුළදී ද සේවයට පැමිණීමට හා රාජකාරියේ යෙදවීමට නිලධාරී සේවක මහත්ම මහත්මීන්ට ප්‍රවාහන පහසුකම් සැලසීම ඇතුලු විවිධ රාජකාරී කටයුතු සඳහා මාර්ග සංවර්ධන අධිකාරිය සතු දකුණු පළාත තුළ පැවති වාහන ප්‍රමාණය කිසිසේත්ම ප්‍රමාණවත් නොවූ බැවින් ප්‍රසම්පාදන කටයුතු සිදුකර කුලී පදනම මත වාහන ලබා ගැනීමට සිදු විය.

	මෝටර් සයිකල් ලබා දී තිබුණු බැවින් ඔවුන්ට කුලී පදනම මත වාහන ලබාදීමේ අවශ්‍යතාවයක් නොමැති බවනිරීක්ෂණය වූ අතර ඒ අනුව අමතර වශයෙන් දරන ලද රු.මිලියන 23.3 ක් වූ වාහන කුලි වියදම් නිෂ්කාර්ය වියදම් ස්වරූපයක් ගෙන තිබුණි.	අමතර වශයෙන් දරන ලද රු. මිලියන 23.3 සඳහා ඉහත 2.2.2. (ඉ) හි පිළිතුර අදාල වේ.
(ඇ)	2021 දෙසැම්බර් 31 දිනට කළ වැඩ වටිනාකම රු.මිලියන 1,142.81ක් සඳහා කොන්ත්‍රාත්කරුවන් වෙත රු.මිලියන 1,217.19 ක් ගෙවා තිබීම නිසා කල වැඩ වටිනාකම ඉක්මවා රු.මිලියන 167.92 ක් ගෙවා තිබුණි.කිසිදු ප්‍රගතියක් නොමැති ව්‍යාපෘතීන් සඳහා නිදහස්කර තිබූ වැඩ ආරම්භ කිරීමේ අත්තිකාරම් ද මේ අතර විය.	රජය විසින් නිකුත් කරන ලද රාජ්‍ය වියදම් පාලනය කිරීමේ චක්‍රලේඛනයෙහි උපදෙස් පිළිපදිමින් ඉදිකිරීම් ආරම්භ කර අර්ධ වශයෙන් නිම කර ඇති මාර්ගයන් රථවාහන ධාවනයට සුදුසුඉතත්වයට අවම පිරිවැයක් තුල පත්කර ව්‍යාපෘතීන් අවසන් කිරීමට කටයුතු කර ඇත. ඒ අනුව එම පියවා ගැනීමට ඇති හිඟ අත්තිකාරම් මුදල් අදාල කොන්ත්‍රාත්කරුවන්ගෙන් ඉදිරි ගෙවීම් බිල්පත් වලින් පියවා ගැනීමට කටයුතු කරමින් පවතී. අතිරේක ගිවිසුමක් මගින් එලෙස වැඩ නවතා දැමීමට කටයුතු කල ව්‍යාපෘතීන් වල කොන්ත්‍රාත් නවතා දමන අතර එම ගිවිසුමට එළඹීමට පෙර පියවා ගැනීමට ඇති හිඟ අත්තිකාරම් මුදල් සම්පූර්ණයෙන් පියවා ගැනීමට කටයුතු කරනු ලැබේ.
(ඉ)	පළාත්බද මාර්ග සංවර්ධන අධිකාරියට අයත් මාර්ග සංවර්ධනයේදී එකී ආයතනය විසින් ඉඩ නොදෙන වියදම් ඇතුළත් කිරීම, අසාමාන්‍ය ප්‍රමාණයකින් සාමාන්‍ය අපතයන් ඇතුළත් කිරීම, තෝරාගෙන තිබූ මිල අනුපාතයන් දෝෂ සහගත වීම, අවශ්‍යතාවය හඳුනා ගැනීමෙන් තොරව වියදම් ඇස්තමේන්තු කිරීම සහ අවශ්‍යතාවය සපුරාගත හැකි ප්‍රශස්ත ක්‍රමය තෝරා නොගැනීම වැනි හේතූන් නිසා මාතර, පොළොන්නරුව, මහනුවර සහ නුවර එළිය දිස්ත්‍රික්ක වලට අයත් මාර්ග කිහිපයක ඇස්තමේන්තු රු.මිලියන 326.2 කින් අධිගණනය වී තිබුණි. මෙලෙස වැරදි ඇස්තමේන්තු මත පදනම්ව කොන්ත්‍රාත්කරුවන්ට ගෙවීම් කිරීම නිසා රු.මිලියන 61 ක් වැඩිපුර ගෙවා තිබූ අවස්ථා කිහිපයක් විගණනයේදී නිරීක්ෂණය විය. එසේම, ඇස්තමේන්තුවේ සඳහන් වැඩ විෂයයන් නිසි පරිදි ඉටු නොකිරීම සහ නියමිත ප්‍රමිතියෙන් තොරව ABC සහ ඇස්පෝල්ට් ඇතිරීම වැනි තත්වයන් තිබියදී මාතර දිස්ත්‍රික්කය තුළ ක්‍රියාත්මක ව්‍යාපෘති කිහිපයක් වෙනුවෙන් කොන්ත්‍රාත්කරුවන්ට රු.මිලියන 14.2 ක් වැඩිපුර ගෙවා තිබුණි.	මෙම සංවර්ධනය කරන මාර්ග බොහෝමයක් ග්‍රාමීය මාර්ග වන බැවින් ප්‍රමාණයෙන් කුඩා වීම සහ භූවිෂමතා අනුව එම ප්‍රවාහනය කලයුතු අමුද්‍රව්‍ය අවුරා තිබීම හෝ ගබඩා කිරීම සඳහා සුදුසු ආරක්ෂිත ස්ථාන සොයාගැනීමේදී වැඩ බිම් වලට තරමක් දුරින් සොයා ගැනීමට සිදු වීම නිසා නැවත ප්‍රවාහනයේදී තරමක අපතේයාමක් සිදුවේ. එම නිසා නැවත ප්‍රවාහනය, භූවිෂමතාවය හා කාලගුණික තත්ත්වය සැලකිල්ලට ගෙන 10% අපතයක් ඇස්තමේන්තු වලට ඇතුලත් කර ඇත. තවද මෙම ව්‍යාපෘතියන්හි ඉඩම් අත්පත් කරගැනීමක් සිදු කරනු නොලබන අතර පවතින මාර්ග සීමාවන් තුල ඉදිකිරීම් කටයුතු සිදු කරනු ලබයි. එම නිසාද ද්‍රව්‍ය හානි වීමක් සිදු වේ. තවද දැනට ක්‍රියාත්මක සහ ක්‍රියාත්මක වූ අනෙකුත් ග්‍රාමීය මාර්ග ව්‍යාපෘතීන් තුල අනුගමනය කරනු ලබන ද්‍රව්‍ය හානි වීම සම්බන්ධව ඇති ක්‍රියාමාර්ගද සැලකිල්ලට ගෙන අඩුම අගයක් සහිතව ඉහත ප්‍රතිශතය ඇස්තමේන්තු සකස් කරන අවස්ථාවේ යොදාගෙන ඇත. මෙම ග්‍රාමීය මාර්ග ව්‍යාපෘතිය Lump Sum කොන්ත්‍රාත් ක්‍රමය යටතේ කොන්ත්‍රාත් පිරිනමා කරගෙන යනු ලබයි. එහිදී කොන්ත්‍රාත් සමාගම සමඟ මූලිකව එකඟ වූ කොන්ත්‍රාත් මුදලක් (Contract Amount) මත එකඟ වූ කාර්ය භාර්යන් (Defined Scope) කිරීම සඳහා ගිවිසුම් ගතවී ඇත. තවද කොන්ත්‍රාත් පිරිනැමීමට ප්‍රථම ඉදිරිපත් වූ කොන්ත්‍රාත්කරුවන්ගෙන් වට්ටම් මුදලක් (Discount Amount) ඉංජිනේරු ඇස්තමේන්තු මත ලබාගනු ලබයි. මෙහිදී කොන්ත්‍රාත්කරුවන් ඉංජිනේරු ඇස්තමේන්තුව මත සකස් කරනු ලබන මුළු කොන්ත්‍රාත් මුදල වෙනුවෙන් එම වට්ටම් ලබාදෙනු ලබන අතර එහිදී ඉංජිනේරු ඇස්තමේන්තුවට ඇතුලත් කර ඇති වැඩ ප්‍රමාණයන්ද ද්‍රව්‍ය හානි සඳහා වන ප්‍රමාණයන්ද ඇතුළුව සියළුම කාරණා සැලකිල්ලට ගෙන වට්ටම් ලබා දීම සිදු කරනු ලබයි. එම ක්‍රමවේදය අනුව මෙම ව්‍යාපෘතීන් සියල්ල ඉංජිනේරු ඇස්තමේන්තුවට වඩා අඩු කොන්ත්‍රාත් මුදලක් යටතේ ප්‍රදානය කර ඇත. මෙම කරුණු අනුව ඇස්තමේන්තුව සකස් කිරීමේදී ද්‍රව්‍ය හානි සම්බන්ධව සලකනු ලැබූ 10% ප්‍රතිශතය මත කිසිදු පාඩුවක් ආයතනයට හෝ රජයට සිදු වී නොමැත.

		නමුත් මහාමාර්ග අමාත්‍යාංශයේ ලේකම්තුමා, මහා මාර්ග අමාත්‍යාංශ නිලධාරීන් සහ විගණන අංශ සමඟ 2021.03.29 දින අමාත්‍යාංශයේදී සිදුකරන ලද සාකච්ඡාවේ ඇතිකරගත් එකඟතාවයන් පරිදි ඉහත ප්‍රතිශතය 10% සිට 5% දක්වා අඩු කිරීම සලකා බැලීමට කටයුතු කරගෙනයනු ලබයි. ඉහත කරුණු වලට අමතරව එම Lump Sum යටතේ ප්‍රදානය කර ඇති කොන්ත්‍රාත් සඳහා ඉහත ආකාරයේ වෙනස් කිරීම් වෙනුවෙන් කොන්ත්‍රාත්කාර සමාගම් ඔවුන්ගේ විරෝධය ප්‍රකාශ කර ඇත. මෙම මාර්ග සංවර්ධනයේදී මාර්ගය සමඟ සම්බන්ධවන ප්‍රවේශයන් ඉදිකිරීමද, මාර්ගයේ වංගු සහිත ස්ථාන වැඩි පළලකින් ඉදිකිරීමද වැනි කටයුතු වෙනුවෙන් අතිරේක ප්‍රදේශ සඳහා 5% ක ප්‍රමාණයක් වෙන් කොට ඇත. මෙම ඉදිකරනු ලබන බොහෝමයක් මාර්ග ග්‍රාමීය මාර්ග වන බැවින් එම මාර්ග භාවිතා කරනු ලබන නිවැසියන් සහ අනෙකුත් පාර්ශවයන් වෙනුවෙන් මෙවැනි පහසුකම් ලබාදීම අත්‍යාවශ්‍යව සිදුවිය යුතු කරුණකි. මෙම සියළුම ව්‍යාපෘතීන් සඳහා මහාමාර්ග අමාත්‍යාංශය මගින් ප්‍රසිද්ධ කරනු ලබන මාර්ග සංවර්ධන අධිකාරියෙහි ඇස්තමේන්තු වෙනුවෙන් යොදාගනු ලබන මිල ගණන් යටතේ (HSR) ඇස්තමේන්තු සකස් කර ඇත. එසේ සිදු කිරීම සඳහා අමාත්‍ය මණ්ඩල අනුමැතිය ලැබී ඇත. මෙම පරීක්ෂාවට ලක්කරනු ලැබූ ව්‍යාපෘතීන් වලට අදාල අවසන් ගෙවීම් මේ දක්වා සිදුවී නොමැති අතර Lump Sum කොන්ත්‍රාත් ක්‍රමවේදය තුල ගෙවීමට ප්‍රථම ඇස්තමේන්තුව සංශෝධනය විය යුතුය. දැනට එම ඇස්තමේන්තු සංශෝධනය කිරීම කරගෙන යනු ලබයි. මෙම ව්‍යාපෘතිය ග්‍රාමීය මාර්ග සංවර්ධන ව්‍යාපෘතියක් ලෙස මූලික වශයෙන් ක්‍රියාත්මක කරනු ලබන අතර කොන්ත්‍රාත් පිරිනැමීම Lump Sum කොන්ත්‍රාත් ප්‍රධානය කිරීමේ ක්‍රමය යටතේ සිදුකර ඇත. ඒ අනුව ව්‍යාපෘතියේ ගෙවීම් නිර්දේශ කිරීම එකඟ වූ කොන්ත්‍රාත් මුදල (Contract Amount) වන ව්‍යාපෘතියේ ප්‍රගතිය සමඟ ගණනය කරනු ලබන සන්ධිස්ථාන ප්‍රතිශතයක් (Milestone Payment) ලෙස නිර්දේශ කරනු ලබයි. මෙම වැඩ කරගෙන යනු ලබන ව්‍යාපෘතීන් වෙනුවෙන් සිදුකරනු ලබන ගෙවීම් සංශෝධනයන්, මහා මාර්ග අමාත්‍යාංශයේදී විගණන අංශ සමඟ සිදුකරනු ලැබූ සාකච්ඡාවේදී ඇතිකරගත් එකඟතාවයන් මත ඉහත ක්‍රම වේදය තුල අවසන් ගෙවීමට ප්‍රථමව සිදු කරනු ලබයි. මාතර දිස්ත්‍රික්කය තුල ක්‍රියාත්මක පස්ගොඩ හැව්ඹිවිට මාර්ගය සංවර්ධනය කිරීමේදී අනුමත වැඩ විෂයට අනුව ABC මිශ්‍ර ගල් සඳහා 150 mm අවම ඝනකමක් සහිත ස්ථරයක්ද එය මත අවශ්‍ය උත්තලය (Camber) පවත්වා ගැනීම සඳහා 50 mm අමතර ABC ප්‍රමාණයක්ද ඇතුලත්ය. මාර්ග ඉදිකිරීම් අධීක්ෂණයේදී අතුරන ලබන පලමු ස්ථරය වෙනුවෙන් ඝනකම 150 mm ක් පවතීද යන්න පරීක්ෂා කරන අතර මාර්ග තලයේ උත්තලය (Camber) එය මත ක්‍රමානුකූලව පවත්වා ගනු ලබයි. මෙහිදී මාර්ගයේ ඇති වංගු සහිත සහ අනෙකුත් භූවිෂමතා ලක්ෂණ අනුව උත්තලය, මාර්ග තලය වන '0' සිට අවශ්‍ය ආනතිය සහිත උස දක්වා වෙනස් විය හැක. ඒ අනුව සම්පූර්ණ ABC ස්ථරයේ මෙම ඝනකම ආනතිය සමඟ 150 mm සිට 200 mm හෝ ඊට වැඩිවිය හැක. එම නිසා අදාල වැඩ විෂය අනුව නිසි ප්‍රමිතියෙන් යුක්තව මාර්ගයේ ABC මිශ්‍රණය අතුරා ඇති අතර එය මත ඉදිකිරීම් සඳහා අනුමත ප්‍රමාණ

		පමණක් කොන්ත්‍රාත් කරුට ගෙවා ඇත. මෙහිදී ප්‍රමිතියෙන් තොර ඉදිකිරීමක් හෝ අමතර ගෙවීමක් සිදු වී නොමැත. මේ වන විට පළාත් කාර්යාල වෙත ලබාදුන් උපදෙස් අනුව කටයුතු කරමින් පවතී.

2.3 වෙනත් කරුණු

ඡේද අංකය	විගණන ඡේදය	පිළිතුරු
(අ)	අධිකාරිය සතු පරිපාලිත සමාගම් අතුරින් අධිවේගී මාර්ග ප්‍රවාහන සමාගම 2016 සිට මූල්‍ය ප්‍රකාශන විගණනය වෙත ඉදිරිපත් කර නොතිබුණි. අධිකාරිය සතු පරිපාලිත සමාගම් අතුරින් මහ නැගුම ඉදිකිරීම් හා යන්ත්‍රෝපකරණ සමාගමේ මූල්‍ය ප්‍රකාශන පිළිබඳව විගණන මතය 2017 වර්ෂයේ සිට ව්‍යාවනය වෙමින් පවතින අතර, මහ නැගුම උපදේශන සහ ව්‍යාපෘති කළමනාකරණ සේවා සමාගමේ විගණන මතය ද 2019 වර්ෂයේ ව්‍යාවනය විය. එසේම, 2007 අංක 07 දරන සමාගම් පනතේ 133 වගන්තිය ප්‍රකාරව, සමාගමක් විසින් සෑම වර්ෂයකට වරක්ම කොටස්කරුවන්ගේ වාර්ෂික මහා සභා රැස්වීම පැවැත්විය යුතු වුවත්, අධිකාරියට අයත් සියලු සමාගම් ඊට අනුකූලව කටයුතු කර නොතිබුණි. තවද, සමාගම්වල මූල්‍ය, පරිපාලන, මිළදී ගැනීම හා මෙහෙයුම් කටයුතු සම්බන්ධයෙන් විධිමත් හා ඒකාකාරී බවක් ඇතිකරනු පිණිස අදාල ක්ෂේත්‍ර සම්බන්ධයෙන් ආකෘතිකමය රාමුවක් හෝ මාර්ගෝපදේශයක් හඳුන්වා දීමට අධිකාරිය හා රේඛීය අමාත්‍යාංශය මැදිහත්ව කටයුතු කර නොතිබූ අතර ඒ ඒ සමාගම්වල අධ්‍යක්ෂ මණ්ඩල තීරණ මතම කටයුතු කර තිබුණි.	පරිපාලිත සමාගම් වල විගණන මතය සම්බන්ධයෙන් අදාල සමාගම් සමඟ සාකච්ඡා කර විගණන මතයට හේතු වූ කරුණු නිරවුල් කර ගන්නා ලෙස උපදෙස් දී ඇත. මහ නැගුම උපදේශන සහ ව්‍යාපෘති කළමනාකරණ සේවා සමාගමේ 2020 සහ 2021 මූල්‍ය වර්ෂයන් සඳහා තත්ත්වාගණනය කරන ලද විගණන මතයක් ලැබුණි. 2007 අංක 07 දරන සමාගම් පනතේ 133 වගන්තිය ප්‍රකාරව, සමාගමක් විසින් සෑම වර්ෂයකට වරක් පවත්වනු ලබන කොටස්කරුවන්ගේ වාර්ෂික මහා සභා රැස්වීම් සම්බන්ධයෙන් ලිපි අංක RDA/DF/332 හා 2022.06.30 දිනැති ලිපිය මගින් අදාල සමාගම් දැනුවත් කර ඇත. මූල්‍ය, පරිපාලන, මිළදී ගැනීම් හා මෙහෙයුම් කටයුතු සම්බන්ධයෙන් මාර්ග සංවර්ධන අධිකාරියේ සභාපතිතුමාගේ අංක RDA/CH/Maga Neguma Co., හා 2022.04.20 දිනැති ලිපිය මගින් උපදෙස් ලබා දී ඇත.
(ආ)	සමාලෝචිත වර්ෂයේ දෙසැම්බර් 31 දිනට නොපියවා ඇති සමස්ථ ණය ශේෂය රු.මිලියන 359,479 ක් වූ අතර එය රු.මිලියන 268,313 ක බැංකු ණය වලින් හා රු.මිලියන 91,166ක ණයකර වලින් සමන්විත විය. මාර්ග කිලෝමීටර් 100,000 වැඩසටහන, මධ්‍යම අධිවේගී මාර්ගය ඉදිකිරීම, මහා මාර්ග පුළුල් කිරීම හා වැඩිදියුණු කිරීම හා අධිකාරියේ කාරක ප්‍රාග්ධන අවශ්‍යතා වෙනුවෙන් මෙම ණය ලබාගෙන තිබූ අතර ණය සඳහා පොළිය බර තබන ලද ප්‍රාථමික ණය අනුපාතයට උපරිම	විගණන නිරීක්ෂණය හා එකඟ වේ. අධිකාරිය විසින් ලබාගන්නා ලද සියලුම දේශීය බැංකු ණය මුදල් මහා භාණ්ඩාගාරයේ අනුමැතිය ඇතිව භාණ්ඩාගාර ඇපකර (Treasury Guaranty) මත ලබා ගන්නා ලදී.

	වශයෙන් සියයට 2 සිට 2.8 වැනි පරාසයක අගයක් එකතුකොට පොළිය නියම කොට තිබුණි. මෙම සියලු ණය ලබා ගැනීමේ දී භාණ්ඩාගාර ඇපකර නිකුත් කර තිබුණි.	
(ඇ)	කොළඹ කටුනායක අධිවේගී මාර්ගයේ ඉලෙක්ට්‍රොනික ගාස්තු අය කිරීම සඳහා 2014 දෙසැම්බර් 18 දින මාර්ග සංවර්ධන අධිකාරිය හා ලංකා බැංකුව සමඟ එළඹී ගිවිසුමේ ගිවිසුම්ගත කාලය 2020 ජුනි 08 දිනෙන් අවසන් වී තිබුණ ද, නව ගිවිසුමකට එළඹීමට කටයුතු කර නොතිබුණි. එසේම, මෙම අධිවේගී මාර්ගයේ ඉලෙක්ට්‍රොනික ගාස්තු ගෙවීමේ ක්‍රමය භාවිතා කරන්නන් දිරිමත් කිරීමට අයකරන ගාස්තු වලින් සියයට 10 ක වට්ටමක් ඉලෙක්ට්‍රොනික ගාස්තු ගෙවීමේ ක්‍රමයට මාරු වන මුල් මාස 06 ක කාලයක් දක්වා පමණක් එම භාවිතකරුවන්ට ලබා දීමට අවසර ලබා දී තිබුණි. මාස 06 ඉකුත් වීමෙන් පසු ද මෙම සියයට 10 වට්ටම ලබා දීම හේතුවෙන් 2021 සහ 2020 වර්ෂ වලට අදාළව පිළිවෙළින් රු.මිලියන 29 ක් සහ රු. මිලියන 27 ක් වශයෙන් එකතුව රු.මිලියන 56 ක් අධිකාරියට අහිමිව තිබුණි. තවද, දෛනිකව එකතු වන ඉලෙක්ට්‍රොනික ගාස්තු අධිකාරියේ ආදායම් රැස්කිරීමේ ගිණුමට ප්‍රේෂණය වීමේ කාල ප්‍රමාදයක් ද පැවතුණි.	නව ගිවිසුමක් සැකසීම සඳහා මාර්ග සංවර්ධන අධිකාරියේ අධ්‍යක්ෂ ජනරාල් විසින් ඇගයීම් කමිටුවක් පත්කරන ලද අතර එම කමිටුව හා ලංකා බැංකුව අතර 2021.04.22 හා 2021.07.28 දිනවල පැවති රැස්වීම්වලදී මාර්ග සංවර්ධන අධිකාරිය මගින් ගණුදෙනු පිරිවැය රු. 6.00 සිට 2.50 දක්වා අඩුකරන ලෙස ඉල්ලීම් කරන ලද අතර ඒ සඳහා දෙපාර්ශවය අතර එකඟතාවයක් ඇති නොවීය. ලංකා බැංකුව විසින් එහිදී පවසන ලද්දේ එම කරුණ සම්බන්ධයෙන් ඔවුන්ගේ ඉහළ කළමනාකාරීත්වය සමඟ මෙය සාකච්ඡා කර පිළිතුරක් ලබා දෙන බවයි. එම අන්තර්වාර කාල සීමාවේදී ලංකා බැංකුව මගින් සපයනු ලබන සේවාවන් අඛණ්ඩව එලෙසම තවදුරටත් ලබා දෙන බැවින් හා ඔවුන්ගේ සේවය නොමැතිව ETC පද්ධතිය ක්‍රියාත්මක කල නොහැකි බැවින් නව ගිවිසුම් අත්සන්කර සම්පූර්ණ කරන තෙක් 2014 දෙසැම්බර් මස එකඟ වූ ගණුදෙනු පිරිවැයම් එනම් රු.6.00 ක් තවදුරටත් අඛණ්ඩව පවත්වාගෙන යයි. එමෙන්ම මාර්ග සංවර්ධන අධිකාරියේ නීති අංශය මගින් ගිවිසුමෙහි සඳහන් කොන්දේසිවල ප්‍රායෝගික හා වලංගුභාවය පරීක්ෂාකල යුතු බැවින් ද රටේ පැවති කොවිඩ් වසංගත තත්වය හේතුවෙන් ද දෙපාර්ශවයටම මෙම ගිවිසුමට එළඹීමට පමා විය. අදාල ගිවිසුම් නීති අංශය විසින් පරීක්ෂා කරන ලද අතර එම නිරීක්ෂණ 2022.09.13 දින අධ්‍යක්ෂ අධිවේගී මාර්ග මෙහෙයුම් නඩත්තු හා කළමනාකරණ අංශය වෙත යොමු කරන ලදී. ඉන්පසු 2022.10.17 දින පැවති සාකච්ඡාවේදී එම නිරීක්ෂණ, අත්සන් කිරීමට යෝජිත ගිවිසුමට ඇතුලත් කර ලංකා බැංකුව වෙත යොමු කරන ලෙස තීරණය කරන ලද අතර ලංකා බැංකුව විසින් නැවතත් එය සංශෝධනය කර අධිකාරිය වෙත එවා ඇත. එසේ එවන ලද සංශෝධන සඳහා නිරීක්ෂණ නීති අංශය විසින් 2023.01.17 දින අධ්‍යක්ෂ අධිවේගී මාර්ග මෙහෙයුම් නඩත්තු හා කළමනාකරණ අංශය වෙත යොමු කර ඇත. විද්‍යුත් ගෙවීම් කටයුතු පද්ධතියේ මූල්‍යමය ක්‍රියාකාරී පද්ධතිය ලංකා බැංකුවේ මූල්‍යමය ක්‍රියාකාරී පද්ධතිය සමඟ එක්ව ක්‍රියාත්මක වන ස්වයංක්‍රීය ක්‍රියාවලියකි. ලංකා බැංකුව වෙතින් සැසඳුම් ගොනුව ලැබීමෙන් පසු භාවිත ගොනුව උත්පාදනය කර එය ලංකා බැංකු පද්ධතියට මාරු කිරීම මිනිස් මැදිහත්වීමකින් තොරව ස්වයංක්‍රීයව සිදු වේ. සති අන්ත හා බැංකු නිවාඩු දිනවල ලංකා බැංකුව වෙත යවනු ලබන භාවිත ක්‍රියාත්මක වනුයේ බැංකුවේ ඊළඟ කාර්යාල දිනයේය. එබැවින් දිනක හෝ දෙකක පමණ ප්‍රමාදයක් එමගින් සිදුවේ. ඒ හැර සැසඳුම් ගොනුවේ හා ETC පද්ධතියේ දත්ත නොගැලපීම් හේතුවෙන් ස්වයංක්‍රීය ක්‍රියාවලියේ කොටසක් ලෙස භාවිත ගොනුව උත්පාදනය කිරීමට අසමත් වේ. එසේ වුවහොත් ඒ සඳහා මූලික හේතුව, ලංකා බැංකුවේ තාක්ෂණික කණ්ඩායමේ සහාය ඇතිව විශ්ලේෂණය කළ යුතු අතර ඉන්පසු අදාල දිනය සඳහා භාවිත ගොනුව උත්පාදනය සඳහා ක්‍රියාවලිය ආරම්භ කිරීමට තාක්ෂණික පුද්ගල මැදිහත්වීම අවශ්‍ය

		වේ. එබැවින් ගැටලුව නිවැරදි කිරීමට ගතවන කාලය තත්ත්වය අනුව වෙනස් වේ. ප්‍රමාදය අවම කිරීම සඳහා හැකි ඉක්මනින් ගැටළු නිවැරදි කිරීමට තාක්ෂණික කණ්ඩායම් සැමවිටම උපරිම උත්සාහයක් දරයි.
(ඇ)	මාර්ග සංවර්ධන අධිකාරියේ ප්‍රධාන අංශ වශයෙන් සැලකෙන පාලන අංශය, මූදල් අංශය, පුහුණු අංශය, ප්‍රසම්පාදන අංශය, ඉඩම් අංශය යනාදී උපකාරක අංශ හා ඉදිකිරීම් අංශය, නඩත්තු හා කළමනාකරණ අංශය, සැලසුම් අංශය, මහා මාර්ග සැලසුම් අංශය, පාලම් නිර්මාණ අංශය යනාදී මෙහෙයුම් අංශ වලින් පාලම් නිර්මාණ අංශය හැර අනෙකුත් කිසිදු අංශයක් එකී අංශවල පරිපාලන හා මෙහෙයුම් කටයුතු වලට අදාල අත්පොත් සකස් කර නොතිබුණි. අධිකාරියේ අංශවල අපේක්ෂිත අරමුණු ඉටුකර ගැනීම සහතික කරනුවස් කාර්සාධන දර්ශක හඳුනාගෙන නොතිබූ අතර කිසිදු අංශයක කාර්ය සාධන ඇගයීම් කම්ටුවක් හෝ පිහිටුවා නොතිබුණි.	මාර්ග සංවර්ධන අධිකාරියේ සභාපතිතුමාගේ කාර්යාලයේ විගණන වාර්තාවේ සඳහන් නිරීක්ෂණයන් සම්බන්ධයෙන් අධ්‍යක්ෂකවරුන් සමග පැවති සාකච්ඡාවේදී එකිනෙක මෙහෙයුම් අංශ සඳහා භාවිතා කල යුතු මාර්ගෝපදේශ පිළියෙළ කිරීම සඳහා කමිටුවක් පත් කිරීමට තීරණය කරන ලදී. ඒ අනුව අදාල කමිටුව විසින් එකිනෙක අංශ වල මෙහෙයුම් හා පරිපාලන කටයුතු වලට අදාලව තිබියයුතු මාර්ගෝපදේශ හා අත්පොත් පිළිබඳ අධීක්ෂණයක් සිදු කොට අදාල මාර්ගෝපදේශ හා අත්පොත් පිළියෙළ කිරීමට තීරණය කරන ලදී. දැනට පවතින සංවිධාන ව්‍යුහය වෙනුවට ඉදිරි සේවා අවශ්‍යතාවය මත නව සංවිධාන ව්‍යුහයක් යෝජනා කර ඇත. සමහර අංශ සඳහා නව තනතුරු යෝජනා කර ඇති අතර ඊට අදාළව බඳවා ගැනීමේ පටිපාටිය සකස් ක කර ඇත. ඉදිරි සේවා අවශ්‍යතාවය මත තනතුරු සේවක සංඛ්‍යාව සහ සුදුසුකම් ඇතුළත් කර ඊට අනුව බඳවා ගැනීමේ පටිපාටිය සකස් කර ඇති බැවින් පරිපාලන හා මෙහෙයුම් කටයුතු වලට අදාල අත්පොත් සකස් කිරීමේ දී බඳවා ගැනීමේ සුදුසුකම් ක්‍රමවේදයන් නීති රීති රෙගුලාසි සහ අනුමත සේවක සංඛ්‍යාව වැනි සියලු කරුණු ඇතුළත් කර සකස් කළ යුතුය. ඒත් කළමනාකරණ සේවා දෙපාර්තමේන්තුවේ අනුමැතිය ලැබෙන තෙක් පරිපාලන හා මෙහෙයුම් කටයුතු වලට අදාළ අත්පොත් සකස් කිරීම් කළ නොහැකි අතර ඒ සඳහා අනුමැතිය ලැබීමෙන් පසුව අදාල අත්පොත් සකස් කිරීමට කටයුතු කරනු ලැබේ.
(ඉ)	2021 දෙසැම්බර් 31 දිනට අනුමත කාර්ය මණ්ඩලය 11,277 ක් වූ අතර සමස්ථ පුරප්පාඩු සංඛ්‍යාව 1,044 ක් ද, නිළධාරීන් 630 දෙනෙකුගේ අතිරික්තයක් ද පැවතුණි. මෙයින් ජ්‍යෙෂ්ඨ කළමනාකරණ මට්ටමේ තනතුරු 26 ක පුරප්පාඩු පැවති අතර, තනතුරු 04 ක අතිරික්තයන් ද පැවතුණි. 2021 වර්ෂයේ සේවක වැටුප් හා වේතන වෙනුවෙන් අධිකාරිය දරා තිබූ සමස්ථ වියදම රු.මිලියන 11,877 ක් වූ අතර, ඒ සඳහා මහා භාණ්ඩාගාරයෙන් ලබා දී තිබූ ප්‍රතිපාදන වලට අමතරව රු.මිලියන 4,129 ක් අධිකාරියේ අරමුදල් වලින් වැටුප් හා වේතන සඳහා දරා තිබුණි. අධිකාරිය සඳහා මේ දක්වා කළමනාකරණ සේවා දෙපාර්තමේන්තුව අනුමත කරන ලද බඳවාගැනීමේ පටිපාටියක් නොතිබුණි.	අදාල දිනට අනුමත සේවක සංඛ්‍යාව 11277 හා එකඟ වේ. ජ්‍යෙෂ්ඨ මට්ටමේ තනතුරු 26 ක අතිරේක අධ්‍යක්ෂ ජනරාල් තනතුරු 4 ක් අධ්‍යක්ෂ තනතුරු 7 ක් ව්‍යාපෘති අධ්‍යක්ෂ තනතුරු 5 ක් අතිරේක අධ්‍යක්ෂ තනතුරු 9 ක් සහ පළාත් හාර අධ්‍යක්ෂ තනතුරක පුරප්පාඩු පවතින අතර එකී පුරප්පාඩු සම්පූර්ණ කිරීම සඳහා ඉදිරියේදී කටයුතු කරනු ලැබේ. ව්‍යාපෘති අධ්‍යක්ෂ තනතුරු සඳහා පත්කිරීම් සිදුකරනු ලබන්නේ අමාත්‍යාංශයේ ලේකම් විසිනි. ඒ සම්බන්ධව අනුමත සේවක සංඛ්‍යාව අමාත්‍යාංශය වෙත කළමණාකරන සේවා දෙපාර්තමේන්තුව විසින් ලබාදී ඇති අතර මෙම තනතුරු මාර්ග සංවර්ධන අධිකාරිය මගින් ලබා දුන් පත්වීම් නොවේ. ඒ අනුව ජ්‍යෙෂ්ඨ මට්ටමේ තනතුරු 4 අතිරික්තයක් වීම අධිකාරියට අදාල නොවේ. සමස්ථ පුරප්පාඩු සංඛ්‍යාව 1044 ක් පවතින බව හා එකඟ වේ. සේවයේ අවශ්‍යතාවය පරිදි මෙකී පුරප්පාඩු සඳහා බඳවා ගැනීමට ඉදිරියේදී කටයුතු කරනු ලැබේ. මාර්ග සංවර්ධන අධිකාරියේ කාර්යය ප්‍රමාණය ප්‍රසාරණය වීම හේතුවෙන් ඒ සඳහා වූ සේවයේ අවශ්‍යතාවය මත අදාල කාර්යයන් ඉටුකර ගැනීම සඳහා බඳවා ගෙන ඇති සේවක ප්‍රමාණය මත අතිරික්ත සේවක සංඛ්‍යාවක් ඇතිවී ඇත. මේ සම්බන්ධයෙන් කළමණාකරණ සේවා දෙපාර්තමේන්තුව දැනුවත් කර ඇත.

		තවද දැනට අනුමත පවතින සේවක සංඛ්‍යාව 2009 වසරේ දී අනුමත කර ඇත්තේ එවකට පැවති කාර්යය ප්‍රමාණය මත වුවද මේ වන විට එකී කාර්යයන් විශාල ප්‍රමාණයක් ප්‍රසාරණය වී ඇත. වැටුප් ගෙවීම සඳහා අධිකාරියේ මුදල් භාවිතා කිරීම පහත පරිදි වේ. • අධිවේගී මාර්ග සේවකයින්ගේ වැටුප් ගෙවීම හා ආශ්‍රිත වියදම් සඳහා මිලියන 1,839.89 ක් අධිවේගී මාර්ග ආදායම යොදාගෙන ගෙවීම් කර ඇත. • ඊට අමතරව ආයෝජන පොළී ආදායම මිලියන 699.75 භාවිතා කර ඇත. • වැටුප් ගෙවීම සඳහා අවශ්‍ය ඉතිරි මුදල් අධිකාරිය විසින් උපයන ලද අනෙකුත් ආදායම් තුලින් ලබා ගෙන ඇත.
(ඊ)	එවකට ආර්ථික සංවර්ධන අමාත්‍යාංශය විසින් 2012/13 වර්ෂවල දකුණු පළාත තුළ ඉටු කරන ලද ව්‍යාපෘති වෙනුවෙන් අධිකාරිය වෙත ආර්ථික සංවර්ධන අමාත්‍යාංශය, ආයෝජන මණ්ඩලය වෙතින් පිළිවෙලින් රු.මිලියන 306 ක්, රු.මිලියන 124 ක් තවදුරටත් අය වී නොතිබුණ නමුත්, එම ණය අයකර ගැනීමට අවශ්‍ය පියවර අධිකාරිය විසින් ගෙන නොතිබුණි.	ආර්ථික සංවර්ධන අමාත්‍යාංශය 2022.12.31 දිනට ගැලපීම් කිරීමට අවශ්‍ය අනුමැතීන් සඳහා ලිපි යොමු කර ඇත. ආයෝජන මණ්ඩලය ආයෝජන මණ්ඩලය විසින් ඉල්ලා ඇති නිම කරන ලද මාර්ග පරීක්ෂා කිරීම සඳහා අවශ්‍ය පරීක්ෂණ වාර්තා 2022.01.21 දින ආයෝජන මණ්ඩලය වෙත යවා ඇති අතර එම වාර්තා ප්‍රමාණවත් නොවන බව ඔවුන් විසින් දන්වා ඇත. එම නිසා 2022.03.16 වන දින එම මාර්ග වලට අදාලව තිබූ සියලුම පරීක්ෂණ වාර්තා ආයෝජන මණ්ඩලය වෙත නැවත යවා ඇති බව පළාත්භාර අධ්‍යක්ෂ-දකුණ විසින් දන්වා ඇත. කෙසේ වෙතත් මේ සම්බන්ධයෙන් ආයෝජන මණ්ඩලය මඟින් ප්‍රතිචාර දැක්වීම හා ක්‍රියාකිරීම ඉතා මන්දගාමී ස්වභාවයක් පෙන්නුම් කරන අතර අධිකාරිය විසින් නිරන්තරයෙන් අයවිය යුතුව ඇති රු. මිලියන 124 ක මුදල අයකර ගැනීමට අවශ්‍ය දැනුවත් කිරීම් දුරකථනය මඟින් ද සිදුකරනු ලබයි. ආයෝජන මණ්ඩලය මඟින් ප්‍රතිචාර දක්වා නොමැති බැවින් නැවත සිහිකැඳවීම් යොමු කිරීමට නියමිතය.
(උ)	අධිකාරිය සතු පිරිවැය රු.මිලියන 122 ක් වූ වාහන 45 ක් සහ කිසිදු පිරිවැයක් සඳහන් නොවූ වාහන 15 ක් වශයෙන් වාහන 60 ක් පිළිවෙලින් මහා මාර්ග අමාත්‍යාංශයට සහ රාජ්‍ය අමාත්‍යාංශය වෙත හා ජනාධිපති ලේකම් කාර්යාලය වෙත ලබා දී තිබුණි. තවද අධිවේගී මාර්ග මෙහෙයුම්, නඩත්තු හා කළමනාකරණ අංශය අධිවේගී මාර්ග පොලිස් කොට්ඨාශය සඳහා වාහන 49 ක් අධිවේගී මාර්ග පොලිස් කොට්ඨාශය සඳහා ම ලබාදී තිබූ අතර ඒ සඳහා දරණ ලද වියදම රු.මිලියන 189.5 ක් විය. එමෙන්ම මාර්ග සංවර්ධන අධිකාරියට අයත් අධිකාරියේ මූලස්ථාන ගොඩනැගිල්ලේ 72,400 ක වර්ග අඩි ප්‍රමාණයක් මාර්ග අමාත්‍යාංශය සහ රාජ්‍ය අමාත්‍යාංශය භාවිතා කරනු ඊට අදාළ වාර්ෂික ක්ෂය රු.මිලියන 11.87 ක් හා ඒ	විගණන නිරීක්ෂණයේ බාහිර ආයතන වලට ලබා දුන් වාහන සංඛ්‍යාව 60 ක් ලෙස දක්වා තිබුණද එම සංඛ්‍යාව 44 ක් ලෙස නිවැරැදි විය යුතුය. වාහන 44 ට අදාල වර්තමාන තත්ත්වය අනුව වාහන 06 ක් මේ වනවිට අපහරණය කර ඇත. තවත් වාහන 02 ක් පවරා ඇති අතර එක් වාහනයක් 1989 දී පැහැර ගැනීමට ලක්ව ඇත. වාහන 10 ක් මාර්ග සංවර්ධන අධිකාරියේ නොයෙක් අංශවල සේවයේ යොදවා ඇති අතර වාහන 03 ක් අලුත්වැඩියාව හෝ අපහරණය සඳහා අඟුලාන යාන්ත්‍රික වැඩපළෙහි ගාල් කර ඇත. එම වාහන 44 න් 05 ක් ආයතන අවශ්‍යතාවය මත නිකුත් කර ඇති අතර පැරණි ලොරි හා කැබ් රථ 05 ක් වර්ෂ 2012 දී අත්සන් කරන ලද ගිවිසුමක් මඟින් මාසික කුලිය ගැනීමේ පදනම මත මගනැගුම යන්ත්‍රෝපකරණ හා පුද්ගලික සමාගම් වෙත නිදහස් කර ඇත. තවද ඉහත වාහන අධිවේගී මාර්ග මෙහෙයුම් කටයුතු සඳහා සුදුසු වාහන නොවන අතර එම අංශයේ සේවා අවශ්‍යතා මත සුදුසු වාහන කුලීපදනම් මත ලබාගෙන ඇත.

	අනුව පැන නගින විදුලිය, ජලය, දුරකථන, ආරක්ෂක වියදම් හා ඉන්ධන වියදම් ඇතුළු පොදුකාර්ය වියදම්ද අධිකාරිය විසින් දරා තිබුණි.	අධිකාරිය විසින් කුලී ගාස්තු වශයෙන් දරා ඇති රු. මිලියන 189.5 අතුරින් රු. මිලියන 185.5 ක් අධිවේගී මාර්ග මෙහෙයුම්, නඩත්තු හා කළමනාකරණ අංශයන් වෙනුවෙන් දරා ඇත. මෙම මුදල වාහන සහ යන්ත්‍රෝපකරණ 152 ක් වෙනුවෙන් දරා ඇති අතර අධිවේගී මාර්ග මෙහෙයුම්, නඩත්තු හා කළමනාකරණ අංශවල මෙහෙයුම් කටයුතු අඛණ්ඩව පවත්වා ගෙන යෑම සඳහා වූ වාහන අවශ්‍යතාවය වෙනුවෙන් වාහන සහ යන්ත්‍රෝපකරණ 103 භාවිතා කර ඇති අතර වාහන ගමනාගමනයේ අධීක්ෂණ කටයුතු, රථවාහන අනතුරු සම්බන්ධයෙන් වන කටයුතු වඩා ආරක්ෂිතව සහ කාර්යක්ෂමව සිදු කිරීම සඳහා අධිවේගී මාර්ග පොලිස් කොට්ඨාශය සඳහා වාහන 49 භාවිතා කර ඇත. මේ සම්බන්ධයෙන් මුදල් අමාත්‍යාංශයේ ලේකම්ගේ අංක PFD/RED/REG/FR/2022 හා 2022.04.08 දිනැති ලිපියෙන් දන්වා ඇති පරිදි මගනැගුම මහ මැදුර ගොඩනැගිල්ල ආසියානු සංවර්ධන බැංකු ආධාර යටතේ ඉදිකර මාර්ග සංවර්ධන අධිකාරිය වෙත භාර දී ඇති අතර එම ණය වාරික ආපසු ගෙවනු ලබන්නේ මහා භාණ්ඩාගාරය විසින් වන බැවින් ද, වාර්ෂික අයවැයෙන් රු. මිලියන 7,500 ආසන්න ප්‍රමාණයක් ආයතනික සහාය සඳහා ලබා දෙන බැවින් ද ගොඩනැගිල්ලේ අමාත්‍යාංශය පරිහරණය කරන කොටස වෙනුවෙන් ගාස්තුවක් ගෙවීම හෝ පැවරීම අවශ්‍ය නොවන බව දන්වා ඇත. අමාත්‍යාංශය පරිහරණය කරන පරිශ්‍රය පැවරීමක් සිදු නොවන අතර මාර්ග සංවර්ධන අධිකාරිය වෙත ආයතනික සහය යටතේ වාර්ෂික අයවැය ඇස්තමේන්තු මඟින් සලසන ප්‍රතිපාදන මත ගොඩනැගිලි කුලිය නාමිකව ගණනය කර රේඛීය අමාත්‍යාංශයේ ගිණුම් වල ගිණුම් සටහනක් මඟින් හෙළිදරව් කිරීමට මහා භාණ්ඩාගාරය විසින් අමාත්‍යාංශය වෙත උපදෙස් දී ඇත. මාර්ග සංවර්ධන අධිකාරියට අයත් මූලස්ථාන ගොඩනැගිල්ලේ අමාත්‍යාංශය විසින් භාවිතා කරනු ලබන මහල් තුනට අදාලව දරනු ලබන නඩත්තු වියදම් හා උපයෝගිතා වියදම් (විදුලිය, ජලය, ආරක්ෂක වියදම් , සනීපාරක්ෂක හා නඩත්තු වියදම්) වෙනුවෙන් 2022 වර්ෂය සඳහා රු. මිලියන 13.0 ක් රේඛීය අමාත්‍යාංශය විසින් අධිකාරිය වෙත දී ඇත.
(ඌ)	මාර්ග සංවර්ධන අධිකාරියේ ඉදිකිරීම් අංශය විසින් ඉදිරිපත් කරන ලද තොරතුරු අනුව 2018 වර්ෂයේ සිට 2021 දෙසැම්බර් 31 දින දක්වා මාර්ග පුළුල් කිරීම හා වැඩිදියුණු කිරීම යටතේ රු. මිලියන 36,349 ක පමණ ඇස්තමේන්තුගත වටිනාකමක් සහිත කොන්ත්‍රාත් වැඩ 239 ක් ක්‍රියාත්මක කිරීමට සැලසුම් කර තිබුණි. මේ අතුරින් කොන්ත්‍රාත් 24 ක පමණක් 2021 දෙසැම්බර් 31 දිනට ඉදිකිරීම් කටයුතු අවසන් කර තිබූ අතර එය මුළු කොන්ත්‍රාත් ප්‍රමාණයෙන් සියයට 10 ක් පමණක් වේ. තවත් කොන්ත්‍රාත් 38 ක් කෙරිගෙන යන තත්වයේ පැවති අතර එක් කොන්ත්‍රාත්තුවක් අරමුදල් නොමැති නිසා අතරමඟ නතර කර තිබුණි.	2021/12/31 දිනට කොන්ත්‍රාත් 24ක ඉදිකිරීම් අවසන්කර තිබූ අතර එදිනට ඉදිකිරීම් කෙරෙමින් පැවති කොන්ත්‍රාත් 38 අතුරින් 8 ක ඉදිකිරීම් 2022-12-31 අවසන් කර ඇත. වැඩ කෙරෙමින් පවතින ව්‍යාපෘති 27 ක් වන අතර ව්‍යාපෘති 02 ක් අවබෝධතා ගිවිසුම් අත්සන් කිරීමට යෝජිතය. අනෙක් ව්‍යාපෘතිය ග්‍රාමීය මාර්ග හා පළාත් සභා මඟින් සිදු කරනු ලැබේ.

	තවත් කොන්ත්‍රාත් 32 ක් ප්‍රතිපාදන නොමැති වීම නිසා ප්‍රදානය කර නොතිබුණි.	
(එ)	2021 දෙසැම්බර් 31 දිනට හේතු දැක්වීමකින් තොරව රු.මිලියන 3,360.9 ක් රඳවාගෙන සිට තිබූ අතර රු. මිලියන 99.4 ක් කොන්ත්‍රාත්කරුවන් විසින් ඉල්ලුම් නොකිරීම නිසා රඳවා ගෙන තිබුණි. මාර්ගවල ඉදිකිරීම් ප්‍රමිතිය පිළිබඳ නැවත සමාලෝචනය කර විධිමත් පටිපාටි අනුගමනය කර මෙම ශේෂය ආදායමට ගැනීමට ක්‍රියාකල යුතු වූවත් 2021 දෙසැම්බර් 31 දිනට ගෙවිය යුතු රඳවා ගැනීම් මුදල් වලින් ලියා හැරීමට යෝජනා කරන ලද වටිනාකම රු.මිලියන 81.8 ක් විය.	හේතු දැක්වීමකින් තොරව රඳවා ගත් රු.මිලියන 3,360.9 න් රු.මිලියන 3033.15 මාර්ග කි. මී.100000 ව්‍යාපෘතියට අදාල වන අතර එම ව්‍යාපෘතියේ වැඩ මේ වන විට නවතා ඇත. ඉතිරි රු. මිලියන 327.75 න් ඉදිකිරීම් අංශයට අදාළව රු.මිලියන 93 න් රු. මිලියන 45.78 ක් ආදායමට ගැනීමට කටයුතු කර ඇති අතර රු. මිලියන 24.06 ක් නිදහස් කිරීම සඳහා ගෙවීම් වවුචර්පත් ලැබී ඇත. රු. මිලියන 3.88 කට අදාල රැඳවුම් මුදල් කෙරීගෙන යන ව්‍යාපෘති වලට අදාල වේ. පළාත් කාර්යාල හා රන් මාවත් ව්‍යාපෘතියට අදාළට රු.මිලියන 131.2 න් රු. මිලියන 6.68 ක් නිදහස් කර ඇති අතර රු. මිලියන 7.57 කමිටු නිර්දේශ මත ආදායමට ගෙන ඇත. අධිවේගී මාර්ග වලට අදාළව රු.මිලියන 15.6 න් 6.06ක් නිදහස් කර ඇත. ගෙවීම් අංශයට අදාළව රු.මිලියන 88 න් රු. මිලියන 0.27 ක් නිදහස් කර ඇති අතර රු. මිලියන 1.38 කමිටු නිර්දේශ මත ආදායමට ගෙන ඇත. කොන්ත්‍රාත්කරුවන් විසින් ඉල්ලුම් නොකිරීම නිසා රඳවාගත් රු. මිලියන 99.4 න් ඉදිකිරීම් අංශයට අදාළව රු.මිලියන 26.4 න් රු.මිලියන 1.78 කමිටු නිර්දේශ මත ආදායමට ගෙන ඇත. පළාත් කාර්යාල වලට අදාළව රු.මිලියන 53 න් හා රන් මාවත් ව්‍යාපෘතියට අදාළව රු. මිලියන 5.5 න් අදාළව රු. මිලියන 12.7 නිදහස් කර ඇත. කොන්ත්‍රාත්කරුවන් විසින් ඉල්ලුම් නොකිරීම නිසා රඳවාගෙන ඇති මුදල් සම්බන්ධයෙන් වූ තොරතුරු අදාල ප්‍රධාන ඉංජිනේරු සහ විධායක ඉංජිනේරුන්ගෙන් කැඳවා එම තොරතුරු පරීක්ෂා කර අදාල කොන්ත්‍රාත්කරුවන්ද දැනුවත් කර අදාල රඳවා ගැනීමේ මුදල් නිදහස් කිරීමට හෝ කමිටු නිර්දේශ මත ආදායමට ගැනීමට අවශ්‍ය කටයුතු අදාල ප්‍රධාන ඉංජිනේරු සහ විධායක ඉංජිනේරු වෙත දැන්වීමට කටයුතු කරනු ලැබේ.
	එසේම, 2021 දෙසැම්බර් 31 දිනට ගෙවිය යුතු රඳවා ගැනීම් මුදලින් ඉදිකිරීම් අංශය, පළාත් අධ්‍යක්ෂ කාර්යාල හා ගෙවීම් අංශයට අදාළව සිදු කරන ලද නියැදි පරීක්ෂාවේ දී කොන්ත්‍රාත් සමාගම් 04 කට අදාළව දෝෂ වගකීම් කාලය ද ඉක්මවා ඇති නමුත් ගෙවිය යුතු රඳවා ගැනීම් මුදල රු.මිලියන 95 ක් විය. මේ සම්බන්ධයෙන් නිසි විමර්ශණයක් කිරීමෙන් අනතුරුව ආදායමට ගැනීමට ක්‍රියාකර නොතිබුණි.	ඉදිකිරීම් අංශයට අදාලව මෙම ඡේදයේ සඳහන් කොන්ත්‍රාත් සමාගම් 04 අතුරින් 03ක් මගින් ක්‍රියාත්මක කරන ලද ව්‍යාපෘතින් බොහොමයක් (2016 වර්ෂයේ ප්‍රදානය කරන ලදි) දෝෂ වගකීම් කාලය අවුරුදු 3ක් බැවින් රඳවා ගත් මුදල කොන්ත්‍රාත්කරු වෙත ගෙවිය හැකිනම් ගෙවීම සඳහා වවුචර්පත් ඉදිරිපත් කරන ලෙසද නොඑසේ නම් මා.ස.අ. ආදායමට බැරකර ගැනීමට ඉදිරිපත් කරන ලෙස ප.හා. අධ්‍යක්ෂවරුන් වෙත දන්වන ලදි. ඒ අනුව ඉදිකිරීම් අංශයට අදාලව මෙම ඡේදයේ සඳහන් කොන්ත්‍රාත් සමාගම් 03 ට අදාලව රුපියල් මිලියන 14.69 කට අදාළ බිල්පත් පළාත්භාර අධ්‍යක්ෂකවරු ගෙවීම් නිර්දේශ කර බිල්පත් ඉදිරිපත් කර ඇති අතර රුපියල් මිලියන 2.24 කට අදාළ බිල්පත් ආදායමට ගැනීමට කටයුතු කර ඇත. ඉතිරි රඳවාගත් මුදල් සම්බන්ධයෙන් අදාල පළාත්භාර අධ්‍යක්ෂවරුන් හා අධ්‍යක්ෂවරුන් හරහා එම මුදල් නිදහස් කිරීමට, ආදායමට ගැනීමට අවශ්‍ය නිර්දේශ ලබා ගැනීමේ කටයුතු කරනු ලැබේ.

(ඒ)	2021 දෙසැම්බර් 31 දිනට කොන්ත්‍රාත් 26 ක වැඩ අවසන් කිරීමේ ඉලක්කගත දිනයන් ඉක්මවා ගොස් තිබූ අතර එකී කොන්ත්‍රාත් වල වැඩ ආරම්භ කිරීමේ අත්තිකාරම් සුරක්ෂණයන්ගේ වලංගු කාලය ද ඉක්මවා ගොස් තිබුණි. 2021 දෙසැම්බර් 31 දිනට එම කොන්ත්‍රාත් වලින් තවදුරටත් අයවිය යුතුව තිබූ අත්තිකාරම් ශේෂය රු.මිලියන 11.93 ක් විය. ඉහත කොන්ත්‍රාත් වලට අදාළ අත්තිකාරම් සුරක්ෂණ වල වලංගු කාලය දීර්ඝ කර ගැනීමට හෝ අවසානාත්මක වශයෙන් අත්තිකාරම් සුරක්ෂණය මුදල් කර ගැනීමට හෝ කළමනාකරණය කටයුතුකර නොතිබුණි. තවද 2021 දෙසැම්බර් 31 දිනට අයවිය යුතු වැඩ ආරම්භ කිරීමේ අත්තිකාරම් ශේෂයෙන් වසර 02 ත්, වසර 05 ත් අතර ශේෂය රු.මිලියන 53.25 ක් හා වසර 05 ඉක්මවා ඇති ශේෂය රු.මිලියන 58.11 ක් විය.	අයවිය යුතු වැඩ ආරම්භ කිරීමේ අත්තිකාරම් ශේෂය වන රු. මිලියන 11.93 න් රු. මිලියන 5.13 ක් මේ වන විට පියවාගෙන ඇත. ඉතිරි අයවිය යුතු වැඩ ආරම්භ කිරීමේ අත්තිකාරම් ශේෂය වන රු. මිලියන 6.8 ක මුදල - අංක RDA/MMC/CP/GOSL/2014/63 ව්‍යාපෘතියෙහි වර්තමාන තත්ත්වය පහත පරිදි වේ. පළාත්භාර අධ්‍යක්ෂ (ම.ප.) ගේ 2022.07.25 දිනැති ලිපි අංක RDA/CP/PD/F/122 මඟින් , කොන්ත්‍රාත් අංක RDA/DC/CP/GOSL/2019/08 හි බිල්පත් අංක 04 මඟින් මෙම අත්තිකාරම් මුදල අයකරගන්නා මෙන් , අධ්‍යක්ෂ (ඉදිකිරීම්) වෙත දන්වා ඇත. ඒ සඳහා අධ්‍යක්ෂ ජනරාල් , මාර්ග සංවර්ධන අධිකාරීගේ අනුමැතිය ද ලැබී ඇත. අදාල බිල්පතෙහි සඳහන් අඩුපාඩු නිවැරදි කර ඉදිරිපත් කරන මෙන් අධ්‍යක්ෂ (ඉදිකිරීම්) විසින් 2022.08.29 දිනැති ලිපි අංක RDA/CON/ACC/GEN/83/2022 මඟින් පළාත්භාර අධ්‍යක්ෂ (ම.ප.) වෙත දන්වමින් අදාල බිල්පත හරවා යවා ඇත. පළාත්භාර අධ්‍යක්ෂ (ම.ප.) විසින් එම බිල්පත ප්‍රධාන ඉංජිනේරු (මාතලේ) වෙත යවා ඇති අතර, අඩුපාඩු නිවැරදි කර මෙම මස තුලදී පළාත්භාර අධ්‍යක්ෂ (ම.ප.) වෙත යොමු කරන බව දන්වා ඇත. <u>වසර 02- 05 අතර ඇති වැඩ ආරම්භ කිරීමේ අත්තිකාරම් ශේෂය රු.මිලියන 53.25</u> රු.මිලියන 20.39 ඉදිකිරීම් අංශය යටතේ ඇති ව්‍යාපෘති වන අතර රු.මිලියන 16.83 ක අත්තිකාරම් මුදල මේ වන විට පියවාගෙන ඇති අතර ඉතිරි අත්තිකාරම් මුදල වන රු. මිලියන 3.56 ඊට අදාල ව්‍යාපෘතියේ රඳවාගත් මුදලින් පියවීමට කටයුතු කරන ලෙස ප්‍රධාන ඉංජිනේරු (හලාවත) වෙත දන්වා ඇත. බස්නාහිර පළාතට අයත් රු. මිලියන 16.16 න් රු. මිලියන 0.33 ක් පියවාගෙන ඇත. රු. මිලියන 15.8 ක අත්තිකාරම් ශේෂයක් පවතින රාජ්‍ය සංවර්ධන හා නිතිගත සංස්ථාවට අදාල පාලම් අංක 1/1 හංවැල්ල - පුගොඩ (B146) මාර්ගයේ වැඩ කටයුතු කොරෝනා ව්‍යාප්තිය හා වර්ෂාව හේතුවෙන් පාලම යට ජල මට්ටම ඉහල යෑම වැනි කරුණු නිසා ප්‍රමාද වීම හේතුවෙන් බිල්පත් නොලැබීම මත අත්තිකාරම් අයකර ගැනීම ප්‍රමාද වී ඇත. එසේ වුවද 2022.10.31 දින වන විට රු. මිලියන 2.18 ක් පියවාගෙන ඇත. ඉතිරි අත්තිකාරම් මුදල ඉදිරියේදී ඉදිරිපත් කරනු ලබන බිල්පත් මගින් ශේෂය පියවා ගැනීමට කටයුතු කරනු ලැබේ. මධ්‍යම පළාතට අයත් රු. මිලියන 16.70 න් රු. මිලියන 3.55 ක් පියවාගෙන ඇත. ඉතිරි රු. මිලියන 13.15 ක වැඩ ආරම්භ කිරීමේ අත්තිකාරම් පියවා ගැනීම සඳහා අදාල ආයතන විසින් නැවත අයකර ගැනීමේ සැලැස්මක් (Recovery Plan) ඉදිරිපත් කර ඇති අතර ඒ අනුව අත්තිකාරම් ශේෂයන් සම්බන්ධයෙන් ඉදිරියේදී කටයුතු කරනු ලැබේ. <u>වසර 05 ඉක්මවා ඇති වැඩ ආරම්භ කිරීමේ අත්තිකාරම් ශේෂය රු.මිලියන 58.11</u> රු. මිලියන 31.69 ක වැඩ ආරම්භ කිරීමේ අත්තිකාරම් ශේෂයක් අයකරගන්නා මෙන් අධ්‍යක්ෂ ජනරාල් , මා.සං.අ. ගේ 02.08.2022 දිනැති ලිපි අංක RDA/FD/Pay/F/Accounta'21

		මඟින් දැනුම් දී ඇති අතර දේශීය බැංකු අරමුදල් ව්‍යාපෘතිය විසින් 100,000 ව්‍යාපෘතිය යටතේ පළාත්බද මාර්ග සංවර්ධන අධිකාරියට ගෙවිය යුතු, බිල්පත් වලින් මෙම වැඩ ආරම්භ කිරීමේ අත්තිකාරම් මුදල අඩු කර ගෙන ඇති අතර 2022 සැප්තැම්බර් මස ජර්නල් සටහන් අංක 213/J09 මඟින් ගිණුම් ගැලපුම් සිදු කර ඇත. ගෙවීම් අංශයට අදාලව වසර 05 ඉක්මවා ඇති වැඩ ආරම්භ කිරීමේ අත්තිකාරම් ශේෂය_වන රු. 10.72 ක මුදලින් කොන්ත්‍රාත් අංක RDA/MMC/CP/GOSL/2014/63 යටතේ ලබා දී ඇති රු. මිලියන 6.86 ක මුදල පිළිබඳව ඉහත සඳහන් කර ඇත. කොන්ත්‍රාත් අංක RDA/DW/E/17 යටතේ ලබා දී ඇති රු. මි. 3.86 ක අත්තිකාරම් මුදල පියවීමට කටයුතු කරන මෙන් 2019.06.05 දිනැති ලිපි අංක RDA/DW/W/Stage 02 මඟින් අධ්‍යක්ෂ (ඉදිකිරීම්) විසින් ප්‍රධාන ඉංජිනේරු(කොළඹ) වෙත දන්වා ඇත. ඊට පිළිතුරු වශයෙන් ප්‍රධාන ඉංජිනේරු කොළඹ විසින් අදාල අත්තිකාරම් මුදල පියවීම සඳහා අවශ්‍ය තොරතුරු සොයා ගත නොහැකි බව 2021.12.01 දිනැති ලිපි අංක RDA/CE/COL/Bill මඟින් දන්වා ඇත. රු.මිලියන 15.70 ඉදිකිරීම් අංශය යටතේ ඇති ව්‍යාපෘති වන අතර රු.මිලියන 1.25 අත්තිකාරම් අදාල කොන්ත්‍රාත්කරුගේ වෙනත් ව්‍යාපෘති වලින් අයකර ගැනීමට කටයුතු කරනු ලැබේ. රු.මිලියන 9.02 අත්තිකාරම් අයකර ගැනීම සඳහා නඩු පවරා ඇත. ඉතිරි රු. මිලියන 5.43 ක අත්තිකාරම් මුදලට අදාල ව්‍යාපෘතිය දිස්ත්‍රික් ලේකම් යටතේ ක්‍රියාත්මක වන වෙනත් ව්‍යාපෘතියක් මඟින් ක්‍රියාත්මක කෙරෙන බැවින් අවබෝධතා ගිවිසුම් යටතේ මෙම ව්‍යාපෘතිය නැවැත්වීමට කටයුතු කර ඇත. අත්තිකාරම් මුදල නැවත ගෙවීමට කොන්ත්‍රාත්කරු එකඟ වී ඇති අතර මීට අදාලව අවශ්‍ය කටයුතු කෙරෙමින් පවතී.
(ඔ)	2021 දෙසැම්බර් 31 දිනට ඉදිකිරීම් අංශයේ විසින් මග නැගුම ඉදිකිරීම් හා යන්ත්‍රෝපකරණ (පුද්) සමාගම හා මගනැගුම උපදේශන හා ව්‍යාපෘති කළමනාකරණ සේවා පුද්ගලික සමාගම වෙත ගෙවිය යුතු රැඳවුම් මුදලින් වසර 5 කට වඩා වැඩි කාලයක සිට නිරවුල් නොවී පවතින මුදල රු. මිලියන 687.9 ක් ද වසර 4-5 ත් අතර කාලයක තුළ පවතින මුදල රු. මිලියන 126.7 ක් විය.	මහ නැගුම ඉදිකිරීම් හා යන්ත්‍රෝපකරණ (පුද්ගලික) සමාගම හා මහ නැගුම උපදේශන හා ව්‍යාපෘති කළමනාකරණ සේවා පුද්ගලික සමාගම වෙත ගෙවීම් නිර්දේශ කල වවුවර්පත් රු. 71,495,749.94 හා කපා හැරීමට යෝජිත රු. 62,736,867.14 අදාල නිර්දේශ අනුව කටයුතු කර ඇත. **සමාගමේ නම** / **ගෙවීම් කිරීමට ඉදිරිපත් කර ඇති මුදල (රු.)** / **කපා හැරීමට කටයුතු කර ඇති මුදල (රු.)** මහ නැගුම උපදේශන හා ව්‍යාපෘති කළමනාකරණ සේවා පුද්ගලික සමාගම — 5,582,529.59 — 6,251,126.96 මහ නැගුම ඉදිකිරීම් හා යන්ත්‍රෝපකරණ (පුද්ගලික) සමාගම — 65,913,220.35 — 56,485,740.18 — 71,495,749.94 — 62,736,867.14

		ඉතිරි රඳවා ගැනීමේ මුදල් සම්බන්ධයෙන් වූ තොරතුරු අදාල ප්‍රධාන ඉංජිනේරු සහ විධායක ඉංජිනේරුවරුන්ගෙන් කැඳවා එම තොරතුරු පරීක්ෂා කර අදාල කොන්ත්‍රාත්කරුවන්ද දැනුවත් කර රඳවා ගැනීමේ මුදල් නිදහස් කිරීමට හෝ කමිටු නිර්දේශ මත ආදායමට බැර කර ගැනීමට අවශ්‍ය නිර්දේශ ලබා ගැනීම සඳහා ප්‍රධාන ඉංජිනේරුවරුන් සහ විධායක ඉංජිනේරුවරුන් වෙත දැන්වීමට අවශ්‍ය කටයුතු කෙරෙමින් පවතී.
(ඕ)	දේශීය බැංකු අරමුදල් සහ ග්‍රාමීය මාර්ග ව්‍යාපෘතිය යටතේ ක්‍රියාත්මක වන ජාතික, ප්‍රාදේශිය හා ග්‍රාමීය වශයෙන් කි.මී 100,000 ක විකල්ප මාර්ග පුනරුත්ථාපනය කිරීමේ වැඩසටහන යටතේ මෙම වැඩසටහන යටතේ 2021 දෙසැම්බර් 31 දින වන විට කිලෝමීටර් 53,517.39 කින් යුත් ග්‍රාමීය මාර්ග ව්‍යාපෘති 71,468 ක් සංවර්ධනය කිරීම සඳහා හඳුනා ගෙන තිබූ අතර කිලෝමීටර් 24,785.04 ක් වූ මාර්ග ව්‍යාපෘති 16,705 ක් සඳහා ඇස්තුමේන්තු සකස් කර තිබුණි. කොන්ත්‍රාත් වටිනාකම රු.බිලියන 356.44 ක් වූ මාර්ග ව්‍යාපෘති 11,595 ක් සඳහා කොන්ත්‍රාත් ප්‍රදානය කිරීම් අවසන්ව තිබුණි. එදිනට මෙම වැඩසටහන වෙනුවෙන් රු.බිලියන 92.25 ක වියදමක් දරා තිබූ අතර, රු.බිලියන 15.65 ක බිල්පත් සඳහා තවදුරටත් ගෙවිය යුතුව තිබුණි. මෙම වාර්තාවේ දිනට නොපියවා ඇති බිල්පත් වටිනාකම රු.මිලියන 52,500 ක් වූ අතර මෙයින් රු.මිලියන 25,491ක් මාස 3 ක් ඉක්මවා තිබුණි.	100,000 ව්‍යාපෘතියේ අරමුදල් මූලාශ්‍රයන් වන්නේ දේශීය බැංකු හා රාජ්‍ය භාණ්ඩාගාර ය වේ. එබැවින් එම මූලාශ්‍රය මගින් අරමුදල් ව්‍යාපෘතියට ප්‍රේෂනය කිරීම අනුව ව්‍යාපෘතියේ කොන්ත්‍රාත්කරුවන් හට ගෙවීම් සිදුකරනු ලබයි. මිලියන 100ට වඩා වැඩි හිඟ ගෙවීම් පවතින කොන්ත්‍රාත්කරුවන් හට එම බිල්පත් සඳහා භාණ්ඩාගාර බැදුම්කර ලබා දී ඇත.
(ක)	මෙම වැඩසටහන යටතේ දිස්ත්‍රික්ක 04 කට අදාළව කාර්යසාධනක් නොමැති කොන්ත්‍රාත්කරුවන් 11 දෙනකු ව්‍යාපෘතිය විසින් හඳුනාගෙන තිබුණි. ඒ අනුව ඔවුන් විසින් අතහැර දමන ලද ව්‍යාපෘති සංඛ්‍යාව 18 ක් වූ අතර එහි කොන්ත්‍රාත් වටිනාකම රු.මිලියන 593.88 ක් විය. එම	රජය විසින් නිකුත් කරන ලද රාජ්‍ය වියදම් පාලනය කිරීමේ චක්‍රලේඛයට අනුව අලුතින් කොන්ත්‍රාත් කැඳවීම සහ ප්‍රදානය කිරීම අත්හිටුවා ඇත. කි.මී. 100000 ව්‍යාපෘතියේ පාලනයෙන් තොරව ඇති වූ අර්බුද මූල්‍ය අර්බුදය නිසා අතිකාරම් මුදල් ගෙවීම සහ බිල්පත් ගෙවීම ප්‍රමාද වීම සිදු විය. ඉන්ධන හිඟයට ඉදිකිරීම් ද්‍රව්‍ය සීමා පැනවීම සහ covid වසංගත තත්ත්වය වැනි හේතූන් නිසා මාර්ග කිලෝමීටර්

	කොන්ත්‍රාත්කරුවන් වෙත ප්‍රදානය කරන ලද කොන්ත්‍රාත් අතුරින් කොන්ත්‍රාත් වටිනාකම රු.මිලියන 147.45 ක් වූ කොන්ත්‍රාත් 04 ක් උක්ත කොන්ත්‍රාත්කරුවන් විසින් ආරම්භ කර නොතිබුණි. වරින් වර මුහුණ දෙන මෙවැනි තත්ත්වයන් වළකා ගැනීම සඳහා අපේක්ෂික කාර්යසාධනයක් පෙන්නුම් නොකරන කොන්ත්‍රාත්කරුවන්ව අසාධු ලේඛනගත කිරීම සඳහා අවශ්‍ය කරන නෛතික රාමුවක් සකස් කිරීමට කළමනාකරණ අවධාරණය මෙතෙක් ඔමුව නොතිබුණි.	100000 ව්‍යාපෘතියෙහි අනපේක්ෂිත ප්‍රගතිය ලගාකර ගැනීමට නොහැකි විය. ඒ මත පදනම්ව ප්‍රගතියක් පෙන්නුම් කළ කොන්ත්‍රාත්කරුවන් අසාදු ලේඛනගත කිරීම ඉදිකිරීම් ක්ෂේත්‍රයේ පැවැත්මට අහිතකර ලෙස බලපාන බැවින් එසේ අසාදු ලේඛන සකස් කිරීම ඉදිනිරීම් කරුවන්ගේ සංගමය විරෝධතාවය දක්වන ලදී. ඉහත හේතූන් සහ කිලෝමීටර් 100000 ව්‍යාපෘතියේ තොන්ත්‍රාත් පිරිනැමීම නවතා ඇති බැවින් අසාදු ලේඛන සැකසීම තාවකාලිකව අත්හිටුවා ඇත.
(ඛ)	ඉහත ව්‍යාපෘතියට අදාළව සකස්කරන ලද ඉංජිනේරු ඇස්තමේන්තු සංශෝධනය කිරීම හා නිවැරදි කිරීම සිදුකරන ලෙස සියලු පළාත් අධ්‍යක්ෂකවරු, ප්‍රධාන ඉංජිනේරුවරු හා විධායක ඉංජිනේරුවරු වෙත අදාල ව්‍යාපෘති අධ්‍යක්ෂක විසින් දන්වා තිබුණද, විගණිත දිනය වනවිටත් එකතුව රු.මිලියන 15,690.5 ක් වටිනා ව්‍යාපෘති 146 ක් සම්බන්ධයෙන් අදාල නිවැරදි කිරීම් සිදුව නොමැති අතර ඒ අනුව අනාගතයේදී කොන්ත්‍රාත්කරුවන්ට සම්මත අනුපාතයට වඩා වැඩි මිල අනුපාතයක් ගෙවීමෙන් රජයට විශාල මූල්‍ය පාඩුවක් සිදුවීමට අවස්ථා පවතින බව නිරීක්ෂණය විය.	පළාත් කාර්යාල වෙත ලබාදුන් උපදෙස් අනුව කටයුතු කරමින් පවතී.
(ග)	මෙම වැඩසටහන යටතේ වූ මාර්ග සංවර්ධනයේ දී මහා මාර්ග සංවර්ධනය සඳහා භාවිතා කරනු ලබන මහා මාර්ග රේට උපලේඛනයන් (HSR) සහ පිරිවිතරයන් භාවිතා කර තිබීම ආර්ථික සහ ඵලදායී නොවන බැවින් ග්‍රාමීය මාර්ග සඳහාම වූ පිරිවිතරයන් සකස් කර අනුගමනය කළ යුතුව තිබුණි.	රජය විසින් නිකුත් කරන ලද රාජ්‍ය වියදම් පාලනය කිරීමේ චක්‍රලේඛයට අනුව සියලු ව්‍යාපෘති නතර වී ඇත. ඒ අනුව නැවත කොන්ත්‍රාත් පිරිනැමීමක් සිදු නොවේ.
(ඝ)	ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ප්‍රසම්පාදන කාර්ය සංග්‍රහය ප්‍රකාරව ලංසු කැඳවීමේ ලේඛනයේ ප්‍රතිපාදන සලසා නොමැති උප කොන්ත්‍රාත් සඳහා ඉඩදීම නීත්‍යානුකූල නොවූව ද, රු.මිලියන 165.9 ක වටිනාකමක් මත ගිවිසුම්ගතව තිබූ පොළොන්නරුව දිස්ත්‍රික්කය තුළ ක්‍රියාත්මක ව්‍යාපෘතියක් වෙනත් පුද්ගලික සමාගමක් වෙත උප කොන්ත්‍රාත් දී තිබුණි. මාතර දිස්ත්‍රික්කය තුළ ක්‍රියාත්මක රු. මිලියන 234.7 ක ඇස්තමේන්තුගත වටිනාකමක් සහිත	මෙම ව්‍යාපෘතීන්හි උප කොන්ත්‍රාත් ලබා දී නොතිබුණද සේවා සපයන්නන්ගේ (කම්කරුවන් සපයන්නන්, ද්‍රව්‍ය සපයන්නන්, සහ යන්ත්‍රෝපකරණ හා උපකරණ සපයන්නන්) දායකත්වය ව්‍යාපෘති සඳහා යොදා ගනු ලබයි. කාලය දීර්ඝ කිරීම සඳහා සමාගම් ඉදිරිපත් කරන ලද ඉල්ලුම් පත් වල සඳහන් කරුණුවල නිරවද්‍යතාවය තහවුරු කරගැනීමෙන් අනතුරුව අවශ්‍ය අනුමැතිය ලබා දෙනු ලබයි. කාර්ය සාධන සුරක්ෂණ දීර්ඝ කිරීම සඳහා ව්‍යාපෘති අධ්‍යක්ෂ හා පළාත් අධ්‍යක්ෂක විසින් අදාළ කොන්ත්‍රාත් කරුවන් සහ මූල්‍ය ආයතන දැනුවත් කර ඇත.

	ව්‍යාපෘතියක, ව්‍යාපෘති කාලය අවසන් වී දින 290 ක් ඉක්මවා තිබුණද, කොන්ත්‍රාත්තුවෙන් සියයට 76.58 ක් තවදුරටත් ඉටුකිරීමට ඉතිරිව ඇති බැවින් ප්‍රමාද හා දඩ අයකර ගතයුතුව තිබුණි. එසේම, රජයේ ප්‍රසම්පාදන මාර්ගෝපදේශ සංග්‍රහයේ 5.4.8 (ආ) ප්‍රකාරව, කාර්යසාධන සුරක්ෂණය වැඩ නිම කිරීමට අපේක්ෂිත දිනයෙන් පසුව දින 28 ක් දක්වා වූ කාලයකට වලංගු විය යුතු වුව ද, පොළොන්නරුව දිස්ත්‍රික්කය තුළ ක්‍රියාත්මක ව්‍යාපෘති කිහිපයක් සම්බන්ධයෙන් එසේ කටයුතු කර නොතිබුණි. එසේම, මාතර දිස්ත්‍රික්කය තුළ ක්‍රියාත්මක ව්‍යාපෘතියක් සඳහා ලබාදී තිබූ රු.මිලියන 8.18 ක කාර්යසාධන බැඳුම්කරය කල් ඉකුත් වී තිබුණද, එය අලුත් කර ගැනීමට කටයුතු කර නොතිබුණි.	

.....

සභාපති

මාර්ග සංවර්ධන අධිකාරිය

මාර්ග සංවර්ධන අධිකාරිය, වාර්ෂික වාර්තාව – 2021
මාර්ග සංවර්ධන අධිකාරියේ කාර්ය සාධනය

2021 වර්ෂය තුළ මාර්ග සංවර්ධන අධිකාරියේ සහ විදේශ අරමුදල්වලින් ක්‍රියාත්මක වූ ව්‍යාපෘතිවල කාර්ය සාධනය පිළිබඳ සියලු සවිස්තරාත්මක තොරතුරු ඉහත වාර්තාවේ දක්වා ඇත. පහත දැක්වෙන්නේ මාර්ග සංවර්ධන අධිකාරියේ හි ක්‍රියාකාරකම්වල කැපී පෙනෙන අංශවල කාර්ය සාධනයේ සාරාංශයක් පමණි.

1. **මාර්ග නඩත්තු කටයුතු ක්‍රියාත්මක කිරීම :**

2021 වර්ෂය තුළ A & B පන්තියේ මාර්ග, අධිවේගී මාර්ග සහ පාලම් වලින් සමන්විත සමස්ත ජාතික ජාලයම සාමාන්‍ය මට්ටමින් නඩත්තු කරන ලදී. මීට අමතරව කිලෝමීටර් 77.53ක් දිග මාර්ගවල වැලි මුද්‍රා තැබීම, පිළිසකර කිරීම් සහ ඒසී ඇතිරීම කිරීම සිදු කර ඇත. 2021 වසර සඳහා ජාතික මාර්ග නඩත්තු වියදම රු. මිලියන 4,006.02 කි.

2. **මහාමාර්ග සංවර්ධනය :**

දේශීය අරමුදල්වලින් මෙන්ම විදේශීය අරමුදල්වලින් මාර්ග ප්‍රතිසංස්කරණය හා වැඩිදියුණු කිරීම් සිදු කරන ලදී. දේශීය අරමුදල්වලින් අධිවේගී මාර්ග සංවර්ධනය දිවයින පුරා පළාත් අධ්‍යක්ෂ කාර්යාල මගින් සිදු කරන ලදී. 2021 අවසන් වන විට දේශීය අරමුදල්වලින් මාර්ග පුළුල් කිරීමේ සහ වැඩිදියුණු කිරීමේ ව්‍යාපෘති යටතේ කිලෝමීටර 68.65 ක දිගකින් යුතු මාර්ග කටයුතු නිම කර ඇති අතර දිග කිලෝමීටර 67.05 ක පමණ කටයුතු සිදු වෙමින් පවතී.

ප්‍රධාන මාර්ග සහ අධිවේගී මාර්ගයට ප්‍රවේශ වීම සඳහා විකල්ප මාර්ග කිලෝමීටර් 100000ක් සංවර්ධනය කිරීම 2020 වසරේ ආරම්භ කළ අතර මෙම වැඩසටහන යටතේ කිලෝමීටර් 4,083ක් සම්පූර්ණ කර ඇති අතර 2021 වසර අවසානයේ කිලෝමීටර් 10,500ක් පමණ ක්‍රියාත්මක වෙමින් පවතී. වර්ෂය තුළ, වාර්තාවේ විස්තර කර ඇති පරිදි විදේශ අරමුදල් ආධාර ඇතිව මාර්ග ප්‍රතිසංස්කරණ සහ වැඩිදියුණු කිරීමේ කටයුතු සැලකිය යුතු ප්‍රමාණයක් සිදු කරන ලද අතර බදුල්ල -චෙන්කලඩි මාර්ගයේ (A005) කිලෝමීටර 108 ක් වැඩිදියුණු කිරීම 2021 වසරේ දී නිම කරන ලදී.

3. **පාලම් ඉදිකිරීම:**

2021 වර්ෂයේදී අබලන් වූ පාලම් වැඩිදියුණු කිරීමේ වැඩසටහන සහ දේශීය අරමුදල්වලින් සිදු කරන ලද පුළුල් කිරීමේ සහ වැඩිදියුණු කිරීමේ වැඩසටහන යටතේ පිළිවෙලින් පාලම් 24 ක සහ පාලම් 10 ක කටයුතු නිම කර ඇත. මීට අමතරව විදේශ අරමුදල් ව්‍යාපෘති යටතේ පාලම් ඉදිකිරීම් කිහිපයක් අවසන් කර ඇත. නව කැලණි පාලමේ ඉදිකිරීම් අවසන් කර 2021 නොවැම්බර් 25 දින ජනතා අයිතියට පත් කරන ලදී.

4. **මාර්ග සහ පාලම් වැඩවල තත්ත්ව පාලනය :**

2021 වසර තුළදී, මාර්ග සංවර්ධන අධිකාරියේ පර්යේෂණ හා සංවර්ධන අංශය පළාත් ක්ෂේත්‍ර රසායනාගාර 9ක් හරහා මාර්ග ඉදිකිරීමේදී සහ නඩත්තු කිරීමේදී සිදුවන කාර්යයන්වල තත්ත්ව පාලනය සඳහා උපදෙස් සහ සහාය අඛණ්ඩව ලබා දුන්නේය. වර්ෂය තුළ මාර්ග සංවර්ධන අධිකාරියේ ව්‍යාපෘති සඳහා රු.මිලියන 5.8 ක පමණ වැඩකටයුතු කරන අතරතුර, පුද්ගලික ආයතන හරහා ලබාගත් සාම්පල භූමි පරීක්ෂණ (විදුම් කටයුතු) සහ රසායනාගාර පරීක්ෂණ මගින් රු. මිලියන 30.6 ක පමණ ආදායමක් ලබා ගෙන ඇත.

5. **දේපල කළමනාකරණය සහ ආදායම් එකතු කිරීම :**

මාර්ග දෙපස ඇති දැන්වීම් පුවරු වැටවල්/දැන්වීම් පුවරු/කැන්ටිලිවර්/බැනර්/බස් නැවතුම්පොළ සහ අනෙකුත් ප්‍රචාරණ උපකරණ/උපාංග සඳහා බලපත්‍ර නිකුත් කිරීම අඛණ්ඩව සිදු කරන ලද අතර 2021 වර්ෂය තුළ ඒවා අලුත් කිරීම් ඇතුළුව අනුමැතීන් 92,970 ක් ලබා දී ඇත. 2021 වර්ෂය තුළ මාර්ග සංවර්ධන අධිකාරියෙ හි

දේපල කළමනාකරණය කිරීමෙන් දේපල කළමනාකරණ සහ ආදායම් අංශය විසින් විවිධ මූලාශ්‍රවලින් උපයාගත් මුළු ආදායම රු.මිලියන 382,21 කි.

6. ඉඩම් අත්පත් කර ගැනීම සහ නැවත පදිංචි කිරීම :

2021 වර්ෂය තුළ මාර්ග සංවර්ධන අධිකාරියේ ඉඩම් අත්පත් කර ගැනීමේ සහ නැවත පදිංචි කිරීමේ අංශය විසින් මාර්ග සහ පාලම් ව්‍යාපෘති සඳහා අවශ්‍ය ඉඩම් අත්පත් කර ගැනීමේ කටයුතු ප්‍රාදේශීය ලේකම්වරුන්ගේ සම්බන්ධීකරණයෙන් සිදු කරන ලදී. වර්ෂය තුළ මාර්ග වැඩිදියුණු කිරීමේ ව්‍යාපෘති සහ අධිවේගී මාර්ග සඳහා අත්පත් කරගත් ඉඩම් සඳහා වන්දි වශයෙන් රු. මිලියන 2,137.8 ක් ගෙවා ඇත.

7. පාරිසරික හා සමාජ ආරක්ෂණ ක්‍රියාමාර්ග ක්‍රියාත්මක කිරීම :

පාරිසරික බලපෑම් ඇගයීම / මූලික පාරිසරික පරීක්ෂණ වාර්තා සැකසීම සහ සමාලෝචනය ඇතුළු විවිධ මාර්ග සංවර්ධන ව්‍යාපෘතිවල පාරිසරික හා සමාජ ආරක්ෂණ පියවර ක්‍රියාත්මක කිරීම සඳහා මාර්ග සංවර්ධන අධිකාරියෙ හි පාරිසරික හා සමාජ අංශය අඛණ්ඩව සහයෝගය ලබා දෙන ලදී.

2021 වර්ෂය තුළ, ලෝක බැංකුව විසින් අරමුදල් සපයන ලද අන්තර් සම්බන්ධතා සහ සංවර්ධන ව්‍යාපෘතිය සඳහා පිරික්සුම් ලැයිස්තු, මාර්ග විශේෂිත පාරිසරික සහ සමාජ කළමනාකරණ සැලැස්ම (ESMP) සහ පාරිසරික සහ සමාජ යහපත් භාවිතයන් (CESGP) සකස් කරන ලද අතර පාරිසරික සහ සමාජ රාමු සමාලෝචනය කරන ලදී.

8. අධිවේගී මාර්ග සංවර්ධනය:

මධ්‍යම අධිවේගී මාර්ගය කඩවත සිට දඹුල්ල දක්වා, කුරුණෑගල හරහා පොතුහැර සිට ගලගෙදරට සම්බන්ධ කරමින් සැලසුම් කර ඇත. මෙම අධිවේගී මාර්ගයේ ඉදිකිරීම් කටයුතු කොටස් හතරක් යටතේ ක්‍රියාත්මක කිරීමට සැලසුම් කර ඇත. 1 කොටසේ කඩවත සිට මීරිගම දක්වා සහ 3 වන කොටසේ 1 වන අදියර පොතුහර සිට රඹුක්කන දක්වා සිවිල් කටයුතු 2021 අවසානයේ සිදු වෙමින් පැවතුනි. මීරිගම සිට කුරුණෑගල දක්වා 2 කොටසේ ඉදිකිරීම් වසර අවසන් වන විට අවසන් කර ඇති අතර 2022 ජනවාරි මාසයේදී මෙහෙයුම් ආරම්භ කිරීමට බලාපොරොත්තු වේ. කුරුණෑගල සිට දඹුල්ල දක්වා කොටස සඳහා ඉඩම් අත්පත් කර ගැනීමේ ක්‍රියාවලිය සහ ප්‍රසම්පාදන ක්‍රියාවලිය සිදු වෙමින් පවතී.

9. අධිවේගී මාර්ග මෙහෙයුම් :

2021 වර්ෂය තුළ දක්ෂිණ අධිවේගී මාර්ගය (E01-කොට්ටාව සිට මත්තල දක්වා), කොළඹ - කටුනායක අධිවේගී මාර්ගය (E03), පිටත වටරවුම් මාර්ගය (E02-කොට්ටාව සිට කෙරවලපිටිය දක්වා) සහ අන්දරවැව - හම්බන්තොට අධිවේගී මාර්ගය (E06) ක්‍රියාත්මක විය. වර්ෂය තුළ අධිවේගී මාර්ග ජාලයේ ගමන් කර ඇති මුළු වාහන ප්‍රමාණය වාහන 32,409,411 කි. වර්ෂය තුළ ගාස්තු ආදායම ලෙස රුපියල් මිලියන 8,100.72ක් උපයා ඇත.

10. සමස්ත මූල්‍ය කාර්ය සාධනය :

2021 වසර සඳහා දේශීය හා විදේශීය අරමුදල් ඇතුළුව මාර්ග සංවර්ධන අධිකාරිය සඳහා වූ මුළු අරමුදල් ප්‍රතිපාදන රු. බිලියන 358.15 ක් වූ අතර වර්ෂය තුළ වියදම රුපියල් බිලියන 211.32 ක් විය. 2021 සඳහා මුළු අරමුදල් ප්‍රතිපාදනවලින් 59% කට ආසන්න ප්‍රමාණයකට විදේශ අරමුදල් දායක විය.

ක්‍රියාකාරකම	ප්‍රතිපාදන වෙන් කිරීම් (රු.මි)	වියදම (රු.මි)
අධිවේගී මාර්ග සංවර්ධනය	63,453.68	23,584.53
මහාමාර්ග සංවර්ධනය	250,361.49	159,126.06
මාර්ග පුළුල් කිරීම සහ වැඩිදියුණු කිරීම	8,100.00	3,305.79
පාලම් සහ ගුවන් පාලම් ඉදිකිරීම	28,335.36	17,407.42
ස්වාභාවික විපත්වලින් අබලන් වූ මාර්ග ප්‍රතිසංස්කරණය කිරීම	130.00	130.00
ආයතනික සහාය	7,770.00	7,770.00
එකතුව	**358,150.54**	**211,323.79**

මාර්ග සංවර්ධන අධිකාරියේ කාර්ය සාධනය වැඩි දියුණු කිරීම සඳහා ගන්නා ලද මධ්‍ය කාලීන පියවර

1. මාර්ග සහ පාලම්වල සවිස්තරාත්මක ඉංජිනේරු සැලසුම් සහ කොන්ත්‍රාත්තු ලේඛන සකස් කිරීම මාර්ග සංවර්ධන අධිකාරිය විසින් අඛණ්ඩව සිදු කරනු ලබයි. 2021 වර්ෂයේ දී, මාර්ග සංවර්ධන අධිකාරිය විසින් බාහිර සහාය ලබා ගැනීමකින් තොරව ශක්‍යතා අධ්‍යයන සිදු කිරීමට නැවත ආරම්භ කරන ලදී. මෙම ක්ෂේත්‍රවල කාර්ය මණ්ඩලයේ තාක්ෂණික දැනුම දියුණු කිරීමේදී කාර්යක්ෂමතාව ඉහළ නැංවීම, පිරිවැය අඩු කිරීම සහ ව්‍යාපෘති ක්‍රියාත්මක කිරීමේ ප්‍රමාදයන් අවම කිරීම සඳහා මෙමඟින් පහසුකම් සැලසිණි.

2. මාර්ග සංවර්ධන අධිකාරියේ කාර්යක්ෂමතාවය වැඩිදියුණු කිරීමේ අරමුණින් දැනට ක්‍රියාත්මක ව්‍යාපෘතිවල අවශ්‍යතා සපුරාලීම සඳහා විවිධ කාණ්ඩවල පුරප්පාඩු පිරවීමට පියවර ගන්නා ලදී.

3. මාර්ග සංවර්ධන අධිකාරියේ කාර්ය මණ්ඩලය සඳහා ඔවුන්ගේ ධාරිතාව ඉහළ නැංවීම සඳහා අඛණ්ඩව දේශීය හා විදේශීය පුහුණු වැඩසටහන් පවත්වන ලදී. කාර්ය මණ්ඩලයේ ධාරිතාව ඉහළ නැංවීමේ අරමුණින් දේශීය විශ්වවිද්‍යාල/ ආයතනවල දීර්ඝ කාලීන පාඨමාලා සඳහා මාර්ග සංවර්ධන අධිකාරියේ නිලධාරීන් 9 දෙනෙකුට අනුග්‍රහය දක්වන ලද අතර මාර්ග සංවර්ධන අධිකාරියේ නිලධාරීන්/සේවකයින් 799 දෙනෙකු ආයතනික පුහුණුවීම් සඳහා සහභාගී විය. තවද වසර තුළදී බාහිර ආයතන මඟින් පවත්වනු ලබන පුහුණු පාඨමාලා, වැඩමුළු සහ සම්මන්ත්‍රණ සඳහා සේවකයින් 244 දෙනෙකු නම් කරන ලදී.

4. මාර්ග සංවර්ධන අධිකාරිය 1986 දී පිහිටුවන ලද අතර එතැන් සිට සුළු වෙනස්කම් හැර ආයතනයේ වර්තමාන සහ අනාගත අවශ්‍යතා සපුරාලීම සඳහා නිසි ප්‍රතිව්‍යුහගත කිරීමක් සිදු කර නොමැත. එබැවින්, පරිපාලන අරමුණු පමණක් නොව, කොට්ඨාසවල ක්‍රියාකාරිත්වය, නව තාක්ෂණය යොදා ගනිමින් අංශ පුළුල් කිරීම, නව තනතුරු හඳුන්වාදීම සහ ආයතනික ඉලක්ක සහ අරමුණු සාක්ෂාත් කර ගැනීම සඳහා නව බඳවා ගැනීමේ පරිපාටි සකස් කිරීමේ අවශ්‍යතාවය මතුව ඇත. 1981 අංක 73 දරන මාර්ග සංවර්ධන අධිකාරී පනතේ විධිවිධාන අනුව, මාර්ග සංවර්ධන අධිකාරියේ කළමනාකරණයේ ප්‍රධාන විධායක නිලධාරියා ලෙස අධ්‍යක්ෂ ජනරාල් විසින් 2016 වර්ෂයේ කළමනාකරණ සේවා දෙපාර්තමේන්තුව විසින් නිකුත් කරන ලද සංශෝධිත ආදර්ශය මත පදනම්ව නව ආයතනික ව්‍යුහය සහ බඳවා ගැනීමේ පරිපාටි සකස් කිරීම 2021 දී ආරම්භ කරන ලදී.

5. ඉදිරි වසර 10 සඳහා ජාතික මාර්ග පද්ධතිය සඳහා මාර්ග නඩත්තු හා වැඩිදියුණු කිරීමේ වැඩසටහන ලෙස 2021-2030 කාලසීමාව සඳහා 2018-2027 ජාතික මාර්ග ප්‍රධාන සැලැස්ම (NRMP) කෙටුම්පත යාවත්කාලීන කිරීම ආරම්භ කරන ලදී. රටේ ආර්ථිකයට ආයෝජනයේ බලපෑම අවම කරන ව්‍යාපෘති කේන්ද්‍රීය ප්‍රවේශය අනුගමනය නොකර, ප්‍රමුඛතා පදනම්න් ව්‍යාපෘති ක්‍රියාත්මක කිරීමේදී ප්‍රධාන සැලැස්ම ඉතා වැදගත් වේ.

6. රථවාහන පුරෝකථන ක්‍රියාවලියේ ධාරිතාව ඉහළ නැංවීමේ අරමුණින්, CUBE Voyager ප්‍රවාහන ආකෘතිකරණ මෘදුකාංගය මාර්ග සංවර්ධන අධිකාරියේ සැලසුම් අංශය වෙත ලබා ගන්නා ලදී. CUBE යනු ප්‍රවාහන සැලසුම් කරන්නන්/ඉංජිනේරුවන් සඳහා අවස්ථා දෘශ්‍යකරණය කිරීමට සහ පරීක්ෂා කිරීමට ප්‍රවාහන ආකෘති පුරෝකථන නිර්මාණය සහ සමාකරණ මෘදුකාංගයකි. නම්‍යශීලී සහ කාර්යක්ෂම ආකෘති නිර්මාණ මෘදුකාංගයක් ලෙස එය ප්‍රවාහන ජාලයක් මත නව ව්‍යාපෘති සහ ප්‍රතිපත්තිවල බලපෑම් විශ්ලේෂණය කිරීමට භාවිතා කළ හැක.

7. මාර්ග වත්කම් කළමනාකරණය සඳහා මාර්ග සංවර්ධන අධිකාරියේ ධාරිතාව ශක්තිමත් කිරීම සහ ශ්‍රී ලංකා මාර්ග වත්කම් කළමනාකරණ පද්ධතියේ (SLRAMS) සියලුම මොඩියුල ක්‍රියාත්මක කිරීම සඳහා, ලෝක බැංකු ආධාර ප්‍රවාහන සම්බන්ධතා සහ වත්කම් කළමනාකරණ ව්‍යාපෘතිය (TCAMP) යටතේ මාර්ග සංවර්ධන අධිකාරිය විසින් අවශ්‍ය මූල්‍ය ආධාර අඛණ්ඩව ලබා ගන්නා ලදී. මෙම ව්‍යාපෘතිය යටතේ මාර්ග පදික වේදිකා, පාලම්, හරස් ජලාපවහන ව්‍යුහයන්, මාර්ග ගෘහ භාණ්ඩ ආදී සියලුම මාර්ග වත්කම්වල

ඉන්වෙන්ටරි සකස් කිරීමෙන් SLRAMS හි සියලුම මොඩියුලයන් පුළුල් මාර්ග වත්කම් කළමනාකරණය කෙරෙහි අවධානය යොමු කරමින් ක්‍රියාත්මක කිරීමට මාර්ග සංවර්ධන අධිකාරිය අපේක්ෂා කරයි. මාර්ග නඩත්තු සහ වැඩිදියුණු කිරීමේ වැඩසටහන SLRAMS හි පදික කළමනාකරණ පද්ධතිය (PMS) මොඩියුලය හරහා HDM4 විශ්ලේෂණයෙන් පසුව සකස් කරනු ලබන අතර පළාත් තාක්ෂණික කාර්ය මණ්ඩලය විසින් SLRAMS හි සාමාන්‍ය නඩත්තු කළමනාකරණ මොඩියුලය (RMMS) හරහා රැස් කරන ලද තොරතුරු වලින් දෛනික නඩත්තු වැඩසටහන සකස් කිරීමට සැලසුම් කර ඇත.

අතීත වාර්තාවලට අනුව, ශ්‍රී ලංකා රජය විසින් රේඛීය අමාත්‍යාංශය හරහා රටේ මාර්ග පද්ධතිය සංවර්ධනය කිරීම සඳහා සැලකිය යුතු මුදල් ප්‍රමාණයක් මාර්ග සංවර්ධන අධිකාරිය වෙත වෙන් කර ඇත. කෙසේ වෙතත්, මෙම යටිතල පහසුකම්වල වටිනාකම තක්සේරු කර නොමැත. වත්කම් තක්සේරුව මඟින් මාර්ග වත්කම්වල වැදගත්කම සහ ආයෝජන සැලසුම්කරණයේදී මූල්‍යමය වශයෙන් එම වත්කමෙහි ආයෝජනය විස්තර කිරීමට අවස්ථාව සැලසේ.

මේ අනුව, මාර්ග සංවර්ධන අධිකාරිය සිය සියලු වත්කම් තක්සේරු කිරීමට තීරණය කළ අතර 2024 වසර අවසන් වන විට මෙම කාර්යය නිම කිරීමට ක්‍රියාකාරී සැලැස්මක් සකස් කර ඇත.

මාර්ග යටිතල පහසුකම් තක්සේරු කිරීමේදී මාර්ග සංවර්ධන අධිකාරියට අවශ්‍ය දැනුම නොමැති බැවින් TCAMP හරහා නියමු ව්‍යාපෘතියක් ලෙස මාර්ග වත්කම් තක්සේරු කිරීම සඳහා උපදේශන සේවාවක් ලබා ගැනීමට තීරණය කර ඇත. අනාගතයේදී මාර්ග සංවර්ධන අධිකාරියේ ප්‍රයෝජනය සඳහා TCAMP යටතේ උපදේශන සහ සේවා ගිවිසුම් කිහිපයක් සැලසුම් කර ක්‍රියාත්මක වේ.එවැනි එක් වැදගත් ගිවිසුමක් වන්නේ මාර්ග වත්කම් තක්සේරු කිරීමේ කොන්ත්‍රාත්තුවයි. තවද, මාර්ග වත්කම් තක්සේරුව සඳහා SLRAMS වෙත නව මොඩියුලයක් එකතු කරනු ඇත.

ලෝක බැංකුව සහය දක්වන ප්‍රවාහන සම්බන්ධතා සහ වත්කම් කළමනාකරණ ව්‍යාපෘතිය (TCAMP) 2023 මාර්තු අග වන විට අවසන් වනු ඇති අතර එහි ප්‍රතිඵලයක් ලෙස මාර්ග යටිතල පහසුකම් ක්‍රමානුකූල කළමනාකරණය සඳහා සවිස්තරාත්මක ඉහළ සහ පහළ ධාවන මාර්ග තොරතුරු පද්ධතියක් මාර්ග සංවර්ධන අධිකාරිය සතු වනු ඇත.